මූල්‍ය සාක්ෂරතා විෂය මාලාව

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

පිදුම

රටේ සියලුම ජන කොටස් අතර ගුණාත්මක මූල්‍ය සේවාවන් වෙත ඇති ප්‍රවේශය සහ ඒවායේ භාවිතය දිරිමත් කිරීම සඳහා සැලසුම් කර ඇති උපායමාර්ගික රාමුවක් ලෙස මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගය හඳුන්වා දිය හැකිය. මෙමඟින් සියළුම පුද්ගලයින්ගේ මූල්‍ය ප්‍රවේශය පහසු කිරීම පමණක් නොව, ඔවුන්ට බුද්ධිමත් මූල්‍ය තීරණ ගැනීමේ හැකියාව ලබා දී ඔවුන්ගේ ආර්ථික සුභසාධනය වැඩිදියුණු කිරීමටත්, ඔරොත්තුදීමේ හැකියාව ශක්තිමත් කිරීමටත්, සියළු දෙනාම අන්තර්ගත වූ මූල්‍ය පද්ධතියක් ගොඩනැගීමත් සඳහා වූ අප රටේ කැපවීම පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතතාවය ප්‍රවර්ධනය කිරීමෙහිලා තීරණාත්මක සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයෙහි අංගයක් ලෙස, 2024 මැයි මාසයේ දී ශ්‍රී ලංකා මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය එළි දක්වන ලදී. උපායමාර්ගික ප්‍රවනතා අංශ හතරක් යටතේ සැලසුම්කර ඇති මෙම මාර්ගොපදේශය මඟින් සියළු මූල්‍ය සාක්ෂරතා පාර්ශවකරුවන්ට සාක්ෂිමත පදනම් වූ මාර්ගෝපදේශකත්වයක් සපයනු ලැබේ.මෙහි ඉදිරිපත් කරඇති මූල්‍ය සාක්ෂරතා විෂය මාලාව, මූල්‍ය සාක්ෂරතා අන්තර්ගත සංවර්ධනය සහ සුසංයෝජනය යන උපායමාර්ගික ප්‍රවනතා අංශය යටතේ නියෝජනය කරයි. මෙම උපායමාර්ගික ප්‍රවනතා අංශය මඟින් රටේ සියළු ජන කණ්ඩායම් ආවරණය වන පරිදි රටපුරාම අධ්‍යාපනික සහ සංස්කෘතිකමය වශයෙන් මූල්‍ය අධ්‍යාපනයක් ලබා දීමට කටයුතු කරයි.

මෙම මූල්‍ය සාක්ෂරතා විෂය මාලාව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දියත් කරන ලද මුලපිරීමකි. මෙය ශ්‍රී ලංකා කැළණිය විශ්වවිද්‍යාලයේ විශේෂඥ දැනුමින් ගොඩනඟන ලද අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන දෙපාර්තමේන්තු සහ මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි අනෙකුත් පාර්ශවකරුවන්ගේ සහයෝගීතාවය ලබා ගනිමින් සංවර්ධනය කරන ලද්දකි. එය විවිධ අදහස්, විශේෂිත දැනුම සහ අත්දැකීම් එකට එක්කොට ශක්තිමත් විෂය මාලාවක් ඉදිරිපත් කිරීමට ගත් උත්සහයකි.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) ශ්‍රී ලංකා ශාඛාව මඟින් ක්‍රියාත්මක කරන "දූෂණය වැළැක්වීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තුළින් ආර්ථික යහපාලන තන්ත්‍රය ප්‍රවර්ධනය කිරීම" ව්‍යාපෘතිය හරහා ජපාන රජයෙන් ලැබෙන ආධාර යටතේ, මෙම මූල්‍ය සාක්ෂරතා විෂය මාලාව සංවර්ධනය හා නිර්මාණය කිරිමේ දී මූල්‍ය හා තාක්ෂණික සහයෝගය ලබා දෙන ලදී. අපගේ අඛණ්ඩ සහයෝගිතාව මඟින් පොදු සංවර්ධන අභියෝග විසඳීමේ දී ජාත්‍යන්තර සහයෝගිතාවල ඇති වැදගත්කම විදහා දක්වන අතර, මූල්‍ය අන්තර්ගතතභාවය පිළිබඳ මුලපිරීම්වල ගෝලීය වැදගත්කමද අවධාරණය කරයි.

විවිධ අධ්‍යාපනික සහ දැනුවත් කිරීමේ වැඩසටහන්වලදී සම්මත මාර්ගෝපදේශයක් ලෙස භාවිත කිරීම සඳහා මෙම විෂයමාලාව සැලසුම් කර ඇති අතර මූල්‍ය දැනුම්වත්භාවයට අදාළ සියලුම වැදගත් කාරණා ආවරණය කරමින්, මෙහි පරිච්ඡේද හතක් අන්තර්ගත වේ. එනම්: ආර්ථික පරිසරය, මූල්‍ය පරිසරය, පුද්ගල මූල්‍ය කළමනාකරණය, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (MSMEs) සඳහා මූල්‍ය කළමනාකරණය, ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාවය, මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව සහ බදු සාක්ෂරතාවය.

මෙම විෂයමාලාව සජීවී සහ සංශෝධනය කළ හැකි ලේඛනයක් ලෙස සැලසුම් කර ඇති අතර වේගයෙන් වෙනස්වන මූල්‍ය පද්ධතියට අනුකූලව යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාමට අපේක්ෂාකෙරේ. අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සඳහා වන අපගේ කැපවීම තුළින්, මෙම විෂයමාලාවෙහි අන්තර්ගතය නව ප්‍රවණතා, තාක්ෂණික නවෝත්පාදන, නීතිමය වෙනස්කම් සහ ජනතාවගේ වෙනස්වන අවශ්‍යතා වලට අදාලව, නිවැරදිව සහ ප්‍රතිචාරශීලීව පවත්වාගෙන යාම සහතික කෙරේ. මෙම විෂයමාලාව සමඟ සම්බන්ධ වී සඳහා ගුරුවරුන්, ශිෂ්‍යයන්, වෘත්තීයවේදීන් සහ අනෙකුත් සියලු පාර්ශවයන්ගේ ඵලදායී අදහස්, යෝජනා සහ විමසුම් අපි පිළිගනිමු. ශ්‍රී ලංකාවේ මූල්‍ය සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම සඳහා අපගේ සාමූහික මෙහෙවරට සඳහා ඔබ ලබා දෙන අවධානය හා දායකත්වය ඉතා අගයකොට සලකන අතර කරුණාකර ඔබගේ අදහස් සහ යෝජනා nfissec@cbsl.lk වෙත යොමු කරන්න.

පටුන

1 වන පර්ච්ඡේදය - ආර්ථික පරිසරය

1.1. හැඳින්වීම ...04
1.2. දළ දේශීය නිෂ්පාදිතය සහ ආර්ථික වර්ධනය ...06
1.3. ශ්‍රම බලකාය සහ විරැකියාව ...07
1.4. උද්ධමනය ...07
1.5. විනිමය අනුපාතය ...08
1.6. පොලී අනුපාතය ...10
1.7. ෆිස්කල් ප්‍රතිපත්තිය ...10

2 වන පර්ච්ඡේදය - මූල්‍ය පරිසරය

2.1. හැඳින්වීම ...12
2.2. මූල්‍ය වෙළඳපොළ ...14
2.3. මූල්‍ය ආයතන ...14

3 වන පර්ච්ඡේදය - පුද්ගල මූල්‍ය කළමනාකරණය

3.1. හැඳින්වීම ...22
3.2. ආදායම් කළමනාකරණය ...26
3.3. වියදම් කළමනාකරණය ...31
3.4. ඉතුරුම් කළමනාකරණය ...35
3.5. ආයෝජන කළමනාකරණය ...39
3.6. ණය කළමනාකරණය ...50
3.7. පුද්ගල මූල්‍ය ආරක්ෂාව ...59
3.8. පුද්ගල අයවැයකරණය ...63

4 වන පර්ච්ඡේදය - ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා මූල්‍ය කළමනාකරණය

4.1. හැඳින්වීම ...72
4.2. ව්‍යාපාරයක් ගොඩනැගීම ...75
4.3. ව්‍යාපාරයේ පිරිවැය හඳුනා ගැනීම ...78
4.4. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ආයෝජන තීරණ ...83
4.5. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මූල්‍යකරණ තීරණ ...85
4.6. අයවැයකරණය ...91
4.7. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මූල්‍ය වාර්තා පවත්වාගෙන යාම ...93
4.8. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අවදානම් කළමනාකරණය සහ ව්‍යාපාර සුරක්ෂිතභාවය ...104

5 වන පර්ච්ඡේදය - ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාවය

5.1. හැඳින්වීම ...105
5.2. ඩිජිටල් මූල්‍ය සේවා ...107
5.3. විද්‍යුත් වාණිජ්‍යය ...120
5.4. ඩිජිටල් අයවැයකරණ මෙවලම් ...124

6 වන පර්ච්ඡේදය - මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව

6.1. හැඳින්වීම ...126
6.2. මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව ...126
6.3. පිරමිඩ යෝජනා ක්‍රම අවබෝධ කර ගැනීම ...132

7 වන පර්ච්ඡේදය - බදු සාක්ෂරතාවය

7.1. හැඳින්වීම ...139
7.2. බදු හඳුනාගැනීමේ අංකය ...143
7.3. බදු වර්ග ...145
7.4. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා බදුකරණය ...149

පහත දැක්වෙන්නේ රත්නායක පවුලයි. එම පවුලේ සෑම සාමාජිකයෙකුම අපගේ සමාජයේ විවිධ භූමිකාවන් නියෝජනය කරනු ලබයි. එම සාමාජික චරිත හරහා අප සියළු දෙනාටම මූල්‍ය සාක්ෂරතාවයේ ඇති අවශ්‍යතාවය හඳුනා ගනිමු.

රත්නායක පවුල

අනිල් රත්නායක
නිවසේ පියා සහ ගෘහ මූලිකයා වේ. ඔහු වයස අවුරුදු 50ක් වන අතර පෞද්ගලික ආයතනයක කළමනාකරුවෙකු ලෙස සේවය කරයි.

අනූෂා රත්නායක
මවක් මෙන්ම පූර්ණ කාලීන ගෘහණියකි. ඇයට වයස අවුරුදු 45ක් වන අතර ඇය රැකියාවක් නොකරයි.

ගෝතමී රත්නායක
පවුලේ වැඩිමහල් දරුවා (දියණිය) වේ. වයස අවුරුදු 22ක් වන ඇය පෞද්ගලික අංශයේ පුහුණුවන්නියක් ලෙස සේවය කරන අතර අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සපුරාගෙන ඇති තරුණියකි.

ධනංජය රත්නායක
පවුලේ දෙවන දරුවා (පුතා) වේ. ඔහුට වයස අවුරුදු 20ක් වන අතර වැඩිදුර අධ්‍යාපනය හැදෑරීමට උනන්දුවක් නොමැති බැවින්, ඔහුගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීම පිළිබඳව සලකා බලමින් සිටී.

අයෝධ්‍ය රත්නායක
පවුලේ බාලම දරුවා (පුතා) වේ. වයස අවුරුදු 12ක් වන ඔහු පාසලේ 7 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබයි.

1 වන පරිච්ඡේදය

ආර්ථික පරිසරය

1.1 හැඳින්වීම

ඉගෙනුම් අරමුණු

- රටක ආර්ථික පරිසරය නිර්වචනය කර පැහැදිලි කිරීම.
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන් හඳුනා ගැනීම.
- දළ දේශීය නිෂ්පාදිතය, ශ්‍රම බලකාය සහ විරැකියාව, උද්ධමනය, විනිමය අනුපාත සහ උද්ධමන අනුපාතය යන සාර්ව ආර්ථික සංකල්ප පිළිබඳව දැනුවත් වීම.
- ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය ණය පිළිබඳව දැනුවත් වීම.
- විවිධ බදු වර්ග සහ බදු අයකිරීමේ වැදගත්කම මෙන්ම ආර්ථිකයට ඇති බලපෑම විස්තර කිරීම.

රටක ආර්ථික පරිසරය එම රටෙහි ජීවත් වන පුද්ගලයන්ගේ ජීවිත මෙන්ම රටෙහි පවතින ව්‍යාපාර ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපානු ලබයි. ප්‍රසිද්ධ ගත් කතුවරුන් විසින් "ආර්ථික පරිසරය" යන්න නිර්වචනය කර ඇති ආකාර කිහිපයක් පහතින් දැක්වේ.

"ආර්ථික පරිසරය යන්න පාරිභෝගික මිලදී ගැනීමේ බලය සහ වියදම් කිරීමේ රටාවන් කෙරෙහි බලපාන සාධක වලින් සමන්විත වේ. එයට ආදායම් මට්ටම්, උද්ධමනය, විරැකියාව සහ සමස්ත ආර්ථික වර්ධනය ආර්ථික පරිසරයක් තුල ඇතුළත් වන අතර ව්‍යාපාර සහ පාරිභෝගිකයින්ගේ සමෘද්ධිමත් වීමේ හැකියාව හැඩගස්වීමෙහි ලා ආර්ථික පරිසරය ඉවහල් වේ."

(ෆිලිප් කොට්ලර්, අලෙවිකරණ කළමනාකරණය)

"ආර්ථික පරිසරය යනු ආර්ථිකයක් තුළ ගනු ලබන නිෂ්පාදන, පරිභෝජනය සහ ආයෝජන තීරණ වලට බලපාන බාහිර ආර්ථික තත්වයන් සහ ප්‍රතිපත්තීන්ය."

(ආර්ථික විද්‍යාව: පෝල් ඒ. සැමුවෙල්සන්)

"ආර්ථික පරිසරය තුළ කර්මාන්ත සහ ඒවායේ ලාභදායිතාවයට බලපාන වෙළඳපල ව්‍යුහයන්, ආර්ථික ස්ථාවරත්වය සහ තරඟකාරිත්වය වැනි පුළුල් සාර්ව ආර්ථික සාධක ඇතුළත් වේ."

(මයිකල් ඊ. පෝටර්, ජාතීන්ගේ සාපේක්ෂ වාසිය)

ඉහත අර්ථ දැක්වීම් මගින් තහවුරු කරන්නේ ඉහළ ආර්ථික වර්ධනයක්, අඩු උද්ධමනයක් සහ ස්ථාවර මූල්‍ය වෙළඳපොළක් මගින් ශක්තිමත් ආර්ථික පරිසරයක් නිර්මාණය වන බවයි. එමගින්, වඩා හොඳ වැටුප්, ඉහල රැකියා සුරක්ෂිතතාවයක් මෙන්ම ණය සඳහා පහසු ප්‍රවේශයන් ඇති වී, ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කළ හැකි වේ.

රත්නායක පවුල සෑම දිනකම රාත්‍රී භෝජනයෙදී ඔවුනොවුන් හමුවෙනු ලබයි. එක්තරා රාත්‍රී භෝජනයක් අතරතුර ඔවුන් අතර පහත සංවාදය ඇතිවිය.

ඉහත සංවාදය මඟින් රටේ අත්‍යවශ්‍ය සාර්ව ආර්ථික සාධක තේරුම් ගැනීමේ වැදගත්කම අවධාරණය කරයි. මෙම සාධක ශ්‍රී ලංකාවේ ඕනෑම පුද්ගලයෙකුගේ හෝ ඕනෑම පවුලක පැවැත්මට බලපානු ලබයි. ශ්‍රී ලංකාවේ සම්මත සාර්ව ආර්ථික විචල්‍යයන් කිහිපයක් සහ එම විචල්‍යයන් ඔබේ ජීවිතයට බලපාන ආකාරය අපි හඳුනා ගනිමු.

1.2. දළ දේශීය නිෂ්පාදිතය සහ ආර්ථික වර්ධනය

දළ දේශීය නිෂ්පාදිතය යනු කුමක්ද?

නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ ආර්ථිකයක් තුළ නිෂ්පාදනය කරන ලද සියලුම භාණ්ඩ හා සේවාවල මුළු වටිනාකම දළ දේශීය නිෂ්පාදිතය ලෙස හැඳින්වේ. මෙයට ආර්ථිකය තුළ ඇති සියලුම ආර්ථික ක්‍රියාකාරකම් මඟින් එකතු කරන ලද අගය ඇතුලත් වේ. එමෙන්ම විවිධ ආර්ථිකයන්හි ප්‍රමාණයන් සංසන්දනය කිරීම සඳහා ජාත්‍යන්තරව භාවිතා කරන වැදගත් දර්ශකයක් ලෙස දළ දේශීය නිෂ්පාදිතය හඳුන්වා දිය හැකිය.

රටේ ජාතික සංඛ්‍යාලේඛන ආයතනය ලෙස, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ ජාතික නිෂ්පාදනය ගණනය කරනු ලබන අතර එම දෙපාර්තමේන්තුව විසින් කාර්තුමය සහ වාර්ෂික පදනමින් සමස්ථ ජාතික ආදායම පිලිබඳ සංඛ්‍යාලේඛන ප්‍රකාශයට පත් කරනු ලබයි.

ආර්ථික වර්ධනය යනු කුමක්ද?

ආර්ථික වර්ධනය යනු, යම් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ පෙර කාල පරිච්ඡේදයට සාපේක්ෂව දළ දේශීය නිෂ්පාදිතයේ සිදුවී ඇති ප්‍රතිශතමය වෙනසයි.

දළ දේශීය නිෂ්පාදිතයේ වැඩිවීම රටේ සමස්ත නිෂ්පාදනයේ ඉහළ යෑම සමඟ සම්බන්ධ වන අතර එමඟින් කුටුම්භ සහ ව්‍යාපාරික ආයතන විසින් උපයන ආදායමේ ඉහළ යාමක් සහ රජයේ බදු ආදායමේ ඉහල යාමක් ද පෙන්නුම් කරනු ලබයි. එමෙන්ම, රට තුළ රැකියා අවස්ථාවන්හි වැඩි වීමක් සහ දරිද්‍රතාවයේ අඩු වීමක් පෙන්නුම් කරන බැවින් තිරසාර ලෙස වර්ධනය වන ආර්ථිකයක් තුළින් රටක සමෘද්ධිමත්භාවය වැඩිදියුණු කෙරේ.

මූර්ත දළ දේශීය නිෂ්පාදිතය සහ නාමික දළ දේශීය නිෂ්පාදිතය

දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය විශ්ලේෂණය කිරීමේදී, එම වෙනසෙන් කොපමණ ප්‍රමාණයක් නිෂ්පාදනයේ සැබෑ වැඩිවීම නිසා සිදුවී ඇත්ද සහ එය නිෂ්පාදනය කරන ලද භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යාම නිසා සිදුවී ඇත්ද යන්න මැන බැලීම වැදගත් වේ. එබැවින්, දළ දේශීය නිෂ්පාදිතය මැනීම සඳහා ක්‍රම දෙකක් භාවිතා වේ. එනම් මූර්ත දළ දේශීය නිෂ්පාදිතය සහ නාමික දළ දේශීය නිෂ්පාදිතයයි.

නාමික දළ දේශීය නිෂ්පාදිතය යනු කුමක්ද?

නාමික දළ දේශීය නිෂ්පාදිතය මඟින් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ ආර්ථිකයක නිෂ්පාදනයේ මුළු වටිනාකම, එකී කාල පරිච්ඡේදය තුළදී භාණ්ඩ හා සේවාවල පැවති මිල ගණන් අනුව මනිනු ලබයි. නාමික දළ දේශීය නිෂ්පාදිතය ජාතික ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනවල "වත්මන් වෙළඳපල මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය" ලෙස හැඳින්වේ.

මූර්ත දළ දේශීය නිෂ්පාදිතය යනු කුමක්ද?

භාණ්ඩ හා සේවාවන්හි මිල වෙනස්වීම්වල බලපෑම හැර, ආර්ථිකයේ සමස්ථ නිෂ්පාදනයේ වටිනාකම දැන ගැනීමට නම් මිල වෙනස්වීම්වල බලපෑමකින් තොරව නිෂ්පාදනය කරන ලද භාණ්ඩ හා සේවා පරිමාව අනුව නිෂ්පාදනය කොපමණ වැඩි වී ඇත්දැයි දැන ගැනීම අත්‍යවශ්‍ය වේ. මූර්ත දළ දේශීය නිෂ්පාදිතය මඟින් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ ආර්ථිකයක නිෂ්පාදනයේ මුළු වටිනාකම, පදනම් වර්ෂයක් තුළ පැවති මිල ගණන් අනුව මනිනු ලබයි. වර්තමානයේ දී මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරනු ලබන්නේ 2015 දී පැවති මිල ගණන් මත බැවින්, වත්මන් පාදක වර්ෂය 2015 ලෙස ගැනේ. එනම් 2015 වර්ෂයේ දී සහ ඉන් ඉදිරියට මේ දක්වා ප්‍රකාශයට පත් කරන ලද දළ දේශීය නිෂ්පාදිත ගණනය කිරීම් ප්‍රකාශ වී ඇත්තේ වර්ෂ 2015 දී පැවති මිල ගණන් අනුව ය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනවල මූර්ත දළ දේශීය නිෂ්පාදිත ගණනය කිරීම් "නියත (2015) මිල ගණන් ලෙස පෙන්නුම් කෙරේ. (එනම් 2015 සිට මිල ගණන් නියතව පවතින බව උපකල්පනය කර ඇත.)

දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය හෝ ආර්ථික වර්ධනය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී, සාමාන්‍ය පිළිවෙත වන්නේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වෙනස සලකා බැලීමයි. මන්ද, එහි මිල චලනයන්හි බලපෑම බැහැර කර ඇති බැවිනි.

ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය යනු කුමක්ද?

යම් වසරකදී රටක් තුළ ජීවත්වන එක් පුද්ගලයෙකු සාමාන්‍යයෙන් කොපමණ මුදලක් උපයනවාද යන්න මැනීමට භාවිතා කරන පොදු දර්ශකය "ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය" ලෙස හැඳින්වේ. නිශ්චිත වසරක් තුළ වාර්තා කරන ලද නාමික දළ දේශීය නිෂ්පාදිතය, මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් බෙදීමෙන් ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරනු ලබයි.

ඇමරිකානු ඩොලර් වලින් ප්‍රකාශ කළ විට, ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය රටක ධනය මැනීම සඳහා ජාත්‍යන්තරව භාවිතා කරන දර්ශකයකි. අඩු, මධ්‍යම සහ ඉහළ ආදායම් ලබන රටවල්, කලින් තීරණය කරන ලද ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිත සීමාවන් මත පදනම්ව වර්ගීකරණය සිදු කර ඇත.

1.3. ශ්‍රම බලකාය සහ විරැකියාව

ශ්‍රම බලකාය යනු කුමක්ද?

ශ්‍රම බලකාය මඟින් ආර්ථිකය තුළ පවතින සමස්ථ ශ්‍රමය හෝ ශ්‍රම සැපයුම, පිළිබිඹු වේ. ශ්‍රම බලකාය යනු වයස අවුරුදු 15 ට වැඩි සහ යම් කාල පරිච්ඡේදයක් තුළ රැකියාවල නියුතු හෝ රැකියා විරහිත (නමුත් රැකියාවක් සොයන), පුද්ගලයින්ගෙන් සංඛ්‍යාවයි. එමෙන්ම, වයස අවුරුදු 15 සහ ඊට වැඩි, ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ජනගහනය ලෙසද ශ්‍රම බලකාය හඳුන්වයි.

රැකියා විරහිත නමුත් රැකියාවක් සොයා ගැනීමට උනන්දුවක් නොදක්වන අවුරුදු 15 හෝ ඊට වැඩි පුද්ගලයින් ශ්‍රම බලකාය ට අයත් නොවන සහ ආර්ථික වශයෙන් අක්‍රිය ජනගහනය ලෙස සැලකෙන බව දැන සිටීම වැදගත් වේ.



රූපය 1:1 : ශ්‍රම බලකාය

විරැකියා අනුපාතය

විරැකියා අනුපාතය ආර්ථිකයේ ගුණාත්මකභාවය මැනීමේ ප්‍රධාන දර්ශකයක් වන අතර එය ශ්‍රම වෙළඳපොළේ තත්ත්වය පිළිබිඹු කරයි. රැකියා විරහිත සහ රැකියාවක් සොයන පුද්ගලයින් සංඛ්‍යාව ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස ගැනීමෙන් විරැකියා අනුපාතය ගණනය කරනු ලබයි.

1.4 උද්ධමනය

උද්ධමනය යනු කුමක්ද?

උද්ධමනය යනු ආර්ථිකයක සමස්ථ භාණ්ඩ හා සේවාවන්හි මිල ඉහළ යාමයි. උද්ධමනය මැනීම අත්‍යවශ්‍ය වේ. මන්ද, එය ආර්ථිකයක ගුණාත්මකභාවය පිළිබඳ වැදගත් දර්ශකයක් වන අතර රටක ජනතාවගේ මිලදී ගැනීමේ ශක්තිය හරහා ඔවුන්ගේ යහපැවැත්මට සෘජුවම බලපාන බැවිනි. උද්ධමනය මනිනු ලබන්නේ කෙසේද?

කාල පරිච්ඡේද දෙකක දී යම් නිශ්චිත භාණ්ඩ හා සේවා පැසක් සඳහා ගෙවන මිලෙහි ප්‍රතිශත වෙනස ගණනය කිරීමෙන් ආර්ථිකයක උද්ධමනය මනිනු ලබයි.

මෙම භාණ්ඩ හා සේවා පැසෙහි මිල මැනීම සඳහා අපට මිල දර්ශකයක් අවශ්‍ය වේ. උද්ධමනය මැනීම සඳහා භාවිතා කරන වඩාත් පොදු මිල දර්ශකය වන්නේ පාරිභෝගික මිල දර්ශකය (CPI) යි. පාරිභෝගික මිල දර්ශකය මඟින් සාමාන්‍ය ගෘහයක් විසින් යම් කාලයක් සඳහා (සාමාන්‍යයෙන් මාසයක් හෝ කාර්තුවක්) පරිභෝජනය කරන භාණ්ඩ හා සේවා පැසක මුළු මිල මනිනු ලැබේ. මෙම පැසෙහි ඇති අයිතම එක එක කාලයන්හිදී කුටුම්භවල පරිභෝජන රටා අනුව වෙනස් කරනු ලබන අතර භාණ්ඩ හා සේවාවන්ට ඇති ඉල්ලුම හා සැපයුම අනුව මෙම අයිතමවල මිල ද වෙනස් වනු ලැබේ.

ඉතින් අපි උද්ධමනය මනින්නේ කෙසේද? උද්ධමනය යනු කාල පරිච්ඡේද දෙකක් අතර පාරිභෝගික මිල දර්ශකයෙහි ප්‍රතිශත වෙනසයි. උද්ධමනය මැනීම සඳහා අපට ඕනෑම සැසඳිය හැකි කාල පරිච්ඡේද දෙකක් තෝරා ගත හැකිය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS) ශ්‍රී ලංකාවේ නිල උද්ධමන ප්‍රතිශතය ප්‍රකාශයට පත් කරයි. ඒ අනුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සෑම මසකම උද්ධමනය ලෙස පාරිභෝගික මිල දර්ශකයේ වෙනස්වීම් තුන් ආකාරයකට ප්‍රකාශ කරනු ලබයි. මෙම ක්‍රම තුන භාවිතා කරමින් 2024 ජූනි මාසයේ උද්ධමනය මනිනු ලබන ආකාරය පිළිබඳ දැක්වෙන පහත උදාහරණය ගනිමු.

උද්ධමන මිනුම	පළමු කාල පරිච්ඡේදය	දෙවන කාල පරිච්ඡේදය
2024 ජූනි මාසයේ වාර්ෂික (වසරින් වසර) උද්ධමනය	2023 ජූනි	2024 ජූනි
2024 ජූනි මාසයේ මාසික (මාසයෙන් මාසය) උද්ධමනය	2024 මැයි	2024 ජූනි
2024 ජූනි මාසයේ මාස 12 ක චලනය වන සාමාන්‍ය (Moving average) උද්ධමනය	2023 ජූනි මාසයෙන් අවසන් වන වර්ෂය	2024 ජූනි මාසයෙන් අවසන් වන වර්ෂය

වගුව 1:1 : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද උද්ධමනය මැනීමේ ක්‍රමවේද තුන

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පාරිභෝගික මිල දර්ශක දෙකක් ප්‍රකාශයට පත් කරනු ලබයි. කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) මඟින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල සාමාන්‍ය මිල මට්ටම සහ උද්ධමනය මනිනු ලබන අතර ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) මඟින් මුළු රටම ආවරණය කරනු ලබයි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කර ප්‍රකාශයට පත් කරන ලද මෙම කොළඹ පාරිභෝගික මිල දර්ශකය ඇතුළු අනෙකුත් මිල දර්ශක පිළිබඳ වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වෙත පිවිසෙන්න. (http://www.statistics.gov.lk.)

උද්ධමනය හා සම්බන්ධ පාරිභාෂික වචන: බොහෝ විට, අපට අසන්නට ලැබෙන්නේ 'උද්ධමනය' යන වචනය, එනම් පාරිභෝගික මිල දර්ශකයේ වැඩිවීමයි. උද්ධමනය හා සම්බන්ධ තවත් යෙදුම් දෙකක් වන උද්ධමනය අඩුවීම සහ අවධමනය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද යන්න අවබෝධ කර ගැනීම වැදගත් වේ. උද්ධමනය අඩුවීම යනු උද්ධමනයේ පහත වැටීමයි. උද්ධමනය අඩුවන කාලවලදී ද, මිල මට්ටම දිගින් දිගටම වැඩි වේ; නමුත් මිල ගණන් වැඩි වනුයේ පෙර කාලවලට වඩා මන්දගාමී අනුපාතයකිනි. ඒ අනුව, පාරිභෝගික මිල දර්ශකය ද වැඩි වේ. උද්ධමනය දිගටම ධනාත්මක නමුත් පෙර කාල පරිච්ඡේදවලට සාපේක්ෂව අඩු අගයක් ගනු ලබයි. අවධමනය යනු පාරිභෝගික මිල දර්ශකයේ අඩුවීමයි. අවධමන කාලවලදී, භාණ්ඩ හා සේවාවන්හි මිල ගණන් අඩු වන විට උද්ධමනය ඍණ අගයක් ගනු ලබයි.

රූපය 1:2 : උද්ධමනය, උද්ධමනය අඩුවීම සහ අවධමනය පිළිබඳ නිදර්ශනයක්



කාල පරිච්ඡේදය	පළමු වසර												දෙවන වසර			
	ජන	පෙබ	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ	ජන	පෙබ	මාර්තු	අප්‍රේල්
මාසික පාරිභෝගික මිල දර්ශකය	110	112	115	120	126	134	144	152	156	158	155	150	147	145	147	151
මාසික උද්ධමනය		1.8	2.7	4.3	5.0	6.3	7.5	5.6	2.6	1.3	-1.9	-3.2	-2.0	-1.4	1.4	2.7

උද්ධමනය කෙරෙහි බලපාන සාධක: උද්ධමනය කෙරෙහි බලපානු ලබන ප්‍රධාන සාධක තුන වන්නේ ආර්ථිකයක **ඉල්ලුම, සැපයුම සහ විනිමය අනුපාතයයි.**

යම් භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා වන ඉල්ලුම එම භාණ්ඩයේ හෝ සේවාවේ සැපයුම ඉක්මවා වැඩි වුවහොත්, අතිරික්ත ඉල්ලුම හේතුවෙන් එම භාණ්ඩයේ හෝ සේවාවේ මිල ද වැඩි වනු ලබයි. අනෙක් අතට, යම් භාණ්ඩයක හෝ සේවාවක අතිරික්ත සැපයුමක් තිබේ නම් මිල පහත වැටිය හැකිය. තවද, උද්ධමන අපේක්ෂාවන්(අනාගතයේදී මිල කොපමණ වැඩි වේද යන්න පිළිබඳව ජනතාව සහ ව්‍යාපාර අතර ඇති අදහස්) භාණ්ඩ හා සේවා සඳහා ඇති ඉල්ලුමට ද බලපාන අතර මිල ගණන් වලට බලපෑම් කරනු ලබයි. ඊට අමතරව, ගෝලීය වෙළඳපොලේ ඉල්ලුම සහ සැපයුම් තත්ත්වයන් සහ දේශීය මුදල් ඒකකයේ විනිමය අනුපාතය හේතුවෙන් ආනයනික භාණ්ඩවල මිල වැඩි විය හැකිය. සාමාන්‍යයෙන්, විනිමය අනුපාතයේ වෙනසෙහි සිදුවන සම්පූර්ණ බලපෑම දේශීය මිල ගණන්වල සිදුවන වෙනසට සම්පූර්ණ ලෙසම සමාන නොවේ. විනිමය අනුපාතයේ උච්චාවචනයන් හේතුවෙන් ආනයනික භාණ්ඩ හා සේවාවල දේශීය මිල ගණන් වෙනස් වීම දේශීය මිල ගණන් මත විනිමය අනුපාතය වෙනස්වන ආකාරය මත රඳා පවතී.

1.5. විනිමය අනුපාතය

විනිමය අනුපාතය මඟින් මනිනු ලබන්නේ කුමක් ද?

එක් ආර්ථිකයක මුදල් ඒකක කොපමණ ප්‍රමාණයක් තවත් ආර්ථිකයක එක් මුදල් ඒකකයක් සඳහා හුවමාරු කළ හැකිද යන්න විනිමය අනුපාතය මඟින් ප්‍රකාශ කරනු ලබයි. එබැවින්, විනිමය අනුපාතය යනු එක් මුදල් ඒකකයක වටිනාකමට සාපේක්ෂව තවත් මුදල් ඒකකයක

[1] The DCS publishes the Producer Price Index which reflects the changes in prices received by producers of domestically produced agricultural produce, manufacturing goods and utilities.

වටිනාකමයි. සරලව කිවහොත්, එය අනෙක් මුදල් ඒකකයක් භාවිතා කරමින් වියදම් කිරීමේදී එක් මුදල් ඒකකයක් මිලදී ගැනීමට ගෙවන මිලයි. උදාහරණයක් ලෙස, අපට එක් ඇමරිකානු ඩොලර් එකක් මිලදී ගැනීමට රු.300 ක් අවශ්‍ය නම්, විනිමය අනුපාතය ඇමරිකානු ඩොලර් එකකට රු.300 කි (අනෙක් අතට, එය ඇමරිකානු ඩොලර් එකකට රු. 0.267 කි). ජාත්‍යන්තරව, ශ්‍රී ලංකා රුපියල හඳුනා ගැනීම සඳහා LKR යන යෙදුම භාවිතා කෙරේ. මෙම සාකච්ඡාව සරල කිරීම සඳහා අපි ඇමරිකානු ඩොලර් එකකට LKR විනිමය අනුපාතය භාවිතා කරමු.

විනිමය අනුපාතය භාවිතා කරමින්, එක් මුදල් ඒකකයකින් මිල නියම කර ඇති භාණ්ඩයක් හෝ සේවාවක් තවත් මුදල් ඒකකයකින් කොපමණ වටිනවාද යන්න අපට තීරණය කළ හැකිය.

මුදල් ඒකකයක අගය ඉහළ යාම සහ අවප්‍රමාණය වීම: ඇමරිකානු ඩොලර් එකකට රුපියල් වල විනිමය අනුපාතය වැඩි වන විට, රුපියලේ අගය ඇමරිකානු ඩොලර් වලට අනුව පහත වැටේ. මෙම තත්වය රුපියලේ අගය අවප්‍රමාණය ලෙස හැඳින්වේ. අනෙක් අතට, ඇමරිකානු ඩොලර් එකකට රුපියල් වල විනිමය අනුපාතය අඩු වුවහොත්, ඇමරිකානු ඩොලර් වලට අනුව රුපියලේ අගය වැඩි වන අතර එය රුපියලේ අගය ඉහළ යාමකි.

රූපය 1:3 : රුපියලේ අගය ඉහළ යාම සහ අවප්‍රමාණය වීම පැහැදිලි කිරීම.

විනිමය අනුපාතය තීරණය වන්නේ කෙසේද? ශ්‍රී ලංකා රුපියල 'පාවෙන' මුදල් ඒකකයකි. මෙයින් අදහස් කරන්නේ විනිමය අනුපාතය හෝ අනෙකුත් මුදල් වර්ගවලින් රුපියලක මිල තීරණය වන්නේ විදේශ විනිමය වෙළෙඳපොළේ සැපයුම සහ ඉල්ලුම තත්වයන් මත බවයි.

පාවෙන විනිමය අනුපාත ක්‍රමයක් (floating exchange rate regime) තුළ, වෙළඳපොළ මූලික කරුණු මගින් මෙහෙයවනු නොලබන විනිමය අනුපාතයේ සිදුවන හදිසි වෙනස්කම් සීමා කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව (මුදල් අධිකාරිය) විදේශ විනිමය වෙළෙඳපලට මැදිහත් විය හැකිය. මෙම මැදිහත්වීම් වෙළෙඳපොලේ විදේශ මුදල් මිලදී ගැනීම් (ඉල්ලුම වැඩි කිරීමට) හෝ විකිණීම් (සැපයුම වැඩි කිරීමට) සඳහා විය හැකිය. පුළුල් සාර්ව ආර්ථික ස්ථාවරත්වයක් පවත්වාගෙන යාම සඳහා එවැනි ක්‍රියාමාර්ග ගනු ලබයි. අනෙක් අතට, විදේශ මුදල් සංචිත කළමනාකරණ මෙහෙයුම් සඳහා විදේශ විනිමය මිලදී ගැනීම් සහ විකිණීම් හරහා මහ බැංකුව විසින් විදේශ විනිමය වෙළෙඳපොළෙහි සැපයුම් සහ ඉල්ලුම් තත්වයන්ට බලපෑම් ඇති කළ හැකිය. ආර්ථිකමය වශයෙන් දුෂ්කර කාලවලදී භාවිතා කිරීම සඳහා රටේ යහපත් ආර්ථික තත්ත්වයන් පවතින කාල වලදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය සංචිත ගොඩනගා ගනු ලබයි. මෙම අර්ථයෙන් ගත් කල, විදේශ මුදල් සංචිත ගොඩනගා ඇත්තේ විනිමය අනුපාතයේ අනාගත අහිතකර චලනයන්ට මුහුණ දීම සඳහා රක්ෂණයක් ලෙසය.

මහ බැංකුවේ මැදිහත්වීම් වලට අමතරව, විදේශ විනිමය වෙළෙඳපොළේ ඉල්ලුම සහ සැපයුම කෙරෙහි වෙනත් බොහෝ සාධක බලපෑම් කරනු ලබයි.

අපනයන ඉපැයීම්, ආමුඛ ප්‍රේෂණ (inward remittances), සංචාරකයින් විසින් කරනු ලබන වියදම්, ආයෝජන සහ විදේශයන්ගෙන් විදේශ මුදල් ණයට ගැනීම් වැනි ප්‍රභවයන් හරහා විදේශ මුදල් විදේශයන්ගෙන් ගලා එන විට, විදේශ විනිමය වෙළෙඳපොළේ විදේශ මුදල් සැපයුම වැඩි වේ.

භාණ්ඩ හා සේවා ආනයනය කිරීම, විදේශ මුදල් ණය ගැනීම් වලට අදාලව විදේශීය පාර්ශවයන්ට ගෙවීම් කිරීම, ශ්‍රී ලාංකිකයන් විදේශයන්හි වියදම් කිරීම සහ විදේශිකයන් තම රුපියල් ආයෝජන විකිණීම වැනි ක්‍රියාකාරකම් හේතුවෙන් විදේශ විනිමය වෙළෙඳපොළ තුළ විදේශ මුදල් සඳහා ඇති ඉල්ලුම වැඩි වේ.

සාමාන්‍ය වෙළෙඳපොළක මෙන්, විදේශ විනිමය සැපයුම විදේශ විනිමය සඳහා ඇති ඉල්ලුම ඉක්මවා ගිය විට, විදේශ මුදල්වල මිල (ඇමරිකානු ඩොලර් වැනි) සහ ඇමරිකානු ඩොලර් එකකට ගෙවිය යුතු රුපියල් ප්‍රමාණය පහත වැටෙන අතර, රුපියලේ අගය ඉහළ යයි(අධිප්‍රමාණය). අනෙක් අතට විදේශ විනිමය වෙළෙඳපොළ තුළ යම් විදේශ මුදල් වර්ගයකට ඇති ඉල්ලුම එහි සැපයුම ඉක්මවා ගිය විට, එම විදේශ මුදලේ මිල ඉහළ යන අතර ඇමරිකානු ඩොලර් එකකට ගෙවිය යුතු රුපියල් ප්‍රමාණය වැඩි වී රුපියලේ අගය පහළ යයි (අවප්‍රමාණය).

ඉල්ලුමට සහ සැපයුමට බලපාන මෙම සාධක හුදකලාව සිදු නොවන බව දැන ගැනීම වැදගත් වේ. තවද, ශ්‍රී ලංකාව සහ අනෙකුත් රටවල් අතර පොලී අනුපාතවල සිදුවන වෙනස්කම්, ආයෝජකයින්ගේ අවදානම් දැරීමට ඇති කැමැත්ත සහ රජයේ ප්‍රතිපත්ති වැනි තවත් බොහෝ කොන්දේසි මෙම සාධක සඳහා බලපානු ලබයි. එබැවින්, විදේශ විනිමය වෙළෙඳපොළේ ඉල්ලුමට සහ සැපයුමට එකවර බලපෑ හැකි විවිධ සාධක මගින් විනිමය අනුපාතය තීරණය වේ.

1.6. පොලී අනුපාතය

පොලී අනුපාතය යනු කුමක්ද?

පොලී අනුපාතය යනු අප මුදල් සඳහා ගෙවන මිලයි. ඔබ මුදල් ණයට ගන්නේ නම්, පොලී අනුපාතය (හෝ ණය ගැනීමේ අනුපාතය) යනු ඔබ ලබාගත් ණය මුදල සඳහා ගෙවන මිලයි. අනෙක් අතට, ඔබ මුදල් ණයට දෙන්නේ නම්, පොලී අනුපාතය (හෝ ණය දීමේ අනුපාතය) යනු ඔබ ණයට දුන් මුදල සඳහා ඔබට ලැබෙන මිලයි. ඔබ බැංකු තැන්පතුවක මුදල් ඉතිරි කිරීමේදී, යම් කලකට පසු, ඔබේ ඉතුරුම් සඳහා ඉතුරුම් (පොලී) අනුපාතයක් ලැබෙන බැවින්, ඔබ තැම්පත් කළ මුදලට වඩා වැඩි මුදලක් ඔබට ලැබේ. අනෙක් අතට බැංකුව විසින් තැම්පත්කරුවන් ඉතිරි කරන ලද මුදල් ව්‍යාපාරවලට ණයට දෙනු ලබන අතර (මෙහි බැංකුවේ කාර්යභාරය මූල්‍ය අතරමැදිකරණය ලෙස හැඳින්වේ. මූල්‍ය අතරමැදිකරණය පිළිබඳ වැඩි විස්තර මෙම අත්පොතෙහි පසුව සාකච්ඡා කෙරේ.) එහිදී ණයට දීමේ පොලී අනුපාතයක් අය කරනු ලබයි.

පොලී අනුපාත කුටුම්බ සහ ව්‍යාපාර ඇතුළු සමාජයේ සෑම කෙනෙකුටම බලපානු ලබයි. උකස්, මෝටර් රථ ණය, ක්‍රෙඩිට් කාඩ්පත් සහ වෙනත් ණය ගැනීම් සඳහා ගෙවීමෙන් පසු පවුලක් සඳහා කොපමණ මුදලක් වියදම් කිරීමට ඉතිරිව තිබේද යන්නට පොලී අනුපාත සැලකිය යුතු ලෙස බලපානු ලබයි. ඒ අනුව. පොලී අනුපාත කුටුම්භයන්ගේ ඉතුරුම් සහ වියදම් තීරණ වලට ද බලපායි. පොලී අනුපාත ආකර්ෂණීය නම්, අත්‍යවශ්‍ය දේ සඳහා වියදම් කිරීමෙන් පසු කුටුම්භ විසින් වැඩි මුදල් ප්‍රමාණයක් බැංකුවල ඉතිරි කිරීමට පෙළඹේ. පොලී අනුපාත ඉතා අඩු නම්, කුටුම්භ විසින් අනාගතය සඳහා ඉතිරි කිරීමට උත්සාහ කරනවාට වඩා වර්තමානයේ පරිභෝජනය සඳහා වැඩිපුර වියදම් කරනු ලබයි. තවද, විශ්‍රාමිකයන් තම ජීවිත කාලය පුරාම ඉතිරිකිරීම් භාවිත කරනුයේ තම විශ්‍රාම ආදායමට අතිරේක ආදායමක් ලෙස හෝ සම්පූර්ණ විශ්‍රාම ආදායමම ආවරණය කිරීම සඳහා පොලී උපයා ගැනීම සඳහාය.

ව්‍යාපාර කෙරෙහි පොලී අනුපාත බලපානු ලබන්නේ ව්‍යාපාර සඳහා අරමුදල් සපයා ගැනීමේදීය. පොලී අනුපාත අඩු නම්, ව්‍යාපාර සමාගම් ණය අරමුදල් සම්පාදනය කරගනිමින් තම ව්‍යාපාර අවස්ථා පුළුල් කිරීමට හෝ නව ව්‍යාපාර ආරම්භ කිරීමට දිරිමත් වනු ලැබේ. ව්‍යාපාර දියුණු වන විට, නිර්මාණය වන රැකියා අවස්ථා හරහා සේවකයන්ට ආකර්ශනීය වැටුප් ගෙවීමෙන් සහ ආයෝජකයන්ට අපේක්ෂිත ප්‍රතිලාභ ගෙවීමෙන් සමස්ත ආර්ථිකයටම ප්‍රතිලාභ ලබාදෙයි. එමෙන්ම, පොලී අනුපාත ඉතා ඉහළ නම්, ව්‍යාපාරවලට ඔවුන්ගේ මෙහෙයුම් සිදු කිරීමට හෝ පුළුල් කිරීමට අවශ්‍ය අරමුදල් ලබා ගැනීමේදී අධික මිලක් ගෙවීමට සිදුවන අතර, ඒ හේතුවෙන් ආර්ථික කටයුතු මන්දගාමී වීමට පවා ඉඩ ඇත.

මූර්ත පොලී අනුපාතය යනු කුමක්ද?

සාමාන්‍යයෙන් කතාබහට ලක්වන, බැංකු විසින් ප්‍රකාශයට පත්කරනු ලබන පොලී අනුපාත නාමික පොලී අනුපාත ලෙස හැඳින්වේ. මූර්ත පොලී අනුපාතය යනු නාමික පොලී අනුපාතයට ආර්ථිකයේ පවතින උද්ධමනයේ බලපෑම ඇතුළත් කර සකස් කරන ලද පොලී අනුපාතයයි. මෙම ගැළපීම සිදු කරනු ලබන්නේ පවතින උද්ධමන අනුපාතය ප්‍රකාශ කරන ලද නාමික වාර්ෂික පොලී අනුපාතයෙන් අඩු කිරීමෙනි.

මූර්ත පොලී අනුපාතය ධනාත්මක වන විට, මිනිසුන්ට තමන් බැංකුවල ඉතිරි කරන මුදල් වෙනුවෙන් උපයන පොලිය භාවිතා කරමින් අනාගතයේදී දැන් පරිභෝජනය කරනවාට වඩා වැඩියෙන් පරිභෝජන අවස්ථා ලඟා කරගත හැකිය. මූර්ත පොලී අනුපාතය සෘණ අගයක් ගන්නේ නම්, භාණ්ඩ හා සේවාවල මිල වැඩිවීම ඉතුරුම් මත උපයන පොලියට වඩා වැඩි බැවින්, පුද්ගලයින්ගේ අනාගත පරිභෝජනය වර්තමාන පරිභෝජනයට වඩා අඩු වේ. එබැවින්, යම් ආර්ථිකයක ජීවත්වන පුද්ගලයින්ට තම ඉතුරුම් හෝ ආයෝජන පිළිබඳව තීරණය ගැනීමේදී මූර්ත පොලී අනුපාතය පිළිබඳ සලකා බැලීම අත්‍යවශ්‍ය වේ.

පොලී අනුපාත තීරණය කරන්නේ කෙසේද? මහ බැංකුව විසින් ගනු ලබන ආර්ථික ප්‍රතිපත්ති තීරණය කිරීමට ආර්ථිකයේ පොලී අනුපාත ප්‍රධාන මිණුම් දණ්ඩක් ලෙස භාවිත කෙරෙයි. වෙළඳපොළ පොලී අනුපාතවලට බලපෑම් කිරීම සඳහා මහ බැංකුව භාවිතා කරන ප්‍රතිපත්ති මෙවලම් සමූහය මූල්‍ය ප්‍රතිපත්තිය ලෙස හැඳින්වේ. ශ්‍රී ලංකාවේ, ආර්ථිකය සුමටව පවත්වාගෙන යා හැකි වන පරිදි උද්ධමනය පහළ සහ ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම මහ බැංකුවේ ප්‍රධාන අරමුණයි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මහ බැංකුව විවිධ මූල්‍ය ප්‍රතිපත්ති මෙවලම් භාවිතා කරයි. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රතිපත්තියට පමණක් ආර්ථිකයේ පොලී අනුපාතවල උච්චාවචනයන් පාලනය කළ නොහැක. ආර්ථිකය තුල පවතින ආයෝජන අවධානම, උද්ධමනය, මූල්‍ය අංශ ප්‍රතිපත්ති වැනි සාධක බොහොමයක් පොලී අනුපාතවලට බලපෑම් කරනු ලබයි. මූල්‍ය ප්‍රතිපත්තිය යනු ආර්ථිකයක සාර්ව ආර්ථිකය කෙරෙහි බලපාන ප්‍රබල මෙවලමකි.

1.7. ෆිස්කල් ප්‍රතිපත්තිය

ෆිස්කල් ප්‍රතිපත්තිය යනු කුමක්ද?

ෆිස්කල් ප්‍රතිපත්තිය යනු රජය විසින් රටේ පුරවැසියන්ට තම සේවාවන් සපයන අතරම ආර්ථිකය හැඩගැස්වීමට සහ කළමනාකරණය කිරීමට භාවිතා කරන මෙවලමකි. ෆිස්කල් ප්‍රතිපත්තියට රජයේ ආදායම, බදුකරණය, රජයේ වියදම් සහ රජයේ ණය ගැනීම් පිළිබඳ තීරණ ඇතුළත් වන අතර එම ප්‍රතිපත්තිය මඟින් රාජ්‍ය ආදායම සහ රාජ්‍ය වියදම් අතර වෙනස නිසා ඇතිවන අයවැය හිඟය කළමනාකරණය කරනු ලබයි.

රජයේ අයවැය මඟින් රටේ පුරවැසියන්ට සේවා සැපයීම සඳහා රජයේ සැලැස්ම සහ එයට මුදල් සපයාගන්නා ආකාරය පැහැදිලි කරනු ලබයි. සාමාන්‍යයෙන්, වර්ෂයක් සඳහා වන අයවැයක් පෙර වසර අවසන් වීමට පෙර පාර්ලිමේන්තුව විසින් ඉදිරිපත් කර, විවාද කර, අනුමත කරගනු ලැබේ.

ඉදිරි වසර සඳහා රජයේ ක්‍රියාකාරකාරී සැලැස්ම, එම ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය අරමුදල් රජයේ ආදායමෙන් කොපමණ ප්‍රමාණයක් ආවරණය වන්නේ ද සහ කොපමණ මුදලක් ණයට ගත යුතුද යන්න අයවැය මඟින් දක්වනු ලබයි.

රජයේ ආදායම රජයේ මුළු වියදම් ඉක්මවා ගියහොත්, අයවැය අතිරික්තයක්ද රජයේ වියදම් රජයේ ආදායම් ඉක්මවා ගියහොත් අයවැය හිඟයක් ද ඇති වේ. අය වැය හිඟය වෙළඳපොළෙන් (දේශීය හෝ ජාත්‍යන්තර) ණයට ගැනීමෙන් සපුරා ගනු ලැබේ.

රාජ්‍ය ණය

රාජ්‍ය ණය යනු කුමක්ද? රාජ්‍ය ණය යනු රජයක් විසින් යම් කාලයකදී තම දේශීය හා ජාත්‍යන්තර ණය ගැතියන්ට කොපමණ මුදලක් ගෙවිය යුතුද යන්නයි.

බදු සහ බදු නොවන ආදායම් හරහා එකතු කරන ලද රාජ්‍ය ආදායම ඉක්මවා රජයේ වියදම් වැඩි වන විට රජයන් විසින් මහජනතාවට ණය උපකරණ නිකුත් කරනු ලබයි. රජය විසින් භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර හෝ වෙනත් සුරැකුම්පත් නිකුත් කරන අතර, නිශ්චිත කාල වකවානුවක් අවසනයේ මෙම ණය සමඟ පොලියද ආපසු ගෙවීමට පොරොන්දු වනු ලබයි. රජයේ සුරැකුම්පත් හිමියන් (භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර මිලදී ගත් ආයෝජකයින්) රජයට අරමුදල් සපයන අතර, බැඳුම්කර කාල සීමාව අවසානයේ දී නියමිත පොලී සමඟින් මූලික මුදල නැවත ගෙවීම අපේක්ෂා කරනු ලබයි. මෙම රජයේ සුරැකුම්පත් හිමියන් දේශීය සහ ජාත්‍යන්තර පාර්ශව යන දෙකම නියෝජනය කළ හැකිය.

රජය විසින් නිකුත් කරන ලද ණය උපකරණ වලට අමතරව, රජයකට ණයට ගත හැකි විවිධ මූලාශ්‍ර තිබේ. එනම් ජාත්‍යන්තර ආයතන (උදා: ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ බැංකුව) සහ ණය ලබා දීමට කැමති වෙනත් රටවල තනි පුද්ගලයින් (ද්විපාර්ශ්වික ණයහිමියන්) හෝ කණ්ඩායම් (බහුපාර්ශ්වික ණයහිමියන්) උදාහරණ ලෙස දැක්විය හැක.

බදු

බද්දක් යනු කුමක්ද? බද්දක් යනු රජය විසින් පුද්ගලයන් හෝ ආයතන මත අය කරනු ලබන අනිවාර්ය ගෙවීමකි. බදුකරණය රජයේ ප්‍රධාන ආදායම් මාර්ගයයි. සෑම රටකම පාහේ රජයන් විසින් බදු අය කරනු ලැබේ. ප්‍රධාන වශයෙන් රජයේ සේවකයින්ගේ වැටුප්, සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය, සමාජ ආරක්ෂණ ජාල සහ මාර්ග සංවර්ධනය වැනි යටිතල පහසුකම් යනාදී රජයේ වියදම් ආවරණය කිරීම සඳහා බදු ආදායම රැස් කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ අය කරනු ලබන විවිධ බදු

- **පුද්ගල ආදායම් බද්ද:** වැටුප්, වේතන, ප්‍රසාද දීමනා, ආයෝජන ප්‍රතිලාභ (පොලිය, ලාභාංශ) සහ දේපළ වෙළඳාම් වැනි වෙනත් ආදායම් ප්‍රභවයන්ගෙන් පුද්ගලයින් පයන ආදායම මත බද්ද.

- **ආයතනික ආදායම් බද්ද:** ව්‍යාපාර සහ සංස්ථා විසින් උපයන ලාභ මත බද්ද.

- **එකතු කළ අගය මත බද්ද (VAT):** මෙය නිෂ්පාදනයේ සිට පරිභෝජනය දක්වා සෑම අදියරකදීම එකතු කළ අගය මත පදනම්ව භාණ්ඩයක් හෝ සේවාවක් මත අය කරනු ලබන පරිභෝජන බද්දකි. අවසානයේ බදු බර දරන පාරිභෝගිකයා එය රජයට ප්‍රේෂණය කරන ආයතනික මට්ටමින් නොගෙවන බැවින් මෙය වක්‍ර බද්දකි.

- **රඳවා ගැනීමේ බද්ද (Withholding tax):** මෙම වර්ගයේ බද්ද පුද්ගලයන්ගේ ආදායම් ප්‍රභවයෙන් අඩු කරනු ලැබේ. ආදායම (ඉතුරුම් පොලී වැනි) ගෙවන ආයතනය විසින් නියමිත ගෙවීමෙන් කොටසක් රඳවා ගැනීමේ බදු ලෙස රඳවා තබාගෙන එය සෘජුවම රජයට ප්‍රේෂණය කරනු ලැබේ.

ඊට අමතරව, රජය අනෙකුත් විවිධ බදු, තීරුබදු සහ අයකිරීම් වලින් ආදායම උපයා ගනු ලබයි. පුද්ගලයින්ගෙන් සහ ආයතනවලින් බදු එකතු කිරීම ශ්‍රී ලංකා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) විසින් සිදු කරනු ලැබේ. බදු අනුපාත පිළිබඳ විස්තර ශ්‍රී ලංකා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. (https://www.ird.gov.lk/en/publications/SitePages/Tax_Chart_2324.aspx?menuid=1404?menuid=1603)

බදු වල වැදගත්කම

රජයක් ක්‍රියාත්මක වීමට සහ මහජනතාව වෙත සැපයිය යුතු සේවාවන් සැපයීම සඳහා ක්‍රියාත්මක කළ යුතු විවිධ වැඩසටහන් වෙනුවෙන් අවශ්‍යවන මූල්‍ය සම්පත් රජය, බදු මඟින් සපයා ගනු ලබයි.

රජය විසින් රටක ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, නීතිය ක්‍රියාත්මක කිරීම, නියාමනය සහ යටිතල පහසුකම් යන සේවාවන් සපයනු ලබයි. සමාජයේ අවදානමකට ලක්විය හැකි පිරිස් වලට ආරක්ෂිත ජාල වැඩසටහන් හරහා විෂමතා අවම කිරීම සහ සමාජ සමානාත්මතාවය ආරක්ෂා කිරීම සඳහා ධනය නැවත බෙදා හැරීම රජය විසින් සිදු කරනු ලබයි. භාණ්ඩ හා සේවා සඳහා වන ඉල්ලුම් සහ සැපයුම් තත්ත්වයන්, ශ්‍රම බලකාය සහ නිෂ්පාදනය වැනි අංශ වල ආර්ථික අසමතුලිතතාවයන් විසඳීම සඳහා රජය විසින් ඇතැම් විට බදු ප්‍රතිපත්ති භාවිතා කරනු ලබයි. උදාහරණයක් ලෙස, බදු කප්පාදුව මඟින් ගෘහස්ථ වියදම් වර්ධනය වී ආර්ථිකය තුල භාණ්ඩ හා සේවා සඳහා වන ඉල්ලුම වැඩි කිරීමෙන් රටෙහි මුළු නිෂ්පාදනය ඉහළ දැමිය හැක. රජයන් විසින් අවශ්‍ය අවස්ථාවන්හිදී, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහාද, තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම සඳහාද, විවිධ ආපදා සහන සැලසීම සඳහාද ආයෝජනයන් කරනු ලබයි. ඒ අනුව, සාර්ථකව ක්‍රියාත්මක වන, සංවිධානාත්මක සහ සාධාරණ රජයේ සේවාවන් හරහා සමාජයේ එදිනෙදා යහපැවැත්ම සහතික කිරීම සඳහා අරමුදල් සම්පාදනය බදු මඟින් සපුරාලනු ලබයි. බදු ආදායමක් නොමැති වුවහොත් පුරවැසියන්ට තම සේවාවන් සැපයීම සඳහා රජයට ණය ගැනීම හෝ රාජ්‍ය ව්‍යවසායන් වැනි වෙනත් ආදායම් මාර්ග වෙත යොමු වීමට සිදුවනු ඇත. කෙසේ වෙතත්, රාජ්‍ය ව්‍යවසායන්ගෙන් ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවිය හැකි අතර ඒවා මත විශ්වාසය තැබිය නොහැක. අධික ණය ගැනීමද තිරසාර නොවන අතර දිගු කාලීනව රටට සහ ආර්ථිකයට හානිකර තත්ත්වයක් උදා විය හැකිය. එබැවින්, බදු මඟින් යහපත් සක්‍රිය රාජ්‍ය සේවාවක් සඳහා අඛණ්ඩව සපයනු ලබන අතර, රජය විසින් බදු මුදල් විචක්ෂණශීලීව භාවිතා කරන්නේ නම්, වඩා හොඳ සමාජයකට මඟ පෑදෙනු ඇත. හොඳින් ක්‍රියාත්මක වන රාජ්‍ය පද්ධතියකට ආර්ථිකය සහ සමාජය ශක්තිමත් කළ හැකි වන අතර, වසංගත, ගැටුම් සහ ස්වාභාවික විපත් වැනි පීඩාකාරී තත්වයන් යටතේ පවා පුරවැසියන්ට ඇවැසි සහාය, සැනසීම සහ ආරක්ෂාව ලබා දීමට හැකි වනු ඇත.

ඉහත සාකච්ඡා කළ පරිදි, බදු ප්‍රධාන වශයෙන් පුද්ගලයන්ගේ සහ ආයතනවල ආදායම හෝ වියදම් සමඟ සම්බන්ධ වේ. එසේම, යම් ආර්ථිකයක් තුළ ආර්ථික ක්‍රියාකාරකම් වර්ධනය වන විට, සාමාන්‍යයෙන් ආර්ථිකයේ වර්ධන වේගයට හානියක් නොවන පරිදි, රජයන් විසින් වැඩි ආදායමක් බදු මගින් රැස් කිරීමට පෙළඹෙනු ලබයි.

2 වන පරිච්ඡේදය

මූල්‍ය පරිසරය

2.1 හැඳින්වීම

ඉගෙනුම් ප්‍රතිඵල

- මූල්‍ය පරිසරයේ ප්‍රධාන සංරචක නිර්වචනය කිරීම සහ හඳුනා ගැනීම.
- මූල්‍ය වෙළඳපොළවල් සහ මූල්‍ය ආයතනවල ප්‍රධාන කාර්යයන් අවබෝධ කර ගැනීම.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය විස්තර කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පාලනය වන ආයතන හඳුනා ගැනීම සහ අවබෝධ කර ගැනීම.
- ශ්‍රී ලංකාවේ අනෙකුත් මූල්‍ය ආයතන හඳුනා ගැනීම සහ අවබෝධ කර ගැනීම.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) මූල්‍ය හා සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුව, මූල්‍ය සේවා යනු පාරිභෝගිකයින් හෝ ව්‍යාපාර මූල්‍ය භාණ්ඩ අත්පත් කර ගන්නා ආකාරයයි. මූල්‍ය සේවා අංශය ආර්ථිකයේ වඩාත්ම තීරණාත්මක අංශවලින් එකකි. මූල්‍ය ආයතන සහ වෙළඳපොළවල් රටක ආර්ථික පරිසරයේ ප්‍රමුඛ ක්‍රියාකාරීන් වේ. සෑම ක්‍රියාකාරියෙකුටම ඔවුන්ගේ කාර්යභාරය ඉටු කිරීමේදී තමන්ගේම කාර්යයන් ඇත.

රත්නායකගේ පවුලේ අය පහත සංවාදයේ නියැළුණි.





රූපය 2:1 : ශ්‍රී ලංකාවේ මූල්‍ය පරිසරය

ආයෝජකයන්ගේ අපේක්ෂාවන්ට අනුව මූල්‍ය වෙළඳපොළ, මුදල් වෙළඳපොළ සහ ප්‍රාග්ධන වෙළඳපොළ ලෙස බෙදා දැක්විය හැක.

මුදල් වෙළෙඳපොළ

මුදල් වෙළඳපොළ පවතින්නේ කෙටි කාලීන පොලී සහිත වත්කම් සඳහා වන අතර, සාමාන්‍යයෙන් වසරකට අඩු කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත්, වාණිජ පත්‍ර, තැන්පතු සහතික සහ කෙටි කාලීන අන්තර් බැංකු ණය ගැනීම් සහ ණය දීම වැනි දේ මීට ඇතුලත් වේ. මුදල් වෙළඳපොළ ආර්ථිකයේ ද්‍රවශීලතා කළමනාකරණයට සහාය වේ. දේශීය මුදල් වෙළඳපොළෙහි ප්‍රධාන ක්‍රියාකාරී ආයතන ලෙස, රජය, බැංකු, ලැයිස්තුගත සමාගම්, හඳුන්වා දිය හැකි අතර තවද, රක්ෂණ සමාගම් මෙන්ම විශ්‍රාම වැටුප් අරමුදල් සහ සේවක අර්ථසාධක අරමුදල ප්‍රධාන ආයතන ලෙස හඳුන්වා දිය හැක. එසේම, අන්තර් බැංකු විදේශ විනිමය වෙළඳපොළද මුදල් වෙළඳපල සමග සමීපව කටයුතු කරනු ලබයි. අන්තර් බැංකු විදේශ විනිමය වෙළඳපොල යනු බැංකු අතර මුදල් ගණුදෙනු කරන ස්ථානයයි.

ප්‍රාග්ධන වෙළඳපොළ

ප්‍රාග්ධන වෙළඳපොළ යනු භාණ්ඩාගාර බැඳුම්කර, පෞද්ගලික ණය සුරැකුම්පත් (බැඳුම්කර සහ ණයකර) සහ කොටස් (කොටස්) වැනි දිගුකාලීන වත්කම් සඳහා විකුණනු ලබන සහ මිලදී ගනු ලබන වෙළඳපොළයි. ප්‍රාග්ධන වෙළඳපොළේ ප්‍රධාන අරමුණ වන්නේ දිගුකාලීන අරමුදල් රැස් කිරීම සඳහා පහසුකම් සැලසීමයි. ප්‍රාග්ධන වෙළඳපොළේද ක්‍රියාකාරී ප්‍රධාන ආයතන ලෙස, රජය, බැංකු, ලැයිස්තුගත සමාගම් හඳුන්වා දියහැකි අතර තවද, රක්ෂණ සමාගම් මෙන්ම විශ්‍රාම වැටුප් අරමුදල් සහ සේවක අර්ථසාධක අරමුදල ද ප්‍රමුඛතම ආයෝජකයින් ලෙස හඳුන්වා දිය හැක.

මූල්‍ය වෙළඳපල තුළ පවතින ආයෝජන මෙවලම්වල ස්වභාවය අනුව, ණය වෙළඳපළ සහ කොටස් වෙළඳපළ ලෙස ප්‍රධාන කොටස් දෙකකට වෙන් කර දැක්විය හැකිය.

ණය වෙළෙඳපොළ

ණය වෙළඳපොළ ස්ථාවර ආදායම් සුරැකුම්පත් වෙළඳපොළ ලෙසද හැඳින්වේ. එය රජයේ සුරැකුම්පත් වෙළඳපොළ (භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර) සහ සාංගමික ණය සුරැකුම්පත් වෙළඳපොළ (වාණිජ පත්‍ර, පෞද්ගලික බැඳුම්කර සහ ණයකර) යනුවෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැක.

කොටස් වෙළෙඳපොළ

කොටස් වෙළෙඳපොළ ප්‍රාථමික සහ ද්විතීයික වෙළෙඳපොළවල් දෙකෙන්ම සමන්විත වේ. ප්‍රාථමික වෙළෙඳපොළ යනු නව කොටස්, ණය සුරැකුම්පත් නිකුත් කිරීම සිදුවන වෙළෙඳපොළයි. ද්විතීයික වෙළෙඳපොළ යනු ප්‍රාථමික නිකුත් කිරීමකින් අලෙවි වූ කොටස් නැවත වෙළඳාම් කරන වෙළෙඳපොළයි.

සටහන: කොටස් වෙළඳපොළ පිළිබඳ පැහැදිලි කිරීමක් පුද්ගල මූල්‍ය කළමනාකරණය පරිච්ඡේදයේ, ආයෝජන කළමනාකරණය යටතේ විස්තර කර ඇත.

2.3. මූල්‍ය ආයතන

බොහෝ මූල්‍ය ආයතන අරමුදල් ඉල්ලුම්කරුවන් සහ සැපයුම්කරුවන් සඳහා අතරමැදියන් ලෙස ක්‍රියා කරයි. මෙම මූල්‍ය ආයතන, මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන ආයතන සහ මහ බැංකුව විසින් නියාමනය නොකරන ආයතන ලෙස කාණ්ඩ දෙකකින් යුක්ත වේ. පහත දැක්වෙන කොටස මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ ප්‍රධාන මූල්‍ය ආයතන වල කාර්යභාරය විස්තර කරනු ලබයි.

ශ්‍රී ලංකා මහ බැංකුව

ආර්ථිකය තුල මුදල් ප්‍රවාහයට පහසුකම් සපයන ආයතන ජාලය අධීක්ෂණය කරන බැවින් මහ බැංකුවක් රටක මූල්‍ය පද්ධතියේ ප්‍රමුඛතම මූල්‍ය ආයතනයයි. ඊට අමතරව රටක මුදල් සැපයුම සහ පොලී අනුපාත කළමනාකරණය කිරීම සඳහා මහ බැංකුවක් වගකිව යුතුය. මහ බැංකුවක් සාමාන්‍යයෙන් ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන අතර, එයින් අදහස් කරනුයේ එහි කාර්යයන් සඳහා කිසිදු බාහිර පුද්ගලයකුගේ හෝ ආයතනයක සෘජු මැදිහත්වීමකින් තොරව තීරණ ගැනීමට මහ බැංකුවට හැකියාව පැවතීමයි. මහ බැංකුව එලෙස ස්වාධීනත්වය පවත්වා ගනිමින් එහි රාජකාරි ඉටු කිරීම සඳහා වගකිව යුතුය.

රටක ප්‍රමුඛතම මූල්‍ය ආයතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රධාන වගකීම් කිහිපයක් ඉටුකරනු ලබයි. ව්‍යවහාර මුදල් නිකුත් කිරීම සහ එහි මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් හරහා ජාතික මුදල් සැපයුම පාලනය කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකකි.

ආර්ථිකයට වැඩිපුර මුදල් (ද්‍රවශීලතාවය) අවශ්‍ය වූ විට, ශ්‍රී ලංකා මහ බැංකුව පොලී අනුපාත අඩු කිරීම මඟින් ආර්ථිකයේ මුදල් සැපයුම වැඩි කරනු ලබයි. බැංකු ණය සඳහා අය කරන පොලී අනුපාතය සහ තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතය අඩු කිරීම මෙහිදී සිදු වේ. පොලී අනුපාත අඩු වන විට පුද්ගලයින්ට සහ ව්‍යාපාරවලට මුදල් ණයට ගැනීමේ පිරිවැය අඩු වන අතරම ඉතිරි කිරීමේ ප්‍රතිලාභද අඩු වේ. එමඟින් ආර්ථිකය තුල ආයෝජන දිරිමත් වේ; ව්‍යාපාර වැඩි දියුණු වේ; රැකියා අවස්ථා නිර්මාණය වේ; පුද්ගලයින්ගේ ආදායම් ඉපයීම් වැඩි වී, වියදම් කිරීමේ හැකියාව වර්ධනය වේ. එමඟින් රට තුල ආර්ථික ක්‍රියාකාරකම් වර්ධනය වේ. මෙම සන්දර්භය තුළ පොලී අනුපාත තීරණය කිරීමේදී මහ බැංකුව ඉතා වැදගත් වේ. ප්‍රතිපත්ති පොලී අනුපාත සකස් කිරීමෙන් බැංකු ණය සඳහා කොපමණ මුදලක් අය කරනවාද සහ තැන්පතු සඳහා කොපමණ මුදලක් ගෙවනවාද යන්න පිළිබඳව තීරණය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව මැදිහත් වේ. උදාහරණයක් ලෙස, මහ බැංකුව පොලී අනුපාත අඩු කරන විට ණය ගැනීම වඩාත් දැරිය හැකි වන අතර එමඟින් ආර්ථික වර්ධනය ඉහළ නංවයි.

මහ බැංකුවේ තවත් ප්‍රධාන වගකීමක් වන්නේ වාණිජ බැංකු සහ මූල්‍ය ආයතන නියාමනය කිරීමයි. එම ආයතන විසින් මූල්‍ය පාරිභෝගිකයින්ගේ මූල්‍ය ආරක්ෂාව සහ ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා පිළිපැදිය යුතු නීති රීති අනුගමනය කරන්නේද යන්න මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබයි. උදාහරණයක් ලෙස, යම් බැංකුවක් අවදානම් සහිත ණය ලබා දෙන බව දැනගත් විටක, එම අවදානම් අඩු කිරීම සඳහා මහ බැංකුව විසින් නීති රෙගුලාසි පනවනු ලබන අතර, එමඟින් ජනතාවගේ ඉතුරුම් වලට බලපෑම් කළ හැකි බැංකු ක්‍රියාකාරකම් වළක්වනු ලැබේ.

බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ද්‍රවශීලතා අර්බුදයකට මුහුණ දෙන්නේ නම්, තම වගකීම් ඉටු කිරීමට උත්සාහ කරන බැංකුවලට මූල්‍යමය සහාය ලබා දෙමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසාන ණය දෙන්නා ලෙස කටයුතු කරනු ලැබේ. ඒ අනුව, අර්බුදකාරී කාලවලදී මහ බැංකුව මත විශ්වාසය තැබිය හැකි බව ජනතාව දන්නා බැවින්, බැංකු පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය පවත්වා ගැනීමට උපකාරී වේ. සාරාංශයක් ලෙස, මූල්‍ය පද්ධතිය පවත්වාගෙන යෑමේදී මහ බැංකුවේ කාර්යභාරය පහත පරිදි දැක්විය හැකිය.

- මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය ප්‍රවර්ධනය කිරීම සහ පවත්වා ගැනීම
- මූල්‍ය ආයතනවල ආරක්ෂාව සහ ශක්තිමත්භාවය ඉහළ නැංවීම
- අනෙකුත් මූල්‍ය නියාමකයින් සමඟ සහයෝගයෙන් මූල්‍ය පද්ධතියට ඇතිවිය හැකි අවදානම් තත්ත්වයන් අවම කිරීම තුළින් ආර්ථික පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය සහතික කිරීම
- අවසාන ණය දෙන්නා ලෙස කටයුතු කිරීම
- සමස්ත ආර්ථිකයට ඇතිවිය හැකි අහිතකර බලපෑම් අවම කරන ආකාරයේ අසාර්ථක මූල්‍ය ආයතනවල ගැටලු විසඳීම
- මූල්‍ය වෙළඳපොල යටිතල පහසුකම් නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව යනු, මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය සහතික කිරීම සඳහා අඩු සහ ස්ථාවර උද්ධමනයක් සහතික කරමින් සහ මූල්‍ය ආයතන අධීක්ෂණය කරමින් සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරන ස්වාධීන ආයතනයකි. මහ බැංකුව සතු ස්වාධීන තීරණ ගැනීමේ එහි හැකියාව මඟින් වෙනස්වන ආර්ථික තත්ත්වයන්ට ඵලදායී ලෙස ප්‍රතිචාර දක්වා මහජනතාවගේ සුභසිද්ධිය ආරක්ෂා කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන බලයලත් මූල්‍ය ආයතන

ශ්‍රී ලංකා මහ බැංකුව, ආර්ථිකය තුළ මුදල් ප්‍රවාහයට සම්බන්ධ ආයතන ජාලයක් අධීක්ෂණය කරයි. මෙම මූල්‍ය ආයතන ජාලයට බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, ලියාපදිංචි ලීසිං ආයතන, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්, රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික අලෙවිකරුවන්, විදේශ විනිමයෙහි බලයලත් අලෙවිකරුවන්, බලයලත් මුදල් හුවමාරු කරන්නන් සහ බලයලත් මුදල් තැරැව්කරුවන් ඇතුළත් වේ.

මෙම ආයතන අත්‍යවශ්‍ය මූල්‍ය සේවා සපයන අතර ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනයට දායක වේ. සියලුම කොටස්කරුවන් සඳහා ශක්තිමත් මූල්‍ය පරිසරයක් පෝෂණය කරමින්, විනිවිදභාවය, ආරක්ෂාව සහ පාරිභෝගික විශ්වාසය ප්‍රවර්ධනය කරන නියාමන රාමුවක් තුළ බලයලත් මූල්‍ය ආයතන ක්‍රියාත්මක වන බව මහ බැංකුව සහතික කරයි. මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන ප්‍රධාන බලයලත් මූල්‍ය ආයතන පිළිබඳ දැනුම්වත් වෙමු.

ශ්‍රී ලංකාවේ බලයලත් මූල්‍ය ආයතන පිළිබඳ දළ විශ්ලේෂණයක්

මූල්‍ය ලෝකයේ, ද්‍රවශීලතා කළමනාකරණයේදී සහ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය වීමේදී විවිධ ආයතන සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි.

ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු තැන්පතු භාරගෙන පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට ණය ලබා දෙමින් මූල්‍ය පද්ධතියේ මූලික පදනම නිර්මාණය කරයි. මූල්‍ය සමාගම්, ලීසිං ආයතන සහ ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් වැනි බැංකු නොවන මූල්‍ය ආයතන, නිශ්චිත වෙළඳපල අවශ්‍යතා සපුරාලීම සහ සැමට මූල්‍ය සේවා ලබා දීම සඳහා පුද්ගලික ණය සහ කල්බදු පහසුකම් වැනි විශේෂිත සේවාවන් සපයයි.

රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික අලෙවිකරුවන් ඇතුළු ආයෝජන ආයතන, ආර්ථික වර්ධනයට දායක වෙමින්, විවිධ ආයෝජන අවස්ථා වෙත අරමුදල් යොමු කිරීමට උපකාරී වේ. බලයලත් විදේශ විනිමය අලෙවිකරුවන් සහ මුදල් හුවමාරු කරන්නන් ගෝලීය වෙළඳ කටයුතු සඳහා ඉඩ සලසමින් මුදල් හුවමාරුව සහ ජාත්‍යන්තර ගනුදෙනු සඳහා පහසුකම් සපයයි.

මහ බැංකුවේ අධීක්ෂණය මඟින් මෙම ආයතන ඒවායෙහි ස්ථාවරත්වය, විනිවිදභාවය සහ පාරිභෝගික ආරක්ෂාව ප්‍රවර්ධනය කරන රාමුවක් තුළ ක්‍රියාත්මක වන බව සහතික කෙරේ. මෙම මූල්‍ය පරිසර පද්ධතිය කාර්යක්ෂම මුදල් ප්‍රවාහයක් සක්‍රීය කරන අතර ආර්ථිකයේ සංවර්ධනයට සහාය වේ. මූල්‍ය පද්ධතිය ක්‍රියාත්මක වන ආකාරය සහ එදිනෙදා ජීවිතයට බලපාන ආකාරය තේරුම් ගැනීම සඳහා මෙම ආයතනවල භූමිකාවන් අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන ප්‍රධාන බලයලත් මූල්‍ය ආයතන, මූල්‍ය ක්ෂේත්‍රයට ඔවුන්ගේ භූමිකාවන් සහ දායකත්වය හඳුනා ගනිමු.

බලපත්‍රලාභී බැංකු

බලපත්‍රලාභී බැංකු යනු ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ මූලික බල කණුවක් ලෙස ක්‍රියාත්මක වන, අති විශාල ගනුදෙනු සහ සේවා ප්‍රමාණයක් සපයනු ලබන විධිමත් ආයතන වේ. රට පුරාම පුළුල් ශාඛා ජාලයක් ඇති, රාජ්‍ය බැංකු මෙන්ම පෞද්ගලික බැංකු ද මීට ඇතුළත් වේ.

ඊට අමතරව, ජාත්‍යන්තර බැංකු ද ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන අතර, ප්‍රධාන වශයෙන් ව්‍යාපාර සහ විදේශිකයන් සඳහා සේවාවන් සපයයි. මෙම බැංකු මූලික ඉතුරුම් ගිණුම් වල සිට සංකීර්ණ වෙළඳ මූල්‍ය කටයුතු දක්වා විවිධ සේවාවන් සපයන අතර වෙළඳ මූල්‍යකරණය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් විවිධ ව්‍යාපාරික ක්‍රමවේදයන් සමඟ ක්‍රියාත්මක වේ.

බලපත්‍රලාභී මූල්‍ය සමාගම් (LFCs)

බලපත්‍රලාභී මූල්‍ය සමාගම් විශේෂිත මූල්‍ය අතරමැදියන් ලෙස සේවය කරන අතර, බොහෝ විට බැංකු විසින් සම්පූර්ණයෙන් විසඳා ගත නොහැකි නිශ්චිත අවශ්‍යතා සපුරාලයි. බලපත්‍රලාභී මූල්‍ය සමාගම් ස්ථාවර තැන්පතු සඳහා වාණිජ බැංකුවලට වඩා ඉහළ පොලී අනුපාත ලබා දෙන අතර, තමන්ගේ ඉතුරුම් උපරිම කර ගැනීමට බලාපොරොත්තු පුද්ගලයින්ව ආකර්ෂණය කර ගනු ලබයි. ඔවුන් බොහෝ විට වඩාත් නම්‍යශීලී කොන්දේසි සහිත ණය ලබා දෙන අතර, කුඩා පරිමාණ නිෂ්පාදකයෙකුට යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට උපකාරී වේ. බැංකු හා සසඳන විට ඔවුන් ක්‍රියාත්මක වන ආකාරය තේරුම් ගැනීමට පහත උදාහරණ සලකා බලමු.

ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන

ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන යනු ප්‍රධාන වශයෙන් කල්බදු මූල්‍යකරණ සේවා සපයන විශේෂිත මූල්‍ය ආයතන වේ. එම සමාගම් වාහන, යන්ත්‍රෝපකරණ සහ වත්කම් සඳහා කල්බදු මූල්‍යකරණ පහසුකම් සපයන අතර ව්‍යාපාර සහ පුද්ගලයන්ට ඒවා සම්පූර්ණයෙන්ම මිලදී නොගෙන භාවිතා කිරීමට ඉඩ සලසයි. එවැනි සමාගම් වල සේවාවන්ට බොහෝවිට මෙහෙයුම් කල්බදුකරණය ඇතුලත් වේ. එහිදී ආයතනයේ වත්කම් හිමිකාරීත්වය රඳවා ගන්නා අතර බදුකරු එහි භාවිතය සඳහා ගෙවනු ලබයි.

බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් (LMFCs)

බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් යනු, සාම්ප්‍රදායික බැංකු සේවා සඳහා පහසුවෙන් ප්‍රවේශ විය නොහැකි පුද්ගලයින් සහ කුඩා ව්‍යාපාර වෙත පහසුකම් සලසන බිම් මට්ටමේ මූල්‍ය ආයතන වේ. සමහර සංවිධාන ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යවසායකයින්ට කුඩා ණය ලබා දෙන අතර එමඟින් ඔවුන්ගේ ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ පුළුල් කිරීමට උපකාරී වේ. ඒවා සාමාන්‍යයෙන් පුළුල් පරාසයක මූල්‍ය සේවා ලබා නොදෙන බැවින් ඒවා බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වලින් වෙනස් වේ. බලපත්‍රලාභී මූල්‍ය සමාගම් බොහෝ විට නාගරික සහ අර්ධ නාගරික ප්‍රදේශවල ක්‍රියාත්මක වන අතර, පුද්ගලයන්ට සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට සේවය කරයි. ඔවුන්ගේ අරමුදල් පදනමේ සැලකිය යුතු කොටසක් වන මහජනතාවගෙන් තැන්පතු පිළිගැනීමට ඔවුන්ට බලය ඇත. ස්ථාවර තැන්පතු, ඉතිරිකිරීමේ ගිණුම්, කල්බදුකරණ පහසුකම්, කුලී මිලදී ගැනීමේ ගිවිසුම් සහ ව්‍යාපාර ණය ඇතුළු විවිධ මූල්‍ය නිෂ්පාදන ඔවුන් පිරිනමයි.

අනෙක් අතට, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්නේ බොහෝ විට ග්‍රාමීය හෝ ආර්ථික වශයෙන් අවාසි සහගත ප්‍රදේශවල අඩු ආදායම්ලාභී පුද්ගලයින්ට සහ ක්ෂුද්‍ර ව්‍යවසායකයින්ට සේවය කිරීම සඳහා ය. ඔවුන්ගේ ප්‍රධාන ව්‍යාපාරය වන්නේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා සහාය වීම හෝ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා සාමාන්‍යයෙන් ඇපකරයක් නොමැතිව කුඩා ණය ලබා දීමයි. නිදසුනක් වශයෙන්, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් එකක් අනුරාධපුර අසල ගමක කාන්තාවන් පිරිසකට අත්යන්ත්‍ර රෙදි විවීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ පොළොන්නරුවේ කුඩා පරිමාණ ගොවීන්ට ක්ෂුද්‍ර රක්ෂණ නිෂ්පාදන ලබා දීමට කුඩා ණයක් ලබා දිය හැකිය. බලපත්‍රලාභී මූල්‍ය සමාගම් මෙන් නොව, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් මහජනතාවගෙන් තැන්පතු භාර ගැනීමට අවසර නැත. ඔවුන්ගේ අරමුදල් සාමාන්‍යයෙන් ලැබෙන්නේ කොටස් හිමියන්ගේ ප්‍රාග්ධනයෙන්, බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවලින් සහ සමහර විට ජාත්‍යන්තර පරිත්‍යාගශීලීන්ගෙන් හෝ ආයෝජකයින්ගෙන් ය.

බලයලත් ප්‍රාථමික අලෙවිකරුවන්

රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික අලෙවිකරුවන් ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය තුළ අත්‍යවශ්‍ය සහ අද්විතීය කාර්යභාරයක් ඉටු කරයි. මෙම විශේෂිත ආයතන මාර්ග, පාසල් සහ රෝහල් ඉදිකිරීම වැනි වැදගත් ව්‍යාපෘති සඳහා මුදල් රැස් කිරීමට රජයට උපකාර කරයි. භාණ්ඩාගාර බැඳුම්කර සහ බිල්පත් විකිණීමෙන් රජය සඳහා අරමුදල් රැස් කරනු ලබන අතර, කාලයත් සමඟ පොලිය සමඟ ණයට ගත් මුදල් ආපසු ගෙවීමට රජයෙන් පොරොන්දු වේ.

ආයෝජකයින් මෙම බැඳුම්කර සහ බිල්පත් මිලදී ගන්නා විට, ඔවුන් පොලී උපයා ගැනීම සඳහා ආරක්ෂිත ආයෝජනයක් ලෙස රජයට මුදල් ණයට දෙයි. මෙම ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ක්‍රියාකාරකම් වැදගත් වන්නේ ඔවුන් මුදල් ණයට ගැනීමේ පිරිවැයට බලපාන ආර්ථික පොලී අනුපාත සැකසීමට උපකාරී වන බැවිනි. නිදසුනක් වශයෙන්, රජයේ සුරැකුම්පත් සඳහා පොලී අනුපාත ඉහළ ගියහොත්, නිවාස ණය සහ ව්‍යාපාර මූල්‍යකරණය සඳහා පොලී අනුපාත බැංකු විසින් ඉහළ නැංවිය හැකිය. මෙයින් අදහස් කරන්නේ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ කාර්යය එදිනෙදා පුද්ගලයින්ට, ව්‍යාපාරවලට සහ සමස්ත ආර්ථිකයට බලපාන අතර, ඔවුන් ජාතික සංවර්ධනයට සහ මූල්‍ය ස්ථාවරත්වයට අත්‍යවශ්‍ය වන බවයි.

බලයලත් විදේශ විනිමය වෙළෙඳුන්

බලයලත් විදේශ විනිමය අලෙවිකරුවන් ගෝලීය ආර්ථිකය සමඟ කටයුතු කිරීම සඳහා පහසුකම් සපයයි. බලපත්‍රලාභී වාණිජ බැංකු සහ සමහර විශේෂිත බැංකු බලයලත් විදේශ විනිමය අලෙවිකරුවන් වන අතර, ව්‍යාපාරවලට විදේශ ඉපැයීම් දේශීය මුදල් බවට පරිවර්තනය කිරීමටද, සිසුන්ට ජාත්‍යන්තර අධ්‍යාපන ගාස්තු ගෙවීමටද උපකාරී වේ. වැඩි වැඩියෙන් අන්තර් සම්බන්ධිත ගෝලීය ආර්ථිකයක් තුළ ඔවුන්ගේ සේවාවන් අත්‍යවශ්‍ය වේ.

බලයලත් මුදල් හුවමාරු කරන්නන්

ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රය තුළ, විශේෂයෙන් සංචාරක කර්මාන්තයට සහාය වීම සඳහා, බලයලත් මුදල් හුවමාරු කරන්නන් අත්‍යවශ්‍ය වේ. සංචාරක ප්‍රදේශ, හෝටල්, ගුවන්තොටුපළ සහ අනෙකුත් ජාත්‍යන්තර ප්‍රවාහන ස්ථානවල බොහෝ විට පිහිටා ඇති මෙම කුඩා විනිමය කාර්යාංශ, සංචාරකයින් සඳහා මුදල් හුවමාරු සේවා සැපයීම සඳහා විශේෂිත වේ.

සංචාරකයෙකු ඇමරිකානු ඩොලර් හෝ යුරෝ වැනි විදේශ මුදල් සමඟ ශ්‍රී ලංකාවට පැමිණෙන විට, ආහාර, නවාතැන් සහ සිහිවටන මිලදී ගැනීම සඳහා ඔවුන් එම මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ යුතුය. තරඟකාරී මිලදී ගැනීමේ සහ විකිණීමේ අනුපාත ලබා දීමෙන් බලයලත් මුදල් හුවමාරු කරන්නන් මෙම ක්‍රියාවලියට පහසුකම් සපයයි. උදාහරණයක් ලෙස, සංචාරකයෙකු ඩොලර් 100 ක් හුවමාරු කරන්නේ නම්, මුදල් හුවමාරු කරන්නා විසින් ඩොලර් මිලදී ගැනීම සඳහා නිශ්චිත අනුපාතයක් ලබා දෙන අතර පසුව සමාන මුදල රුපියල් වලින් වෙනස් අනුපාතයකට (මිලදී ගැනීමේ අනුපාතයට වඩා වැඩි අනුපාතයක්) විකුණනු ඇත, පාරිභෝගිකයාට සේවාවක් සපයන අතරම ලාභයක්ද උපයනු ලබයි.

මෙම විනිමය අනුපාත, වෙළඳපල තත්වයන් මත පදනම්ව උච්චාවචනය විය හැකි බැවින්, සංචාරකයින් හොඳම අනුපාතය ලබා ගැනීම සඳහා විවිධ මුදල් හුවමාරු කරන්නන්ගෙන් අනුපාත සංසන්දනය කළ යුතු වේ. පුද්ගලයින් තම මුදල් පහසුවෙන් පරිවර්තනය කිරීමට උපකාර කිරීමෙන්, බලයලත් මුදල් හුවමාරු කරන්නන් ඔවුන්ගේ සමස්ත සංචාරක අත්දැකීම වැඩි දියුණු කරමින් සංචාරකයින්ට දේශීය ආර්ථිකය තුළ මුදල් වියදම් කිරීමට වඩාත් පහසු කරයි. මුදල් හුවමාරු කරන්නන් දේශීය ව්‍යාපාරවලට සහාය වන අතර, සංචාරක අංශයේ වර්ධනයට ද දායක වේ.

බලයලත් මුදල් තැරැව්කාර සමාගම්

බලයලත් මුදල් හුවමාරු කරන්නන් හා සසඳන විට, බලයලත් මුදල් තැරැව්කරුවන් නිහඬවම තම සේවාවන් සිදුකරනු ලබන අතර ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළඳපොළවල අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. ඔවුන් විදේශ විනිමය අවදානම් කළමනාකරණය කිරීමේදී බැංකු සහ මූල්‍ය ආයතනවලට සහාය වන අතර අන්තර් බැංකු ණය දීම සඳහා පහසුකම් සපයයි. ඔවුන් මහජනතාව සමඟ සෘජුව අන්තර් ක්‍රියා නොකළද, මුදල් වෙළෙඳපොළේ ද්‍රවශීලතාවය සහතික කිරීම සඳහා ඔවුන්ගේ ක්‍රියාකාරකම් අත්‍යවශ්‍ය වේ. ඔවුන් මූල්‍ය ආයතනවලට මුදල් ගනුදෙනු සඳහා හොඳම අනුපාත සොයා ගැනීමට උපකාර කරමින්, ආර්ථිකයේ සමස්ත විනිමය සහ පොලී අනුපාතවලට බලපෑම් කරයි. මෙම අත්‍යවශ්‍ය සේවාව සැපයීමෙන්, බලයලත් මුදල් තැරැව්කරුවන් ව්‍යාපාර සහ පාරිභෝගිකයින්ට එකසේ බලපාන විවිධ ආර්ථික සාධක කෙරෙහි බලපෑම් කරමින් මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහ කාර්යක්ෂමතාවයට දායක වේ.

අරමුදල් සහ අනෙකුත් මූල්‍ය ආයතන

අරමුදල් සහ අනෙකුත් මූල්‍ය ආයතන ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පාලනය නොවන ආයතන වලින් සමන්විත වේ. ඒ අතරට රක්ෂණ සමාගම්, සකසුරුවම් සහ ණය දෙන සමුපකාර සමිති, ග්‍රාමීය බැංකු, සේවක භාර අරමුදල සහ සේවක අර්ථසාධක අරමුදල සහ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය වැනි ආයතන ඇතුළත් වේ.

රක්ෂණ සමාගම්

අවදානම් කළමනාකරණය කිරීමේදී රක්ෂණ සමාගම් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන අතර, සිදුවිය හැකි හානි වලට එරෙහිව මූල්‍ය ආරක්ෂාව සපයයි. හදිසි අනතුරු, රෝගාබාධ, ස්වාභාවික විපත් සහ මරණය වැනි අනපේක්ෂිත සිදුවීම් වලට එරෙහිව ඔවුන් මූල්‍ය ආරක්ෂාව සපයයි. උදාහරණයක් ගනිමු. නිමල් සහ අමිල යන දෙදෙනෙක් සිටියි. එක් දිනක් නිමල්ගේ බේකරියේ ගින්නක් ඇති වී ඔහුගේ උපකරණ, අමුද්‍රව්‍ය සහ ගොඩනැගිලි වලට සැලකිය යුතු හානියක් සිදුවිය. නිමල්ට රක්ෂණයක් නොමැති බැවින් අලුත්වැඩියා කටයුතු සඳහා සියලුම වියදම් ඔහුට දැරිය යුතුවේ. අවාසනාවකට මෙන් මුළු පිරිවැය ඉතා ඉහළ බැවින් නිමල්ට ඔහුගේ බේකරිය නැවත ආරම්භ කිරීමට යන වියදම දරාගත නොහැකි අතර ව්‍යාපාරය වසා දැමුවහොත් ඔහුගේ ආදායම අහිමි වේ. අමිල ද එවැනි අවාසනාවන්ත සිදුවීමකට මුහුණ දීමට සිදුවිය. එනම් ඔහුගේ බේකරියටද ගින්නෙන් හානි සිදුවිය. කෙසේවෙතත්, අමිලට ගිනි රක්ෂණයක් ඇත. ඔහුගේ රක්ෂණයේ ඔහුගේ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම, උපකරණ ප්‍රතිසංස්කරණය කිරීම සහ ඔහුගේ සැපයුම් තොග නැවත යථා තත්ත්වයට පත්කර ගත හැකි විය. අලුත්වැඩියාවක් සඳහා ඔහුගේ බේකරිය වසා දැමූ විට අහිමි වූ ආදායම ආවරණය කිරීමට ද රක්ෂණය උපකාරී වේ. එහි ප්‍රතිඵලයක් ලෙස සැලකිය යුතු මූල්‍ය පාඩු නොලබා අමිලට මාස කීපයකින් ඔහුගේ බේකරිය නැවත විවෘත කළ හැකිය.

මෙම උදාහරණය මගින්, අමිලගේ රක්ෂණය දැනට මූල්‍ය ව්‍යාපාරය ආරක්ෂා කළ අතර, ඔහුට යථා තත්ත්වයට පත්වී ඔහුගේ ව්‍යාපාරය කරගෙන යෑමට ඉඩ සැලසීය. අනෙක් අතට රක්ෂණයක් නොමැතිව නිමල් බොහෝ මූල්‍ය දුෂ්කරතාවයන්ට මුහුණ දෙන ලදී. අනපේක්ෂිත සිදුවීම් වලින් ආරක්ෂාකාරී මූල්‍ය ස්ථාවරත්වයක් රක්ෂණය මගින් ලබාදෙන බව මෙයින් ඉස්මතු කරයි. සැලකිය යුතු අලාභයක් හෝ යම් යම් දුෂ්කරතාවන් ඇතිකල හැකි අනපේක්ෂිත සිදුවීම් වලින් යම් පුද්ගලයෙක් හෝ ව්‍යාපාරයක් ආරක්ෂා කරන නිසා රක්ෂණය අත්‍යවශ්‍ය වේ. එය පුද්ගලයින්ට, පවුල් වලට සහ ව්‍යාපාර වලට ඔවුන්ගේ වියදමින් ම ගෙවිය යුතු වියදම් ආවරණය කිරීමෙන් අවදානම් කළමනාකරණය කිරීමට උපකාරී වේ. නමුත් උදාහරණයක් ගතහොත්, ඔබගේ මෝටර් රථය වෙනත් රථයක ගැටුනේ යැයි සිතන්න. රක්ෂණයක් නොමැති නම්, ඔබේ මෝටර් රථයට සහ අනෙක් වාහනයට සිදුවන හානිය සඳහා ඔබටම ගෙවීමට සිදුවනු ඇත. එයට විශාල මුදලක් වැය වේ. කෙසේවෙතත්, රථ වාහන රක්ෂණයක් ඇත්නම් අලුත්වැඩියා වියදම් වලින් වැඩි ප්‍රමාණයක් ආවරණය කරගනු ඇති අතර සැලකිය යුතු මූල්‍ය බරකින් ඔබව ගලවා ගනු ඇත.

ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම් සංවර්ධනය කිරීම, අධීක්ෂණය කිරීම සහ නියාමනය කිරීම සඳහා 2000 අංක 43 දරන රක්ෂණ සමාගම් නියාමන පනත මගින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ නියුතු ආයතන නියාමනය කරනු ලබයි.

2023 දෙසැම්බර් 31 වන දින වන විට, රක්ෂණ සමාගම් විසිඅටක් (28) IRCSL සමඟ ලියාපදිංචි වී ඇත. සාමාන්‍ය රක්ෂණ සහ දිගු කාලීන රක්ෂණ යනුවෙන් ප්‍රධාන රක්ෂණ කාණ්ඩ දෙකක් තිබේ. ඒ අනුව, සමාගම් දහහතරක් (14) දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරවල නියැලී සිටින අතර, සමාගම් දොළහක් (12) සාමාන්‍ය රක්ෂණයේ පමණක් නියැලී සිටී. තවත් සමාගම් දෙකක් (02) දිගු කාලීන රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ යන කාණ්ඩ දෙකම යටතේ කටයුතු කරයි. (https://ircsl.gov.lk/insurance-companies/).

සාමාන්‍ය රක්ෂණය මගින් රක්ෂණ හිමියාගේ ජීවිත අවදානම හැර වෙනත් ඕනෑම අවදානමක් ආවරණය කරනු ලබන අතර ජීවිත රක්ෂණය ප්‍රධාන වශයෙන් රක්ෂිත පුද්ගලයාගේ ජීවිත අවදානම ආවරණය කරයි.

දිගුකාලීන රක්ෂණ ගිවිසුම් මගින් ජීවිතය, ආබාධිතභාවය සහ බහු හානි රක්ෂණය, හදිසි අනතුරු සහ අසනීප ආවරණය, ස්ථිර සෞඛ්‍ය ආවරණ සහ විශ්‍රාම සැලසුම් ආවරණය කෙරේ. "දිගුකාලීන ව්‍යාපාර" යන අර්ථ දැක්වීමට අයත් නොවන අනෙකුත් රක්ෂණ, සමුද්‍ර රක්ෂණය, ගුවන් සේවා හෝ ප්‍රවාහන රක්ෂණය, ගිනි රක්ෂණය, මෝටර් රථ රක්ෂණය, සෞඛ්‍ය රක්ෂණය, සේවා යෝජකයින්ගේ වගකීම් රක්ෂණය, විවිධ රක්ෂණය යන උප කාණ්ඩ වලින් සමන්විත වේ. මෙම රක්ෂණ පිළිබඳ සාමාන්‍ය දළ විශ්ලේෂණයක් පහතින් දැක්වේ.

ජීවිත රක්ෂණය: රක්ෂණ ඔප්පු හිමියාගේ මරණින් පසු ප්‍රතිලාභීන්ට මූල්‍ය ආධාර ලබාදෙයි. කාලීන ජීවිත, පූර්ණ ජීවිත සහ විශ්වීය (Universal) ජීවිත රක්ෂණය වර්ග මෙයට අදාල වේ.

සෞඛ්‍ය රක්ෂණය: වෛද්‍ය වියදම්, වෛද්‍ය හමුවීම්, රෝහල්ගත කිරීම්, නියම කරන ලද ඖෂධ සහ අනෙකුත් සෞඛ්‍ය සේවා ආශ්‍රිත වියදම් මෙමගින් ආවරණය වේ.

සමුද්‍ර, ගුවන් සේවා හෝ ප්‍රවාහන රක්ෂණ ඔප්පුව: නැව්, භාණ්ඩ පර්යන්ත සහ ආරම්භයේදී හෝ ගමනාන්තයන් අතර ඕනෑම ප්‍රමාණයක සිදුවන හානි හෝ පාඩු ආවරණය කරයි.

ගිනි රක්ෂණ: නේවාසික, වාණිජ හෝ කාර්මික දේපළ වලට ගින්නක් හේතුවෙන් සිදුවන හානි හා පාඩු ආවරණය කරයි.

මෝටර් රථ රක්ෂණය: අනතුරු, සොරකම් සහ ස්වභාවික විපත් ඇතුළුව වාහන වලට සිදුවිය හැකි හානි සඳහා ආවරණය සපයයි.

සේවා යෝජක වගකීම් රක්ෂණය: මෙමගින් මහජන වගකීම් රක්ෂණය, නිෂ්පාදන වගකීම්, වෘත්තීය වන්දි රක්ෂණය, අධ්‍යක්ෂකවරුන් සහ නිලධාරීන්ගේ වන්දි සහ සේවක වන්දි ඇතුළු වගකීම් පරාසයක් ආවරණය කරයි.

රක්ෂණය ක්‍රියාත්මක වන ආකාරය

රක්ෂණ ඔප්පු හිමියෙකු යනු රක්ෂණ ඔප්පුවක් හිමි පුද්ගලයෙකු වන අතර අහඹු සිදුවීමක් සිදු වූ විට එම රක්ෂණ ඔප්පුවේ සඳහන් අයිතිවාසිකම් ලබාගැනීමට හැකියාව ඇති පුද්ගලයෙකි.

රක්ෂණ හිමියන් තම රක්ෂණ ආවරණය සඳහා රක්ෂණ සමාගමට වාරික (මාසිකව හෝ වාර්ෂිකව) ගෙවනු ලබයි. රක්ෂණකරු රක්ෂණ ඔප්පුව හරහා පුද්ගලයෙකු හෝ ව්‍යාපාරයක් රක්ෂණය කිරීමේ දී, එය රක්ෂණය කරන්නේද යන්න තීරණය කිරීම සඳහා අවදානම තක්සේරු කරයි.

අවදානම වැඩිවන විට වාරිකයද වැඩි වේ. රක්ෂණ ඔප්පු හිමියෙකු රක්ෂණය කරන ලද සිදුවීමකට (අනතුරක්, අසනීපයක්) මුහුණ දෙන විට ඔවුන් තම රක්ෂණ සමාගමෙන් හිමිකම් පානු ලබයි. අනුමත වුවහොත් රක්ෂණකරු රක්ෂණ ඔප්පුවේ ආවරණ සීමාවන් දක්වා රක්ෂණ හිමියාට හෝ තෙවන පාර්ශවයකට වන්දි මුදල ලබා දෙයි.

සකසුරුවම් සහ ණය දෙන සමුපකාර සමිති (TCCS)

සකසුරුවම් සහ සමුපකාර ණය දෙන සමිති යනු ග්‍රාමීය මට්ටමේ සංවිධානයක් වන අතර එය ග්‍රාමීය ඉතුරුම් බලමුලු ගන්වන අතර අවශ්‍ය විටෙක ආයතනික නොවන ණය වෙළඳපොලේ (පෞද්ගලික ණය දෙන්නන්) පවතින පොලී අනුපාතවලට වඩා බෙහෙවින් අඩු පොලී අනුපාතවලට එහි සාමාජිකයින්ට ණය ලබා දෙයි. විවිධ සකසුරුවම් සහ සමුපකාර ණය දෙන සමිති අතර කරනු ලබන පොලී අනුපාත වෙනස් වන අතර, ණය ප්‍රමාණය පිළිබඳ උපරිම සීමාවන් සහ ණය ලබා දෙන කොන්දේසිද වෙනස් වේ.

සකසුරුවම් සහ සමුපකාර ණය දෙන සමිති යනු ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වන අඩු ආදායම්ලාභීන්ගේ ස්වේච්ඡා සංගම් වේ. සකසුරුවම් සහ සමුපකාර ණය දෙන සමිතියක සාමාජිකත්වය සාමාන්‍යයෙන් 40 සිට 60 දක්වා පරාසයක පවතී, නමුත් සමහර සමිති සාමාජිකත්වය 150 ඉක්මවයි. සකසුරුවම් සහ සමුපකාර ණය දෙන සමිතියක අයිතිය එහි සේවාවන් භාවිතා කරන සාමාජිකයින්ට (පාරිභෝගික සමුපකාරයක් හෝ ණය සමිතියක්) හෝ එහි සිටින අයට පමණක් වේ.

ශ්‍රී ලංකාවේ සමුපකාර අංශය අඩ සියවසකට වැඩි කාලයක් ජනගහනයෙන් බහුතරයකගේ දෛනික ජීවිතයට සමීපව සම්බන්ධ වී ඇත. ජාතික මට්ටමේ සමුපකාර පරිපාලනය කරනු ලබන්නේ සමුපකාර සංවර්ධන විෂය පථය අයත් වන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මඟිනි. සමුපකාර සමිති පනත මගින් සමුපකාරවල මෙහෙයුම් නියාමනය කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ ජාතික සමුපකාර සභාව යනු රටේ සමුපකාරවල ඉහළම සංවිධානයයි. ජාතික සමුපකාර සභාව විසින් සමුපකාර සමිති පිළිබඳව අධ්‍යාපනය සහ පුහුණුව, උපදේශනය, ප්‍රකාශනය, සම්බන්ධීකරණය සහ ජාත්‍යන්තර කටයුතු අධීක්ෂණය කරනු ලබයි.

සමුපකාරයක් යනු ව්‍යාපාර කිරීමේ වෙනස් ආකාරයක ක්‍රමයකි. එබැවින්, බොහෝ ලාභ නොලබන සහ ලාභ ලබන සංවිධානවලට සමුපකාර ආකෘතිය භාවිතා කළ හැකිය. සාම්ප්‍රදායික ව්‍යුහයක් සහ සමුපකාර ව්‍යුහයක් අතර වෙනස්කම් ප්‍රමුඛතා අනුපිළිවෙලක් අනුව හඳුනා ගත හැක. පළමුව, සමුපකාරයක් විසින්, එහි සාමාජිකත්වයේ අවශ්‍යතා එලදායී, ස්වයංපෝෂිත සහ සමාජීය වශයෙන් වගකිවයුතු ආකාරයකින් සපුරාලනු ලබයි. දෙවනුව, සමුපකාර සමිති ගොඩනැගී ඇත්තේ තමන්ටම සහ එකිනෙකාට උදව් කර ගැනීම, වගකීම භාර ගැනීම, සාධාරණ වීම සහ එකට වැඩ කිරීම වැනි වටිනාකම් මත ය. තෙවනුව, සමුපකාර සමිතිවල සාමාජිකයින් අවංක, විවෘත, සමාජීය වශයෙන් වගකිව යුතු සහ අන් අය කෙරෙහි සැලකිලිමත් වීම විශ්වාස කරයි. මෙම වටිනාකම් සමුපකාර සමිති ක්‍රියාත්මක වන ආකාරය සහ තීරණ ගන්නා ආකාරය අවබෝධ කරගැනීමට උදව් වේ.

ග්‍රාමීය බැංකු

ග්‍රාමීය ඉතුරුම් බලමුලු ගැන්වීම සහ ග්‍රාමීය අංශයට ණය ලබා දීම සඳහා මහජන බැංකුව විසින් 1964 දී ග්‍රාමීය බැංකු යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී. මෙම යෝජනා ක්‍රමයේ අරමුණ වූයේ ග්‍රාමීය මට්ටමේ ප්‍රාථමික සමුපකාර සමිතිවලට ඔවුන්ගේ බැංකු කටයුතු කාර්යක්ෂම මාර්ග ඔස්සේ සංවර්ධනය කිරීම දිරිමත් කිරීම සහ ඒවායේ කළමනාකරණ සහ මෙහෙයුම් ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා සංයුක්ත යෝජනා ඇතුළත් කිරීමට සහාය වීමයි. ආයතනික ව්‍යුහයට අනුව, මහජන බැංකුව සාමාජිකයින්ට නැවත ණය දීම, උපකරණ මිලදී ගැනීම සඳහා මූල්‍යකරණය ආදිය සඳහා අත්තිකාරම් හරහා මෙම සමිතිවලට සහාය වේ. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ සහයෝග යෙන්, මහජන බැංකුව මෙම සමිතිවලට ඔවුන්ගේ අදාළ ප්‍රදේශවල සංවර්ධන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට සහාය වේ.

ග්‍රාමීය බැංකු විසින් ඉල්ලුම් තැන්පතු භාරගැනීම හෝ චෙක්පත් පහසුකම් සපයනු නොලබන බැවින් ඒවා වාණිජ බැංකු ලෙස නොසලකන අතර ඒවායේ ක්‍රියාකාරකම් සීමිත වේ. කෙසේ වෙතත්, පසුගිය දශක තුන තුළ, ග්‍රාමීය බැංකු සංඛ්‍යාවෙන් වර්ධනය වූ අතර, ග්‍රාමීය ජනගහනයෙන් විශාල කොටසකට අත්‍යවශ්‍ය බැංකු සේවා සපයයි. 1970 දී රජය විසින් ආරම්භ කරන ලද බහුකාර්ය සමුපකාර ග්‍රාමීය බැංකු යෝජනා ක්‍රමය ජාතික වශයෙන් පුළුල් කිරීම සඳහා අවශ්‍ය රාමුව සපයන ලදී. අනෙක් අතට මීට පෙර කාලවලදී සීමිත සමුපකාර සංඛ්‍යාවක් ග්‍රාමීය බැංකු ලෙස ක්‍රියාත්මක වීමට සුදුසුකම් ලබන ලදී. ඉතුරුම් සහ ස්ථාවර තැන්පතු ගිණුම් හරහා ඉතුරුම් බලමුලු ගැන්වීමට අමතරව, මෙම ග්‍රාමීය බැංකු විසින් ග්‍රාමීය අංශයට

ණය පහසුකම් සපයයි. විශේෂයෙන් නිෂ්පාදනය, නිවාස, විදුලිය, ණය නිදහස් කිරීම, පරිභෝජනය සහ හදිසි අවස්ථා වැනි අවශ්‍යතා සහ වුවමනා ඉටු කරගැනීමේදී මුදල් කළමනාකරණය කර ගැනීමට ග්‍රාමීය ජනතාවට උදව් වේ.

ග්‍රාමීය බැංකු පුද්ගලික සහ ආයතනික ගනුදෙනුකරුවන්ට බැංකු සහ මූල්‍ය සේවා රාශියක් සපයයි. ඒ අනුව ග්‍රාමීය බැංකු විසින් ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරකම් වන වාණිජ, සිල්ලර සහ තොග වෙළඳාම් සඳහා අවශ්‍ය බැංකු සේවා සපයනු ලැබේ. සමාජීය වශයෙන් වගකිවයුතු, ලාභදායී ආකාරයකින් ශ්‍රී ලංකාව තුළ රට පුරා ස්ථාපිත ජාලයක් හරහා සමුපකාර ව්‍යාපාරයට සහ අනෙකුත් තෝරාගත් පාරිභෝගිකයින්ට, කණ්ඩායම්වලට උසස් මූල්‍ය සේවා සැපයීමට ග්‍රාමීය බැංකු බැඳී සිටී.

සේවක භාරකාර අරමුදල සහ සේවක අර්ථසාධක අරමුදල් අරමුදල

සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාර අරමුදල (ETF) යනු ශ්‍රී ලංකාවේ අනිවාර්ය සමාජ ආරක්ෂණ වැඩසටහන් වන අතර විශ්‍රාම ගැනීමෙන් පසු සේවකයින්ගේ මූල්‍යමය යහපැවැත්ම සුරක්ෂිත කිරීම සඳහා ඒවා ඉතා වැදගත් වේ.

සේවක අර්ථසාධක අරමුදල (EPF)

සේවක අර්ථසාධක අරමුදල 1958 දී පිහිටුවන ලද අතර එය බොහෝ පෞද්ගලික සහ සමහර රජයේ සේවකයින්ට අදාළ වේ. අරමුදලට සේවකයෙකුගේ දායකත්වය මාසික වැටුපෙන් 8% ක් වන අතර සේවායෝජකයාගේ දායකත්වය මාසික වැටුපෙන් 12% ක් වන අතර එමඟින් සේවායෝජකයා සහ සේවකයාගෙන් 20% ක් එකතු වේ. ශ්‍රී ලංකා මහ බැංකුව සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය කරයි.

සේවක අර්ථසාධක අරමුදල යනු විශ්‍රාම යන වයසේදී මූල්‍ය ශක්තියක් පමණක් නොව, මුළු ජීවිත කාලය පුරාම විශිෂ්ට සහකරුවෙකු ද වේ. සාමාජිකයින්ට නිවාස ණය සඳහා ඇපකර පහසුකමක් සහ විශ්‍රාම යාමට පෙර ප්‍රතිලාභ ලෙස නිවාස හා වෛද්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා සියයට 30 ක (30%) අර්ධ මුදල් ආපසු ගැනීමක් ලබා ගත හැකිය. මේ අනුව, සේවක අර්ථසාධක අරමුදල, සේවකයින්ට විශ්‍රාම යාමට පෙර 'නිවසක්' පිළිබඳ ඔවුන්ගේ සිහිනය සැබෑ කර ගැනීමට ඇපයක් ලෙස මෙන්ම සෞඛ්‍ය ගැටළු විසඳා ගැනීමටද උපකාරී වේ.

ඔබේ ප්‍රතිලාභ සඳහා මුදල් ආපසු ලබා ගත හැක්කේ කුමන අවස්ථාවන්හිදීද?

- ඔබ විශ්‍රාම යන වයසට පැමිණ රැකියාවෙන් ඉවත් වන විට
- විවාහය හේතුවෙන් රැකියාවෙන් ඉවත් වන විට
- සම්පූර්ණ ආබාධිතභාවය හේතුවෙන් රැකියාවෙන් ඉවත් වන විට
- ස්ථිර පදිංචිය සඳහා විදේශ රටකට යාමේදී රැකියාවෙන් ඉවත් වන විට
- රජයේ හෝ පළාත් පාලන සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක නියැලී සිටින විට
- රජයේ ආයතන සංස්ථා බවට පත් වූ විට, සංස්ථා වසා දැමූ විට සහ අතිරික්ත කාර්ය මණ්ඩලය අඩු කළ විට, ජනසතු කළ විට සහ සමාගම් බවට පරිවර්තනය වීමෙන් පසු ඉල්ලා අස් වූ විට ප්‍රතිලාභ ආපසු ලබා ගත හැකිය.

වැඩි විස්තර සඳහා, මෙම වෙබ් අඩවියට පිවිසෙන්න: https://epf.lk/

සේවක භාරකාර අරමුදල (ETF)

1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනතේ විධිවිධාන යටතේ සේවක භාරකාර අරමුදල 1981 දී පිහිටුවන ලදී. සේවක භාර අරමුදල් මණ්ඩලය විසින් අරමුදල පරිපාලනය කරයි. වර්තමානයේ, සේවක භාරකාර අරමුදල් මණ්ඩලය මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. රජයේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට හිමිකම් නොලබන සියලුම රාජ්‍ය අංශයේ සේවකයින් සහ සියලුම පෞද්ගලික අංශයේ සේවකයින් මෙම අරමුදලේ සාමාජිකයින් වේ. ඒ සමඟම, ඔවුන්ගේ සේවායෝජකයින් තම සේවකයින්ගේ දළ ඉපැයීම්වලින් 3% ක් මාසිකව අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. එබැවින්, සේවක අර්ථසාධක අරමුදල මෙන් නොව, සේවකයා/සාමාජිකයා වෙනුවෙන් සේවායෝජකයා පමණක් දායක වේ. එබැවින්, එය සාමාජිකයාට දායක නොවන ප්‍රතිලාභයකි. ස්වයං රැකියාලාභීන් සහ සංක්‍රමණික සේවකයින්ට ස්වාධීනව අරමුදලට දායක වී සාමාජිකත්වය ලබා ගත හැකිය.

වැඩි විස්තර සඳහා, මෙම වෙබ් අඩවියට පිවිසෙන්න https://etfb.lk/

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SSB)

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය 1996 අංක 17 දරන පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපිත කරන ලද අතර පසුව 1999 අංක 33 දරන පනත මගින් සංශෝධනය කරන ලදී. 2006 සැප්තැම්බර් 25 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1464/5 අංකය දරන අති විශේෂ ගැසට් නිවේදනයක් මගින් විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය වන්නේ රජයේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් නොමැති අයට විශ්‍රාම වැටුප් අරමුදලක් හරහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීමයි.

සංගමයේ ඕනෑම සාමාජිකයෙකුට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි නිලධාරීන් හෝ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය වගකීම පවරා ඇති වෙනත් ඕනෑම නිලධාරියෙකුගෙන් සාමාජිකත්වය ලබා ගත හැකිය.

වැඩි විස්තර සඳහා, ඔවුන්ගේ වෙබ් අඩවියට පිවිසෙන්න: https://ssb.gov.lk/

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB)

1995 අංක 8 සහ 2008 අංක 42 දරන පනත් මගින් සංශෝධනය කරන ලද 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශ පනත මගින් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) පිහිටුවන ලදී.

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය යනු ස්වාධීන ව්‍යවස්ථාපිත ආයතනයක් වේ. එය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සමඟ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයක් ඇති අතර එහි කොටස් වලින් බහුතරයක් හිමි වන්නේ මහ බැංකුවේ මුදල් මණ්ඩලයටය. වේ. ඉතිරි කොටස් කාර්යාංශයේ අනෙකුත් කොටස් හිමියන් අතර බෙදා හරිනු ලැබේ.

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ ප්‍රධාන ව්‍යවස්ථාපිත අරමුණ වන්නේ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශ පනත මගින් නියම කර ඇති පරිදි ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ කොටස් හිමියන්ගේ සාමාජික ණය දෙන ආයතන (කොටස් හිමියන්ගේ සාමාජිකයින්) සහ මහජනතාව කෙරෙහි නීත්‍යානුකූලව පවරා ඇති වගකීම් තහවුරු කිරීමයි. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ ප්‍රධාන කාර්යයන් වන්නේ,

- අදාළ පාර්ශවයන්ගෙන් ණය සහ මූල්‍ය තොරතුරු රැස් කිරීම, එකතු කිරීම සහ සංස්ලේෂණය කිරීම.
- අවසර ලත් අරමුණු සඳහා ඉල්ලීමක් මත පදනම්ව අදාළ පාර්ශවයන්ට ණය සහ මූල්‍ය තොරතුරු සැපයීම.
- ණය ශ්‍රේණිගත කිරීම්වල කාර්යය භාර ගැනීම සහ එවැනි ශ්‍රේණිගත කිරීම් විදේශීය සහ දේශීය ආයතනවලට ලබාදීම.
- කාර්යාංශයේ ණය සහ ණය ප්‍රදානය කරන ආයතනවල ඉල්ලීම පරිදි පුද්ගලයින් සඳහා ණය ලකුණු ලබා දීම.
- කාර්යාංශයේ කොටස් හිමියන්ට ණය දෙන ආයතන සහ සහභාගී වන ණය ප්‍රදානය කරන ආයතන සඳහා පර්යේෂණ සහ පුහුණු ව්‍යාපෘති භාර ගැනීම.
- චංචල දේවල ආරක්ෂක පොලී ලියාපදිංචි කිරීම සඳහා සුරක්ෂිත ගනුදෙනු සඳහා ගොනු කිරීමේ කාර්යාලයක් ක්‍රියාත්මක කිරීම.

ණය ලකුණ

ණය ලකුණ යනු යම් ණය ගනුදෙනු කරුවෙකු විසින් මීට පෙර ලබාගත් ණය සහ එම ණය සඳහා ආපසු ගෙවීම් සිදුකළ ආකාරය මත පදනම්ව ඔහුගේ හෝ ඇයගේ ණය අවධානම පුරෝකථනය කිරීම සඳහා ගණනය කරන ලද සංඛ්‍යාත්මක අගයකි. ණය ලකුණ මගින් පුද්ගලයෙකු හා බැඳී පවතින ණය අවධානම හෙවත් ණය නොගෙවා පැහැර හැරීමට ඇති සම්භාවිතාව පෙන්නුම් කරනු ලබයි.

ණය ලකුණ භාවිතයෙන් ඔබහට ඔබගේ ණය අවධානම සහ මූල්‍ය විනය පිළිබඳ වඩාත් හොඳ අවබෝධයක් ඉක්මණින් හා පහසුවෙන් ලබාගත හැකි වේ. එය අලුතින් ණය පහසුකමක් ලබා ගැනීම සඳහා ප්‍රවේශ වීමේදී පහසුවකි. ණය අවධානම නිසිලෙස කළමණාකරනය කර ගැනීම මගින් යහපත් ණය ශක්‍යතාවයක් උපදවාගත හැකි වේ.

"CRIB Score" හෙවත් "CRIB ණය ලකුණ" යනු ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය විසින් ප්‍රථම වරට අප රටට හඳුන්වාදුන් ණය ලකුණයි. ණය ලකුණ සංඛ්‍යාත්මකව අංක 250 සිට 900 දක්වා වූ පරාසයක විහිදෙන අතර ඔබගේ ණය තොරතුරු වාර්තාවෙහි අඩංගු ණය තොරතුරු මත පමණක් පදනම්ව ගණනය කරනු ලබයි. CRIB ණය ලකුණ, පුද්ගල සහ ආයතනික ලෙස දෙයාකාර වේ.

ඔබගේ ණය ලකුණ වාර්තාව නිකුත් කෙරෙනුයේ ඔබගේ ණය තොරතුරු වාර්තාව (MyReport) සමඟ පමණි. ඔබගේ ණය තොරතුරු වාර්තාව සතියේ කාර්යාල දිනවල පෙ.ව. 9 සිට ප.ව. 3.30 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය වෙත පෞද්ගලිකව පැමිණ ලබාගත හැකි වේ. එමෙන්ම ඔබ ගනුදෙනු කරනු ලබන බැංකු ශාඛාවක් හරහා ඉල්ලුම් පතක් කාර්යාංශය වෙත යොමු කිරීමෙන් ලියාපදිංචි තැපෑලෙන් නිවසට ගෙන්වාගත හැකියි.

මීට අමතරව කාර්යාංශයේ වෙබ් අඩවිය **www.crib.lk** වෙත පිවිස මාර්ගගත (online) ලෙසද ඉල්ලු කර ලබාගත හැකියි. කොන්දේසී අදාල වේ. වැඩිදුර විස්තර සඳහා දුරකතන අංක **0112131313** ඔස්සේ කාර්යාංශය හා සම්බන්ධ විය හැකියි.

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ මෙවලම් සහ සේවාවන් පිළිබඳ දළ විශ්ලේෂණය

සාමාන්‍ය ජනතාව සඳහා ලබාදෙන සේවාවන්

මෙවලම්/සේවාවන්	විස්තරය	අරමුණ
ස්වයං විමසීම් ණය වාර්තාව සේවාවන් මාර්ගගත/මාර්ගගත නොවන	ණය ගැනීමට ඇති හැකියාව පිළිබඳ සමස්ත තක්සේරුවක් ලබා ගැනීම සඳහා ණය ලකුණු ඇතුළුව පුද්ගලයින් සහ ව්‍යාපාර සඳහා ණය ඉතිහාසය පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක්	පුද්ගලයින්ට මෙන්ම ආයතන වලට තමන්ගේම ණය පිළිබඳ තොරතුරු ලබා ගැනීමට පහසුකම් සලසයි.

ණය ලබාදෙන ආයතන සඳහා ලබාදෙන සේවාවන්

මෙවලම්/සේවාවන්	විස්තරය	අරමුණ
සාමාන්‍ය ණය වාර්තාව	පුද්ගලයින්ට සහ ව්‍යාපාරවලට ණය ගැනීමට ඇති හැකියාව දක්වමින් ණය ඉතිහාසය පිළිබඳ පුළුල් වාර්තාවක්.	ණය දෙන්නන් සඳහා දැනුවත් ණය තීරණ, අවදානම් තක්සේරුව සහ තොරතුරු අසමමිතිය අවම කිරීම.

මෙවලම්/සේවාවන්	විස්තරය	අරමුණ
ණය ලකුණු	පුද්ගලයෙකුගේ හෝ ව්‍යාපාරයක ණය පැහැර හැරීමේ සම්භාවිතාව සහ ණය තත්ත්වය මැන බැලීම සඳහා කැපී පෙනෙන ණය දත්ත ලක්ෂ්‍ය මත පදනම් වූ සංඛ්‍යානමය ආකෘතියකින් ලබාගත් සංඛ්‍යාත්මක නිරූපණය.	පුරෝකථන ණය අවදානම් තක්සේරුව සහ ණය ඇතුළත් කිරීම ප්‍රවර්ධනය කිරීම.

මෙවලම්/සේවාවන්	විස්තරය	අරමුණ
කළඹ කළමනාකරණය	වැඩි වශයෙන් දත්ත/ණය ලබා ගැනීම සඳහා මෙවලම් සහ දැනට සිටින ණය ගැනුම්කරුවන් සමාලෝචනය කිරීම	අවදානම් කළමනාකරණය, කාර්ය සාධන ප්‍රශස්තිකරණය සහ ඉදිරි ණය නොගෙවීම් කල්තියා හඳුනා ගැනීම.

මෙවලම්/සේවාවන්	විස්තරය	අරමුණ
Business Analytics	Data-driven credit risk insights, scenario analysis, and performance forecasting. Risk, delinquency & market statistics management tool.	Mitigation of systemic credit risk and enhancement of credit decision frameworks for the progress of an economy.

මෙවලම්/සේවාවන්	විස්තරය	අරමුණ
ව්‍යාපාර විශ්ලේෂණ	දත්ත මත පදනම් වූ ණය අවදානම් විශ්ලේෂණය, අවස්ථා විශ්ලේෂණය සහ කාර්ය සාධන පුරෝකථනය. අවදානම්, වැරදි සහ වෙළඳපල සංඛ්‍යාලේඛන කළමනාකරණ මෙවලමකි.	ආර්ථිකයක ප්‍රගතිය සඳහා පද්ධතිමය ණය අවදානම අවම කිරීම සහ ණය තීරණ රාමු වැඩි දියුණු කිරීම

මෙවලම්/සේවාවන්	විස්තරය	අරමුණ
නිරීක්ෂණ සහ ඇගයීම් සේවාවන්	දැනට කාර්යාංශය හා සම්බන්ධ වී සිටින ණයගැතියන්ගේ හැසිරීම් නිරීක්ෂණය කිරීම සහ අනතුරු ඇඟවීම් ලබා ගැනීම.	අවදානම් කළමනාකරණය, කාර්ය සාධනය ප්‍රශස්ථකරණය සහ වියහැකි පැහැරහැරීම් කල්තියා හඳුනා ගැනීම.

මෙම මෙවලම් සහ සේවාවන් ලබාදීම මඟින්, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය ණය දෙන්නන්ට, ණය ගැණුම්කරුවන්ට සහ සමස්ත ආර්ථිකයටම ප්‍රතිලාභ ලබා දෙන සමබර, විනිවිද පෙනෙන සහ කාර්යක්ෂම ණය පද්ධතියක් ක්‍රියාත්මක කරයි.

වැඩි විස්තර සඳහා, මෙම වෙබ් අඩවියට පිවිසෙන්න: https://www.crib.lk/

3 වන පරිච්ඡේදය

පුද්ගල මූල්‍ය කළමනාකරණය

3.1 හැඳින්වීම

ඉගෙනුම් අරමුණු

- පුද්ගල මූල්‍ය කළමනාකරණයේ ඇති වැදගත්කම නිර්වචනය කිරීම සහ අවබෝධ කර ගැනීම
- පුද්ගල මූල්‍යකරණයේ ප්‍රධාන සංරචක හඳුනා ගැනීම
- පුද්ගල මූල්‍ය ඉලක්ක සපුරාගැනීම සඳහා අවශ්‍ය ප්‍රධාන පියවර විස්තර කිරීම

පුද්ගල මූල්‍ය යනු

දැනුවත් මූල්‍ය තීරණ ගැනීමට සහ අවසානයේ පුද්ගල මූල්‍ය යහපැවැත්ම සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍යය වන මූල්‍ය දැනුම්වත්භාවය, මූල්‍ය දැනුම, කුසලතා, ආකල්ප සහ චර්යාවන් යන කරුණු සියල්ලෙහි සංයෝජනයයි. (ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානය, 2020)

පුද්ගල මූල්‍ය කළමනාකරණය මඟින් ආර්ථික ස්වාධීනත්වය සහ සුරක්ෂිතභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා ඔබේ මුදල් සහ අනෙකුත් මූල්‍ය වත්කම් ඵලදායී ලෙස කළමනාකරණය කරනු ලබයි. පුද්ගල මූල්‍ය කළමනාකරණය තුල අයවැයකරණය, ඉතිරි කිරීම, ආයෝජනය කිරීම සහ වියදම් පාලනය කිරීම යන අංග ඇතුළත් වන අතර එමගින් පුද්ගලයන්ට තමා සතු වත්කම් සමගින් කෙටි කාලීන සහ දිගු කාලීන පුද්ගලික ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍යවන සැලසුම් සකස් කර ගැනීමට මග පෙන්වනු ලබයි.

එක්තරා සැන්දෑවක, රත්නායක පවුලේ සාමාජිකයන් අතර පහත සංවාදය සිදු විය.

ඉහත සඳහන් වන්නේ ඕනෑම සාමාන්‍ය පවුලක සිදුවිය හැකි සංවාදයකි. ප්‍රධාන වශයෙන් සීමිත මූල්‍ය සම්පත් සහිත මෙන්ම තමන්ගේ මූල්‍ය කටයුතු ඵලදායී ලෙස කළමනාකරණය කර නොගන්නා ඕනෑම පවුලකට හෝ ඕනෑම පුද්ගලයෙකුට විවිධ මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු වේ.

කෙසේ වෙතත්, ඔබ මූල්‍ය සාක්ෂරතාවයෙන් යුතු පුද්ගලයෙක් නම්, කලින් සැලසුම් නොකරන ලද හදිසි වියදම් වුවද වැඩි දුෂ්කරතාවයකින් තොරව විසඳා ගත හැකිය. පවුලක් හෝ තනි පුද්ගලයෙකු විසින් මුහුණ දෙනු ලබන පොදු මූල්‍ය ගැටළු හඳුනා ගනිමු.

- **ස්ථාවර ආදායමක් නොමැතිකම**
- **වියදම් පියවා ගැනීමට ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවීම**
- **ඉතිරිකිරීම් නොමැතිකම**
- **හදිසි වියදම් කළමනාකරණය කර ගැනීමේ අපහසුතාවය**
- **මූල්‍ය අස්ථාවරත්වය හේතුවෙන් ඇතිවන මානසික අවපීඩන තත්වය**
- **පුද්ගලික ඉලක්ක හෝ අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීමට නොහැකි වීම**

මූල්‍ය සාක්ෂරතාවය සහ ධනාත්මක මූල්‍ය හැසිරීම් වැඩිදියුණු කර ගැනීමෙන්, ඕනෑම පුද්ගලයෙකුට මූල්‍යමය වශයෙන් ස්වාධීනත්වය ලඟා කර ගැනීම සඳහා කටයුතු කළ හැකි වේ.

මූල්‍යමය වශයෙන් ස්වාධීන පුද්ගලයෙකු වීමට අනුගමනය කලයුතු පියවර

මූල්‍යමය වශයෙන් ස්වාධීන වීමට ඔබට පහත දැක්වෙන සරළ පියවර තුන අනුගමනය කළ හැකිය.

පියවර 1: ඔබගේ වර්තමාන මූල්‍ය තත්ත්වය හඳුනා ගන්න.

මෙහිදී, පහත දැක්වෙන කරුණු ඔබ විසින් දැනගත යුතුය.

- **ඔබගේ සම්පූර්ණ වර්තමාන ආදායම** – වැටුප්, වේතන හෝ ව්‍යාපාර ලාභ
- **ඔබගේ සම්පූර්ණ වියදම් ප්‍රමාණය** – සියලුම වියදම් වර්ග
- **පවතින සම්පූර්ණ ඉතුරුම් ප්‍රමාණය** – ස්ථාවර තැන්පතු, බැංකු ගිණුම් ශේෂයන් හෝ ඕනෑම මුදල් සංචිත
- **ඔබ සතු වත්කම්වල මුළු වටිනාකම** – ඉඩම්, නිවස, වාහන, ගෘහ භාණ්ඩ ඇතුළු වෙනත් සියලුම වත්කම්
- **ඔබට පියවීමට ඇති මුළු ණය ප්‍රමාණය** – බැංකු ණය, හිඟ ගෙවල් කුලී හෝ අනෙකුත් ගෙවීම් හෝ වෙනත් වගකීම්

පියවර 2: අනාගතයේදී ඔබ විසින් සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වන මූල්‍ය ඉලක්ක හඳුනා ගන්න.

ඔබගේ සිහින, අපේක්ෂාවන් සහ මූල්‍ය ඉලක්ක ලැයිස්තුගත කරන්න.

- ඉදිරි වසර තුන තුළ සපුරා ගත යුතු මූල්‍ය ඉලක්ක
- සපුරා ගැනීමට වසර තුනකට වඩා ගතවන මූල්‍ය ඉලක්ක

පියවර 3: එම මූල්‍ය ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක කලයුතු සැලැස්මක් සකස් කරන්න.

මෙහිදී ඔබ කළ යුත්තේ,

- ඔබගේ වත්මන් මූල්‍ය තත්ත්වය සහ අපේක්ෂිත අනාගත ඉලක්ක අතර පවතින මූල්‍ය පරතරය හඳුනා ගැනීම (පියවර 1 සහ 2 හි දැක්වෙන පරිදි)
- ඔබගේ මූල්‍ය තත්වය වැඩිදියුණු කර ගනිමින් මෙම පරතරය පියවා ගැනීමට අවශ්‍ය උපාය මාර්ග ගොඩනැගීම.

මෙම සරල පියවර තුන මඟින් ඔබගේ මූල්‍ය කළමනාකරණය කළ යුතු ආකාරය පිළිබඳව පැහැදිලිව විස්තර කෙරේ.

පුද්ගල මූල්‍ය කළමනාකරණයේ සංරචක

තනි පුද්ගලයෙකුට හෝ පවුලකට එලදායී මූල්‍ය කළමනාකරණයක් සඳහා සලකා බැලිය යුතු ප්‍රධාන සංරචක හයක් වේ. පහත රූපසටහනේ දැක්වෙන මෙම සංරචක පුද්ගල මූල්‍ය කළමනාකරණයේදී එක ලෙස වැදගත් වේ.

'Rich Dad' 'Poor Dad' කෘතියේ කතුවරයා වන රොබට් කියොසාකි පවසන්නේ පුද්ගලයෙකු කොපමණ මුදලක් උපයනවාද යන්නට වඩා වැදගත්වන්නේ, පුද්ගලයකු කොපමණ මුදලක් රඳවා තබා ගන්නේද, එම රඳවාගත් මුදල් පුද්ගලයා වෙනුවෙන් කොතරම් ප්‍රයෝජනවත් වන්නේද සහ පුද්ගලයා එම මුදල් කොපමණ පරම්පරා ගණනක් දක්වා රඳවා ගන්නේද යන කරුණුය. එසේ පුද්ගලයකුගේ මුදල් රඳවා ගැනීමේ හැකියාව තීරණය කරන්නේ එම පුද්ගලයා තම පෞද්ගලික ජීවන ඉලක්ක කෙතරම් හොඳින් සපුරාගෙන ඇතිද යන කරුණ මත බවයි.

මෙම ප්‍රකාශය පුද්ගලයෙකුගේ ධනය ඉපයීමේදී සහ ආරක්ෂා කිරීමේදී පුද්ගල මූල්‍යකරණයේ වැදගත්කම ඉස්මතු කර පෙන්වයි.

3.2 ආදායම් කළමනාකරණය

ඉගෙනුම් අරමුණු

- ආදායම් කළමනාකරණය තේරුම් ගැනීම සහ විවිධ සමාජ කණ්ඩායම් සඳහා පවතින ආදායම් ප්‍රභවයන් තේරුම් ගැනීම
- නිෂ්ක්‍රීය ආදායම සහ එහි වැදගත්කම පිළිබඳව දැන ගැනීම.

ආදායම යනු, භාණ්ඩයක් හෝ සේවාවක් සැපයීම වෙනුවෙන් හෝ ප්‍රාග්ධනය ආයෝජනය කිරීම වෙනුවෙන් පුද්ගලයෙකුට ලැබෙන මුදල්මය වටිනාකමයි.

පුද්ගලයෙකුගේ ආදායමේ ප්‍රමාණය තම වියදම් පියවා ගැනීමට, ඉතිරි කිරීමට, ආයෝජනය කිරීමට සහ ණය කළමනාකරණය කිරීමට ඇති හැකියාව තීරණය කරන බැවින්, ආදායම් කළමනාකරණය මූල්‍ය කළමනාකරණයේ මූලික පදනම වේ. කෙනෙකුගේ ආදායමේ ස්වභාවය අවබෝධ කර ගැනීම සහ එය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම මූල්‍ය ස්ථාවරත්වය සහ අනාගත මූල්‍ය ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉතා වැදගත් වේ.

රත්නායක පවුලේ දරුවන් අතර පහත දැක්වෙන සංවාදය සිදුවිය.

මෙම සංවාදයෙන් ඉස්මතු කරනු ලබන්නේ, සෑම පුද්ගලයකුම වයස හෝ ස්ත්‍රී පුරුෂ භාවය නොතකා යම් ආකාරයක ආදායමක් අපේක්ෂා කරන බවයි.

ඔබේ ආදායමේ ස්වභාවය තේරුම් ගැනීම ශක්තිමත් මූල්‍ය සැලැස්මක් ගොඩනැගීමේ පළමු පියවර වේ. එය ඔබට පවත්වාගෙන යා හැකි ජීවන රටාවේ ස්වභාවය තීරණය කිරීමට උපකාරී වේ.

කෙසේ වෙතත්, ඔබේ වර්තමාන ආදායම ඔබේ වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් නොවිය හැකිය. මෙම පරතරය පියවා ගැනීම සඳහා, පුද්ගලයන්ට ඔවුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගයට අමතරව විකල්ප ආදායම් උත්පාදනය කරගත හැකි ආකාර සලකා බැලිය හැකිය.

මූලික පුද්ගල අදායම් ප්‍රභව

උපයාගත් ආදායම	ශ්‍රමය හෝ සේවා සැපයීම වෙනුවෙන් ලැබෙන මුදල් උපයාගත් අදායම ලෙස හැඳින්වේ. වැටුප්, වේතන, ප්‍රසාද දීමනා, පාරිතෝෂික සහ කොමිස් මුදල් යන ඉපයීම් උපයාගත් ආදායමට ඇතුලත් වේ. උපයාගත් ආදායම බහුතරයක් පුද්ගලයන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය වේ.
ව්‍යාපාර ලාභ	ව්‍යාපාර හිමියන්ට තම ව්‍යාපාරයෙන් ලැබෙන ලාභය ඔවුන්ගේ ආදායම් මාර්ගය ලෙස සැලකේ
ආයෝජන ආදායම	සමාගම් කොටස්වල ආයෝජනය කිරීමෙන් ලැබෙන ලාභාංශ, බැඳුම්කර හෝ ඉතුරුම් ගිණුම් වලින් උපයන පොලී අදායම සහ දේපල කුලියට හෝ බද්දට දීමෙන් ලැබෙන කුලී/බදු ආදායම මෙයට ඇතුළත් වේ.
රජයෙන් ලැබෙන ප්‍රතිලාභ	ඇතැම් පුද්ගලයින්ට රජයෙන් ලැබෙන සමාජ ආරක්ෂණය, අඩු ආදායම්ලාභී ප්‍රතිලාභ, ආබාධිත ගෙවීම් හෝ විශ්‍රාම වැටුප් වැනි විවිධ ගෙවීම් ඔවුන්ගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීමට උපකාරී වේ.
විවිධ ආදායම්	තෑගි ලොතරැයි දිනුම් හෝ පවුල් උරුමයෙන් ලැබෙන වත්කම් වැනි එක් වරකදී පමණක් ලැබෙන මූල්‍යමය ආදායම් වැනි දෑ මෙයින් අදහස් වේ.

නිෂ්ක්‍රීය ආදායමක වැදගත්කම

පුද්ගල ආදායම සාමාන්‍යයෙන් වර්ග දෙකකට වර්ග කළ හැකිය. එනම්, ක්‍රියාකාරී ආදායම සහ නිෂ්ක්‍රීය ආදායම ලෙසයි. ක්‍රියාකාරී ආදායම යනු ඔබ පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන පදනම මත ක්‍රියාකාරීව නිරතවීම තුළින් උපයන මුදල් ආදායමයි. නිෂ්ක්‍රීය ආදායම යනු එසේ ශ්‍රමය සපයීමකින් තොරව හෝ ඉතාම සුළු මහන්සියකින් ලබා ගන්නා මුදල් ආදායමයි. මෙම නිෂ්ක්‍රීය ආදායම් ප්‍රභවයන් ඔබ සතුව දැනටමත් පැවතිය හැක.

බුද්ධිමය දේපළවලින් ලැබෙන ඉපැයීම්, අනුබද්ධ අලෙවිකරණයෙන් හෝ දේපළකින් ලැබෙන කුලී ආදායම නිෂ්ක්‍රීය ආදායමට ඇතුළත් වේ. මෙම මූලාශ්‍ර වලට ආදායමක් උත්පාදනය කිරීම සඳහා ඉතා සුළු හෝ ක්‍රියාකාරී කාර්යයන් අවශ්‍ය නොවේ.

ඔබේ නිෂ්ක්‍රීය ආදායම ඔබේ වියදම් ඉක්මවා ගිය විට ඔබ මූල්‍යමය වශයෙන් නිදහස් වේ.

අමතර ආදායම් උපයා ගත හැකි විවිධ මාර්ග සඳහා උදාහරණ

රැකියා නියුක්ත පුද්ගලයින්	රැකියා විරහිත පුද්ගලයින්	ළමුන්
• **කෙනෙකුගේ කුසලතා සහ විශේෂඥතාව මත පදනම් වූ** නිදහස් සේවා සැපයීම් සහ මාර්ගගත රැකියා. • **කුඩා ව්‍යාපාර හිමිකාරීත්වයට** සිල්ලර වෙළඳාම, සේවා සැපයීම, මාර්ගගත ව්‍යාපාර ආදිය ඇතුලත් වේ. • **කෘෂිකර්මාන්තය සහ පශු සම්පත්:** කාබනික වගාව, නව තාක්ෂණික ක්‍රම භාවිත කරනු ලබන කෘෂි හා පශු සම්පත් නිෂ්පාදනය. • **සංචාරක කර්මාන්තයට** නවාතැන් සැපයීම, හෝටල් සහ අවන්හල්වල වැඩ කිරීම සහ නිදහස් මාර්ගෝපදේශකයින්/ පරිවර්තකයින්/ රියදුරන් ඇතුලත් වේ. • **කුලී රථ සේවා සහ බෙදාහැරීමේ සේවා** • **අන්තර්ගත නිර්මාණය සහ සමාජ මාධ්‍ය බලපෑම්.**	• **අර්ධකාලීන රැකියා** • **ස්වයං රැකියා පදනම් වී ඇත්තේ** යම් පුද්ගලයෙකුගේ කුසලතා සහ විශේෂඥතාව මතය. • **ක්ෂුද්‍ර ව්‍යාපාර** • **යම් පුද්ගලයෙකුගේ කුසලතා සහ විශේෂඥතාව මත පදනම් වූ** නිදහස් සේවය සහ මාර්ගගත කාර්යයන්. • **කෘෂිකර්මාන්තය සහ පශු සම්පත් නිෂ්පාදනය:** සාම්ප්‍රදායික, නවීන, කාබනික සහ පශු සම්පත් ගොවිතැන • **අන්තර්ගත නිර්මාණය සහ සමාජ මාධ්‍ය බලපෑම.**	• එදිනෙදා වියදමට දෙමපියන් විසින් ලබාදෙන මුදල් • මුදල් තෑගි • මුදල් කැට • විවිධ අවස්ථාවන්හිදී දෙමාපියන් හෝ මිතුරන් විසින් ලැබූ තෑගී වවුචර • ඉතිරි මුදල් • පැරණි සෙල්ලම් බඩු විකිණීමෙන් ලැබෙන මුදල්

ඉහත සඳහන් කළ ආදායම් උත්පාදන මාර්ග ඔබේ ආදායම වැඩි දියුණු කර ගන්නේ කෙසේද යන්න පිළිබඳ උදාහරණ කිහිපයක් පමණි. ඔබේ කුසලතා, අත්දැකීම්, විශේෂඥතාව, සුදුසුකම්, නිර්මාණාත්මක අදහස් සහ ධනාත්මක ආකල්ප මත පදනම්ව අමතර ආදායමක් උපයා ගැනීමට ඔබට වෙනත් ක්‍රම සොයාගත හැකිය.

ආදායම් උත්පාදනය සඳහා අවශ්‍යවන කුසලතා සහ සම්පත්

ආදායම් මූලාශ්‍ර	අවශ්‍යතා
පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ රැකියා	• අධ්‍යාපන සුදුසුකම් • වෘත්තීය සුදුසුකම් • වෘත්තීය පුහුණුව • රැකියා පළපුරුද්ද • කුසලතා සහ විශේෂඥතාවන් • නිසි වයස් අවශ්‍යතා • නීතිමය සුදුසුකම්
ව්‍යවසායකයින්	• ප්‍රාග්ධනය සඳහා ඇති ප්‍රවේශය • ව්‍යාපාරික අභිප්‍රාය • නවෝත්පාදනය • නීතිමය අවශ්‍යතා • භෞතික යටිතල පහසුකම් • මානව සම්පත් • අනෙකුත් කුසලතා
ආයෝජන	• ප්‍රාග්ධනය • මූල්‍ය සාක්ෂරතාවය • අවදානම කෙරෙහි ආකල්පය • අනෙකුත් කුසලතා
නිදහස් සේවා සැපයීම	• නිශ්චිත කුසලතා සහ විශේෂඥතාවයන් • සුදුසුකම් • පළපුරුද්ද • අනුවර්තනය වීමේ හැකියාව • පවරන ලද කාර්යය නියමිත දිනට/වේලාවට සපුරාලීමේ හැකියාව
කෘෂිකර්මාන්තය සහ පශු සම්පත් නිෂ්පාදනය	• ඉඩම් සහ ගොඩනැගිලි • දැනුම • මෙවලම් සහ උපකරණ • යන්ත්‍රෝපකරණ • මූල්‍ය පහසුකම්

ඔබේ ආදායම වැඩි දියුණු කර ගැනීමට උපදෙස් 7ක්

1. ඔබගේ විෂය ක්ෂේත්‍රයේ විශේෂඥයෙකු වන්න

ඔබේ විශේෂඥතාවන් හඳුනාගෙන අඛණ්ඩ ඉගෙනීම තුළින් ඔබේ කුසලතා සහ දැනුම අඛණ්ඩව වැඩිදියුණු කර ගන්න. රැකියා වෙළඳපල තුල ඉල්ලුමක් ඇති අනෙකුත් කුසලතා සඳහා කාලය, ශ්‍රමය සහ මුදල් ආයෝජනය කරන අතරතුර ඔබේ අන්තර් පුද්ගල කුසලතා වැඩි දියුණු කරගන්න. ඔබේ ක්ෂේත්‍රය තුළ කීර්තිමත් නාමයක් හිමි පුද්ගලයෙක් බවට පත්වීමට උත්සාහ කරන්න.

2. ඔබේ වැටුප පිළිබඳව සාකච්ඡා කරන්න

පළමුව, ඔබ රැකියාවෙහි නියැලෙන ක්ෂේත්‍රයේ අදාළ රැකියාව සඳහා ගෙවන සාමාන්‍ය වැටුප පිළිබඳව සොයා බලන්න. ඔබ රැකියාවේ නියැලෙන ආයතනය තුල විශිෂ්ට ලෙස කටයුතු කර ඉහළ කාර්ය සාධනයක් අත්පත් කර ගන්න. ඉන්පසු, වැටුප් වැඩිවීමක් සාධාරණීකරණය කිරීම සඳහා සුදුසු වේලාවේදී (කාර්ය සාධන සමාලෝචනයකදී) ඔබේ කැපවීම හා දායකත්වය පෙන්වා දී වැටුප් වැඩි වීමක් සඳහා ඉල්ලුම් කරන්න.

3. ඔබගේ මූලික ආදායම් ඉපයීමේ මාර්ගයෙන් ඔබ්බට ගොස් වෙනත් ආදායම් ඉපයිය හැකි අවස්ථා ගවේෂණය කරන්න.

නිවාඩු දිනවලදී නියැලිය හැකි අර්ධකාලීන රැකියා, නිදහස් සේවා සැපයීම් වැනි විවිධ අවස්ථා සොයා බලන්න. මූලික අදායම් මාර්ගයට අමතරව විකල්ප ආදායම් මාර්ග නිර්මාණය කරගන්න.

4. නිෂ්ක්‍රීය ආදායම් මාර්ගයක් සකස් කර ගැනීම පිළිබඳව කටයුතු කරන්න.

ශ්‍රම දායකත්වයකින් තොරව හෝ ඉතාම අඩු මහන්සියකින් ඉපයිය හැකි ආදායම් මාර්ග ඔබගේ ජීවිතය පහසු කරනු ලබයි. ඔබගේ සියලු වියදම් පියවා ගත හැකි වන නිෂ්ක්‍රීය අදායමක් ඔබ සතු නම්, ඔබ මූල්‍යමය වශයෙන් ස්වාධීන පුද්ගලයෙකු බව මතක තබා ගන්න.

5. ඔබ තුළ ව්‍යවසායකත්ව මනෝභාවයක් දියුණු කර ගන්න

මෙතෙක් වෙළඳපොලේ සපුරා නොමැති අවශ්‍යතා හඳුනා ගනිමින් නව ව්‍යාපාරික අවස්ථා හඹා යන්න. ඒ සමඟම වැරදීම් සහ අභියෝග වලින් පසුබට නොවී දිරිමත්ව අනාගතයට මුහුණ දෙන්න.

6. කාලය ඵලදායී ලෙස කළමනාකරණය කරගන්න

රැකියාව සහ පෞද්ගලික ජීවිතය අතර සමතුලිතතාවයක් පවත්වා ගනිමින් ආදායම් උත්පාදනයට දායක වන ඉහළ වටිනාකමක් ඇති ක්‍රියාකාරකම්වලට ප්‍රමුඛත්වය දෙන්න. සැමවිටම ඵලදායීව ආදායම් ඉපයීම සඳහා උත්සාහ කරන්න.

7. වෘත්තීය උපදෙස් අනුගමනය කරන්න.

ඔබේ වෘත්තීය ජීවිතය පුරාවට නිසි මග පෙන්වීම ලබා ගැනීම සඳහා ඔබේ උපදේශකයින් සහ වෘත්තීය පුහුණුකරුවන් සමඟ සම්බන්ධව සිටීමට අමතක නොකරන්න. ඔබේ කුසලතා නිතිපතා සමාලෝචනය කර අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය තුළින් යාවත්කාලීන වන්න.

3.3 වියදම් කළමනාකරණය

ඉගෙනුම් අරමුණු

- පුද්ගල වියදම් කළමනාකරණය කරන්නේ කෙසේද යන්න දැන ගැනීම
- අවශ්‍යතා සහ වුවමනා අතර වෙනස හඳුනා ගැනීම
- වියදම් කළමනාකරණය කිරීමේ උපදෙස් ලබා ගැනීම

වියදම් යනු පුද්ගලයෙකු හෝ පවුලක් විවිධ අවශ්‍යතා සහ වුවමනා සපුරා ගැනීම සඳහා සිදු කරනු ලබන මුදල් වැය කිරීම් ය.

වියදම් කළමනාකරණය මූල්‍ය සැලසුම්කරණයේ ප්‍රධාන අංගයක් වන්නේ, එය ඉතුරුම්, ආයෝජන සහ කාර්යක්ෂම ආදායම් භාවිතයකට මඟ පාදන අනෙකුත් මූල්‍ය ඉලක්ක සඳහා ප්‍රමාණවත් මුදල් වෙන් කිරීමට උපකාරී වන බැවිනි. දුර්වල වියදම් කළමනාකරණයක් ඇති පුද්ගලයෙකු මූල්‍යමය වශයෙන් දුර්වල පුද්ගලයෙකු බවට පත් වනු ඇත.

එක් කාර්යබහුල උදෑසනක, රත්නායක පවුලේ නිවසේ දී පහත සංවාදය සිදු විය.

රත්නායක පවුලේ සාමාජිකයින්ට එදින ඉටු කර ගැනීමට බොහෝ අවශ්‍යතා ඇති බව පෙනේ. අනුෂාට බොහෝ වියදම් දැරීමට සිදුවන බව පෙනෙන අතර ඇය මුදල් වියදම් කිරීමේදී ඉතා පරිස්සම්කාරී විය යුතුය. එදින කිරීමට ඇති වියදම් ලැයිස්තුවක් සකස් කළහොත්, අනුෂාට මුදල් වියදම් වී ඇති ආකාරය පිළිබඳව හොඳ අවබෝධයක් ලැබෙනු ඇත.

- බහුතරයක් පුද්ගලයින් විසින් තමන්ට මිලදී ගැනීමට අත්‍යාවශ්‍ය නොවන දේ මිලදී ගැනීම සඳහා මුදල් වියදම් කරනු ලබයි. ඇතැම් පුද්ගලයින් භාණ්ඩ හා සේවා මිලදී ගනු ලබන්නේ සමාජ අවධානය දිනා ගැනීමට සහ තමන්ගේ වියදම් කිරීමේ හැකියාව අන් අයට පෙන්වා සිටීම සඳහාය. මුදල් වියදම් කිරීමේදී ඔබේ හැඟීම් වලට ඔබව පාලනය කිරීමට ඉඩ නොදෙන්න.
- මූල්‍යමය වශයෙන් ස්වාධීන සහ බුද්ධිමත් පුද්ගලයින් තම නෑදෑ හිත මිතුරන් නිතර තම දුරකථන අලුත් ඒවාට මාරු කළද, සෑම සති අන්තයකම රාත්‍රී ආහාරය සඳහා අවන්හල් වෙත ගියද ඔවුන්ව අනුකරණය නොකරති.
- ඔබේ වියදම් ඔබේ ආදායම ඉක්මවා නොයෑම ඉතාම වැදගත් වේ. ඔබේ අවශ්‍යතා හා වුවමනා ප්‍රමුඛතාවයන් තීරණය කළ පසු, ඔබට කොපමණ මුදලක් වියදම් කල යුතුද යන්න තීරණය කරන්න. ඔබ උපයන මුදලට වඩා වැඩියෙන් වියදම් නොකිරීමට සැලසුම් කරන්න.

අප සියල්ලන්ටම ඉටුකරගතයුතු අවශ්‍යතා හා වුවමනා ඇත. ඔබේ අවශ්‍යතා හා වුවමනා අතර වෙනස හඳුනා ගැනීම වියදම් කළමනාකරණය කිරීමේ මූලික අංගයයි. පහත දැක්වෙන්නේ අවශ්‍යතා සහ වුවමනාවන් පිළිබඳ න්‍යායාත්මක දෘෂ්ටිකෝණයකින් කෙරෙන විවරණයකි.

අවශ්‍යතා සහ වුවමනා

අප විසින් දරනු ලබන වියදම් අපගේ අවශ්‍යතා සහ වුවමනා සපුරා ගැනීම සඳහා වන බැවින්, අවශ්‍යතා සහ වුවමනා අතර වෙනස හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වේ. ප්‍රසිද්ධ ගත කතුවරුන් විසින් අවශ්‍යතා සහ වුවමනා අර්ථ දක්වා පැහැදිලි කර ඇති ආකාරය පහත දැක්වේ.

පිලිප් කොට්ලර් විසින් රචිත "අලෙවිකරණ කළමනාකරණය" (2016) ග්‍රන්ථයේ සඳහන් පරිදි, අවශ්‍යතා යනු මිනිසාට ජීවත්වීම සඳහා අවශ්‍යයෙන්ම සපුරා ගතයුතු ආහාර, ඇඳුම්, නිවාස වැනි දෑ වේ. වුවමනාවන් සංස්කෘතිය සහ පුද්ගල පෞර්ෂය අනුව හැඩගස්වා ඇති අතර එමඟින් අවශ්‍යතා ඉටුවන ආකාරය නිශ්චිත වේ. උදාහරණයක් ලෙස, ආහාර යන අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා, කෙනෙකුට බත් සහ ව්‍යංජන වුවමනා විය හැකි අතර, තවත් කෙනෙකුට පාන් වුවමනා විය හැකිය. අලෙවිකරණය හරහා ව්‍යාපාර විසින් මෙම වුවමනා සංජානනීය අවශ්‍යතා බවට පරිවර්තනය කරනු ලබන බව කොට්ලර් පවසයි.

රිචඩ් ලිප්සි විසින් ඔහුගේ "ආර්ථික විද්‍යාව" (2015) නම් ග්‍රන්ථයේ අවශ්‍යතා යනු මිනිස් ජීවිතයේ පැවැත්මට හෝ මූලික ක්‍රියාකාරිත්වයට අත්‍යවශ්‍ය කාරණා ලෙසත්, වුවමනා යනු ජීවන තත්ත්වය වැඩිදියුණු කරන හෝ තෘප්තිය ලබා දෙන නමුත් අත්‍යවශ්‍ය නොවන කාරනා ලෙසත් අර්ථ දක්වනු ලබයි. තවද, අවශ්‍යතා සීමිත නමුත් වුවමනා අසීමිත වන අතර වෙළඳපල ආර්ථිකයක් තුළ පාරිභෝගික හැසිරීම වුවමනා විසින් මෙහෙයවනු ලබන බව ඔහු පවසයි.

ඔබේ අවශ්‍යතා සහ වුවමනාවන් අතර වෙනස දැනගැනීම තුළින් සුඛෝපභෝගි දේවල් ගැන සලකා බැලීමට පෙර ඔබේ මූලික අවශ්‍යතා සපුරා ගැනීමේ හැකියාව ලැබේ. උදාහරණයක් ලෙස රූපවාහිනි වැනි ඉලෙක්ට්‍රොණික උපාංග, මිල අධික ඇඳුම්, පිටතට ගොස් ආහාර වැනි දේ සඳහා මුදල් වියදම් කිරීමට පෙර ඔබේ දරුවාගේ පොත් මිලදී ගැනීමට කටයුතු කළ හැකිය.

කෙසේ වෙතත්, ඒබ්‍රහම් මැස්ලෝ අවශ්‍යතා පිළිබඳ වඩාත් පුළුල් විශ්ලේෂණයක් ඉදිරිපත් කරනු ලබයි. ඔහු විසින් රචිත "අභිප්‍රේරණය සහ පෞරුෂය" (1954) නමැති ග්‍රන්ථයේ, මිනිස් අවශ්‍යතා වර්ගීකරණය කර ධූරාවලියක් තුළ දක්වා ඇත. එහිදී, අවශ්‍යතා යනු ජීවිතය පවත්වාගෙන යාම සඳහා සපුරාලිය යුතු මූලික කාරණා ලෙස පමණක් හඳුනාගෙන නැත. ඒබ්‍රහම් මැස්ලෝ පවසන පරිදි, අවශ්‍යතා මිනිස් ජීවිතයේ විවිධ අවස්ථා වලදී විවිධ ආකාරවලින් ඇතිවිය හැකිය. "මැස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය" ලෙස හැඳින්වෙන මෙම විශ්ලේෂණය, අලෙවිකරණය මඟින් වුවමනා සංජානනීය අවශ්‍යතා (perceived needs) බවට පරිනාමණය කල හැකි බවට පිලිප් කොට්ලර් විසින් පල කරන මතය සනාථ කරනු ලබයි.

Self-actualization
This level of need refers to what a person's full potential is and the realization of that potential. Maslow describes this level as the desire to accomplish everything that one can, to become the most that one can be. Individuals may perceive or focus on this need very specifically. For example, one individual may have the strong desire to become an ideal parent. In another, the desire may be expressed athletically. For others, it may be expressed in paintings, pictures, or inventions.

Esteem
All humans have a need to feel respected; this includes the need to have self-esteem and self-respect. Esteem presents the typical human desire to be accepted and valued by others. People often engage in a profession or hobby to gain recognition.

These activities give the person a sense of contribution or value.
Low self-esteem or an inferiority complex may result from imbalances during this level in the hierarchy.



Love and belonging
After physiological and safety needs are fulfilled, the third level of human needs is interpersonal and involves feelings of belongingness. This need is especially strong in childhood and can override the need for safety as witnessed in children who cling to abusive parents.

Physiological needs
Physiological needs are the physical requirements for human survival.

If these requirements are not met, the human body cannot function properly and will ultimately fail. Physiological needs are thought to be the most important; they should be met first.

Safety needs
with their physical needs relatively satisfied, the individual's safety needs take precedence and dominate behavior. In the absence of physical safety - due to war, natural disaster, family violence, childhood abuse, etc. - people may (re-)experience post-traumatic stress disorder or transgenerational trauma.

This level is more likely to be found in children because they generally have a greater need to feel safe.

ඔබේ වියදම් කළමනාකරණය කිරීමට ක්‍රම 8 ක්

1. **ඔබේ වුවමනා කෙරෙහි නොව අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරන්න.**

   අපගේ පැවැත්ම සඳහා වාතය, ආහාර, ජලය සහ නවාතැන් අවශ්‍ය බව පැහැදිලිය. කෙසේ වෙතත්, අපට පැතලි තිර රූපවාහිනියක්, නවතම ස්මාර්ට් ජංගම දුරකථනයක් සහ සුඛෝපභෝගී නිවසක වුවමනාවද ඇත. බොහෝ දුරට, අපගේ සැබෑ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කිරීම හුදු ආශාවන් විසින් යටපත් කරනු ලබයි. එබැවින්, ඇතැම් විට තීරණාත්මක අවශ්‍යතාවන් වුවමනාවන් වෙනුවෙන් කැප කරනු ලැබේ. අතාර්කික ලෙස අපගේ හුදු වුවමනා පසුපස හඹා යාමෙන් අපව තාවකාලිකව සතුටු කළ හැකි නමුත් අපගේ අවශ්‍යතා තෘප්තිමත් නොවී පැවතිය හැකිය. එබැවින්, එදිනෙදා වියදම් කිරීමේදී වුවමනාවලට වඩා අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දීම ඉතා වැදගත් වේ.

2. **ඔබේ අවශ්‍යතා ඉටුකරගැනීම සඳහා සැලසුම් කරන්න.**

   ඔබේ වුවමනාවන්, ආශාවන් සහ අපේක්ෂාවන් අත්හැරිය යුතු නැත. මන්ද, ඔබට ඔබේ සියලු වුවමනාවන් ඵලදායී ලෙස සැලසුම් කර සාක්ෂාත් කර ගත හැකිය. නිසි අයවැයකරණයක් මඟින් ඵලදායී මූල්‍ය සැලසුම්කරණයට ළඟා කරගත හැක.

3. **ඔබගේ අයහපත් පුරුදු යහපත් පුරුදු බවට පරිවර්තනය කරගන්න.**

   අධික ලෙස දුම්පානය, මත්පැන් පානය වැනි නරක පුරුදු අතහැර ඒ සඳහා ගිය වියදම ඉතිරි කිරීම වැනි හොඳ පුරුදු බවට පරිවර්තනය කිරීමෙන් ඔබේ ශාරීරික සෞඛ්‍යය ආරක්ෂා වනවා පමණක් නොව මුදල්ද ඉතිරි වේ.

4. වට්ටම් උගුලවලට හසු නොවන්න.

වෙළඳුන් විසින් ලබා දෙන විවිධාකාරයේ වට්ටම් ඔබේ පසුම්බියට හිතකර ලෙස ඔබට පෙනිය හැකිය. කෙසේ වෙතත්, ඉතා ප්‍රවේශමෙන් විශ්ලේෂණය කළහොත්, ඔවුන් බොහෝ දුරට ඔබේ පසුම්බියට පක්ෂව කටයුතු නොකරයි. වට්ටම් මඟින් ඔබට මිලදී ගැනීමට අවශ්‍ය ප්‍රමාණයට වඩා භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීමට මඟ පාදයි (එකක් මිලදී ගන්නා විට තවත් එකක් නොමිලේ ලබා දීම, දෙකක් ගත්විට පොඩි ප්‍රමාණයකින් මිල අඩු වීම). ඔබට "යම් ලාභයක් ලබා ගන්නා" බවක් දැනිය හැකි වුවද, සැබෑ ලෙස එය එසේ නොවේ. වට්ටම් පිලිබඳ දැන්වීමක් දුටු සැනෙන් එය අත්පත් කර නොගතහොත් ඔබට වටිනා ලාභයක් මඟ හැරී යාමට ඇති බවට හැඟීමක් සහ බියක් ඇතිවන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, එම මග හැරීම වළක්වා ගැනීම සඳහා ඉක්මනින් එම වට්ටම සහිත භාණ්ඩය හෝ සේවාව මිලදී ගැනීම සඳහා ඔබේ සිත ඔබට බල කරනු ඇත. වට්ටම් පිළිගත යුත්තේ එම අවස්ථාවේදී, ඔබ සතුව ඇති අවශ්‍යතා ලැයිස්තුවේ ඇති අයිතම සඳහා පමණි. එසේ නොමැතිනම්, එය ඔබේ මුදල් සහ වියදම් සැලැස්ම කෙරෙහි අහිතකර ලෙස බලපානු ලබයි.

5. ඔබේ මූල්‍ය ඉලක්ක මතක තබා ගන්න.

මිනිසුන් වශයෙන්, අප විශේෂයෙන් අලෙවිකරණ සහ ප්‍රවර්ධන ව්‍යාපාරවලට ආකර්ෂණය වන අවස්ථාවන්හිදී අපගේ සීමාවන් සහ සැලසුම් අමතක කිරීමට නැඹුරු වී සිටිමු. එමනිසා, සෑම විටම ඔබේ මූල්‍ය ඉලක්ක කෙරෙහි අවධානය යොමු කරන්න, මතක තබා ගන්න.

6. පහසු ගෙවීමේ ක්‍රම පිළිබඳව දැනුවත් වන්න.

භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී ඔබව හසු විය හැකි තවත් උගුලක් ලෙස වාරික ක්‍රම වලට යොමුවීම දැක්විය හැකිය. ඔබේ ජීවිතයට සැබෑ ලෙසම අවශ්‍යව ඇති ඉහළ වටිනාකමක් ඇති භාණ්ඩ ලබා ගැනීම සඳහා දැනුවත්භාවයකින් යුතුව භාවිතා කළහොත් පමණක් පහසු ගෙවීමේ ක්‍රම මඟින් ඔබගේ වියදම් සැලැස්ම පහසු කරනු ඇත. උදා: රූපවාහිනිය, ශීතකරණය, වාහනය, ඉඩම, නිවාස ආදිය.

7. හැඟුම් මිලදී ගැනීම් වලින් වළකින්න

පැහැදිළි හේතු රහිත, සැලසුම් නොකළ මිලදී ගැනීම් විසින් ඔබේ වියදම් සැලැස්ම වෙත අහිතකර බලපෑම් කරනු ලැබිය හැක. බොහෝ විට, හදිසි සිතුවිල්ලක් මත සිදු කරනු ලබන මිලදී ගැනීම් සිදුවන්නේ විකුණුම් ප්‍රවර්ධන සහ අලෙවිකරණ වැඩසටහන්, වට්ටම්, දීමනා ආදියෙන් අභිප්‍රේරණය වූ විටය. හැඟුම් මිලදී ගැනීම් වළක්වා ගැනීම සඳහා, ඔබගේ මිලදී ගැනීමේ තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා කෙටි පමා කිරීමේ කාලයක් (මිලට ගැනීමේ තීරණය අනුව එය පැයක්, එක දිනක් හෝ මාසයක් විය හැකිය) ලබා ගන්න. මෙම පමා කිරීමේ කාලයෙන් පසු ඔබේ මිලදී ගැනීමේ ආශාවන් බොහොමයක් මැකී යන බව ඔබට වැටහෙනු ඇත. මේ අනුව, ඔබට අනවශ්‍ය වියදම් සඳහා වැය කරන්නට සිතූ මුදල ඉතිරි වේ.

8. 50/30/20 රීතිය අනුගමනය කරන්න

ඔබේ මුළු ආදායමෙන්, ආහාර, නිවාස කුලිය ඇතුළු කපා හරිය නොහැකි අවශ්‍යතා සඳහා ආදායමෙන් 50% ක්, ඔබේ වුවමනා සපුරාලීමට සඳහා 30% ක් හා අනාගත භාවිතය සහ මූල්‍ය ආරක්ෂාව සඳහා ඉතිරිකිරීම් සහ ණය ආපසු ගෙවීම සඳහා 30% ක් වෙන් කිරීම මින් අදහස් වේ.

වියදම් සහ අවශ්‍යතා වර්ගීකරණය මත පදනම්ව, ඔබේ මනාපයන් අනුව මෙම අනුපාතයන් තීරණය කළ හැකිය. කෙසේ වෙතත්, අනවශ්‍ය වියදම් කපා හැරීමට වග බලා ගන්න. ඔබේ මූල්‍ය ඉලක්ක සහ මනාපයන් මත පදනම්ව වියදම් කපා හරින ආකාරය ඔබට තෝරා ගත හැකිය.

වියදම් කළමනාකරණයේදී ගෘහණියන්ට පුහුණු විය හැකි කරුණු 4ක්

මෙම කාරණා හතර (භාවිතය අඩු කිරීම, නැවත භාවිතා කිරීම, ප්‍රතිචක්‍රීකරණය සහ ප්‍රතික්ෂේප කිරීම) සකසුරුවම් සංකල්පය මත පදනම් වේ. සකසුරුවම් යන්නෙන් අදහස් වන්නේ මුදල් සහ අනෙකුත් සම්පත් තාර්කික ලෙස සහ අවම ලෙස භාවිතා කරමින් තම අවශ්‍යතා හා වුවමනා සපුරාගනීමටයි. පුරාණ කාලයේ සිටම මිනිසුන් ලොව පුරා විවිධ සංස්කෘතීන් හරහා සකසුරුවම්කම අගය කර ඇත. එබැවින්, වියදම් කළමණාකරණය කර ගැනීමට සහ අඩු කිරීමට පළමු පියවර වනුයේ තම නිවසේ පරිසරය සහ ජීවන රටාව සකසුරුවම්කම හරහා නිර්මාණය කර ගැනීමයි.

මෙම කරුණු හතර ධුරාවලියක් තුළ සංවිධානය කර ඇති අතර, වඩාත්ම තීරණාත්මක පියවර වන්නේ අනවශ්‍ය වියදම් අඩු කිරීමයි. වියදම් අඩු කිරීම යනු අප මිල දී ගනු ලබන භාණ්ඩ හා සේවා හැකිතාක් අඩු කිරීමයි. නැවත භාවිතා කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම යන සංකල්ප හරහා අනවශ්‍ය වියදම් අවම කිරීම වඩාත් පහසු වනු ඇත.

අනුෂා ට ඇගේ නිවසේදී සකසුරුවම්කම ප්‍රගුණ කළ හැකි ආකාරය බලමු.

● ප්‍රතික්ෂේප කිරීම

අත්‍යවශ්‍ය නොවන වියදම් ප්‍රතික්ෂේප කිරීම මෙයින් අදහස් වේ. එය කොතරම් කුඩා වියදමක් වුවද ඒ සඳහා සැබෑ අවශ්‍යතාවයක් නොමැති නම් ප්‍රතික්ෂේප කළ යුතුය.

● අඩු කිරීම

ඔබේ වුවමනාවන් හැකිතාක් අවම කර සැබෑ අවශ්‍යතා කෙරෙහි පමණක් අවධානය යොමු කරන්න.

● නැවත භාවිතා කිරීම

බොහෝ විට බොහෝ පිරිස් සෑම උත්සවයක් සඳහාම අලුත් ඇඳුම් මිල දී ගැනීමට පෙළඹී සිටී. (උදා: සෑම විවාහ මංගල්‍යයක් සඳහාම අලුත් සාරියක් ඇඳීම). නමුත් මෙය ඔබේ වියදම් කළමනාකරණයට අමතර බරක් ඇති කරනු නොඅනුමානය. අවස්ථා දෙකක් හෝ වැඩි ගණනක් සඳහා එකම ඇඳුමක් ඇඳීම වියදම් පාලනය කිරීමට උපකාරී වනු ඇත. ඇඳුම් පැළඳුම් සහ අනෙකුත් පාරිභෝගික භාණ්ඩ වැඩිමහල් සහෝදරියගෙන් බාල සහෝදරියට, වැඩිමහල් සහෝදරයාගෙන් බාල සහෝදරයාට, මවගෙන් දියණියට, පියාගෙන් පුතාට ආදී ලෙස නැවත භාවිතා කිරීම සකසුරුවම්කම පුහුණු කරන පුද්ගලයින්ගේ පුරුද්දකි. බොහෝ ආකාරවලින් නැවත භාවිතා කළ හැකි දේවල් සොයාගෙන ඒ අනුව කිරීමෙන් බොහෝ මිලදී ගැනීමේ අවශ්‍යතා අඩු කරගනු හැකි වේ.

● ප්‍රතිචක්‍රීකරණය සහ නවෝත්පාදනය

යම් අවශ්‍යතාවයක් වෙනුවෙන් භාවිත කර අවසන් වූ පසු ඉවත දමන දේවල් උපයෝගී කර ගනිමින් වෙනත් භාණ්ඩ නවෝත්පාදනය කල හැක. භාවිතයෙන් ඉවත් කරන ලද පරණ ඇඳුම් වලින් පාපිසි පිළියෙළ කර ගැනීම වැනි දේ උදාහරණ ලෙස දැක්විය හැකිය.

සාකච්ඡාව පදනම් වූ ගෘහපාලන සංස්කෘතියක් නිර්මාණය කර ගැනීම

පවුලේ මූල්‍ය තත්ත්වය පිළිබඳව සියලුම සාමාජිකයින් සමග සාකච්ඡා කර දැනුවත් කරන්න. සැබෑ මූල්‍ය තත්ත්වය පිළිබඳව සෑම සාමාජිකයෙකුම දන්නා විට, ඔවුහු මුදල් ඉල්ලීමට සහ වියදම් කිරීමට පෙර සිතා බැලීමට නැඹුරු වෙති. පවුලේ සාමාජිකයින්ට, විශේෂයෙන් දරුවන්ට, තම අවශ්‍යතා හා වුවමනා පිළිබඳව පවුලේ සාමාජිකයන් අතර සාකච්ඡා කිරීමටට, එම අවශ්‍යතා සඳහා ඉතිරි කිරීමටද සහ සුබෝපභෝගී වුවමනා අත්හැරීමටද (ඒ සඳහා මූල්‍ය සූදානම ඇතිවන තෙක්) දිරිමත් කරන්න. පවුලේ අයවැයක් සකස් කිරීම සඳහා සියලුම සාමාජිකයින් ඇතුළත් කරගන්න.

"ඔබට දැරීමට සිදුවන වියදම් සියල්ල අවශ්‍යතා, ඉලක්ක සහ අභිලාෂයන් ලෙස වෙන් කිරීම මගින් ඔබේ මුදල් ප්‍රවාහය කළමනාකරණය කර ගනිමින් සුවපහසු ලෙස ජීවත් වීම සඳහා වඩා හොඳ සැලසුමක් ලබාදේ."

3.4 ඉතුරුම් කළමනාකරණය

ඉගෙනුම් අරමුණු

- ඉතුරුම් කළමනාකරණය සහ එහි වැදගත්කම අවබෝධ කර ගැනීම.
- ඵලදායී ලෙස ඉතිරි කිරීම සඳහා උපායමාර්ගික ප්‍රවේශය හඳුනා ගැනීම.
- ඔබේ ඉතුරුම් සැලසුම් කිරීම සඳහා සරළ මාර්ගෝපදේශ දැන ගැනීම.

පුද්ගල මූල්‍යකරණයේදී, ඉතුරුම් යනු ඔබ විසින් වර්තමානයේ වියදම් නොකොට අනාගත භාවිතය සඳහා ඔබේ ආදායමෙන් වෙන් කර තබන කොටසයි.

ඉතිරි කිරීමේ පුරුද්ද තම මූල්‍ය ආරක්ෂාව ගොඩනගා ගැනීමේදී මෙන්ම තම කෙටි කාලීන සහ දිගු කාලීන මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමේදී ද ඉතා වැදගත් වේ. හදිසි මුදල් අවශ්‍යතාවන්හිදී ප්‍රයෝජනයට ගැනීමට, විශාල පිරිවැයක් දැරීමට සිදුවන මිලදී ගැනීම් සඳහා මුදල් සම්පාදනය කර ගැනීමට හෝ නිවසක් මිලදී ගැනීම, දරුවන්ගේ හෝ තමාගේ උසස් අධ්‍යාපන කටයුතු වලට අවශ්‍යවන මුදල් සපයා ගැනීම හෝ තම විශ්‍රාම දිවිය ගත කිරීමට අවශ්‍ය අරමුදල් සොයා ගැනීම වැනි ප්‍රධාන ජීවන සන්ධිස්ථාන කරා ළඟා වීමට ඔබට උපකාරී වන පරිදි ඉතිරිකිරීම් සැලසුම් කළ හැකිය.

රත්නායක මහතාගේ නිවසේදී මව සහ දියණිය අතර ඉතා විශේෂ සංවාදයක් පැවැත්විනි.

රත්නායක පවුල ඉතිරිකිරීමේ වැදගත්කම තේරුම් ගෙන ඇති බව මෙම සංවාදයෙන් පෙනී යයි. ඉතිරි කිරීම් දිගු කාලීනව ඔබට බොහෝ ආකාරවලින් ප්‍රතිලාභ ලබා දෙනු ඇත. ඉතිරි කිරීම පුරුද්දක් ලෙස එක් පරම්පරාවකින් තවත් පරම්පරාවකට පැවත යා යුතු පාරම්පරික උරුමයක් සේ සැලකිය යුතුය.

මුදල් ඉතිරි කිරීම යනු වඩා ඉහළ ශේෂයක් සහිත බැංකු ගිණුමක් ගොඩනඟා ගැනීම පමණක් නොව, අනෙකුත් අත්‍යවශ්‍ය මූල්‍ය කුසලතා උගන්වන්නක් බව බොහෝ දෙනෙක් නොදන්නා කාරණයකි. එය ඔබට මූල්‍යමය ලෙස සංවිධානාත්මකව සිටීමට, ස්වයං පාලනයක් පුහුණු වීමට සහ ඔබේ අනාගතය සැලසුම් කිරීමට බොහෝ සෙයින් උපකාරී වේ.

ඉතිරි කිරීම මඟින් අපට වඩා හොඳ ජීවිතයක් භුක්ති විඳීමට ඉඩ සලසන, ඒ සඳහා ඇවැසි බොහෝ ප්‍රතිලාභ ලබා දෙයි.

"පරිභෝජනය සඳහා වියදම් කිරීමෙන් පසු ඉතිරි කිරීම නොව, ඉතිරි කිරීමෙන් පසු පරිභෝජනය සඳහා වියදම් කරන්න."

-වොරන් බෆට්-

ඉතිරි කිරීමේ වැදගත්කම

- **හදිසි අවස්ථා සඳහා සූදානම සහ ණය වළක්වා ගැනීම:** ජීවිතය අනපේක්ෂිතය. හදිසි මෝටර් රථ අලුත්වැඩියාවක්, හදිසි වෛද්‍ය ප්‍රතිකාර ගැනීමක් හෝ හදිසි රැකියා අහිමිවීමකදී ගැටළුවක් නොමැතිව ජීවිතය පවත්වාගෙන යාමට අවශ්‍ය මුදල් කිසිදු ණය වීමක් නොමැතිව ඉතුරුම් විසින් ඔබට ලබා දෙනු ඇත. හදිසි මූල්‍ය හිඟතාවයන් ආවරණය කිරීම සඳහා මාස 3 සිට 6 දක්වා කාලයකට සෑහෙන ඔබට අවශ්‍ය ජීවන වියදම් වලට සමාන මුදලක් සාමාන්‍ය ඉතුරුම් ගිණුමක ඉතිරි කර තබා ගන්නා ලෙස මූල්‍ය විශේෂඥයින් විසින් නිර්දේශ කරනු ලැබේ. හදිසි වියදම් ආවරණය කිරීම සඳහා මුදල් ණයට ගැනීමට සිදුවුවහොත්, පොලී සහ බැංකු ගාස්තු ඔබගේ සමස්ත වියදම්වලට අතිරේක ලෙස එකතු වේ. එබැවින්, ඔබේ ඉතිරි කිරීම් දුෂ්කර කාලවලදී ඔබට මූල්‍ය කටයුතු කෙරෙහි හොඳ සහනදායීත්වයක් සහතික කරනු ලබයි.
- **මූල්‍ය ස්වාධීනත්වය:** යම් පවුලක ඉතිරිකිරීම් යම් ප්‍රමාණයකට එම පවුලේ ආර්ථික නිදහසකට මඟ පාදනු ඇත. නිසි ආදායම් මාර්ගයක් නොමැති යැපෙන්නන්ට වුවද තමන්ට යැපීම පිණිස ලැබෙන මුදල් ඉතිරි කිරීම මඟින් යම් මූල්‍ය ස්වාධීනත්වයක් අත්පත් කර ගත හැකි වේ. උදාහරණයක් ලෙස, ගෘහණියන්ට සහ පාසල් දරුවන්ට හෝ වෙනත් ආදායමක් නොලැබෙන ඕනෑම පුද්ගලයෙකුට රැකවරණය සපයන්නා විසින් ලබා දෙන ඉතා කුඩා මුදල් ප්‍රමාණවලින් වුවද ඉතිරි කර ගත හැකිය. එබැවින්, යැපෙන්නෙකුට හෝ ආදායමක් නොමැති පුද්ගලයෙකුට පවා යම් මූල්‍ය ස්ථාවරත්වයක් සඳහා අඩිතාලමක් දමා ගැනීම ඉතුරුම් යොදා ගත හැක.
- **ධනය ගොඩනගා ගැනීම සහ ජීවන ඉලක්ක සපුරා ගැනීම:** ඉතිරිකිරීම් මගින් අනාගත ඉලක්ක සඳහා අරමුදල් සපයා ගත හැකිය (සුඛෝපභෝගී භාණ්ඩ මිලදී ගැනීම, ආරක්ෂිත විශ්‍රාම දිවියක් සලසා ගැනීම ආදී ලෙස). සැලකිය යුතු ඉතුරුම් ඇති පුද්ගලයින්ට අනාගතය පිළිබඳ අඩු මූල්‍ය ආතතියක් සහිත, අවිනිශ්චිතභාවයකින් තොර ජීවිතයක් අත්විඳිය හැකි අතර, එය තමාගේ සමස්ත මානසික යහපැවැත්මටද ඉවහල් වේ. මේ අනුව, සාමාන්‍ය පුද්ගලයෙකු ධනවතකු බවට පත් කිරීමේ මූලික අඩිතාලම දමනු ලබන්නේ ඉතිරිකිරීම් මගිනි. ඔබගේ ඉතුරුම් නිසි පරිදි අනාගත ප්‍රතිලාභ ලැබෙන ලෙස ආයෝජනය කිරීමෙන් ධනය ගොඩ නගා ගත හැක.
- **ජාතික මෙහෙවර:** ඔබේ ඉතිරිකිරීම් රට තුළ සමස්ත ආයෝජන වැඩි කිරීමට හේතු වන අතර එමඟින් ආර්ථික ස්ථාවරත්වය සහ ආර්ථික වර්ධනය කෙරෙහි ධනාත්මක බලපෑමක් සිදු වනු ඇත.

ඵලදායී ලෙස ඉතිරි කිරීම සඳහා ව්‍යුහාත්මක ප්‍රවේශයක්

ඔබේ වර්තමාන ඉපැයීම් වලින් ඵලදායී ලෙස ඉතිරි කිරීම සඳහා අවශ්‍යවන මූල්‍ය විනය, උපායමාර්ගික සැලසුම්කරණය සහ තම මූල්‍ය ඉලක්ක පිළිබඳ පැහැදිලි අවබෝධයක් තිබීම යන කාරණා හොඳින් අවබෝධ කරගැනීම වැදගත් වේ. ව්‍යුහගත ප්‍රවේශයක් අනුගමනය කිරීමෙන්, ඔබට ඔබේ ආදායමෙන් උපරිම ප්‍රයෝජන ගත හැකි අතර වඩා යහපත් මූල්‍ය අනාගතයක් ගොඩනගා ගත හැකිවේ. එසේ ඵලදායී ලෙස ඉතිරි කිරීම සඳහා ගත හැකි ප්‍රධාන පියවර පහත දැක්වේ.

පියවර 1: පැහැදිලි ඉතුරුම් ඉලක්ක සකසා ගැනීම

අනාගතයේදී ඉටුකරගත යුතු මූල්‍ය ඉලක්ක හඳුනා ගැනීමෙන් ආරම්භ කරන්න. ඒවා කෙටි කාලීන සහ දිගු කාලීන ඉලක්ක ලෙස වෙන් කරන්න.

කාල රාමුව	උදාහරණ
කෙටිකාලීන - අවුරුදු 1 සිට 3 දක්වා	හදිසි අරමුදල
	නිවාඩුවක් ගතකිරීම (විනෝද ගමනක්, පිටරට සචාරියක් ආදී ලෙස)
	නිවාස ප්‍රතිසංස්කරණ
	ණය පියවීම
දිගු කාලීන - අවුරුදු 3 ට වඩා වැඩි	නිවසක් මිලදී ගැනීම
	දරුවන්ගේ උසස් අධ්‍යාපනය
	විශ්‍රාම දිවිය සැලසුම් කිරීම

පියවර 2: අයවැයක් සැකසීම

ඕනෑම ඉතුරුම් සැලැස්මක ආරම්භක පදනම වනුයේ අයවැයයි.

- **මුළු ආදායම ගණනය කරන්න:** ඔබ මාසිකව කොපමණ මුදලක් උපයනවාද යන්න දැන ගන්න.
- **වියදම් හඳුනා ගන්න:** සියලුම ස්ථාවර සහ විචල්‍ය වියදම් (කුලී වියදම්, ආහාර වියදම්, බිල්පත් ආදිය) සටහන් කරන්න.
- **ඉතිරි කිරීමට ක්‍රම හඳුනා ගන්න:** අඩු කළ හැකි වියදම් සහ වළක්වා ගත හැකි අනවශ්‍ය වියදම් සොයා ගන්න. තිරසාර පරිභෝජන රටාවකින් අත්‍යවශ්‍ය නොවන වියදම් කපාහැරීමෙන් ඉතුරුම් වඩා පහසු වනු ඇත.

පියවර 3: හදිසි මුදල් අවශ්‍යතා සඳහා වෙනම අරමුදලක් සැලසුම් කරන්න.

හදිසි අරමුදලක් පවත්වාගැනීම සඳහා ප්‍රමුඛතාවය දිය යුතුය. මාස 3ක හෝ 6ක ජීවන වියදමට සමාන මුදලක් වෙනම, ඉතුරුම් ගිණුමක ඉතිරි කිරීම සුදුසුය.

- **කුඩා මුදලකින් ඉතිරි කිරීම ආරම්භ කරන්න:** ආරම්භක ඉලක්කයක් (උදා: මසකට රු.5000) තබා ගන්න. ඔබේ ආදායම් මට්ටමට අනුව ඉතුරුම් ක්‍රමයෙන් වැඩි කරන්න.
- **ඉතුරුම් ස්වයංක්‍රීයව සිදු කිරීමට පියවර ගන්න:** හදිසි අරමුදල සඳහා වෙනම ඉතුරුම් ගිණුමක් ආරම්භ කර එම ගිණුම වෙත ස්වයංක්‍රීයව මුදල් හුවමාරු කිරීම් සකසන්න. මේ සඳහා ඔබට බැංකුවෙන් උපදෙස් සහ සහාය ලබා ගත හැකි අතර, අන්තර්ජාල බැංකු සේවා හෝ ස්ථාවර නියෝග හරහා මුදල් හුවමාරු කිරීම් ඉතා ඉක්මනින් හා පහසුවෙන් සිදු කළ හැකිය.

පියවර 4: නිවැරදි ඉතුරුම් මෙවලම් භාවිතා කරන්න

- **ඉතුරුම් ගිණුම්:** මධ්‍ය කාලීන/දිගු කාලීන ඉලක්ක සඳහා ස්ථාවර තැන්පතුද, කෙටි කාලීන ඉලක්ක සඳහා සාමාන්‍යය ඉතුරුම් ගිණුම්ද භාවිත කල හැක.
- එක් එක් (ඉතුරුම්) ඉලක්කය සඳහා වෙනම ඉතුරුම් ගිණුමක් භාවිතා කරන්න.

පියවර 5: ආදායම සහ වියදම් නිරීක්ෂණය කිරීමෙන් ඉතුරුම් සැලසුම් සංශෝධනය කරන්න.

- **මාසික අයවැය සමාලෝචනය කරන්න:** ඔබගේ ඉතිරිකිරීම් ඔබ විසින් පිළියෙළ කල සැලැස්ම සමඟ සමපාත වන බවට වග බලා ගන්න සහ අවශ්‍ය පරිදි වියදම්/ඉතුරුම් නැවත ගලපන්න.
- **කාලයත් සමඟ ඉතිරිකිරීම් වැඩි කරන්න:** ඔබට උසස්වීමක්, ප්‍රසාද දීමනාවක් හෝ අමතර වැටුපක් ලැබුණු විට, එයින් කොටසක් ඉතිරි කිරීමට උත්සාහ කරන්න (උදාහරණයක් ලෙස, වැඩි වූ ආදායමෙන් 50%).

ඉතුරුම් සැලැසුම්කරණය සඳහා උපදෙස් 6ක්

- **ඔබේ වියදම් කළමනාකරණය කරන්න:** ආදායම වැඩි වන විට, ඒ අනුව වියදම් වැඩි නොකරන්න. ඔබ බලාපොරොත්තුවන සමාජ තත්වයට අනුකූලව, ජීවිතය පවත්වාගෙන යාම සඳහා උපායමාර්ගිකව ඔබේ වියදම් සැලසුම් කරන්න.
- **ඔබව අභිප්‍රේරණය කර තබා ගන්න:** ඔබේ ඉතුරුම් ඉලක්ක අමතක නොකරන්න. ඉතුරුම් පිළිබඳ සොයාබැලීම සඳහා මෙවලම් භාවිතා කිරීමෙන් හෝ ඔබේ ඉතුරුම්වල ප්‍රගතිය නිතර නිරීක්ෂණය කිරීමෙන් ඉතුරුම් ඉලක්ක පවත්වාගෙන යන්න.
- **ඔබේ ඉතුරුම් ජයග්‍රහණ ඔබම සමරන්න:** යම් යම් ඉතුරුම් සන්ධිස්ථාන කරා ළඟා වූ පසු කුඩා සැමරීමක් ඔබටම සිදු කරගැනීමෙන් ඔබ ඔබවම පෙළඹවිය යුතුය. විශේෂිත ඉතුරුම් ඉලක්කයක් කරා ළඟා වීමම එක්තරා අභිප්‍රේරණයකි.
- **ඉතුරුම් පිළිබඳ සොයාබැලීම:** ඉතුරුම් ලුහුබැඳීමක් යනු ඉතුරුම් ඉලක්ක කරා යාමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට සහ කළමනාකරණය කිරීමට භාවිතා කරන මෙවලමක් හෝ ක්‍රමයකි. එය අතින් යාවත්කාලීන කරන ලද පොතක් හෝ ජංගම දුරකථනයට බාගත කළ හැකි මෘදුකාංගයක් හෝ විය හැකිය.
- **ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය නොවන මූල්‍ය ආයතන ප්‍රතික්ෂේප කරන්න:** ඔබේ ඉතුරුම් අහිමි වීම වළක්වා ගැනීම සඳහා තැන්පතු ලබා ගන්නා මූල්‍ය ආයතන අධීක්ෂණ අධිකාරිය (ශ්‍රී ලංකා මහ බැංකුව) විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතනවල පමණක් තබා ගත යුතුය.
- **ඔබේ ඉතුරුම් විචක්ෂණශීලීව විවිධාංගීකරණය කරන්න:** මූල්‍ය ආයතන විසින් බාල වයස්කාර ඉතුරුම් ගිණුම්, තරුණ ඉතුරුම් ගිණුම්, කාන්තා ඉතුරුම් ගිණුම්, විශ්‍රාම සැලසුම් ඉතුරුම් ගිණුම් සහ කාලීන තැන්පතු වැනි විවිධ ආකාරයේ ඉතුරුම් උපකරණ පිරිනමයි. ඒවා ඔබේ ඉතුරුම් ඉලක්ක අනුව භාවිතා කළ හැකිය. ඔබේ සියලු ඉතුරුම් එකම ගිණුමක තබා ගැනීමෙන් ඔබේ ඉතුරුම් ඉලක්ක සපුරා ගැනීමට බාධා ඇතිවිය හැකිය.

ඉතුරුම් වලින් ඔබ්බට සිතන්න

වියදම් කිරීමට වඩා ඉතිරි කිරීම සඳහා මුදල් වෙන් කිරීම ධනවත් වීමේ පළමු පියවරයි. ඉතිරිකිරීම් විසින් ඔබට නිෂ්ක්‍රීය සහ කිසිදු ප්‍රයෝජනයක් නොමැති විශාල මුදලක් ලබා දිය හැකි වුවත් හුදෙක් ඉතිරිකිරීම් පමණක් ඔබව පොහොසත් නොකරනු ඇත.

මුදල් යනු ඔබට උපයා ගත හැකි සහ වර්ධනය කරගත හැකි වත්කමකි. එමනිසා, මුදලේ සැබෑ ප්‍රතිලාභ ලබා ගැනීමට නම්, ආයෝජන ප්‍රතිලාභ මගින් ඔබේ ඉතුරුම් වර්ධනය කිරීම සඳහා සුදුසු පරිදි ආයෝජනය කළ යුතුය.

3.5 ආයෝජන කළමනාකරණය

ඉගෙනුම් අරමුණු

- ආයෝජන කළමනාකරණය සහ එහි වැදගත්කම තේරුම් ගැනීම.
- ශ්‍රී ලංකාවේ විවිධ ආකාරයේ ආයෝජන අවස්ථා හඳුනා ගැනීම.
- ආයෝජනය කිරීමේදී සලකා බැලිය යුතු ප්‍රධාන සාධක හඳුනා ගැනීම.
- අවදානම සහ ආයෝජන මත ප්‍රතිලාභ අතර සම්බන්ධතාවය තේරුම් ගැනීම.
- විවිධාංගීකරණය මගින් ආයෝජන අවදානම අවම කළ හැකි ආකාරය දැන ගැනීම.
- මුදල්වල කාල අගය පිළිබඳ සංකල්පය තේරුම් ගැනීම.
- සරල සහ සංයුක්ත පොලී පිළිබඳ අදහස දැන ගැනීම.
- පුද්ගල මූල්‍යකරණයේ දී මුදලේ කාලානුරූපී අගය භාවිතා කරන ආකාරය දැන ගැනීම.
- කොළඹ කොටස් වෙළඳපොලේ (CSE) ප්‍රාථමික සහ ද්විතීයික කොටස් වෙළඳපොළ හඳුනා ගැනීම.
- කොළඹ කොටස් වෙළඳපොලේ ආයෝජනය කිරීම සඳහා මාර්ගෝපදේශ දැන ගැනීම.
- ණය සුරැකුම්පත් හඳුනා ගැනීම.
- නිවැරදි ආයෝජන තෝරා ගන්නේ කෙසේදැයි දැන ගැනීම.

ආයෝජන යනු අනාගත කාල පරිච්ඡේදයක් තුළ ආදායමක් උපයා ගැනීම සඳහා ඔබේ මුදල් හෝ මූල්‍ය වත්කම්, ව්‍යාපෘති හෝ ව්‍යාපාරවල ආයෝජනය කිරීමයි. ආයෝජනයේ ප්‍රධාන ඉලක්කය වන්නේ ඔබේ ධනය වර්ධනය කර අනාගතයේදී ඔබේ මූල්‍ය ආරක්ෂාව සහතික කිරීමයි.

එක්තරා කාර්යබහුල දවසක අවසානයේ රත්නායක පවුලේ සාමාජිකයන් ඔවුන්ගේ රාත්‍රී ආහාර මේසයේදී මුණගැසිනි

රත්නායක පවුල මෙන්, බොහෝ පවුල් ඔවුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය තමන්ගේ රැකියාවන් මතම රඳවාගෙන සිටිති. එසේ නමුත්, ඉහළ යන ජීවන වියදම් වලට මුහුණ දීමටනම්, නිතිපතා ඉතිරි කිරීමෙන් ලබා ගන්නා මුදලට වඩා ඒවා ආයෝජනය තුළින් වැඩි මුදල් ප්‍රමාණයක් අනාගතය වෙනුවෙන් උපයා ගැනීම වැදගත් වේ. එය අනාගතය සඳහා ස්ථාවර ආදායම් මාර්ගයක් බවට පත්වන බීජ රෝපණයක් වැනිය. පහත දැක්වෙන කොටස මඟින් ආයෝජනයේ වැදගත්කම පැහැදිලි කරනු ලබයි.

ආයෝජනය කිරීමේ වැදගත්කම

- **ධනය ගොඩනැගීම:** ආයෝජනය කිරීමෙන් කාලයත් සමඟ ඔබේ මුදල් වැඩි කර ගැනීමට සහ ඔබේ ධනය වර්ධනය කර ගැනීමට හැකියාව ලැබේ.
- **මූල්‍ය ඉලක්ක සපුරා ගැනීම:** ආයෝජනය මඟින් පුද්ගලයන්ට නිවසක් හෝ ඉඩමක් මිලදී ගැනීම, අධ්‍යාපනයට අරමුදල් සැපයීම, වාහනයක් මිලදී ගැනීම හෝ විශ්‍රාම ගැනීම සඳහා මුදල් සැපයීම වැනි මහා පරිමාණ වියදම් සඳහා මුදල් උපයාගැනීමට ඉඩ සලසයි.
- **උද්ධමනය පරාජය කිරීම:** උද්ධමනය කාලයත් සමඟ ඔබේ මිලදී ගැනීමේ ශක්තිය අඩු කරයි. හොඳ ආයෝජනයක් මඟින් උද්ධමනයේ බලපෑම්වලට යටත් නොවී ඔබට ඇති මිල දී ගැනීමේ හැකියාව එලෙසම පවත්වා ගැනීමට අවස්ථාව ලබා දේ.

ශ්‍රී ලංකාව තුල දැනට පවතින වඩාත් ප්‍රචලිත ආයෝජන අවස්ථා

ආයෝජන වර්ගය	විස්තරය
කොටස් වෙළෙඳපොළ තුළ ආයෝජනය	කොටස් හුවමාරුවක් යනු සමාගමක හිමිකාරිත්වය කුඩා කොටස් වලින් මිලදී ගැනීම සහ විකිණීම සඳහා වන වෙළඳපොළකි. පුද්ගලයෙකු සමාගමක කොටසක් මිලදී ගන්නා විට, ඔවුන් එම සමාගමේ හිමිකාරිත්වයෙන් කුඩා කොටසක් අත්පත් කර ගනු ලැබේ. සමාගම වර්ධනය වන විට, එහි කොටස්වල වටිනාකම වැඩි විය හැක. එවිට ඔබ සතුව ඇති කොටස් සියල්ලම හෝ කොටසක් විකුණා ප්‍රාග්ධන ලාභයක් හා ලාභාංශය උපයා ගත හැකිය.
ආයතනික ණය සුරැකුම්පත්වල ආයෝජනය කිරීම	ආයතනික බැඳුම්කර යනු පෞද්ගලික අංශයේ සමාගම්වල මධ්‍ය කාලීන හෝ දිගු කාලීන ණය සුරැකුම්පත් වන අතර ඒවා මිල දී ගන්නාට කල්පිරීමේදී පොළිය ගෙවීමටද ප්‍රාග්ධන මුදල මුදා හැරීමටද බැඳී සිටී. ආයතනික ණය සුරැකුම්පත් ආයෝජකයින්ට ස්ථාවර ආදායමක් ලබා දෙනු ලැබේ.
භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල ආයෝජනය කිරීම	ශ්‍රී ලංකා රජය විසින් ප්‍රධාන වශයෙන් කෙටි කාලීන ණය උපකරණ ලෙස භාණ්ඩාගාර බිල්පත්ද, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය උපකරණ ලෙස භාණ්ඩාගාර බැඳුම්කරද මහජනතාව වෙත නිකුත් කිරීමෙන් දේශීයව ණය මුදල් ලබා ගනියි. එකඟ වූ කාල සීමාව අවසානයේ, බිල්පත් හෝ බැඳුම්කරවල ආයෝජනය කර ඇති මුළු මුදල අදාළ පොලිය සමඟ ආපසු ගෙවනු ලැබේ.
අන්‍යෝන්‍ය අරමුදල් සහ ඒකක භාරවල ආයෝජනය	මෙම අරමුදල් නිර්මාණය කරනු ලබන්නේ සාපේක්ෂව කුඩා මුදල් ප්‍රමාණයකින් දායකත්වය ලබාදෙන ආයෝජකයින් සුළු සංඛ්‍යාවක් විසිනි. විශේෂ ආයෝජන කුසලතා සහ හැකියාවන් ඇති වෘත්තීය මට්ටමේ ආයෝජන විශේෂඥයන් විසින් මෙම අරමුදල් කළමනාකරණය කරනු ලබයි. එම අරමුදල් කළමනාකරුවන් විසින් කොටස් වෙළඳපල සහ බැඳුම්කර වැනි විවිධ ආයෝජන අවස්ථා වල අරමුදල් ආයෝජනය කර ඒකක භාර හා අන්‍යෝන්‍ය අරමුදලේ ආයෝජනය කර ඇති අයට අදාළ ප්‍රතිලාභ ලබා දෙනු ලබයි. මෙහිදී, ආයෝජන විශේෂඥයින් විසින් ආයෝජනයේ අවදානම කළමනාකරණය කරනු ලබයි.
දේපළ (ඉඩම්, නිවාස) මිලදී ගැනීම	දේපළ වල ආයෝජනය කිරීම යනු නිවාස, ගොඩනැගිලි, ඉඩම් ආදිය මිලදී ගැනීමයි. දේපළ කුලියට දීමෙන් හෝ බදු දීමෙන් හෝ එහි වටිනාකම වැඩි වූ පසු වැඩි මුදලකට විකිණීමෙන් හෝ ආදායමක් උපයා ගත හැකිය.
ඉතා ඉහළ වටිනාකම්වලින් යුතු භාණ්ඩ මිලදී ගැනීම	රන්, රිදී, මුතු, මැණික් ආදී ඉහළ වටිනාකමක් ඇති වත්කම් මිලදී ගැනීම.
ව්‍යාපාරයක ආයෝජනය කිරීම	නව ව්‍යාපාරයක් ආරම්භ කිරීම හෝ පවතින ව්‍යාපාරයක ආයෝජනය කිරීම. ඔබේ ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභය ව්‍යාපාරය විසින් උපයන ලාභය වනු ඇත.
ආයෝජන නැඹුරුතාවයකින් යුතු රක්ෂණයක් ලබා ගැනීම	ආයෝජන අරමුණු සඳහා විශේෂයෙන් නිර්මාණය කරන ලද රක්ෂණාවරණයක් මිලදී ගැනීම. කල්පිරීමේදී, එය මූලික ආයෝජනයට වඩා ඉහළ වටිනාකමක් ලබා දෙනු ඇත.

ආයෝජනය කිරීමේදී සලකා බැලිය යුතු සාධක

ආයෝජනයේ අරමුණ

ආයෝජන මගින් ආදායම් උත්පාදනය, ධනය සංරක්ෂණය කිරීම, අනාගත අවශ්‍යතා සඳහා ප්‍රාග්ධනය රැස් කිරීම හෝ විශ්‍රාම ගැනීම හෝ අධ්‍යාපන අරමුදල් වැනි දිගුකාලීන අරමුණු සපුරාලීම වැනි නිශ්චිත මූල්‍ය ඉලක්ක සපුරා ගැනීම අරමුණු කරයි.

ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ.

ප්‍රතිලාභය යනු ආයෝජනයකින් උපයන ලද ඕනෑම ආදායමක් (ලාභාංශ හෝ පොලිය වැනි) සහ ආයෝජනයේ වටිනාකමෙහි වෙනස්වීම් හේතුවෙන් ඇති වන ඕනෑම ප්‍රාග්ධන ලාභයක් (හෝ අලාභයක්) ඇතුළුව ආයෝජනයකින් ලබා ගන්නා ලද මුළු මූල්‍යමය ලාභය හෝ අලාභයයි.

ආයෝජන ප්‍රතිලාභය පහත පරිදි ගණනය කළ හැකිය

$$\text{ප්‍රතිලාභය} = \frac{(\text{අවසාන අගය} - \text{ආරම්භක අගය}) + \text{ආදායම}}{\text{ආරම්භක අගය}}$$

කාලපරිච්ඡේදය අවසානයේ ආයෝජනයේ වෙළඳපල වටිනාකම අවසාන අගය වන අතර, ආරම්භක අගය කාලපරිච්ඡේදය ආරම්භයේදී ආයෝජනයේ වෙළඳපල වටිනාකම වේ. අපි මෙය ආයෝජනයේ 'ප්‍රාග්ධන ලාභය' ලෙසද හඳුන්වා දී ඇත. ආදායම යනු ලාභාංශ හෝ පොලිය වැනි ආයෝජනයෙන් ලැබෙන ඕනෑම මුදල් ප්‍රවාහයකි.

උද්ධමනය යනු ආයෝජනයේ මූර්ත ප්‍රතිලාභයේ ප්‍රධාන නිර්ණායකයකි. එය අනාගත මුදල් ප්‍රවාහයන්ගේ මිලදී ගැනීමේ හැකියාව අඩු කරයි. ආයෝජනයක අපේක්ෂිත ලාභදායීතාවය තක්සේරු කිරීමේදී උද්ධමනය සලකා බැලිය යුතුය. ආයෝජනයේ ප්‍රතිලාභ අනුපාතය ආර්ථිකයේ පවතින/අපේක්ෂිත උද්ධමන අනුපාතයට වඩා වැඩි විය යුතුය.

ආයෝජනයේ ප්‍රතිලාභ වාර ගණන

දෛනික, මාසික, කාර්තුමය හෝ වාර්ෂික වැනි ආයෝජනයකින් ප්‍රතිලාභ සාක්ෂාත් කර ගන්නා හෝ බෙදා හරින ආවර්තිතා කාලය ප්‍රතිලාභ වාර ගණන ලෙස හඳුනා ගැනේ. එය ආයෝජන කළඹ (බහු ආයෝජන) සැලසුම් කිරීමේදී සහ මුදල් ප්‍රවාහ කළමනාකරණයේ ප්‍රධාන සාධකයකි.

ආයෝජනයට අදාළ අවදානම සහ ආරක්ෂාව

අවදානම යනු යම් ආයෝජනයකින් ලැබිය හැකි අපේක්ෂිත ප්‍රතිලභයේ සිදුවිය හැකි වෙනසයි. ආයෝජන අවස්ථාව නිර්මාණය කරනු ලැබූ ආයතනයේ ස්ථාවරත්වය, වෙළඳපල තත්වයන්, ආර්ථික පරිසරයේ සිදුවන වෙනස්වීම් සහ අදාළ ආයෝජනට ආවේනික ලක්ෂණ ආදී විවිධ සාධක වල හේතුවෙන් ආයෝජයන අවදානම ඇති වේ. මහ බැංකු නියාමන රාමු වලට අනුගත වන සහ විනිවිදභාවයෙන් යුතු මූල්‍ය හෙළිදරව්වක් ඇති මූල්‍ය සමාගමක් විසින් නිකුත් කරන ලද ආයෝජන මෙවලම් (ණයකර, කොටස්) සාපේක්ෂව ආරක්ෂිත ආයෝජන අවස්ථා ලෙස සැලකේ. රජයේ අනුග්‍රහය ලත් ආයෝජන උපකරණ (භාණ්ඩාග ාරික බිල්පත් සහ බැඳුම්කර) වඩාත්ම ආරක්ෂිත යැයි සැලකේ.

ආයෝජනයේ කල්පිරීමේ කාලය

කල්පිරීමේ කාලය යනු ආයෝජනයක හෝ මූල්‍ය උපකරණයක කාලසීමාව හෝ ආයු කාලය වන අතර, ඉන් පසු ආයෝජිත ප්‍රාග්ධන මුදල ආපසු ගෙවනු ලබන අතර ආයෝජනය තවදුරටත් නොපවතී. එය මුදල් ප්‍රවාහ සඳහා කාල සීමාව තීරණය කරන අතර ද්‍රවශීලතාවය සහ අවදානම තක්සේරු කිරීමේදීද තීරණාත්මක සාධකයක් ලෙස සලකා බැලේ.

ආයෝජනයට බදුවලින් සිදු වන බලපෑම

ආයෝජනයක බදු බලපෑම යනු අදාළ බදු නීති යටතේ ආයෝජනයකින් ලැබෙන ශුද්ධ ප්‍රතිලාභ වලින් කොතරම් ප්‍රමාණයක් බදු ලෙස රජයට ගෙවීමට සිදුවේද යන්නයි.

ආයෝජනයේ ද්‍රවශීලතාවය

ද්‍රවශීලතාවය යනු වත්කමක් ඉක්මනින් සහ එහි වෙළඳපල වටිනාකමට ආසන්න මිලකට මිලදී ගැනීමට හෝ විකිණීමට ඇති හැකියාවයි. ප්‍රාග්ධන අලාභයක් නොලබා ආයෝජනයක් මුදල් බවට පරිවර්තනය කිරීමේ පහසුව එයින් පිළිබිඹු වේ.

ආයෝජනයක අවදානම සහ ප්‍රතිලාභ අතර සම්බන්ධතාවය

ආයෝජනය සම්බන්ධයෙන් ගත් කල, අවදානම යනු ආයෝජනය කළ මුදලින් යම් ප්‍රමාණයක් (සමහර විට ආයෝජනය කළ මුළු මුදල) අහිමි වීමේ සම්භාවිතාව හෝ යම් කාලයක් තුළ ආයෝජනයක ප්‍රතිලාභවල අස්ථාවරත්වය ලෙස අර්ථ දැක්විය හැකිය. ආයෝජන ප්‍රතිලාභය, ආයෝජන ආදායම සහ ප්‍රාග්ධන ලාභ වලින් සමන්විත වේ.

ආයෝජකයින් ඉතා ඉහළ අවදානම් සහිත ආයෝජනයක් මිලදී ගැනීම ගැන සලකා බලන විට, එය ඔවුන්ගේ ආයෝජනයෙන් කොටසක් හෝ සියල්ලම අහිමි වීමට ඉඩ ඇති බව ඔවුන් දැන සිටිය යුතුය. ප්‍රතිලාභ අස්ථාවරත්වය යනු අපේක්ෂිත ප්‍රතිලාභයෙන් සැබෑ ප්‍රතිලාභය කොතරම් දුරස් වන්නේද යන්නයි. එය සම්මත අපගමනය මගින් මනිනු ලැබේ.

ආයෝජන ප්‍රතිලාභයක් ප්‍රාග්ධන ලාභ සහ ලාභාංශ වැනි විවිධ ආකාරවලින් පැමිණිය හැකිය. මෙය ආරම්භක ආයෝජන වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කළ හැකිය.

සාමාන්‍යයෙන් ඉහළ අවදානමක් ඇති ආයෝජන විසින් වඩා ඉහල ප්‍රතිලාභ ලබා දෙන අතර, අඩු අවදානම් සහිත ආයෝජන විසින් ලබා දෙන්නේ සාපේක්ෂව අඩු ප්‍රතිලාභයකි.

කොටස් වෙළඳපොලේ ආයෝජනය කිරීම, කොටස් වටිනාකම්වල ඉහළ අස්ථාවරත්වය හේතුවෙන් ඉහළ අවදානම් සහිත ආයෝජනයක් ලෙස සැලකිය හැකිය. කෙසේ වෙතත්, ඉහළ අවදානම් සහිත ආයෝජන සෑම විටම ඉහළ ප්‍රතිලාභ ජනනය නොකරයි. ආයෝජනය කිරීමේදී ඇති 'ඉහළ අවදානම' එයයි. ආයෝජකයා ලාභය සහ අලාභය යන තත්වයන් දෙකටම සූදානම් විය යුතුය. රජයේ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කිරීම සාමාන්‍යයෙන් අඩු අවදානම් සහිත ආයෝජනයක් ලෙස හඳුනාගෙන ඇත. මෙයට හේතුව රජය තම වගකීම් පැහැර හැරීමේ සම්භාවිතාව ඉතා අඩු බැවිනි.



ආයෝජන අවදානම අවම කරන්නේ කෙසේද?

ආයෝජන අවදානම අවම කිරීම යනු අවදානම් ප්‍රභවයන් තේරුම් ගැනීම සහ විවිධ වත්කම් හෝ ආයෝජන වර්ග හරහා අවදානම විවිධාංගීකරණය කරන උපාය මාර්ග භාවිතා කිරීමයි. ආයෝජන කළඹක ව්‍යුහය සකස් කිරීමෙන්, ආයෝජකයින්ට සැලකිය යුතු පාඩු ඇතිවීමේ සම්භාවිතාව අඩු කර වඩාත් ස්ථාවර ප්‍රතිලාභ සහතික කළ හැකිය.

අවදානම අවම කිරීම සඳහා ප්‍රධාන උපාය මාර්ගය වන්නේ ආයෝජන කළඹක් පවත්වා ගැනීමෙන් ආයෝජන විවිධාංගීකරණය කිරීමයි.

විවිධාංගීකරණය

විවිධාංගීකරණය යනු ආයෝජන කළඹෙහි සමස්ත අවදානම අඩු කිරීම සඳහා විවිධ ආයෝජන උපකරණ/අවස්ථා වල ආයෝජනය කිරීමයි. ආයෝජන වත්කම් මිශ්‍රණයක් තබා ගැනීමෙන් සමස්ථ ආයෝජන කළඹේ සැලකිය යුතු අලාභයක් ඇතිවීමේ අවදානම අඩු කරයි. (ආයෝජන කලඹ තුල ඇති එක ආයෝජනයකින් සිදුවන අලාභයක් තවත් ආයෝජනයකින් ආවරණය වීමක් සිදු වේ.)

ඇමරිකානු ආයෝජක වොරන් බෆට් විසින් "ඔබේ සියලු බිත්තර එක කූඩයකට දමන්න එපා" යන සුප්‍රසිද්ධ වාක්‍ය ඛණ්ඩයේ වැදගත්කම අවධාරණය කර ඇත. බිත්තර පහසුවෙන් බිඳෙන සුළු වන අතර ඒ සියල්ල එක කූඩයකට දැමීමෙන්, කූඩය බිම වැටුණහොත් සියලු බිත්තර කැඩී යාමේ අවදානමක් ඇත. නමුත්, බිත්තර එක කූඩයක් තුල ගබඩා නොකර කූඩ කිහිපයක ගබඩා කිරීමෙන්, එක කූඩයක් බිම වැටුනද, අනෙක් කූඩ වල ඇති බිත්තර ආරක්ෂා වී පවතිනු ඇත.

අවම වශයෙන් බිත්තර කිහිපයක් නොකැඩී පැවතීමේ අවස්ථාව උපරිම කිරීම සඳහා, බිත්තර වෙන වෙනම කූඩ කිහිපයක දැමිය යුතු අතර, එම කූඩ විවිධ පුද්ගලයින්ට රැගෙන යාමට ලබා දිය යුතුය. ඒ හා සමානව, සියලු මුදල් එක් වත්කමක ආයෝජනය කළහොත්, ඔබගේ සමස්ත ආයෝජනයේ මුළු වටිනාකමම විනාශ විය හැකිය.

සමාගම් කොටස්, භාණ්ඩාගාර බැඳුම්කර සහ දේපළ වෙළඳාම් වත්කම් සහිත ආයෝජන කළඹක්, සමාගම් කොටස් පමණක් ඇති ආයෝජන කළඹකට වඩා අඩු අවදානමකින් යුතු වනු ඇත.

එක් එක් ආයෝජන වත්කම් බොහෝ විට වෙළඳපල තත්ත්වයන්ට වෙනස් ලෙස ප්‍රතිචාර දක්වන බැවින්, එක් වත්කමකින් ඇතිවන අහිතකර ප්‍රතික්‍රියා, කළඹෙහි තවත් වත්කමක හිතකර/උදාසීන ප්‍රතික්‍රියා මගින් ආවරණය කර ගත හැකිය. විවිධාංගීකරණය මගින් ආයෝජකයින්ට සමස්ත අවදානම අඩු කරන අතරම ස්ථාවර ආයෝජන ප්‍රතිලාභ ලබා ගැනීමට හේතු විය හැක.

මුදලෙහි කාලානුරූප වටිනාකම

මුදලෙහි කාලානුරූප වටිනාකම යනු, යම් කිසි කාලයන් දෙකක් අතරතුරදී මුදල්හි ඇති ඉපයීම් ශක්‍යතාවය හේතුවෙන්, යම් නිශ්චිත මුදල ප්‍රමාණයක් අනාගත දිනයකදී ලැබෙන වටිනාකමට වඩා වර්තමාන මොහොතේදී වැඩි වටිනාකමකින් යුක්ත බවට වන සංකල්පයයි. උදාහරණයක් ලෙස, අද ඔබ අතට ලැබෙන රුපියල් 5000 ක වටිනාකම, තව වසරකට පසුව ඔබ අතට ලැබෙන රුපියල් 5000ට වඩා වැඩි වනු ඇත.

මුදලේ කාලානුරූපී වටිනාකම නිතර සිහි තබා ගත යුතු වැදගත් සංකල්පයකි. මන්ද ඔබේ මුදල් වරක් ආයෝජනය කළ විට, එය කාලයත් සමඟ වර්ධනය වනු ඇත. ඔබ විසින් යම් මුදලක් ඉතුරුම් ගිණුමකට හෝ ස්ථාවර තැන්පතුවකට තැන්පත් කල විට, එම මුදලට වැල් පොලියක් උපයා ගත හැකි අතර, ආයෝජන වර්ධනයට එකී වැල් පොළී බලපෑම සැලකිය යුතු ලෙස හේතු විය හැකිය.

අනෙක් අතට, ආයෝජනය නොකළ මුදල්වල වටිනාකම කාලයත් සමඟ අඩු වී යයි. උදාහරණයක් ලෙස, අද ඔබට රුපියල් 100 න් ලබාගත හැකි දේට සාපේක්ෂව, මීට වසර කීපයකට පෙර එම රු. 100 ට මිලදී ගත හැකිව තිබූ දේ සලකා බලන්න. එම වෙනසට හේතුව ලෙස දැක්විය හැක්කේ, උද්ධමනය සහ විභව ඉපැයීම් අහිමි වීම හේතුවෙන් මුදල්වල වටිනාකම අඩු වීමයි. ඔබ ඔබේ මුදල් වසර 10 ක් පුරාවට ඔබේ නිවසේ තබා ගතහොත්, උද්ධමනය නිසා එහි වටිනාකම අඩු වනවා පමණක් නොව, ආයෝජනය කළ විට උපයා ගත හැකිව තිබූ පොලියද ඔබට අහිමි වනු ඇත.

මුදලේ කාලානුරූපී වටිනාකම යනු සෑම මූල්‍ය හා ආයෝජන තීරණයක් සඳහාම පදනම සපයන මූලික සංකල්පයකි. ණයක් ගැනීමේ සිට වැටුපක් සාකච්ඡා කිරීම හෝ මිලදී ගැනීමේ තීරණයක් ගැනීම දක්වා, හොඳම මූල්‍ය ක්‍රියාමාර්ගය ඇගයීමට ඔබට මුදලේ කාලානුරූපී වටිනාකම භාවිතා කළ හැකිය.

මුදලෙහි කාලානුරූපී අගය ගණනය කිරීම

මුදලෙහි කාලානුරූපී අගය ගණනය කිරීම සඳහා, පහත විචල්‍යයන් අවබෝධ කරගත යුතුය.

වර්තමාන අගය (PV)

වර්තමාන අගය (PV) යනු යම් කිසි මුදල් ප්‍රමාණයක අද දින වටිනාකම හෝ වත්මන් අගයයි.

අනාගත අගය (FV)

අනාගත වටිනාකම (FV) යනු අපේක්ෂිත ප්‍රතිලාභයක් (හෝ වර්ධන වේගයක්) මත පදනම්ව කලින් තීරණය කළ අනාගත දිනයක වත්මන් මුදල් එකතුවකට (හෝ වත්කමකට) ලබා ගත හැකි වටිනාකමයි.

උදාහරණයක් ලෙස, ඔබ අද (Yo) රුපියල් 100,000 ක් 20% ක වාර්ෂික පොලී අනුපාතයක් සහිතව බැංකුවක ආයෝජනය කරන්නේ නම්, වසරක් අවසානයේ එහි වටිනාකම රුපියල් 120,000 ක් වනු ඇත.

පොලී/වට්ටම් අනුපාතය (r)

වට්ටම් අනුපාතය යනු වත්කමක හෝ ආයෝජනයක වර්තමාන වටිනාකම තීරණය කිරීම සඳහා භාවිතා කරන ප්‍රතිලාභ අනුපාතයයි. මෙය තවත් ආකාරයකින් පැහැදිලි කරන්නේ වට්ටම් අනුපාතය යනු ආයෝජකයෙකු විසින් වර්තමානයේදී (Yo) ලැබීමට ඇති යම් මුදලක් පිළිනොගෙන, එම මුදල අනාගත දිනකදී පිළිගැනීමට තීරණය කිරීමෙන් අහිමි වන ප්‍රතිලාභයයි.

සංයුක්ත කිරීමේ වාර ගණන (n)

සංයුක්ත කිරීමේ වාර ගණන, නැතහොත් පොලිය වර්ෂයක කාලයක් තුලදී කොපමණ වාරයක් තක්සේරු කරන්නේද යන්න, යම් මුදලක අනාගත වටිනාකමට සැලකිය යුතු ලෙස බලපානු ලබයි. ආයෝජකයෙකු විසින් යම් පොලියක් ලැබෙන වත්කමකට මුදල් යොදවන බව සිතමු. සරළ උදාහරණයක් ලෙස, ඔබ ස්ථාවර තැන්පතුවක මුදල් ආයෝජනය කර ඇති විටක, ඔබගේ තැන්පතුවට අදාළ පොලිය මාසිකව, කාර්තුමය හෝ දෛනික වශයෙන් ගණනය කර තැන්පතුවටම නැවත ආයෝජනය කළ හැක.

මුදලෙහි කාලානුරූපී අගය ගණනය කිරීමේදී "කාල රේඛාව" භාවිත කිරීම මගින් අදාළ තොරතුරු මනා ලෙස විශ්ලේෂණය කර ගත හැක. කාල රේඛාව සඳහා උදාහරණයක් පහත පරිදි දැක්විය හැකිය.

කාලරේඛා (n)	0 (r=0.05)	1	2	3	4	5
	1000	1050	1102.50	1157.63	1215.51	1278.28
	PV	FV_1	FV_2	FV_3	FV_4	FV_5

මුදලෙහි කලානුරූපී අගය ගණනය කරන්නේ කෙසේද?

පහත දැක්වෙන උදාහරණය මගින් මුදලෙහි කාලානුරූපී අගය ගණනය කරණ ආකාරය දැක්වේ.

උදාහරණය: සමන් මහතාට ඔහුගේ ආයෝජන වලින් මුදල් නැවත ලබා ගැනීමට මූල්‍ය විකල්ප දෙකක් ලබා දී තිබේ.

විකල්පය 1: අදම රුපියල් මිලියන 4.5ක් ලබා ගැනීම

විකල්පය 2: වසර දෙකකින් රුපියල් මිලියන 5ක් ලබා ගැනීම

අද රුපියල් මිලියන 4.5ක් ලබා ගැනීම, වසර දෙකකින් රුපියල් මිලියන 5ක් ලබා ගැනීමට වඩා වෙනස් බව මුදලෙහි කාලානුරූපී අගය ගණනය කිරීමෙන් හඳුනා ගත හැක. ඒ අනුව, සමන් මහතාට වඩාත් ප්‍රයෝජනවත් වන්නේ කුමන විකල්පයද?

සමන් මහතා අද දින ලබා ගන්නා රුපියල් මිලියන 4.5 ක මුදල වාර්ෂිකව 6% ක වාර්ෂික වැල් පොළියක් යටතේ ගෙවන ඉතුරුම් ගිණුමක ආයෝජනය කරයි නම්, වසර දෙකකට පසු ඔහුගේ ඉතුරුම් ශේෂය ගණන කල හැකිය. ඒ සඳහා ඉහත සාකච්ඡා කළ විචල්‍යයන් ඇතුළත් පහත සූත්‍රය

භාවිතා කර කළ හැකිය.

මුදලේ අනාගත වටිනාකම = වර්තමාන වටිනාකම (1+ r) $^{(n)}$

r = සංයුක්ත කාල පරිච්ඡේදයට අදාළ ප්‍රතිලාභ අනුපාතය (පොළී අනුපාතය)

n = පොලිය සංයුක්ත වන කාල පරිච්ඡේද ගණන

t = සලකා බැලිය යුතු වසර ගණන

ඒ අනුව,

මුදලේ අනාගත වටිනාකම = 4,500,000 ((1 + 0.06) 2

වර්තමාන වටිනාකම = රු. 5,056,200

එය දෙවන විකල්පය විසින් සමන් මහතාට වසර දෙකකට පසු ලැබෙන රු. 5,000,000 ට වඩා වැඩිය. එබැවින්, අද (වර්තමානයේ) රු. මිලියන 4.5 ක් ලබා ගැනීම වසර දෙකකට පසු රු. මිලියන 5 ක් ලබා ගැනීමට වඩා සමන් මහතාට වාසිදායකය. මන්ද අද ලබා ගන්න රු. මිලියන 4.5 ආයෝජනය කිරීම මගින් දෙවන විකල්පයෙන් ලැබෙන මුදලට වඩා වැඩි වටිනාකමක් (එනම් රු.5,056,200 ක්) ලබා ගත හැක.

සංයුක්ත පොලිය (වැල් පොලිය)

මෙය දැනටමත් එකතු වී ඇති පොලිය මත අය කරනු ලබන පොලියයි. උදාහරණයක් ලෙස, ඔබ වාර්ෂිකව 8% ක පොලියක් ගෙවන ඉතුරුම් ගිණුමකට රු. 1000 ක් තැන්පත් කළහොත්, පළමු වසර අවසානයේ එය රු. 1080 ක් වනු ඇත. කෙසේ වෙතත්, දෙවන වසර අවසානයේදී, එය රු. 1,166.40 ක් වනු ඇත, එහිදී දෙවන වසර තුළ එකතු කරන ලද පොලී මුදල පළමු වසරට වඩා වැඩි වේ. පළමු වසර අවසානයේ රු. 80 ක් වුවද දෙවන වසර අවසානයේ එකතුවන පොලිය රු. 86.40 ක් බවට පත් වේ. එයට හේතුව වන්නේ, පළමු වසරේදී එකතු වූ රු. 80 ක පොලිය මත නැවත පොලියක් එකතු වීමයි. සංයුක්ත පොලිය ගණනයේදී සිදු වන්නේ, පොලිය මත පොලී එකතු වීමයි. එනම්, යම් සංයුක්ත කාල පරිච්ඡේදයක් තුල එකතුවන පොලියද නැවත එම පොලී අනුපාතය යටතේ ආයෝජනය වීමකි.

පුද්ගල මූල්‍ය කටයුතු සඳහා මුදලෙහි කාලානුරූපී අගය භාවිතා කිරීම

ඉතුරුම් සහ ආයෝජන

ඔබ විසින් අද ඉතිරි කර ආයෝජනය කරන එක රුපියලක්, හෙට ඉතිරි කර ආයෝජනය කරන රුපියලට වඩා වටිනා කමින් වැඩිය. කාලයත් සමඟ වටිනාකම ඉහළ යන වත්කම්වල ඔබේ ඉතුරුම් අදම (වර්තමනයේදීම) ආයෝජනය කිරීමෙන් අනාගතයේදී ඔබේ ඉතුරුම් වලට වැඩි වටිනාකමක් ලබා ගත හැකිය.

ණය කළමනාකරණය

අද ඔබේ ණයෙන් ඉවත් කරන ඕනෑම රුපියලක් හෙට නැතහොත් අනාගතයේදී ඉවත් කරන රුපියලට වඩා අඩු වියදම් සහිත වේ.

විශ්‍රාම සැලසුම් කිරීම

විශ්‍රාම දිවිය සඳහා සැලසුම් කරන විට, ඔබට සංයුක්ත වැල් පොලියෙන් ප්‍රතිලාභ ලබා ගත හැකි අතර ඔබ සතු වර්තමාන ඉතුරුම් ඉතා ඉහළ අනාගත වටිනාකමක් බවට පරිවර්තනය කළ හැකිය. නමුත් උද්ධමනයෙහි ඇති බලපෑම තේරුම් ගත යුතුය.

උද්ධමනය සහ එහි බලපෑම

උද්ධමනය මුදලෙහි කාලානුරූපී අගයට හානි කරනු ලබයි. මන්ද මුදලෙහි මිලදී ගැනීමේ හැකියාව කාලයත් සමඟ අඩු වන බැවිනි. වෙනත් වචන වලින් කිවහොත්, එක රුපියලක වටිනාකම අදට වඩා අනාගතයේදී අඩු වනු ඇත.

එබැවින්, උද්ධමන අනුපාතයට වඩා වැඩි අනුපාතයකින් ධනාත්මක ප්‍රතිලාභ ජනනය කරන වත්කම්වල ආයෝජනය කිරීමෙන් ඔබට උද්ධමනය විසින් පහත දමනු ලබන මිලදී ගැනීමේ හැකියාව ජය ගත හැකිය. එනම්, ඔබේ ආයෝජන ප්‍රතිලාභ අනුපාතය රටේ උද්ධමන අනුපාතයට වඩා වැඩි විය යුතු වත්කම් වල ඔබ ආයෝජනය කළ යුතුය.

කොටස් වෙළඳපොලේ ආයෝජනය කිරීම

කොටස් හුවමාරුවක් යනු කුමක්ද?

කොටස් හුවමාරුවක් යනු කුඩා කොටස් වලින් සමාගමක හිමිකාරිත්වය මිලදී ගැනීම සහ විකිණීම සඳහා වන වෙළඳපොළකි. ඔබ සමාගමක කොටසක් මිලදී ගන්නා විට, ඔබ එම සමාගමේ හිමිකාරිත්වයෙන් කුඩා කොටසක් අත්පත් කර ගනී. ඒ සමඟම, ඔබ සමාගමේ හිමිකරුවෙකු බවට පත්වේ. එවිට ඔබ එම සමාගමෙන් මිලදී ගත් කොටස් වලට සමාන මුදලක් ආයෝජනය කර ඇත.

කොළඹ කොටස් හුවමාරුව/වෙළඳපොළ

ශ්‍රී ලංකාවේ එකම කොටස් වෙළෙඳපොළ කොළඹ කොටස් වෙළෙඳපොළ වන අතර එහි ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටා ඇත. මහනුවර, යාපනය, මීගමුව, මාතර, කුරුණෑගල, අනුරාධපුර, මඩකලපුව, බණ්ඩාරවෙල සහ රත්නපුර යන නගරවල ශාඛා ඇත. එය ආයෝජකයින්ට කොටස් වෙළඳපොලේ ප්‍රසිද්ධ ලැයිස්තුගත සමාගම්වල කොටස් මිලදී ගැනීමට සහ විකිණීමට හැකි වේදිකාවක් ලෙස ක්‍රියා කරයි. ආයෝජන සඳහා පහසුකම් සැලසීමෙන් සහ සමාගම්වලට වර්ධනය වීමට අවශ්‍ය ප්‍රාග්ධනය ලබා දීමෙන් කොළඹ කොටස් වෙළඳපොල රටේ ආර්ථිකයට ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. කොළඹ කොටස් වෙළඳපොල පිළිබඳ වැඩිදුර දැන ගැනීමට, ඔබට මෙම වෙබ් අඩවියට (www.cse.lk) පිවිසිය හැකිය.

කොළඹ කොටස් වෙළෙඳපොළ ක්‍රියාත්මක වන්නේ කෙසේද?

1. සමාගම් ලැයිස්තුගත කිරීම

සමාගමකට අරමුදල් රැස් කිරීමට අවශ්‍ය වූ විට, එය මූලික මහජන නිකුතුවක් (IPO) හරහා තම කොටස් විකිණීමට ඉදිරිපත් කිරීමෙන් "ලැයිස්තුගත පොදු සමාගමක්" බවට පත්විය හැකිය. මෙයින් අදහස් කරන්නේ ඕනෑම කෙනෙකුට සමාගමේ හිමිකාරිත්වයෙන් කොටසක් මිලදී ගත හැකි බවයි. සමාගමක් කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීමට සැලසුම් කරන්නේ නම් එම සමාගමේ මූල්‍ය ස්ථාවරත්වය සහ විනිවිදභාවය පිළිබඳ නිශ්චිත නිර්ණායක සපුරාලිය යුතුය.

2. කොටස් මිලදී ගැනීම සහ විකිණීම

සමාගමක කොටස් ලැයිස්තුගත කළ පසු, ඒවා ඕනෑම පුද්ගලයෙකුට (ආයෝජකයෙකුට) මිලදී ගෙන විකිණීමට හැකිය. ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් අතර අතරමැදියන් වන කොටස් තැරැව්කරුවන් හරහා කොටස් මිලදී ගැනීම සිදුවේ. ආයෝජකයින්ට වෙළඳපොල ඇණවුම් (වෙළඳපොල මිලට මිලදී ගැනීම/විකිණීම) හෝ ඇණවුම් සීමාකිරීම (මිලදී ගැනීම/විකිණීම සඳහා නිශ්චිත මිලක් නියම කිරීම) වැනි විවිධ ඇණවුම් කළ හැකිය.

3. කොටස් මිල

කොටස් මිල තීරණය වන්නේ සැපයුම සහ ඉල්ලුම අනුව ය. සමාගමක කොටස් සඳහා විකිණීමට ඇති ප්‍රමාණයට වඩා වැඩි ඉල්ලුමක් ඇති විට, එම සමාගමේ කොටස් මිල ඉහළ යයි. අනෙක් අතට, ගැනුම්කරුවන් විසින් මිලදී ගැනීමට බලාපොරොත්තුවන ප්‍රමාණයට වඩා වැඩි කොටස් ඇති විට, මිල පහත වැටේ. මීට අමතරව, දේශීය හා විදේශීය දේශපාලන, ආර්ථික තත්ත්වයන්හි වෙනස්වීම්, සමාග මේ ප්‍රධාන කළමනාකරණ තීරණ සහ සමාගමේ අනාගතය පිළිබඳ ආයෝජකයන්ගේ අපේක්ෂාවන් ද මිල තීරණයට බලපෑ හැකිය.

සටහන: වැඩි විස්තර සඳහා, CSE වෙබ් අඩවියේ ඇති අධ්‍යාපනික වීඩියෝ බලන්න.

කොළඹ කොටස් හුවමාරුවෙහි ප්‍රාථමික වෙළඳපොළ

ප්‍රාථමික වෙළඳපොළ යනු පළමු වරට කොටස් හෝ බැඳුම්කර විකුණනු ලබන ස්ථානයයි. එය මූලික මහජන නිකුතුවක් හරහා සිදු කෙරේ. සමාගමකට ප්‍රාග්ධනය රැස් කිරීමට අවශ්‍ය වූ විට, එයට කොටස් වෙළඳපොළ හරහා මූලික මහජන නිකුතුවක් (IPO) මඟින් මහජනතාවට නව කොටස් නිකුත් කළ හැකිය. මූලික මහජන නිකුතුවක කොටස් විකිණීමෙන් ලැබෙන ආදායම සෘජුවම අදාළ සමාගමට ලැබේ. මෙම මුදල් සමාගමේ අභිමතය පරිදි ප්‍රාග්ධන ප්‍රසාරණය, පර්යේෂණ සහ සංවර්ධනය හෝ ණය ආපසු ගෙවීම වැනි විවිධ අරමුණු සඳහා භාවිතා කළ හැකිය.

ප්‍රාථමික වෙළඳපොලේ කොටස් මිලදී ගන්නන් ආයෝජකයින් වන අතර, කොටස් විකුණන්නා යනු එම කොටස් නිකුත් කරන සමාගමයි. ආයෝජකයින්ට මූලික මහජන නිකුතුවකදී නියම කරන මිලට කොටස් මිලදී ගත හැකි අතර, මූලික මහජන නිකුතුවකින් පසු කොටස් මිල ඉහළ ගියහොත්, ද්විතීයික කොටස් වෙළඳපොලේ එම කොටස් විකුණා ප්‍රාග්ධන ලාභයක් ලබා ගත හැකිය.

ආයෝජන බැංකු බොහෝ විට මූලික මහජන නිකුතු සඳහා ප්‍රාග්ධනය සපයන අතර, එහිදී ආයෝජන බැංකුව සමාගමේ කොටස් වලින් යම් කොටසක් මිලදී ගෙන සමාගමට යම් ප්‍රාග්ධනයක් ලැබෙන බව සහතික කිරීම සඳහා එය මහජනතාවට නැවත විකුණයි. මෙමගින් මූලික මහජන නිකුතුවක් හරහා සමාගමට ප්‍රාග්ධනය රැස් කිරීමට නොහැකි වීමේ අවදානම අවම කරනු ලබයි.

කොළඹ කොටස් හුවමාරුවෙහි ද්විතීයික වෙළෙඳපොළ

ද්විතීයික වෙළෙඳපොළ යනු ආයෝජකයින් තමන් දැනටමත් හිමිකරගෙන ඇති කොටස් මිලදී ගෙන විකුණන ස්ථානයයි.

මූලික මහජන නිකුතුවකින් මිලදී ගන්නා කොටස් කොළඹ කොටස් වෙළෙඳපොළේ වෙළඳාම් කිරීම ආරම්භ කළ හැක. විවිධ ආයෝජකයින්ට මෙම කොටස් එකිනෙකා අතර මිලදී ගෙන විකිණීමට හැකිය. කොටස් මිල අඩු වූ විට මිලදී ගෙන කොටස් මිල ඉහළ ගිය විට ඒවා විකිණීමෙන් ලැබෙන ලාභය ප්‍රාග්ධන ලාභයක් ලෙස හැඳින්වේ.එනම්, කොටස් මිලදී ගැනීමේ ශුද්ධ පිරිවැය සහ කොටස්වල ශුද්ධ විකුණුම් මිල අතර ධනාත්මක වෙනසයි.

ද්විතීයික වෙළෙඳපොළ තුළ, සැපයුම සහ ඉල්ලුම මත පදනම්ව කොටස්වල මිල උච්චාවචනය වේ. සමාගමේ ක්‍රියාකාරිත්වය, වෙළඳපල තත්වයන් සහ ආර්ථික දර්ශක වැනි සාධක ද මෙම මිල ගණන් තීරණය කිරීමට බලපායි.

ද්විතීයික වෙළෙඳපොළ ආයෝජකයාගේ ආයෝජනවල ද්‍රවශීලතාවය සහතික කරනු ලබයි. ආයෝජකයින්ට කලින් තීරණය කළ දිනයක් දක්වා ඒවා තබා නොගෙන ඉක්මනින් කොටස් විකිණීමට සහ මිලදී ගැනීමට ඉඩ සලසයි. එනම්, ආයෝජකයින්ට ඔවුන්ගේ කොටස් ආයෝජන ඉක්මනින් මුදල් කර ගැනීමට හැකියාව ලබා දෙයි. ද්විතීයික වෙළෙඳපොළ හරහා කොටස් විකිණීමෙන් සමාගමට මුදල් නොලැබේ.

ප්‍රාථමික සහ ද්විතීයික වෙළෙඳපොළ අතර සැලකිය යුතු වෙනස්කම්

නිර්ණායක	ප්‍රාථමික වෙළඳපොළ	ද්විතියික වෙළඳපොළ
අරමුණ	නව සුරැකුම්පත්/කොටස් විකිණීම	දැනටමත් නිකුත් කර ඇති සුරැකුම්පත්/කොටස් මිලදී ගැනීම සහ විකිණීම
ප්‍රාග්ධන ප්‍රවාහය	අරමුදල් කෙලින්ම සමාගමට යයි.	සමාගමට අරමුදල් ගලා එන්නේ නැත. ආයෝජකයින් අතර අරමුදල් හුවමාරු වේ.
මිල තීරණය කිරීම	සමාගම සහ ප්‍රතිරක්ෂණකරුවන් විසින් තීරණය කරනු ලැබේ.	වෙළඳපොළ බලවේග (සැපයුම සහ ඉල්ලුම) මගින් තීරණය වේ.
ආයෝජක අන්තර්ක්‍රියා	ආයෝජකයින් සමාගමෙන් කෙලින්ම මිලදී ගනී.	ආයෝජකයින් එකිනෙකා අතර වෙළඳාම් කරනු ලැබේ.

කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කිරීමට අනුගමනය කළ යුතු පියවර

ප්‍රාථමික වෙළඳපොලේ නව කොටස් නිකුතුවකින් කොටස් මිල දී ගැනීම. (මූලික මහජන නිකුතුව)

- කොටස් මිලදී ගැනීමට කැමති ආයෝජකයෙකු විසින් කොටස් තැරැව්කරුවෙකු හෝ භාරකාර බැංකුවක් හරහා මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) සුරැකුම්පත් ගිණුමක් විවෘත කළ යුතුය.

- බලපත්‍රලාභී කොටස් තැරැව්කාර සමාගම් බොහෝමයක් ඇත.

- නිසි පරිදි සම්පූර්ණ කරන ලද සේවාලාභී ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍ර සමඟ අදාළ සියලුම අවශ්‍යය ලියකියවිලි (ජාතික හැඳුනුම්පතේ පිටපතක් සහ බිල්පත් සාක්ෂියක්) කොටස් තැරැව්කරුට හෝ භාරකාර බැංකුවකට භාර දිය යුතුය. ඉදිරිපත් කිරීමට පෙර පෝරමවල අන්තර්ගතය කියවා තේරුම් ගන්න.

- CDS පද්ධතිය මගින් සේවාලාභී ගිණුම් අංකයක් ජනනය කරනු ලබන අතර, මෙය CDS ගිණුම් විවෘත කිරීම තහවුරු කරමින් කොටස් තැරැව්කරුට හෝ භාරකාර බැංකුවකට භාර දෙනු ඇත.

- සමාගමක් අනාගත ආයෝජකයින්ට ලැයිස්තුගත කිරීමට සූදානම් වන විට හෝ මූලික මහජන නිකුතුවක් (IPO) හරහා කොටස් නිකුත් කිරීමට යන විට පුවත්පත්, වෙබ් අඩවි, ගුවන්විදුලි නාලිකා සහ රූපවාහිනිය හරහා ඒ බව ප්‍රසිද්ධියට පත් කරනු ලබයි.

- කොටස් නිකුතුවකදී, සමාගම, මූල්‍ය තත්ත්වය, අනාගත සැලසුම් පිළිබඳ තොරතුරු සහිත සංස්ථා ප්‍රකාශය (Prospectus) ප්‍රකාශයට පත් කරයි.

- නිකුත් කරන ලද කොළඹ කොටස් හුවමාරුව (CSE), එහි ශාඛා සහ වෙබ් අඩවිය/බැංකුකරුවන් විසින් කොටස් නිකුත් කරන දිනයට පෙර හෝ සමාගම සඳහන් කරන වෙනත් ඕනෑම ස්ථානයකට කොටස් තැරැව්කරුවෙකුගෙන්/කළමනාකරුවන්ගෙන් සංස්ථා ප්‍රකාශය නොමිලේ ලබා ගත හැක.

- වයස අවුරුදු 18 ට වැඩි ආයෝජකයින්ට මූලික මහජන නිකුතුව සඳහා අයදුම් කළ හැකිය.

- සංස්ථා ප්‍රකාශය ප්‍රවේශමෙන් කියවිය යුතු අතර, කොටස් මිලදී ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය නිවැරදිව සහ පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. අවශ්‍ය නම්, උපදෙස් සඳහා විශේෂඥයෙකුගෙන් විමසන්න. ඔබගේ CDS ගිණුම් අංකය ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කර අයදුම් පත්‍රයේ ඔබගේ අත්සන තැබීමට මතක තබා ගන්න.

- චෙක්පතක් හෝ බැංකු කෙටුම්පතක් හරහා ගෙවිය යුතු මුදල ගෙවීමට අදාළ සමාගමට/ කොටස් තැරැව්කරුවකුට/භාරකාර බැංකුවකට/කළමනාකරුවන්ට මෙම පෝරමය කෙලින්ම යැවිය යුතුය. උදාහරණයක් ලෙස, ඔබ කොටස් 100 ක් සඳහා අපේක්ෂා කරන්නේ නම් සහ කොටසක නිකුතුවේ මිල රුපියල් 20.00 ක් නම්, ඔබට රුපියල් 2,000 ක චෙක්පතක්/ කෙටුම්පතක් ලිවිය යුතුය.

- සංස්ථා ප්‍රකාශයෙ හි කොටස් නිකුතුව ආරම්භක දිනය සහ අවසන් දිනය දක්වයි. නිකුතුව අවසන් වන දිනට පෙර චෙක්පත්/බැංකු කෙටුම්පත සමඟ අයදුම්පත් පෝරමය යැවීමට වග බලා ගන්න. නිකුතුවක් ඉදිරිපත් කරන ලද කොටස් වලට වඩා වැඩි ගැනුම්කරුවන් සිටී නම් කොටස් නිකුතුව ආරම්භක දිනයේම වසා දමනු ලැබේ.

- කොටස් නිකුතුව අවසන් වූ විගසම, සමාගම නිකුතුව සඳහා ඇති ඉල්ලුම ඇගයීමට ලක් කරනු ඇති අතර, ආයෝජකයින් සමාගම මුලින් නිකුත් කිරීමට සැලසුම් කළ ප්‍රමාණයට වඩා වැඩි කොටස් ඉල්ලා ඇත්නම් එම අවස්ථාවේදී (එනම් අධි ඉල්ලුමක් ඇති අවස්ථාවක) සමාගම කොටස් බෙදා හැරීමට යන ආකාරය ප්‍රකාශ කරයි.

- වෙන් කරන ලද කොටස් අයදුම්කරුගේ CDS ගිණුමට විද්‍යුත් වශයෙන් බැර කෙරේ.

- අයදුම්පතක් අර්ධ වශයෙන් පමණක් පිළිගන්නා විට, මූලික නිකුතුවේ අධික ඉල්ලුම හේතුවෙන් අයදුම්කරු විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි මුදල් ආපසු ගෙවීම සිදු කරනු ලැබේ. උදාහරණයක් ලෙස, ඔබ කොටස් 1,000 ක් සඳහා රු. කොටසකට 20.00 (මුළු වටිනාකම රු. 20,000) සහ අධි ඉල්ලුම හේතුවෙන් ඔබට ලබාගත හැක්කේ කොටස් 600ක් පමණි. වෙන් කිරීමේ ලැයිස්තුවේ වසා දැමීමේ දිනය හැර වසා දැමීමේ සිට වෙළඳපොල දින 10ක් (වැඩ කරන දින) ඇතුලත සමාගම විසින් ඉතිරි කොටස් 400 සඳහා (රු. 8,000) මුදල් ප්‍රතිපාදන ලබා දීම අවශ්‍ය වේ.

- ඉන් පසුව කොටස් වෙළඳපල විසින් කොටස්වල පළමු වෙළඳ දිනය ප්‍රකාශයට පත් කරනු ඇත. කොටස් වෙළඳාම් කිරීම මූලික නිකුතුව අවසන් වීමෙන් පසු වෙළඳපල දින (වැඩකරන දින) ආරම්භ වේ.

- කොටස් හිමියා තම කොටස් විකිණීමට කැමති නම්, ඔහුට කොටස් තැරැව්කරු අමතා කොටස් ලැයිස්තුගත කළ පසු මෙම කොටස් විකිණීමට උපදෙස් දිය හැකිය.

- බොහෝ විට පළමු වරට ආයෝජකයින් කොටස් වෙළඳපොළට පැමිණෙන්නේ මූලික මහජන නිකුතුවේ කොටස් සඳහා ඉල්ලුම් කිරීමෙනි. අලුතින් පැමිණෙන අය ලැයිස්තුගත කිරීමට යන සමාග මේ පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

- o ව්‍යාපාරික පරිසරය
- o සමාගමේ කළමනාකරණය
- o අනාගත ඉපැයීම් සහ තක්සේරුව
- o බදු සහන

- සමාගම පිළිබඳ මෙම තොරතුරු ආයෝජන උපදේශකයෙකුගෙන් ලබාගත හැකිය.

ද්විතියික වෙළඳපොලේ කොටස් මිලදී ගැනීම සහ විකිණීම

මෙය ප්‍රාථමික වෙළඳපොලේ මුල් නිකුතුවෙන් පසුව ආයෝජකයෙකුට වෙනත් ආයෝජකයෙකුගෙන් මිලදී ගැනීමට හෝ විකිණීමට හැකි වෙළඳපොලයි. ඔබ ප්‍රථමයෙන් ඔබ කොටස් තැරැව්කරුවෙකු / භාරකරුවෙකු සොයා ගත යුතු අතර ඔවුන් හරහා කී ගිණුමක් විවෘත කරන්න.

කොටස් තැරැව්කරුවෙකු සමඟ ඇණවුමක් කරන්නේ කෙසේද?

- ඕනෑම ආයෝජකයෙකුට කොටස් තැරැව්කාර සමාගම් හරහා CDS ගිණුම් එකක් හෝ කිහිපයක් පවත්වාගෙන යා හැක.

- කොටස් තැරැව්කාර සමාගම ඔබට කොටස් මිලදී ගැනීමට/විකිණීමට උපදෙස් දීමට ආයෝජන උපදේශකයෙකු වෙන් කරනු ඇත.

- "සහතික කළ ආයෝජන උපදේශකයින්" සමඟ පමණක් ගනුදෙනු කිරීමට වගබලා ගන්න. ආයෝජකයින්ට උපදෙස් දීම සඳහා සියලුම ආයෝජන උපදේශකයින් මෙම සුදුසුකම් ලබා ගත යුතුය.

- ද්විතීයික වෙළඳපොලේ වෙළඳාම් කිරීම සඳහා පහත දැක්වෙන මාර්ග හරහා ඔබට ඔබේ තැරැව්කරු සම්බන්ධ කර ගත හැක.
  - o දුරකථනය
  - o ෆැක්ස්
  - o ඊමේල් කරන්න
  - o පුද්ගලික සංචාරය
  - o අන්තර්ජාලය

- ඔබ ඔබේ කොටස් තැරැව්කරුට (ආයෝජන උපදේශක) සමාග මේ නම, මිල සහ ඔබට මිලදී ගැනීමට/විකිණීමට අවශ්‍ය කොටස් ප්‍රමාණය ලබා දිය යුතුය. ආයෝජන උපදේශක ඔබට මිලදී ගැනීමට/විකිණීමට උපදෙස් දෙනු ඇත.

- ආයෝජන උපදේශකයා ඔබේ ඇණවුම ලබා දෙනු ඇත, නමුත් මිලදී ගැනීම/විකිණීම පිළිබඳ අවසාන තීරණය ආයෝජකයා විසින් ගත යුතුය.

- ඇණවුම සැකසූ පසු, ඔබට අවශ්‍ය මිලට මිලදී ගැනීමට හැකි වූ කොටස් පිළිබඳව ඔහු ඔබට දන්වනු ඇත.

- ඇණවුම ක්‍රියාත්මක වූ පසු, තැරැව්කරුගෙන් ඔබට මිලදී ගත්/විකුණු සටහනක් ලැබෙනු ඇත. මෙම ලේඛනය ඔබගේ අනුමැතිය ඇතිව සිදුවී ඇති ගනුදෙනු තහවුරු කරයි.

- මිලදී ගත්/විකිණු නෝට්ටු ඊළඟ වෙළඳ සැසිය ආරම්භ කිරීමට පෙර තැරැව්කරු විසින් ගනුදෙනුකරුවන් වෙත යවනු ලැබේ.

- ගැනුම්කරු මිලදී ගැනීමෙන් පසු 3 වන වෙළඳ දිනට මිලදී ගත් කොටස් සඳහා ගෙවීම් කළ යුතුය (T+3). පළමු වරට ආයෝජකයෙකුට කොටස් මිලදී ගැනීමට පෙර අත්තිකාරමක් කිරීමට සිදු විය හැකිය. විකිණුම්කරුට විකිණීමෙන් පසු 3 වන වෙළඳ දින වන විට විකුණන ලද කොටස් සඳහා ගෙවීමක් ලැබෙනු ඇත (T+3).

- ඕනෑම ආයෝජකයෙකුට ගෙවීමක් නොකර CDS හරහා තම තැරැව්කරු වෙනස් කළ හැක.

- කොටස් මිලදී ගැනීමෙන් පසු, ආයෝජකයෙකුට අපේක්ෂිත කාලයක් සඳහා කොටස් තබා ගත හැකිය. විකුණුම් මිල සහ විකිණීමේ තීරණය ආයෝජකයා විසින් තීරණය කරනු ලැබේ. මෙම තීරණය සඳහා ඔබට සහාය වීමට ඔබේ කොටස් තැරැව්කරුවන්ගෙන් පර්යේෂණ වාර්තා ලබා ගත හැක.

- යම් මාසයක (මාසික ප්‍රකාශය) එවැනි ගිණුමක් සක්‍රියව පැවතියේ නම් CDS ගිණුම් හිමියා වෙත මාසික ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය. සක්‍රිය ගිණුමක් ලෙස ඉහත සඳහන් කාල සීමාවන් තුළ අවම වශයෙන් එක් ගනුදෙනුවක් (මිලදී ගැනීම/විකිණීම/තැන්පතු/ඉවත් කිරීම/මාරු කිරීම) සහිත ගිණුමක් තිබිය යුතුය.

- ඔබ කොටස් මිල ගණන් පරීක්ෂා කර වෙළඳපල ක්‍රියාකාරකම් නිරන්තරයෙන් නිරීක්ෂණය කළ යුතුය. ඔබට කොටස් තැරැව්කරු ඇමතීමෙන්, දිනපතා පුවත්පත් කියවීමෙන්, කොළඹ කොටස් හුවමාරුවේ (CSE) www.cse.lk වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ ඔබේ කොටස් තැරැව්කරුගේ වෙබ් අඩවියට පිවිසීමෙන් එය කළ හැකිය. ඔබට මාතර, මහනුවර, කුරුණෑගල, මීගමුව, අනුරාධපුර, මඩකලපුව, බණ්ඩාරවෙල, යාපනය සහ රත්නපුර පිහිටි ඔබේ කොටස් ශාඛා කාර්යාලය තැරැව්කරුවන්ගේ කාර්යාල වෙත පැමිණිය හැකිය.

- ආයෝජන උපදේශකයා ඔබේ උපදෙස් නොමැතිව කොටස් මිලදී ගැනීම/විකිණීම නොකළ යුතුය. යමක් දැනගැනීමට ඇත්නම් කරුණාකර වහාම කොටස් තැරැව්කාර සමාගමේ අනුකූලතා නිලධාරියා අමතන්න.

ණය සුරැකුම්පත්වල ආයෝජනය කිරීම

ආයෝජනය සඳහා ඇති ණය සුරැකුම්පත් මොනවාද?

ප්‍රධාන වශයෙන් ණය සුරැකුම්පත් කාණ්ඩ දෙකක් තිබේ:

1. ආයතනික: සමාගම් විසින් විසින් නිකුත් කරන ලද ණය සුරැකුම්පත්
2. රජය විසින් නිකුත් කරන ලද ණය සුරැකුම්පත්

සමාගම් විසින් නිකුත් කරන ලද ණය සුරැකුම්පත්

සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ

සාංගමික බැඳුම්කර වන්නේ නිකුත් කරන්නා විසින් පොලිය ගෙවීම සහ කල් පිරීමේ දී මුල් මුදල මුදා හැරීම සඳහා බැඳී සිටින පෞද්ගලික අංශයේ සමාගම්වලට අයත් මධ්‍ය සහ දිගුකාලීන සුරැකුම්පත් වේ. විශේෂිත වත්කමක් මගින් ආවරණය නො වන සාංගමික බැඳුම්කර ණයකර නමින් හැඳින්වේ.

සාංගමික ණයකර

ණයකර යනු නිකුත් කරන්නාගේ සාමාන්‍ය ණයෙන් පමණක් ආවරණය වන පෞද්ගලික අංශයේ සමාගම්, බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන විසින් නිකුත් කරනු ලබන ඇප රහිත, මධ්‍ය හෝ දිගුකාලීන, පොලී සහිත බැඳුම්කර වේ. ස්ථාපිත, විශාල ආයතන විසින් සාමාන්‍යයෙන් ණයකර නිකුත් කරනු ලැබේ. ණයකර හිමියන් සලකනු ලබන්නේ ණයහිමියන් ලෙස ය. නිකුත් කරනු ලබන සමාගමේ ඈවර කිරීමේ අවස්ථාවක දී කොටස්කරුවන්ට පෙර ගෙවීම් ලැබීම සඳහා ඔවුන් හිමිකම් ලබයි.

වාණිජ පත්‍ර වෙළෙඳපොළ

වාණිජ පත්‍ර යනු තමන්ගේ ම භාවිතය සඳහා අරමුදල් නගා සිටුවීම පිණිස පෞද්ගලික අංශයේ සමාගම් විසින් සහ බැංකු හා අනෙකුත් මූල්‍ය අතරමැදියන් හරහා නිකුත් කරනු ලබන කෙටි කාලීන, ඇපයට තැබිය නො හැකි (අනාරක්ෂිත) ණය සුරැකුම්පත් වේ. විශාල අගයක් ඇති ණය දීමට සුදුසු (ඉහළ ශ්‍රේණිගත කිරීමක් සහිත) සහ ගෙවීමේ දී අමතර බැංකු ඇප ඇති ආයතන විසින් විශාල අගයන් සහිත ව මේවා සාමාන්‍යයෙන් නිකුත් කරනු ලැබේ. වාණිජ පත්‍ර සාමාන්‍යයෙන් අලෙවි කරනු ලබන්නේ වට්ටමක් ඇති ව වන අතර සමහර ඒවාට පොලී ගෙවයි.

ආයතනික ණය සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේ ප්‍රතිලාභ

- ආයෝජකයින්ට ආවර්තිතා පොලී ගෙවීම් මගින් ස්ථාවර ආදායම් ප්‍රතිලාභ ලබා ගත හැකිය.
- විවිධ කල්පිරීමේ කාල පරිච්ඡේද සහ අවදානම් පැතිකඩ සහිත ආයෝජන විවිධාංගීකරණය කිරීමට අවස්ථා සපයයි.
- රජයේ සුරැකුම්පත්වලට වඩා ඉහළ අවදානමක් දැරීමට කැමති ආයෝජකයින්ට ඉහළ ප්‍රතිලාභයක් ලබා ගත හැකිය'

ආයතනික බැඳුම්කරවල ආයෝජනය කිරීම සඳහා මාර්ගෝපදේශය

කොළඹ කොටස් වෙළඳ පල ආයෝජනය කිරීමට සමාන වේ.

රජය විසින් නිකුත් කරන ලද ණය සුරැකුම්පත්

භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර

ශ්‍රී ලංකා රජය ප්‍රධාන වශයෙන් කෙටිකාලීන ණය උපකරණ, භාණ්ඩාගාර බිල්පත්, මධ්‍ය කාලීන සහ දිගුකාලීන ණය උපකරණ සහ භාණ්ඩාගාර බැඳුම්කර හරහා අයවැය අරමුණු වෙනුවෙන් දේශීය මුදල් ණය රැස් කරයි. ශ්‍රී ලංකා රජයේ නියෝජිතයා ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර නිකුත් කිරීම සහ පොළී කූපන් ගෙවීම සහ කල්පිරීම් ගෙවීම් ඇතුළුව අදාල ණය සේවා ගෙවීම් සඳහා වගකිව යුතුය.

භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොල, දේශීය මුදල් වෙළඳපොලේ කොටසකි. භාණ්ඩාගාර බිල්පත් වල අධික ද්‍රවශීලතාවය ආයෝජකයන්ට ආයෝජන මත ප්‍රතිලාභයන් ජනනය කරන අතරම විකල්ප ද්‍රවශීලතා ප්‍රභවයක් ද වේ. එබැවින් භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලේ පොළී අනුපාත චලනයන් කෙටි කාලීන ණය වෙළඳපොල සඳහා මිනුම් ලකුණක් සපයයි. මීට අමතරව භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොලේ පර්මාවන් හා අනුපාතවල වෙනස්වීම්, මූල්‍ය ආයතන වල පිරිවැය, ලාභදායීත්වය සහ ද්‍රවශීලතාවය බලපායි.

ශ්‍රී ලංකා මහ බැංකුව විවෘත වෙළඳපොල කටයුතු යටතේ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ඇපකරයක් ලෙස පිළිගනී. මීට අමතරව මූල්‍ය ස්ථාවරත්වය වැඩිදියුණු කිරීම සඳහා මූල්‍ය ආයතන විවිධ පැහැරහැරීම් අවදානම් රහිත ආයෝජන සඳහා සැලකිය යුතු නිරාවරණයන් පවත්වා ගැනීමට නියාමකයාට අවශ්‍ය වේ. මූල්‍ය අධිකාරිය ආපසු ගෙවීමේ සහතිකය හේතුවෙන් පැහැර හැරීමේ අවදානම් රහිත යැයි සැලකෙන භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වල වැදගත්කම මෙය ශක්තිමත් කරයි. දෛනික වෙළඳපොල තුළ භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර රජයේ සුරැකුම්පත් ලෙස හැඳින්වේ.

භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොල

භාණ්ඩාගර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර දේශීය ආයෝජකයින් සඳහා ලබා ගත හැකි වෙළෙඳ ණය උපකරණ වේ.

- **භාණ්ඩාගාර බිල්පත්:** භාණ්ඩාගාර බිල්පතක් යනු 1923 අංක 8 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත යටතේ (සංශෝධිත පරිදි) ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද කෙටි කාලීන ණය උපකරණයක් වන අතර එය රජයේ අයවැය අවශ්‍යතා සඳහා යොදා ගැනේ.
- **භාණ්ඩාගාර බැඳුම්කර:** භාණ්ඩාගාර බැඳුම්කරයක් යනු 1937 අංක 7 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත යටතේ ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද මධ්‍යකාලීන හා දිගුකාලීන ණය මෙවලමකි (සංශෝධිත). එය රජයේ අයවැය අවශ්‍යතා සඳහා යොදා ගැනේ.

භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල ප්‍රධාන ලක්ෂණ

භාණ්ඩාගාර බිල්පත් දින 91, දින 18 සහ දින 364 පරිනත කාල සඳහා නිකුත් කරනු ලබන අතර 1923 අංක 08 දරණ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පණතේ විදිවිධාන අනුව අවුරුදු 2-30 අතර පරිනත කාල සඳහා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරනු ලබයි.

- පැහැර හැරීමේ අවදානම් රහිත, වඩාත් සුදුසු ණය උපකරණ වේ.
- භාණ්ඩාගාර බිල්පත් යනු කෙටිකාලීන ශුන්‍ය කූපන් ණය උපකරණයක් වන අතර භාණ්ඩාගාර බැඳුම්කර යනු මධ්‍යකාලීන සිට දිගුකාලීන ණය උපකරණයකි.
- භාණ්ඩාගාර බිල්පත් සඳහා කල් පිරීමේ දී මුල් මුදල් ගෙවනු ලැබේ. භාණ්ඩාගාර බැඳුම්කර සඳහා අර්ධ වාර්ෂික කූපන් සහ කල් පිරීමේ දී මුල් මුදල ගෙවනු ලැබේ.
- භාණ්ඩාගාර බිල්පත් සඳහා කල්පිරීමේ දී කල් පිරෙන මුදල් ගෙවනු ලැබෙන අතර භාණ්ඩාගාර බැඳුම්කර සඳහා අර්ධ වාර්ෂික කූපන් ගෙවීම් සහ මූලික මුදල් කල් පිරෙන විට ආපසු ගෙවනු ලැබේ.
- ඵලදා අනුපාතය තීරණය කරනු ලබන්නේ වෙළෙඳපොළ ය.
- ද්විතීයික වෙළෙඳපොළ තුළ වෙළෙඳාම් කළ හැකි උපකරණ
- නිර්ලේඛිත ආකෘතියෙන් නිකුත් කෙරේ.

භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවල ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ

- ස්වෛරීත්ව රාජ්‍ය විසින් නිකුත් කරනු ලබන බැවින් එය අවදානම් රහිත නිදහස් ආයෝජනයක් වේ.
- මෙම බිල්පත් ද්විතීයික වෙළෙඳපොළ තුළ වෙළෙඳාම් කළ හැකි බැවින් ඒවා වෙළෙඳපොළ තුළ විකිණීමෙන් ක්ෂණික ද්‍රවශීලතාව ලබා ගත හැකි ය. විදේශීය ආයෝජකයින් විසින් ලබාගන්නා සියලු කල් පිරීම්වලින් ලැබෙන ආදායම් සහ ප්‍රාග්ධන ලාභය සම්පූර්ණයෙන් ම ආපසු ගෙන්වා ගත හැකි ය.
- වත්මන් නීතිය යටතේ රජයේ සුරැකුම්පත් රඳවා ගැනීමේ බද්දට යටත් නොවේ.
- වෙනත් පුද්ගලයෙකු හෝ පුද්ගලයකු සමඟ ඒකාබද්ධ ආයෝජනයක් කිරීමට ද ඔබට හැකි ය.

- ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ආයෝජන, ස්වයංක්‍රීය නිර්ලේඛන සුරැකුම්පත් ගෙවීම් පද්ධතියට සම්බන්ධ කරඇති මධ්‍යම තැන්පතු පද්ධතියේ ආරක්ෂිතව ලියාපදිංචි කරයි.
    - භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ඕනෑම අවස්ථාවක ද්විතීයික වෙළඳපොලෙන් ප්‍රාථමික අලෙවිකරුවන් හෝ බලපත්‍රලාභී බැංකු හරහා මිලදී ගත හැකිය. ප්‍රාථමික වෙළඳපොල (ආරම්භක නිකුතුව) හරහා රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම හරහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළඳුන් පත් කරනු ලැබේ. ප්‍රාථමික වෙළඳපොලේ භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වල ආයෝජනය කිරීමට කැමති අනෙකුත් පුද්ගලයින්ට ප්‍රාථමික වෙළඳුන් හරහා ලංසු තැබීමෙන් එය කල හැකිය.
    - මධ්‍යම තැන්පතු පද්ධතියෙහි අලෙවිකරුවෙකුගේ සෘජු සහභාගිත්වයෙන් ආයෝජකයාගේ නමින් මධ්‍යම තැන්පතු පද්ධතියේ සුරැකුම්පත් ගිණුමක් නිර්මාණය කළ යුතුය.
    - භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වල පොළිය හා කල්පිරීමේ මුදල් ගිණුම්ගත දිනය ආයෝජකයාගේ සුරැකුම්පත් ගිණුම පවත්වාගෙන යන අදාළ අලෙවිකරුවෙකුගේ සෘජු සහභාගිවන්නන් හරහා ආයෝජකයාගේ ගිණුමට බැර කරනු ලබයි.

රාජ්‍ය සුරැකුම්පත් සඳහා තොරතුරු ලබා ගන්නේ කෙසේ ද?

රජයේ පවත්නා සුරැකුම්පත් පිළිබඳ තොරතුරු සහ පවත්නා වෙළෙඳපොළ අනුපාත පිළිබඳ විස්තර බලපත්‍රලාභී වාණිජ බැංකු, ප්‍රාථමික වෙළෙඳුන් සහ මහ බැංකුවේ වෙබ් අඩවිය මගින් ලබා ගත හැකි ය.

වත්මන් වෙන්දේසි පිළිබඳ විස්තර ප්‍රාථමික වෙළෙඳුන් සහ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් ලබා ගත හැකි ය.රාජ්‍ය සුරැකුම්පත් පිළිබඳ කිසියම් විස්තරයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගත හැකි ය.

නිවැරදි ආයෝජනයක් තෝරා ගැනීම සඳහා උපදෙස් 7ක්

1. **ඔබේ මූල්‍ය ඉලක්කවලට ගැලපෙන ආයෝජන තෝරන්න.**

   ඔබේ මූල්‍ය ඉලක්කය කෙටි කාලීන නම්, ඔබ ඉහළ ද්‍රවශීලතාවයක් සහිත කෙටි කාලීන ආයෝජන තෝරා ගත යුතුය. දිගු කාලීන මූල්‍ය ඉලක්ක සඳහා ඔබ ඉහළ ප්‍රතිලාභ සහිත නමුත් අඩු ද්‍රවශීලතාවයක් සහිත ආයෝජන තෝරා ගත යුතුය.

2. **ආයෝජන අවස්ථා පිළිබඳව හොඳින් මූලික තක්සේරුවක් කරන්න**

   සමාගමක ආයෝජනය කිරීමට පෙර, ඔබ එහි මූල්‍ය ස්ථාවරත්වය, ලාභදායීතාවය සහ ද්‍රවශීලතාවය, වෙළඳපල අවස්ථා, ක්‍රියාකාරී මෙහෙයුම් හැකියාවන් සහ නෛතික තත්ත්වය විමර්ශනය කළ යුතුය. තවද, ඔබට ඔවුන්ගේ අතීත වාර්තා සහ ආයෝජන වසර ගණනාවක් තිස්සේ ඔවුන් ගොඩනගා ඇති කීර්තිය පිළිබඳව සොයා බැලිය හැකිය'

3. **ණය සුදුසුකම් තක්සේරු කරන්න**

   තෝරාගත් ආයෝජනයේ ණය ශ්‍රේණිගත කිරීම් ලබා ගන්න. විශේෂයෙන් බැඳුම්කර හෝ ණය උපකරණ සඳහා, Moody's, S&P හෝ Fitch වැනි ආයතන විසින් නිකුත් කරන්නාට එහි මූල්‍ය බැඳීම් සපුරාලීමට ඇති හැකියාව පෙන්නුම් කරන ශ්‍රේණිගත කිරීම් සපයයි.

   (ඉහළ ශ්‍රේණිගත කිරීම්: ආයෝජන ඉතා ආරක්ෂිත යැයි සැලකේ. අඩු ශ්‍රේණිගත කිරීම්: ඉහළ අවදානමක් දක්වන අතර ප්‍රවේශමෙන් ප්‍රවේශ විය යුතුය.)

4. **ඇපකර පරීක්ෂා කරන්න**

   සුරක්ෂිත ආයෝජන බොහෝ විට ඇපකර (සුරක්ෂිත වත්කම්) මගින් පිටුබලය ලබන අතර එය පැහැර හැරීමකදී ආයෝජකයින් ආරක්ෂා කරයි.

නිවැරදි ආයෝජනයක් තෝරා ගැනීම සඳහා උපදෙස් 7ක්

5. **නියාමන අනුකූලතාව සත්‍යාපනය කරන්න**

   ඔබේ ආයෝජන සමාගම කිසිදු නීති විරෝධී ව්‍යාපාරයක් නොකරන බවට හා එය අදාළ බලධාරීන් විසින් නියම කරන ලද දේශීය නීති සහ රෙගුලාසි වලට අනුකූල බවට වගබලා ගන්න. උදාහරණයක් ලෙස, සමාගම සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ, කොළඹ කොටස් වෙළඳපොළේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති බව ඔබට සොයා බැලිය හැකිය.

6. **යථාර්ථවාදී සහ ප්‍රයෝගික නොවන ප්‍රතිලාභවලින් පරිස්සම් වන්න**

   සමහර ආයෝජන ව අසාමාන්‍ය ලෙස ඉහළ ප්‍රතිලාභ පොරොන්දු වේ. එවැනි අවස්ථාවන්වල වංචා හෝ සැඟවුණු අවදානම් ඇතුළත් විය හැකිය. එබැවින්, පොරොන්දු වූ ප්‍රතිලාභ, වෙළඳපලේ පවතින සාමාන්‍යය ප්‍රතිලාභ ඉක්මවා ගිය, වඩා ආකර්ශනීයභාවයක් පෙන්නුම් කරන්නේ නම්, ඔබ වඩාත්ම ප්‍රවේශම් විය යුතුය.

7. **වෘත්තීය උපදෙස් ලබා ගන්න**

   යම් ආයෝජනයක් ඔබේ මූල්‍ය අරමුණු සහ අවදානම් දැරීමේ හැකියාව සමග ගැලපෙනවාද යන්න තක්සේරු කිරීමට මූල්‍ය උපදේශකයින්ගෙන් හෝ ආයෝජන වෘත්තිකයන්ගෙන් සහාය ලබා ගන්න.

3.6 ණය කළමනාකරණය

ඉගෙනුම් අරමුණු

- ණය සහ ණය සඳහා ඇති අවශ්‍යතාවය හඳුනා ගැනීම
- විධිමත් සහ අවිධිමත් ණය ප්‍රභවයන් දැන ගැනීම
- ණය ගැනීමේ තීරණ සඳහා සලකා බැලිය යුතු සාධක තේරුම් ගැනීම
- පොලී අනුපාත වර්ගයන් හඳුනා ගැනීම.
- ණය සපයන්නන්ගෙන් විමසිය යුතු කරුණු දැන ගැනීම.
- ණය කළමනාකරණය කිරීම සඳහා සහ ආරක්ෂිත ණය ගැනීම් අවශ්‍ය උපදෙස් දැන ගැනීම.
- අර්ථවත් ණය හා අර්ථවත් නොවන ණය හඳුනා ගැනීම

ණය යනු මූල්‍යමය වගකීමකි. එහිදී සාමාන්‍යයෙන් ණය ගනු ලබන්නා විසින් එකඟ වූ කාල සීමාවක් තුළ ණයට ගත් මුදල සහ පොලිය ආපසු ගෙවීමේ පොරොන්දුව ඇතිව, ණය දෙනු ලබන්නා ගෙන් මුදල් හෝ වෙනත් සම්පත් ණයට ගනී. ණය යනු ප්‍රමාණවත් අරමුදල් ඉක්මනින් ලබා ගත නොහැකි අවස්ථාවන්හිදී ක්‍රියාකාරකම් හෝ ආයෝජන සඳහා වියදම් කිරීමට පුද්ගලයින්, ව්‍යාපාර සහ රජයන් භාවිතා කරන වැදගත් මෙවලමකි.

එදින, රත්නායක පවුලේ සාමාජිකයින්ට රාත්‍රී භෝජනයේදී සාකච්ඡා කිරීමට විශේෂ මාතෘකාවක් තිබුණි.

ඉහත සංවාදයේදී, ගෝතමී ණය බරක් නිසා කරදරයට පත් වූ පුද්ගලයෙකු ගැන කතා කරයි. ණය අපගේ හදිසි අවශ්‍යතා සඳහා මුදල් යෙදවීමට උපකාරී වේ. කෙසේ වෙතත්, නිසි ලෙස කළමනාකරණය නොකළහොත්, අප ගෝතමීගේ කාර්යාල සගයා මෙන් කරදරවලට වැටෙනු ඇත.

ණයක් සමග සම්බන්ධ වන ප්‍රධාන අංග

ණය

මූලික මුදල
ණයට ගත් මුදල

පොලිය
ණයට ගැනීමේදී ගෙවන මිල

ඇපකරය
සෑම ණයකටම අනිවාර්ය නොවුනද, ණය ගෙවීම පැහැර හැරීමේ අවධානම ආවරණය පිණිස ණය හිමියා විසින් ඉල්ලුම් කරනු ලබයි.

ආපසු ගෙවීමේ නියමයන්
ආපසු ගෙවීමේ කොන්දේසි, වාර ගණන සහ කල්පිරීමේ දිනය

ණයට ගැනීමේ වැදගත්කම

ණය ගැනීම මඟින් සමාගම් සහ පුද්ගලයන්ට වර්තමාන අවශ්‍යතා සහ අනාගත ආදායම අතර පරතරය පියවා ගැනීමට ඉඩ සලසයි. කෙසේ වෙතත්, මූල්‍ය දුෂ්කරතා සහ අධික පොලී වියදම් වළක්වා ගැනීම සඳහා ප්‍රවේශමෙන් ණය ගැනීම කළමනාකරණය කර ගැනීම අවශ්‍ය වේ.

ණය ගැනීමෙන් සපුරා ගන්නා අවශ්‍යතා

ණය ගැනීම් සඳහා උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

දේපලක් මිලදී ගැනීම

පුද්ගලයෙකුට නිවසක්, ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් මිලදී ගැනීමට අවශ්‍ය වන විට ඒ සඳහා ගෙවීමට ප්‍රමාණවත් තරම් ඉතුරුම් නොතිබිය හැකිය. ණය මුදලක් විසින් එම දේපල මිලදී ගැනීමට පහසුකම් සපයනු ඇත. වටිනා වත්කමකට හිමිකමක් ලබා ගනිමින් කාලයත් සමඟ එහි පිරිවැය බෙදා හැරීමට පුද්ගලයන්ට ඉඩ සලසන බැවින් දේපළ අත්පත් කර ගැනීම සඳහා ණය ගැනීම සමාජයේ සුලභව දක්නට ලැබේ.

අධ්‍යාපන වියදම්

යම් ශිෂ්‍යයෙකුට පිට රටක හෝ මෙරට පෞද්ගලික විශ්ව විද්‍යාලයකට ඇතුලත් වීමට අවශ්‍යව පවතින නමුත් අධ්‍යාපන වියදම් සහ ජීවන වියදම් සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණවත් නොවන විටකදී, ශිෂ්‍ය ණයක්/අධ්‍යාපන ණයක් ලබාගැනීමෙන් එම අවශ්‍යතාවය සපුරාලිය හැක. එබැවින්, අධ්‍යාපන ණය පුද්ගලයන්ට තම අනාගත ඉපැයීම් ශක්‍යතාවය සඳහා ආයෝජනය කිරීමට උපකාරී වන අතර, බොහෝ විට අනාගතයේදී ඉහළ ආදායමක් ලබා ගැනීමට අවස්ථාව ලැබීමක් ලෙස ප්‍රතිලාභ ලබා දෙයි.

හදිසි අවස්ථා

පවුලේ සාමාජිකයෙකුට හදිසි ශල්‍යකර්මයක් සිදු කිරීමේ අවශ්‍යතාවයක් ඇති වූ විට, ඒ සඳහා ප්‍රමාණවත් මුදල් හෝ රක්ෂණ ආවරණයක් නොමැති නම් පුද්ගලික ණයක් මගින් වෛද්‍ය වියදම් ආවරණය කළ හැකිය. හදිසි අවස්ථා වලදී ණයට ගැනීම නොවැළැක්විය හැකි නමුත්, දිගු කාලීන මූල්‍ය පීඩනය වළක්වා ගැනීම සඳහා එම ණය ප්‍රවේශමෙන් භාවිතා කර හැකි ඉක්මනින් ආපසු ගෙවිය යුතුය.

ව්‍යාපාර මූල්‍යකරණය

ව්‍යවසායකයෙකු වීමට කැමති අයෙකු ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සැලසුම් කරන නමුත් උපකරණ මිලදී ගැනීමට සහ ස්ථානයක් කුලියට ගැනීමට අවශ්‍ය ප්‍රාග්ධනය නොමැති විට, ව්‍යාපාර ණයක් හෝ මිතුරන්ගෙන් සහ පවුලේ අයගෙන් ලබා ගත ණයක් මගින් ව්‍යාපාරය ආරම්භ කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සපුරාගත හැකිය. ණය යනු කුඩා ව්‍යාපාර හිමියන් සඳහා තීරණාත්මක සම්පතක් වන අතර, හිමිකාරිත්වය දුර්වල කර නොගෙන ව්‍යාපාර අවස්ථා පුළුල් කර ගැනීමට අවශ්‍ය ඉඩ සලසනු ලබයි.

වාහනයක් මිලදී ගැනීම

පුද්ගලයෙකුට විශ්වාසදායක සහ සුවපහසු ප්‍රවාහන පහසුකම් අවශ්‍ය නමුත් අපේක්ෂිත වාහනය මිලදී ගැනීමට අවශ්‍ය සම්පූර්ණ මුදල් නොමැති විය හැක. වාහන ණයක් මඟින් මුදල් යොදවා තම වාහන අවශ්‍යතාවය සපුරාලිය හැකිය. වත්කම් මිලදී ගැනීම විසින් තම ඵලදායිතාව සහ ජීවන තත්ත්වය වැඩිදියුණු කරන බැවින් වාහන වැනි කල් පවතින භාණ්ඩ සඳහා ණය ගැනීම සාධාරණීකරණය කෙරේ.

ණය ඒකාබද්ධ කිරීම

පුද්ගලයෙකුට ඉහළ පොලී සහිත ක්‍රෙඩිට් කාඩ් ණය කිහිපයක් තිබේ නම්, අඩු පොලී අනුපාතයකට ලබා ගන්න ලද පවතින ණය ඒකාබද්ධ කිරීමේ ණයක් මගින් එම පෙර ලබා ගත ණය මුදල් පියවීම මගින් සමස්ථ ණය ගැනීමේ පිරිවැය අඩු කර ගැනීමට හැකිය. මෙසේ ණය ඒකාබද්ධ කිරීමෙන් වියදම් අඩු කිරීමට හැකි නමුත් තවදුරටත් මූල්‍ය අභියෝග වළක්වා ගැනීම සඳහා හොඳ මූල්‍ය විනයක් සහිතව ණය පියවීම අත්‍යවශ්‍ය වේ.

ජීවන රටා වියදම් හෝ සැමරුම්

යුවළක් විවාහ මංගල්‍යයක් සැලසුම් කරන විට, සියලු වියදම් පියවා ගැනීමට ඔවුන්ට ඉතුරුම් හෝ වෙනත් අරමුදල් නොමැති විය හැකිය. පුද්ගලික ණයක් හෝ ක්‍රෙඩිට් කාඩ්පතක් භාවිතා කිරීම මගින් උත්සවයේ මුදල් අවශ්‍යතාවය සපුරාලිය හැකිය. අභිමත වියදම් සඳහා ණයට ගැනීම එක්තරා වැරදි පෙළඹවීමක් විය හැකි නමුත්, තම වුවමනාවන් සපුරාගනිමින් අනාගතයේදී අනවශ්‍ය මූල්‍ය බර වළක්වා ගැනීම සඳහා ප්‍රවේශමෙන් දැඩි මූල්‍ය විනයක් සහිතව තම ණය කළමනාකරණය කරගත හැකි බව විශ්වාස සහගත අවස්ථාවන්හිදී මෙවැනි ණය ප්‍රයෝජනවත් වනු ඇත.

ආර්ථික පසුබෑම් සමඟ කටයුතු කිරීම

පුද්ගලයෙකුට රැකියාව අහිමි වන අතර එවැනි පුද්ගලයෙකු නැවත රැකියාවකට ඇතුළත් වන තෙක් ජීවන වියදම් පියවා ගැනීමට අවශ්‍ය වන අවස්ථාවක, ණය මුදලක් හෝ ක්‍රෙඩිට් කාඩ්පතක් මගින් දෛනික වියදම් කළමනාකරණය කර ගත හැකිය. මූල්‍ය අස්ථාවරත්වය අතරතුර කෙටි කාලීන ණය ගැනීමක් මගින් යම් මට්ටමක කෙටි කාලීන ගැටළු නිරාකරණයක් සිදු වුවද, වගකීමෙන් යුතුව ලබා ගත ණය කළමනාකරණය කළ යුතුය.

ණය මූලාශ්‍ර

විධිමත් මූලාශ්‍ර

● මූල්‍ය ආයතන

සාම්ප්‍රදායික බැංකු ණය යනු පුද්ගලයෙකුට වඩාත් පොදු මූල්‍ය පහසුකම් සපයන ක්‍රමවලින් එකකි. ණය ගන්නාගේ සුදුසුකම් සහ ඇපකර ලබා ගැනීමේ හැකියාව මත, මෙම ණය සුරක්ෂිත හෝ අනාරක්ෂිත විය හැකිය. ණය ගැනුම්කරු සතු වත්කම් වල ස්වභාවය සහ මූල්‍ය ආයතනය විසින් සපයනු ලබන ණය පහසුකම මත පදනම්ව ඇපකරය පිළිබඳව මූල්‍ය ආයතන සමඟ ණය ගැනුම්කරුට සාකච්ඡා කළ හැකිය. උදාහරණයක් ලෙස, තරුණයෙකුට වැඩිදුර අධ්‍යාපනය සඳහා අරමුදල් සැපයීමට හෝ කුඩා ස්වයං රැකියාවක් ආරම්භ කිරීමට පුද්ගලික ණයක් ලබා ගත හැකිය.

සියලුම බැංකු සහ මූල්‍ය ආයතන තරඟකාරී පොලී අනුපාත සහ නම්‍යශීලී ආපසු ගෙවීමේ පහසුකම් සහිත විවිධ ණය වර්ග ලබා දෙනු ලබයි. ණය ගැනීම් සඳහා පහසුකම් සපයන බලපත්‍රලාභී බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන ලැයිස්තුව සඳහා ඔබට ශ්‍රී ලංකා මහා බැංකුවේ වෙබ් අඩවියට යොමු විය හැකිය. (Authorized Financial Institutions | Central Bank of Sri Lanka)

● ක්ෂුද්‍ර මූල්‍ය

ක්ෂුද්‍ර මූල්‍ය ආයතන (MFIs) සාම්ප්‍රදායික බැංකු සේවා සඳහා ප්‍රවේශය නොමැති පුද්ගලයින් සඳහා සේවය සපයයි. මෙම ආයතන සාමාන්‍යයෙන් ඇපකරයක් නොමැතිව කුඩා ණය ලබා දෙන අතර එමඟින් අඩු ආදායම්ලාභීන් සඳහා මූල්‍ය පහසුකම් ලබා ගැනීමට අවස්තාවක් ලැබේ. කුඩා වෙළඳුන්ට තම භාණ්ඩ තොග පුළුල් කිරීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණයක් ලබා ගත හැකි අතර එමඟින් ඔවුන්ගේ ඉපැයීම් ශක්‍යතාවය සැලකිය යුතු ලෙස ඉහළ නංවාගත හැකි වනු ඇත. ලංකා ක්ෂුද්‍ර මූල්‍ය වෘත්තිකයින්ගේ සංගමයේ (www.microfinance.lk) වෙබ් පිටුවේ ශ්‍රී ලංකාවේ බොහෝ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන පිළිබඳ තොරතුරු අඩංගු වේ.

● ක්‍රෙඩිට් කාඩ්පත්

එදිනෙදා වියදම් සහ ඉහල වටිනාකමක් සහිත මිලදී ගැනීම් සඳහා පහසු මූල්‍යකරණ ක්‍රමයක් ලෙස ක්‍රෙඩිට් කාඩ්පත් භාවිතා කල හැක. කෙසේ වෙතත්, නිසි ලෙස කළමනාකරණය නොකළහොත් ඒ සඳහා ඉහල පොලියක් ගෙවීමට සිදු වේ. කාඩ්පත් හිමියන්ට හදිසි වෛද්‍ය වියදම් සඳහා ක්‍රෙඩිට් කාඩ්පතක් භාවිතා කළ හැකි අතර, අමතර ගාස්තු වළක්වා ගැනීම සඳහා පොලී රහිත කාල සීමාව තුළ ඉතිරි මුදල ගෙවිය හැකිය.

● රජයෙන් අරමුදල් සපයන ණය යෝජනා ක්‍රම

නිශ්චිත සමාජ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා රජය විවිධ රජයේ අරමුදල් සපයන වැඩසටහන් යටතේ හෝ රාජ්‍ය බැංකුවල සහයෝගීතාවය සමගින් විශේෂ ණය පහසුකම් ක්‍රියාත්මක කරනු ලබයි. සමෘද්ධි ණය එවැනි ණය පහසුකම් සඳහා එක් උදාහරණයකි. එවැනි ණය වැඩසටහන් ප්‍රධාන වශයෙන් අරමුණු කරන්නේ විශේෂිත ආදායම් කාණ්ඩවල හෝ භූගෝලීය ප්‍රදේශවල පුද්ගලයින්ට අඩු පොලී සහිත ණය ලබා දීමයි. ණය ලබාගන්නන්ට සහන පොලී අනුපාත යටතේ ණය ලබා ගැනීමේ අවස්ථාව සහ ව්‍යාපාර සඳහා රජයේ සහායද ලබාදෙනු ලැබේ. කෙසේ වෙතත්, ණය ලබා ගන්නා රජය විසින් ලබාදී ඇති නිර්ණායක සපුරාලීම අත්‍යවශ්‍ය වේ.

● උකස් කිරීම (රන් ණය)

දිවයින පුරා බහුලව දැකිය හැකි මූල්‍ය ආයතන සහ අනෙකුත් උකස් මධ්‍යස්ථාන වලින් රන් හෝ රන් ආභරණ ඇපයට තබා මුදල් ණයට ගැනීම උකස් කිරීම ලෙස හැඳින්වේ. සාපේක්ෂව අඩු අවදානමක් සහිත මෙම ණය ලබා ගැනීම් අරමුදල් අවශ්‍යතාවයට ඉක්මන් විසඳුමක් සපයනු ලබයි. කෙසේ වෙතත්, ණය ගැණුම්කරුට ඉහළ පොලී අනුපාත ගෙවිය යුතු වන අතර එකඟ වූ වේලාවට ආපසු නොගෙවන්නේ නම් උකස් තැබූ භාණ්ඩ අහිමි වීමේ අවදානමක්ඇත.

අවිධිමත් මූලාශ්‍ර

● මිතුරන් සහ පවුලේ අය

විශේෂයෙන් කුඩා හදිසි මුදල් අවශ්‍යතා සඳහා තම පෞද්ගලික සම්බන්ධතා වලින් ණයට ගැනීම සාමාන්‍ය දෙයකි. මිතුරන් සහ පවුලේ අයගෙන් ණයට ගැනීමේ වාසිය නම් කිසිදු පොලී ගෙවීමක් හෝ විධිමත් ණය ගිවිසුමක් සම්බන්ධ නොවීමයි. කෙසේ වෙතත්, ආපසු ගෙවීම පමා වීම, අඩාල වීම හෝ නොහැකි වීම නිසා අදාළ පුද්ගල සම්බන්ධතාවය දුර්වල වීම හෝ විනාශ විය හැකිය.

● මුදල් ණයට දෙන්නන්

මෙම ණය දීම් විධිමත් බැංකු පද්ධතියෙන් පිටත ක්‍රියාත්මක වන අතර අවම ලියකියවිලි සහිතව ඉතා ඉක්මනින් ණය ලබා ගැනීමේ අවස්ථාව ලබා දෙනු ලබයි. ඔවුන් ක්ෂණික මුදල් ලබා ගැනීමට පහසුකම් සපයන නමුත්, අතිශයින් ඉහළ පොලී අනුපාත මගින් ණය ගන්නන් සූරාකෑමට යටත් විය හැක.

● ඩිජිටල් ණය දීමේ වේදිකා

මෘදුකාංග යෙදුම් සහ මාර්ගගත සේවාවන් මගින් ඉක්මන් කුඩා ණය ලබා දීම පහසුකම් වඩාත් ප්‍රචලිත වෙමින් පවතියි. අවම හෝ ශූන්‍ය ලියකියවිලි සමඟ ක්ෂණිකව මුදල් ණයට ගත හැකි වුවද, ඉහළ පොලී අනුපාත අය කරනු ලබන අතර, කුඩා ප්‍රමාණවලින් පමණක් ණයට ගත හැකිය. මෙම ණය ලබා දීම් බොහෝ විට මූල්‍ය වංචා සඳහා මග විවර කල හැකි බැවින් ඉතා ප්‍රවේශමෙන් භාවිත කල යුතු වේ.

මුදල් ණයට ගැනීමේදී, අවිධිමත් ආයතනවලට වඩා නියාමනය කරනු ලබන විධිමත් මූල්‍ය ආයතනවලට ප්‍රමුඛත්වය දීම සාමාන්‍යයෙන් යෝග්‍ය වේ. එම විධිමත් මූල්‍ය ආයතන නීති සහ පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි මගින් පාලනය වීමත්, සාපේක්ෂව අඩු සහ නියාමනය කරන ලද පොලී අනුපාත ලබා දීමත්, ඔබේ ණය ලබා ගැනීමේ ඉතිහාසය ගොඩනැගීමට උපකාරී වීම මඟින් අනාගත ණය ලබා ගැනීම පහසු කරගත හැකි වීමත්, වඩාත් පැහැදිලි විනිවිදභාවයකින් යුතු සේවාවන් ලබා දීමත් සහ ඔබට කළමනාකරණය කරගත හැකි ආපසු ගෙවීමේ සැලසුම් ලබා දීමත් වැනි විවිධ හේතු නිසා විධිමත් මූල්‍ය ආයතනවලින් ණය ලබා ගැනීම වඩාත් ආරක්ෂිත, අඩු වියදම් සහිත සහ දිගු කාලීනව වඩා තිරසාර ක්‍රමයක් ලෙස දැක්විය හැක. හදිසි අවස්ථාවන්හිදී අවිධිමත් මූලාශ්‍ර වලින්ණය ලබා ගැනීම වඩා පහසු බවක් පෙනෙන්නට තිබුණත්, එමඟින් සැලකිය යුතු මූල්‍ය අවදානම් වලට මුහුණ දීමට සිදුවිය හැක.

ණය ගැනීමක් තීරණය කිරීමේදී සඳහා සලකා බැලිය යුතු සාධක

● ණය ගැනීම වෙනුවට ඇති වෙනත් විකල්ප

ණය ගැනීමට පෙර, පුද්ගලයින් ණයට ගැනීමකින් තොරව විකල්ප අරමුදල් ප්‍රභවයන්ගෙන් තම අවශ්‍යතා සපුරා ගත හැකිද යන්න සොයා බැලිය යුතුය. ඉතිරිකිරීම් භාවිතා කිරීම, වත්කම් විකිණීම හෝ වියදම් කල් දැමීම වැනි වෙනත් විකල්ප, ණය ගැනීමට තීරණය කිරීමට පෙර විමසා බැලිය හැකිය.

● ණය ගැනීමේ අරමුණ

ණය ගැනීම වත්කමක් අත්පත් කර ගැනීම, අධ්‍යාපනයට අරමුදල් සැපයීම හෝ හදිසි අවස්ථාවක් විසඳීම වැනි පැහැදිලි, සාධාරණ අරමුණක් වෙනුවෙන් පමණක් සිදු කළ යුතුය. ඔබේ අරමුණ විසින් ණය මුදලේ ප්‍රමාණය, ණය මූලාශ්‍රය, ණය කාලසීමාව සහ ලබා ගතයුතු ණය වර්ගය තීරණය කරනු ලබයි. කෙටි කාලීන ආශාවන් තෘප්තිමත් කිරීමට

වඩා දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වයක් සහ වර්ධනයක් ලබා ගැනීම සඳහා ණයක් ලබා ගැනීම වැදගත් බව සැලකිය යුතුය.

⬢ ආපසු ගෙවීමේ හැකියාව

ණයක් ගැනීමේදී, ණය ගන්නාගේ මූල්‍ය ස්ථාවරත්වයට හානියක් නොවන පරිදි ආපසු ගෙවීමේ බැඳීම සපුරාලීමට ණය ගැතියාට ඇති හැකියාව සලකා බැලිය යුතුය. එබැවින්, තමාගේ පෞද්ගලික මුදල් සැලසුම් (අයවැය) වලට අවම බලපෑමක් වන පරිදි, අත්‍යවශ්‍ය වියදම් කැප නොකර මාසිකව ණය ආපසු ගෙවීම් පහසුවෙන් කළමනාකරණය කළ හැකිද යන්න ණයක් ගැනීමේදී විමසා බැලිය යුතුය. උදාහරණයක් ලෙස, පුද්ගලයෙකුට මෝටර් රථයක් මිලදී ගැනීමට අවශ්‍ය වූ විට, තම මාසික ආදායම සහ මාසික වියදම් හඳුනා ගැනීම අවශ්‍ය වන අතර එමඟින් ණය වාරිකය ආපසු ගෙවීමට ණය ගැණුම්කරුට ඇති හැකියාව මත පදනම්ව ණය මුදල තීරණය කළ හැකිය.

⬢ පොලී අනුපාත සහ අනෙකුත් ණය ගැනීමේ වියදම්

පුද්ගලයෙකුගේ මූල්‍ය කාර්යක්ෂමතාව පවත්වා ගැනීම සඳහා ණය පිරිවැය අවම කර ගැනීම අත්‍යවශ්‍ය වේ. එබැවින්, ණය ලබා දෙන මූල්‍ය ආයතන කිහිපයක පොලී අනුපාත, සැකසුම් ගාස්තු සහ අනෙකුත් ගාස්තු සංසන්දනය කර ණය ගැනීම සඳහා වඩාත්ම ලාභදායී විකල්පය තෝරා ගත යුතුය. මන්ද මේ සියල්ලම ණය ගැනුම්කරු විසින් දරනු ලබන වියදම් වේ. ණයට ගත් අරමුදල් කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා මෙම වියදම් අවම විය යුතුය. ණය සැකසුම් කාලය වැනි සමහර සාධක ණය ගැනීමේ පිරිවැයට සාපේක්ෂව අඩු වැඩි විය හැකිය.

⬢ ණය කාලසීමාව සහ ණය කොන්දේසි

ණයෙහි කාලසීමාව සහ කොන්දේසි ණය ගැණුම්කරුගේ මූල්‍ය සැලසුම් සහ ආපසු ගෙවීමේ ධාරිතාව සමඟ සමපාත විය යුතුය. දිගු කාල සීමාවන් සහිත ණයවලට දිගු ආපසු ගෙවීමේ කාල සීමාවන් හේතුවෙන් අඩු මාසික ගෙවීම් සහ ඉහළ සමස්ත පොලී පිරිවැයක් තිබිය හැකිය. එමෙන්ම අඩු කාල සීමාවක් සහිත ණයකට වැඩි මාසික ගෙවීමක් සහිතව, එහෙත් අඩු පොලී අනුපාතයක් සහිත කොන්දේසි පැවතිය හැක.

පොලී අනුපාතය

පොලී අනුපාතය යනු ණයට ගත් අරමුදල් සඳහා ගෙවන මිල වන අතර එය ණයට ගැනීමේ ප්‍රධාන පිරිවැය වේ. අනෙක් අතට, පොලිය ණයහිමියාගේ ආදායම නියෝජනය කරයි.

ණය ගැණුම්කරුවෙකු දැනගත යුතු වැදගත් පොලී අනුපාත වර්ග තුනක් පහත දැක්වේ.

⬢ නාමික පොලී අනුපාතය

නාමික පොලී අනුපාතය යනු ණයක් සඳහා ප්‍රකාශිත පොලී අනුපාතය වන අතර, එයින් අදහස් කරන්නේ ණය ලාභීන් ගැතියන් තම මුදල් භාවිතා කිරීම සඳහා ණය දෙන්නන්ට ගෙවන සැබෑ මූල්‍ය මිලයි. ණයක් සඳහා නාමික අනුපාතය 10% නම්, ණය ලාභීන්ට ණය දෙන්නාගෙන් ණයට ගන්නා සෑම රු. 100 කටම රු. 10 ක පොලියක් ගෙවීමට අපේක්ෂා කළ හැකිය. නාමික පොලී අනුපාත සාමාන්‍යයෙන් වාර්ෂිකව ප්‍රකාශ කරනු ලැබේ, එනම් 5%, 7% හෝ 10% වැනි වන අතර, ඒවා නිශ්චිත කාල සීමාව තුළ පොලිය ලෙස ගෙවිය යුතු ණය මුදලේ ප්‍රතිශතය නියෝජනය කරයි.

⬢ මූර්ත පොලී අනුපාතය

නාමික අනුපාතය මෙන් නොව, මූර්ත පොලී අනුපාතය උද්ධමනය සැලකිල්ලට ගනිමින් ණයට ගන්නා පාර්ශ්වයන්ට අදාළ ණය මුදලේ මිලදී ගැනීමේ ශක්‍යතාවය පිළිබඳ වඩාත් නිවැරදි මිනුමක් ලබා දෙයි. ණයක් සඳහා වාර්ෂික පොලී අනුපාතය 10% ක් සහ උද්ධමන අනුපාතය 4% ක් නම්, මූර්ත පොලී අනුපාතය 6% ක් පමණි.

විශේෂයෙන් ආයෝජන සහ ණය සඳහා දැනුවත් මූල්‍ය තීරණ ගැනීම සඳහා මූර්ත පොලී අනුපාත ඉතා වැදගත් වේ. ණය ගැනීමේ පිරිවැය තක්සේරු කිරීමේදී සහ ආයෝජන අවස්ථා තක්සේරු කිරීමේදී, සැබෑ ආර්ථිකමය බලපෑම සහ උද්ධමනය ආයෝජන ප්‍රතිලාභයට හෝ ණය ගැනීමේ සැබෑ පිරිවැයට බලපාන්නේ කෙසේද යන්න තේරුම් ගැනීමට මූර්ත පොලී අනුපාතය සලකා බැලීම අත්‍යවශ්‍ය වේ.

⬢ සඵල පොලී අනුපාතය

ණය ගැණුම්කරුවන් විසින් සංයුක්ත කිරීමේ (වැල් පොලී) සංකල්පයට අදාළ ඵලදායී පොලී අනුපාතය පිළිබඳව ද දැනුවත් විය යුතුය. ගණිතමය වශයෙන් කිවහොත්, ණය ගැනීම සඳහා අදාළ කාල සීමාව තුළ ඇති සංයුක්ත කාල පරිච්ඡේද ගණන අනුව නාමික අනුපාතය සහ සඵල අනුපාතය අතර වෙනස වැඩි වේ. වසරකට සඵල පොලී අනුපාතය ගණනය කරනු ලබන ආකාරය පහත දැක්වේ.

වාර්ෂික සඵල පොලී අනුපාතය (%) = $\left[\left(1+\frac{r}{n}\right)-1\right] \times 100$

කෙසේද,

r = ණය මුදලට අදාළ නාමික පොලී අනුපාතය

n = වසරක් තුළ පොලී ගෙවීම් ගණන (සංයුක්ත කිරීමේ කාල පරිච්ඡේද ගණන)

ණය සපයන්නාගෙන් ඇසිය යුතු ප්‍රශ්න

1. පොලිය ගණනය කරන්නේ කෙසේද? ස්ථාවර පොලී අනුපාතයක්ද, විචල්‍ය පොලී අනුපාතයක්ද, පොලී ගණනය කරනු ලබන්නේ සමාන වාරික මතද, හීනවන ශේෂය මතද?

පොලී අනුපාතය ස්ථාවර අනුපාතයක් නම් සමස්ථ ණය කාලය තුලම පොලී අනුපාතය නොවෙනස්ව එලෙසම පවතිනු ඇත. නමුත්, විචල්‍ය පොලී අනුපාතය ණය කාලය තුළ වෙළඳපල පොලී අනුපාතවල අඩු වැඩිවීම හේතුවෙන් වරින් වර වෙනස් වීම් වලට ලක් වනු ඇත.

විචල්‍ය පොලී අනුපාතයකට වඩා තරමක් වැඩි වුවද, ස්ථාවර පොලී අනුපාතයක්, ඔබේ අනාගත ගෙවීම් නිවැරදිව පුරෝකථනය කිරීමට ඔබට ඉඩ සලසයි. විචල්‍ය පොලී අනුපාතයකදී, වෙළඳපල පොලී අනුපාත වැඩි වුවහොත් ඔබට ණයහිමියාගේ අභිමතය පරිදි වැඩි පොලියක් සහිත ඉහළ මාසික වාරිකයක් ගෙවීමට හේතු විය හැක.

පොලිය සමාන වාරික ගෙවන පරිදි හෝ ක්‍රමයෙන් හීනවන වාරික ගෙවන පරිදි ගණනය කළ හැක. 15%ක හීනවන ශේෂය මත ගණනය කරන පොලියක් සහිත ණයක මුළු පොලී වියදම, 15%ක සමාන වාරික ක්‍රමය සහිත ණයක මුළු පොලී වියදම ට වඩා අඩු වනු ඇත.

එසේ වන්නේ, හීනවන ශේෂ ක්‍රමයේදී පළමු වාරිකය ගෙවීමෙන් පසු ඉතිරි වන ණය ප්‍රමාණයට පමණක් පොලිය ගණනය කරනු ලබන බැවිනි. ඒ ආකාරයෙන් වාරික වශයෙන් ණය ගෙවීගෙන යනවිට ක්‍රමයෙන් ගණනයවන පොලී ප්‍රමාණයද අඩු වේ. එහෙත්, සමාන වාරික ක්‍රමයේදී, සම්පූර්ණ ණය මුදලටම, එකම පොලී ප්‍රමාණයක් ගණනය වන අතර ණය මුදලේ සහ මුළු පොලී වියදමේ එකතුව ණය කාල සීමාවෙන් බෙදා වාරිකය ගණනය කරනු ලැබේ.

2. වාරික ගෙවීමක් මග හැරුණහොත් අය කරනු ලබන දඩ පොලිය හෝ දඩ මුදල් මොනවාද?

ඇතැම් විට හදිසි මූල්‍ය ගැටළු හේතුවෙන්, යම් වාරික ගෙවීමක් මග හැරිය විට ඒ වෙනුවෙන් දඩපොලියක් හෝ වෙනත් ගෙවීමක් එකතු විය හැකිය. මේ පිළිබඳව ණය දෙන්නාගෙන් අසා දැනගෙන සිටීම වැදගත් වේ.

3. පොලිය කොපමණ වාරයක් සංයුක්ත වේද?

පොලිය වාර්ෂිකව, අර්ධ වාර්ෂිකව, කාර්තුමය වශයෙන්, මාසිකව, සතිපතා හෝ දිනපතා සංයුක්ත කළ හැක. සංයුක්ත කිරීමේ වාර ගණන දිගු වන තරමට, ණය මුදලේ මුළු පොලී පිරිවැය අඩු වන අතර ගෙවන වාරිකය වැඩි වේ. සංයුක්ත කිරීමේ වාර ගණන කෙටි වන තරමට, ණය ගැනීමේ මුළු පොලී පිරිවැය වැඩි වන අතර ගෙවන වාරිකය කුඩා වේ. මෙය වාර්ෂික සඵල පොලී අනුපාතයේ ප්‍රතිඵලයකි.

4. ණය සපයන්නා විසින් අය කළ හැකි අමතර ගාස්තු මොනවාද?

එක් එක් මූල්‍ය ආයතන, ණය දීමේදී අමතර ඉදිරි ගාස්තු, මුද්දර ගාස්තු, සහ ණය සැකසුම් ගාස්තු පොලියට අමතරව අය කරනු ලැබේ. ණය නියමිත කාලසීමාවට කලින් පියවීමේදීද යම් අමතර ගෙවීමක් සිදු කල යුතු වේ. එම අමතර ගාස්තු පිළිබඳව ණය ගැනීමට පෙර අදාළ මූල්‍ය ආයතනය හෝ ණය දෙන්නා සමග සාකච්ඡා කළ හැකි අතර, ඇතැම් මූල්‍ය ආයතන ගනුදෙනුකරුවන් දිනා ගැනීම සඳහා මෙම ගාස්තු අත්හැර දමනු ලැබීමද සිදු වේ.

5. ණය ගැනීමට සුරැකුම් හෝ ඇපකර අවශ්‍යද?

ඔබ ඔබේ ණය ආපසු ගෙවීමට අපොහොසත් වීමකදී, ණයහිමියාට ලබා දී ඇති සුරැකුම භාර ගැනීමට හෝ ඇපකරුගෙන් ඔබේ ණය පියවීමට ඉල්ලා සිටීමට නීත්‍යානුකූල අයිතිවාසිකම් තිබේ. සුරැකුමක් නොමැතිව ණය දීමකදී දැඩි අවධානමක් ගන්නා බැවින් ඉතා ඉහළ පොලී අනුපාත අය කළ හැකිය. මන්ද ආරක්ෂාවක් නොමැතිව ණයක් ලබාදීම අවදානම් සහගතය. ඔබ ණයක් ලබා ගන්නේ නම්, ණය මුදල ඇතුළුව සියලුම කොන්දේසි තේරුම් ගෙන ඇති බවට වග බලා ගතයුතුය.

6. මුළු ණය කාලය තුළ ඔබ පියවිය යුතු සම්පූර්ණ මුදල කොපමණද?

මෙයට ඇතුළත් වන්නේ, ණයට ගත් මුළු මුදල, මුළු කාලය සඳහා පොලී පිරිවැය සහ වෙනත් ගාස්තු ය.

7 . ණය ලබා ගැනීමේදී ඔබ විසින් ගෙවන බදු සඳහා වන බලපෑම කෙබඳු වේද?

ඇතැම් ණය පොලිය බදු අය ගණනය කිරීමේදී ඔබේ ආදායමෙන් අඩු කල හැකි බැවින්, ශුද්ධ ණය පිරිවැය නාමික පොලී පිරිවැයට වඩා අඩු වනු ඇත.

ක්‍රෙඩිට් කාඩ්පත කළමනාකරණය කිරීම

ක්‍රෙඩිට් කාඩ්පතක් යනු ලොව පුරා වලංගු සහ බහුලව භාවිතා වන ගෙවීම් කාඩ්පතකි. සාමාන්‍යයෙන් බැංකු විසින් ක්‍රෙඩිට් කාඩ්පත් නිකුත් කරනු ලබන අතර එම කාඩ්පත් භාවිතයෙන් හදිසි අවස්ථාවකදී කාඩ්පත් හිමියාට භාණ්ඩ, සේවා සහ මුදල් ණයට ගැනීමට හැකි වේ. කාඩ්පත භාවිතා කිරීමෙන් පසු, එම ගනුදෙනුවේ අගය ගෙවියයුතු සම්පූර්ණ ණය මුදලට (ක්‍රෙඩිට් කාඩ් බිලට) එකතු කරනු ලැබේ. ක්‍රෙඩිට් කාඩ්පතක් ඵලදායී ලෙස භාවිතා කරන්නේ නම්, ඔබට විවිධ මූල්‍ය අවශ්‍යතාවයන් ඉටු කරගත් හැකි අතර ඔබේ දිගු කාලීන මූල්‍ය තත්වය යහපත් ලෙස පවත්වාගැනීමට සහායක් වනු ඇත.

ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත කළමනාකරණය කිරීමට උපදෙස් 7ක්

1. සෑම විටම නියමිත වේලාවට ක්‍රෙඩිට් කාඩ් බිල ගෙවා දමන්න

සෑම මසකම පියවීම සඳහා ලබා දී ඇති නියමිත දිනට හෝ ඊට පෙර ක්‍රෙඩිට් කාඩ් බිල්පත පියවීමට වග බලා ගන්න. එසේ කාලානුරූපී ගෙවීම් මගින් ප්‍රමාද ගාස්තු සහ ණය සඳහා අය වන පොලී ගාස්තු වළක්වනු ඇත. ප්‍රමාද ගාස්තු සහ නොපියවූ ක්‍රෙඩිට් කාඩ් බිල්පත් වළක්වා ගැනීම සඳහා ඩිජිටල් තාක්ෂණය හරහා ස්වයංක්‍රීය ගෙවීම් හෝ ගෙවීම් මතක් කිරීම් සකසන්න.

2. ගෙවිය යුතු අවම මුදල නොව සම්පූර්ණ කාඩ්පත් බිලම ගෙවන්න

පොලී වළක්වා ගැනීම සඳහා සම්පූර්ණ ණය ශේෂය ගෙවීමට වග බලා ගන්න. ඔබට එය සම්පූර්ණයෙන් ගෙවීමට නොහැකි නම්, ප්‍රමාද ගාස්තුව වළක්වා ගැනීම සඳහා අවම මුදල ඉක්මවා හැකි උපරිම මුදලක් ගෙවීමට උත්සාහ කරන්න. එමගින්, පොලී ගාස්තු අඩු කරගත හැකිවනු අතර ණය ප්‍රමාණයද අඩු වනු ඇත.

3. අත්‍යවශ්‍ය සහ හදිසි අවස්ථා වලදී පමණක් ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත භාවිතා කරන්න

ඔබ ක්‍රෙඩිට් කාඩ්පත් මඟින් ගෙවීමක් සිදු කරන විට, එම වියදම කෙතරම් අත්‍යවශ්‍ය දැයි සැමවිටම ඔබෙන්ම ප්‍රශ්න කර බලන්න. ඔබට එය කල් දැමිය හැකි වියදමක්ද යන්න සිතා බලන්න. ගෙවීම පැහැර හරිය නොහැකි අවස්තාවන්හිදී පමණක් ක්‍රෙඩිට් කාඩ්පත මගින් ගෙවීම් කරන්න. ඔබේ අවශ්‍යතා සහ වුවමනා වර්ගීකරණය කර ඒ අනුව, විචක්ෂණශීලීව ක්‍රෙඩිට් කාඩ්පත භාවිතා කරන්න. ඔබ සතුව ක්‍රෙඩිට් කාඩ්පතක් තිබීම නිසාම එය භාවිතා නොකරන්න.

4. ඔබට ගැලපෙන ක්‍රෙඩිට් කාඩ්පත තෝරන්න

වෙළඳපොළේ බොහෝ ක්‍රෙඩිට් කාඩ්පත් තිබේ. ඔබේ වියදම් පුරුදු වලට ගැලපෙන නිවැරදි ක්‍රෙඩිට් කාඩ්පත තෝරා ගැනීමට වග බලා ගන්න. වාර්ෂික ගාස්තු, ප්‍රමාද ගාස්තු, විවිධ වට්ටම් සහ දීමනා පොලී අනුපාත පරීක්ෂා කිරීමට අමතක නොකරන්න. ඔබ නිතර සංචාරය කරන්නෙකු නම්, ඔබ කැමති හෝටල් සහ අවන්හල්වල ආකර්ශනීය වට්ටම් ලබා දෙන ක්‍රෙඩිට් කාඩ්පතක් තෝරන්න. සුපිරි වෙළඳ සැල් වලට ලබා දෙන වට්ටම් ආදියද සැලකිල්ලට ගත හැක.

5. ක්‍රෙඩිට් කාඩ්පත් කිහිපයක් සඳහා අයදුම් නොකරන්න

ක්‍රෙඩිට් කාඩ්පත් කිහිපයක් ළඟ තබා ගැනීම අනවශ්‍ය වියදම් රටා වලට පුරුදු වීමට හේතු වන අතර එමගින් ඔබව අනවශ්‍ය ණය උගුලකට ඇද දැමිය හැකිය. ක්‍රෙඩිට් කාඩ්පත් ප්‍රවර්ධනය උදෙසා බැංකුවලින් ලබා දෙන වෙනත් දීමනා නිසා නව කාඩ්පත් සඳහා අයදුම් නොකරන්න. එමෙන්ම ක්‍රෙඩිට් කාඩ් පතේ ණය සීමාවන් වැඩි කර නොගන්න.

6. ඔබේ ක්‍රෙඩිට් කාඩ් ප්‍රකාශය විශ්ලේෂණය කිරීමට මතක තබා ගන්න

ඔබේ ක්‍රෙඩිට් කාඩ් ප්‍රකාශය (බිල) නිතිපතා පරීක්ෂා කිරීමට අමතක නොකරන්න. මෙය ඔබේ ක්‍රෙඩිට් කාඩ් මගින් කල ගෙවීම් වල ඉතිහාසය පිළිබඳව දැනුවත් වීමට සහ ඔබේ ප්‍රකාශයේ දෝෂ හෝ වංචා නොමැති බව සහතික කිරීමට උපකාරී වේ. ඔබ කිසියම් අනවසර අයිතමයක් බිලට ඇතුලත් වී ඇතිබව සොයා ගන්නේ නම්, වහාම බැංකුවට දැනුම් දිය යුතුය.

7. මුදල් අත්තිකාරම් වලින් වළකින්න

ක්‍රෙඩිට් කාඩ් පත් මගින් ලබාගැනීමට පහුකම් සපයා ඇති මුදල් අත්තිකාරම් ලබා ගැනීමෙන් සාමාන්‍යයෙන් පළමු දිනයේ සිටම ඉහළ ගාස්තු සහ පොලී ගෙවීමට සිදු වනු ඇත. ක්‍රෙඩිට් කාඩ් පත් මුදල් අත්තිකාරම් ඔබේ හදිසි මුදල් අවශ්‍යතා සඳහා පවතින අවසාන විසඳුම ලෙස පමණක් භාවිතා කරන්න.

ණය නිවැරදි ලෙස කළමනාකරණය කර ගැනීමට උපදෙස්

ඵලදායී ණය කළමනාකරණය සඳහා මූල්‍ය විනය, දැනුවත් තීරණ ගැනීම සහ විචක්ෂණ උපාය මාර්ග අවශ්‍ය වේ. පහත උපදෙස් අනුගමනය කිරීමෙන්, ඔබට ණය පිරිවැය අවම කර ගත හැකි අතර ඔබගේ මූල්‍ය තත්වය යහපත් ලෙස පවත්වාගත හැකිය.

1. සවිස්තරාත්මක අයවැයක් පිළියෙළ කරන්න.

අධික හෝ අනවශ්‍ය වියදම් සහ ණය ගෙවීම් ප්‍රමාද වීම වළක්වා ගැනීම සඳහා අයවැයක් පිළියෙළ කර ගැනීම අත්‍යවශ්‍ය වේ. නොවැලක්විය හැකි අත්‍යවශ්‍ය වියදම් සඳහා මුදල් වෙන් කරමින් අයවැය පිළියෙළ කළ හැකිය. උදා: මාසික ණය වාරිකය වෙනුවෙන් අයවැය තුල මුදල් කල් තියාම වෙන්කර තබා ගත හැකිය. වියදම් කළමනාකරණය කර ගැනීමට නම් සහ අයවැය සැලසුම තුලම කටයුතු කිරීමට සිදු වේ. එමගින් ණය ගෙවීම් ප්‍රමාද වීම් හෝ පැහැර හැරීම් වලින් තොරව නියමාකාරයෙන් පියවිය හැක.

2. නිවැරදි උපාය මාර්ග භාවිතා කරමින් ණය ගෙවීමට ප්‍රමුඛත්වය දෙන්න.

ඔබ පියවීම සඳහා ණය කිහිපයක් තිබේ නම්, උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව ණය පියවිය යුතු ආකාරය තීරණය කරන්න. ණය පියවීම සැලසුම් කිරීම සඳහා පහත උපාය මාර්ග අනුග මනය කළ හැකිය.

- කාලයත් සමඟ මුදල් ඉතිරි කර ගැනීම සඳහා පළමුව ඉහළ පොලී සහිත ණය පියවීම කෙරෙහි අවධානය යොමු කරන්න.

  උදාහරණයක් ලෙස, ඔබට පහත ණය තිබේ නම්:

  ක්‍රෙඩිට් කාඩ්පත: 25% පොලියකට රු. 300,000.

  පුද්ගලික ණය: 15% පොලියට රු. 500,000.

  මෝටර් රථ ණය: 10% පොලියට රු. 3,000,000.

පළමුව, ඔබට ඉහළම පොලී පිරිවැය ලබා දෙන බැවින් ක්‍රෙඩිට් කාඩ්පත කෙරෙහි අවධානය යොමු කළ හැකිය. ක්‍රෙඩිට් කාඩ් ණය පියවූ පසු, ඉහළ පොලී සහිත ණය ගෙවා දමා ඇති බැවින් ඔබේ මාසික පොලී පිරිවැය පෙරට වඩා අඩු වනු ඇත.

- ආත්ම විශ්වාසය සහ අභිප්‍රේරණය ගොඩනගා ගැනීම සඳහා කුඩාම ණයෙන් නිදහස් වීම ආරම්භ කරන්න.

  මෙම උපාය මාර්ගය ණය ආපසු ගෙවීමේ බර සම්බන්ධයෙන් මානසික සහනයක් ලබා දෙයි. ප්‍රමාණයෙන් කුඩා ණය ගෙවීම ඉක්මනින් පියවිය හැකි අතර, යම් ණයකින් නිදහස් වූ බවට දැනෙන මානසික සහනය ඊළඟ ණය ගෙවීමට අභිප්‍රේරනයක් වනු ඇත. උදාහරණයක් ලෙස, ඔබට පහත පරිදි ණය මුදල් තුනක් පියවීමට තිබේ නම්:

  පෞද්ගලික ණය දෙන්නෙකුගෙන් ලබා ගත් 25% පොලියක් සහිත රු.50,000 ක ණයක්,

  15% පොලියක් සහිත රු.400,000 ක පුද්ගලික ණයක්, සහ

  10% පොලියක් සහිත රු.2,000,000 ක වාහන ණයක්,

මෙවැනි අවස්තාවක, පුද්ගලිකව ණය දෙන්නගෙන් ලබාගත් කුඩා ණය මුදල ප්‍රථමයෙන් ගෙවා නිම කිරීමෙන් ණය බරින් යම් තරමකට නිදහස් වීමේ සහනය දැනෙනු ඇත. එමගින්, අනිත් ණය ගෙවා දැමීමට අවශ්‍යය වන ධෛර්යය ද ලැබෙනු ඇත.

3. ණය ඒකාබද්ධ කර ප්‍රතිමූල්‍යකරණය කරන්න.

මූල්‍ය ආයතන විසින් අඩු පොලී අනුපාතයක් සහිත තනි ණය මුදලකින් ඔබ සතුවන විවිධ ණය ඒකාබද්ධ කිරීමට සහ මාසික ණය වාරිකය අඩු කර පවතින ණය ප්‍රති මූල්‍යකරණය කිරීමට පහසුකම් සපයනු ලබයි. මෙසේ ණය ඒකාබද්ධ කිරීම සහ ප්‍රති මූල්‍යකරණය මගින් ණය පියවීම සරළ කරන අතරම ඔබට දැරීමට සිදුවන පොලී වියදමද අඩු කරනු ලබයි.

උදාහරණයක් ලෙස, ඔබට පියවීමට පහත ණය තිබේ යයි සිතමු.

ක්‍රෙඩිට් කාඩ්පත: 25% ක පොලියට රු. 300,000.

පුද්ගලික ණය: 15% ක පොලියට රු. 500,000 සහ

මෝටර් රථ ණය: 10%ක පොලියට රු. 3,000,000.

ඉහත ණය තුනම පියවීමට අවශ්‍ය මුදලට සමාන මුදලක් 12% ක පොලියට වෙනම ණයක් ලෙස ඔබට ලබා ගත හැකිය. එවිට ඔබට විවිධ පොලී අනුපාත යටතේ ගෙවීමට ඇති ණය කිහිපයක් වෙනුවට 12%ක පොලියට එක් ණයක් පමණක් ඉතිරිවනු ඇත. එමගින්, ඔබේ සියලු ණය බැඳීම් අඩු පොලී අනුපාතයකට තනි ණයක් බවට ඒකාබද්ධ වේ.

කෙසේ වෙතත්, ඔබ විසින් එක් එක් මූල්‍ය ආයතනවල ඇති ණය ඒකාබද්ධ කිරීමේ විකල්ප පිළිබඳව සොයා බලා, සංසන්දනය කර ඔබට ගෙවීමට සිදුවන අමතර ගාස්තු ඇතුළු මුළු පිරිවැය ආදිය පරීක්ෂා කර බලා, වඩාත් සුදුසු විකල්පය තෝරා ගත යුතුය.

4. ණය දෙන්නන් සමඟ සාකච්ඡා කරන්න (පවතින ණය ප්‍රතිව්‍යුහගත කිරීම)

පොලී අනුපාත අඩු කර ගැනීමට සහ ආපසු ගෙවීමේ කාල සීමාව දීර්ඝ කර ගැනීම වැනි ණය පියවා ගැනීම සඳහා වාසිදායක කොන්දේසි වෙනුවෙන් ණය දෙනු ලැබූ පාර්ශව සමඟ සාකච්ඡා කල හැක. මෙමගින්, ණය ගෙවීම පැහැර හැරීමේ අවදානම අවම කරන බැවින් ණය දෙන්නන් විසින් සාකච්ඡා සඳහා එකඟ වනු ඇත. ගෙවීම් දුෂ්කරතා කල්තියා විසඳා ගැනීමෙන් දෙපාර්ශවයටම පැහැර හැරීම් වළක්වා ගත හැකිය.

උදාහරණයක් ලෙස, ණය ආපසු ගෙවීමේදී ඔබේ මූල්‍ය දුෂ්කරතා පැහැදිලි කිරීමට සහ ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කර ගැනීමට මෙන්ම පොලී අනුපාතය අඩු කර ගැනීම සඳහා ආපසු ගෙවීමේ නියමයන් නැවත සකස් කිරීමට ඔබට බැංකුව සමඟ සාකච්ඡා කළ හැකිය.

ආරක්ෂිත ණය ගැනීමකට මෙන්ම ණය ගැනීම වළක්වා ගැනීමට උපදෙස්

1. හදිසි අරමුදලක් ගොඩනඟා ගන්න.

අනපේක්ෂිත ලෙස මුහුණ දීමට සිදුවන වියදම් සඳහා කල් තියා යම් මුදල් ප්‍රමාණයක් ඉතිරි කර වෙන් කර තබා ගත හැකිය. මෙය පුරුද්දක් ලෙස පුහුණු වීමෙන්, ණය නොගෙන හදිසි මුදල් අවශ්‍යතා කළමනාකරණය කරගත හැකි වේ. අනපේක්ෂිත වියදමක් සඳහා ඔබට බොහෝ විට අධික පොලියක් සහිත ණයක් ගැනීමට සිදු වේ. හදිසි අරමුදලක් පවත්වාගැනීම මගින් එවැනි අනවශ්‍ය ණය බරකට යටත් වීමෙන් වැළකිය හැකිය.

උදාහරණයක් ලෙස, ඔබේ මෝටර් රථය හදිසියේ කැඩී ගිය විට, ඉහළ පොලියක් සහිත ඉක්මන් ණය සොයනවාට වඩා ඔබේ හදිසි අරමුදල භාවිතා කර මෝටර් රථය අලුත්වැඩියා කරගත හැක.

2. හැඟුම් වියදම් වලින් වළකින්න

මිලදී ගැනීමේදී හොඳ විනයක් පවත්වා ගැනීම මඟින් අත්‍යවශ්‍ය නොවන හෝ හැඟීම්වලට වහල් වී කරන මිලදී ගැනීම් සඳහා ණයපත් (ක්‍රෙඩිට් කාඩ්) භාවිතය අවම කර ගත හැක.

- **ඉහළ පොලී සහිත ණය ගැනීමෙන් වළකින්න.**

ඔබට ණයට ගැනීමට අවශ්‍යතාවයක් ඇති වූ විට, පුද්ගලිකව ණය දෙන්නන් හෝ ක්‍රෙඩිට් කාඩ්පත් වැනි ඉහළ පොලී අනුපාත සහිත ප්‍රභවයන්ගෙන් ණය ගැනීම සීමා කිරීමට උත්සාහ කරන්න. ඉහළ පොලී සහිත ණය ඔබගේ ණය බර ඉතා ඉක්මනින් වර්ධනය කරනු ලබන අතර, එය ආපසු ගෙවීමේ හැකියාවද දුර්වල කරනු ලැබේ. ණයක් ලබා ගැනීමේ සැබෑ අවශ්‍යතාවයකදී, විකල්ප ණය ප්‍රභවයන් සංසන්දනය වඩාත් සුදුසු, හිතකර නියමයන් සහිත, අඩු පොලී ණය ප්‍රභවයන්ට ප්‍රමුඛත්වය දෙන්න.

- **ණය ගැනීමේ මුළු පිරිවැය තේරුම් ගන්න.**

ණයක් ගැනීමට පෙර, පොලිය, අනෙකුත් ගාස්තු සහ ආපසු ගෙවීමේ නියමයන් ඇතුළුව ණය ලබා ගැනීමේ සම්පූර්ණ මූල්‍ය බලපෑම සලකා බලන්න. ඔබට මෙම සියලු තොරතුරු ණයහිමියාගෙන් විමසා බලා තීරණය කල හැකිය.

උදාහරණයක් ලෙස, ඔබට ණය විකල්ප දෙකක් සංසන්දනය කළ හැකිය: එක් විකල්පයක් අඩු පොලී අනුපාතයක් සහිත නමුත් ඉහළ ණය සැකසීමේ ගාස්තු සහිත වන අතර අනෙක් විකල්පය ණය සැකසීමේ ගාස්තු රහිත නමුත් ඉහළ පොලී අනුපාතයක් සහිත විය හැකිය. වඩා හොඳ විකල්පය තෝරා ගැනීම සඳහා ඔබට විකල්ප දෙකෙහිම මුළු පිරිවැය ගණනය කළ හැකිය. මුළු ණය ගැනීමේ පිරිවැය ඇස්තමේන්තු කිරීම සඳහා අන්තර්ජාල වෙබ් අඩවි ඔස්සේ ණය පිරිවැය ගණනය කර ඔබටම සොයා ගත හැක.

අර්ථවත් ණය සහ අර්ථවත් නොවන ණය

ඔබ ලබා ගන්නා ණය, අර්ථවත් ණයක් වන්නේ එය ඔබේ ධනය වර්ධනය කළ හැකි දෙයක ආයෝජනය කිරීම සඳහා අරමුදල් සපයා ගැනීමක් සිදුකරන්නේනම් පමණි. අර්ථවත් ණය සාමාන්‍යයෙන් අය කරනු ලබන්නේ අඩු පොලී අනුපාතයකි.

උදාහරණයක් ලෙස, අධ්‍යාපනික ණය, නිවාස ණය හෝ ව්‍යාපාර ණය.

අර්ථවත් නොවන ණය යනු කාලයත් සමඟ ඔබගේ මුළු මූල්‍ය වටිනාකම විනාශ කරවන හෝ ඔබේ මූල්‍ය තත්වය වැඩිදියුණු නොකරන දේවල් මිලදී ගැනීම සඳහා මුදල් ණයට ගැනීමයි. අර්ථවත් නොවන ණය විසින් ඉහළ පොලී අනුපාත දරන අතර ආපසු ගෙවීමේ අපහසුතාවය හේතුවෙන් ඔබේ මූල්‍ය කටයුතු අවුල් කරනු ඇත.

අනවශ්‍ය මිලදී ගැනීම් සඳහා ක්‍රෙඩිට් කාඩ්පත් භාවිතා කිරීම උදාහරණයක් ලෙස දැක්විය හැක.

ඥානවන්තව භාවිතා කළහොත්, ණය යනු ඔබේ ජීවිත ඉලක්ක සපුරා ගැනීමට උපකාරී වන බලවත් මෙවලමකි.

3.7 පුද්ගල මූල්‍ය ආරක්ෂාව

ඉගෙනුම් අරමුණු

- රක්ෂණය සහ විශ්‍රාම සැලසුම්කරණය තුළින් පුද්ගල මූල්‍ය ආරක්ෂාව පැහැදිලි කර ගැනීම.
- විශ්‍රාම සැලසුම්කරණය සහ එහි ප්‍රධාන පියවර දැන ගැනීම.
- විශ්‍රාම සැලසුම්කරණයේදී මුදලෙහි කාලානුරූපී අගය භාවිතා කිරීම දැන ගැනීම
- රක්ෂණ සංකල්පය සහ එහි වැදගත්කම හඳුනා ගැනීම.
- පුද්ගල රක්ෂණ වර්ග දැන ගැනීම.
- නිවැරදි රක්ෂණ ඔප්පුව තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු දැන ගැනීම.

පුද්ගල මූල්‍ය ආරක්ෂාව යනු අනාගතයේ දී සිදුවිය හැකි අනපේක්ෂිත නමුත් සිදුවිය හැකි හානිදායක සිදුවීම් වල අවදානම් හඳුනා ගැනීමයි. මෙම හානිදායක සිදුවීම් වලට මුහුණ දීමට ඔබ කල්තියා සූදානම් විය යුතුය. විශ්‍රාම සැලසුම් කිරීම සහ රක්ෂණය යනාදී උපක්‍රම මඟින් මෙම හානිදායක සිදුවීම් අවම කරගත හැක.

3.7.1 විශ්‍රාම සැලසුම් කිරීම

විශ්‍රාම සැලසුම් කිරීම යනු ඔබේ වයස්ගත කාලය තුළ මූල්‍ය ස්වාධීනත්වය තහවුරු කර ගැනීම සඳහා සූදානම් වීමයි. කම්කරු නීතිවලට අනුව, පුද්ගලයෙකුට උපරිම වයසක් දක්වා රැකියාවක නිරත විය හැකිය. එම වයසට පැමිණි පසු, ඔබ ඔබේ ස්ථිර රැකියාවෙන් ඉවත් විය යුතුය. ස්ථිර රැකියාවෙන් විශ්‍රාම ගත් පසුව වුවද ඔබේ ආදායම වෙනත් මූලාශ්‍රයකින් උපයා ගත හැකි විය හැක. එහෙත්, ශාරීරිකව යෝග්‍ය නොවීම හෝ වෙනත් වෛද්‍ය හේතූන් මත, ඔබට වඩාත් ක්‍රියාශීලීව උපයා ගැනීමට නොහැකි කාලයක් පැමිණෙනු ඇත. එවිට ඔබේ මූල්‍ය ආරක්ෂාව සහ ස්වාධීනත්වය පවත්වා ගැනීම සඳහා වර්තමානයේදීම සැලසුම් කිරීම ඉතා වැදගත් වේ.

රැකියාව නතර කිරීමෙන් පසු ජීවන වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් ලබාගැනීම සඳහා ඉතුරුම් සහ ආයෝජන සැලැස්මක් නිර්මාණය කිරීම එයට ඇතුලත් වේ. විශ්‍රාම සැලසුම් කිරීම මූල්‍ය සැලසුම්කරණයේ අත්‍යවශ්‍ය අංගයකි. විශ්‍රාම සැලසුමක් මඟින් ඔබේ ඉලක්ක සපුරා ගැනීමට සහ සුවපහසු මෙන්ම ආරක්ෂිත ජීවිතයක් සහතික කිරීමට උපකාරී වේ.

විශ්‍රාම සැලසුම්කරණය සඳහා අනුගමනය කළ යුතු පියවර

විශ්‍රාම සැලසුම්කරණය සඳහා ප්‍රායෝගිකව ගත හැකි පියවර පහත පරිදි දැක්විය හැක.

1. ඔබේ විශ්‍රාම ඉලක්ක සකසා ගන්න

ඔබට විශ්‍රාම යාමට අවශ්‍ය කාලය තීරණය කිරීම සහ ඔබේ විශ්‍රාම ජීවිතය තුළදී අපේක්ෂාවන් සපුරාලීමට අවශ්‍ය මූල්‍ය වටිනාකම ඇස්තමේන්තු කිරීම අත්‍යවශ්‍ය වේ. ඔබේ විශ්‍රාම සැලසුම් සලකා බලන විටදී, අනාගත උද්ධමන අනුපාත සහ සෞඛ්‍ය සේවා සඳහා වන වියදම් වැනි සාධක ද ඔබ විසින් පුරෝකථනය කළ යුතුය.

2. ඔබේ වත්මන් මූල්‍ය තත්වය ඇස්තමේන්තු කරන්න.

ඔබ සතු සියලු වත්කම් එකතු කර ඉන් ඔබේ මුළු ණය හෝ වගකීම් අඩු කිරීමෙන් ඔබේ වත්මන් ධනය ගණනය කල හැක. ඔබට ඇති අමතර සහ නිෂ්ක්‍රීය ආදායම් මූලාශ්‍ර සහිතව ඔබේ ආදායම සමාලෝචනය කරන්න. ඒ සමගම ඔබට දැරීමට සිදුවන වියදම්ද හඳුනා ගන්න.

3. විශ්‍රාම දිවිය සඳහා ඉතුරු කිරීමේ සැලැස්මක් පිළියෙළ කරන්න. එම විශ්‍රාම ඉතුරුම් වෙත අත නොතබන්න.

ඔබ විසින් සකසු විශ්‍රාම ඉලක්ක මත පදනම්ව, ඉතුරු කිරීමේ සැලැස්මක් සකසන්න. හැකිතාක් පෙර සිටම ඉතිරි කිරීම ආරම්භ කිරීමට උත්සාහ කරන්න. ඔබේ විශ්‍රාම ඉතුරුම් වර්ධනය කිරීම සඳහා සංයුක්ත පොලී අනුපාත භාවිතා කරන්න (ස්ථාවර තැන්පතු වැනි). ඔබගේ විශ්‍රාම ඉතුරුම් නියමිත කල් පිරීමේ දිනයන්ට කලින් ඉවත් කර ගන්නේ නම්, ඔබට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබෙනු ඇත. තවද, ඔබ වෙත දැනටමත් ඇති සේවායෝජක විශ්‍රාම වැටුප් සැලසුම් හෝ වෙනත් වරප්‍රසාද හොඳින් තේරුම් ගැනීම වැදගත් වේ. විශ්‍රාම දිවිය උදෙසා අවශ්‍ය ධනය ගොඩනැගීමට සහ ආදායම් උත්පාදනය සඳහා ඔබේ විශ්‍රාම ඉතුරුම් ආයෝජනය කිරීම අත්‍යවශ්‍ය වේ.

ඔබේ විශ්‍රාමික අරමුදල් කළඹ ගොඩනැගීම සඳහා ඔබට භාවිතා කළ හැකි ආයෝජන වර්ග කිහිපයක් තිබේ. එනම්, ව්‍යාපාර කොටස්, බැඳුම්කර, අන්‍යෝන්‍ය අරමුදල්, සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල ආදී ආයෝජන අවස්ථා ඇතුළත් වේ.

සෑම ආයෝජන විකල්පයකටම ඒවාට ආවේණික අවදානම් සහ ප්‍රතිලාභ ඇති අතර, ඔබේ මුදල් ආයෝජනය කිරීමට පෙර එම අවධානම් සහ ප්‍රතිලාභ තේරුම් ගැනීම අත්‍යවශ්‍ය වේ.

4. ඔබේ විශ්‍රාම සැලැස්ම සමාලෝචනය කරමින් නැවත සකස් කරන්න

ඔබ විසින් සකස් කරන ලද විශ්‍රාම සැලැසුම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරගෙන යාමේදී යම් අපගමනයන් සිදුවිය හැක. ඒවා ඒ ඒ අවස්තාවන්හිදීම හඳුනා ගෙන නිවැරදි කිරීම මඟින් ඔබේ අවසාන විශ්‍රාම ඉලක්කයන් ලඟා කර ගැනීම පහසු වේ.

විශ්‍රාම සැලසුම් කිරීමේදී මුදලේ කාලානුරූපී අගය භාවිතා කරන්නේ කෙසේද?

විශ්‍රාම දිවිය වෙනුවෙන් මුදල් ඉතිරි කිරීමේදී හෝ ආයෝජනය කිරීමේදී හෝ ප්‍රතිලාභ ලබා ගැනීමේදී ඔබට මුදලේ කාලානුරූපී අගය භාවිතා කළ හැකිය. පහත අවස්ථා උදාහරණ ලෙස දැක්විය හැක.

අවස්ථාව 1

මාසිකව සංයුක්ත කිරීමක් යටතේ, 8% ක වාර්ෂික පොලියක් ගෙවන ඉතුරුම් ගිණුමක ඔබේ පළමු වැටුපේ සිට මාසිකව රුපියල් 1000 බැගින් ඔබේ විශ්‍රාම දිවිය වෙනුවෙන් ඉතිරි කර ගන්නේ යැයි සිතමු. දැන් ඔබට වයස අවුරුදු 20 ක් වන අතර වයස අවුරුදු 55 දී ඔබ විශ්‍රාම යනු ඇතැයි උපකල්පනය කල විට, ඔබ විශ්‍රාම යාමේදී කොපමණ මුදලක් ගිණුමේ ශේෂය ලෙස පවතීද?

ගිණුමේ ශේෂය ගණනය කිරීම සඳහා පහත සූත්‍රය භාවිතා කළ හැකිය.

$$\text{Future value} = \text{Monthly payment X} \left[\frac{(1+(r/n))^{(n \times t)}-1}{(r/n)}\right]$$

Where,

r = වාර්ෂික පොලී අනුපාතය

n = පොලිය වර්ෂයක් තුල සංයුක්ත වන වර ගණන

t = අදාළ වන වර්ෂ ගණන

වයස අවුරුදු 55 දී බැංකු ශේෂය

$= 1000 *[(((1+ (.08/12))^{(12*35)}) - 1)/(.08/12)]$

= Rs 2,293,882.50

අවස්ථාව 2

ඔබට දැන් වයස අවුරුදු 30ක් වන අතර වයස අවුරුදු 60 දී විශ්‍රාම යාමට බලාපොරොත්තු වන බව සිතමු. ඔබේ විශ්‍රාම සැලසුමට අනුව, විශ්‍රාම දිවිය ආරම්භයේදී ඔබට රු. 10,000,000ක් අවශ්‍ය වන බව සිතමු. එම මුදල උපයා ගැනීම සඳහා, මාසිකව සංයුක්ත වන පරිදි 7%ක වාර්ෂික පොලියක් ගෙවන ඉතුරුම් ගිණුමක මාසිකව කොපමණ මුදලක් ඔබ විසින් ඉතිරි කළ යුතුද?

මේ සඳහා පහත සූත්‍රය භාවිතා කළ හැකිය.

$$\text{Monthly saving amount} = \frac{\text{Lumpsum required at the beginning or retirement}}{\left[\frac{(1+(r/n))^{(n \times t)}-1}{(r/n)}\right]}$$

මාසිකව ඉතිරි කල යුතු මුදල

$= 10{,}000{,}000 \,/\, [(((1+ (.07/12))^{(12*30)}) - 1)/(.07/12)]$

= Rs 8,196.92

අවස්ථාව 3

ඔබ අවුරුදු 55 දී රු. 50,000,000 ක ඉතිරි කළ විශ්‍රාම අරමුදලක් ඇත. වසර 25 ක විශ්‍රාම දිවියක් තුල සෑම මසකම එක සමාන මුදලක් ඔබගේ විශ්‍රාම දිවියේ වියදම් වෙනුවෙන් වැය කිරීමට ඔබ සැලසුම් කරයි. ඔබේ විශ්‍රාම අරමුදල වාර්ෂිකව 7% ක පොලියක් මාසිකව සංයුක්ත වන පරිදි උපයයි නම්, සෑම මසකම කොපමණ මුදලක් ඔබට ආපසු ලබා ගත හැකිද?

මේ සඳහා පහත සූත්‍රය භාවිතා කළ හැකිය.

$$\text{The monthly withdrawal} = \frac{\text{The lumpsum in hand at the beginning of retirement}}{\left[\dfrac{1 - (1 + (r/n))^{-(n\,x\,t)} - 1}{(r/n)}\right](1 + (r/n))}$$

මාසිකව ආපසු ගැනීමේ මුදල

$= 50{,}000{,}000/[(1-(1+(.07/12))-^{(12*25)})/(.07/12))(1+(.07/12)]$

= Rs 351,340.10

3.7.2 රක්ෂණය

රක්ෂණය මඟින් ජනතාවට ආරක්ෂිත ආවරණයක් සහ ඔවුන්ගේ පවුල් සඳහා මූල්‍ය ආරක්ෂාවක් ලබා දේ. අනාගතයේදී ඇතිවිය හැකි අනපේක්ෂිත මූල්‍ය අලාභ හේතුවෙන් පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල් ආරක්ෂා කිරීම සඳහා පුද්ගලික රක්ෂණ ආවරණ රක්ෂණ ආයතන විසින් නිර්මාණය කර ඇත. ඒවා පුද්ගලයෙකුගේ ජීවිතය, සෞඛ්‍යය, ආදායම සහ වත්කම්වල විවිධ අංශ ආවරණය කරනු ලබයි.

ඉහත සංවාදය අපට මතක් කර දෙන්නේ අප ජීවත් වන්නේ ඊළඟ මොහොතේ කුමක් සිදුවේදැයි කිසිවෙකු නොදන්නා ඉතා අවිනිශ්චිත ලෝකයක බවයි. නමුත් අපගේ ජීවිතවල, පවුල්වල සහ වටිනා දේපල වල ඇති වන ඕනෑම ආපදාවක් වෙනුවෙන් යම් ආරක්ෂාවක් සහතික කර ගැනීමට අපි සැමට අවශ්‍යය. රක්ෂණය විසින් මෙම අවශ්‍යතාවය සැලකිය යුතු ලෙස ඉටු කරනු ලබයි.

පුද්ගල රක්ෂණයේ වැදගත්කම

- **ඔබේ වත්කම් ආරක්ෂා කිරීමට**

පුද්ගලයෙකුගේ හෝ පවුලක ඉහළ වටිනාකමක් ඇති වත්කම් ආරක්ෂා කිරීම සඳහා රක්ෂණය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. පුද්ගලයෙකුට හෝ පවුලකට යම් වත්කමක් විනාශ වීමෙන් යම් මූල්‍යමය අලාභයක් සිදු වූ විට රක්ෂණයක් මගින් හානිපූරණය කර ගත හැකිය.

- **ඔබේ පවුල ආරක්ෂා කිරීමට**

ආදායම් අහිමි වීම, හදිසි වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍යතාවයකදී හෝ ජීවිත හානි වීමකදී ඔබේ යැපෙන්නන් වෙනුවෙන් අවශ්‍ය කරන මූල්‍ය ආරක්ෂාව ලබා දීම රක්ෂණය මගින් සහතික කරයි. එමගින්, ඔබගේ පවුලේ එදිනෙදා ජීවන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි වනු ඇත.

- **යහපත් මානසිකත්වයක් ඇතිවීම**

රක්ෂණ යනු ඔබේ අවදානම තෙවන පාර්ශවයකට මාරු කිරීමට උපකාරී වන උපාය මාර්ගයකි. හදිසි අවස්ථාවන්හිදී ඔබට ඇති විය හැකි මානසික ආතතිය අඩු කිරීමට රක්ෂණය උපකාරී වේ.

පුද්ගල රක්ෂණ වර්ග:

- **සෞඛ්‍ය රක්ෂණය:** වෛද්‍ය වියදම්, රෝහල්ගත වීම්, සැත්කම් සහ මූලික වෛද්‍ය පරීක්ෂාවන් මගින් රෝග වලක්වා ගැනීමේ වියදම් ආවරණය කරයි.
- **ජීවිත රක්ෂණය:** රක්ෂිතයාගේ මරණයෙන් පසු ප්‍රතිලාභීන්ට මූල්‍යමය සහාය ලබා දෙයි.
- **ආබාධිත රක්ෂණය:** අසනීප හෝ තුවාල හේතුවෙන් රක්ෂිතයාට වැඩ කළ නොහැකි නම් ආදායම් ආදේශකයක් ලබා දෙයි.
- **නිවාස රක්ෂණය:** නිවාස සහ පෞද්ගලික දේපළ හානිවලින් හෝ සොරකම්වලින් වන හානි ආවරණය කරයි.
- **වාහන රක්ෂණය:** වාහන ආශ්‍රිත හානි, සොරකම් සහ අනතුරු සඳහා වගකීම් ආවරණය කරයි.
- **ගමන් රක්ෂණය:** සංචාරය කරන අතරතුර ඇතිවිය හැකි හදිසි වෛද්‍ය අවස්ථා හෝ නැතිවූ ගමන් මලු හේතුවෙන් සිදුවන පාඩු ආවරණය කරයි.

නිවැරදි රක්ෂණ ඔප්පුව තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු උපදෙස් 4ක්

1) හොඳම රක්ෂණ සමාගම හඳුනා ගන්න,

ඔවුන්ගේ ණය ශ්‍රේණිගත කිරීම, කොන්දේසි, ක්‍රියාපටිපාටීන් සහ වන්දි ගෙවීමට ගතවන කාලය ආදී කරුණු මගින්, ඔවුන්ගේ වන්දි ගෙවීමේ හැකියාව සලකා බලන්න.

2) විවිධ රක්ෂණ සමාගම් වලින් මිල ගණන් ලබා ගන්න.

ඔබේ රක්ෂණ අවශ්‍යතා ගැන එක් රක්ෂණ සමාගමක් සමග පමණක් නොව සමාගම් කිහිපයක් සමඟ සාකච්ඡා කරන්න. එක් එක් සමගම ලබා දෙන විකල්ප ගැන හොඳින් සිතා බලා ඔබේ අවශ්‍යතාවයන් වඩාත් හොඳින් සපුරාලන රක්ෂණාවරණය තෝරා ගන්න.

3) රක්ෂණ ගිවිසුම් ලේඛන සඳහා ඔබ ගැන නිවැරදි තොරතුරු ලබා දෙන්න.

ඔබ නිවැරදි තොරතුරු ලබා දී නොමැති අවස්ථාවක, රක්ෂණ සමාගමට ඔබේ රක්ෂණ හිමිකම් අහෝසි කල හැකිය.

4) ඔබේ රක්ෂණ ගිවිසුම ප්‍රවේශමෙන් කියවන්න.

ඔබට නොතේරෙන තැන අසා පැහැදිලි කරගන්න. රක්ෂණ ආවරණය සහ ඔබ ගෙවන වාරික ඇතුළුව සියලු කරුණු පිළිබඳව සෑහීමකට පත් වූ විට පමණක් රක්ෂණ ගිවිසුම අත්සන් කරන්න

මතක තබා ගත යුතු කරුණු

- රක්ෂණ සමාගම අසාධාරණ ලෙස ඔබට වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කර ඇති බව හෝ ඔබට ප්‍රමාණවත් වන්දි ලබා දී නොමැති බව ඔබ සිතන්නේ නම්. එවැනි අවස්ථාවක, ඔබට රක්ෂණ සමාගම වෙත පැමිණිලි කළ හැකිය.
- රක්ෂණ සමාගම ඔබේ පැමිණිල්ල සලකා බැලීම ප්‍රතික්ෂේප කරයි නම්, නැතහොත් රක්ෂණ සමාගම ඔබේ පැමිණිල්ලට සාපේක්ෂව ප්‍රතිචාර දක්වා නොමැති බව ඔබ සිතයි නම්, එම අවස්ථාවේදී ඔබට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) හෝ ශ්‍රී ලංකා රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා අමතා ඒ පිළිබඳව දැනුම්දිය හැකිය. එම ආයතන විසින් තම සේවාවන් නොමිලේ සපයනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා Chapter on Personal 'Financial Management - Insurance.pdf සබැඳියට පිවිසෙන්න.

3.8 පුද්ගල අයවැයකරණය

ඉගෙනුම් අරමුණු

- පුද්ගල අයවැයකරණය සහ අයවැයක් සකස් කිරීමේ වැදගත්කම හඳුනා ගැනීම.
- පුද්ගල අයවැයක් සකස් කිරීමේ ප්‍රධාන පියවරයන් දැන ගැනීම.

පුද්ගල අයවැයක් යනු යම් නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා, (සතියක් හෝ මාසයක්) ඔබේ ආදායම සහ වියදම් නිරීක්ෂණය කිරීම සඳහා සකස් කරන ලද මූල්‍ය සැලැස්මකි. එයට බොහෝ විට හදිසි අවස්ථා, අධ්‍යාපනය හෝ විශ්‍රාම ගැනීම වැනි අනාගත ඉලක්ක සඳහා මුදල් ඉතිරි කිරීමට හෝ ආයෝජනය කිරීමට කැප වූ කොටසක් ඇතුළත් විය යුතුය. අනාගත කාල පරිච්ඡේදයක් සඳහා (සමහර විට ඊළඟ මාසය හෝ වසර සඳහා) අයවැයක් සකස් කිරීම මඟින් ඔබේ මුදල් විවිධ ආකාරවලින් කළමනාකරණය කිරීමට හැකියාව ලැබේ.

රත්නායක පවුලේ අය ඔවුන්ගේ රාත්‍රී ආහාර මේසයේදී පහත සංවාදයෙහි යෙදුණි.



මෙම සංවාදයේදී, අනුෂා ඇය විසින් දරනු ලබන සියලු වියදම් සටහන් කර තැබීමට පටන් ගෙන ඇති අතර දරුවන් විසින් එය අගය කර අනුෂාගේ සටහන් තැබීම තවදුරටත් වැඩිදියුණු කරන්නේ කෙසේද යන්න පිළිබඳව නව අදහස්ද ලබා දෙන ලදී. ඒ ආකාරයෙන් ඔබේ වියදම් සටහන් කර ගැනීම හොඳ ඉතා වැදගත් වේ.

ඔබේ ආදායම සහ වියදම් පිළිබඳව සටහන් තබා ගැනීම මූල්‍ය සාක්ෂරතාවය සහිත බවට හොඳ සලකුණකි. එය පුද්ගල අයවැයක් සකස් කිරීමේ තීරණාත්මක අංගයක් වන අතර එය එදිනෙදා ජීවිතයේදී ඔබේ මුදල් කළමනාකරණය කිරීමට කදිම ආරම්භයක්ද වේ.

පුද්ගල අයවැයක් සකස් කිරීමේ වැදගත්කම.

ඔබගේ ආදායම් සහ වියදම් නිරීක්ෂණය කිරීමට උපකාරී වේ

අයවැය විසින් ඔබගේ සියලු ආදායම් සහ වියදම්වල සියලුම මූලාශ්‍ර වාර්තා කරනු ලබන අතර, වියදම් වර්ගීකරණය කිරීමටද උපකාරී වේ. එමගින් ඔබේ මුදල් වියදම් වෙන ආකාරය දැක ගැනීමට ඔබට හැකියාව ලැබේ. අනවශ්‍ය වියදම් පාලනය කර ගැනීමට මෙන්ම මූල්‍ය සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම සහතික කර ගැනීමටද වියදම් නිරීක්ෂණය කිරීම අත්‍යවශ්‍ය වේ.

ඔබගේ මූල්‍ය ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට සහාය වේ

අයවැයක් සකස් කිරීමේදී, නිවසක්, අධ්‍යාපනය, ණය පියවීම හෝ විශ්‍රාම සැලසුම වැනි කෙටි කාලීන සහ දිගු කාලීන මූල්‍ය අරමුණු සමඟ ඔබගේ වියදම් පෙළගස්වයි. ඔබගේ මූල්‍ය සම්පත් වඩාත්ම වැදගත් අරමුණ සඳහා ප්‍රමුඛත්වය ලබා දීම අයවැයක් සකස් කිරීම මගින් සිදු වේ. අයවැයකරණය ඔබගේ මූල්‍ය ඉලක්ක ප්‍රායෝගික කාර්යයන් බවට පරිවර්තනය කරන අතර අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කර ගැනීම සහතික කරනු ලබයි.

⬣ ඔබගේ ණය එකතුවීම් වළක්වන අතරම ණය පියවීමටද උපකාරී වේ.

අයවැයක් විසින් ඔබගේ වියදම් සීමාවන් නියම කර දෙන අතර ඔබ සතු වත්කම් ප්‍රමාණයට අනුව ජීවිතය පවත්වාගෙන යාම සහතික කරයි. අධික ලෙස වියදම් ණයට මඟ පාදන අතර මූල්‍ය ස්ථාවරත්වයට බාධාවක් විය හැකිය. අයවැයක් විසින් නිරන්තරයෙන්, ඔබගේ වියදම් නිරීක්ෂණය වන බැවින්, අධික ලෙස වියදම් කිරීමේ හැකියාව පාලනය කරනු ලබයි. එමෙන්ම, අයවැයකරණය මඟින් ඔබේ වර්තමාන හිඟ ණය නිරීක්ෂණය කිරීමට සහ කළමනාකරණය කිරීමට ඔබට උපකාරී වේ. අයවැය මඟින් ණයෙන් මිදීමට අවශ්‍යවන සැලසුම සකසා දෙනු ලබන අතර, නොබෝ කලකින්ම ණයෙන් නිදහස් වීමට උදව් වනු ඇත.

⬣ ඔබ වෙනුවෙන් ඉතුරුම් සහ හදිසි අරමුදල් ගොඩනඟයි

අයවැයක පිළියෙළ කිරීමේදී ඉතුරුම් සඳහාද ප්‍රතිපාදනයක් ඇතුළත් වන අතර එමගින් මූල්‍ය ආරක්ෂාව සපයන අතර හදිසි මුදල් අවශ්‍යතාවලදී ණය නොගෙන ඉතුරුම් භාවිතා කිරීමට ඉඩ සලසනු ලබයි.

⬣ වඩා හොඳ මූල්‍ය තීරණ ගැනීමට සහය වේ

අයවැයක් විසින් ඔබගේ මූල්‍ය සම්පත්වල ස්වභාවය පැහැදිලි කර පෙන්වාදෙනු ලබයි. දැනුවත්භාවයෙන් යුතු වියදම්, ඉතිරිකිරීම් සහ ආයෝජන තීරණ වලට ඉඩ සලසයි. අයවැයකරණය විසින් ඔබේ හැඟුම්බර මූල්‍ය තීරණ වළක්වා ජීවන ප්‍රමුඛතා කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ. අයවැය මඟින් ලබා දෙන මඟ පෙන්වීම තුළින් ඔබේ මූල්‍ය තීරණ පුද්ගල වටිනාකම් සහ ප්‍රමුඛතා සමඟ හොඳින් පෙළගස්වනු ඇත.

⬣ ජීවිතයේ සිදුවන වෙනස්කම් සඳහා සූදානම් වීම

අයවැයක් විසින් ජීවිතයේ සිදු වන විවාහය, දෙමාපියභාවය හෝ වෘත්තීය වෙනස්කම් වැනි විවිධ කඩඉම් සඳහා සැලසුම් සකස් කෙරේ. මෙම වෙනස්කම් සඳහා කල් තබා සූදානම් වීමෙන්, ඔබගේ මූල්‍ය ස්ථාවරත්වය සහතික කෙරේ.

⬣ ඔබගේ මූල්‍ය විනය වැඩි දියුණු කරයි

අයවැයකරණය විසින් ඔබගේ වියදම් ප්‍රවේශමෙන් සැලසුම් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ පුරුදු වැඩි දියුණු කරයි. එමෙන්ම, වුවමනාවලට වඩා අවශ්‍යතා ඉටුකර ගැනීම කෙරෙහි ඇති වැදගත්කම පෙන්වා දෙයි. අයවැය විසින් ඔබගේ මූල්‍ය සීමාවන් නියම කරනු ලබන අතර එමගින් ලබාගන්න දැනුම හේතුවෙන් මනා මූල්‍ය විනයක් ඔබ තුල වැඩි දියුණු වනු ඇත.

අයවැයක් සකස් කරන්නේ කෙසේද?

පළමු පියවර

වත්මන් ආදායම් සහ වියදම් පිළිබඳ සමස්ථ අවබෝධයක් ලබා ගන්න.

- ඔබේ සියලු ආදායම් මාර්ග ලැයිස්තුගත කරන්න.
- ආදායම් අගයන් සමඟ අදාළ ලැබීම් කාල වකවානු සහිතව හඳුනා ගන්න
- ඔබේ ආදායම පහත පරිදි වර්ගීකරණය කරන්න.

පුද්ගල ආදායම් වර්ගීකරණය සඳහා මඟ පෙන්වීමක්

ආදායම් මූලාශ්‍ර	ආදායම් තත්ත්වය	ආදායම් මූලාශ	ආදායම් තත්ත්වය
ස්ථාවර ආදායම්:			
වැටුප් සහ වේතන	සක්‍රිය	මාසික	
විශ්‍රාම වැටුප	නිෂ්ක්‍රීය	මාසික	
කුලී ආදායම	නිෂ්ක්‍රීය	මාසික	
ස්ථාවර තැන්පතු වලින් ලැබෙන පොලී ආදායම	නිෂ්ක්‍රීය	මාසික	
රජයෙන් ලැබෙන ආධාර (සමෘද්ධි, අස්වැසුම, වැඩිහිටි දීමනාව, ආබාධිත දීමනාව ආදිය)	නිෂ්ක්‍රීය	මාසික	
වෙනත් පවුලේ සැලසුම් (උදා: මවට තම පුතාගෙන් සෑම මසකම රු. 10,000 ක් ලැබේ)	නිෂ්ක්‍රීය	මාසික	
විචල්‍ය ආදායම්:			
ස්වාධීනව සපයන සේවා සඳහා ගෙවීම්	සක්‍රිය	*	**
කොමිස්	සක්‍රිය	*	**
අතිකාල ගෙවීම්	සක්‍රිය	*	**
ලාභාංශ වැනි ආයෝජන ආදායම්	නිෂ්ක්‍රීය	*	**
බෝනස්	නිෂ්ක්‍රීය	*	**
ව්‍යාපාර ලාභ	සක්‍රිය	*	**
අර්ධකාලීන රැකියාව	සක්‍රිය	*	**
කෘෂිකර්මාන්තයෙන් ලැබෙන ආදායම	සක්‍රිය	*	**

* විචල්‍ය ආදායම්වල වාර ගණන තීරණය වන්නේ සේවායෝජකයින්/පාරිභෝගිකයින් අතර ඇති කර ගන්නා අදාළ ගිවිසුම් හෝ ඉටු කරන ලද කාර්යය මත ය.

** පෙර අත්දැකීම්, කාලගුණික තත්වයන් ආදිය මත පදනම්ව නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා විචල්‍ය ප්‍රභවයන්ගෙන් ලැබෙන සාමාන්‍ය ආදායම තීරණය කළ හැකිය.

- මුළු ආදායම ගණනය කරන්න. ඔබේ විචල්‍ය ආදායම අධි තක්සේරු නොකිරීමට වග බලා ගන්න.
- ඔබේ සියලු වියදම් පහත පරිදි ලැයිස්තුගත කරන්න.

පුද්ගල සහ පවුලේ වියදම් වර්ගීකරණය සඳහා මග පෙන්වීමක්

වියදම් අයිතමය	වියදම් වාර ගණන	වියදම් අයිතමය
ස්ථාවර වියදම්:		
ගෙවල් කුලිය	මාසික	
පාසල් වෑන්/කාර්යාල ප්‍රවාහන ගාස්තු	මාසික	
ණය වාරිකය	මාසික	
රක්ෂණ වාරිකය	මාසික	
දිවා සුරැකුම් ගාස්තුව	මාසික	
උපකාරක ගාස්තු	මාසික	
උපයෝගිතා බිල්පත් කුලී	මාසික	
ස්ථාවර ආදායම් බදු	මාසික	
විචල්‍ය වියදම්:		
ආහාර	*	**
ගෘහ වියදම්	*	**
උපයෝගිතා බිල්පත් වල විචල්‍ය සංරචකය	*	**
ඉන්ධන පිරිවැය	*	**
පුද්ගලික සත්කාර සහ සනීපාරක්ෂාව (කොණ්ඩා කැපීම ආදිය)	*	**
වෛද්‍ය වියදම්	*	**
ඇඳුම් සහ පැළඳුම්	*	**
විනෝදාස්වාදය (චිත්‍රපටි, උත්සව සහ චාරිකා)	*	**
තෑගි සහ පරිත්‍යාග	*	**
වාහන නඩත්තුව (සේවා පිරිවැය)	*	**
විචල්‍ය ආදායම් සඳහා බදු	*	**
වෛද්‍ය වියදම්	*	**

සටහන: ඉහත දක්වා ඇත්තේ වියදම් ලැයිස්තුවක උදාහරණයක් පමණි. වඩාත් නිවැරදි චිත්‍රයක් ලබා ගැනීම සඳහා මෙය හැකි තරම් විස්තරාත්මකව සකස් කළ හැකිය. ඔබේ වියදම් ලැයිස්තුව හඳුනාගෙන අවසන් කිරීම සඳහා ඔබට මුලින් සතියක් හෝ මාසයක කාලයක් පුරා ඔබේ වියදම් ලැයිස්තුගත කිරීමට සිදු විය හැකි අතර එය එම වියදම් අධිතක්සේරු හෝ අවතක්සේරු නොවිය යුතුය.

* ඔබේ පරිභෝජනය සහ මිලදී ගැනීමේ පුරුදු අනුව මෙම වියදම් කොපමණ වාරයක් සිදු වේද යන්න ඔබට තීරණය කළ හැකිය.

** නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා (සමහර විට මාසයක් සඳහා) පරිභෝජන සහ මිලදී ගැනීමේ පුරුදු නිරීක්ෂණය කිරීම මත පදනම්ව, එක් එක් වියදම් කාණ්ඩය සඳහා සාමාන්‍ය අගයක් ලබා ගත හැකිය.

දෙවන පියවර

ඔබේ ආදායම ඔබේ වියදම් සමඟ ගලපන්න.

- පළමුව අයවැය පිළියෙළ කලයුතු කාල සීමාව තීරණය කරන්න. එය මාසයක් හෝ සතියක් විය හැකිය. ඔබේ ආදායමෙන් වැඩි කොටස ලැබෙන්නේ ස්ථාවර ප්‍රභවයන්ගෙන් නම්, ඔබට මාසික අයවැයක් භාවිතා කළ හැකිය. ඔබේ ආදායමෙන් වැඩි කොටසක් විචල්‍ය ප්‍රභවයන්ගෙන් ලැබේ නම් නම්, ඔබට සතිපතා අයවැයක් සඳහා යා හැකිය.
- නිශ්චිත කාලයක් සඳහා සාමාන්‍ය ආදායමක් සහ සාමාන්‍ය වියදම් අගයක් තීරණය කරන්න.
- ආදායමේ සහ වියදමේ පරතරයේ ස්වභාවය හඳුනා ගන්න.

තුන්වන පියවර

ඔබේ මූල්‍ය ඉලක්ක ලැයිස්තුගත කරන්න.

- සාක්ෂාත් කර ගැනීමට ගතවන කාලය අනුව මෙම ඉලක්ක හඳුනා ගන්න.
  - **ද කෙටි කාලීන ඉලක්ක:** ඔබේ සහ ඔබේ පවුලේ සාමාජිකයින්ගේ අවශ්‍යතා සහ වුවමනාවන් මත පදනම්ව, ඉක්මනින්, වසරක් ඇතුළත හෝ වසර තුනකට නොවැඩි කාලයක් තුළ ඉටු කළ යුතු ඉලක්ක වියයුතු අතර එය ඕනෑම අවශ්‍යතාවයක්, අපේක්ෂාවක් හෝ කැමැත්තක් විය හැකිය.
  - **උදාහරණ:** හදිසි අරමුදලක් ගොඩනැගීම, ණයක් පියවීම, නිවාඩුවක් ගැනීම, අධ්‍යාපන ඉලක්ක යනාදිය.
  - **දිගු කාලීන ඉලක්ක:** ඉටු කිරීමට දිගු කාලයක් අවශ්‍ය වන ඉලක්ක දිගුකාලීන ඉලක්ක වන අතර එය වසර තුනකට වඩා ගත විය හැකි ඕනෑම අවශ්‍යතාවයක්, අපේක්ෂාවක් හෝ ආශාවක් විය හැකිය.
  - **උදාහරණ:** නිවසක්, ව්‍යාපාරයක්, වාහනයක්, විශ්‍රාම ගැනීම, දරුවන්ගේ උසස් අධ්‍යාපනය, ව්‍යාපාරයක් ආරම්භ කිරීම යනාදිය.
- ඔබේ ඉලක්ක ප්‍රයෝගික හා යථාර්ථවාදී බවට වග බලා ගන්න.
- කෙටි කාලීන සහ දිගු කාලීන යන දෙයාකාරයෙන්ම ඔබේ ඉලක්කවලට ප්‍රමුඛත්වය දෙන්න.

සිව්වන පියවර

නියමිත ඉලක්ක කරා ළඟා වීමට අවශ්‍යවන පරිදි ඔබේ මූල්‍ය සැලැස්ම සකස් කරන්න.

- එක් එක් ඉලක්කයේ පිරිවැය තීරණය කරන්න.
- ඔබට අදාළ පිරිවැය සහ සේවාවේ හෝ නිෂ්පාදනයේ ගුණාත්මකභාවය වැනි අනෙකුත් සාධක සමඟ ඉලක්ක සපුරා ගැනීම සඳහා ඇති විකල්ප පිළිබඳව පර්යේෂණ කර සොයා ගැනීමට සහ ඔබට සුදුසු විකල්පය තෝරා ගැනීමට සිදු විය හැකිය.
  - උදාහරණය: ඔබේ දරුවාට උසස් අධ්‍යාපනය ලබා දීම ඉලක්කය නම්, ඔබ සොයා බැලිය යුත්තේ,
  - දරුවා කැමති පාඨමාලාව ,
  - විවිධ විශ්ව විද්‍යාලවල එම පාඨමාලාවේ පිරිවැය,
  - එක් එක් විශ්ව විද්‍යාලයේ ගුණාත්මකභාවය සහ කීර්තිය,
  - ඉගෙනීමේ පහසුව
  - ඔබේ වර්තමාන මූල්‍ය තත්ත්වය මත පදනම් වූ දැරිය හැකි මිල
- ඉහත ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉතිරිකිරීමේ ඉලක්ක තීරණය කරන්න.
- ඉතිරිකිරීමේ ඉලක්ක තැබීමේදී යථාර්ථවාදී වන්න.
- ඔබේ ආදායම් රටා සහ ප්‍රමාණයන් අනුව කාලෝචිත මුදල් වෙන් කිරීම් සිදු කරන්න. ඔබට දිනපතා, සතිපතා හෝ මාසිකව ඉතිරි කිරීම් කළ හැකිය.
- ඔබට වඩාත් ගැලපෙන සැලැස්ම/සැලසුම් තීරණය කරන්න.
- ඉතිරිකිරීමේ ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍යවන ඉතිරිකිරීමේ මාර්ග තීරණය කරන්න,
  - අත්‍යවශ්‍ය නොවන, වළක්වා ගත හැකි වියදම් අඩු කිරීම
  - ඔබේ වර්තමාන අවශ්‍යතා සහ වුවමනාවන් පිළිබඳ මනෝවිද්‍යාත්මක විශ්ලේෂණයක් සිදු කිරීමෙන්, ඔබේ ආදායම, ජීවන රටාව, කැමැත්ත සහ කැපවීම් මත පදනම්ව කුමන අවශ්‍යතා සහ වුවමනා අත්හැරිය හැකිදැයි ඔබට සොයාගත හැකිය. ඒවා ඥානවන්තව කපා හැරීම සඳහා ඔබේ වර්තමාන වියදම් රටා විශ්ලේෂණය කළ යුතුය. මෙය ඔබේ ජීවන රටාවේ වෙනසක් ඇති කිරීමට ද හේතු විය හැකි අතර, මේ සඳහා ඔබට මනෝවිද්‍යාත්මකව සූදානම් වීමක් අවශ්‍ය විය හැකිය.
  - නොවැළැක්විය හැකි අත්‍යවශ්‍ය වියදම් සඳහා ප්‍රායෝගික වියදම් සීමාවන් නියම කිරීම.
  - ඔබේ අනාගත ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය පමණට ධනය ඉහළ නංවා ගන්නා තෙක් ඔබේ වර්තමාන පරිභෝජනය අත්හැරීමට ඔබට සිදු විය හැකිය.
  - ඔබේ පවුලේ අය සමඟ මේ ගැන සාකච්ඡා කර, කලින් නියම කළ වියදම් සඳහා වියදම් සීමාවන් තීරණය කිරීමේදී ඔවුන් සම්බන්ධ කර ගන්න. එය ඔබට සැලැස්ම අනුව කටයුතු කිරීමට පහසුවනු ඇත
  - ඉතිරි කිරීම සඳහා නව අමතර ආදායමක් වෙන් කිරීම.
  - ඔබේ වර්තමාන පරිභෝජනය සඳහා නොව, ඔබේ ඉතුරුම් ඉලක්ක සපුරා ගැනීම සඳහා උපයා ගැනීමට සහ නව මාර්ග සොයා ගැනීම සහ ඒවා ස්ථිරවම වෙන් කිරීම.
- ඔබගේ සියලු ආදායම්, වියදම් (සීමාවන්, අඩු කිරීම සහ සංශෝධන සහිතව) සහ ඉතිරි කිරීමේ ඉලක්ක ඇතුළුව ඔබේ අයවැය සකස් කරන්න. පහත දැක්වෙන්නේ අයවැයක එක් උදාහරණයකි.

පුද්ගල අයවැයකට උදාහරණයක්

මාසය: වර්ෂය:		අයවැයගත මුදල
ආදායම්:		
වැටුප්		
අතිකාල		
අමතර ආදායම්		
මුළු ආදායම		
ඉතුරුම්*		
ඉතිරි කිරීමේ ඉලක්කය 1 (හදිසි අරමුදල)		
ඉතිරි කිරීමේ ඉලක්කය 2 (උසස් අධ්‍යාපනය)		
මුළු ඉතුරුම්		
වියදම්:		
ආහාර	සිල්ලර බඩු	
	එළවළු	
	පළතුරු	
	සුළු ආහාර	
ගෘහස්ථ	සබන්/පිරිසිදු කිරීමේ දියර ආදිය	
අධ්‍යාපනය	උපකාරක පන්ති ගාස්තු	
	ලිපි ද්‍රව්‍ය	
	පාසල් සැපයුම්	
	නිල ඇඳුම්	
ප්‍රවාහනය	ඉන්ධන	
	කුලී රථ ගාස්තු	
	බස් ගාස්තු	
	වාහන නඩත්තුව	

මාසය: වර්ෂය:		අයවැයගත මුදල
වෛද්‍ය	චැනලින් කිරීම	
	ඖෂධ	
වෙනත් අනිවාර්ය වියදම්	කුලිය	
	රක්ෂණ	
	ණය වාරිකය	
	රක්ෂණ වාරිකය	
	පාසල් ගාස්තු	
	පාසල් වෑන් රථය	
	විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල්	
	කාර්යාල ප්‍රවාහනය	
විනෝදාස්වාදය	චිත්‍රපට	
	ආහාර ගැනීම	
	සංචාර	
	ක්‍රීඩාගාරය / ක්‍රීඩා සමාජය	
වෙනත්	ඇඳුම්	
	ක්‍රෙඩිට් කාඩ් ගෙවීම	
	ළමා ඉතුරුම් ගිණුම් වෙත මාරු කිරීම්	
	පුණ්‍ය කටයුතු	
	වෙනත් ඉඳහිට කළ වියදම් (විවාහ උත්සව, අවමංගල්‍ය කටයුතු, දානමය කටයුතු ආදිය)	
මුළු වියදම්		

* ඉතිරිකිරීම් ද මුළු එකතුවට ඇතුළත් කළ හැකිය.

සටහන: මෙය උදාහරණයක් පමණි. ඔබේ කැමැත්ත සහ ආදායම් සහ වියදම් වර්ගීකරණය අනුව ඔබට ඔබේ අයවැය ආකෘතිය නිර්මාණය කළ හැකිය.

පස්වන පියවර

ඔබේ අයවැය නිතිපතා නිරීක්ෂණය කර සමාලෝචනය කරන්න.

- එක් එක් කාල පරිච්ඡේදයෙන් පසු සත්‍ය ආදායම් සහ වියදම් අයවැය සමඟ සසඳන්න.
- ඔබ අයවැය සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වී ඇත්නම්, ඒ සඳහා හේතු හඳුනාගෙන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගන්න.
- පවුලේ සියලුම සාමාජිකයින් අයවැය පිළිබඳව දැනුවත් කර එය සාක්ෂාත් කර ගැනීමට ඔවුන්ගේ සහාය ලබා ගන්න.
- දිනපතා කරන සියලුම ගනුදෙනු පිළිබඳ සටහන් තබා ගැනීමට පවුලේ සියලුම සාමාජිකයින් අතර පුරුද්දක් ඇති කර ගන්න.
- අයවැය සාක්ෂාත් කර ගැනීම සඳහා ඔබ සහ ඔබේ පවුලේ සාමාජිකයන් වගකිව යුත්තන් බවට පත් කරන්න.
- ජංගම දුරකථන යෙදුම් : mobile apps for budgeting and saving) භාවිතා කිරීම, ක්‍රෙඩිට් කාඩ් සීමාවන් පැනවීම, ඉතුරුම් සඳහා ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම වැනි වියදම් පාලනය කිරීමේ සහ වියදම් අඩු කිරීමේ ක්‍රම පිළිබඳව පවුලේ සාමාජිකයන්ට දැනුවත් කිරීමට පියවර ගන්න.
- අවශ්‍ය විටෙක ඔබේ අයවැය සංශෝධනය කර යාවත්කාලීන කරන්න.

- උදාහරණයක් ලෙස, ඔබට වැටුප් වැඩිවීමක් හෝ අමතර ආදායමක් ලැබුණු විට, ඔබට ඔබේ ඉතුරුම් ඉලක්ක වැඩි කර ගත හැකිය.
- උද්ධමනය වැනි ආර්ථික පරිසරයේ සිදුවන වෙනස්කම් හේතුවෙන්, ඔබට ඔබේ අයවැය සංශෝධනය කිරීමට අවශ්‍ය විය හැකිය.
- ජීවිතයේ සිදුවන විවිධ වෙනස්කම් හේතුවෙන් අයවැය සංශෝධනය කිරීමට සිදු විය හැක. උදාහරණ ලෙස, වැඩිමහල් දරුවා අධ්‍යාපනය අවසන් කර රැකියාවක් සොයා ගැනීම, තවත් දරුවෙකු විදේශගත අධ්‍යාපනයට යොමු වීම, සහ පවුලේ එක් සාමාජිකයෙකුට බරපතල රෝග යක් ඇති බව හඳුනා ගැනීම ආදිය දැක්විය හැකිය.

සාරාංශය

පුද්ගල මූල්‍ය කළමනාකරණ තීරණ වලදී මූල්‍ය සාක්ෂරතාවයේ කාර්යභාරය මෙම පරිච්ඡේදය තුල විමසා ඇත. මෙහිදී ඔබ විසින් මතක තබා ගත යුතු ප්‍රධාන කරුණු නම්,

- පුද්ගලික මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන අංග වන්නේ ආදායම, වියදම්, ඉතිරිකිරීම්, ආයෝජන, ණය සහ ආරක්ෂාවයි.
- රැකියා, ව්‍යවසායකත්වය, නිදහස් සේවය, කෘෂිකර්මාන්තය සහ පශු සම්පත් වැනි පවතින ආදායම් උපයන අවස්ථා හඳුනා ගැනීම මෙන්ම සුදුසුකම්, පුහුණුව සහ පළපුරුද්ද සහ මෘදු කුසලතා වැනි අවශ්‍යතා ආදායම් කළමනාකරණය කිරීමේදී අත්‍යවශ්‍ය වේ.
- ආදායම වැඩිදියුණු කිරීමට සහ ජීවිතය අඩු ආතතියකින් යුක්ත කිරීමට නිෂ්ක්‍රීය ආදායමක් තිබීම වැදගත් වේ. ඔබේ නිෂ්ක්‍රීය ආදායම ඔබේ වියදම් ඉක්මවා ගිය විට ඔබ මූල්‍යමය වශයෙන් ස්වාධීන පුද්ගලයකු බවට වේ.
- ඔබේ වියදම් ඔබේ ආදායම ඉක්මවා යා හැකි යැයි අපේක්ෂා කෙරෙන අතර ඔබ ඔබේ වියදම් ප්‍රමුඛතා තීරණය කළ පසු, ඔබට කොපමණ මුදලක් වියදම් කල හැකිද යන්න තීරණය කරන්න. ඔබ උපයන ප්‍රමාණයට වඩා වියදම් නොකිරීමට වග බලා ගන්න.
- විවිධ වියදම් හඳුනාගෙන ආදායම් මට්ටම අනුව ඒවා වර්ගීකරණය කර ප්‍රමුඛතාවය දීම අත්‍යවශ්‍ය වේ. වියදම් පිළිබඳ මනෝවිද්‍යාත්මක විශ්ලේෂණයක් වන ඒබ්‍රහම් මැස්ලෝ විසින් රචිත The Hierarchy of Human Needs, වියදම් මට්ටම් තේරුම් ගැනීමට උපකාරී වේ. අර්ථවත් වියදම් කළමනාකරණය සඳහා උපදෙස් අනුගමනය කිරීම සඳහා අවශ්‍යතා සහ වුවමනා පැහැදිලිව තේරුම් ගත යුතුය.
- මුදල් ඉතිරි කිරීම යනු වඩාත් විශාල ශේෂයක් සහිත බැංකු ගිණුමක් ගොඩනඟා ගැනීම පමණක් නොවේ. එය අනෙකුත් අත්‍යවශ්‍ය මූල්‍ය කුසලතා ද ඔබ තුල වැඩි දියුණු කරවයි. එය ඔබට සංවිධානාත්මකව සිටීමට, ස්වයං පාලනයක් පුහුණු කිරීමට සහ ඔබේ අනාගතය සැලසුම් කිරීමට උපකාරී වේ.
- ස්ථිර සහ දැඩි ඉතිරිකිරීමේ සැලැස්මක් අනුගමනය කිරීම හදිසි අවස්ථාවන්ට මුහුණ දීමට සහ සියලු මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමට උපකාරී වේ.
- ආයෝජන වලදී සලකා බැලිය යුතු සාධක රාශියක් ඇත, එනම් එහි අරමුණ, අවදානම සහ ආරක්ෂාව, ප්‍රතිලාභ, ද්‍රවශීලතාවය, ප්‍රතිලාභ වාර ගණන, බදු සහ පරිණත කාලයයි.
- ආයෝජනය කිරීම ඔබේ මූල්‍ය ස්වාධීනත්වය වැඩි දියුණු කරන අතර ධනය උපරිම කිරීමට මඟ පාදයි. කොටස්, බැඳුම්කර, අන්‍යෝන්‍ය අරමුදල්, දේපළ වෙළඳාම්, ව්‍යවසායකත්වය සහ බැංකු ගිණුම් වැනි ශ්‍රී ලංකාවේ ඇති ආයෝජන අවස්ථා හඳුනා ගැනීම සහ නිවැරදි ආයෝජන මෙවලම තෝරා ගැනීම, අදාළ අවදානම් සහ ප්‍රතිලාභ සංසන්දනය කිරීම, ධනය ගොඩනැගීමට සහ අනෙක් අතට මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමට උපකාරී වේ.
- ආයෝජන විකල්ප විශ්ලේෂණය කිරීම සඳහා මුදලෙහි කාලානුරූපී අගය අත්‍යවශ්‍ය මෙවලමකි. සංයුක්ත පොලී (වැල් පොලී) ස්වභාවය හඳුනා ගැනීම ආයෝජනවල අගය වැඩි කිරීමට උපකාරී වේ.
- ණය යනු ප්‍රමාදයකින් තොරව අනාගත ඉලක්ක සපුරා ගැනීමට උපකාරී වන මූල්‍යකරණයේ වැදගත් මූලාශ්‍රයකි. ණය උගුල් වළක්වා ගැනීම සඳහා නිසි ණය කළමනාකරණය අත්‍යවශ්‍ය වේ.
- රක්ෂණය මඟින් අනාගත අවදානම් සහ අවිනිශ්චිතතාවයන් ආවරණය කරන අතර, පරිපූර්ණ විශ්‍රාම සැලසුමක් මගින් වැඩිහිටි පුද්ගලයින් සඳහා සාමකාමී ජීවිතයක් සහ ස්වාධීන විශ්‍රාම වැටුපක් සහතික කරනු ඇත.
- අයවැය යනු ආදායම්, වියදම්, ඉතිරිකිරීම් සහ ණය සැලසුම් කිරීම සඳහා ප්‍රබල මෙවලමකි.

4 වන පරිච්ඡේදය

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා මූල්‍ය කළමනාකරණය

4.1 හැඳින්වීම

ඉගෙනුම් අරමුණු

- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මූල්‍ය සාක්ෂරතාවයේ වැදගත්කම තේරුම් ගැනීම.
- නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවශ්‍ය පියවර හතරක් හඳුනා ගැනීම.
- ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමේ වැදගත්කම තේරුම් ගැනීම.

සාර්ථක ව්‍යාපාරයක අත්තිවාරම මූල්‍ය සාක්ෂරතාවයයි. ආරම්භයේ සිටම අයවැයකරණය, මුදල් ප්‍රවාහ කළමනාකරණය සහ ආයෝජන තක්සේරුව වැනි මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන සංකල්ප තේරුම් ගැනීමට සහය වීමෙන් ව්‍යවසායකයින්ට තම ව්‍යාපාරය පිළිබඳව නිවැරදි තීරණ ගැනීමට මූල්‍ය සාක්ෂරතාවය මඟ පෙන්වනු ලබයි.
මූල්‍ය සාක්ෂරතාවය ව්‍යවසායකයින්ට ආරම්භක පිරිවැය තක්සේරු කිරීමට, සම්පත් ඵලදායී ලෙස වෙන් කිරීමට සහ ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී සුදුසු අරමුදල් ප්‍රභවය තෝරා ගැනීමට උපකාරී වේ. අනාගත ආදායම් සහ වියදම් ප්‍රක්ෂේපණය කිරීමෙන් ව්‍යාපාරයේ ශක්‍යතාව ඇගයීමට ලක් කල හැක.
ව්‍යාපාරය තිරසාර ලෙස ක්‍රියාත්මක වන විට මූල්‍ය සාක්ෂරතාවයේ අවශ්‍යතාවය වඩාත් වැදගත් වේ. මූල්‍ය සාක්ෂරතාවය විසින් ව්‍යාපාරයේ ලාභදායිතාවය ඉහළ දමනඅතරම ව්‍යවසායකයින්ට ඔවුන්ගේ ද්‍රවශීලතාවය සහ ණය කළමනාකරණය කිරීමට අවශ්‍ය දැනුම ලබා දෙමින් ව්‍යාපාරවලට තිරසාර ආයෝජන හරහා වර්ධනය වීමට සහ අවදානම් කළමනාකරණය කිරීමට ඉඩ සලසයි.

ධනංජය රත්නායක තමා ජීවත්වන ප්‍රදේශය අයිති ප්‍රාදේශීය ලේකම් කාර්ය-ාලයේ සිටින ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ :හෑ* නියෝජිත නිලධාරියා හමු වී ඇත.



ඉහත සංවාදයෙන් අවධාරණය කරන්නේ ව්‍යාපාරයක් ආරම්භ කිරීම උද්යෝගිමත් මෙන්ම අභියෝගාත්මක ගමනක් බවයි. ඒ සඳහා කැමැත්ත, සැලසුම් කිරීම සහ උපායමාර්ගික ප්‍රවේශය කෙරෙහි දැඩි අවධානයක් අවශ්‍ය වේ.
ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයක් ආරම්භ කිරීම අභියෝගාත්මක කාර්යයක් ලෙස පෙනෙන්නට පුළුවන. ව්‍යාපාරය ආරම්භ කරන්නේ කෙසේද, මෙම ක්‍රියාවලියේ ප්‍රධාන පියවර සහ ප්‍රාග්ධනය සොයා ගන්නේ කෙසේද යනාදිය පිළිබඳව ඔබට බොහෝ ප්‍රශ්න තිබිය හැකිය.

ව්‍යවසායකත්වය යනු ඉහළ ප්‍රතිලාභ ලැබිය හැකි එහෙත් ඒ හා සමානවම අවදානමක්ද සහිත ආයෝජන අවස්ථාවකි. ව්‍යාපාරයක් ඇරඹීමෙන් ඔබේ අනාගතය උදෙසා සාර්ථක ආදායම් මාර්ගයක් නිර්මාණය විය හැක. එසේම, ඔබේ ව්‍යාපාරික සහ මූල්‍යමය සාර්ථකත්වය බොහෝ දෙනෙකුට තම ව්‍යාපාර ආරම්භ කිරීම අභිප්‍රේරණයක් විය හැකිය. මෙම මාර්ගෝපදේශය පහත පියවර මඟින් ඔබේ අපේක්ෂිත ව්‍යාපාර සිහිනය සැබෑ කර ගැනීමට උපකාරයක් වනු ඇත.

ඔබේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පියවර 4ක්

පළමු පියවර : ඔබේ ව්‍යාපාර අදහස ගොඩනගා ගන්න.

සාර්ථක ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ ආරම්භක පියවර වන්නේ ව්‍යාපාර අදහසක් ගොඩ නැගීමයි. එය දැනුම, නවෝත්පාදනය සහ අදාළ කුසලතා ඒකාබද්ධ කරන නිර්මාණාත්මක ක්‍රියාවලියකි. විශිෂ්ට ව්‍යාපාර අදහසක් සැමවිටම අද්විතීය ව්‍යාපාරයකට මඟ සලසමින් ඔබේ අපේක්ෂාවන් සහ පාරිභෝගික අවශ්‍යතා සමඟ මනා ලෙස පෙළගැස්විය යුතුය.

ව්‍යාපාර අදහසක් ආරම්භයේදීම පරිපූර්ණ සංකල්පයක් වන්නේ ඉතා කලාතුරකිනි. වෙළඳපල ප්‍රතිචාර, නැගී එන ප්‍රවණතා, පාරිභෝගික අවශ්‍යතා සහ තාක්ෂණික වෙනස්කම් මත පදනම්ව ඔබේ අදහස කලින් කලට වෙනස් කිරීමට සහ වැඩිදියුණු කිරීමට සිදු වනු ඇත.

දෙවන පියවර : දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය

ඔබේ ව්‍යාපාර අදහස හඳුනාගත් පසු, ඔබ ඔබේ අභ්‍යන්තර සහ බාහිර ව්‍යාපාරික පරිසරයන් දැන සිටිය යුතුය. මේ සඳහා ඔබේ අපේක්ෂිත ව්‍යාපාරය පිළිබඳ පුළුල් පර්යේෂණයක් හෝ පසුබිම් අධ්‍යයනයක් අවශ්‍ය වේ.

ඔබ පර්යේෂණ කළ යුතු සාධක කිහිපයක් නම්,

- අපේක්ෂිත නිෂ්පාදනයේ හෝ සේවාවේ වත්මන් පිරිවැය ව්‍යුහය
- තරඟකාරිත්වයේ තත්වය (ප්‍රතිවාදීන් සංඛ්‍යාව, ඔවුන්ගේ ශක්තීන් සහ දුර්වලතා සහ ඔවුන්ගේ ගුණාංග, නව වෙළඳපල ප්‍රවණතා, පාරිභෝගික අවශ්‍යතා, පාරිභෝගික මනාපයන් සහ මිලදී ගැනීමේ හැසිරීම් හඳුනා ගැනීම)
- වත්මන් මිලකරණ උපාය මාර්ග සහ නිෂ්පාදනයේ ලාභදායීතාවය.
- පවතින තාක්ෂණයන් සහ අපේක්ෂිත ව්‍යාපාරයේ නව තාක්ෂණික ප්‍රවණතා.
- උද්ධමනය, පොලී සහ විනිමය අනුපාත වැනි පවතින සාර්ව ආර්ථික විචල්‍යයන්ගෙන් නව ව්‍යාපාරයට ඇති විය හැකි බලපෑම අවබෝධ කර ගැනීම.
- වෙළඳපොලේ ඇති විය හැකි නව ව්‍යාපාරික අවස්ථා සහ ඔබේ නිෂ්පාදන විශේෂීකරණය කරන්නේ කෙසේද යන්න හඳුනා ගැනීම.
- ආරම්භක ආයෝජන පිරිවැය අවබෝධ කර ගැනීම සහ ව්‍යාපාරය සඳහා දැනට පවතින ප්‍රාග්ධන ප්‍රභවයන් ඇගයීම.
- ව්‍යාපාරයේ අපේක්ෂිත ආදායමේ ලාභ සමච්ඡේද ලක්ෂ්‍යය (අදායම සහ වියදම සමාන වන විකුණුම් ධාරිතාව) ගණනය කිරීම.
- ආපසු ගෙවීමේ කාලය, ශුද්ධ වර්තමාන වටිනාකම, අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය, වට්ටම් සහිත ආපසු ගෙවීම සහ ආයෝජන ප්‍රතිලාභ වැනි ආයෝජන තක්සේරු ශිල්පීය ක්‍රම භාවිතා කරමින් නව ආයෝජනය ඇගයීම සහ සාධාරණීකරණය කිරීම.
- ව්‍යාපාරයේ විවිධ ආකාර සහ නව ව්‍යාපාරයක් පිහිටුවීම සඳහා අදාළ වන නීතිමය අවශ්‍යතා අවබෝධ කර ගැනීම.
- අපේක්ෂිත ව්‍යාපාරය සඳහා ඇති දේශපාලනික හා සමාජීය පරිසරයේ බලපෑම අවබෝධ කර ගැනීම.
- ව්‍යාපාරය හා සම්බන්ධ අවදානම් සහ ඒවා මැඩපවත්වා ගැනීම සඳහා වත්මන් උපාය මාර්ග තේරුම් ගැනීම.
- සමාගමේ අපේක්ෂිත වටිනාකම් සහ අනාගත ව්‍යාපාරික අභිලාෂයන් තේරුම් ගැනීම.

තුන්වන පියවර : ව්‍යාපාර සැලැස්මක් සකස් කරන්න

ඔබේ ව්‍යාපාර අදහස ගොඩනගා, අවශ්‍ය දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය සිදු කළ පසු, ඔබ ව්‍යාපාර සැලැස්මක් කෙටුම්පත් කළ යුතුය. ව්‍යාපාර සැලැස්මක් මඟින් සමාග මේ මාර්ග සිතියම සකසන අතර එම සැලැස්ම ව්‍යාපාරයේ ආරම්භක ප්‍රාග්ධනය සොයා ගැනීම සඳහා ආයෝජකයින් හෝ මූල්‍ය අතරමැදියන් ආකර්ෂණය කර ගැනීමට ඔබට උපකාරී වේ. ව්‍යාපාර සැලැස්මක් මඟින් ව්‍යාපාරයේ අරමුණු සහ එම අරමුණු සාක්ෂාත් කර ගැනීමේ උපාය මාර්ගය ද පෙන්නුම් කෙරේ.

මනා ලෙස සකසන ලද ව්‍යාපාර සැලැස්මක් පහත කොටස් වලින් සමන්විත වේ.

- ව්‍යාපාරයේ මෙහෙවර, දැක්ම සහ ඉලක්ක
- ව්‍යාපාර ව්‍යුහය සහ කළමනාකරණ ව්‍යුහය
- ව්‍යාපාරයේ, නිෂ්පාදනයේ හෝ සේවාවන්හි ස්වභාවය
- තරඟකරුවන් හඳුනා ගන්නා තරඟකාරී විශ්ලේෂණය, ඔවුන්ගේ ශක්තීන් සහ දුර්වලතා, සහ වෙළඳපල ස්ථානගත කිරීම සහ ඉලක්ක වෙළඳපොළ
- වටිනාකම් යෝජනාව
- මෙහෙයුම් උපාය මාර්ග
- අලෙවිකරණ ප්‍රවේශය
- මූල්‍ය ප්‍රක්ෂේපණ (ඉදිරි ආදායම් සහ වියදම්)

- අවදානම් කළමනාකරණය සහ ව්‍යාපාර ආරක්ෂාව

ව්‍යාපාරයක දැක්ම සහ ශක්‍යතාව කොටස්කරුවන්ට සන්නිවේදනය කිරීම සඳහා මනා ලෙස සකස් කරන ලද ව්‍යාපාර සැලැස්මක් අත්‍යවශ්‍ය වේ.

හතර වන පියවර : ක්‍රියාත්මක කිරීම සහ සමාලෝචනය

මෙම අදියරේදී, ව්‍යාපාර සැලැස්ම පැහැදිලි උපාය මාර්ගික සැලැස්මක් සහිතව ක්‍රියාත්මක කෙරේ. ඒ සඳහා ක්‍රියාවෙහි යෙදවීමට ඇති ප්‍රධාන ක්‍රියාමාර්ග කිහිපයක් නම්,

- අදාළ නීති සහ රෙගුලාසි වලට අනුකූලව ඔබේ ව්‍යාපාරය ලියාපදිංචි කර අවශ්‍ය බලපත්‍ර හෝ බලපත්‍ර ලබා ගැනීම.
- ව්‍යාපාරයට අවශ්‍ය ආරම්භක ප්‍රාග්ධනය සපයා ගනීම.
- නිවැරදි දක්ෂතා සහිත සේවකයින් බඳවා ගෙන ව්‍යාපාර මෙහෙයුම් සිදු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම්, පද්ධති සහ ක්‍රියාවලීන් ස්ථාපිත කිරීම.
- ව්‍යාපාරය පිළිබඳව ප්‍රජාව තුළ දැනුවත්භාවය ඇති කිරීම සහ ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා අලෙවිකරණ උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම.
- ව්‍යාපාරයේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය සහ ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීම.
- මූල්‍ය වාර්තා පවත්වා ගැනීම සහ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම.
- ව්‍යාපාරයේ ප්‍රතිලාභ බෙදා ගැනීම පිළිබඳ තීරණ ගැනීම.

4.2. ව්‍යාපාරයක් ගොඩනැගීම

ඔබ ඔබේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට කැමති නම්, ඔබේ අවශ්‍යතාවලට වඩාත් ගැලපෙන ව්‍යාපාර ආකෘති මොනවාදැයි දැන ගැනීම වැදගත් වේ. විවිධ ව්‍යාපාරවලට ඒවායේ හිමිකාරිත්වය සහ නීත්‍යානුකූලභාවය මත පදනම්වූ විවිධ ආකෘති ඇත.

ඉගෙනුම් අරමුණු

- හිමිකාරිත්වය සහ නීත්‍යානුකූලභාවය මත පදනම්ව ප්‍රධාන ව්‍යාපාර වර්ග හතර හඳුනා ගැනීම.
- එක් එක් ව්‍යාපාර වර්ගය සඳහා හිමිකාරිත්වය, නීත්‍යානුකූලභාවය, වගකීම් ප්‍රමාණය, ලියාපදිංචිය සහ අදාළ නීති දැන ගැනීම.
- එක් එක් ව්‍යාපාර වර්ගය සඳහා බදු ගෙවීම් තේරුම් ගැනීම.

ධනංජය හෑෂ් නිලධාරිණිය සමඟ ඔහුගේ සාකච්ඡාව දිගටම කරගෙන ගියේය.

ව්‍යාපාරයක හිමිකාරිත්වය එහි ප්‍රාග්ධනයට දායකත්වය දක්වා ඇති ආකාරය මත රඳා පවතී. ප්‍රාග්ධනය යනු ව්‍යාපාර මෙහෙයුම් සඳහා හිමිකරු(වන්) විසින් ලබා දෙන අරමුදල් වේ. එය හිමිකරු(වන්) විසින් කරන ලද ආයෝජනයක් ලෙස සැලකේ. නීතිය ඉදිරියේ ව්‍යාපාරයේ නීත්‍යානුකූල පැවැත්ම, ලියාපදිංචි කිරීම සහ බාහිර වගකීම් පියවීම සඳහා එහි හිමිකරුවන්ගේ වගකීමේ ප්‍රමාණය අදාල නීති, නීත්‍යානුකූලභාවය මඟින් ඉස්මතු කරනු ලබයි.

හිමිකාරිත්වය සහ නීත්‍යානුකූලභාවය මත පදනම් වූ ප්‍රධාන ව්‍යාපාර වර්ග තුන හඳුනා ගනිමු.

- තනි පුද්ගල හිමිකාරිත්වය
- හවුල්කාරිත්වය
- සීමිත සමාගම්

මම මගේ ව්‍යාපාරයේ එකම හිමිකරු වෙමි. → තනි පුද්ගල හිමිකාරිත්වය
→ සීමිත පුද්ගලික සමාගම්

මගේ ව්‍යාපාරයේ හිමිකරුවන් ලෙස මගේ මිතුරන් සහ මගේ පවුල එකතු කර ගැනීමට මම කැමතියි → හවුල්කාරිත්වය
→ සීමිත පුද්ගලි/පොදු සමාගම්

පහත වගුවේ විවිධ වර්ගයේ ව්‍යාපාර සංවිධාන සංසන්දනය කර පෙන්වයි

ව්‍යාපාර ආකෘතිය	හිමිකාරිත්වය	නීත්‍යානුකූලභාවය	වගකීම් ප්‍රමාණය	ව්‍යාපාරය ලියාපදිංචි කිරීම	ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේදී අදාළ නීති
තනි පුද්ගල හිමිකාරිත්වය	එක් හිමිකරුවෙකු පමණි. ව්‍යාපාරයේ 'හිමිකරු' ලෙස හඳුනා ගනී.	ව්‍යාපාරයට නීත්‍යානුකූල අනන්‍යතාවයක් නොමැත. හිමිකරු විසින් නීතිය ඉදිරියේ ව්‍යාපාරය නියෝජනය කළ යුතුය. බාහිර පාර්ශ්වයන්ට හිමිකරුගේ නමින් ව්‍යාපාරයට එදිරිව නඩු පැවරිය හැකිය.	ව්‍යාපාරයේ බාහිර වගකීම් පියවීම සඳහා හිමිකරුට වගකීමක් ඇති අතර, ඒ සඳහා හිමිකරුගේ පෞද්ගලික වත්කම් ද භාවිතා කිරීමට සිදු විය හැකිය.	ලියාපදිංචිය අනිවාර්ය නොවේ. කෙසේ වෙතත්, ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ ලිපිනය පිහිටි ප්‍රදේශයේ පළාත්/ප්‍රාදේශීය සභාවේදී ඔබේ තනි ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතුයි.	අදාළ නොවේ
හවුල්කාරත්වය	හිමිකරුවන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක්. හිමිකරුවන් හවුල්කරුවන් ලෙස හඳුනාගෙන ඇත. ලියාපදිංචි කිරීමේදී එකඟ වූ ලාභ බෙදා ගැනීමේ අනුපාතයට අනුව හවුල්කරුවන් අතර ලාභ/අලාභ බෙදා ගනු ලැබේ.	ව්‍යාපාරයට නීත්‍යානුකූල අනන්‍යතාවයක් නොමැත. හවුල්කරුවන් නීතිය ඉදිරියේ ව්‍යාපාරය නියෝජනය කළ යුතුය. හවුල්කරුවන්ගේ නම් ව්‍යාපාරය වෙනුවෙන් භාවිතා කළ හැකිය.	හවුල්කරුවන් හවුල්කාරිත්වයේ වගකීම් සඳහා ඒකාබද්ධව වගකිව යුතුය.	ප්‍රාග්ධනය රු. 1000 ඉක්මවන්නේ නම් ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ. ව්‍යාපාර ස්ථානයේ ලිපිනයට අදාළ පළාත්/ප්‍රාදේශීය සභාවේදී ඔබට හවුල්කාරිත්ව ව්‍යාපාරය ලියාපදිංචි කළ හැකිය.	1890 හවුල්කාරිත්ව පනත ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ පනත (1987 අංක 07)
පුද්ගලික සීමිත සමාගම	එක් හිමිකරුවෙක් හෝ හිමිකරුවන් කිහිප දෙනෙක්. හිමිකරුවන්(ය) කොටස් හිමියන් ලෙස හඳුනා ගැනේ. ලාභයෙන් කොටසක් පමණක් 'ලාභාංශ' ලෙස කොටස් හිමියන් අතර බෙදා ගනු ලැබේ.	නීතිය ඉදිරියේ ව්‍යාපාරය වෙනම පුද්ගලයෙකු ලෙස හඳුනාගෙන ඇත.	කොටස් හිමියන් ව්‍යාපාරයේ බාහිර වගකීම් සඳහා වගකිව යුත්තේ ඔවුන් විසින් ප්‍රාග්ධනයට දක්වා ඇති දායකත්වයේ ප්‍රමාණයට පමණි.	සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි වීම අනිවාර්ය වේ. දැන්, ලියාපදිංචිය අන්තර්ජාලය ඔස්සේ සිදු කළ හැකිය. යඑඑචඑරුරුඅඅඅග ාරජගටදඩගකනරු	2007 අංක 07 දරන සමාගම් පනත

ඔබගේ ව්‍යාපාරය ස්ථානගත කරන ප්‍රදේශයට අයත් නගර/ප්‍රාදේශීය සභාවෙන් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සහ වෙළඳ සහතික ලබා ගත යුතුය. තවද, ව්‍යාපාරයේ ස්වභාවය අනුව අදාළ රජයේ බලධාරීන් සමඟ ලියාපදිංචි වීම සහ ව්‍යාපාරය පවත්වාගෙන යාමට අවශ්‍ය කරන වෙනත් බලපත්‍ර හෝ අවසරපත් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ. එමඟින්, නීතිමය අනුකූලතාවය සහතික කරන අතර ගනුදෙනුකරුවන්, ආයෝජකයින් සහ සැපයුම්කරුවන් වැනි ප්‍රධාන කොටස්කරුවන් විසින් ඔබේ ව්‍යාපාරය කෙරෙහි තබන විශ්වසනීයත්වය තහවුරු කරනු ලබයි.

ව්‍යාපාරයේ ප්‍රමාණය සහ විකුණුම් ආදායම මත, ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ක්෴ෂුද්‍ර, සුළු හා මධ්‍යම ලෙස පහත නිර්ණායක අනුව වර්ගීකරණය කල හැක.

˜ස'ැරැඵජචදර	කරසඑැරස්	එැසමප	˜ජකක	එසජරද
ඒබමඡේජඑමරසබට	්‍බබමේක ඔමරබදඩැර	ඍග 351 එබ් 1 ඉබ	ඍග 21් 350 එබ	ඍග 20 එබ දර කෑ එය්බ ඍග 20 එබ
	හදග දෙ ඍපචකදහෑ	51 - 200	10 - 50	ඕෑ එය්බ 10
˜ැරඩසජ්‍ෑ'ැජචදර	්‍බබමේක ඔමරබදඩැර	ඍග 351 එබ් 1 ඉබ	ඍග 21් 350 එබ	ඍග 20 එබ දර කෑ එය්බ ඍග 20 එබ
	හදග දෙ ඍපචකදහෑ	51 - 200	5 - 50	ඕෑ එය්බ 05

විවිධ ව්‍යාපාර වර්ගවලට අදාළ බදු බැඳීම්

ආදායම් බදු නීතියට අනුව තක්සේරු වර්ෂය ලෙස හඳුන්වන මූල්‍ය වර්ෂයක් සඳහා ව්‍යාපාර ලාභයක් ඇති සියලු෴ම ව්‍යාපාර විසින් රජය විසින් නියම කර ඇති පරිදි ඔවුන්ගේ ව්‍යාපාර ලාභය සඳහා ආදායම් බදු ගෙවිය යුතුය. බදු නීති සහ රෙගුලාසි නිතිපතා වෙනස් වීමට යටත් වේ. යාවත්කාලීන බදු තොරතුරු ලබා ගැනීම සඳහා, https://www.ird.gov.lk/ වෙත පිවිසෙන්න.

ඔබේ ව්‍යාපාරය ස්වභාවය මත පදනම්ව බදු වගකීම පහත පරිදි පැන නගී.

තනි පුද්ගල හිමිකාරත්වය	බදු අය කළ හැකි ලාභය, ඔවුන්ගේ ආදායම් බදු ගණනය කිරීමේදී හිමිකරුගේ ආදායම් මූලාශ්‍රය ලෙස හඳුනා ගනු ලැබේ. (මෙය ආදායම් බදු නීතියේ හිමිකරුගේ තක්සේරු කළ හැකි ආදායමේ කොටසක් ලෙස හඳුනාගෙන ඇත). එබැවින්, ව්‍යාපාර ලාභය ආදායම් බද්දට යටත් වන්නේ හිමිකරුගේ මුළු බදු අය කළ හැකි ආදායම (ව්‍යාපාර ලාභය ඇතුළුව) ආදායම් බද්දට යටත් වන්නේ නම් පමණි. ව්‍යාපාරයට අලාභයක් සිදුවුවහොත්, එය ඊළඟ වසර දක්වා ඉදිරියට ගෙන යා හැකිය, නැතහොත් හිමිකරුගේ තක්සේරු කළ හැකි ආදායමට එරෙහිව හිලව් කළ හැකිය.
හවුල්කාරත්වය	ආයතනයක් ලෙස හවුල්කාරිත්වයක බදු අය කළ හැකි ලාභයෙන් ආදායම් බදු ගෙවිය හැකිය. හවුල්කාරිත්වයේ බදු අය කළ හැකි ලාභය ඔවුන්ගේ ලාභ බෙදා ගැනීමේ අනුපාතය අනුව හවුල්කරුවන් අතරේ බෙදා ගනු ලබන අතර හවුල්කරුවන්ගේ ආදායම් බදුකරණයේදී ඔවුන්ගේ ආදායම් ප්‍රභවයේ කොටසක් ලෙස සලකනු ලැබේ. එකම ලාභය දෙවරක් බදු අය කිරීම වළක්වා ගැනීම සඳහා, හවුල්කාරිත්වය විසින් ගෙවන ලද මුළු බදු ද හවුල්කරුවන් අතරේ බෙදා ගනු ලබන අතර, එමගින් ආයතනයක් ලෙස හවුල් ව්‍යාපාරය විසින් ගෙවූ බදු හවුල් කරුවන්ගේ පුද්ගලික ආදායම් බදු වගකීමෙන් අඩු කිරීමට ඉඩ සලසයි.
සීමිත වගකීම් සමාගම් (පෞද්ගලික/පොදු)	සීමිත සමාගම්වල බදු අය කළ හැකි ලාභය මත බදු අය කෙරේ. සමහර ව්‍යාපාර සමාගම් වලට එය නියැලෙන කර්මාන්තය මත පදනම් වූ විශේෂ බදු අනුපාත ගෙවීමට බැඳී සිටී. (උදා: මත්පැන් සහ දුම්කොළ ව්‍යාපාර)

ව්‍යාපාරයේ ආදායම් පරිමාව මත පදනම්ව, ඔබේ ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ අගය එකතු කළ බදු සඳහා ලියාපදිංචි කළ යුතුය. වැඩිදුර තොරතුරු සඳහා https://www.ird.gov.lk/ වෙත පිවිසෙන්න.

4.3. ව්‍යාපාරයේ පිරිවැය හඳුනා ගැනීම

ව්‍යාපාරයක ප්‍රධාන අරමුණ ලාභ උත්පාදනය කිරීමයි. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා, ඔබට ඔබේ නිෂ්පාදන හෝ සේවාවන් මිල දී ගැනීම, නිෂ්පාදනය කිරීම හෝ සැපයීම සඳහා වන සැබෑ පිරිවැයට වඩා ඉහළ මිලකට අලෙවි කළ යුතුය.

ඉගෙනුම් අරමුණු

- ඔබේ ව්‍යාපාරයේ පිරිවැය විශ්ලේෂණය කිරීමේ වැදගත්කම තේරුම් ගැනීම.
- පිරිවැය වර්ගීකරණය හඳුනා ගැනීම. දායකත්වය සහ හැසිරීම මත පදනම්ව පිරිවැය වර්ගීකරණය කිරීම
- ඒකකයකට පිරිවැය ගණනය කරන්නේ කෙසේදැයි ඉගෙන ගැනීම.
- ව්‍යාපාරයේ ලාභ සමච්ඡේද ලක්ෂ්‍යය හඳුනා ගැනීම සහ තීරණ ගැනීම සඳහා භාවිත කිරීමට ඉගෙන ගැනීම.
- නිෂ්පාදනයේ මිල නියම කිරීමේදී සලකා බැලිය යුතු සාධක හඳුනා ගැනීම.
- ක්ෂුද්‍ර, සුළු හා මාධ්‍ය පරිමාන ව්‍යාපාර විසින් අනුගමනය කරන පොදු මිලකරණ උපාය මාර්ග දැන ගැනීම.

හෑ් නිලධාරිණිය සහ ධනංජය අතර සාකච්ඡාවට අමුත්තෙකු විසින් බාධා කරන ලදී.



ව්‍යවසායකයෙකු විසින් තම ව්‍යාපාරයේ පිරිවැය විශ්ලේෂණය කළ යුත්තේ ඇයි?

1. සම්පත් කාර්යක්ෂමතාව: ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාන ව්‍යාපාර තම ව්‍යාපාර කටයුතු කරනු ලබන්නේ බොහෝ විට ඉතා සීමිත සම්පත් ප්‍රමාණයක් සමගය. පිරිවැය විශ්ලේෂණය මඟින් එම සීමිත ව්‍යාපාර සම්පත් ඵලදායී ලෙස කළමනාකරණය කරන අතරම පිරිවැය ඉතිරි කිරීමේ අවස්ථා හඳුනා ගැනීමට උපකාරී වේ.

2. මිලකරණ තීරණ: ස්ථාවර, විචල්‍ය සහ අනෙකුත් පිරිවැය අවබෝධ කර ගැනීම සැබෑ පිරිවැය ගණනය කිරීම සහ නිෂ්පාදනයේ නිවැරදි මිල නියම කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

3. ලාභදායිතා විශ්ලේෂණය: පිරිවැය විශ්ලේෂණය මඟින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාන ව්‍යාපාර වලට එක් එක් නිෂ්පාදනයේ ලාභදායීතාවය තීරණය කිරීමට උපකාරී වන අතර ඉහළ ආන්තික නිෂ්පාදන ධාරිතාවයක් කෙරෙහි අවධානය යොමු කිරීමට උපකාරී වේ.

4. නිවැරදි ව්‍යාපාරික තීරණ ගැනීම: ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාන ව්‍යාපාර විසින් ව්‍යාපාරය තුලම නිපදවීම, බාහිර සැපයුම් කරුවන්ගෙන් ලබා ගැනීම, ව්‍යාපාර මෙහෙයුම් පුළුල් කිරීම හෝ නිෂ්පාදනය නතර කිරීම වැනි ව්‍යාපාරික තීරණ ගනු ලබයි. පිරිවැය විශ්ලේෂණය මඟින් මෙම තීරණ සඳහා අතවශ්‍ය තොරතුරු සපයනු ලබයි.

5. අයවැයකරණය සහ සැලසුම් කිරීම: පිරිවැය විශ්ලේෂණය ඵලදායී අයවැයකරණයක් සඳහා මූලික පදනම සකසන අතර කෙටි කාලීන සහ දිගු කාලීන මෙහෙයුම් සඳහා ව්‍යාපාරික සැලසුම් සකස් කිරීමට පිරිවැය විශ්ලේෂණ උපකාරී වේ.

6. අධීක්ෂණය සහ විචල්‍යතා විශ්ලේෂණය: ව්‍යාපාරයේ මූල්‍ය කාර්ය සාධනය නිරීක්ෂණය කිරීමට සහ පිරිවැය ඉක්මවා යාම කළමනාකරණය කිරීමට සහ වැළැක්වීම සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට පිරිවැය නිරීක්ෂණය කළ යුතුය. ව්‍යාපාරයට කිසියම් අහිතකර විචලනයන් හමු වුවහොත්, ඒවා අවම කිරීම සඳහා ක්‍රියාකාරී පියවර ගැනීමට පිරිවැය තොරතුරු ඉවහල් වේ.

පිරිවැය යනු කුමක්ද

ලාභ උපයා ගැනීම සඳහා භාණ්ඩය හෝ සේවාව නිෂ්පාදනය කර විකිණීමට දරන ලද සත්‍ය හෝ නාමික වියදම පිරිවැය ලෙස හැඳින්වේ.ග

ධනංජයගේ අවන්හල සඳහා විය හැකි වියදම් පහත දැක්වේ.

- ව්‍යාපාර පරිශ්‍රයේ කුලී පිරිවැය
- විදුලි බිල්පත්
- ජල බිල්පත්
- ව්‍යාපාර ලියාපදිංචි ගාස්තු
- කුලී ගිවිසුම සඳහා නීතිමය ගාස්තු
- ආහාර සෑදීමට අවශ්‍ය අමුද්‍රව්‍යවල පිරිවැය. (සහල්, එළවළු, මාළු, මස්, බිත්තර, කුළුබඩු, තෙල්, ආදිය)
- කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන වැටුප්. (අරක්කැමියා, මුදල් අයකැමි, පිරිසිදු කරන්නා, වේටර්, ආදිය)
- මුළුතැන්ගෙයි උපකරණවල පිරිවැය
- කෑම උපකරණවල පිරිවැය
- පිඟන් සහ පිඟන් වල පිරිවැය
- බජ ගෑස් පිරිවැය
- ගෘහ භාණ්ඩවල පිරිවැය (මේස සහ පුටු)
- අලෙවිකරණ පිරිවැය (වෙළඳ දැන්වීම්)
- අභ්‍යන්තර අලංකරණය කිරීමේ පිරිවැය
- ගෘහ භාණ්ඩ ක්ෂය වීම
- ණය පොලිය

ඔබේ ව්‍යාපාරයේ පිරිවැය වර්ගීකරණය කරන්නේ කෙසේද?

ඔබේ ව්‍යාපාරයේ විය හැකි සියලුම පිරිවැය අයිතම හඳුනාගත් පසු, ඔබට මෙම පිරිවැය විවිධාකාරයෙන් වර්ගීකරණය කළ හැකිය. බහුලව භාවිතා වන මෙන්ම වඩාත්ම වැදගත්වන වර්ගීකරණයන් වන්නේ:

1. පිරිවැය දායකත්වයේ ස්වභාවය අනුව: මෙම වර්ගීකරණය ව්‍යාපාරයේ අවසාන නිෂ්පාදනයට එක් එක් පිරිවැය දායක වන ආකාරය මත පදනම් වේ.
2. පිරිවැය හැසිරීම අනුව: ක්‍රියාකාරකම් මට්ටමේ වෙනස්කම් වලට (නිෂ්පාදනය කරන ලද හෝ විකුණන ලද ඒකක ගණන) අනුරූපව පිරිවැයේ සිදුවන වෙනස් වීම් මත පදනම්ව මෙම වර්ගීකරණය සිදුකර ඇත.

පිරිවැය දායකත්වයේ ස්වභාවය වර්ගීකරණය

අවසාන නිෂ්පාදනයට පිරිවැය දායක වන ආකාරය අනුව පිරිවැය වර්ග දෙකක් තිබේ.

1. සෘජු පිරිවැය: නිෂ්පාදනය කරන ලද නිෂ්පාදනය/සේවාව සමඟ සෘජුවම සම්බන්ධ වන මෙම පිරිවැය ඉතා පැහැදිලිව නිෂ්පාදන පිරිවැය ලෙස හඳුනාගත හැකිය. සෘජු පිරිවැය නිෂ්පාදන ව්‍යාපාරයක ප්‍රධාන පිරිවැය වන අතර, මෙම පිරිවැයයන් දැරීමෙන් තොරව ඔබට භාණ්ඩ නිෂ්පාදනය කිරීමට හෝ සේවාව සැපයීමට නොහැකිය.

   උදාහරණය: අවන්හලක නිෂ්පාදිතය ලෙස පිරිනමනු ලබන ආහාර සලකා බැලූ විට,

   - ආහාර පිසීමට ගන්න අමුද්‍රව්‍ය (සහල්, පිටි, එළවළු, මාළු, කුකුල් මස්, කුළුබඩු, තෙල් ආදිය) - මේවා ද්‍රව්‍ය පිරිවැය ලෙස හැඳින්වේ
   - සූපවේදියා සඳහා ගෙවීම් - මේවා ශ්‍රම පිරිවැය ලෙස හැඳින්වේ
   - නිෂ්පාදනයට සෘජුවම සම්බන්ධ අනෙකුත් වියදම් (කඩදාසි සර්වියට්, ඇසුරුම, ලේබල් ආදිය) මේවා සෘජු පොදුකාර්ය වියදම් ලෙස හැඳින්වේ

2. වක්‍ර පිරිවැය / වක්‍ර පොදු කාර්ය වියදම්: මෙම වියදම් භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කිරීමට සෘජුවම සම්බන්ධ නොවන වියදම් වේ. වක්‍ර පිරිවැය අවසන් නිෂ්පාදිතයට කොතරම් ප්‍රමාණයකින් දායක වී ඇතිදැයි පැහැදිලි ලෙස සොයාගත නොහැක. වක්‍ර පිරිවැයද වක්‍ර අමුද්‍රව්‍ය, වක්‍ර ශ්‍රමය සහ වෙනත් වක්‍ර වියදම් ලෙස හඳුනා ගත හැකිය.

   උදාහරණය: අවන්හලක නිෂ්පාදිතය ලෙස පිරිනමනු ලබන ආහාර සලකා බැලූ විට,

   සූපවේදියාගේ වැටුප, වේටර් ගේ වැටුප

   අයකැමියාගේ වැටුප, ගොඩනැගිලි කුලිය, විදුලි බිල, ජල බිල, දුරකථන බිල යනාදී පිරිවැයන් සකස් කරන ලද සහ විකුණන ලද ආහාර ද්‍රව්‍ය ප්‍රමාණයට(කෑම පිඟන් ප්‍රමාණයට) අනුරූපව වෙනස් නොවේ.

හැසිරීම අනුව පිරිවැය වර්ගීකරණය

හැසිරීම අනුව පිරිවැය පහත පරිදි වර්ගීකරණය කල හැක.

1. විචල්‍ය පිරිවැය: නිෂ්පාදනය කරන ලද ඒකක ගණනට අනුරූපීව වෙනස් වන පිරිවැය විචල්‍ය පිරිවැය වේ.

   උදාහරණය: අවන්හලක නිෂ්පාදිතය ලෙස පිරිනමනු ලබන ආහාර සලකා බැලූ විට,

   සෘජු ද්‍රව්‍ය: සහල්, එළවළු. මාළු, මස්, බිත්තර වැනි ආහාර සකස් කිරීමට සෘජුවම දායක වන පිරිවැය අංගයන්

   සෘජු ශ්‍රමය: නිපදවනු ලැබූ භාණ්ඩ ගණන අනුව ගෙවනු ලබන වේතන. (කෑලි ගණනට ගෙවීම්) බත් පිඟානක් හෝ පැකට්ටුවක් සැකසීම වෙනුවෙන් අරක්කමියාට යම් ස්ථාවර මුදලක් ගෙවන්නේ නම් එය සෘජු වැටුප් ලෙස සැලකේ. එසේ වුවද, සූපවේදියාගේ මාසික වැටුප සෘජු පිරිවැය ලෙස නොසැලකේ.ග

2. ස්ථාවර පිරිවැය: කෙටි කාලයේදී ව්‍යාපාරයක නිෂ්පාදනය කරන භාණ්ඩ හෝ සේවා ඒකක ගණන අනුව වෙනස් නොවන පිරිවැය ස්ථාවර පිරිවැය වේ.

   උදාහරණය: අවන්හලක නිෂ්පාදිතය ලෙස පිරිනමනු ලබන ආහාර සලකා බැලූ විට,

   උදාහරණය: අවන්හලක නිෂ්පාදිතය ලෙස පිරිනමනු ලබන ආහාර සලකා බැලූ විට,

   නිෂ්පාදනය කර විකුණන ලද ආහාර පිඟන් ගණනට අනුරූපීව වක්‍ර පිරිවැය වෙනස් නොවේ. එය වෙනස් නොවී ස්ථාවරව පවතී.

   ගොඩනැගිලි කුලිය, අයකැමියාගේ වැටුප සහ පිරිසිදු කරන්නාගේ වැටුප යනාදී පිරිවැයයන් සකස් කරන ලද ආහාර පිඟන් ගණන අනුව වෙනස් නොවේ.

3. අර්ධ විචල්‍ය පිරිවැය: විචල්‍ය සහ ස්ථාවර සංරචක දෙකම ඇති පිරිවැයයන් අර්ධ විචල්‍ය පිරිවැය වේ.ග

   උදාහරණය: විදුලි බිල්පතක භාවිත කරන ලද විදුලි ඒකක ගණන අනුව වෙනස් නොවන ස්ථාවර සංරචකයක් ඇත. කෙසේ වෙතත්, විදුලි භාවිතය සඳහා වන ගාස්තුව ව්‍යාපාරයේ මෙහෙයුම් කාලය සහ ක්‍රියාකාරකම් මට්ටම අනුව ද වෙනස් වේ. ඒ අනුව විදුලි බිලක, ස්ථාවර කොටසක් මෙන්ම ව්‍යාපාරයේ ස්වභාවය සහ විදුලිය භාවිතා කරන ආකාරය මත රඳා පවතින විචල්‍ය කොටසක්ද ඇතුලත් ය. එබැවින්, එය අර්ධ විචල්‍ය පිරිවැයක් ලෙස හඳුනා ගත හැක. එලෙස, ස්ථාවර සහ විචල්‍ය යන ලක්ෂණ දෙකම ඇතුලත් පිරිවැයයන් වෙනම හඳුනා ගත යුතුය.

ධනංජයගේ අවන්හලේ පිරිවැය වර්ගීකරණ

පිරිවැය අයිතමය / වර්ගීකරණය	දායක වන ආකාරය				හැසිරීම		
	සෘජු			වක්‍ර	විචල්‍යය	ස්ථාවර	අර්ධ විචල්‍යය
	ද්‍රව්‍ය	ශ්‍රම	පොදුකාර්ය				
කුලී පිරිවැය				✓		✓	
විදුලි බිල්පත්				✓			✓
ජල බිල්පත්				✓			✓
ව්‍යාපාර ලියාපදිංචි ගාස්තු	ව්‍යාපාර මෙහෙයුම් පිරිවැයක් නොවේ.						
කුලී ගිවිසුම සඳහා නීතිමය ගාස්තු	ව්‍යාපාර මෙහෙයුම් පිරිවැයක් නොවේ.						
ආහාර පිසීමට අවශ්‍ය අමුද්‍රව්‍යවල පිරිවැය. (සහල්, එළවළු, මාළු, මස්, බිත්තර, කුළුබඩු, තෙල් ආදිය)	✓				✓		
කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන වැටුප්. (අරක්කැමියා, මුදල් අයකැමියා, පිරිසිදු කරන්නා, වේටර්, ආදිය)				✓		✓	
මුළුතැන්ගෙයි උපකරණවල පිරිවැය	ව්‍යාපාර මෙහෙයුම් පිරිවැයක් නොවේ.						
අහාර ගැනීමේ උපකරණවල පිරිවැය (හැඳි, ගෑරුප්පු)	ව්‍යාපාර මෙහෙයුම් පිරිවැයක් නොවේ.						
පිඟන් සහ දීසි වල පිරිවැය	ව්‍යාපාර මෙහෙයුම් පිරිවැයක් නොවේ.						
බඡ ගෑස් පිරිවැය				✓	✓		
ගෘහ භාණ්ඩවල පිරිවැය (මේස සහ පුටු)	ව්‍යාපාර මෙහෙයුම් පිරිවැයක් නොවේ.						
අලෙවිකරණ පිරිවැය (වෙළඳ දැන්වීම්)				✓		✓	
අභ්‍යන්තර අලංකරණය කිරීමේ පිරිවැය	ව්‍යාපාර මෙහෙයුම් පිරිවැයක් නොවේ.						
ගෘහ භාණ්ඩ ක්ෂය වීම				✓		✓	
ණය පොලිය (ප්‍රාග්ධනය සොයා ගැනීමට ණයක් ලබාගෙන තිබේ නම්)				✓		✓	

ඒකක පිරිවැය ගණනය කරන්නේ කෙසේද?

ඒකක පිරිවැය ගණනය කිරීමට ඇති සරලම ක්‍රමය නම් ඒකක විචල්‍ය පිරිවැය පහත පරිදි ගණනය කිරීමයි.

ඒකකයකට ද්‍රව්‍ය පිරිවැය	ooo
ඒකකයකට ශ්‍රම පිරිවැය	ooo (ශ්‍රමය කෑලි අනුපාතයට ගෙවන්නේ නම් පමණි)
ඒකකයකට සෘජු වියදම්	ooo
ඒකකයකට මුළු විචල්‍ය පිරිවැය	ooo

උදාහරණය: ධනංජයගේ අවන්හලේ ව්‍යංජන සහිත බත් පිඟානක විචල්‍ය පිරිවැය පහත පරිදි ගණනය කළ හැකිය.

සෘජු ද්‍රව්‍ය පිරිවැය:

සහල් :රු. 230රැනට ං 0ග125නට*	28.75
එළවළු තුනක් :රු. 400රැනට ං 0ග04නට ං 3*	48.00
පරිප්පු :රු. 300රැනට ං 0ග03නට*	09.00
බිත්තරයක්	45.00
පිඟානකට සම්පූර්ණ සෘජු ද්‍රව්‍ය පිරිවැය	130ග75

ඉඟිය: කෝකියාට හෝ සූපවේදියාට ප්‍රායෝගිකව ගෙවනු ලබන්නේ කෑලි පදනමක් මත නොවන නිසා සෘජු ශ්‍රම පිරිවැය මෙහිදී අදාළ නොවේ. විකුණන ලද බත් පිඟන් ගණන නොසලකා ඔවුන්ට මාසික වැටුපක් ගෙවනු ලැබේ.

එබැවින්, බත් පිඟානක විචල්‍ය පිරිවැය = රු.130.75 කි.

ධනංජය මෙම බත් පිඟාන රුපියල් 350 කට විකුණන්නේ නම්, එක් පිඟානකින් ලැබෙන දායකත්වය රුපියල් 219.25 (350-130.75) කි. කෙසේ වෙතත්, මෙය ඔහුගේ අවසාන ලාභය නොවේ. ඔහුගේ අවසාන ලාභය ලබා ගැනීම සඳහා ඔහු මුළු දායකත්වයෙන් පොදු කාර්ය පිරිවැය (ස්ථාවර පිරිවැය) අඩු කළ යුතුය.

බත් පිඟානක විකුණුම් මිල 350ග00

බත් පිඟානක විචල්‍ය පිරිවැය 130ග75

බත් පිඟානක දායකත්වය
219.25 (විකුණුම් මිල - විචල්‍ය පිරිවැය)

ලාභ සමච්ඡේද ලක්ෂ්‍යයි

ලාභ සමච්ඡේද ලක්ෂ්‍යය යනු ව්‍යාපාරයේ මුළු පිරිවැය ආවරණය කරන විකුණුම් ඒකක ගණනයි.

මේ අනුව කුලිය, ගෑස්, වැටුප්, උපයෝගිතා බිල්පත් වැනි ස්වභාවයෙන්ම නියම කර ඇති සියලුම වක්‍ර වියදම් ආවරණය කිරීම සඳහා ධනංජයට කොපමණ බත් පිඟන් ප්‍රමාණයක් විකිණිය යුතුද යන්න ගණනය කළ හැකිය.

ව්‍යාපාරයේ මුළු ස්ථාවර පිරිවැය = ලාභ සමච්ඡේද ඒකක ගණන

ඒකකයකට දායකත්වය

ධනංජයගේ අවන්හල සඳහා මසකට රුපියල් 150,000 ක මුළු ස්ථාවර පිරිවැයක් (කුලිය, වැටුප්, උපයෝගිතා බිල්පත් ආදිය ඇතුළුව) දරන්නේ නම්, ඔහුගේ මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා ඔහු විකිණිය යුතු බත් පිඟන් ගණන:

150,000 රු 219ග25 බත් පිඟන් 685 :එක මාසයකදී*

ලාභ සමච්ඡේද විකුණුම් වටිනාකම

ලාභ සමච්ඡේද විකුණුම් වටිනාකම = ලාභ සමච්ඡේද ඒකක ගණන ෆ ඒකකයක අපේක්ෂිත විකුණුම් මිල

ඉහත සඳහන් ආහාර ලේඛනයට අනුව මාසිකව පිඟන් 685 ක් අලෙවි කිරීමෙන් ඔහුට මුළු මාසික පිරිවැය පියවා ගත හැකිය.

එබැවින්, ලාභ සමච්ඡේද විකුණුම් අගය විය යුත්තේ = බත් පිඟන් 685* රු. 350/- (විකුණුම් මිල) රු. 239,750.00

ඉලක්කගත ලාභය

ලාභ සමච්ඡේද ලක්ෂ්‍යයේ ඒකක ගණනින් පසු විකුණනු ලබන සෑම බත් පිඟානකින්ම ව්‍යාපාරය ලාභ ඉපයීමට පටන් ගනී.

ව්‍යාපාරයේ මුළු ස්ථාවර පිරිවැය + ඉලක්කගත ලාභය

ඒකකයකට දායකත්වය

ධනංජයට මසකට රු. 100,000 ක ලාභයක් උපයා ගැනීමට අවශ්‍ය නම්, බත් පිඟන් 1,141ක් විකිණීමට සිදුවේ.

(150,000+100,000)/ 219.25 = 1,141

ඉහත උදාහරණයේ දක්වා ඇති පරිදි, එදිනෙදා ව්‍යාපාරික තීරණ ගැනීමේදී, ව්‍යාපාරයේ පිරිවැය විශ්ලේෂණය කිරීමෙන් ව්‍යවසායකයෙකුට සැලකිය යුතු ප්‍රතිලාභ ලබා ගත හැකිය.

ඔබේ නිෂ්පාදනයට මිල නියම කරන්නේ කෙසේද?

නිෂ්පාදනයක මිල නියම කිරීමේදී සලකා බැලිය යුතු සාධක

- **ඉලක්ක වෙළඳපොළ තේරුම් ගන්න:** ඔබේ ඉලක්ක පාරිභෝගිකයින් කවුරුන්ද යන්න, ඔවුන්ගේ අවශ්‍යතා මොනවාද? ඔවුන් ඔබේ නිෂ්පාදනය සඳහා කොපමණ මුදලක් ගෙවීමට කැමතිද? ඉලක්කගත ගනුදෙනුකරුවන්ට දැරිය හැකි මිල ගණන් නියම කිරීම සඳහා ඉලක්ක වෙළඳපොළ පිළිබඳ හොඳ අවබෝධයක් තිබීම ඉතා වැදගත් වේ.
- **ඔබේ නිෂ්පාදනය හෝ සේවාව සලකා බලන්න:** එහි සුවිශේෂී ලක්ෂණ සහ ප්‍රතිලාභ මොනවාද? එය තරඟකරුවන්ට සාපේක්ෂව කෙසේද? එහි වටිනාකම මත පදනම්ව ඔබේ මිල ගණන් සාධාරණීකරණය කිරීමට ඔබට හැකි විය යුතුය.
- **පිරිවැය වර්ගය:** ඔබේ ස්ථාවර වියදම් මොනවාද? ඔබේ විචල්‍ය වියදම් මොනවාද? ඔබේ මිල ගණන් ඔබේ වියදම් ආවරණය කරන බවත් ඔබට ලාභ ලැබීමට ඉඩ සලසන බවත් ඔබ සහතික කර ගත යුතුය.
- **තරඟකාරීත්වය විශ්ලේෂණය කිරීම:** තරඟකරුවන්ගේ මිල ගණන් මොනවාද? ඔවුන්ගේ උපාය මාර්ග මොනවාද? ඔබේ මිල ගණන් නියම කිරීමට පෙර, ඔබ ඔබේ තරඟකරුවන් සහ ඔවුන්ගේ උපාය මාර්ග හඳුනාගෙන සිටිය යුතුය.
- **නම්‍යශීලී වන්න:** ඔබේ ව්‍යාපාරය වර්ධනය වන විට සහ වෙනස් වන විට ඔබේ මිලකරණ උපාය මාර්ගය කාලයත් සමඟ වෙනස් විය යුතුය. ඒ අනුව අවශ්‍ය පරිදි ඔබේ මිල ගණන් සකස් කිරීමට සූදානම්ව සිටින්න.

ව්‍යාපාර විසින් භාවිතා කරනු ලබන පොදු මිලකරණ උපාය මාර්ග

- **වෙළඳපොළ විනිවිද යාම මත පදනම් වූ මිලකරණය (penetration pricing):** මෙම උපාය මාර්ගයේදී, ඔබේ තරඟකරුවන්ට වඩා අඩු පිරිවැයක් තුළ නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා මිල නියම කිරීම සිදු වේ. ඒ අනුව, වෙළඳපලේ පවතින තරඟකාරී ව්‍යාපාර වල මිලට වඩා අඩු මිලකට ඔබගේ නිෂ්පාදන හෝ සේවා ලබා දිය යුතු වේ. එය නව ව්‍යාපාරයක් අරඹන විට හෝ දැඩි මිල තරඟකාරීත්වයක් සහිත වෙළඳපොළකට ඇතුළු වීමට උත්සාහ කරන ව්‍යාපාර සඳහා හොඳ උපාය මාර්ගයක් විය හැකිය.
- **පිරිවැය මත පදනම් වූ මිලකරණය (cost plus pricing):** ව්‍යාපාරයක් තම නිෂ්පාදන පිරිවැය ගණනය කර අපේක්ෂිත ලාභ ආන්තිකය එකතු කිරීමෙන් මිල නියම කරන සාම්ප්‍රදායික මිලකරණ උපාය මාර්ගයක් ලෙස පිරිවැය මත පදනම් වූ මිලකරණය දැක්විය හැකිය.
- **වටිනාකම් මත පදනම් වූ මිලකරණය (value based pricing):** මෙම උපාය මාර්ගයේදී, ඔබේ නිෂ්පාදනයේ හෝ සේවාවේ ප්‍රත්‍යක්ෂ වටිනාකම මත පදනම්ව මිල නියම කළ හැකිය. අද්විතීය හෝ උසස් තත්ත්වයේ, ගුණාත්මක භාවයෙන් වැඩි නිෂ්පාදන හෝ සේවා ලබා දෙන ව්‍යාපාර සඳහා මෙය හොඳ උපාය මාර්ගයක් විය හැකිය.
- **අධි මිලකරණය (premium pricing):** මෙහිදී, පාරිභෝගිකයා වෙත, ඔබේ භාණ්ඩ හා සේවා භාවිතා කිරීම පිළිබඳව සුවිශේෂී හැඟීමක් ඇති කිරීම සඳහා ඉහළ මිල ගණන් නියම කිරීම සිදු වේ. සුඛෝපභෝගී භාණ්ඩ හෝ සේවා අලෙවි කරන ව්‍යාපාර සඳහා මෙම උපාය මාර්ගය සුදුසු විය හැකිය.

4.4. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ආයෝජන තීරණ

ආයෝජන තීරණ යනු සමාගමක ධනය උපරිම කර ගැනීම සඳහා භාවිත කරන ප්‍රධානතම මෙවලමයි. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරයක් පිහිටුවීමම ආයෝජන තීරණයකි. ආයෝජන තීරණ වලදී බොහෝ අවදානම් දැරීමට සිදු වේ. ව්‍යවසායකයෙකු දැනටමත් ව්‍යාපාරයක ආයෝජනය කිරීම මගින් අවදානමක් දරා ඇත. කෙසේ වෙතත්, යම් ආයෝජනයක ශක්‍යතාව සහ ලාභදායීතාවය තේරුම් ගැනීම සඳහා ආයෝජන තීරණ නිසි ආයෝජන තක්සේරුවකින් යුතුව විශ්ලේෂණය කළ යුතුය.

ඉගෙනුම් අරමුණු

- ආයෝජන තක්සේරුව සඳහා අවශ්‍ය ප්‍රධාන තොරතුරු හඳුනා ගැනීම.
- සම්මත ආයෝජන තක්සේරු ශිල්පීය ක්‍රම හඳුනා ගැනීම.
- ආයෝජන ඇගයීමට ඉගෙන ගැනීම.
- ආයෝජන තක්සේරුවේ ප්‍රධාන සීමාවන් දැන ගැනීම.

ධනංජය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ භෑ් නිලධාරිණිය සමඟ සාකච්ඡාව දිගටම කරගෙන යයි.



ආයෝජන ඇගයීම සඳහා අවශ්‍ය වන තොරතුරු

- ආයෝජනයේ වටිනාකම: මෙය ආරම්භක ආයෝජන වටිනාකමයි. ආයෝජනයේ මුළු පිරිවැය තීරණය වන්නේ ඔබ ඒ සඳහා කොපමණ මුදලක් වැය කළ යුතුද යන්න මතය.
- අනාගත මුදල් ප්‍රවාහයන්: ආයෝජනය මඟින් අනාගතයේදී ව්‍යාපාරය තුළට මුදල් ලැබීම්ද, පිටතට මුදල් ගලායාමද පුරෝකථනය කරගත යුතුය. එයින් අදහස් වන්නේ ආයෝජනයෙන් අපේක්ෂිත අනාගත ආදායම් සහ ආදායම උපයා ගැනීමට දැරීමට සිදුවන වියදම් ඇස්තමේන්තු කිරීමට ඔබට හැකි විය යුතු බවයි..
- ආයෝජනය හා සම්බන්ධ අවදානම: අවදානම් තක්සේරුවක් මඟින් ආයෝජනයක් හා සම්බන්ධ විය හැකි අවදානම් හඳුනාගෙන වර්ගීකරණය කිරීම මෙහිදී සිදු වේ.

ආයෝජන ඇගයීම් ශිල්පීය ක්‍රම

1. ප්‍රතිසාධන කාලය (payback period) ගණනය කිරීම/ ආපසු ගෙවීමේ කාලය

ප්‍රතිසාධන කාලය යනු ආයෝජනයක් වෙනුවෙන් යෙදවූ මූලික අරමුදල එහි ප්‍රතිලාභ හරහා ආපසු ලබා ගැනීමට ගත වන කාලයයි. ප්‍රතිසාධන කාලය ප්‍රධාන වශයෙන් වසර සහ මාස වලින් ගණනය කර ප්‍රකාශ කරනු ලබයි. ප්‍රතිසාධන කාලය කෙටි වන තරමට ආයෝජනයක් වඩාත් ආකර්ශනීය වේ. එසේ, ආයෝජනයක ප්‍රතිසාධන හඳුනා ගැනීම ආයෝජකයෙකුට ප්‍රයෝජනවත් වන අතර ආරම්භක ආයෝජන මුදල සාමාන්‍ය මුදල් ප්‍රවාහයෙන් බෙදීමෙන් එම කාලය ගණනය කල හැක.

2ග ශුද්ධ වර්තමාන අගය (Net Present Value)

ශුද්ධ වර්තමාන වටිනාකම යනු යම් කාල පරිච්ඡේදයක් තුළ, ආයෝජනයක සිදුවන අනාගත මුදල් ගලාඒම් සහ ගලායාම්වල වර්තමාන වටිනාකම් අතර වෙනසයි. අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන අගයන් ගණනය කරනු ලබන්නේ මුදලේ කාලානුරූපී අගය භාවිතා කරමිනි (පෙර පුද්ගල මූල්‍ය පරිච්ඡේදයේ පැහැදිලි කර ඇත). වර්තමාන අගයන් ගණනය කිරීම සඳහා නිසි වට්ටම් අනුපාතයක් භාවිතා කළ යුතුය. ධනාත්මක ශුද්ධ වර්තමාන වටිනාකමක් සහිත ව්‍යාපෘති සාමාන්‍යයෙන් ආයෝජනය කිරීම සඳහා සුදුසු යයි පිළිගනු ලබන අතර, ඍණ ශුද්ධ වර්තමාන වටිනාකමක් සහිත ව්‍යාපෘති ප්‍රතික්ෂේප කළ යුතුය.

3. වට්ටම් කරනු ලැබූ ප්‍රතිසාධන කාලය (Discounted Payback period)

වට්ටම් කළ ප්‍රතිසාධන කාලය, ආයෝජනයක වට්ටම් කළ මුදල් ප්‍රවාහයන් විසින් එහි ආරම්භක පිරිවැය ආවරණය කිරීමට කොපමණ කාලයක් ගතවේද යන්න තීරණය කරයි. ආයෝජනයක ප්‍රතිසාධන කාලය ගණනය කිරීමේදී මුදලේ කාලානුරූපී අගය සැලකිල්ලට නොගැනීමේ ප්‍රධාන අඩුපාඩුව වළක්වා ගැනීම සඳහා වට්ටම කළ ප්‍රතිසාධන කාලය ගණනය කරනු ලැබේ. ඒ අනුව, වට්ටම් කළ ප්‍රතිසාධන කාලය සම්මත ප්‍රතිසාධන කාලයට වඩා නිවැරදි මිනුමක් ලබා දේග

උදාහරණය: ධනංජයගේ අවන්හලේ ආයෝජනය තක්සේරු කිරීම.

පළමු පියවර : තොරතුරු රැස් කිරීම

විධිමත් හා අවිධිමත් වෙළඳපල සමීක්ෂණය පැවැත්වීමෙන් ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු රැස් කිරීමට ධනංජය තීරණය කළේය. ඔහු තම ප්‍රදේශයේ සියලුම අවන්හල් වෙත ගොස් ඒවායේ සේවකයින් සමඟ මූලික සාකච්ඡා පැවැත්වීය.

ඉන්පසු, ඔහු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ භෑ‍ නිලධාරිණිය හමුවී උපදෙස් ලබා ගත්තේය.

දෙවන පියවර : මූලික සැලසුම් කිරීම.

ආරම්භයක් ලෙස අලෙවි කළ යුතු නිෂ්පාදන වර්ග ධනංජය තීරණය කළේය. අවශ්‍ය අවන්හල් ගෘහ භාණ්ඩ, උපකරණ, මුළුතැන්ගෙයි සහ ආහාර ගැනීමේ උපකරණ සහ අනෙකුත් භෞතික වත්කම් ඔහු ලැයිස්තුගත කළේය. ඉන්පසු, එම ලැයිස්තුව මත පදනම්ව, ඔහු ආයෝජනයේ ආරම්භක පිරිවැය, ව්‍යාපාර ලියාපදිංචි කිරීම, කුලී ගිවිසුමේ නීතිමය ගාස්තු ආදිය ගණනය කළේය.

තුන්වන පියවර : මෙහෙයුම් සැලසුම් කිරීම

ධනංජයගේ පර්යේෂණ මත පදනම්ව, ඔහු සතියකට ව්‍යංජන සහිත බත් පිඟන් 250 ක් විකිණීමට සැලසුම් කළේය.

ඍඅපේක්ෂිත ඉල්ලුම: සතියකට ව්‍යංජන සහිත බත් පිඟන් 250ක්.

ඒ අනුව, පළමු වසර සඳහා ඔහුගේ මුදල් ප්‍රවාහ පුරෝකථනයන් පහත පරිදි වේ:

විකුණුම් ආදායම (මුදල් ලැබීම්) = පිඟන් 250 x 350 x සති 52	රු. 4,550,000
විචල්‍ය පිරිවැය (මුදල් ගෙවීම්) = පිඟන් 250 x රු. 130 x සති 52	රු. 1,690,000*
ස්ථාවර පිරිවැය :මුදල් ගෙවීම්*= 100,000 x මාස 12	රු. 1,200,000*
වසරකට ශුද්ධ මුදල් ප්‍රවාහය	රු. 1,660,000

ධනංජය ඔහුගේ අවන්හල ආරම්භ කිරීමට රුපියල් 2,000,000 ක ආරම්භක ප්‍රාග්ධනයක් අවශ්‍ය බව තහවුරු කරගෙන තිබේ.

හතරවන පියවර : ව්‍යාපෘති ඇගයීම

ප්‍රතිසාධන කාලය :

ප්‍රතිසාධන කාලය	මූලික ආයෝජනය/සාමාන්‍ය වාර්ෂික ශුද්ධ මුදල් ප්‍රවාහය
	= 2,000,000/ 1,660,000 = 1.2048 years
	= 1.2048 x 12 = 14.46 months

ප්‍රතිසාධන කාලය ආසන්න වශයෙන් මාස 14.5 කි. මෙයින් අදහස් කරන්නේ ධනංජයට ඔහුගේ ආයෝජනය මාස 14.5 කින් නැවත උපයා ගත හැකි බවයි.

ශුද්ධ වර්තමාන අගය

ඉහත මුදල් ප්‍රවාහ පුරෝකථනයන් ඉදිරි වසර තුන සඳහා නොවෙනස්ව පවතිනු ඇතැයි ධනංජය උපකල්පනය කරයි. මෙහිදී, ශුද්ධ මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීම සඳහා වට්ටම අනුපාතය ලෙස යොදා ගන්නේ, ව්‍යාපාරයේ ප්‍රාග්ධන පිරිවැය අනුපාතයයි. ව්‍යාපාරයක ප්‍රාග්ධන පිරිවැය ගණනය කරණ ආකාරය ප්‍රාග්ධන පිරිවැය කොටසේ දක්වා ඇත.

ධනංජය 15% ක පොලී අනුපාතයකට ලබා ගත බැංකු ණයක් හරහා සපයා ගත් අරමුදල් ඔහුගේ ව්‍යාපාරයට ආයෝජනය කරයි නම්, ඔහුගේ ව්‍යාපාර ආයෝජනයේ ශුද්ධ වර්තමාන වටිනාකම පහත පරිදි ගණනය කෙරේ.

වර්ෂය	මුදල් ප්‍රවාහ	15% දී වට්ටම් සාධකය	වර්තමාන අගය
0 (ආරම්භය)*	(2,000,000)	$(1+0\ .15)^0$	$(2,000,000)/\ (1+\ .15)^0$ = (2,000,000)
1	1,660,000	$(1+0.15)^1$	$1,660,000/\ (1+0.15)^1$ = 1,443,478
2	1,660,000	$(1+0.15)^2$	$1,660,000/\ (1+0.15)^2$ = 1,255,198
3	1,660,000	$(1+0.15)^3$	$1,660,000/\ (1+0.15)^3$ = 1,091,477
ශුද්ධ වර්තමාන අගය			1,790,154

මෙම ආයෝජනයේ ශුද්ධ වර්තමාන අගය ධනාත්මක අගයකි. එබැවින්, මෙය ශක්‍ය ව්‍යාපෘතියක් ලෙස සැලකේ.

වට්ටම් කරනු ලැබූ ප්‍රතිසාධන කාලය

වර්ෂය	මුදල් ප්‍රවාහ	15% දී වට්ටම් සාධකය	වර්තමාන අගය
0 (ආරම්භය)*	(2,000,000)	$(1+0\ .15)^0$	$(2,000,000)/\ (1+\ .15)^0$ = (2,000,000)
1	1,660,000	$(1+0.15)^1$	$1,660,000/\ (1+0.15)^1$ = 1,443,478
2	1,660,000	$(1+0.15)^2$	$1,660,000/\ (1+0.15)^2$ = 1,255,198
3	1,660,000	$(1+0.15)^3$	$1,660,000/\ (1+0.15)^3$ = 1,091,477

වට්ටම් කරනු ලැබූ ප්‍රතිසාධන කාලය	= අවුරුදු 1.631 (මාස 31.57)
මුළු ආයෝජනය	රු. 2,000,000
පළමු වසර අවසානයේදී වර්තමාන වටිනාකම	(රු. 1,443,478)
ශේෂය	රු. 556,522
එබැවින්, වට්ටම් කළ ප්‍රතිසාධන කාලය, = වසර 1 යි අවුරුදු 0.4434 (556,522/ 1,255,198)	අවුරුදු 1.4434

ආයෝජන ඇගයීමේ දුර්වලතා

- මුදල් ප්‍රවාහ ප්‍රක්ෂේපණවල නිරවද්‍යතාවය
- වට්ටම් සාධකයේ යෝග්‍යතාවය
- කාල පරිච්ඡේද පුරෝකථන නිරවද්‍යතාවය
- ව්‍යාපාර මෙහෙයුම් වලට බලපාන අනෙකුත් පාරිසරික සාධක නොසලකා හැරීම

4.5. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මූල්‍යකරණ තීරණ

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා මූල්‍යකරණ තීරණ ගැනීමේදී, ව්‍යාපාරයේ මෙහෙයුම් සහ වර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා සුදුසු මූල්‍ය ප්‍රභවයන්, ප්‍රාග්ධන ව්‍යුහයන් සහ අරමුදල් නියමයන් තෝරා ගැනීම යන කරුණු සලකා බැලේ. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර බොහෝ සම්පත් සීමාවන් යටතේ ක්‍රියාත්මක වන බැවින් විශාල ව්‍යවසායන් හා සසඳන විට ප්‍රාග්ධන වෙළඳපොළට ඇත්තේ සීමිත ප්‍රවේශයකි. එම නිසා මෙම මූල්‍යකරණ තීරණ ඉතා නිවැරදිව ගැනීම එම ව්‍යාපාර වලට ඉතා වැදගත් වේ.

ඉගෙනුම් අරමුණු

- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා ඇති කෙටිකාලීන සහ දිගුකාලීන මූල්‍යකරණයේ මූලාශ්‍ර හඳුනා ගැනීම.
- හිමිකරුගේ අරමුදල් සහ ණය අරමුදල් වල වාසි සහ අවාසි දැන ගැනීම.
- මූල්‍ය පිරිවැය පිළිබඳ සංකල්පය තේරුම් ගැනීම.
- මූල්‍ය පිරිවැය ගණනය කරන්නේ කෙසේදැයි දැන ගැනීම.
- ව්‍යාපාරයක කෙටිකාලීන මූල්‍ය කළමනාකරණයේ වැදගත්කම තේරුම් ගැනීම.
- මූල්‍ය ප්‍රභවය තෝරා ගැනීමට පෙර පිළිතුරු සොයා ගතයුතු ගැටළු හඳුනා ගැනීම.

ධනංජය ඔහුගේ ව්‍යාපාර සඳහා ප්‍රාග්ධනය සොයා ගැනීමට ඔහුගේ පවුලේ අයගෙන් සහාය පතයි.



ව්‍යාපාරයක මූල්‍යකරණ (ප්‍රාග්ධන) තීරණ ප්‍රධාන වශයෙන් දෙයාකාර වේ.

1. දිගුකාලීන මූල්‍යකරණය යනු ව්‍යාපාරය ආරම්භ කිරීමට සහ අනාගත ව්‍යාපාර පුළුල් කිරීම් සඳහා අවශ්‍ය ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමයි.

2. කෙටිකාලීන මූල්‍යකරණ තීරණවලට එදිනෙදා ව්‍යාපාර මෙහෙයුම් සඳහා අවශ්‍ය මූල්‍ය කළමනාකරණය ඇතුළත් වේ. මෙය කාරක ප්‍රාග්ධන කළමනාකරණය ලෙස හැඳින්වේ.

දිගුකාලීන මූල්‍ය තීරණ (ප්‍රාග්ධන තීරණ)*

මූල්‍යකරණයේ පිරිවැය (ප්‍රාග්ධන පිරිවැය) අවම කිරීම සඳහා මූල්‍ය ප්‍රභවය හඳුනා ගැනීම සහ තෝරා ගැනීම මූල්‍යකරණ තීරණ වලදී අත්‍යවශ්‍ය වේ. ව්‍යාපාරයකට ප්‍රධාන වශයෙන් හිමිකරුගෙන් සහ ණය මඟින් අරමුදල් ලබා ගත හැකිය.

හිමිකරුගේ අරමුදල්

හිමිකරු විසින් ලබා දෙන සියලු􏰀ම අරමුදල් සහ ආර්ථික සම්පත් මේ යටතට ගැනේ.

1. හිමිකරුවන්ගේ ඉතිරිකිරීම්: බොහෝ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරයන්හි ආරම්භක ප්‍රාග්ධනය සහ ව්‍යාපාර පුළුල් කිරීම් සඳහා හිමිකරුවන්ගේ පෞද්ගලික ඉතුරුම් අරමුදල් යොදාගනු ලබයි. ව්‍යාපාරයේ රඳවා ගත් ඉපැයීම්ද හිමිකරුවන්ටම අයිති වන බැවින්, එම රඳවාගත් ව්‍යාපාර ලාභයන්ද ඉදිරි වර්ධන කටයුතු සඳහා ප්‍රාග්ධනය ලෙස යොදා ගත හැක.

2. පරිත්‍යාග: ආපසු ගෙවීමක් අපේක්ෂා නොකර සහ ව්‍යාපාරයේ කොටසක් හෝ කිසිදු ප්‍රතිලාභයක් බලාපොරොත්තු නොවී පවුලේ සාමාජිකයන්, බොහෝ විට දෙමාපියන්, ධනවත් ඥාතීන් හෝ මිතුරන් විසින් ලබා දෙන අරමුදල්.

3. ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ප්‍රාග්ධනය යොදවන්නන් (ඕටැක ෂබඩිඑඩ්රි): ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ප්‍රාග්ධනය යොද ආයෝජකයින් ආරම්භක ව්‍යාපාර සඳහා ආරම්භක ප්‍රාග්ධනය ලබා දෙනු ලබයි. ඒ වෙනුවෙන් ඔවුන්ට ව්‍යාපාරයේ අයිතීන් කොටසක් සහ ලාභාංශ වලින් කොටසක් ගෙවිය යුතුය. ඔවුන් විසින් ණය ලබා නොදෙන අතර වඩාත් ආකර්ශනීය ව්‍යාපාර අවස්ථා (ඉහළ සාර්ථකත්වයක් සහිතව ඉහල ප්‍රතිලාභ ලැබෙන බව ප්‍රත්‍යක්􏰀ෂ වන ව්‍යාපාර) සඳහා තම අරමුදල් ආයෝජනය කරනු ලබයි.ශ

ණය ප්‍රාග්ධනය/ණය මූල්‍යකරණය

ණය දෙන්නන්ගෙන් හෝ ආයෝජකයින්ගෙන් පොළී ගෙවීමේ පදනම යටතේ ණයට ගන්නා ලද අරමුදල්.

1. බැංකු: ඕනෑම වාණිජ බැංකුවක් සහ අනෙකුත් මූල්‍ය ආයතන (සමහර විට) ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා විවිධ ණය යෝජනා ක්‍රම ඉදිරිපත් කර ඇත. අදාළ මූල්‍ය ආයතනයට පිවිසීමෙන් අවශ්‍ය තොරතුරු ලබා ගත හැකිය. (ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි වාණිජ බැංකු ලැයිස්තුව https://www.cbsl.gov.lk/en/authorized-financial-institutions/licensed-commercial-banks)

2. ක්ෂුද්‍ර මූල්‍ය: ක්ෂුද්‍ර මූල්‍ය ණය සාමාන්‍යයෙන් සාම්ප්‍රදායික බැංකු විසින් සේවාවන් සපයනු නොලබන ක්ෂුද්‍ර සහ කුඩා ව්‍යාපාර සඳහා නිර්මාණය කර ඇත. මෙම ණය ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ලෙස හඳුන්වන විශේෂිත මූල්‍ය සේවා සපයන්නන් විසින් පිරිනමනු ලැබේ. කෙසේ වෙතත්, තවත් බොහෝ මූල්‍ය ආයතන ආරම්භක ව්‍යාපාර සඳහා ක්ෂුද්‍ර ණය ලබා දෙයි. (ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ලැයිස්තුව: https://www.cbsl.gov.lk/en/authorized-financial-institutions/licensed-microfinance-companies)

3. රජයේ අරමුදල් සම්පාදනය යටතේ ලබා දෙන ණය: රජයේ අරමුදල් සම්පාදනය යටතේ කුඩා ව්‍යාපාර සඳහා ලබාදෙන ණය, රජයේ ආයතන විසින් සහතික කරනු ලබන අතර රජයේ අනුමත සුදුසුකම් ලත් ණය දෙන්නන් විසින් පිරිනමනු (බොහෝ විට රාජ්‍ය බැංකු මඟින්) ලැබේ. ඒවා අඩු අවදානම් සහ වඩාත් සරල කොන්දේසි සහිතව කුඩා ව්‍යාපාරවලට අවශ්‍ය අරමුදල් ලබා ගැනීමට උපකාර කිරීම සඳහා නිර්මාණය කර ඇත.

:වැඩිදුර තොරතුරු සඳහා https://www.treasury.gov.lk/web/frequently-asked-questions/section/msme%20 loans)

හිමිකරුවන්ගේ අරමුදල් යොදාගැනීමේ වාසි

ප්‍රාග්ධනය රැස් කිරීමට අපේක්ෂා කරන ක්ෂුද්‍ර, සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා හිමිකරුවන්ගේ අරමුදල් ආයෝජනයේ බොහෝ වාසි ඇත:

- ආපසු ගෙවීමේ වගකීමක් නොමැත.
- ව්‍යාපාරයට අමතර මූල්‍ය බරක් නොමැති ආරක්ෂිත මූල්‍යකරණයකි.
- ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ප්‍රාග්ධනය යොදවන්නන් මඟින් ව්‍යාපාරයට විශේෂඥතාව සහ වෙනත් ප්‍රයෝජනවත් සම්බන්ධතා ඇති ආයෝජකයින් වෙත ප්‍රවේශය ලබා ගත හැකිය.
- ණය ප්‍රාග්ධන අනුපාතය සහ ණය ලකුණු (credit ratings) අඩු කරගැනීමෙන් ව්‍යාපාරයේ මූල්‍ය තත්වය යහපත් ලෙස වැඩිදියුණු කළ හැකිය.
- ඉදිරියේදී, පොදු සමාගමක් ලෙස ලැයිස්තුගත කිරීම හරහා සැලකිය යුතු කොටස් ආයෝජන වෙත ප්‍රවේශ වීමේ හැකියාව.

හිමිකරුවන්ගේ අරමුදල් යොදාගැනීමේ අවාසි

ප්‍රාග්ධනය රැස් කිරීමේ අනෙකුත් ක්‍රම හා සසඳන විට හිමිකරු විසින් අරමුදල් යෙදවීමේ යම් අවාසි ද ඇත.

- හිමිකාරිත්වය බෙදීයාම හේතුවෙන් ව්‍යාපාරයේ පවතින හිමිකාරිත්වය බාල කරනු ලැබේ.
- තීරණයක් ගැනීමේදී කළමනාකරණයට තම ආයෝජකයින් සමඟ සාකච්ඡා කිරීමට බලපෑම් කළ හැක.
- ඉහළ අවදානම හේතුවෙන් ණය මූල්‍යකරණයට වඩා වැඩි පිරිවැයක් දැරීමට සිදු වේ.
- ණයහිමියෙකුට වඩා ආයෝජකයෙකු සොයා ගැනීම බොහෝ විට අභියෝගාත්මක ය.
- පොදු සමාගමක් ලෙස ලැයිස්තුගත කිරීම හරහා මූල්‍යකරණය කිරීම මිල අධික හා කාලය ගතවන දෙයක් විය හැකිය.ග

ණය මූල්‍යකරණයේ වාසි

ප්‍රාග්ධනය රැස් කිරීමට අපේක්ෂා කරන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය මූල්‍යකරණයේ වාසි පහත පරිදි වේ.ග

- ව්‍යාපාරයේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වය කෙරෙහි ණයහිමියාට පාලනයක් නොමැත.
- හිමිකාරිත්වය බාල වීමක් සිදු නොවේ.
- බොහෝ අවස්ථාවන්හිදී ණය සඳහා ගෙවන පොලිය, බදු අය කළ හැකි ලාභයෙන් අඩු කළ හැකිය. එබැවින් ව්‍යාපාරවලට යම් බදු ප්‍රතිලාභයක් භුක්ති විඳිය හැකිය.
- කොටස් නිකුත් කිරීමට සාපේක්ෂව ණය සකස් කිරීමට පහසු ප්‍රවේශයක් පැවතීම.

ණය මූල්‍යකරණයේ අවාසි

හිමිකරුවන්ගේ අරමුදල් ආයෝජනයට සාපේක්ෂව ණය මූල්‍යකරණයේ යම් අවාසි ද ඇත.

- ණය ගිවිසුම් මගින් ණය ගැණුම්කරුවන්ගේ යම් යම් ක්‍රියාමාර්ග සීමා කළ හැකිය.
- අධික ණය ව්‍යාපාරවල මූල්‍ය අවදානම වැඩි කළ හැකිය.
- ව්‍යාපාර හිමියන්ට පුද්ගලිකව ණය ඇපකර දීමට සිදු වීම.
- ගෙවීම් පැහැර හැරීමේ ප්‍රතිඵලයක් ලෙස ණය හිමියන් විසින් වත්කම් අත්පත් කර ගත හැකිය.
- ලබා ගත හැකි ණය ප්‍රමාණය ව්‍යාපාරය විසින් ඉදිරිපත් කරන සුරැකුම් වටිනාකමට සීමා වේ.

මූල්‍යකරණ පිරිවැය (ප්‍රාග්ධන පිරිවැය)

ව්‍යාපාරය සඳහා කිසිදු අරමුදලක් නොමිලේ නොලැබේ. හිමිකරුගේ අරමුදල් ප්‍රාග්ධනය ලෙස භාවිතා කළද, ඒ සඳහාද දැරිය යුතු පිරිවැයක් ඇත. ප්‍රාග්ධනයේ පිරිවැය හඳුනා ගැනීම ප්‍රාග්ධනයේ මූලාශ්‍ර මත පදනම් වේ. ව්‍යාපාරයේ භාවිතා වන ප්‍රාග්ධනය සඳහා ගෙවිය යුතු මිල ගණනය කරන ආකාරය මින් ඉදිරියට විස්තර කෙරේ.

ණය ප්‍රාග්ධනයේ පිරිවැය

ණය ප්‍රාග්ධනයේ පිරිවැය යනු ව්‍යාපාරය විසින් අරමුදල් ණයට ගැනීමේදී දරනු ලබන පොලී සහ අනෙකුත් වියදම්ය. ඒවා "ණය ගැනීමේ පිරිවැය" ලෙසද හැඳින්වේ

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා ණය ගැනීමේ සැබෑ පිරිවැය, පොලී අනුපාත සහ සැකසුම් ගාස්තු වැනි සාමාන්‍යයෙන් අවධානය යොමු කරන ලද වියදම් ඉක්මවා යයි.

ණය පිරිවැයේ ප්‍රධාන අංග:

- පොලී අනුපාත: මෙය ණය ගැනීමේ ප්‍රාථමික පිරිවැය වන අතර එය සාමාන්‍යයෙන් වාර්ෂික ප්‍රතිශත අනුපාතයක් ලෙස ප්‍රකාශ වේ.
- සැකසුම් ගාස්තු: ණය අයදුම්පත සැකසීම සඳහා ණය දෙන්නන් විසින් අය කරනු ලබන ගාස්තු, ලියකියවිලි සහ පරිපාලන වියදම්.
- කලින් පියවීමේ ගාස්තු: නියමිත කාලයට පෙර ණය ආපසු ගෙවන්නේ නම් ණය ගැණුම්කරුට පනවන ලද ගාස්තු.
- සුරැකුම් අවශ්‍යතා: සමහර ණය සඳහා දේපල හෝ වාහන වැනි සුරැකුම් අවශ්‍ය විය හැකි අතර, එහිදී ඔබ තක්සේරු වාර්තා, හිමිකම් රක්ෂණය සහ වෙනත් නීතිමය අවශ්‍යතා සපුරාලිය යුතුය.
- ණය රක්ෂණය: සමහර විට, ණයහි සමස්ත පිරිවැයට එකතු කරමින්, නිශ්චිත අවදානම් වලින් ණයහිමියා ආරක්ෂා කිරීම සඳහා ණය රක්ෂණය අවශ්‍ය වේ.
- ප්‍රමාද වූ ගෙවීම් ගාස්තු: මග හැරුණු හෝ ප්‍රමාද වූ ගෙවීම් සඳහා දඩ මුදල්, ණයට ගැනීමේ මුළු පිරිවැය වැඩි කරනු ඇත.
- වෙනත් සැඟවුණු ගාස්තු: ණය ගිවිසුමේ පැහැදිලිව සඳහන් කර නොමැති නමුත් සමස්ත පිරිවැයට බලපෑම් කළ හැකි ඕනෑම අමතර ගාස්තුවක්.

"ණය ගැනීමේ මුළු පිරිවැය නිවැරදිව තක්සේරු කිරීම සහ දැනුම්වත් මූල්‍ය තීරණ ගැනීම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ඉතා වැදගත් වේ."

හිමිකරුවන්ගේ අරමුදල්වල ප්‍රාග්ධන පිරිවැය

හිමිකරුවන් විසින් ආයෝජිත ප්‍රාග්ධනයේ පිරිවැය ගණනය කිරීම සඳහා විවිධ මූල්‍ය න්‍යායන් භාවිත කල හැකිය. කෙසේ වෙතත්, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර වලට පහත ආකාරයෙන් ව්‍යාපාරයේ ණය නොවන ප්‍රාග්ධන පිරිවැය ගණනය කළ හැකිය.

හිමිකරුගේ ඉතුරුම් සහ පරිත්‍යා

මෙම අරමුදල් සඳහා ප්‍රතිලාභයක් ගෙවීමට නීත්‍යානුකූලව ව්‍යාපාරය බැඳී නොමැත. එමෙන්ම කිසිඳු සැකසුම් ගාස්තුවකද මෙම අරමුදල ලබා ගැනීමේදී දැරීමට සිදු නොවේ. එසේ වුවද, මෙම අරමුදල් හිමිකරු විසින් යම් ආවස්ථික පිරිවැයක් දරමින් ව්‍යාපාරයේ ආයෝජන කර ඇති නිසා නොමිලේ ලැබේ යයි සැලකිය නොහැක.

ආවස්ථික පිරිවැය යනු තෝරාගත් විකල්පය හැර වෙනත් විකල්පයකින් ලබා ගත හැකිව තිබූ ප්‍රතිලාභයයි. උදාහරණයක් ලෙස, ඔබ ඔබේ ඉතිරිකිරීම් ව්‍යාපාරය සඳහා භාවිතා කරන විට, එම මුදල් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමෙන් ලබා ගත හැකි පොලී ආදායම අත්හැර දැමීමට සිදු වේ. එවිට, එසේ අත්හැර දමනු ලැබූ පොලී අදායම, ඔබේ ඉතුරුම් මුදල් ව්‍යාපාරයේ ආයෝජනය කිරීමේ ආවස්ථික පිරිවැය ලෙස සැලකේ.

හිමිකරු විසින් ආයෝජිත අරමුදල්වල ආවස්ථික පිරිවැය ව්‍යාපාරයට අරමුදල් ලබා දෙන පුද්ගලයා (ව්‍යාපාර හිමිකරු හෝ වෙනත් ආයෝජකයින්) විසින් දරනු ලැබේ. කෙසේ වෙතත්, ව්‍යාපාරය විසින් එහි රඳවා ගත් ලාභය ව්‍යාපාරයේ වර්ධනය සඳහා නැවත ආයෝජනය කරන්නේ නම්, ආවස්ථික පිරිවැය දරනු ලබන්නේ ව්‍යාපාරය විසිනි.

ඔබේ ව්‍යාපාරය සඳහා ප්‍රාග්ධන පිරිවැය ගණනය කරන්නේ කෙසේද?

ව්‍යාපාරයේ ප්‍රාග්ධනයට,

1. හිමිකරුගේ අරමුදල් පමණක් හෝ
2. ණය පමණක් හෝ
3. හිමිකරුගේ අරමුදල් සහ ණය යන දෙකම හෝ ඇතුළත් විය හැකිය.ග

ප්‍රාග්ධනය හිමිකරුගේ අරමුදල් වලින් පමණක් සමන්විත නම්:

ප්‍රාග්ධන පිරිවැය (කධක) = හිමිකරුගේ අරමුදල්වල පිරිවැය

හිමිකරුගේ අරමුදල්වල පිරිවැය = හිමිකරුගේ ඉතුරුම් හෝ පරිත්‍යාග වල ආවස්ථික පිරිවැය

ඉඟිය: ආවස්ථික පිරිවැය යනු ව්‍යාපාරයේ ආයෝජනය කිරීම හැර වෙනත් විකල්පයකින් ලබා ගත හැකිව තිබී අත්හැර දැමූ ප්‍රතිලාභයේ වටිනාකමයි. ඔබ විසින් යම් මුදලක් පොලී ගෙවන බැංකුවක මුදල් තැන්පත් කිරීමට සිතා, එසේ නොකර ව්‍යාපාරයක ආයෝජනය කළේ නම්, ව්‍යාපාරයේ ආයෝජනය කරන ලද අරමුදල්වල (ප්‍රාග්ධනය) පූර්ව ප්‍රතිලාභය යනු උපයා ගත හැකිව තිබූ පොලී ආදායමයි. එවිට, එම හිමිකරු විසින් යෝජිත ප්‍රග්ධනයේ ආවස්ථික පිරිවැය වන්නේ, අහිමිව ගිය පොලී ආදායමයි. එම නිසා,

හිමිකරු විසින් ආයෝජිත ප්‍රග්ධනයේ පිරිවැය අනුපාතය = සාමාන්‍ය ඉතුරුම් පොලී අනුපාතය

උදාහරණය: ඔබ විසින් වසරකට 10% ක පොලියක් ලැබූ රු. 100,000ක ස්ථාවර තැන්පතුවක්, එම ගිණුම වසා ඔබේ ව්‍යාපාරයේ ආයෝජනය කරන්නේ නම්,

ඔබේ ව්‍යාපාරයේ ප්‍රාග්ධනය = රු. 100,000

ප්‍රාග්ධන මූලාශ්‍රය = හිමිකරුගේ අරමුදල්

ප්‍රාග්ධනයේ පිරිවැය අනුපාතය = වසරකට 10% (ස්ථාවර තැන්පතුවෙන් අහිමි වූ පොලී ආදායම)*

ප්‍රාග්ධනය ණය වලින් පමණක් සමන්විත නම්:

ප්‍රාග්ධන පිරිවැය කධක = ණය පිරිවැය

ණය පිරිවැය = ණය පොලිය

ඉඟිය: බැංකුවකින් (හෝ ඕනෑම මූල්‍ය ආයතනයකින්) ණයක් ලබා ගන්නා විට, පොලිය ගෙවිය යුතුය. ඒ ප්‍රාග්ධනයේ (ණය) පිරිවැයයි. කෙසේ වෙතත්, ඔබේ ව්‍යාපාරය රජයට බදු ගෙවන විට, ණය පොලිය අඩු කිරීමෙන් පසුවබදු ලෙස ගෙවන මුදල ගණනය කරනු ලැබේ, එහිදී පොලී ගෙවීමෙන් යම් බදු ප්‍රමාණයක් ව්‍යාපාරයට ඉතිරි වේ.

එබැවින්,

ණය පිරිවැය අනුපාතය = ණය පොලී අනුපාතය ං (1- බදු අනුපාතය)

උදාහරණය: ඔබ විසින් 15 ක පොලී අනුපාතයකට ලබා ගත් රුපියල් 100,000ක බැංකු ණයක්, ඔබේ ව්‍යාපාරයේ ආයෝජනය කර ඇති විටක, ව්‍යාපාරික ආදායම් බදු ලෙස ලාභයෙන් 25% ක් බදු ගෙවයි නම්,

ව්‍යාපාරයේ ප්‍රාග්ධනය = රු. 100ල000

ප්‍රාග්ධනයේ මූලාශ්‍රය = ණය

ප්‍රාග්ධනයේ පිරිවැය අනුපාතය = 15% x (1-25%) = වසරකට 11.25%

ප්‍රාග්ධනය, හිමිකරුගේ අරමුදල් සහ ණය යන දෙකෙන්ම සමන්විත නම්ථ

ප්‍රාග්ධන පිරිවැය යනු හිමිකරුගේ අරමුදල්වල පිරිවැයේ සහ ණය පිරිවැයේ බර තැබූ සාමාන්‍යය වනු ඇත.

$$COC = \frac{(\text{Cost of equity x Equity capital}) + (\text{Cost of debt x Debt capital})}{\text{Total capital}}$$

උදාහරණය: ඔබ විසින්, 8 ක පොලියක් ගෙවනු ලබන ඉතුරුම් ගිණුමේ තිබූ රුපියල් 50,000 ක් සහ 20 ක පොලියක් සහිත බැංකු ණයක් ලෙස ලබා ගත් රුපියල් 50,000 ක් ඔබේ ව්‍යාපාරයේ ආයෝජනය කර ඇති

විට, ව්‍යාපාරය ලාභයෙන් 25 ක ව්‍යාපාරික ආදායම් බද්දක් ගෙවයි නම්,

$$COC = \frac{(50,000 \times 8\%) + (50,000 \times (20\% \times (1- 25\%))}{100,000}$$

බර තැබූ ප්‍රාග්ධන පිරිවැය අනුපාතය :WACC) = වසරකට රු. 4,000 + 7,500

බර තැබූ ප්‍රාග්ධන පිරිවැය අනුපාතය :WACC) = (11,500/100,000) x 100 = වසරකට 11.5%

කෙටිකාලීන මූල්‍යකරණය / කාරක ප්‍රාග්ධන කළමනාකරණය

කෙටිකාලීන මූල්‍යකරණය යනු එදිනෙදා ව්‍යාපාර කටයුතුවලදී මුහුණ දීමට සිදුවන ක්ෂණික මූල්‍ය අවශ්‍යතා සපුරාලීමට හෝ කෙටිකාලීන බැඳීම් ආවරණය කිරීමට අරමුදල් ලබා ගැනීමයි. ව්‍යාපාර විසින් මුදල් ප්‍රවාහ උච්චාවචනයන් කළමනාකරණය කිරීමට, කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා මුදල් සපසා ගැනීමට මෙන්ම, කෙටි කාලීන ආයෝජන අවස්ථා සපුරා ගැනීමටද කෙටිකාලීන මූල්‍යකරණය යොදා ගැනේ.

කාරක ප්‍රාග්ධනය යනු ව්‍යාපාරයකට එහි කෙටි කාලීන වගකීම් සහ දෛනික මෙහෙයුම් සඳහා ඇති ජංගම වත්කම් ප්‍රමාණයයි. ව්‍යාපාරයේ පවතින වත්මන් මුදල් ප්‍රමාණයද, ලැබිය යුතු ගිණුම් (එහි ගනුදෙනුකරුවන් විසින් ව්‍යාපාරයට ගෙවිය යුතු මුදල්) සහ භාණ්ඩ තොග (විකිණීමට ඇති භාණ්ඩ) මෙම ජංගම වත්කම් වලට ඇතුලත් වේ. එසේම, කෙටි කාලීන වගකීම් (ජංගම වගකීම්) යන්නට ගෙවිය යුතු ගිණුම් (සමාගම එහි සැපයුම්කරුවන්ට ගෙවිය යුතු මුදල්), ගෙවිය යුතු වැටුප්, වේතන සහ බදු ඇතුළත් වේ. ඒ අනුව ව්‍යාපාරයක ජංගම වත්කම් වලින් එහි ජංගම වගකීම් ප්‍රමාණය අඩු කල විට ලැබෙන අගය කාරක ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ. ව්‍යාපාරයක එදිනෙදා මෙහෙයුම් කාර්යක්ෂමතාවය පවත්වාගෙන යාමට කාරක ප්‍රාග්ධන කළමනාකරණය ඉවහල් වේ..

ධනංජය තම නිවස අසල කඩහිමියා හමුවෙයි.



කෙටිකාලීන මූල්‍ය කළමනාකරණයේ වැදගත්කම

එදිනෙදා ව්‍යාපාර කටයුතු සඳහා කෙටි කාලීන අරමුදල් ප්‍රභවයන් අත්‍යවශ්‍ය වේ. එහිදී, වැටුප් ගෙවීම්, භාණ්ඩ තොග මිලදී ගැනීම සහ බිල්පත් ගෙවීම සඳහා අවශ්‍ය මුදල් සපයා දීම මෙමඟින් සිදු වේ.

ව්‍යාපාර බොහෝ විට ඉල්ලු□මේ උච්චාවචනයන්ට මුහුණ දෙයි. කෙටි කාලීන මූල්‍යකරණය එවැනි ඉල්ලු□ම් උච්චිවචනයන් හේතුවෙන් ඇතිවන ආදායම් චක්‍ර අතර පරතරය පියවීමට උපකාරී වේ. සමහර විට, අනපේක්ෂිත සිදුවීම්, යන්ත්‍රවල ඇතිවිය හැකි අනපේක්ෂිත කාර්මික දෝෂ, ස්වාභාවික විපත් හෝ අනපේක්ෂිත සැපයුම් ප්‍රමාද වීම් වැනි තත්වයන් කළමනාකරණය කර ගැනීම සඳහා ව්‍යාපාරවලට ක්ෂණික අරමුදල් අවශ්‍යතා ඇති විය හැක.

එපමණක් නොව, ව්‍යාපාරයේ පරිසරය වේගයෙන් වෙනස් වන විට, වෙළඳපල මාරුවීම් වලට අනුවර්තනය වීමේදී සැපයුම්කරුවන් සහ ගනුදෙනුකරුවන් කළමනාකරණය කිරීමට සහ ව්‍යාපාරික සබඳතා ශක්තිමත් කිරීමට එලදායී කෙටි කාලීන මූල්‍යකරණය උදව් වේ.

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වන කෙටිකාලීන මූල්‍යකරණ මූලාශ

1. වෙළඳ ණය:

වෙළඳ ණය යනු සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ හෝ සේවා ණය කොන්දේසි මත මිලදී ගැනීමයි. ගැනුම්කරුට භාණ්ඩ වහාම ලැබෙන නමුත් සැපයුම්කරුට මුදල් ගෙවනු ලබන්නේ පසු දිනකදීය. (සාමාන්‍යයෙන් දින 30 සිට 90 දක්වා ගෙවීම් කාලයක් සැපයුම කරුවන් විසින් ලබා දේ.)

උදාහරණය: සිල්ලර වෙළෙන්දෙකු තොග වෙළෙන්දෙකුගෙන් භාණ්ඩ තොග මිලදී ගෙන දින 60ක් ඇතුළත මුදල් ගෙවීමට එකඟ වේ.

2. බැංකු අයිරා:

බැංකු අයිරාවක් යනු, ව්‍යාපාරයකට එහි ජංගම ගිණුමේ පවතින ශේෂයට වඩා වැඩි අරමුදල් ආපසු ගැනීමට බැංකුව විසින් ලබාදෙන පහසු කමකි. හදිසි මුදල් අවශ්‍යතා වෙනුවෙන් මෙසේ බැංකු අයිරා භාවිතා කිරීමෙන් ක්ෂණික ද්‍රවශීලතා ගැටළු විසඳා ගැනීම උපකාරී වේ. කෙසේ වෙතත්, මෙම බැංකුව අයිරා ශේෂයන් වෙනුවෙන් අධික පොලියක් බැංකුව විසිනු අය කරනු ලබයි.

උදාහරණය: කුඩා ව්‍යාපාරයක් තාවකාලික මුදල් හිඟයකට මුහුණ දෙන අතර වැටුප් වියදම් පියවා ගැනීම සඳහා අයිරා පහසුකමක් භාවිතා කරයි.

3. කෙටිකාලීන ණයථ

බැංකු, මූල්‍ය සමාගම් හෝ පෞද්ගලික ණය දෙන්නන්ගෙන් ව්‍යාපාර සඳහා කෙටි කාලීන ණය ලබා ගත හැකිය. මෙම ණය සඳහා ස්ථාවර කොන්දේසි (උදා: මාස 3, මාස 6) බලපානු ලබන අතර එකඟ වූ කෙටි කාලය අවසානයේ පොලිය සමඟ ලබාගත් ණය මුදල ආපසු ගෙවනු ලැබේ.

උදාහරණය: ක්ෂුද්‍ර ව්‍යාපාරයක් විසින්, අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මාස 6 ක ණයක් ලබා ගැනීම. මෙහිදී, සුරැකුම් ලෙස ලබා දීමට ව්‍යාපාරය සතු වත්කම් නොමැති විටදී, ව්‍යාපාරයේ වර්තමාන මුදල් ප්‍රවාහ පදනම් කරගෙන ණය ලබා ගත හැක.

4. සාධකකරණය

මෙම සේවාව තුලින් ව්‍යාපාරයේ ලැබිය යුතු බිල්පත් (නොගෙවූ බිල්පත්) තෙවන පාර්ශවයකට වට්ටමක් යටතේ විකිණීමයි. මේ මගින් ක්ෂණික මුදල් සපයනු ලබන අතර ණය ගැතියන්ගෙන් මුදල් එකතු කර ගැනීමේ අවදානම තුන්වන පාර්ශවයක් වෙත පවරා දෙනු ලැබේ.

උදාහරණය: රෙදිපිළි නිෂ්පාදකයෙකු විසින් හදිසි මුදල් අවශ්‍යතාවයක් වෙනුවෙන්, ෆැක්ටරින් සමාගමකට (සධකකරණ පහසුකම් සපයන ආයතනයකට) හැම ලැබිය යුතු බිල්පත් (වට්ටමකට යටත්ව) විකුණයි.

5. භාණ්ඩ තොග මූල්‍යකරණය:

කෙටි කාලීන ණය ලබා ගැනීම සඳහා ව්‍යාපාරවලට තම භාණ්ඩ තොග ඇපයක් ලෙස තබා කෙටි කාලීන ණය ලබා ගත හැක. ණය දෙන්නන් භාණ්ඩ තොගයේ වටිනාකම තක්සේරු කර ඒ අනුව ණය මුදල සපයයි.

උදාහරණය: ඉලෙක්ට්‍රොනික උපකරණ වෙළෙන්දෙකු නත්තල් සමයට පෙර ජනප්‍රිය හෝ ඉහළ ඉල්ලු￼මක් ඇති නිෂ්පාදන මිලදී ගැනීම සඳහා භාණ්ඩ තොග මූල්‍යකරණය භාවිතා කරයි.

මූල්‍යකරණ ක්‍රමය තෝරා ගැනීම මූල්‍ය පිරිවැය, මූල්‍ය අවශ්‍යතාවයේ හදිසිභාවය සහ ව්‍යාපාරයේ ණය සුදුසුකම් වැනි සාධක මත රඳා පවතින බව සැලකිල්ලට ගැනීම වැදගත්ය.

ඔබේ ව්‍යාපාරය සඳහා ප්‍රාග්ධන ප්‍රභවය තෝරා ගැනීමේදී විසඳා ගත යුතු ගැටළු

1. **අරමුදල් අවශ්‍යතාවයේ අරමුණ සහ ආපසු ගෙවීමේ හැකියාව කුමක්ද?**

   අරමුදල් අවශ්‍ය වන්නේ කුමක් සඳහාද යන්න තේරුම් ගැනීම අත්‍යවශ්‍ය වේ. උදාහරණ ලෙස, එම අවශ්‍යතාවය නව ආයෝජන අවස්ථාවක්, කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයක් හෝ වෙනත් ණයක් ආපසු ගෙවීමක් විය හැකියි. ඇතැම් විට, ආයෝජනයේ අවධානම ඉහළ වන අතර ස්ථාවර ප්‍රතිලාභ පොරොන්දු විය නොහැකි වනු ඇත. ඒ අනුව, ප්‍රතිලාභ ස්ථිර නොවන විටකදී ණය ලබා ගැනීම සුදුසු නොවන අතර, හිමිකරු විසින් ලබා දෙන අරමුදල් යෙදවීම වඩාත්ම සුදුසුය.

2. **ව්‍යාපාරයට පහසුවෙන් ප්‍රවේශ විය හැකි අරමුදල් ප්‍රභවය කුමක්ද?**

   ප්‍රාග්ධන සැපයුම්කරුවෙකු (ආයෝජකයකු) සොයා ගැනීම වඩාත් සංකීර්ණ බැවින් ව්‍යාපාරයකට ණය මූල්‍යකරණය වඩා පහසු ප්‍රවේශයක් විය හැකිය. දරනු ලබන ඉහළ අවදානම නිසා, පෞද්ගලික ආයෝජකයින් ව්‍යාපාරයෙන් සැලකිය යුතු ප්‍රතිලාභ අපේක්ෂා කරනු ලබයි. කෙසේ වෙතත්, ආරම්භක ව්‍යාපාර සඳහා ණය ලබාදීම මූල්‍ය ආයතන විසින් සිදු කිරීම අපහසු කාර්යයකි.

3. **මුල් හිමිකරුවන්ට ව්‍යාපාරයේ පාලනය පවත්වා ගත හැකිද?**

   බාහිර ආයෝජකයින් විසින් අරමුදල් සපයන විටදී, ව්‍යාපායේ මුල් හිමිකරුට ව්‍යාපාර හිමිකාරිත්වය නව ආයෝජකයින් සමඟ බෙදා ගැනීමට සිදු වේ. එහෙත්, ණය මූල්‍යකරණය භාවිතා කරන විට, හිමිකාරීත්වය බෙදා ගැනීමකින් තොරව අරමුදල් සපයා ගැනීමේ අවස්ථාව ලැබේ.

4. **නව ආයෝජකයාගේ ඉලක්ක ව්‍යාපාරයේ දැක්ම සමඟ සමපාත වේද?**

   ව්‍යාපාර හිමිකරුවෙකුට ව්‍යාපාර ඉලක්ක නොවෙනස්ව තබා ගැනීමද අවශ්‍ය විය හැකිය. ආයෝජන ගනුදෙනුව සම්පූර්ණ කිරීමට පෙර ව්‍යාපාර හිමිකරුවන් සහ නව ආයෝජකයන් විසින් තම තමන්ගේ ව්‍යාපාරික අභිලාෂයන් පැහැදිලිව තේරුම් ගත යුතුය.

5. **ආයෝජනයකට සුදුසු කාලය මෙයද?**

   ව්‍යාපාරය තම මූල්‍ය අවශ්‍යතා සහ ඒවාට ප්‍රවේශ විය යුත්තේ කවදාද යන්න දැන සිටිය යුතුය. උදාහරණයක් ලෙස, බැංකු ණයක් ගැනීමට නම් ආර්ථික සහ මූල්‍ය පරිසරය හිතකර විය යුතු අතර, පොලී අනුපාත සාපේක්ෂව අඩු විය යුතුය.

4.6. අයවැයකරණය

ඉගෙනුම් අරමුණු

- අයවැයකරණය මඟින් ඔබේ ව්‍යාපාරයට ලැබෙන ප්‍රධාන ප්‍රතිලාභ තේරුම් ගැනීම.
- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා අයවැයක් ගොඩ නැගීමේ මූලික පියවර හඳුනා ගැනීම.
- මූල්‍ය සාක්ෂරතාවය ඇසුරෙන් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර කළමනාකරණය කිරීමේ ක්‍රම තේරුම් ගැනීම.

යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළදී සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වන යම් කිසි අරමුණක් සඳහා යෙදවිය යුතු ප්‍රාග්ධන ප්‍රමාණය, සැලසුම් කරන ලද ආදායම් සහ දැරීමට සිදුවන වියදම් යන කරුණු මූල්‍යමය වශයෙන් පුරෝකථනය කර අනුමත කරන ලද සැලසුමක් අයවැයක් ලෙස හඳුන්වනු ලැබේ.

කෂඒ (ඔණ) කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනය (එක්සත් රාජධානිය)

අයවැයක් යනු ඔබේ ඉලක්ක සපුරා ගැනීම සඳහා මුදල් යොදවන ආකාරය පිළිබඳව තීරණය කිරීම, සැලසුම් කිරීම සහ භාවිතා කිරීම සඳහා යොදා ගන්නා මෙවලමකි. එය ඔබේ ඉලක්ක කරා ළඟා වීම සඳහා ඔබේ මුදල් ඥානවන්තව වියදම් කිරීම සහ ඉතිරි කිරීම පිළිබඳව තීරණ ගැනීමට ඔබට උපකාරී වේ.

ඒ අනුව, අයවැයක් යනු ඔබේ සමස්ත ව්‍යාපාර සැලැස්මේ කොටසක් විය යුතු අතරම ඔබේ ව්‍යාපාරයේ සාර්ථකත්වය මැනීමට උපකාරී වන්නකි.

අනිල් සහ ධනංජය බැංකු කළමනාකරු මුණගැසී තමාගේ ව්‍යාපාර සැලසුම පිළිබඳව පැහැදිලි කරයි. එම සාකච්ඡාවෙන් කොටසක් පහත දැක්වේ.

අයවැයකරණයෙන් ඔබේ ව්‍යාපාරයට ලැබෙන ප්‍රධාන ප්‍රතිලාභ

මුදල් ප්‍රවාහයන් පුරෝකථනය කිරීමට සහ අනවශ්‍ය මුදල් ගෙවීම් වළක්වා ගැනීමට ඔබට උපකාරී වේ.	ණය ආපසු ගෙවීමේ උපාය මාර්ගය නිරූපණය කරයි.	ඉතා වැදගත් ක්ෂේත්‍ර ක්ෂණිකව ඉස්මතු කරයි.	ව්‍යාපාරයේ එදිනෙදා මෙහෙයුම් ක්‍රියාකාරීව තබා ගැනීමට උපකාරී වේ.	අනාගත ලාභ ආරක්ෂා කිරීමට ඔබට උපකාරී වේ.

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක අයවැයක් සකස් කිරීම සඳහා අත්‍යවශ්‍ය පියවර

බොහෝ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විධිමත් අයවැයක් සකස් කිරීමට අපොහොසත් වන බව පර්යේෂණවලින් හෙළි වී ඇත. ඒ අනුව, ඔවුන් දැඩි මුදල් ප්‍රවාහ අර්බුදවලින් පීඩා විඳීම පුදුමයක් නොවේ. ඔබේ ආදායම, වියදම්, ඉතිරිකිරීම්, ණය සහ ආයෝජන සාර්ථකව කළමනාකරණය කිරීමේ මූලික පදනම වන්නේ පැහැදිලි ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම සහ එම සැලැස්ම අනුගමනය කිරීමයි. මෙහිදී, අයවැයක් සකස් කිරීම ව්‍යාපාර සාර්ථකත්වයට තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ඇත.

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා අයවැයක් සකස් කිරීම යනු නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා අපේක්ෂිත ආදායම, වියදම්, මුදල් ප්‍රවාහයන් සහ ලාභ ගෙනහැර දක්වන මූල්‍ය සැලැස්මක් නිර්මාණය කිරීමයි. ඒ සඳහා යොදාගත හැකි මාර්ගෝපදේශයක් පහත දැක්වේ.ග

1. ව්‍යාපාරයේ ආදායම තක්සේරු කරන්න

ව්‍යාපාරයකට නිෂ්පාදන සහ සේවා විකිණීම, ආයෝජන ආදායම් හෝ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ප්‍රදාන වැනි විවිධ ආදායම් මාර්ග තිබිය හැකිය. විකුණුම් මිල ගණන් සහ විකිණිය හැකි ඒකක ගණන ඇස්තමේන්තු කිරීම සහ අනෙකුත් ආදායම් ප්‍රභවයන්ගෙන් ලැබිය හැකි ආදායම් ප්‍රමාණයන් පුරෝකථනය කිරීමෙන් ව්‍යාපාරයේ අනාගත මුළු ආදායම ඇස්තමේන්තු කල හැකි වේ.

මෙම ක්‍රියාවලියේදී, ව්‍යාපාරයේ අතීත ප්‍රතිඵල, ඍතුමය වෙනස්කම් සහ වෙළඳපොළ ප්‍රවණතා විශ්ලේෂණය කිරීමට අවශ්‍ය වේ. එහි ආදායම් ඉලක්ක සැකසීම සඳහා මධ්‍යස්ථ, යථාර්ථවාදී ප්‍රවේශයක් අනුගමනය කළ යුතුය.

2. ස්ථාවර සහ විචල්‍ය පිරිවැය හඳුනා ගන්නි

මෙම පියවරේදී, ව්‍යාපාරය විසින් හැකි සියලුම මෙහෙයුම් වියදම් ලැයිස්තුගත කර එම වියදම් සියල්ලම ප්‍රධාන වශයෙන් ව්‍යාපාරයේ ස්ථාවර පිරිවැය, විචල්‍ය පිරිවැය සහ මිශ්‍ර පිරිවැය ලෙස වර්ගීකරණය කළ යුතුය.

නිෂ්පාදන පරිමාවේ සිදුවන අඩු වැඩි වීම් නොසලකා, කාලයත් සමඟ නියතව පවතින වියදම් ස්ථාවර පිරිවැය වේ. උදාහරණ:

- කුලී හෝ කල්බදු ගෙවීම්
- කාර්ය මණ්ඩල වැටුප්
- රක්ෂණ ගෙවීම්
- ණය ආපසු ගෙවීම්

ව්‍යාපාරයේ ක්‍රියාකාරකම් මට්ටම (නිෂ්පාදන පරිමාවේ සිදුවන අඩු, වැඩි වීම්) සමඟ විචල්‍ය පිරිවැය සෘජුවම උච්චාවචනය වේ. උදාහරණ:

- අමුද්‍රව්‍ය මිලදී ගැනීම්
- භාවිතය අනුව වෙනස් වන උපයෝගිතා
- නැව්ගත කිරීමේ සහ බෙදා හැරීමේ පිරිවැය
- කොමිස් මත පදනම් වූ වැටුප්

ස්ථාවර සහ විචල්‍ය යන ලක්ෂණ දෙකම සහිත පිරිවැය මිශ්‍ර පිරිවැය වේ. උදාහරණ:

- ස්ථාවර හා විචල්‍ය පිරිවැය සහිත විදුලි බිල, දුරකථන බිල, ආදිය භාවිතය අනුව වෙනස්විය හැකිය.
- ස්ථාවර වැටුප් වේතන සමඟ එකතු වීම නිසා මිශ්‍ර පිරිවැයක් බවට පත් විය හැකි අතර එය අතිකාල වියදම් සමඟ වෙනස් වේ.

මීට අමතරව, ව්‍යාපාරවලට උපකරණ, ගොඩනැගිලි, යන්ත්‍ර, වාහන, ගෘහ භාණ්ඩ සහ පරිගණක වැනි ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා අනාගත ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු කිරීමට අවශ්‍ය වේ.

ඉහත පරිදි ව්‍යාපාරයේ අනාගතය පිරිවැය ඉලක්ක සැකසිය හැකිය.

3. ව්‍යාපාරයේ ඉලක්කගත ලාභය ඇස්තමේන්තු කරන්න.

ව්‍යාපාර යම් කාල පරිච්ඡේදයක් සඳහා තම ආදායම් සහ වියදම් පුරෝකථන සකස් කර ගත් පසු, එම පුරෝකථනය කළ ආදායමෙන් පුරෝකථනය කළ මෙහෙයුම් වියදම් අඩු කිරීමෙන් එම අනාගත කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපාරයේ ලාභය ඇස්තමේන්තු කළ හැකිය.

ව්‍යාපාරයට නිශ්චිත ඉලක්කගත ලාභ අරමුණක් තිබේ නම්, ඊට අදාළ වන පරිදි, ඇස්තමේන්තුගත පිරිවැය සහ ආදායම් සකස් කර ගත යුතුය.

4. මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කර සකස් කරන්න

ව්‍යාපාරය විසින් යම් කාල පරිච්ඡේදයක් සඳහා ඇස්තමේන්තුගත මුදල් ලැබීම් සහ ගෙවීම් සහිත අයවැයක් ද සකස් කළ යුතුය. මෙතුළින් සමාග මට අනාගත මුදල් ඌනතාවයන් සහ අතිරික්තයන් පුරෝකථනය කිරීමට සහ මුදල් ප්‍රවාහ පිළිබඳ ගැටළු මඟහරවා ගැනීම සඳහා උපාය මාර්ග සොයා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

5. නිති සමාලෝචනයන්ට අනුව අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම

සකස් කර ගත් අයවැය සැලසුමට අනුව ව්‍යාපාර කටයුතු ක්‍රියාත්මක කළ පසු, සියලුම පිරිවැය සහ ආදායම් වල සැබෑ ප්‍රතිඵල අයවැය සමග සසඳා සමාලෝචනය කිරීම අත්‍යවශ්‍ය වේ. යම් කාල පරිච්ඡේදයක් තුළ ව්‍යාපාරයේ සියලු හිතකර සහ අහිතකර වෙනස්වීම් හඳුනා ගැනීම එවැනි සංසන්දනාත්මක සමාලෝචනයක් මගින් සිදු වේ. එමෙන්ම, අහිතකර විචලනයන්ට පාදක වූ හේතු සාධක විශ්ලේෂණය කිරීමටත්, ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අයවැය සමාලෝචන උපකාරී වේ.

තවද, ආර්ථික හා ව්‍යාපාරික පරිසරයේ සිදුවන වෙනස්කම් පිළිබඳව සුපරීක්ෂාකාරී විය යුතු අතර අවශ්‍ය වෙනස්කම් සිදු කරමින් අයවැයක් නිති යාවත්කාලීන කළ යුතුය.

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර මෙහෙයුම් සඳහා මූල්‍ය සාක්ෂරතාවය භාවිතයි

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ මූල්‍ය සාක්ෂරතාවය ඔවුන්ගේ ව්‍යාපාරහි ජීවන චක්‍රයේ සෑම අදියරකදීම අවශ්‍ය ව්‍යාපාරික සහ මූල්‍ය තීරණ ගැනීම කෙරෙහි සෘජුවම බලපානු ඇත. ඔබ ඔබේ ව්‍යාපාර අදහස පැහැදිලි ව්‍යාපාර සැලැස්මක් බවට පරිවර්තනය කළ පසු, ඊළඟ පියවර වන්නේ මෙහෙයුම ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීමයි. මෙම ව්‍යාපාර මෙහෙයුම් ක්‍රියාත්මක කරන අවධියේදී, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයාට අවිනිශ්චිත පරිසරයක් තුළ විවිධ අභියෝගවලට මුහුණ දීමට සහ සීමිත සම්පත් යටතේ ව්‍යාපාරයක් පවත්වාගෙන සිදු වේ. මෙහෙයුම් ක්‍රියාකාරකම් සහ තීරණ ගැනීමේදී මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ දැනුම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හිමිකරුවන්ට සහ කළමනාකරුවන්ට ප්‍රධාන වශයෙන් පහත සඳහන් ක්ෂේත්‍ර වල ව්‍යාපාර පවත්වාගෙන යෑමට උපකාරි වේ.

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ව්‍යාපාර කටයුතුවලදී මූල්‍ය සාක්ෂරතාවය යොදා ගත හැකි ආකාර 6 ක්

1. ව්‍යාපාරයේ මුදල් ප්‍රවාහ කළමනාකරණය කිරීම.

ව්‍යාපාරය තුලට මුදල් ලැබීම් සහ ව්‍යාපාරයෙන් පිටතට මුදල් ගෙවීම් නිවැරදිව කළමනාකරණය කරගැනීම මෙන්ම එදිනෙදා ව්‍යාපාරික කටයුතු සඳහා මුදල් ඌනතාවයන් වළක්වා ගැනීමට මූල්‍ය සාක්ෂරතාවයෙන් යුතුවීම ඉතා වැදගත් වේ.

එමෙන්ම මූල්‍ය සාක්ෂරතාවය, වඩා කාර්යක්ෂම සහ ඵලදායී කළමනාකරණයක් තුලින් ඔබේ ව්‍යාපාරයේ එදිනෙදා මෙහෙයුම් කටයුතු සුමටව ක්‍රියාත්මක කිරීමටද, දිගුකාලීන සාර්ථකත්වයක් අත්කර ගැනීමටද උපකාරි වේ.

2 සැලසුම් කිරීම සහ අයවැයකරණය

අපේක්ෂිත ව්‍යාපාරික ලාභ ඉලක්ක සපුරා ගැනීම සඳහා වඩාත් නිවැරදි ආදායම් ප්‍රවාහ පුරෝකථනය කිරීම සහ වියදම් කළමනාකරණය කිරීම වැදගත් වේ. මේ සඳහා ව්‍යාපාරයේ කෙටි කාලීන සහ දිගු කාලීන ඉලක්ක සහ අරමුණු කරගත් යථාර්ථවාදී අයවැය සකස් කිරීම තුලින් වඩාත් ප්‍රායෝගික සැලසුම්කරණයක් සිදු කල යුතුය.

3 ලාභදායීතාවය විශ්ලේෂණය කර වර්ධනය කර ගැනීම සහ ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීම.

ව්‍යාපාරයේ සියලු□ම ගනුදෙනු වාර්තා කිරීම සහ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම ඉතා වැදගත් වන අතර එමඟින් ව්‍යාපාරයේ ආර්ථික ක්‍රියාකාරිත්වය සහ තත්වය තේරුම් ගැනීමට හැකියාව ලැබේ. මූල්‍ය අනුපාත භාවිතා කරමින් ව්‍යාපාරයක ලාභදායීතාවය විශ්ලේෂණය කිරීමත්, එක් එක් නිෂ්පාදනයට හෝ සේවාවට ඇති ලාභ උත්පාදනය කිරීමේ හැකියාව මැනීමට එමඟින් ඉඩ සළසනු ලබයි. එමෙන්ම, එය ව්‍යාපාරයේ ද්‍රවශීලතා තත්වය මැන ගැනීමත් කළමනාකරණය කිරීමත් අඛණ්ඩව, කාර්යක්ෂමව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට උපකාරී වනු ඇත.

4 ව්‍යාපාරයේ ණයට ගැනීම් සහ ණය අරමුදල් කළමනාකරණය කිරීම

කුඩා ව්‍යාපාර හිමියන්ට බොහෝ විට ව්‍යාපාර ආරම්භය සහ පුළුල් කිරීමට අරමුදල් සපයා ගැනීම සඳහා ණය ගැනීමට යොමු වේ. අරමුදල් සම්පාදනය කර ගැනීමේදී පවතින විවිධ මූල්‍යකරණ විකල්ප ඇගයීම සඳහා පොලී පිරිවැය ගණනය කිරීම සහ ණය කළමනාකරණය කිරීම පිළිබඳ අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය වේ.

5 ව්‍යාපාරයේ නීතිමය අනුකූලතා ඉටු කිරීම සහ බදු ගෙවීම කළමනාකරණය කිරීම.

ව්‍යාපාරයේ නියාමන අවශ්‍යතා අදාළ නීති රෙගුලාසි යටතේ සිදු කිරීමට සහ බදු ගෙවීම පිළිබඳ නීතිමය තත්වයන්ද තේරුම් ගැනීම සහ කළමනාකරණය කිරීමට මූල්‍ය සාක්ෂරතාවය ඉතා වැදගත් මෙන්ම අත්‍යවශ්‍යද වේ.

6 ව්‍යාපාරය සතු ආයෝජන අවස්ථා ඇගයීම.

විවිධ ඇගයුම් මෙවලම් සහ ගණිතමය ශිල්පීය ක්‍රම හරහා සියලු□ අනාගත ආයෝජන අවස්ථා ඇගයීම මඟින් ව්‍යාපාරයේ සමස්ත වටිනාකම උපරිම කරගැනීම සඳහා දැනුවත් ආයෝජන තීරණ ගැනීමට මූල්‍ය සාක්ෂරතාවය අත්‍යවශ්‍ය ය.

4.7. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මූල්‍ය වාර්තා පවත්වාගෙන යාම

බොහෝ ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ව්‍යවසායන් තම මූල්‍ය වාර්තා පවත්වා ගැනීමට අපොහොසත් වන බව පර්යේෂණවලින් හෙළි වී තිබේ. ඔබේ ව්‍යාපාරය සඳහා ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාමේ ප්‍රතිලාභ හා එම වාර්තා පවත්වාගෙන යන ආකාරය පිළිබඳව වැඩි දුර හදාරමු.

ඉගෙනුම් අරමුණු

- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වාර්තා තබා ගැනීමේ වැදගත්කම තේරුම් ගැනීම.
- ක්ෂුද්‍ර ව්‍යාපාරයක මූල්‍ය වාර්තා පවත්වා ගැනීම සඳහා මූලික පියවර හඳුනා ගැනීම.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක මූල්‍ය වාර්තා පවත්වා ගැනීම සඳහා මූලික පියවර හඳුනා ගන්න.
- ද්විත්ව සටහන් ක්‍රමය භාවිතයෙන් ගනුදෙනු වාර්තා කරන්නේ කෙසේදැයි ඉගෙන ගැනීම.
- ලෙජර ගිණුම් සාරාංශ කර ශේෂ පිරික්ෂුම පිළියෙළ කිරීම සහ මූල්‍ය ප්‍රකාශන සකස් කරන ආකාරය ඉගෙන ගැනීම.
- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා අවදානම් කළමනාකරණය පිළිබඳ සංකල්පය සාකච්ඡා කිරීම.
- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා ඵලදායී අවදානම් කළමනාකරණ උපාය මාර්ගයක් සංවර්ධනය කිරීමේ පියවර හඳුනා ගැනීම.
- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා රක්ෂණයේ ප්‍රතිලාභ දැන ගැනීම.

ව්‍යාපාරයක් කරගෙන යාම පිළිබඳ වැඩිදුර ඉගෙන ගැනීම සඳහා ධනංජය කඩ හිමියා සමග වැඩිදුර කතාබහ කළේය.



ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වාර්තා තබා ගැනීමේ වැදගත්කම

- මුදල් ප්‍රවාහ කළමනාකරණය.

මුදල් සහ ද්‍රවශීල වත්කම් ව්‍යාපාරයක තීරණාත්මක සාධක වේ. නිවැරදි, කාලීන ගනුදෙනු වාර්තා තබා ගැනීම මගින් එම වත්කම්වල සියලු□ම චලනයන් පිළිබඳ අඛණ්ඩව තොරතුරු දැනගත හැකි වන අතර, එමඟින් මුදල් කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට ඉඩ සැලසේ. එමෙන්ම, වාර්තා තබාගැනීම සමාගමේ මුදල් ප්‍රවාහ කළමනාකරණයට සැළකිය යුතු ලෙස උපකාරී වන අතර ව්‍යාපාර මූල්‍ය පිළිබඳ නිවැරදිව පුරෝකථනය කිරීමට අවශ්‍ය වන තොරතුරු සපයයි.

- වර්තමාන සහ අනාගත ව්‍යාපාරික තීරණ වලට සහාය වීම.

ව්‍යාපාරය තුළ පවතින සෑම රුපියලක්ම ඉතා වැදගත් වන අතර එම මුදල් වඩා ඵලදායී ලෙස වියදම් කළ යුතුය. එමනිසා, ව්‍යාපාරයට ලැබෙන මුදල් වියදම් කරන්නේ කෙසේද යන්න තේරුම් ගැනීම ඉතා වැදගත් වේ. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හිමිකරුවෙකු ලෙස, ඔබට වාර්තාගත තොරතුරු භාවිතා කර ඔබේ ව්‍යාපාරයේ නිවැරදි අනාගත ප්‍රක්ෂේපණ කිරීමට සහ ඔබේ ව්‍යාපාර ලාභ වර්ධනය කිරීමට හැකි වේ.

- වංචා හෝ සොරකම් වැළැක්වීම.

නිසි ගිණුම්කරණ පද්ධතියක් පවත්වා ගැනීමෙන් වංචා සහ දෝෂ වැළැක්වීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමට ඔබට හැකියාව ලැබේ.

- බදු ගෙවීම සහ නීතිරීතිවලට අනුකූල වීම.

නිසි ගිණුම්කරණ පිළිවෙත් පවත්වා ගැනීමෙන් ඔබට ඔබේ බදු නිවැරදිව ගෙවීමට හැකි වේ.

තවද, රජයේ නීති රීති වලට අනුකූල වීම සඳහා ව්‍යාපාරට පරිපූර්ණ ගිණුම්කරණ පද්ධතියක් අත්‍යවශ්‍ය වේ.

ක්ෂුද්‍ර ව්‍යාපාරයක මූල්‍ය වාර්තා පවත්වා ගැනීම සඳහා ගත යුතු මූලික පියවර

පළමු පියවර

‍යාපාරයේ සිදුවන සියලු□ම ගනුදෙනු ලියා තබන්න. ක්ෂුද්‍ර මට්ටමේ ව්‍යාපාරිකයාට තේරුම් ගැනීමට අපහසු විය හැකි බැවින්, සම්ප්‍රදායික ගිණුම්කරණ මූලධර්ම අනුගමනය කිරීමක් අවශ්‍ය නොවන අතර තොරතුරු නිවැරදිව සටහන් කර තැබීම ප්‍රමාණවත්ය.

දෙවන පියවර

ඉන්පසු, ගනුදෙනු ලැයිස්තුව ප්‍රධාන වර්ග පහකට වර්ගීකරණය කළ යුතුය: ආදායම, වියදම්, අයිතිකරුගේ හිමිකම්, වගකීම් සහ වත්කම්. උදාහරණ සමඟ මෙම ප්‍රධාන ගනුදෙනු වර්ග තේරුම් ගනිමු.

1* ආදායම්: ආදායම යනු ව්‍යාපාරයට ලැබුණු සියලු□ම භාණ්ඩ හා සේවා විකුණුම්වල සහ අනෙකුත් ආදායම්වල වටිනාකමයි. එක් එක් ආදායම වෙන වෙනම සටහන් කිරීම අත්‍යවශ්‍ය වේ.

උදාහරණ:

- ව්‍යාපාරයේ විකුණුම් ආදායම
- ස්ථාවර තැන්පතුවකින් ලැබෙන පොලී ආදායම
- ව්‍යාපාර ගොඩනැගිල්ලේ අමතර ඉඩක් කුලියට දීමෙන් ලැබෙන කුලී ආදායම

2* වියදම්: වියදම් යනු ව්‍යාපාරය විසින් ආදායම ඉපයීමේ දී වියදම් කරන ලද මුදල් සහ දරන ලද පිරිවැයයි. එක් එක් වියදම් වර්ගය වෙන වෙනම සටහන් කිරීම අත්‍යවශ්‍ය වේ.

උදාහරණ:

- කාර්ය මණ්ඩලයේ වැටුප්
- ගොඩනැගිල්ලේ කුලිය
- විකුණුම් පිරිවැය (විකිණූ භාණ්ඩවල මිලදී ගැනීමේ වටිනාකම)
- උපයෝගිතා බිල් (විදුලිය, වතුර, දුරකථන)
- ප්‍රචාරණ
- ප්‍රවාහන
- ණය පොලිය

3* වත්කම්: වත්කම් යනු අනාගත ආර්ථික ප්‍රතිලාභ ජනනය කිරීමට භාවිතා කරනු ලබන ව්‍යාපාරයක් සතු හෝ ව්‍යාපාරය විසින් පාලනය කරන සම්පත් වේ.

උදාහරණ

- අතේ ඇති මුදල්/බැංකුවේ ඇති මුදල්
- ඉන්වෙන්ටරි (විකිණී නොමැති භාණ්ඩ තොග)
- වෙළඳ ණය ගැතියෝ,
- ලැබිය යුතු ආදායම් (කුලී ආදායම)
- වියදම් පෙරගෙවුම්/කලින් පියවීම්
- ඉඩම් සහ ගොඩනැගිලි
- යන්ත්‍රෝපකරණ
- උපකරණ, සවිකිරීම්
- ගෘහ භාණ්ඩ
- වාහන

4* වගකීම්: වගකීම් යනු ව්‍යාපාරයක් විසින් බාහිර පාර්ශවයන්ට ගෙවීමට බැදී සිටින ගෙවීම් ය. වගකීම් සඳහා ව්‍යාපාරයේ අනාගත ආර්ථික ප්‍රතිලාභ කැප කරනු ලැබේ.

උදාහරණ:

- වෙළඳ ණය හිමියන්
- ගෙවිය යුතු වියදම්
- බැංකු අයිරාව
- බැංකු ණය

5* හිමිකම් යනු, හිමිකරුගේ දායකත්වය හෝ හිමිකරු ව්‍යාපාරයේ ආයෝජනය කළ වටිනාකම ලෙස හැඳින්වේ. හිමිකරු වරින් වර අමතර ප්‍රාග්ධනය ව්‍යාපාරයට ලබාදෙන විට, හිමිකම් වටිනාකම වැඩි වන අතර ඔහු තම පුද්ගලික භාවිතය සඳහා වත්කම් භාවිතා කරන විට ව්‍යාපාරයේ හිමිකම් අඩු වේ.

උදාහරණ:

- ප්‍රාග්ධනය

මෙම ප්‍රධාන ගනුදෙනු වර්ග පහ නිර්මාණය වී ඇත්තේ මූල්‍ය ගිණුම්කරණයේ පදනම වන ගිණුම්කරණ සමීකරණයෙනි. එම සමීකරණයට අනුව, ඕනෑම අවස්ථාවක, ව්‍යාපාරයේ වත්කම් සහ වියදම්වල සමුච්චිත වටිනාකම, මුළු වගකීම්, ආදායම සහ හිමිකම්වල උපචිත වටිනාකමට සමාන විය යුතුය.

වත්කම් + වියදම් = හිමිකම් + වගකීම් + ආදායම්

Step 3: Identification of the impact of the transactions on the business

ව්‍යාපාරයක් තුළ සිදුවන සෑම ගනුදෙනුවක්ම දෙයාකාරයකින් ව්‍යාපාරය කෙරෙහි බලපානු ලබයි. මෙය ගිණුම් වලට ද්විත්ව සටහන් ලෙස හඳුන්වයි. උදාහරණයක් ලෙස, හිමිකරු ව්‍යාපාරයට ප්‍රාග්ධනය ලෙස මුදල් ලබා දෙන විට, මුදල් වත්කම සහ හිමිකම්(අයිතිකරුගේ) වැඩි වේ. ව්‍යාපාරය ණයක් ලබා ගන්නේ නම්, මුදල් (වත්කම) සහ බැංකු ණය (වගකීම) ද වැඩි වේ. සමාගම තම වගකීම් පියවන විට මුදල් (වත්කම්) සහ බැංකු ණය (වගකීම) අඩු වේ. ඒ අනුව, සෑම ගනුදෙනුවක් අවසානයේම ගිණුම්කරණ සමීකරණයේ දෙපැත්තම වටිනාකමින් සමාන වන ආකාරයෙන් සිදු වේ.

පහත වගුවේ දැක්වෙන්නේ ධනංජයගේ අවන්හලේ මෙහෙයුම්වල පළමු සතිය තුළදී සිදු වූ මූලික ගනුදෙනු එම ව්‍යාපාරයේ ආදායම්, වියදම්, වත්කම්, වගකීම් සහ හිමිකම් වලට බලපාන ආකාරයයි.

ගනුදෙනුව	ආදායම්		වියදම්			වත්කම්				වගකීම්		හිමිකම්
	විකුණුම් ආදායම	වෙනත් ආදායම්	අලෙවිකරණ පිරිවැය	ප්‍රවාහන පිරිවැය	වැටුප්	මුදල්/බැංකු ශේෂය	අමුද්‍රව්‍ය තොග	වෙළඳ ණය ගැතියෝ	ගෘහ භාණ්ඩ සහ උපකරණ	වෙළඳ ණය හිමියෝ	බැංකු ණය	ප්‍රාග්ධනය
1) හිමිකරු ව්‍යාපාරයට රු. 100,000 ක් වෙන් කරයි.						+ 100,000						+ 100,000
2) රු. 50,000 කට ගෘහ භාණ්ඩ හා උපකරණ මිලදී ගත්තා.						- 50,000			+ 50,000			
3) රු. 10,000 කට ආහාර පිසීමට අවශ්‍ය අමුද්‍රව්‍ය මුදල් ගෙවා මිලදී ගැනීම.						- 10,000	+ 10,000					
4) ආහාර පිසීමට ණයට ගත් අමුද්‍රව්‍ය රු. 15,000							+ 15,000			+ 15,000		
5) ආහාර වේලක් සඳහා රු. 350 කට ආහාර වේල් 100 ක් විකුණන ලදී; එහි විකුණුම් පිරිවැය රු. 220 කි. පාරිභෝගිකයින්ගෙන් මුදල් ලැබුණි.	+ 35,000		+ 22,000			+35,000	-22,000					
6) ආහාර වේලක් සඳහා රු. 350 කට ආහාර වේල් 10 ක් විකුණන ලදී; එහි විකුණුම් පිරිවැය රු. 220 කි. ගනුදෙනුකරුවන් පසුව ගෙවීමට පොරොන්දු විය.	+ 3,500		+ 2,200				- 2,200	+ 3,500				
7) ණයට ආහාර මිලදී ගත් ගනුදෙනුකරුවන් පස් දෙනෙකු මුදල් ගෙවන ලදී. (රු. 350o5)						+1,750		- 1,750				
8) තොග කඩයට රු. 10,000 ක් ගෙවන ලදී.						- 0,000				- 10,000		
9) බැංකු ණයක් ලබා ගන්නා ලදී. රු. 500,000						+ 500,000					+ 500,000	
10) ගෙවන ලද ත්‍රිරෝද රථ ගාස්තුව රු. 500 ගෙවන ලද වැටුප් රු. 10,000				+ 500	+ 10,000	-	500					
11* three-wheeler fee Rs 500	-	- 10,000										
12) Salaries Rs 10,000	38,500	0	24,200	500	10,000	556,250	800	1,750	50,000	5,000	500,000	100,000
එකතුව	38,500		34,700			608,800				505,000		100,000

* එක් එක් ගනුදෙනු වර්ගය පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් පහත දක්වා ඇත.ග

1. ව්‍යාපාරයට මූලික අරමුදල් වෙන් කිරීම. මෙම අරමුදල් ප්‍රමාණය ව්‍යාපාරයේ අයිතිකරුගේ ආයෝජනය වන අතර එය "ප්‍රාග්ධනය" ලෙස හැඳින්වේ. ව්‍යාපාරයට ලැබෙන පළමු මුදල් ගලා ඒම ප්‍රග්ධනයයි. මෙය ව්‍යාපාර කටයුතු වලින් ලැබෙන ආදායමක් නොවේ. එය ව්‍යාපාරයට ලැබෙන මුදල් ආයෝජනයක් පමණි.

2. ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අවශ්‍ය ගෘහ භාණ්ඩ, මෙවලම්, යන්ත්‍ර සහ උපකරණ මිලදී ගැනීම. මෙය ව්‍යාපාරයෙන් මුදල් පිටතට ගලා යාමකි. මේවා ව්‍යාපාර කටයුතුවල වියදම් නොවන අතර, ලාභය ගණනය කිරීමේදී සලකා බලනු නොලැබේ. මෙම වියදම් ව්‍යාපාරය කරගෙන යාමට අවශ්‍යවන වත්කම් අත්පත් කර ගැනීම සඳහා සිදු වේ. මේ අනුව, මේවා ස්ථාවර වත්කම් මිලදී ගැනීම් ලෙස සැලකේ.

3. නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය මිලදී ගැනීම හෝ විකිණීම සඳහා භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම ව්‍යාපාරයෙන් පිටතට මුදල් ගලා යාමකි. මිලදී ගත් අමුද්‍රව්‍ය ව්‍යාපාරයේ වත්කමක් ලෙස සැලකේ. කෙසේ වෙතත්, නිමි භාණ්ඩ විකිනුණ පසු, එම විකුණන ලද නිෂ්පාදන සෑදීමට භාවිතා කරන අමුද්‍රව්‍යවල පිරිවැය නිෂ්පාදන පිරිවැය / විකුණුම් පිරිවැය ලෙස හැඳින්වෙන වියදමක් බවට පරිවර්තනය වේ.

4. නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය හෝ විකිණීම සඳහා භාණ්ඩ ණයට ගැනීම. මෙහිදී, ව්‍යාපාරයෙන් මුදල් පිටතට ගලා යාමක් සිදු නොවේ. ඒ වෙනුවට, වෙළඳ ණය හිමියන් ලෙස ඉදිරියේදී ගෙවිය යුතු වගකීමක් නිර්මාණය වේ. මිලදී ගත් අමුද්‍රව්‍ය මිලදී ගත විටදී මෙන් ව්‍යාපාරයේ වත්කමක් ලෙස සැලකේ. කෙසේ වෙතත්, නිමි භාණ්ඩ විකුණන ලද පසු, එම විකුණන ලද නිෂ්පාදන සෑදීමට භාවිතා කරන අමුද්‍රව්‍යවල පිරිවැය, නිෂ්පාදන පිරිවැය / විකුණුම් පිරිවැය ලෙස හැඳින්වෙන වියදමක් බවට පරිවර්තනය වේ.

5. නිෂ්පාදනය කරන ලද භාණ්ඩ (හෝ මිලදී ගත් භාණ්ඩ) මුදල් පදනම මත විකිණීම. මෙය ව්‍යාපාරයට මුදල් ගලා ඒමක් සහ ව්‍යාපාරයෙන් ආදායම් උත්පාදනයක් වන අතර එය විකුණුම් ආදායම ලෙස හඳුනා ගැනේ. මෙම විකිණීමත් සමඟ, නිමි භාණ්ඩ ව්‍යාපාරයෙන් පිටතට යන අතර එම නිසා, විකුණන ලද භාණ්ඩවල පිරිවැය හඳුනාගෙන භාණ්ඩ තොගවලින් ඉවත් කළ යුතුය.

6. නිෂ්පාදනය කරන ලද භාණ්ඩ (හෝ මිලදී ගත් භාණ්ඩ) ණයට විකිණීම. ව්‍යාපාරයට මුදල් ගලා ඒමක් නොමැත. ඒ වෙනුවට, ව්‍යාපාරය තුළ ඉදිරියේදී ලැබිය යුතු වෙළඳ ණය ගැතියෙක් (වත්කමක්) නිර්මාණය වේ. කෙසේ වෙතත්, ණයට විකුණුවද, විකුණුම් ආදායම ජනනය වන අතර, නිමි භාණ්ඩ විකුණන ලද පසු, එම නිෂ්පාදන සෑදීමට භාවිතා කරන අමුද්‍රව්‍යවල පිරිවැය නිෂ්පාදන පිරිවැය / විකුණුම් පිරිවැය ලෙස හැඳින්වෙන වියදමක් බවට පරිවර්තනය වේ. එමෙන්ම, නිමි භාණ්ඩ ව්‍යාපාරයෙන් පිටතට යන අතර, එම නිසා, විකුණන ලද භාණ්ඩවල පිරිවැය හඳුනාගෙන භාණ්ඩ තොගවලින් ඉවත් කළ යුතුය.

7. ණයට මිලදී ගත් ගනුදෙනුකරුවන් විසින් මුදල් පියවීම (වෙළඳ ණය ගැතියෝ). මෙය ව්‍යාපාරයට මුදල් ගලා ඒමකි. තවද, වෙළඳ ණය ගැතියෝ (වත්කම්) ප්‍රමාණය අඩු වේ. මෙය ආදායමක් නොවේ.

8. ව්‍යාපාරය විසින් ණයට භාණ්ඩ මිලදී ගත් සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම (වෙළඳ ණය හිමියෝ). මෙය ව්‍යාපාරයෙන් මුදල් පිටතට ගලා යාමකි. තවද වෙළඳ ණය හිමියෝ (වගකීම්) ප්‍රමාණය අඩු වේ. මෙය වියදමක් නොවේ.

9. බැංකුවෙන් (හෝ ඕනෑම ණය දෙන්නේකුගෙන්) ණයක් ලබා ගැනීම. මෙය ව්‍යාපාරයට මුදල් ගලා ඒමකි. ව්‍යාපාරය ණය ආපසු ගෙවීමට බැඳී සිටින බැවින්, එය ව්‍යාපාරයේ වගකීමකි.

10. වැටුප්, උපයෝගිතා බිල්පත්, කුලිය, ප්‍රවාහන වියදම් (බස් ගාස්තු, ට්‍රක් රථයක් කුලියට ගැනීම, ඉන්ධන පිරිවැය), වෙළඳ දැන්වීම් ආදී විවිධ වියදම් සඳහා මුදල් ගෙවීම ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේදී අනිවාර්ය වේ. මෙම වියදම් මුදලින් ගෙවන විට, ව්‍යාපාරයෙන් මුදල් පිටතට ගලා යාමක් සිදු වේ.

පියවර 4: ලාභය ගණනය කිරීම

ඉහත වගුවට අනුව ඔබ ව්‍යාපාරයේ වාර්තා නිවැරදිව තබා ඇත්නම්, තීරු වල එකතුව ලබා ගැනීමෙන් යම් කාල පරිච්ඡේදයක් සඳහා ව්‍යාපාරයේ, වත්කම්, වියදම්, ආදායම්, වගකීම් සහ හිමිකම් වල මුළු වටිනාකම සොයාගත හැකිය. ඉන්පසු, ඔබට පහත සූත්‍රය භාවිතයෙන් ව්‍යාපාරයේ ලාභය හෝ අලාභය ගණනය කළ හැකිය.

මුළු ලාභය = කාලපරිච්ඡේදයේ මුළු ආදායම - කාලපරිච්ඡේදයේ මුළු වියදමග

පළමු සතියේ ලාභය = පළමු සතියේ ආදායම - පළමු සතිය තුළ දැරූ වියදම්

පළමු සතියේ ලාභය = 38,500 – 34,700 = 3,800

මෙම ලාභ අගය ව්‍යාපාරයේ පවතින මුදල් ශේෂයට වඩා වෙනස් වේ. මෙයට හේතුව ව්‍යාපාරයේ ණය ගනුදෙනුය. ණයට ගැනුම් සහ ණයට විකුණුම් වලින් මුදල් ගලා ඒමක් හෝ යාමක් සිදු නොවන නමුත් විකුණුම් ආදායම වැඩි වීමක් සහ විකුණුම් පිරිවැය වැඩි වීමක් සිදු වේ. මෙහිදී, ගිණුම්කරණයේ උපචිත සංකල්පය ට අනුව මුදලින් ලැබුනා හෝ නොලැබුණා හෝ කාල පරිච්ඡේදයට අදාළ ආදායම් සහ වියදම් වාර්තා කර්නු ලැබේ. ඉහත වගුව විසින් ව්‍යාපාරයේ ආදායම් සහ වියදම් වලට අමතරව පහත සඳහන් තොරතුරුද ලබා ගත හැක.

- යම් කිසි කාලපරිච්ඡේදයක් අවසානයේ සමාගමේ මුළු වත්කම්වල වටිනාකම සහ ඒ එක් එක් වත්කමේ වටිනාකම්.
- යම් කාල පරිච්ඡේදයක් අවසානයේ සමාගමේ මුළු වගකීම්වල වටිනාකම සහ ඒ එක් එක් වගකීම්වල වටිනාකම්.
- යම් කාලපරිච්ඡේදයක් අවසානයේ ව්‍යාපාරයේ හිමිකරුගේ අයිතියේ වටිනාකම.
- මුදල් තීරුව මඟින් අදාළ කාලපරිච්ඡේදය තුළ ව්‍යාපාර කටයුතු සහ අනෙකුත් ව්‍යාපාරයට සම්බන්ධ කටයුතු හරහා ව්‍යාපාරය තුලට මුදල් ලැබීම් සහ ව්‍යාපාරයෙන් පිටතට මුදල් ගෙවීම් පෙන්වනු ලබයි.

ඒ අනුව, ඉහත දක්වා ඇති සරල එහෙත් සවිස්තරාත්මක වගුව තුලින් ඔබේ ව්‍යාපාරයේ ලාභය නිවැරදිව හඳුනා ගැනීමට සහ ව්‍යාපාරයේ මූල්‍ය තත්වය (හිමිකාරිත්වය, වත්කම් සහ වගකීම්) හඳුනා ගැනීමට හැකියාව ලැබේ. එමෙන්ම, යම් කිසි කාල සීමාවක් අවසානයේ ව්‍යාපාරයේ ද්‍රවශීලතාවය (මුදල් තත්වය) තේරුම් ගැනීමටද එම වගුව ඔබට හැකියාව ලබා දෙයි.

ඉහත දැක්වෙන පරිදි ව්‍යාපාරයේ සිදුවන සියලුම ගනුදෙනු, ක්‍රියාකාරකම් පිළිබඳව වාර්තා තබා ගැනීමේ ක්‍රමය ක්ෂුද්‍ර මට්ටමේ ව්‍යාපාර සහ ආරම්භක මට්ටමේ පවතින සුළු පරිමාණ ව්‍යාපාර සඳහා භාවිතා කල හැකිය. කෙසේ වුවත්, ව්‍යාපාරය ක්‍රමයෙන් වර්ධනය වන විට, නිසි මූල්‍ය ගිණුම්කරණ ක්‍රියාවලියකට යා යුතුය.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මූල්‍ය වාර්තා සකස් කිරීම

ව්‍යාපාරය වර්ධනය වන විට නිසි ගිණුම්කරණ පද්ධතියක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. මෙම අදියරේදී, සමාගම තම මූල්‍ය වාර්තා පවත්වා ගැනීම සඳහා ද්විත්ව සටහන් ක්‍රමය අනුගමනය කළ යුතුය. පළමුව, ව්‍යාපාරය එහි සියලු ම ගනුදෙනු පිළිබඳ වාර්තාවක් තබා ගත යුතු අතර, ගිණුම් සකස් කිරීමේදී අදාළ තොරතුරු එම වාර්තාවලින් ලබා ගත හැකිය. ගනුදෙනු, වත්කම් සහ වගකීම් පිළිබඳ වාර්තා කාලානුක්‍රමික අනුපිළිවෙලට සහ දින නියම කර තිබිය යුතු අතර එමඟින් ගනුදෙනු නිශ්චිත කාල පරිච්ඡේදයකට (උදා: දිනපතා, සතිපතා, මාසික, වාර්ෂික) සාරාංශගත කර අවශ්‍ය තොරතුරු ලබා ගත හැකිය.

ගිණුම් සකස් කිරීමේ පළමු පියවර වන ද්විත්ව සටහන් ක්‍රමය අනුව පොත් තැබීම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සිදු කරන ආකාරය, මෙම පරිච්ඡේදය තුල විස්තරාත්මකව පහදා දෙනු ලැබේ.

පොදු ලෙජරය

පොදු ලෙජරය යනු ව්‍යාපාරයක මූල්‍ය කටයුතු සාරාංශ කරන ගිණුම් වාර්තාවකි. එහි එක් එක් වත්කම්, වගකීම්, ප්‍රාග්ධනය, ආදායම සහ වියදම් සඳහා ගිණුම් අඩංගු වේ. එය විවිධ ගිණුම් රාශියකින් සමන්විත වන අතර, ඒ සෑම ගිණුමකම, එහි අරමුණ, නම සඳහන් කර ඇත

ලෙජර් ගිණුමක ආකෘතිය

ලෙජර් ගිණුමක පැති දෙකක් සහ ඉහළින් ශීර්ෂයක් ඇති අතර එය සාමාන්‍යයෙන් 'ඔ' ගිණුමක් ලෙස හැඳින්වේ. එය සටහන් පොතක ලිඛිතව දක්වා ඇත්නම්, එහි ආකෘතිය පහත පරිදි වේ.

Debit		Accounts Name				Credit	
Date	Narr ative	Ref	(Rs)	Date	Narr ative	Ref	(Rs)

ද්විත්ව සටහන් පොත් තැබීම

ද්විත්ව සටහන් සහිත පොත් තැබීමේ ක්‍රමයට අනුව සෑම ගනුදෙනුවකටම බලපෑම් දෙකක් ඇත, එනම් හර බලපෑම සහ බැර බලපෑමයි. සෑම හර සටහනකටම සමාන බැර සටහනක් ඇති බවයි. වෙනත් වචන වලින් කිවහොත්, මෙම ද්විත්ව බලපෑම ලෙජරයේ හර සහ බැර ඇතුළත් කිරීම් ලෙස සටහන් වේ.

පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණය මතක තබා ගන්න.

වත්කම් + වියදම් = ප්‍රාග්ධනය + වගකීම් + ආදායම

සමීකරණයට අනුව, ව්‍යාපාරයක මුළු වගකීම්, ප්‍රාග්ධනය සහ ආදායම්වල එකතුව සැමවිටම මුළු වත්කම් සහ වියදම් වල එකතුවට සමාන වේ. එබැවින්, මුළු වත්කම් හෝ වියදම් වෙනස් කරන ඕනෑම ගනුදෙනුවක් විසින් මුළු වගකීම් හෝ ආදායම හෝ ප්‍රාග්ධනය ද වෙනස් කරනු ඇත.

ද්විත්ව සටහන් ගිණුම්කරණයේ නීති

මූලික රීතිය වනුයේ වත්කම් සහ වියදම් ගිණුම්වල හර ශේෂයන් සහ වගකීම් ප්‍රාග්ධනය සහ ආදායම් ගිණුම්වල බැර ශේෂයන් තිබිය යුතු බවයි.



එබැවින්, වත්කම් සහ වියදම් වැඩි වූ විට, අදාළ ගිණුම්වල හර පැත්තේ සටහන් කිරීමක් සිදු කරනු ලැබේ.

වත්කමක හෝ වියදමක වැඩිවීමක් ගිණුම්ගත කිරීම



එමෙන්ම, වත්කම් සහ වියදම් අඩුවීම බැර සටහනක් මඟින් අදාළ ගිණුම් වලට ඇතුළත් කෙරේ.

වත්කමක හෝ වියදමක අඩුවීමක් ගිණුම් ගත කිරීම



ආදායම්, වගකීම් සහ ප්‍රාග්ධනය වැඩි වන විට, එය අදාළ ගිණුම්වලට බැර සටහනක් ලෙස ඇතුළත් වේ.

ආදායමක්, වගකීමක් හෝ ප්‍රාග්ධන ගිණුමක වැඩිවීමක් ගිණුම් ගත කිරීම



ආදායම්, වගකීම් සහ ප්‍රාග්ධනය අඩු වන විට, එය අදාළ ගිණුම්වලට හර සටහනක් ලෙස ඇතුළත් වේ

ආදායමක්, වගකීමක් හෝ ප්‍රාග්ධන ගිණුමක අඩුවීමක් ගිණුම් ගත කිරීම



ද්විත්ව සටහන් ක්‍රමය සාරාංශ ලෙස:



Accounts	To record	The entry in the account
Assets	an increase	Debit
	a decrease	Credit
Liabilities	an increase	Credit
	a decrease	Debit
Income	an increase	Credit
	a decrease	Debit
Expenses	an increase	Debit
	a decrease	Credit
Capital	an increase	Credit
	a decrease	Debit

ද්විත්ව සටහන් ක්‍රමයේ මූලික රීතිය නම්, සෑම මූල්‍ය ගනුදෙනුවක්ම ගිණුම්කරණ සටහන් දෙකක්, එනම්, එක් හර සටහනක් සහ එක් බැර සටහනක් ඇති බවයි. එබැවින්, පොදු ලෙජරයේ හර සටහන්වල මුළු වටිනාකම සෑමවිටම බැර සටහන්වල මුළු වටිනාකමට සමාන වේ.

පහත උදාහරණය භාවිතයෙන් ද්විත්ව සටහන් ක්‍රමය පිළිබඳව වැඩිදුර ඉගෙන ගනිමු.

1) ධනංජය මහතා රුපියල් 100,000 ක් ආයෝජනය කරමින් ව්‍යාපාරයක් ආරම්භ කළේය.

මෙම උදාහරණයේ දී, ආරම්භක ආයෝජනය වන ව්‍යාපාරයේ ප්‍රාග්ධනය, වැඩි වන අතර, ප්‍රාග්ධන ගිණුමට බැර කරනු ලැබේ. ව්‍යාපාරයට ප්‍රාග්ධනය මුදල් වශයෙන් ලැබෙන විට, වත්කම් (මුදල් යනු වත්කමකි) වැඩි වන අතර, මුදල් ගිණුම හර කරනු ලැබේ.

මුදල් ගිණුම (හර) 100,000
ප්‍රාග්ධන ගිණුම (බැර) 100,000

වත්කම්	+	වියදම්	=	ආදායම්	+	වගකීම්	+	ප්‍රාග්ධනය
වැඩිවේ			=					වැඩිවේ

Asset (Cash) account

Debit	Credit
Capital 100,000	

Capital account

Debit	Credit
	Cash 100,000

2* ව්‍යාපාරය රු. 25,000 ක ගෘහ භාණ්ඩ මුදල් ගෙවා මිලදී ගත්තේය.

මෙම ගනුදෙනුවේදී, වත්කම් (මුදල්) අඩු වන අතර, වත්කම් (ගෘහ භාණ්ඩ) වැඩි වේ.

ගෘහ භාණ්ඩ ගිණුම :හර * 25,000
මුදල් ගිණුම (බැර) 25,000

වත්කම්	+	වියදම්	=	ආදායම්	+	වගකීම්	+	ප්‍රාග්ධනය
(මුදල්) අඩු වේ (ගෘහ භාණ්ඩ) වැඩිවේ								

Asset(Furniture) account

Dr	Cr
Cash 25,000	

Asset(Cash) account

Dr	Cr
	Furniture 25,000

3* ව්‍යාපාරයක් රු. 25,000 ක් වටිනා භාණ්ඩ ණයට ගත්තේය.

මෙම ගනුදෙනුව ව්‍යාපාරයේ වත්කම් (තොග) වැඩි කරන අතර වගකීමක් (ණයහිමියන්) ඇති කරයි.

තොග ගිණුම : හර * 25,000
ණයහිමියන් : බැර * 25,000

වත්කම්	+	වියදම්	=	ආදායම්	+	වගකීම්	+	ප්‍රාග්ධනය
(තොග) වැඩි වේ						(ණය හිමියන්) වැඩි වේ		

Asset(Inventory) account

Dr	Cr
Creditors 25,000	

Liability(Creditors) account

Dr	Cr
	Inventory 25,000

4* ව්‍යාපාරය රුපියල් 5,000 කට භාණ්ඩ මුදලට අලෙවි කළ අතර, විකුණන ලද භාණ්ඩවල පිරිවැය රුපියල් 3,500 කි.

මෙම ගනුදෙනුවේ කොටස් දෙකක් තිබේ.

1. විකුණුම් වටිනාකම සටහන් කිරීම

2. විකුණුම් පිරිවැයේ වටිනාකම සටහන් කිරීම

විකුණුම් වටිනාකම සටහන් කිරීම

භාණ්ඩ විකුණන විට, මුදල් වැඩි වන අතර ආදායමක් ජනනය වේ.

මුදල් (හර) 5,000
විකුණුම් (බැර) 5,000

විකුණුම් පිරිවැය සටහන් කිරීම

ඒ සමගම, භාණ්ඩ විකුණා දැමීම නිසා භාණ්ඩ තොගයෙන් අඩු වන අතර, විකිණූ භාණ්ඩ වල තොග වටිනාකම විකුණුම් පිරිවැය ලෙස හඳුනාගත යුතුය. එබැවින්, විකුණුම් පිරිවැය ලෙස වෙනම ගිණුමක් හර කරනු ලැබේ.

විකුණුම් පිරිවැය (හර) 3,500
තොග (බැර) 3,500

වත්කම්	+	වියදම්	=	ආදායම්	+	වගකීම්	+	ප්‍රාග්ධනය
(මුදල්) වැඩි වේ				(විකුණුම්) වැඩි වේ				
(තොග) අඩු වේ		(විකුණුම් පිරිවැය) වැඩි වේ						

Asset(Cash) account

Dr			Cr
Sales	5,000		

Income (Sales) account

Dr			Cr
		Cash	5,000

(Asset) Inventory account

Dr			Cr
		COS	3,500

(Expense) Cost of Sales account

Dr			Cr
Inventory	3,500		

5* ව්‍යාපාරයට රු. 2,000 ක කුලිය ගෙවනලදී.

මෙම ගනුදෙනුවේදී, වියදම් (කුලිය) වැඩි වන අතර, වත්කම් (මුදල්) අඩු වේ.

කුලී වියදම (හර) රු. 2,000
මුදල් (බැර) රු. 2,000

වත්කම්	+	වියදම්	=	ආදායම්	+	වගකීම්	+	ප්‍රාග්ධනය
(මුදල්) අඩු වේ		(කුලී) වැඩි වේ						

Asset(Cash) account

Dr			Cr
		Rent	2,000

Expenses (Rent) account

Dr			Cr
Cash	2,000		

6* ව්‍යාපාරය රුපියල් 15,000 කට භාණ්ඩ ණයට විකුණන ලදී. විකුණන ලද භාණ්ඩවල පිරිවැය රුපියල් 10,500 කි.

මෙම ගනුදෙනුවේ කොටස් දෙකක් තිබේ. ඒ අනුව, බලපෑම් හතරකි.

විකුණුම් වටිනාකම සටහන් කිරීම

භාණ්ඩ ණයට විකුණන විට, ආදායමක් ජනනය වේ. නමුත් ව්‍යාපාරයට මුදල් නොලැබෙන අතර අනාගතයේදී ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. එබැවින්, ණයගැතියන් (ලැබිය යුතු ගිණුම්) ලෙස හඳුන්වන වත්කමක් නිර්මාණය වේ.

ණයගැතියන් (හර) 15,000
විකුණුම් (බැර) 15,000

විකුණුම් පිරිවැය වටිනාකම සටහන් කිරීම

භාණ්ඩ විකිණීම හේතුවෙන් භාණ්ඩ තොග අඩු වන අතර, විකුණන ලද භාණ්ඩවල තොග මිලෙන් විකුණුම් පිරිවැය වැඩි කළ යුතුය.

විකුණුම් පිරිවැය (හර) 10,500
තොග (බැර) 10,500

වත්කම්	+	වියදම්	=	ආදායම්	+	වගකීම්	+	ප්‍රාග්ධනය
(ණය ගැතියන්) වැඩි වේ				(විකුණුම්) වැඩි වේ				
(තොග) අඩු වේ		(විකුණුම් පිරිවැය) වැඩි වේ						

(Asset) Debtors (accounts receivable) account

Dr			Cr
Sales	15,000		

(Income) Sales account

Dr			Cr
		Debtors	15,000

(Asset) Inventory account

Dr			Cr
		COS	10,500

(Expense) Cost of Sales account

Dr			Cr
Inventory	10,500		

7* ව්‍යාපාරයට රු. 12,000ට භාණ්ඩ විකුණුම් ප්‍රතිලාභයක් ලැබුණි. මෙම භාණ්ඩ මුදල් පදනම මත විකුණන ලද අතර විකුණුම් පිරිවැය රු. 800 කි.

මෙම ගනුදෙනුව හරහා බලපෑම් හතරක් සිදු වේ. බලපෑම් දෙකක් විකුණුම් වටිනාකමින් සිදුවන අතර අනෙත් බලපෑම් දෙක විකුණුම් පිරිවැයට සිදු වේ.

පළමුව, ආදායම අඩු වන අතර මුදල් ආපසු ලබා දෙනු ලැබේ (විකුණුම් ආපසු පැමිණෙන බැවින්). ඒ අනුව, විකුණුම් ආපසු එවුම් ගිණුම ආපසු එවූ විකුණුම් වටිනාකමෙන් හර කරනු ලබන අතර, මුදල් ගිණුම බැර කරනු ලැබේ.

විකුණුම් ආපසු එවුම් ගිණුම (හර) 1,200
මුදල් ගිණුම (බැර) 1,200

ඉන්පසු, භාණ්ඩ ආපසු ලැබෙන බැවින් තොග ගිණුම වැඩි කළ යුතුය. එමෙන්ම, විකුණුම් පිරිවැය ද අඩු කළ යුතුය. ඒ අනුව, ආපසු ලබා දුන් භාණ්ඩවල තොග මිල තොග ගිණුමට හර කරනු ලබන අතර, විකුණුම් පිරිවැය ගිණුම බැර කරනු ලැබේ.

තොග ගිණුම් (හර) 800
විකුණුම් පිරිවැය ගිණුම (බැර) 800

වත්කම්	+	වියදම්	=	ආදායම්	+	වගකීම්	+	ප්‍රාග්ධනය
(මුදල්) අඩු වේ 1200				(විකුණුම්) අඩු වේ 1200				
(තොග) වැඩි වේ 800		විකුණුම් පිරිවැය) අඩු වේ 800						

(Income) Sales Returns account

Dr			Cr
Cash	1,200		

(Assets) Cash Account

Dr			Cr
		Sales Returns	1,200

(Asset) Stock account

Dr			Cr
COS	800		

(Expenses) COS account

Dr			Cr
		Stock	800

8* ධනංජය ව්‍යාපාරයේ මුදල් ලාච්චුවෙන් රුපියල් 2,500ක් පුද්ගලික භාවිතය සඳහා ලබා ගත්තේය.

මෙම ගනුදෙනුවේදී මුදල් (වත්කම්) සහ ප්‍රාග්ධනය (හිමිකරුගේ ගැනිලි වැඩි වීම නිසා) අඩු වේ.

ගැනිලි (හර) 2,500
මුදල් (බැර) 2,500

වත්කම්	+	වියදම්	=	ආදායම්	+	වගකීම්	+	ප්‍රාග්ධනය
(මුදල්) අඩු වේ 2,500								(ගැනිලි) අඩු වේ 2,500

(Asset) Cash account

Dr		Cr	
		Drawings	2,500

(Capital) Drawings account

Dr		Cr	
Cash	2,500		

9* ව්‍යාපාරය රු. 50,000 ක බැංකු ණයක් ලබා ගත්තේය

මෙම ගනුදෙනුවේදී මුදල් (වත්කම්) සහ වගකීම් (බැංකු ණය) වැඩි වේ.

මුදල් (හර) 50,000
බැංකු ණය (බැර) 50,000

වත්කම්	+	වියදම්	=	ආදායම්	+	වගකීම්	+	ප්‍රාග්ධනය
(මුදල්) වැඩි වේ 50,000						(බැංකු ණය) වැඩි වේ 50,000		

(Asset) Cash account

Dr		Cr	
Bank loan	50,000		

(Liability) Bank loan account

Dr		Cr	
		Cash	50,000

10* ව්‍යාපාරය රුපියල් 50,000 ක මුදලකට ගොඩනැගිල්ලක් මිලදී ගත්තේය.

මෙම ගනුදෙනුවේදී, ගොඩනැගිල්ලක් නම් වත්කම වැඩි වන අතර මුදල් නම් වත්කම අඩු වේ.

ගොඩනැගිලි (හර) 50,000
මුදල් (බැර) 50,000

වත්කම්	+	වියදම්	=	ආදායම්	+	වගකීම්	+	ප්‍රාග්ධනය
(මුදල්) අඩු වේ 50,000 (ගොඩනැගිලි) වැඩි වේ 50,000.								

(Asset) Cash account

Dr		Cr	
		Buildings	50,000

(Asset) Buildings account

Dr		Cr	
Cash	50,000		

11* ගොඩනැගිල්ල කුලියට දීමෙන් ව්‍යාපාරයට රුපියල් 10,000 ක කුලී ආදායමක් ලැබුණි.

මෙම ගනුදෙනුවේදී, මුදල් සහ කුලී ආදායම යන දෙකම වැඩි වේ.

මුදල් (හර) 10,000
කුලී ආදායම (බැර) 10,000

වත්කම්	+	වියදම්	=	ආදායම්	+	වගකීම්	+	ප්‍රාග්ධනය
(මුදල්) අඩු වේ 50,000 (ගොඩනැගිලි) වැඩි වේ 50,000.				(කුලී ආදායම) වැඩි වේ 10,000				

(Asset) Cash account

Dr		Cr	
Rent	10,000		

(Income) Rent Income account

Dr		Cr	
		Cash	10,000

ලෙජර් ගිණුම් තුලනය කිරීම

ගිණුම්කරණ කාලපරිච්ඡේදයක් අවසානයේදී, එක් එක් ලෙජර් ගිණුමේ සාරාංශය හෝ අවසන් ශේෂය ලබා ගත යුතුය. පළමුව, ගිණුමේ සියලු□ම හර සහ සියලු□ම බැර එකතු කළ යුතුය. මුළු හර, මුළු බැර ඉක්මවා ගියහොත්, ගිණුමේ හර ශේෂයක් ඇති බව කියනු ලැබේ. බැර එකතුව, හර එකතුව ඉක්මවා ගියහොත්, ගිණුමට බැර ශේෂයක් ඇත. ලෙජර් ගිණුම්වල ඇත්තේ එක සටහනක් පමණක් නම්, එම ගිණුමේ ශේෂය ගැනෙන්නේ එම සටහනේ අගයයි.

ලෙජර් ගිණුමක් තුලනය කරන ආකාරය පහත උදාහරණයෙන් දැක්වේ.

මුදල් ගිණුම

ඩර			කර
:1* ප්‍රාග්ධනය	100,000	:2* ගෘහ භාණ්ඩ	25,000
:4* ප්‍රාග්ධනය	5,000	:5* කුලී වියදම්	2,000
:5* බැංකු ණය	50,000	:7* විකුණුම් ප්‍රතිලාභ	1,200
:11* කුලී ආදායම	10,000	:8* ගැනිලි	2,500
		:10* ගොඩනැගිලි	50,000
		පහළට ගෙනා ශේෂය	84,300
	165,000		165,000
ඉදිරියට ගෙනා ශේෂය	84,300		

සියලුම ලෙජර් ගිණුම් තුලනය කළ පසු, ශේෂ පත්‍රය සකස් කිරීමෙන් ලේජර ගිණුම් සටහන් වල ගණිතමය නිරවද්‍යතාවය පරීක්ෂා කළ හැකිය. එය සමාගමේ ලෙජර් ගිණුම් ශේෂ ලැයිස්තුවකි. ශේෂ පත්‍රයේ ආකෘතිය පහත පරිදි වේ.

202ඪ දෙසැම්බර් 31 වන දිනට ශේෂ පත්‍රය

ගිණුමේ නම	හර	බැර
වත්කම් ගිණුම්	ooo	
වියදම් ගිණුම්	oo	
වගකීම් ගිණුම්		ඕං
ආදායම් ගිණුම්		ooo
(හිමිකම්) ප්‍රාග්ධන ගිණුම්		ooo
	ooo	ooo

ශේෂ පත්‍රයේ හර සහ බැර තීරු වල එකතු සමාන වන විට, ලේජර ගිණුම් සටහන් ගණිතමය වශයෙන් නිවැරදි බව අපට නිගමනය කළ හැකිය. ඉන්පසු, අවසන් තොග ගණනය කිරීම, ගෙවිය යුතු සහ කලින් ගෙවූ වියදම්, දෝෂ නිවැරදි කිරීම, ස්ථාවර වත්කම් ක්ෂය කිරීම සහ වෙනත් වෙන්කිරීම් වැනි ගිණුම්කරණ ගැලපීම් සිදු කල යුතුය.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම

ගණකාධිකාරිවරු විසින් මූල්‍ය ප්‍රකාශන ලෙස හැඳින්වෙන අවසන් ගිණුම් ප්‍රකාශ පිළියෙළ කරනු ලබයි. මේ සඳහා, භාවිත කරනු ලබන්නේ පොදු ලෙජරයේ ඇති ගිණුම්වල ශේෂයන්, නැතිනම් ශේෂ පත්‍රයයි.

පහත දැක්වෙන්නේ, එසේ සකස් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනයි.

1. ආදායම් ප්‍රකාශය - වසරක් තුළ ආදායම් හා වියදම් සහ වසර අවසානයේ ව්‍යාපාරයේ ශුද්ධ ලාභය පෙන්වයි.

2. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය - වසර අවසානයේ ව්‍යාපාරයේ හිමිකරුගේ ප්‍රාග්ධනය ඇතුළුව වත්කම් සහ වගකීම්වල වටිනාකම පෙන්වයි.

3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය - වසර තුළ බැංකුවේ මුදල්, මෙහෙයුම්, ආයෝජන සහ මූල්‍ය කටයුතු ඇතුළුව ව්‍යාපාරය එහි මුදල් කළමනාකරණය කළ ආකාරය පෙන්වයි.

4. අයිතිකරුවන්ගේ හිමිකම්වල වෙනස්වීම් ප්‍රකාශය (සමාගම්වලට පමණක් අදාළ වේ) - වසර තුළ ව්‍යාපාරයේ හිමිකරුවන්ගේ ප්‍රාග ්ධනය, සංචිත සහ ශුද්ධ ලාභය වෙනස් වූ ආකාරය පෙන්වයි.

2007 අංක 07 දරන සමාගම් පනතට අනුව, සියලු ම සමාගම් ස්වාධීන විගණකවරයෙකු විසින් ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශන විගණනය කළ යුතුය. විගණනය මඟින් මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු වල විශ්වසනීයත්වය වැඩි වන අතර කොටස් හිමියන්ගේ සහ අනෙකුත් ආයෝජකයින්ගේ විශ්වාසය වැඩි වේ. කෙසේ වෙතත්, තනි හිමිකාරත්වයන් සහ හවුල්කාරිත්වයන් සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම අනිවාර්ය නොවේ.

ආදායම් ප්‍රකාශනයක සහ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ (ශේෂ පත්‍රය) ආකෘතිය පහත දැක්වේ.

අවසන් වූ කාල පරිච්ඡේදය සඳහා ආදායම් ප්‍රකාශය oooooo

	රු. 000
ආදායම	98,000
විකිණුම් පිරිවැය	(73,500)
දළ ලාභය	24,500
මෙහෙයුම් පිරිවැය	(17,150)
මෙහෙයුම් ලාභය	7,350
මූල්‍ය පිරිවැය	(1,400)
බදු ගෙවීමට පෙර ලාභය	5,950
ආදායම් බදු	(1,750)
වසර සඳහා ලාභය	4,200

දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය ooooooo

	රු. 000	රු. 000
වත්කම්		
ජංගම නොවන වත්කම්		
දේපල සහ ගොඩනැගිලි සවිකිරීම්		53,550
ජංගම වත්කම්		
තොගය	17,850	
බැංකු ශේෂය	1,750	19,600
මුළු වත්කම්		73,150
හිමිකම් සහ වගකීම්		
ප්‍රාග්ධනය (හෝ කොටස් ප්‍රාග ්ධනය)		46,550
ජංගම නොවන වගකීම්		
දිගු කාලීන ණය		14,000
ජංගම වගකීම්		
වෙළඳ ණය හිමියෝ	9,450	
ගෙවිය යුතු බදු	3,150	12,600
මුළු හිමිකම් සහ වගකීම්		73,150

4.8. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අවදානම් කළමනාකරණය සහ ව්‍යාපාර සුරක්ෂිතභාවය

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිරන්තරයෙන් අවදානම් වලට නිරාවරණය වේ. මෙම අවදානම් විසින් ව්‍යාපාරයේ දෛනික මෙහෙයුම් වලට සෘජුවම බලපෑම් ඇති කල හැක. එම බලපෑම් නිසා ව්‍යාපාරයේ ආදායම අඩු වීමට හෝ වියදම් වැඩි වීමට ඉඩ ඇති අතර, අවසානයේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය හැකිය. ව්‍යාපාරය අසාර්ථක වී කඩා වැටීමට තරම් සමහර අවදානම් තත්වයන් දරුණු විය හැකිය.

බොහෝ ව්‍යාපාර හිමිකරුවන් රක්ෂණය මගින් ඇතැම් අවදානම් ආවරණය කළ හැකි බව දනිති. කෙසේ වෙතත්, ඕනෑම ව්‍යාපාරයක් බොහෝ අනතුරු සහ අවදානම් වලට මුහුණ දෙන අතර, ඒවායින් ඇතැම් අවදානම් සම්පූර්ණයෙන්ම නොසලකා හරිනු ලැබේ. සෑම ව්‍යාපාරයක්ම කළමනාකරණය නොකරන ලද අවදානම් වලින් සිදුවිය හැකි පාඩු වලට යටත් වේ. හොඳ අවදානම් කළමනාකරණයක් විසින් නිශ්චිත සිදුවීමක් සිදුවීමේ සම්භාවිතාව අඩු කරනු ඇත. ඒ අනුව, හොඳ අවදානම් කළමනාකරණයක් මගින් අවදානම්වල බලපෑම අඩු කර ව්‍යාපාරයේ ධනය ආරක්ෂා කිරීමට උපකාරී වනු ඇත.

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ඵලදායී අවදානම් කළමනාකරණ උපාය මාර්ගයක් ගොඩ නැගීම සඳහා ගතයුතු පියවර:

1) ඕනෑම ව්‍යාපාරයක පළමු පියවර වන්නේ ව්‍යාපාර කටයුතු වලට බාධා ඇතිකරන හෝ අලාභ ඇති කරනු ලබන මූල්‍ය අවදානම්, මෙහෙයුම් අවදානම්, කීර්තිනාමයට හානි ඇති වීමේ අවදානම්, අනුකූල නොවීමේ අවදානම්, ස්වාභාවික ආපදා අවදානම් සහ ව්‍යාපාරික අවදානම් හඳුනා ගැනීමයි.

2) ව්‍යාපාරය අනාගතයේ ඇතිවිය හැකි අවදානම් හඳුනාගත් පසු, ඒවා ඇති වීමේ සම්භාවිතාව සහ එම අවදානම් නිසා ව්‍යාපාරයට ඇතිවිය හැකි බලපෑම විශ්ලේෂණය කළ යුතුය.

   සම්භාවිතාව යනු කිසියම් අවදානමක් සිදුවීමට ඇති හැකියාවයි. එය අවම, මධ්‍යස්ථ හෝ ඉහළ සම්භාවිතාවක් විය හැකිය.

   බලපෑම යනු අවධානම විසින් ව්‍යාපාරයට අනාගතයේදී ඇති කළ හැකි හානියයි. බලපෑමද අවම, මධ්‍යස්ථ හෝ ඉහළ මට්ටම් වලින් විය හැකි අතර රුපියල් වටිනාකමින් මනිනු ලැබේ.

   ඉහත පරාමිතීන් මත පදනම්ව, ව්‍යාපාරයකට අවදානම් අනුකෘතියක් (රසින ජ්වරසං) සකස් කළ හැකිය. මෙම අනුකෘතිය ව්‍යාපාරයට තීරණාත්මක අවදානම් හඳුනා ගැනීමට උපකාරී වනු ඇත.

3) අවදානම් අනුකෘතිය මත පදනම්ව, ව්‍යාපාරය තුල වඩාත්ම සිදු වීමට ඉඩ ඇති සහ වැඩිම හානියක් සිදු විය හැකි අවදානම සැලකිල්ලට ගත යුතුය.

4) අවදානම් සඳහා ප්‍රතිචාර දැක්වීමේ සැලැස්මක් සකස් කරන්න. ඒ අනුව, සියලු□ම ඉහළ ප්‍රමුඛතා අවදානම් සඳහා හදිසි සැලසුම් සහ ක්‍රියා පටිපාටි සකස් කළ යුතුය. එවැනි අවදානම් වෙනුවෙන් පැහැදිලි වගකිව යුත්තන් පත් කිරීම මගින් කළමනාකරණය කර ගත යුතුය. එමෙන්ම, ව්‍යාපාරය විසින් එම අවදානම් වලට මුහුණ දීමේ සැලසුම් ව්‍යාපාරයේ හිමිකරුවන් ඇතුළු උනන්දුවක් දක්වන පාර්ශ්වයන් වෙත සන්නිවේදනය කළ යුතුය.ග

   අවදානම් හැසිරවීම සඳහා වඩාත් පොදු උපාය මාර්ග වනුයේ,

   වැළැක්ම: අනවශ්‍ය අවදානම් ඇති කරන ක්‍රියාකාරකම් ව්‍යාපාරයෙන් ඉවත් කරන්න.

   අඩු කිරීම: අවදානම් වල සම්භාවිතාව හෝ බලපෑම අවම කිරීම සඳහා ආරක්ෂක විධිවිධාන ක්‍රියාත්මක කරන්න.

   මාරු කිරීම: රක්ෂණය හෝ හවුල්කාරිත්වයන් හරහා අවදානම මාරු කරන්න.

   පිළිගැනීම: අවදානම කළමනාකරණය කිරීමට සූදානම් වන්න (අඩු බලපෑම් අවදානම් හඳුනා ගන්න)

5) නිරීක්ෂණය කර සමාලෝචනය කරන්න

   අවදානම් කළමනාකරණය යනු අඛණ්ඩ ක්‍රියාවලියකි. නිශ්චිත අවසානයක් නොමැති ක්‍රියාවලියකි. ව්‍යාපාර පරිසරය වෙනස් වන විට, අවදානම් ද ඒ ඒ ආකාරයෙන් වෙනස් විය හැකිය. එබැවින්, ව්‍යාපාර තම අවදානම් කළමනාකරණ සැලසුම් සමීපව නිරීක්ෂණය කර සමාලෝචනය කළ යුතුය.

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා රක්ෂණයේ ප්‍රතිලාභ

අවදානම් ප්‍රතිචාර උපාය මාර්ගයක් ලෙස, ව්‍යාපාරයට තම අවදානම තෙවන පාර්ශවයකට මාරු කිරීම රක්ෂණය භාවිතයෙන් කළ හැකි ආකාරය මීට පෙර පරිච්ඡේදයේදී විස්තර කෙරිණි. අවදානම් වලින් ව්‍යාපාරය ආරක්ෂා කර ගැනීමට ඇති වැදගත්ම ක්‍රමයක් නම් ප්‍රමාණවත් රක්ෂනාවරනයක් ලබා ගැනීමයි. රක්ෂණාවරනයක් මගින් ආවරණය කළ යුතු අවදානම්ද සහ ව්‍යාපාරයට හෝ එහි හිමිකරුවන්ට පාලනය කළ හැකි අවදානම්ද වෙන වෙනම හඳුනා ගත යුතුය.ග

පහත වගුවේ දැක්වෙන්නේ විවිධ රක්ෂණාවරණ වර්ග සහ ඒවායින් ආවරණය කරනු ලබන අවදානම්ය.

රක්ෂණ වර්ගය	ආවරණය කරන දේ
දේපල රක්ෂණය	ගොඩනැගිලි, තොග සහ උපකරණ වැනි භෞතික වත්කම්.
ව්‍යාපාර බාධා කිරීම්	ගිනි, ගංවතුර හෝ ස්වාභාවික විපත් වැනි සිදුවීම් හේතුවෙන් අහිමි වූ ආදායම.
සේවක වන්දි	සේවක හානි හෝ වෘත්තීය රෝග.
වෘත්තීය වගකීම	වෘත්තීය සේවාවන්හි වැරදි හෝ නොසැලකිල්ල.
සයිබර් වගකීම	සයිබර් ප්‍රහාර, දත්ත කඩ කිරීම්.
නිෂ්පාදන වගකීම	දෝෂ සහිත හෝ හානිකර නිෂ්පාදන නිසා සිදුවන හානි
වාහන රක්ෂණය	ව්‍යාපාරික අරමුණු සඳහා භාවිතා කරන වාහන.
පුද්ගල රක්ෂණය	ප්‍රධාන සේවකයෙකුගේ හෝ හිමිකරුවෙකුගේ මරණය හෝ අකර්මණ්‍යතාවය හේතුවෙන් සිදුවන මූල්‍යමය පාඩුව.

රක්ෂණකරුවෙකු තෝරා ගැනීමේදී, ව්‍යාපාරය විසින් බොහෝ සාධක සලකා බැලිය යුතුය. පළමුව, ඔවුන් රක්ෂණ ආවරණයක් අවශ්‍යවන අවදානම් හඳුනාගත යුතුය. ඉන්පසු, ඔවුන් ප්‍රදේශයේ රක්ෂණ සමාගම් (ෂබ්මර්බජ සෑටමක්චිදරහ ඤපපසිසදබ දශ්රස ඩිබන්) සමඟ සාකච්ඡා කර මුදලට වටිනාකමක් ලබා දෙන නිවැරදි රක්ෂණය තෝරා ගත යුතුය. තවද, හිමිකම් පෑමේදී අනපේක්ෂිත තත්වයන් වළක්වා ගැනීම සඳහා ව්‍යාපාරයට ආවරණ සීමාවන්, ආවරණය නොවන දේ, සහ හානියකදී වන්දි අඩු කිරීම් වැනි කාරණා සමාලෝචනය කිරීමට අවශ්‍ය වේ. අවසාන වශයෙන්, ව්‍යාපාරයේ වර්ධනය වන අවශ්‍යතා සපුරාලීම සඳහා රක්ෂණ ආවරණයද වාර්ෂිකව නැවත පරීක්ෂා කළ යුතුය.

5 වන පරිච්ඡේදය

ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාවය

5.1 හැඳින්වීම

ඉගෙනුම් අරමුණ

- ගෙවීම් මාධ්‍යයක් ලෙස ඩිජිටල් මූල්‍යකරණය භාවිතා කිරීමේ පහසුව තේරුම් ගැනීම.
- ඩිජිටල් ගෙවීම් භාවිතා කිරීමේ ජාතික වැදගත්කම තේරුම් ගැනීම.
- ඩිජිටල් මූල්‍ය සේවාවල සියලු්ම පවතින ක්‍රම හඳුනා ගැනීම.
- ආරක්ෂා සහිතව ඩිජිටල් මූල්‍ය සේවා භාවිතා කරන ආකාරය හඳුනා ගැනීම.
- නිතිපතා ගනුදෙනු සඳහා විවිධ ආකාරයේ ඩිජිටල් මූල්‍ය සේවා භාවිතා කිරීම.

ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාවය

ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාවය යනු, ඩිජිටල් භාවිතයන්හිදී මුහුණ දීමට සිදුවන සයිබර් ආරක්ෂාව (ජහඉැර්‍ැජමරසඑහ) සහ දත්ත පෞද්ගලිකත්වය (ඊ්‍ී චරසඩ්ජහ) වැනි ගැටළු පිළිබඳව දැනුවත්ව වෙමින් මූල්‍ය නිෂ්පාදන සහ සේවා ලබා ගැනීමට, කළමනාකරණය කිරීමට සහ දැනුවත්භාවයෙන් යුතුව තීරණ ගැනීම සඳහා ඩිජිටල් වේදිකා(ාසටසඒක චක්චදෙරපි), ඩිජිටල් මෙවලම්(ාසටසඒක එදදකි) සහ ඩිජිටල් තාක්ෂණයන් කාර්යක්ෂමව භාවිතා කිරීමේ හැකියාවයි. මූල්‍ය මූලධර්ම තේරුම් ගැනීම සඳහා ඩිජිටල් කුසලතා ඒකාබද්ධ කිරීමෙන් එය මූල්‍ය යහපැවැත්ම සහ සියලු පාර්ශවයන්ට ප්‍රවේශය සහිත ඩිජිටල් ආර්ථිකයක් ඇති කරනු ලබයි.

ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාවය, ඩිජිටල් සාක්ෂරතාවයේ සහ මූල්‍ය සාක්ෂරතාවයේ එකතුවක් ලෙස තේරුම් ගත හැකිය. ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාවය අත්පත් කරගැනීම තුළින්:

- ඩිජිටල් මූල්‍ය මෙවලම් සහ වේදිකා (ාසටසඒක එදදකි) චක්චදෙරපි) භාවිතා කිරීමේ හැකියාව
- දැනුවත් මූල්‍ය තීරණ ගැනීමේ හැකියාව
- ඩිජිටල් අවදානම් (උදා: වංචා, සයිබර් ආරක්ෂාව) තේරුම් ගෙන ඒවා අවම කර ගැනීමේ හැකියාව ලැබේ.

රත්නායක පවුල උදෑසන ආහාරය ගනිමින් සිටියදී පහත සංවාදයට එළඹුණහ.





තවත් බොහෝ පවුල්වල මෙවැනි සංවාද සිදුවිය හැකිය. විශේෂයෙන් වැඩිහිටි හා තරුණ පරම්පරාවන් අතර ඩිජිටල් සාක්ෂරතා පරතරයක් පවතියි. බොහෝ විට දෙමාපියන් ඩිජිටල් මූල්‍ය මෙවලම් භාවිතා කිරීමට මැලි වන්නේ, ඒවායේ ක්‍රියාකාරීත්වය සහ ආරක්ෂක විශේෂාංග පිළිබඳ හුරුපුරුදුකමක් නොමැතිකම සහ ඒවායේ ප්‍රතිලාභ පිළිබඳ නොදැනුවත්භාවය නිසාය.

ගෙවීම්, ඉතිරිකිරීම් සහ වියදම් වාර්තා තබා ගැනීම සඳහා තරුණ පරම්පරාව ඩිජිටල් මෙවලම් (ˆසටසඒක චඪදකි) සහ යෙදුම් (ˆචචි) භාවිතා කිරීම බහුලව දක්නට ලැබේ. තාක්ෂණය පිළිබඳ දන්නා පුද්ගලයින් ලෙස, ඔවුන්ට වැඩිහිටියන්ව ඩිජිටල් භාවිතය පිළිබඳව දැනුවත් කළ හැකිය. එලෙස, නිසි මග පෙන්වීම සහ විශ්වාසය ගොඩනැගීම තුලින්, පැරණි පරම්පරාවන්ටද ක්‍රමයෙන් ඩිජිටල් මූල්‍ය මෙවලම් භාවිතා කිරීමේ හැකියාව ලැබෙනු ඇත.

ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාවයේ ප්‍රතිලාභ

- පහසුවෙන් සහ ඉක්මනින් ගෙවීම් කිරීමේ හැකියාව.
- කාලය සහ මුදල් ඉතිරි වීම.
- අයවැය සකස් කිරීම මඟින් පහසුවෙන් වියදම් කළමනාකරණය කර ගැනීම.
- සත්‍යාපන (ˆමචියැබචිසප්චිසදබ) සහිත ආරක්ෂිත යෙදුම් භාවිතා කිරීම.
- ස්වයංක්‍රීය ඉතුරුම් සිදු කිරීමේ හැකියාව.

5.2 ඩිජිටල් මූල්‍ය සේවා

ඉගෙනුම් අරමුණු

- බැංකුකරණයේ ඩිජිටල් පරිවර්තනය පිළිබඳව අවබෝධය ලබා ගැනීම.
- ඩිජිටල් බැංකුකරණය නිර්වචනය කිරීම
- විවිධ ඩිජිටල් බැංකුකරණ ක්‍රම අවබෝධ කර ගැනීම
- මාර්ගගත බැංකු ගිණුම් විවෘත කිරීම සහ කළමනාකරණය කිරීම අවබෝධ කර ගැනීම.
- ඩිජිටල් බැංකුකරණයේ වාසි අවබෝධ කර ගැනීම
- ඩිජිටල් ගෙවීම් නිර්වචනය කිරීම
- විවිධ වර්ගයේ ඩිජිටල් ගෙවීම් පද්ධති හඳුනා ගැනීම
- ජනප්‍රිය ඩිජිටල් ගෙවීම් ක්‍රම සහ ඩිජිටල් නිෂ්පාදන (digital products) අවබෝධ කර ගැනීම
- අරමුදල් රැස් කිරීමේදී ඩිජිටල් ආයෝජන මෙවලම්වල කාර්යභාරය අවබෝධ කර ගැනීම.
- ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳාම සහ අන්‍යෝන්‍ය අරමුදල්(පමචිම්ක මෙඛ්‍රි) සඳහා ඩිජිටල් වේදිකා (digital platforms) හඳුනා ගැනීම.
- නවීන මූල්‍ය පද්ධතිවල බ්ලොක්චේන් (blockchain) සහ ගුප්ත ව්‍යවහාර මුදල් (ජරහචචිදජමරරුබජසිි) ක්‍රියා කරන ආකාරය හඳුනා ගැනීම.
- ඩිජිටල් ආයෝජන මෙවලම් සමඟ සම්බන්ධ ප්‍රතිලාභ සහ අවදානම් ඇගයීම.

ඩිජිටල් මූල්‍ය සේවා

ඩිජිටල් මූල්‍ය සේවා යනු ජංගම දුරකථන, පරිගණක සහ අනෙකුත් ඩිජිටල් උපාංග ඇතුළු ඩිජිටල් දුරස්ථ ක්‍රම හරහා ලබා දෙන සහ ලබා ගත හැකි වන ගෙවීම්, ඉතිරිකිරීම්, ණය, රක්ෂණ සහ ආයෝජන වැනි පුළුල් පරාසයක මූල්‍ය සේවාවන් ය. එම සේවාවන් සැමට මූල්‍ය සේවා ලබා ගැනීමේ මූලික අඩිතාලම් ලෙස ලෝකය පුරාම පිළිගැනේ.

ඩිජිටල් මූල්‍ය සේවා සහ සාම්ප්‍රදායික මූල්‍ය සේවා අතර වෙනස

ඩිජිටල් මූල්‍ය සේවා මගින්, ගනුදෙනුවක් සඳහා කාසි හා නෝට්ටු වලින් ගෙවීම හෝ බැංකු කටයුතු සඳහා බැංකු ශාඛාවකට යාම වැනි භෞතික ප්‍රවේශය වලක්වන බැවින් සාම්ප්‍රදායික මූල්‍ය සේවාවන්ට වඩා වැඩි වාසි ලබා දෙයි.

සාම්ප්‍රදායිකව, මුදලින් ගෙවීමක් කිරීමේදී, ගැනුම්කරුට එය කාසි හා නෝට්ටු වලින් අදාළ වටිනාකම විකුණුම්කරුට ලබා දීමට සිදු වේ. එවිට, එක් තැනකින් තවත් තැනකට ගමන් කිරීමට සිදු වන අතර, ඒ සඳහා ගමන් වියදම් දැරීමට සිදු වීමත්, සොරසතුරු අවදානමට ලක්වීමත්, ඒ සඳහා ඔවුන්ගේ කාලය වැය කිරීමටත් සිදු වේ.

ගෝලීයකරණයේ වර්තමාන ස්වභාවය සහ ඉහළ යන ඩිජිටල්කරණය හේතුවෙන්, බොහෝ සාම්ප්‍රදායික මූල්‍ය සේවාවන් තාක්ෂණය මත පදනම් වූ ඩිජිටල් මූල්‍ය සේවාවන් බවට පරිවර්තනය වී ඇත.

සාම්ප්‍රදායික මූල්‍ය සේවා	ඩිජිටල් මූල්‍ය සේවා
භෞතිකව පිහිටා ඇති බැංකු	ජංගම බැංකුකරණය
සාම්ප්‍රදායික ණය	තාක්ෂණය මත පදනම් වූ ණය දීමේ වේදිකා
සාම්ප්‍රදායික මුදල්	ඩිජිටල් මුදල්
කාසි හා නෝට්ටු මගින් ගෙවීම්	ඩිජිටල් ගෙවීම් සහ මුදල් හුවමාරු
භෞතික මුදල් පසුම්බි	ඩිජිටල් පසුම්බි
මූල්‍ය උපදේශකයින් සමග මුහුණට මුහුණ හමුවීම	රොබෝ-උපදේශකයින් මඟින් උපදෙස් ගැනීම

ඩිජිටල් මූල්‍ය සේවාවන්හි වැදගත්කම

ණය සහ බැංකුකරණය වැනි මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශ වීම සහ විශේෂයෙන් කාන්තාවන් සහ තරුණයින් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමට උපකාර කිරීමේදී ඩිජිටල් මූල්‍ය සේවාවන් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි. ඔබට විධිමත් මූල්‍ය සේවා භාවිතා කිරීමට හැකියාවක් නොමැති නම් හෝ ඔබ මූල්‍යමය වශයෙන් සේවයක් නොලැබූ කෙනෙක් නම්, ඔබ "ඌන මූල්‍ය සේවාලාභියෙකු" ලෙස සලකනු ලැබේ. ශ්‍රී ලංකාවේ, බොහෝ දෙනෙකුට මූල්‍ය සේවා වෙත ප්‍රවේශ වීම සඳහා භාවිතා කළ හැකි ජංගම දුරකථන තමන් සතුව තිබේ. එහෙත්, බොහෝ පුද්ගලයින් තමා සතුව ඇති තාක්ෂණික මෙවලම් (දුරකථන, ලැප්ටොප් හෝ ස්මාර්ට් ඔරලෝසු වැනි) මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශ වීම සඳහා භාවිතා නොකරයි.

ඔබ සතුව ඇති ඩිජිටල් මෙවලම් මගින් පහත සඳහන් කාර්යයන් සිදු කර ගත හැක.

- මුදල් යැවීම හෝ ලැබීම
- බිල්පත් ගෙවීම
- ජංගම ගෙවීම් (පදඉසකැ ඒහපැබඑ) කිරීම
- වියදම් පුරුදු (වැබාසබට ය්ඉසඑ) පරීක්ෂා කිරීම
- ණය තත්වගත කිරීම (ජරුාසඑ ර්එසබට)
- ආයෝජන පිළිබඳ උපදෙස් ලබා ගැනීම

ඉහත පහසුකම් සඳහා යොමු නොවීමේ ප්‍රධාන හේතුව වන්නේ බොහෝ දෙනෙකුට තාක්ෂණය හා මූල්‍ය කටයුතු පිළිබඳ දැනුම හා කුසලතා නොමැති වීමයි. මෙම දැනුම නොමැතිකම නිසා ඔවුන් ආර්ථික වර්ධනයේ ඵල නෙලා ගැනීමට අපොහොසත් වේ.

ඉතා පහසුම ක්‍රමය නම් ඔබේ ඩිජිටල් මූල්‍ය උපාංග භාවිතා කර මූල්‍ය සේවා සමඟ සම්බන්ධ වීම වන අතර එමඟින් නිල ආයතන හරහා ඔබේ මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සරළ සහ පහසු වේ.

විවිධ ඩිජිටල් මූල්‍ය සේවා

අපගේ දෛනික පුද්ගලික සහ ව්‍යාපාර මූල්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම් වලදී ඩිජිටල් මූල්‍ය සේවා පහත සඳහන් ආකාරවලින් අපට සහාය වේ.1ග "මඑදප්එා ඔැකකැර ඒජයසබෘ :ඔඑ*

1. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ඔඑ)
2. ඩිජිටල් බැංකුකරණය
3. ඩිජිටල් ගෙවීම්
4. ඩිජිටල් මුදල් වර්ග
5. ඩිජිටල් ආයෝජන මෙවලම්

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් යනු විවිධ මූල්‍ය සේවා සැපයීම සඳහා ඔබේ බැංකු ගිණුම සමඟ අන්තර් ක්‍රියා කරන පරිගණකගත උපාංග යකි.

"ඔඑ ලෙස පොදුවේ හැඳින්වෙන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය නූතන සමාජයේ ලොව පුරාම ප්‍රචලිතව පවතින අතර, පුද්ගලයන්ට ඔවුන්ගේ අරමුදල් සහ විවිධ මූල්‍ය සේවාවන් සඳහා පැය විසිහතර පුරාම ප්‍රවේශය ලබා දෙයි.

අනුෂා සහ ගෝතමී සාප්පු සවාරියක
යෙදී සිටිති.

ගෝතමී : අපි මුලින්ම මගේ සපත්තු දෙක අරන් ඉමු.

අනුෂා : ඊට කලින් අපි බැංකුවට ගිහින් සල්ලි ගන්න ඕන.

ගෝතමී : අම්මා, ඇයි ඔයා ඒටීඑම් කාඩ් එකක් ගන්නේ නැත්තේ?

අනුෂා : ඒවා ගන්නකොට තව අමතර ගානක් කැපෙනවනේ.

ගෝතමී : හරි. දැන්, අම්මා මට මේක කියන්නකෝ. එක සැරයක් ATM එකෙන් සල්ලි ගන්නවට ගෙවන ගානයි, බැංකුවට යන්න බස් එකට ගෙවන ගානයි ගත්තම, කොයි එකද වැඩි?

ඉහත සංවාදයෙන් පෙනී යන්නේ, ඒටීඑම් සේවා භාවිතා කිරීමේ පිරිවැය සහ ප්‍රතිලාභ විශ්ලේෂණය කිරීමේදී පුද්ගලයින් තුල පවතින ඌන මූල්‍ය සාක්ෂරතාවයයි.

ඒටීඑම් යන්ත්‍ර භාවිතා කිරීමේ ප්‍රතිලාභ

1. පැය 24 පුරාම ලබා ගැනීමේ හැකියාව: ATM යන්ත්‍ර මගින් ඕනෑම වේලාවක බැංකු සේවා සඳහා ප්‍රවේශය ලබා දෙන අතර, හදිසියකදී වුවද මුදල් ආපසු ගැනීම පහසු කරයි.

2. ගෝලීය ප්‍රවේශය සහ පහසුව: ATM යන්ත්‍ර බොහෝ ප්‍රදේශවල ඇති අතර එමගින් ජනතාවට පහසුවෙන් සේවා ලබා ගැනීමට ඉඩ සලසයි.

3. අවම බැංකු පෝලිම්: ATM යන්ත්‍ර විසින් භෞතික බැංකු ශාඛාවල දිගු පෝලිම්වල රැඳී සිටීමේ අවශ්‍යතාවය අඩු කිරීමට උපකාරී වේ.

4. අනෙකුත් බැංකු සේවා සඳහා ප්‍රවේශය: ATM යන්ත්‍ර භාවිතයෙන් ශේෂ විමසීම් සහ උපයෝගිතා ගෙවීම් ඇතුළුව මුදල් ආපසු ගැනීම් සහ අනෙකුත් බැංකු සේවා සඳහා පහසුකම් සපයනු ලබයි.

ඒටීඑම් යන්ත්‍රයක් හරහා බැංකු සේවාවන් ලබා ගන්නේ කෙසේද?

පියවර 1: ATM කාඩ්පත ඇතුළු කරන්න

පියවර 2: භාෂාවක් තෝරන්න

පියවර 3: ඔබේ ඉලක්කම් 4 ATM පුද්ගලික හැඳුනුම් අංකය (ජ්ඡභ අංකය) එක ඇතුළත් කරන්න

පියවර 4: සේවා වර්ගය තෝරන්න:

- මුදල් ආපසු ගැනීම
- බහු ලැයිස්තුගත ගිණුමක් සඳහා මුදල් ආපසු ගැනීම
- ප්‍රකාශන
- ශේෂ විමසුම
- මාරු කිරීම
- වෙනත් කාඩ්පතකට මාරු කිරීම
- වේගවත් මුදල්
- පුද්ගලික හැඳුනුම් අංකය වෙනස් කිරීම
- පුද්ගලික හැඳුනුම් අංකය අවහිරය ඉවත් කිරීම

පියවර 5: ගිණුම් වර්ගය තෝරන්න

පියවර 6: ආපසු ගැනීමට අවශ්‍ය මුදල ඇතුළත් කරන්න (ඔබට මුදල් ලබා ගැනීමට අවශ්‍ය නම්)

පියවර 7: මුදල් එකතු කරන්න

පියවර 8: අවශ්‍ය නම් මුද්‍රිත රිසිට්පතක් ගන්න

පියවර 9: කාඩ්පත ගන්න

*මෙම පියවර බැංකුවෙන් බැංකුවට සහ ඒටීඑම් යන්ත්‍රයෙන් යන්ත්‍රයට තරමක් වෙනස් විය හැකිය

ATM යන්ත්‍ර ආරක්ෂිතව භාවිතා කිරීම සඳහා උපදෙස්

- ඔබගේ ජ්ඡභ අංකය ආරක්ෂා කරන්න: ඔබගේ පුද්ගලික හැඳුනුම් අංකය (ජ්ඡභ) රහසිගතව තබා ගන්න, එය කිසිවෙකු සමඟ කිසි විටෙකත් බෙදා නොගන්න.

- ʼඔඑ යන්ත්‍රය පරීක්ෂා කරන්න: ʼඔඑ යන්ත්‍රයක් භාවිතා කිරීමට පෙර, කාඩ්පත් තොරතුරු සොරකම් කිරීමට භාවිතා කළ හැකි අසාමාන්‍ය උපාංග (ස්කිමිං උපාංග) එයට සම්බන්ධ කර තිබේදැයි පරීක්ෂා කරන්න.
- ආරක්ෂිත ස්ථානය: හොඳින් ආලෝකමත් සහ කාර්යබහුල ප්‍රදේශවල ʼඔඑ යන්ත්‍ර භාවිතා කරන්න. ඉතා හදිසි අවස්ථාවකදී හැර, හුදකලා ස්ථානවල තනි ʼඔඑ යන්ත්‍ර භාවිතයෙන් වළකින්න.
- යතුරු පුවරුව ආවරණය කරන්න: අන් අයට නොපෙනන සේ ඔබේ ඡෂභ අංකය එයට ඇතුළු කරන විට හැකි අයුරින් එය ආවරණය කරන්න.
- ʼඔඑ භාවිතා කිරීමට ආගන්තුකයන්ගෙන් උදව් ලබා නොගන්න
- නැතිවූ ʼඔඑ කාඩ්පත්, වංචා හෝ වෙනත් හදිසි/උදව් වලදී වහාම බැංකුව අමතන්න.

ඩිජිටල් බැංකුකරණය

වර්තමානයේදී, බැංකු මඟින් සපයන සේවා විශාල ඩිජිටල් පරිවර්තනයකට භාජනය වී ඇත. ඒ අනුව, බැංකු විසින් මූල්‍ය සේවා ලබා දෙන ආකාරය සහ පාරිභෝගිකයින් විසින් එම සේවාවන් ලබා ගන්නා ආකාරය නවතම හැඩයකින් සිදු වෙමින් පවතී. මෙම ඩිජිටල් විප්ලවයේ ප්‍රධාන හේතුවක් වන්නේ, වඩාත් පුද්ගලානුබද්ධ (personalized) සහ ඕනෑම අවස්ථාවක භාවිතා කළ හැකි මූල්‍ය සේවා (on-the-go financial serviceඑ) සඳහා ඇති ඉල්ලුම වැඩි වීමයි. විශේෂයෙන්ම, නව පරම්පරාවන් ඔවුන්ගේ වෙනස්වන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වේගවත් සහ දියුණු බැංකු සේවාවන් අපේක්ෂා කරනු ලබයි.

ඩිජිටල් බැංකුකරණය යනු විද්‍යුත් වේදිකා හරහා සාම්ප්‍රදායික බැංකු සේවා ලබා දීමේ ක්‍රියාවලියයි. එමඟින් ගනුදෙනුකරුවන්ට භෞතික ශාඛාවකට යාමකින් තොරව මූල්‍ය නිෂ්පාදන සහ සේවාවන් මාර්ගගතව ලබා ගැනීමට හැකියාව ලැබේ.

රත්නායක පවුල එක සවස් වරුවක පහත සංවාදයේ යෙදුණා.





මෙම පවුලේ සංවාදය විසින් ඩිජිටල් බැංකුකරණය පිළිබඳව බොහෝ දෙනෙකු තුල තවමත් පවතින නොදැනුවත්භාවය සහ ඒ පිළිබඳව වැඩෙන කුතුහලය ඉස්මතු කර පෙන්වනු ලබයි.

Benefits of using ATMs

ඩිජිටල් බැංකුකරණයට විවිධ කාණ්ඩ ඇතුළත් වේ; එනම් මාර්ගගත බැංකුකරණය(දබකසබැ ඉ්බනසබට) සහ ජංගම බැංකුකරණය (පදඉසකැ ඉ්බනසබට) යි. තවද, විවිධ ඩිජිටල් නාලිකා ඒකාබද්ධ කිරීමෙන් (සබඑැටර්එසබට ඩ්රසදම් ාසටසඒක ජය්බබැකි) ඔබට බැංකුවකට භෞතිකව පිවිසීමෙන් තොරව සහ කඩදාසි චෙක්පත්, තැන්පතු රිසිට්පත් හරහා ගනුදෙනු සිදු නොකර, ඕනෑම දිනෙක, ඕනෑම වෙලාවක බැංකුව විසින් සපයනු ලබන මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශ වීමට ඉඩ සලසයි. බැංකු විසින් සපයනු ලබන සේවාවන් සැපයීම සඳහා ජංගම යෙදුම් (පදඉසකැ ්චච) භාවිතා කිරීමට පටන් ගැනීමත් සමඟ ජංගම බැංකුකරණයේ සිදු වූ සංවර්ධනය ඩිජිටල් බැංකුකරණයේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස සැලකේ.

ඩිජිටල් බැංකුකරණයේ පරිණාමයත් සමඟ, මාර්ගගත බැංකු ගිණුම් පිහිටුවීම සහ කළමනාකරණය කිරීම ඕනෑම පුද්ගලයෙකුට හෝ ව්‍යාපාරයකට මඟ හැරිය නොහැකි කුසලතාවක් බවට පත්ව ඇත. මාර්ගගත බැංකුකරණය පහසුව ලබාදෙන අතර ඔබේ පරිහරණය හෝ ජංගම දුරකතනය හරහා ඕනෑම වේලාවක ඕනෑම තැනක සිට බැංකු සේවා වෙත ප්‍රවේශ වීමට ඔබට අවස්ථාව සලසයි.

ඩිජිටල් බැංකුකරණයේදී, ණශක (නබදඅ හදමර ජම්එදපැර :ඔබේ ගනුදෙනුකරු හඳුනාගන්න) යනු බැංකු සහ මූල්‍ය ආයතන ගිණුම් විවෘත කිරීමට හෝ මූල්‍ය සේවාවන් ලබා ගැනීමට පෙර ගනුදෙනුකරුවන්ගේ අනන්‍යතාවය සත්‍යාපනය කරන ක්‍රියාවලියකි. මුදල් වංචා, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වැනි වෙනත් නීති විරෝධී ක්‍රියාකාරකම් ඒ හරහා වළක්වා ගත හැකිය.

ඩිජිටල් බැංකුකරණයේ ණශක හි ප්‍රධාන අංග

- අනන්‍යතා සත්‍යාපනය: ගනුදෙනුකරුවන් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා නිල හැඳුනුම්පත් ලේඛන (උදා: ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය) ලබා දිය යුතුය.
- ලිපින සත්‍යාපනය: විදුලි/ජල බිල්පත් හෝ බැංකු ප්‍රකාශන වැනි ස්ථිර පදිංචිය පිළිබඳ සාක්ෂි අවශ්‍ය විය හැකිය.
- ජෛවමිතික සත්‍යාපනය: ඇතැම් බැංකු ගනුදෙනුකරුවන් සත්‍යාපනය කිරීම සඳහා මුහුණු හඳුනාගැනීම, ඇඟිලි සලකුණු පරීක්ෂා කිරීම හෝ අක්ෂි (සරසි) හඳුනාගැනීම භාවිතා කිරීම වැනි ශාරීරික අංගයන් මඟින් ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමේ ක්‍රම භාවිතා කරයි.
- මුදල් විශුද්ධිකරණය(පදබැහ ක්මබාැරසබට) වැළැක්වීමේ නීති සමග අනුකූල වීම: ගනුදෙනුකරුවන් මුදල් විශුද්ධිකරණයට හෝ වෙනත් මූල්‍ය අපරාධවලට සම්බන්ධ නොවන බව සහතික කර ගැනීම මෙහිදී සිදු වෙයි.
- අඛණ්ඩ අධීක්ෂණය: සැක සහිත ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සඳහා බැංකු ගනුදෙනු සහ පාරිභෝගික හැසිරීම අඛණ්ඩව නිරීක්ෂණය කෙරෙයි.

ඩිජිටල් බැංකුකරණයේ ප්‍රතිලාභ

- ගනුදෙනු ඉතිහාසය (එර්බ්ජචසදබ යසිචදරහ) දැනගැනීමේ හැකියාව: තැන්පතු, මුදල් ආපසු ගැනීම්, මාරු කිරීම් සහ ගෙවීම් ඇතුළුව සියලු􏰀ම ගනුදෙනු මාර්ගගත ගිණුම් මගින් වාර්තා කෙරේ.
- මාර්ගගත ගනුදෙනු (දබකසබැ එර්බ්ජචසදබ) සිදු කිරීම: පවුලේ අයට, මිතුරන්ට හෝ වෙනත් පුද්ගලයින්ට ගෙවීම් හෝ අරමුදල් හුවමාරු කර ගැනීම් ක්ෂණයකින් කරගත හැකිවීම. සෑම ගනුදෙනුවක් සඳහාම, ලබා දෙන යොමු අංකය හරහා සෑම ගනුදෙනුවක්ම පසු විපරම් කිරීමේ හැකියාව ඇත.
- ගිණුම් ශේෂය (ජපදමබච ඉ්ක්බජැ) ඕනෑම මොහොතක දැන ගත හැකි වීම: ඔබේ ගිණුමේ ශේෂය ඔබ විසින් සිදු කරනු ලැබූ ගනුදෙනු සමග සමාන වන බව ඕනෑම මොහොතකදී දැන ගත හැකි වීම.

ඔබේ අනුදැනුමකින් තොරව යම් ගනුදෙනුවක් ඔබේ බැංකු ගිණුම හරහා සිදු වී ඇත්නම්, ඒ පිළිබඳව ක්ෂණිකව දැනුවත් වීමේ හැකියාව ලැබේ.

- බිල්පත් ගෙවීම සහ වෙනත් ග්‍රාහක මුදල් ගෙවීම ක්ෂණයකින් සිදු කිරීමේ හැකියාව ලැබේ.

අන්තර්ජාල බැංකු ගිණුමක් විවෘත කිරීමට අනුග මනය කළ යුතු පියවර:

1. ඔබේ අවශ්‍යතා සපුරාලන බැංකුවක් තෝරා ගත යුතුය.
2. අදාළ බැංකුවේ නිලධාරියෙකු හරහා මාර්ගගත බැංකු ගිණුමක් විවෘත කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි බැංකුව වෙත ඉදිරිපත් කරන්න. (පුද්ගලික හැඳුනුම්පත් ලේඛන සහ ගිණුම් විවෘත කිරීමේ අයදුම්පත)
3. නව ගිණුමට මුදල් තැන්පත් කර ගිණුම සක්‍රීය කරගන්න. (බැංකු හුවමාරුවක් හෝ මුදල් තැන්පතු හරහා)
4. විද්‍යුත් තැපෑල හෝ කෙටි පණිවුඩ දැනුම්දීම් හරහා දැනුවත් වීම් සලසා ගන්න: ගිණුම් හිමියාට සිදුවන ගනුදෙනු සහ හිඟ ශේෂයන්, විශාල ගනුදෙනු හෝ නියමිත ගෙවීම් දිනයන් වැනි තොරතුරු බැංකුව විසින් ඔබට ලබා දෙනු ලැබේ. ඒ ආකාරයෙන් ඔබේ ගිණුම හරහා සිදුවන සියලු􏰀ම ගනුදෙනු පිළිබඳව ඔබව දැනුවත් වන බැවින් ඔබගේ මාර්ගගත ගිණුමේ ආරක්ෂාව සහතික කර ගත හැක.
5. ඔබගේ ගිණුමට පිවිසීමට පහසු සහ වේගවත් බැංකු සේවාවක් භුක්ති විඳීමට හැකි උපාංගයක් (ස්මාර්ට් දුරකථනය, ඕනෑම පරිගණකයක් හෝ ටැබ්ලටයක්) භාවිතා කරන්න.

මාර්ගගත ගිණුමක් ආරම්භ කල පසු, එහි ප්‍රතිලාභ උපරිම කර ගැනීම සඳහා එය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම ඉතා වැදගත් වේ.

ඔබ ජංගම දුරකථනයක් හෝ ටැබ්ලටයක් භාවිතා කරන්නේ නම්, ඔබේ බැංකුව විසින් සපයන ලද විශේෂිත ජංගම යෙදුම (පදඉසකෑ ඉ්ඛනසඛට "චච) බාගත කළ හැකි අතර ඒ හරහා ඉතා පහසුවෙන් සේවාවන් ලබාගත හැකිවනු ඇත.

බැංකු වෙබ් පිවිසුම් /යෙදුම් සහ ජංගම ගෙවීම් යෙදුම්

බැංකු වෙබ් පිවිසුම් /යෙදුම් යනු බැංකු විසින් සපයනු ලබන මාර්ගගත වේදිකා වන අතර එමඟින් තම ගනුදෙනුකරුවන්ට ඕනෑම ස්ථානයක සිට, ඕනෑම මොහොතක ඉතා පහසුවෙන් පුළුල් පරාසයක බැංකු කටයුතු සිදු කිරීමට ඉඩ සැලසේ. තවද, ජංගම ගෙවීම් යෙදුම් යනු පරිශීලකයින්ට තම ජංගම උපාංග භාවිතයෙන් මූල්‍ය ගනුදෙනු කිරීමට හැකි වන පරිදි ස්මාර්ට් දුරකථන වල ස්ථාපනය කර ඇති යෙදුම් වේ.

රත්නායක පවුල සවස් වරුවක පහත සංවාදයට එළඹින.

මෙම පවුලේ සංවාදය විසින් ඕනෑම කෙනෙකුට බැංකු වෙබ් පිවිසුම් /යෙදුම් (ඇලු වදරචීකි/චච) සහ ජංගම ගෙවීම් යෙදුම් (පදඉසකෑ චීහපැබච් 'චච) පිළිබඳ වැඩෙන කුතුහලය ඉස්මතු කරනු ලබයි. එමෙන්ම, එම ක්‍රියාවලීන් සහ ප්‍රතිලාභ පිළිබඳව තවමත් බොහෝ දෙනෙකුට ඇති නොදැනුවත්භාවයද පිළිබිඹු කරයි. ජංගම ගෙවීම් යෙදුම් සාමාන්‍යයෙන් බැංකුව විසින් සපයනු ලබන යෙදුම් වන අතර ඒවා සධ් (චචකැ) සහ 'බාරදසා යන උපාංග වර්ග දෙකටම අදාළව වෙන වෙනම සකසා ඇත. ඒ අනුව ගනුදෙනුකරුවන්ට තම සතු ජංගම උපාංගයේ වර්ගය අනුව අදාළ බැංකු වෙබ් පිවිසුම් /යෙදුම් සහ ජංගම ගෙවීම් යෙදුම් බාගත කරගත හැකිය. එමඟින්, වේගවත් සුව පහසු බැංකුකරණයක අත්දැකීම් ලබා ගත හැකි වනු ඇත.

ඔබගේ ජංගම දුරකථනයේ බැංකු යෙදුම හෝ ජංගම ගෙවීම් යෙදුම සැකසීමට පියවර:

1. Apple App Store හෝ Google Play Store වෙතින් නිල බැංකු/ගෙවීම් යෙදුම බාගත කරගන්න.

2. ඔබ නව පරිශීලකයෙකු නම් ලියාපදිංචි වන්න. ඔබ දැනටමත් මාර්ගගත බැංකුකරණය සඳහා ලියාපදිංචි වී ඇත්නම් ඔවුන්ගේ පරිශීලක නාමය (username) සහ මුරපදය (password) භාවිතා කර යෙදුමට ඇතුල් වන්න.

3. බැංකුවේ ඔබේ ගනුදෙනුකරු තහවුරු කරගැනීම (KYC) සඳහා ඔබේ අනන්‍යතාවය තහවුරු කිරීමට බැංකුවට ප්‍රශ්න කිහිපයක් අසන්නට පුළුවන.

4. ප්‍රවේශය සුරක්ෂිත කිරීමට සහ ජෛවමිතික සත්‍යාපනය හෝ බහු-සාධක සත්‍යාපනය (Multi-Factor Authentication) සක්‍රීය කිරීමට ඡඕභ (පුද්ගලික හැඳුනුම් අංකය) එකක් හෝ මුරපදයක් සාදන්න. (Justpay යෙදුම්වලට මුදල් පසුම්බි නොමැත - බැංකු ගිණුමකට සෘජුවම සම්බන්ධ කර ඇත)

5. බැංකු සහ මූල්‍ය සමාගම් වල ගෙවීම් යෙදුම්වලට මුදල් පසුම්බි (Payment apps by banks and finance companies will have wallets) හෝ ගිණුම් විවෘත කිරීමේ පහසුකම් ඇත..

ජංගම යෙදුමක් බාගත කරගෙන එහි ලියාපදිංචි වූ පසු එහි ප්‍රතිලාභ උපරිම කර ගැනීම සඳහා එය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම ඉතා වැදගත් වේ.

බැංකු යෙදුමක හෝ ජංගම ගෙවීම් යෙදුමක ප්‍රතිලාභ

- ගනුදෙනු ඉතිහාසය බැලීමට හැකි වීම.
- අරමුදල් මාරු කිරීම් සහ බිල්පත් ගෙවීම් සිදු කිරීමට හැකි වීම.
- ගිණුම් ශේෂය බැලීමට හැකි වීම.
- ස්ථාවර සහ ඉතුරුම් තැන්පතු ගිණුම් විවෘත කිරීමට හැකි වීම.
- පසුගිය මාසික ගිණුම් ප්‍රකාශන වෙත ප්‍රවේශ වීමේ හැකියාව.
- පාරිභෝගික ගැටළු සඳහා මාර්ගගත පාරිභෝගික සහාය ලබා ගැනීමට හැකි වීම.

ජංගම ගෙවීම් යෙදුම් පහසුව සලසන අතර බැංකුවට භෞතිකව පිවිසීමෙන් තොරව අන්තර්ජාල සම්බන්ධතාවයක් ඇති ඕනෑම තැනක සිට ඔබේ ගිණුම 24/7 කළමනාකරණය කිරීමට ඔබට ඉඩ සලසයි. තවද බිල්පත් ගෙවීම්, අරමුදල් මාරු කිරීම සහ චෙක්පත් තැන්පතු වැනි ගනුදෙනු පවා ශාඛාවකට හෝ 'ඔඑ යන්ත්‍ර වෙත පිවිසීමෙන් සිදුවන ප්‍රමාදයකින් තොරව ඉක්මණින් සිදු කරගත හැකිය.

ඩිජිටල් ගෙවීම්

ඩිජිටල් ගෙවීම් යනු භෞතික මුදල් හුවමාරු නොකර ඩිජිටල් නාලිකා හරහා ඉලෙක්ට්‍රොනිකව සිදු කරන ගනුදෙනු ය. එනම්, අරමුදල් මාරු කිරීම, වෙළඳ ගෙවීම්, රජයේ ගෙවීම් වැනි ගනුදෙනු සඳහා ජංගම යෙදුම් (mobile apps) සහ වෙබ් අඩවි වැනි ඩිජිටල් නාලිකා හරහා මුදල් ප්‍රේෂණය කිරීමයි. ඩිජිටල් ගෙවීම් මගින් පුද්ගලයන් සහ ව්‍යාපාර ගනුදෙනු කරන ආකාරය වෙනස් වෙමින් ඇති අතර, වඩා වේගවත්, පහසු සහ ආරක්ෂා සහිත සේවයක් ලබා දෙයි.

ඩිජිටල් ගෙවීම් ක්‍රම

1. ගෙවීම් කාඩ්පත්

ගෙවීම් කාඩ්පත් (ඕඑ/ ණය/ හර/ ගබඩා කළ වටිනාකම් කාඩ්පත්) මගින් කාඩ්පත් හිමියන්ට කාඩ්පතට සම්බන්ධ කර ඇති තම ගිණුමට හෝ කාඩ්පතේ ගබඩා කර ඇති වටිනාකමේ ප්‍රමාණයට මුදල් ලබා ගැනීමට හෝ භාණ්ඩ හා සේවා සඳහා ගෙවීම් කිරීමට හැකියාව ලැබේ.

2. අන්තර්ජාල බැංකුකරණය

ජංගම දුරකථන සහ පරිගණක වැනි විවිධ උපාංග හරහා අන්තර්ජාලය භාවිතයෙන් ගෙවීම් සහ අනෙකුත් බැංකු ගනුදෙනු සිදු කිරීමට හැකියාව ලබා දෙයි.

3. ජංගම ගෙවීම් යෙදුම් (Mobile apps)

මෙය ජංගම උපාංගයක් මත ක්‍රියාත්මක කළ හැකි මෘදුකාංග යෙදුමක් වන අතර එමඟින් උපයෝගිතා බිල්පත්, අරමුදල් මාරු කිරීම් සහ අනෙකුත් බැංකු ගනුදෙනු සඳහා ගෙවීම් කිරීමට හැකියාව ලැබේ.

4. QR කේතය

ජංගම යෙදුමක් (mobile app) භාවිතයෙන් QR කේතයක් පරිලෝකනය කිරීමෙන් (scan) ගනුදෙනු ආරම්භ කෙරේ.

5. ජංගම දුරකථන පාදක විද්‍යුත් මුදල්

ජංගම දුරකථන පාදක විද්‍යුත් මුදල් පද්ධතිවල ලියාපදිංචි ගනුදෙනුකරුවන්ට විද්‍යුත් මුදල් නියෝජිතයාට ගෙවීමෙන් ජංගම දුරකථන පාදක විද්‍යුත් මුදල් මිලදී ගත හැකි අතර, එය ගෙවීමේ මාධ්‍යයක් ලෙස භාවිතා කළ හැකිය.

6. විකුණුම් ස්ථානය - QR සහ කාඩ්පත්

විකුණුම් ස්ථානය (POS) පද්ධති යනු පාරිභෝගික ගනුදෙනු සැකසීම සඳහා වෙළෙන්දන් විසින් භාවිතා කරන උපාංග වේ. QR කේත සහ කාඩ්පත් ඇතුළු විවිධ ක්‍රම හරහා ඔවුන්ට ගෙවීම් පිළිගත හැකිය.

7. රජයේ ගෙවීම්

රජයේ ගෙවීම් යනු විවිධ සේවා, බදු, රේගු බදු, දඩ සහ වෙනත් බැඳීම් සඳහා රජයේ ආයතන වෙත කරන ගනුදෙනු ය. මෙම ගෙවීම් මාර්ගගත පිවිසුම්, බැංකු ගිණුම්, ඨෑඩඍෂ සහ ඕබන්ඡහ මාර්ගගත ගෙවීම් වේදිකාව (බඡධඡෂ) ඇතුළු බහුවිධ නාලිකා හරහා සිදු කළ හැකිය.

8. ගෙවීම් හුවමාරු නාමය (PEN)

LankaPay මාර්ගගත ගෙවීම් වේදිකාවේ මෙම විශේෂාංගය පරිශීලකයින්ට ඔවුන්ගේ ජංගම දුරකථන අංකවලට සෘජුවම ගෙවීම් කිරීමට ඉඩ සලසයි. පරිශීලකයින්ට ඔවුන්ගේ බැංකු ගිණුම සඳහා පුද්ගලාරෝපිත අන්වර්ථ නාමයක් නිර්මාණය කළ හැකි මෙන්ම, ගෙවන්නා සමඟ ජංගම ගෙවීම් ලබා දිය හැකි අතර බාධාවකින් තොරව ගෙවීම් ද සිදු කළ හැකිය.

9. ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS)

මෙම ගෙවීම් සහ පියවීම් පද්ධතිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලැබේ. එය බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන අතර අරමුදල් තත්කාලීනව මාරු කිරීමට (real-time transfers) පහසුකම් සපයයි. වැටුප් වැනි සමුච්චිත මුදල් මාරු කිරීම් (bulk transfers) සිදු කිරීමට ආයතන විසින් SLIPS භාවිතා කරයි.

10. නම්ච්ජ්හ වෙබ්

මෙය ඞබන්ජ්හ විසින් සංවර්ධනය කරන ලද මාර්ගගත ගෙවීම් වේදිකාවක් වන අතර එය බාධාවකින් තොරව සහ ආරක්ෂිත ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම සඳහා නිර්මාණය කර ඇත. නම්ච්ජ්හ හරහා, පරිශීලකයින්ට ඕනෑම බැංකු ගිණුමක්, බැංකු හුවමාරුවක් හෝ ඞ්හණ්ෟසෘ සම්බන්ධ කිරීමෙන් තෙවන පාර්ශවීය යෙදුමක් (third-party app) හරහා ගෙවීම් සිදු කළ හැකිය.

11. Payme

ඞබන්ජ්හ විසින් සංවර්ධනය කරන ලද මෙම නව්‍ය ගෙවීම් විසඳුම ගනුදෙනු සරල කිරීමට සහ සුරක්ෂිත කිරීමට නිර්මාණය කර ඇත. මෙමගින් පරිශීලකයින්ට තමන් කැමති යෙදුම හරහා ක්ෂණිකව ගෙවීම් කිරීමට භාවිතා කළ හැකි ගෙවීම් සබැඳි යැවීමට ඉඩ සලසයි.

12. LANKA QR

ශ්‍රී ලංකාවේ, ඞ්හණ්ෟසෘ යනු දේශීය ගෙවීම් සඳහා ජාතික ප්‍රමිතියයි. ඕනෑම ඞ්හණ්ෟසෘ සහතික කළ ජංගම ගෙවීම් යෙදුමක් බාගත කිරීමෙන්, ඕනෑම පුද්ගලයෙකුට ඕනෑම බැංකුවක ඇති ජංගම ගිණුමක්/ඉතුරුම් ගිණුමක් සම්බන්ධ කිරීමෙන් ඞ්හණ්ෟසෘ කේතයක් ප්‍රදර්ශනය කර ඇති වෙළෙන්දෙකුට ගෙවිය හැකිය.

නම්ච්ජ්හ සහ ඞ්හණ්ෟසෘ අන්තර් ක්‍රියාකාරී වේ. එබැවින්, පරිශීලකයින්ට ඕනෑම යෙදුමක් භාවිතා කළ හැකි අතර ඔවුන්ගේ බැංකුව සහ සත්‍යාපනය සම්බන්ධ කළ හැකිය.

LANKA QR හි ප්‍රතිලාභ

1. වෙළෙන්දා සඳහා විශේෂ උපකරණ අවශ්‍ය නොවේ - පාරිභෝගිකයා සඳහා පමණක් ස්මාර්ට් ජංගම දුරකතනයක් අවශ්‍ය වේ. අරමුදල් ලැබුණු විට SMS දැනුම්දීමක් ලබා ගැනීමට අවශ්‍ය වෙළඳුන්ට කිසියම් දුරකථනයක් භාවිතා කළ හැකිය.
2. පාරිභෝගිකයාට වැඩි පහසුවක් - මුදල්/කාඩ්පත් රැගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැත. ජංගම දුරකථනයක් පමණක් අවශ්‍ය වේ.
3. ඉක්මන් සහ භාවිතා කිරීමේ පහසුව.
4. කාඩ්පත් ගෙවීම් හා සසඳන විට වෙළෙන්දාට අඩු පිරිවැයකින් ගනුදෙනුව සම්පූර්ණ කළ හැක.

රත්නායක පවුල සවස් වරුවක පහත සංවාදයට එළඹිණ.

අනිල්: ගෝතමී, මම කඩවල්වල නිතරම දකින රටා සහිත ඒ කුඩා හතරැස් කොටු මොනවාද? සමහරු ඒවා ස්කෑන් කරනවා වගේ.

ගෝතමී: ආ, තාත්තේ, ඒවා ූසෘ ජදාැ. ඒවා ස්කෑන් කරලා ෆෝන් එකෙන් ගෙවීම් කරන්නයි, වෙන තොරතුරු ගන්නයි පුළුවන් ඉක්මන් ක්‍රමයක්.

අනුෂා: ඉතින්, සල්ලි ගෙනියන්නේ නැතිව, ඔය කොටු ස්කෑන් කරලා ගෙවන්න පුලුවන්ද? කොහොමද ඒක වෙන්නේ?

ගෝතමී: එක වෙන්නේ මෙහෙමයි. අම්මගේ ෆෝන් එකේ තියෙන ගෙවීම් යෙදුමක් විවෘත කරලා ූසෘ කේතය ස්කෑන් කරලා ඊට පස්සේ ගෙවන්න ඕන මුදල ඇතුළත් කරල, ගෙවීම තහවුරු කරන්න. එක හරිම ලේසියි.

අයෝධ්‍යා: ඒක නියමයි වගේ, QR කේත වලින් වෙන මොනවද කරන්න පුළුවන්?

ගෝතමී: ගොඩක් දේවල්. සමහර අවන්හල් වල මෙනු එක බලන්න වෙන්නේ ූසෘ ජදාැ එකක් ස්කෑන් කරලා. අවන්හල් වල මිල ගණන් පරීක්ෂා කරන්නත් පුළුවන්. එහෙම නැත්නම්, ආරක්ෂිත ඇප්ස් වලට ලොග් වෙන්නත් ඒවා පාවිච්චි කරනවා.

ධනංජය: මේකෙන් මගේ කඩේ වේලාව ගොඩාක් ඉතිරි කරගන්න පුළුවන්. මේක මගේ කඩේටත් පාවිච්චි කරන්න ඕන. මාත් ඉක්මනට හදා ගන්න ඕනූසෘ ජදාැ වලින් ගෙවීමේ පහසුකම.

ගෝතමී:	අනිවාර්යයෙන්ම, පාරිභෝගිකයන් කැමතියි ඒවලින් ගෙවන්න, ගොඩක් ඉක්මන් නිසා.
අයෝධ්‍යා:	අනේ, මට එක කරන්නනේ කොහොමද කියල බලන්න ඕන.
ගෝතමී:	හරි අපි ආයේ ෂොපින් ගියාමූ ඍ ජදාෟ එකකින් ගෙවමුකෝ.

මෙම පවුලේ සංවාදයූ ඍ කේත පිළිබඳ වැඩෙන කුතුහලය ඉස්මතු කරයි. නමුත් එය ක්‍රියාත්මක කරන ආකාරය සහ ඊට සම්බන්ධ ප්‍රතිලාභ පිළිබඳව තවමත් බොහෝ දෙනෙකුට ඇත්තේ අඩු දැනුමකි.

ක්ෂණික ප්‍රතිචාර (QR) කේතය මගින් ගෙවීම්

QR කේත මගින් ගෙවීමක් ආරම්භ කර සම්පූර්ණ කිරීම සඳහා යන්ත්‍රයකින් කියවිය හැකි ද්විමාන (two-dimensional) තීරු කේතයක් (QR කේතය) ස්කෑන් කිරීම සිදු වේ. QR කේතය විසින් ගෙවීම පිලිබඳ විස්තර, වෙළෙන්ඳා පිලිබඳ තොරතුරු හෝ ගෙවීම්දොරටුව වෙත ගෙනයන සබැඳිය (link to payment gateway) වැනි දත්ත ගබඩා කරනු ලැබේ. එය QR කේතය ගෙවීම් යෙදුමක් (payment app) භාවිතයෙන් ස්මාර්ට් දුරකථන කැමරාවක් මඟින් ස්කෑන් කළ හැකිය. QR කේත මඟින් ගෙවීම් කිරීමේදී භෞතික මුදල් හෝ කාඩ්පත් අවශ්‍යතාවයක් ඇති නොවේ. ගනුදෙනු බාධාවකින් තොරව සහ වේගවත්ව සම්පූර්ණ කර ගැනීමට ඔබට අවශ්‍ය වන්නේ ඔබේ ස්මාර්ට් දුරකථනය පමණි.

QR කේත වර්ග දෙකක් තිබේ

1. ස්ථිතික QR කේත: මෙම කේත ස්ථාවර වන අතර නිර්මාණය කිරීමෙන් පසු වෙනස් කළ නොහැක. ඒවා බොහෝ විට කුඩා සාප්පු හෝ කුටිවල නැවත නැවත ගනුදෙනු සඳහා භාවිතා කරයි. ඔබට ගෙවීමක් කිරීමට අවශ්‍ය නම්, ඔබට ගෙවීමට පෙර QR කේතය ස්කෑන් කර ගනුදෙනු මුදල අතින් ඇතුළත් කළ හැකිය.

2. ගතිකූ ඍ කේත: මෙම කේත සෑම ගනුදෙනුවක් සඳහාම අනන්‍ය වන (unique for each transaction) ලෙස ජනනය වන අතර නිශ්චිත ගෙවීම් විස්තර අඩංගු වේ. ගතිකූ ඍ කේත මඟින් වැඩි ආරක්ෂාවක් ගනුදෙනුව වෙත ලබාදෙන අතර ස්වයංක්‍රීයකරණය නිසා සිදුවිය හැකි දෝෂ අවම කරයි.

LANKAQR ගෙවීම් සඳහා අනුගමනය කළ යුතු පියවර

පාරිභෝගිකයා සඳහා:

1. ගෙවීම් යෙදුම (payment app) විවෘත කරන්න: LANKAQR කේත ගෙවීම් සඳහා සහය දක්වන ජංගම ගෙවීම් යෙදුමක් (payment app) විවෘත කරන්න.

2. QR කේතය පරිලෝකනය (scan) කරන්න: වෙළෙන්දා විසින් ලබාදෙන ඛ්හණ්‍ඍ කේතය ඔබගේ ජංගම දුරකතනයේ කැමරාව භාවිතයෙන් ස්කෑන් කරන්න.

3. ගෙවීම් විස්තර තහවුරු කරන්න: ජංගම යෙදුම (payment app) විසින් වෙළෙන්දාගේ නම සහ ගනුදෙනු මුදල ඇතුළුව ගෙවීම් තොරතුරු දුරකථන තිරයේ පෙන්වනු ලබයි. (ගතික QR කේතයක් භාවිතා කරන්නේ නම් සියලු තොරතුරු තිරයේ දිස්වන අතර, ස්ථිතික QR කේතයක් නම්, පාරිභෝගිකයා විසින් ගෙවනු ලබන මුදල ඇතුලත් කල යුතුය.)

4. ගෙවීම සම්පූර්ණ කරන්න: ඔබට ගෙවීම තහවුරු කිරීමට අවසර දෙන්න. බොහෝ විට ජෛවමිතික සත්‍යාපනය (ඇඟිලි සලකුණු හෝ මුහුණු හඳුනාගැනීම) හෝ ජ්‍ෂඟ එකක් භාවිතා කළ හැකිය.

5. තහවුරු කිරීම ලබා ගන්න: ගෙවීම සාර්ථක වූ බවට තහවුරු කිරීමක් දුරකථන තිරයේ දිස්වනු ඇත.

වෙළෙන්දා සඳහා

1. ඛ්හණ්‍ඍ කේතය ජනනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම: වෙළෙන්දෙකු ලෙස, ඔබට නැවත නැවත භාවිතා කළ හැකි ස්ථිතිකූ ඍ කේතයක් ප්‍රදර්ශනය කළ හැකිය. උදාහරණයක් ලෙස, පිටවීමේ දොරටුවේ හෝ මුදල් ගෙවන ස්ථානයේ මුද්‍රිත QR කේතය ප්‍රදර්ශනය කල හැක. එසේ නොමැතිනම්, එක් එක් නිශ්චිත ගනුදෙනුව සඳහා ගතිකූ ඍ කේතයක් ජනනය කර අදාළ පාරිභෝගිකයාට ලබා දිය හැකිය.

2. ස්කෑන් කර තහවුරු කරන්න: පාරිභෝගිකයා LANKAQR කේතය ස්කෑන් කර ගෙවීම් කළ පසු, ඔබට ඔවුන්ගේ ගෙවීම් පද්ධතියෙන් තහවුරු කිරීමේ දැනුම්දීමක් ලැබෙනු ඇත. ශ්‍රී ලංකාවේ, සියලුම ගෙවීම් QR LANKAQR ප්‍රමිතියට අනුකූල විය යුතුය. ඕනෑම LANKAQR සක්‍රීය යෙදුමකට ඕනෑම LANKAQR කේතයක් ස්කෑන් කළ හැකිය.

- QR කේත ඕනෑම ස්මාර්ට් ජංගම දුරකතනයකින් ස්කෑන් කළ හැකි අතර, එමගින් ගනුදෙනුකරුවන්ට සහ වෙළෙන්දන්ට QR කේත භාවිතා කිරීම ඉතාමත් පහසු වී ඇත.

- ගිණුමට අනවසර ප්‍රවේශය වැළැක්වීම සඳහා, ගෙවීම් යෙදුම් (payment app) මඟින් ගනුදෙනුකරුවන්ට ජ්‍ෂඟ, ජෛවමිතික (ඇඟිලි සලකුණු, මුහුණු හඳුනාගැනීම) හෝ එක් වරක් පමණක් භාවිතා කළ හැකි මුරපද (OTP) වැනි බහු-සාධක සත්‍යාපනය (multi-factor verification) භාවිතයෙන් ගනුදෙනු සත්‍යාපනය (verify) කිරීමට අවශ්‍ය වේ.

අනෙකුත් ජනප්‍රිය ඩිජිටල් ගෙවීම් ක්‍රම සහ නිෂ්පාදන

QR කේත ගෙවීම් වලට අමතරව, ගනුදෙනුකරුවන් සහ ව්‍යාපාර ගනුදෙනු පහසු කිරීම සඳහා තවත් ඩිජිටල් ගෙවීම් ක්‍රම කිහිපයක් භාවිතයේ පවතියි.

ජංගම මුදල් පසුම්බි	අන්තර්පුද්ගල (P2P) ගෙවීම්	දැන් මිලදී ගන්න, පසුව ගෙවන්න	ගෙවීම් කාඩ්පත්	සෘජු හර කිරීම
මෙම ජංගම මුදල් පසුම්බි මඟින් ඔබගේ ණය, හර සහ පෙරගෙවුම් කාඩ්පත් විස්තර ඔබගේ උපාංගවල ආරක්ෂිතව ගබඩා කිරීමට ඔබට ඉඩ සලසයි.	අන්තර් පුද්ගල (P2P) ගෙවීම් යනු බැංකු හෝ භෞතික මුදල් සම්බන්ධ නොවී ඩිජිටල් වේදිකාවක් (ඊමේල් ලිපිනය හෝ දුරකථන අංකය භාවිතයෙන්) හරහා පුද්ගලයින් දෙදෙනෙකු අතර මුදල් හුවමාරු කිරීමයි. (Peer to Peer)	BNPL සේවාවන් මඟින් ඔබට සාම්ප්‍රදායික ක්‍රෙඩිට් කාඩ්පත් අවශ්‍යතාවයකින් තොරව භාණ්ඩ හා සේවා වාරික වශයෙන් ගෙවීමේ පහසුකම යටතේ මිලදී ගැනීමට ඉඩ සලසනු ලබයි.	ගෙවීම් කාඩ්පත් (ණය කාඩ්පත්, හර කාඩ්පත්, පෙරගෙවුම් කාඩ්පත්, ආරෝපණ කාඩ්පත්) ඕනෑම දිනක ඕනෑම වේලාවක විකුණුම් සඳහා භාවිතා වන උපකරණ (POS) (සිල්ලර ස්ථානවල කාඩ්පත් ගෙවීම් සැකසීමට භාවිතා කරන ඉලෙක්ට්‍රොනික උපාංගයක්) සහ ATM යන්ත්‍රවලින් මුදල් ආපසු ගැනීම සඳහා භාවිතා කළ හැකිය.	මෙය පාරිභෝග කයෙකුගේ උපදෙස් පරිදි, තෙවන පාර්ශවයක මූල්‍ය ආයතනයක් (උදා: විදුලිබල මණ්ඩලය, ජල සම්පාදන මණ්ඩලය) විසින් විදුලි බිල්පත් පියවීම/ජල බිල්පත් පියවීම වැනි පුනරාවර්තන ගෙවීම් සඳහා පාරිභෝග කයාගේ ගිණුමෙන් යම් මුදල් ප්‍රමාණයක් ලබා ගන්නා පහසුකමකි. එහිදී, මුදල් හුවමාරුව පාරිභෝග කයා විසින් සිදු කරනු නොලබයි.
අනුකූල පර්යන්තවල ඔබගේ දුරකථනය / උපාංගය ළං කිරීමෙන් ඔබට සම්බන්ධතා රහිත ගෙවීම් කළ හැකි ය. උදා: තරසපස පජ්‍ිය (එදඉසඑැක විසින් බලගන්වනු ලැබේ), ezCash (ඍස්කදට විසින් බලගන්වනු ලැබේ), ඔබගේ ගිණුම් පවත්වාගෙන යනු ලබන බැංකුව විසින් හඳුන්වා දී ඇති ජංගම මුදල් පසුම්බි (mobile wallets) සොයා ගන්න.	බිල්පත් ගෙවීම් බෙදාගැනීම, මිතුරන්ට ගෙවීම හෝ කුඩා ව්‍යාපාර ගනුදෙනු කිරීම සඳහා වන ගෙවීම් සඳහා P2P ගෙවීම් ජනප්‍රිය වේ.	ඊහඡබ සේවාවන් මඟින් ඔබේ මිලදී ගැනීම් මාස දෙකක් තුළ පොලී රහිත වාරික තුනකට බෙදීමට ඔබට ඉඩ සලසයි. උදා: ණධණධ යෙදවුම්	ගෙවීම් කාඩ්පත් (ණය කාඩ්පත්, හර කාඩ්පත්, පෙරගෙවුම් කාඩ්පත්, ආරෝපණ කාඩ්පත්) ඕනෑම දිනක ඕනෑම වේලාවක විකුණුම් සඳහා භාවිතා වන උපකරණ (POS) (සිල්ලර ස්ථානවල කාඩ්පත් ගෙවීම් සැකසීමට භාවිතා කරන ඉලෙක්ට්‍රොනික උපාංගයක්) සහ ඕඑ යන්ත්‍රවලින් මුදල් ආපසු ගැනීම සඳහා භාවිතා කළ හැකිය.	මෙය පාරිභෝග කයෙකුගේ උපදෙස් පරිදි, තෙවන පාර්ශවයක මූල්‍ය ආයතනයක් (උදා: විදුලිබල මණ්ඩලය, ජල සම්පාදන මණ්ඩලය) විසින් විදුලි බිල්පත් පියවීම/ජල බිල්පත් පියවීම වැනි පුනරාවර්තන ගෙවීම් සඳහා පාරිභෝග කයාගේ ගිණුමෙන් යම් මුදල් ප්‍රමාණයක් ලබා ගන්නා පහසුකමකි. එහිදී, මුදල් හුවමාරුව පාරිභෝග කයා විසින් සිදු කරනු නොලබයි.
විදේශයන් හි ප්‍රචලිත යෙදුම් (Samsung" Apple" Google pay)	උදා : (CEFT" Justpay ඇතුළු ගෙවීම් යෙදවුම් ශ්‍රී ලංකාවේ අන්තර් පුද්ගල ගෙවීම් සඳහා පහසුකම් සපයනු ලබයි.		අන්තර්ජාලය හරහා භාණ්ඩ හෝ සේවා (online shops) මිලදී ගැනීමට ගෙවීම් කාඩ්පත් භාවිතා කළ හැකිය. උදා: ශ්‍රී ලංකාවේ බැංකු, වීසා මාස්ටර් කාඩ්. ඇමරිකන් සහ යුනියන් ඡ්හ වැනි ජාත්‍යන්තර කාඩ් පත් යටතේ ගෙවීම් කාඩ්පත් නිකුත් කරයි.	

ඩිජිටල් මුදල් වර්ග: ක්‍රිප්ටෝ මුදල් සහ බ්ලොක්චේන්

ඩිජිටල් මුදල් යනු ඩිජිටල් ආකාරයෙන් පවතින මූල්‍ය වත්කම් වන අතර ගනුදෙනු, ආයෝජන හෝ වෙනත් මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ හැකිය.

ඩිජිටල් මුදල් වර්ගවල උප කුලකයක් වන ක්‍රිප්ටෝ මුදල් යනු මහ බැංකුව වැනි මධ්‍යම අධිකාරීත්වයකින් තොරව ස්වාධීනව ක්‍රියාත්මක වන සංකේතනය හරහා සුරක්ෂිත කරන ලද ඩිජිටල් හෝ අතථ්‍ය (virtual) මුදල් වේ. මෙම විමධ්‍යගත ස්වභාවය ඒවා සාම්ප්‍රදායික මුදල් වර්ග වලින් වෙනස් වීමට හේතු වේ.

රත්නායක පවුල රූපවාහිනී ප්‍රවෘත්ති නරඹමින් සිටියදී පහත සංවාදයට එළඹුනහ.



මෙම සංවාදය ඩිජිටල් මුදල් සම්බන්ධයෙන් බොහෝ දෙනෙකුගේ කුතුහලය සහ පැහැදිලි දැනුමක් නොමැතිකම අවධාරණය කරයි. දැනුවත් තීරණ ගැනීමට පෙර ඩිජිටල් මුදල්වලට අදාළ තාක්ෂණය, අවදානම් සහ අවස්ථාවන් තේරුම් ගැනීම අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින්, ක්‍රිප්ටෝ මුදල් ලෙස පොදුවේ හඳුන්වන අතථ්‍ය මුදල් (ඪසරඑ්මක ක්මරරැඛපජහ) හා සම්බන්ධ අවදානම් පිළිබඳව නිරන්තරයෙන් මහජනතාවට අනතුරු අඟවා ඇත. මෙම ඩිජිටල් වත්කම් ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල ලෙස පිළි නොගන්නා අතර නියාමන ආරක්ෂණ ක්‍රම නොමැතිව ක්‍රියාත්මක වේ. ක්‍රිප්ටෝ මුදල් යනු කිසිඳු මූල්‍ය අධිකාරීත්වයක් විසින් නියාමනය නොකෙරෙන ආයෝජන උපකරණ වන අතර ශ්‍රී ලංකාව තුල ඒවා වත්කම් ලෙස නොසැලකෙන බව ශ්‍රී ලංකා මහ බැංකුව වැඩි දුරටත් අවධාරණය කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රිප්ටෝ කරන්සි සම්බන්ධයෙන් ඉස්මතු කරනු ලබන සැලකිලිමත් විය යුතු කරුණු:

- නියාමන තත්ත්වය: ශ්‍රී ලංකාවේ ක්‍රිප්ටෝ මුදල් නීත්‍යානුකූල ලෙස පිළි නොගන්නා අතර නියාමන ආරක්ෂණ ක්‍රම නොමැත.
- මූල්‍ය වංචා: ක්‍රිප්ටෝ ආයෝජන මත පදනම්ව ඉහළ ප්‍රතිලාභ ලබා දෙන බවට පොරොන්දු වන මූල්‍ය වංචා සංඛ්‍යාව වැඩි වෙමින් පවතී. මෙම වංචා බොහෝ විට වංචනික ක්‍රිප්ටෝ මුදල් ව්‍යාපෘතිවල ආයෝජනය කිරීමට පුද්ගලයින් පොළඹවා ඔවුන්ට සැලකිය යුතු මූල්‍ය අලාභ හිමිකර දී ඇත.
- නියාමන අවසරය: ආරම්භක කාසි පිරිනැමීම් (ෂඛසඑස්ක ක්මරරැඛපජහ ධෛරෙසඛට), ක්‍රිප්ටෝ මුදල් කැණීම් මෙහෙයුම් (Crypto mining operations), හුවමාරු හෝ ආයෝජන උපදේශන සේවා ඇතුළුව ක්‍රිප්ටෝ මුදල් සම්බන්ධ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍ර නිකුත් කර හෝ කිසිදු පුද්ගලයෙකුට හෝ ව්‍යාපාරයකට අවසර දී නොමැත.

මෙම අවදානම් සැලකිල්ලට ගෙන, සිදුවිය හැකි මූල්‍ය පාඩු සහ නීතිමය ප්‍රතිවිපාක වළක්වා ගැනීම සඳහා, ප්‍රවේශම් වන ලෙසත්, ක්‍රිප්ටෝ මුදල් ගනුදෙනුවලින් වැළකී සිටින ලෙසත් ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාවට උපදෙස් දෙයි.

ඩිජිටල් ආයෝජන මෙවලම්

ඩිජිටල් ආයෝජන මෙවලම් යනු පුද්ගලයන්ට තම මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීමට, ආයෝජනය කිරීමට සහ නිරීක්ෂණය කිරීමට හැකියාව ලබා දෙන තාක්ෂණයන් සහ වේදිකා වේ.

ඒවා විසින් මූල්‍ය වෙළඳපොළවලට සහභාගී වීමට ප්‍රවේශ විය හැකි සහ පහසුවෙන් පරිශීලනය කළහැකි ක්‍රම සපයන අතර, ආයෝජන විකල්ප සහ දත්ත මත පදනම් වූ අවබෝධයන් රාශියක් ඉදිරිපත් කරනු ලබයි.

ඩිජිටල් ආයෝජන මෙවලම්වල පරිණාමය ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළඳපොළ සැලකිය යුතු ලෙස පරිවර්තනය කර ඇති අතර, පුද්ගලයන්ට විවිධ ආයෝජන අවස්ථා හඳුනා ගැනීම පහසු කරයි.

රත්නායක පවුල මෑතකදී නිවාඩුවක් ගත කරමින් සිටියදී පහත සංවාදයට එළඹින.

අනිල්: අනුෂා, ඔයා දන්නවද, ෆෝන් එකෙන් දැන් කොටස් වෙළඳපලේ ආයෝජනය කරන්නත් පුළුවන්.

අනුෂා: ඇත්තද? එහෙම නම් හරි ලේසියිනෙ. ඒත් කොහොමද ඔයා පටන් ගන්නේ?

ගෝතමී : ඔව්, මගේ යාළුවා වෙනම ඇප් එකක් පාවිච්චි කරනවා. ඒකෙන්කොටස් වෙළඳාම් කරන්න වගේම අන්‍යෝන්‍ය අරමුදල් වල ආයෝජනය කරන්න පවා පුළුවන්. දැන් ඒ ඔක්කොම ඩිජිටල් වෙලා තියෙන්නේ.

ධනංජය: මාත් ඒ ගැන හොයල බලන්න ඕන. මගේ ව්‍යාපාරයට ඒකෙන් ඉතුරු කරගන්න සල්ලි ටික ආයෝජනය කරලා බිස්නස් වැඩි කරගන්න පුලුවන්නේ.

අනුෂා: අපි හැමෝම ඒ ගැන උනන්දු නිසා, වැඩි විස්තර හොයල බලමු.

මෙම පවුලේ සංවාදය ඩිජිටල් ආයෝජන මෙවලම් පිළිබඳ දැනගැනීමේ අවශ්‍යතාවය ඉස්මතු කරයි. ඒ සමගම, බොහෝ දෙනෙකුට ඩිජිටල් ආයෝජන ක්‍රියාවලීන් සහ වේදිකා පිළිබඳව දැනුවත්භාවයක් නොමැති බවද පෙනේ.

ඩිජිටල් තාක්ෂනය භාවිතයෙන් ආයෝජනය කිරීම ආරම්භ කරන්නේ කෙසේද යන්න හෝ ඒ හා සම්බන්ධ අවදානම් සහ ප්‍රතිලාභ ඇගයීම පිළිබඳව බොහෝ පුද්ගලයින් අවිනිශ්චිතව සිටිති. මෙම මෙවලම් ගවේෂණය කිරීමෙන්, පුද්ගලයන්ට දැනුවත්භාවයෙන් යුතු මූල්‍ය තීරණ කාර්යක්ෂමව ගැනීමට ඉඩ සැලසේ. එමෙන්ම මෙම දැනුමෙහි පරතරය හඳුනාගත් විට ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කරගත හැකිය.

මේ සඳහා වැඩිදුර දැනුවත් වීමට ශ්‍රී ලංකාවේ වඩාත් ජනප්‍රිය ඩිජිටල් ආයෝජන මෙවලම් ගවේෂණය කරමින් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කල යුතුය.

- කොටස් වෙළඳ වේදිකා
- අන්‍යෝන්‍ය අරමුදල් වේදිකා ස
- විකල්ප ආයෝජන තාක්ෂණයන්

කොටස් වෙළඳාම සඳහා ඇති ඩිජිටල් වේදිකා / අවස්ථාවන්

ශ්‍රී ලාංකික කොටස් තැරැව්කරුවන් ප්‍රධාන වශයෙන්, ඎසරුපඑතඖ සහ 'ඕර්‍ැ යන තත් කාලීන වෙළඳ වේදිකා දෙකක් භාවිතා කරයි. මෙම වේදිකාවලට වෙබ් පිටු සහ ජංගම යෙදුම් හරහා ප්‍රවේශ විය හැකි අතර, එමඟින් කොළඹ කොටස් වෙළඳපොලේ (ඕිෑ) ලැයිස්තුගත කර ඇති සුරැකුම්පත් බාධාවකින් තොරව වෙළඳාම් කිරීමට හැකි වේ.

මෙම වේදිකාවල ප්‍රධාන ලක්ෂණ වන්නේ,

- උසස් ප්‍රස්ථාරකරණ මෙවලම්: ආයෝජකයින්ට තාක්ෂණික සහ විශ්ලේෂණාත්මක අවබෝධයක් ලබා දෙයි.
- වෙළඳපල දත්ත සහ විශ්ලේෂණය: දැනුවත් තීරණ ගැනීම සඳහා තත්කාලීන වෙළඳපල යාවත්කාලීන කිරීම් ලබා දෙයි.
- වෙළඳාම ක්‍රියාත්මක කිරීම: කොටස් සහ අනෙකුත් ලැයිස්තුගත සුරැකුම්පත් සඳහා ඇණවුම් මිලදී ගැනීම සහ විකිණීම සඳහා පහසුකම් සපයයි.
- ආයෝජන කළඹ කළමනාකරණය: ආයෝජන නිරීක්ෂණය කිරීම සහ පැරණි දත්ත වෙත ප්‍රවේශ වීම සඳහා විශේෂාංග ඇතුළත් වේ.

ගැඹුරු වෙළඳපල විශ්ලේෂණයක් සහ උසස් වෙළඳ හැකියාවන් සොයන ක්‍රියාකාරී වෙළඳුන්ට සහ ආයෝජකයින්ට මෙම අවස්ථාවන් ප්‍රතිලාභ ලබා දෙයි.

වැඩි විස්තර සඳහා, කොළඹ කොටස් හුවමාරුව (CSE) https://www.cse.lk වෙත පිවිසෙන්න.

අන්‍යෝන්‍ය අරමුදල්වල (පමඑ්මක මෙඞ) ආයෝජනය කිරීමේ ඩිජිටල් වේදිකා/අවස්ථාවන්

ශ්‍රී ලංකාවේ වත්කම් කළමනාකරණ සමාගම් කිහිපයක් අන්‍යෝන්‍ය අරමුදල් ආයෝජන කළමනාකරණය කිරීම සඳහා ඩිජිටල් වේදිකා සපයයි. අන්‍යෝන්‍ය අරමුදලක් යනු කොටස්, බැඳුම්කර හෝ වෙනත් වත්කම් වැනි විවිධාංගීකරණය වූ මූල්‍ය උපකරණවල ආයෝජනය කිරීම සඳහා බහු ආයෝජකයින්ගෙන් මුදල් රැස් කරන වෘත්තීයමය වශයෙන් කළමනාකරණය කරන ලද ආයෝජන ක්‍රමයකි. ප්‍රවේශ වීමේ පහසුව, වෘත්තීය කළමනාකරණය සහ අවදානම් විවිධාංගීකරණය හේතුවෙන් එය බොහෝ විට නවක මෙන්ම පළපුරුදු ආයෝජකයින් සඳහා වඩාත් සුදුසු ආයෝජන ක්‍රමයක් ලෙස සැලකේ.

අන්‍යෝන්‍ය අරමුදල් හි ප්‍රධාන කාර්යයන්

කාර්යය	විස්තරය
මිලදී ගැනීමේ ඒකක	ඩිජිටල් මෙවලම් භාවිතයෙන් අන්‍යෝන්‍ය අරමුදල් ඒකක මිලදී ගැනීමට ඉඩ සලසයි.
අරමුදල් මාරු කිරීම	ප්‍රතිලාභ ප්‍රශස්ථ කිරීම සඳහා අරමුදල් අතර චලනය සක්‍රිය කරයි.
ඒකක මුදා ගැනීම	ආයෝජන පහසුවෙන් මුදල් බවට පරිවර්තනය හැකියාව ලබා දෙයි.
ආයෝජන කළඹ නිරීක්ෂණය	අරමුදල්වල ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කරන අතර තීරණ ගැනීම සඳහා ඉතා හොඳ දැනුමක් ලබා දෙයි

වැඩිදුර තොරතුරු සඳහා, CSE හි අන්‍යෝන්‍ය අරමුදල් අංශයට පිවිසෙන්න.ග එමඑ්මක ඡමඞ්‍ී‍ැපජඑසදබ දඛ CSE

5.3. විද්‍යුත් වාණිජ්‍යය

ඉගෙනුම් අරමුණු

- විද්‍යුත් වාණිජ්‍යය නිර්වචනය කර විවිධ වර්ගයේ විද්‍යුත් වාණිජ්‍ය වේදිකා/අවස්ථාවන් හඳුනා ගැනීම.
- මාර්ගගත මිලදී ගැනුම්වල ප්‍රධාන අංග විස්තර කර පියවර තේරුම් ගැනීම.
- මාර්ගගත මිලදී ගැනුම්වල ඇති විවිධ ඩිජිටල් ගෙවීම් ක්‍රම තේරුම් ගැනීම.
- ප්‍රධාන ආරක්ෂක පිළිවෙත් හඳුනාගෙන ආරක්ෂිත මාර්ගගත මිලදී ගනුම් සඳහා හොඳම ක්‍රමවේද හ හඳුනා ගැනීම

විද්‍යුත් වාණිජ්‍යය

විද්‍යුත් වාණිජ්‍යය (ෑ-ජදපපැරජැ), නැතහොත් සරලම ආකාරයෙන්, මාර්ගගත වෙළඳාම යන්නෙන් අදහස් කරන්නේ අන්තර්ජාලය භාවිතයෙන් භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සහ විකිණීමයි. එයට මාර්ගගත වෙළඳපොළවල් හරහා නිෂ්පාදන මිලදී ගැනීමේ සිට මූල්‍ය ගනුදෙනු ඩිජිටල් තාක්ෂණය ඔස්සේ සිදු කිරීම දක්වා වූ ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

රත්නායක පවුල ඔවුන්ගේ සවස තේ වේලාවේදී පහත සංවාදයට එළඹින.

අනිල්:	මාත් අන්තර්ජාල ෂොපින් කරන්න හිතුවා. මීට කලින් මම කවදාවත් අන්තර්ජාල හරහා බඩු අරන් නැහැ. මොනවා හරි විශේෂ දේවල් තියෙනවද මම දැනගන්න ඕනේ?
අනුෂා:	ඒක හොඳ අදහසක්, අනිල්. ලොකු දෙයක් නෑ, හොඳ විශ්වාසදායක වෙබ්අඩවි වලට ගියාම හරි.
ගෝතමී :	ඔව්, සහ වෙබ් අඩවිය ආරක්ෂිතද කියල දැනගන්න නම්, වෙබ් ලිපිනයේ යවච්චි තියෙනවද කියල බලන්න ඕනේ.
ධනංජය:	තත්තා, අන්තර්ජාලයෙන් නියම භාණ්ඩ හොයාගන්න පුළුවන්. මම නම් කරන්නේ, භාණ්ඩයක් මිලදී ගැනීමට කලින් පාරිභෝගික ගුණදොස් බලන එක. මීට කලින් ඒ භාණ්ඩය ගත්ත අය හොඳ කියල තියෙනවනම්, ඒ විකුණුම්කරුව විශ්වාස කරන්න පුළුවන්.
අනිල්:	එතකොට ගෙවන්නේ කොහොමද? ණයපත් එකෙන් ගෙවන එක ආරක්ෂිතයිද?
අනුෂා:	පිළිගත් වෙබ් අඩවි වලින් භාණ්ඩ මිලදී ගන්නවානම්, ඒවා සාමාන්‍යයෙන් ආරක්ෂිතයි. බොහෝ ශ්‍රී ලාංකික වෙබ් අඩවි වල, ඔයා හරපත් හෝ ණයපත් වලින් ගෙවන විට, ඔයාගේ ෆෝන් එකට ධඔඡ එකක් එනවා. එකෙන් ආරක්ෂාවක් ලැබෙනවා. එහෙම නැත්නම් ඡ්හඡ්ක වගේ ගෙවීම් සේවා ද භාවිතා කරන්න පුළුවන්. එත් එකට වෙනම ගිණුමක් තියෙන්න ඕනේ.

ධනංජය: අනිත් එක තමයි, බෙදාහැරීම් ගාස්තු බලන්න ඕන. සමහර භාණ්ඩ වල මිලට වඩා දෙතුන් ගුණයකින් ඩිලිවරි ගාස්තුව වැඩි වෙන වෙලාවල් තියෙනවා.

අනිල්: හරි, එතකොට සිල්ලර බඩු වගේ එදිනෙදා භාණ්ඩ අන්තර්ජාලය හරහා මිලදී ගැනීම හොඳ අදහසක්ද?

අනුෂා: අනිවාර්යෙන්ම, දැන් ගොඩක් සුපර් මාකට් වල අන්තර්ජාල භාණ්ඩ මිලදී ගැනීම් තියෙනවා. වෙලාවත් ගොඩක් ඉතිරි වෙනවා. බෙදාහැරීම් වෙලාව හරියටම දෙන්න ඕන.

ගෝතමී : තාත්තා, අන්තර්ජාල භාණ්ඩ මිලදී ගැනීමේ අඩවියට ලියාපදිංචි වෙනකොට, හොඳ මුරපදයක් දා ගන්න.

අනිල්: හරි, හැමෝටම, ස්තූතියි, මට උපදෙස් දුන්නට. දැන් මට විද්‍යුත් වාණිජ්‍ය හරහා බඩු මිලදී ගැනීම පිළිබඳව වැඩි විශ්වාසයක් තියෙනවා. ඒ නිසා මම පොඩියට පටන්ගෙන ඒ කොහොමද වෙන්නේ කියලා බලන්නම්කෝ.

අනුෂා : ඒක හොඳ සැලැස්මක් ඔබේ කාලය ගන්න. මෙම ක්‍රියාවලියට හුරුවන්න. ඉක්මණට ඔබට අන්තර්ජාල භාණ්ඩ මිලදී ගැනීමේ පහසුව අත්විඳිය හැකිය.

මෙම සංවාදය විසින් මාර්ගගත වෙළඳාම මගින් ලබා දෙන පහසුව ඉස්මතු කරනු ලබයි. ඩිජිටල් බැංකුකරණය සහ ඩිජිටල් ගෙවීම් පහසුකම් ඉහළ යාමත් සමඟ, විද්‍යුත් වාණිජ්‍ය (ෘ-ජදපපැරජැ) අපගේ ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත්ව ඇත. වර්තමාන තාක්ෂණය මත පදනම් වූ ලෝකය තුළ මාර්ගගත වෙළඳාම අනුගත වීම අවශ්‍ය වන්නේ, එයින් වැළකී සිටීම තවදුරටත් ප්‍රායෝගික නොවන බැවිනි.

මාර්ගගත වෙළඳාමවල නොයෙකුත් ප්‍රතිලාභ තිබියදීත්, ගනුදෙනුවල ආරක්ෂාව සම්බන්ධයෙන් යම් යම් අවදානම් පවතියි. මෙම ගැටළු පිළිබඳව දැනුවත් වීම සහ ඒවා අවම කිරීම සඳහා සුදුසු පියවර ගැනීම ඉතා වැදගත් වේ. ඩිජිටල් ලෝකය තුල ඔබව ආරක්ෂා කර ගන්නේ කෙසේද යන්න පිළිබඳ නිසි දැනුමක් සහ අවබෝධයක් ලබා ගැනීමෙන්, අවදානම් අවම කර ගනිමින් මාර්ගගත වෙළඳාමේ වාසි භුක්ති විඳිය හැකිය.

ගනුදෙනුවල ස්වභාවය මත පදනම් වූ ප්‍රධාන විද්‍යුත්-වාණිජ්‍ය (e-commerce) වේදිකා හයක් ඇත.

1 ව්‍යාපාරයෙන් පාරිභෝගිකයාට (ඊමිසබිෑ එද ජදබිමපැර)ඃ සමාගම් විසින් නිෂ්පාදන හෝ සේවා පාරිභෝගිකයින්ට කෙලින්ම විකුණයි. උදාහරණ ලෙස ්ප්ා දබ සහ දේශීය මාර්ගගත වෙළඳසැල් ඇතුළත් වේ.

2. ව්‍යපාරයෙන් ව්‍යාපාරයට (ඊමිසබිෑ එද ඊමිසබිෑ)ඃ ව්‍යාපාර විසින් වෙනත් ව්‍යාපාරවලට නිෂ්පාදන හෝ සේවා විකුණයි. මෙම ආකාරයේ ඊ-වාණිජ්‍යයට බොහෝ විට තොග හෝ තොග මිලදී ගැනීම් ඇතුළත් වේ.

3. පාරිභෝගිකයාට පාරිභෝගිකයාට (ජදබිමපැර එද ජදබිමපැර)ඃ පුද්ගලයන් විවිධ ක්‍රම හරහා නිෂ්පාදන හෝ සේවා වෙනත් පුද්ගලයින්ට කෙලින්ම විකුණයි.උදාඃසරඉබඉ

4. සමාජ ජාල අනුබද්ධ විද්‍යුත්-වාණිජ්‍යය ෴දජස්ක ෘ-ජදපපැරජැ)ඃ සමාජ ජාල සහ මාර්ගගත සමාජ සම්බන්ධතා මගින් ඊ-වාණිජ්‍යය සක්‍රීය කර ඇත. උදාහරණඃ ත්ජැඉදදන ඒරනැචවක්ජැ

5. ජංගම-වානිජ්‍යය (පදඉකසැ ෘ-ජදපපැරජැ)ඃ මාර්ගගත ගනුදෙනු සක්‍රීය කිරීම සඳහා ජංගම උපාංග භාවිත කිරීම.

6. ප්‍රාදේශීය විද්‍යුත්-වාණිජ්‍යය (කදජ්ක ෘ-ජදපපැරජැ)ඃ භූගෙ ්ලීය පිහිටීම මත පදනම්ව පාරිභෝගිකයා සම්බන්ධ කර ගැනීම කෙරෙහි ඊ-වාණිජ්‍යය අවධානය යොමු කරයි. උදාහරණඃ ඹඉැර, ඡසපජන පැඃ

මාර්ගගත වෙළඳාම

විද්‍යුත්-වාණිජ්‍යයේ කොටසක් වන මාර්ගගත වෙළඳාම යනු, නිෂ්පාදන හෝ සේවා පැහැදිලිවම මාර්ගගතව ගවේෂණය කිරීම සහ ඩිජිටල් ක්‍රම භාවිතයෙන් මිලදී ගැනීමයි.

මාර්ගගත වෙළඳාමේ මූලික අංග

නිෂ්පාදන ලැයිස්තුගත කිරීම:
සවිස්තරාත්මක නිෂ්පාදන විස්තර, නිෂ්පාදනවල රූප, නිෂ්පාදනවල විශේෂාංග සහ නිෂ්පාදනයේ මිල.

මාර්ගගත ක්‍රමයට තෝරාගත් භාණ්ඩ මිලදී ගැනීමේදී භාණ්ඩ මාර්ගගතව රැස්කර තබා ගන්නා පැස **(shopping cart):** පරිශීලකයින්ට මිලදී ගැනීමට අවශ්‍ය නිෂ්පාදන මාර්ගගත ක්‍රමයට රැස්කර තබා මාර්ගගත ක්‍රමයට මුදල් ගෙවීමට හෝ එයින් පිටවීමට හැකිය.

පරිශීලක ගිණුම් (user accounts): පරිශීලකයින්ට අදාළ වෙබ් අඩවියේ සාමාජික ගිණුම් නිර්මාණය කිරීමට, ඇණවුම් නිරීක්ෂණය කිරීමට සහ මිලදී ගැනීමේ ඉතිහාසය බැලීමට ඇති හැකියාව.

විකල්ප නිෂ්පාදන සෙවීම සහ වඩාත් ගැලපෙන නිෂ්පාදනය ඉක්මනින් සොයා ගැනීමට අවශ්‍ය කොන්දේසි සහිත ව සෙවීමේ සහාය **(Search and filter options):** කාණ්ඩ, මිල පරාසයන් සහ වෙනත් මනාපයන් මත පදනම්ව නිෂ්පාදන සොයා ගැනීමට උපකාරී වන මෙවලම්.

ගෙවීම් පිවිසුම් (payment gateways)׃ ණය/හර කාඩ්පත්, ඩිජිටල් පසුම්බි හෝ බැංකු මාරු කිරීම් හරහා ගෙවීම් පහසුකම් සලසන ආරක්ෂිත ක්‍රමවේද.

ඇණවුම් පිළිබඳ සොයාබැලීම (order tracking)׃ යැවීමේ සිට බෙදා හැරීම දක්වා ඇණවුම්වල තත්ත්වය නිරීක්ෂණය කිරීමේ හැකියාව.

අන්තර්ජාල වෙළඳාම්වලදී ගනුදෙනුකරුවන් විසින් අනුගමනය කළ යුතු පියවර

පළමු පියවර: අන්තර්ජාල සෙවීම - පාරිභෝගිකයින්ට විද්‍යුත්-වාණිජ්‍යය වෙබ් අඩවියක් හරහා ඉඟි පද (නැහ අදරි) භාවිතයෙන් නිෂ්පාදන පිළිබඳ සෙවීමට හෝ විවිධ භාණ්ඩ හා සේවා කාණ්ඩ හරහා අන්තර්ජාලයේ සෙවීමට හැකිය. වෙළඳ නාමය, මිල හෝ නිෂ්පාදනය පිලිබඳ විශේෂාංග මත පදනම්ව, අදාළ සෙවීම් විවිධ ක්‍රම හරහා අවශ්‍ය දේ පමණක් තෝරාගැනීමට හැකිවීමෙන් අඩු කාලයක් තුල ඔබගේ අවශ්‍යතාවය සපුරාලන භාණ්ඩ හෝ සේවා සොයා ගත හැක.

දෙවන පියවර: නිෂ්පාදන තේරීම"නිෂ්පාදනයක්/භාණ්ඩයක් තෝරාගත් පසු, පාරිභෝගිකයින්ට එම නිෂ්පාදනය පිළිබඳ සවිස්තරාත්මක විස්තර, නිෂ්පාදනයේ ඡායාරූප සහ එම නිෂ්පාදනයේ මිල දී ගෙන ඇති පාරිභෝගිකයින්ගේ ප්‍රතිචාරද පරීක්ෂා කල හැක. ඔබගේ අවශ්‍යතාවලට වඩාත් ගැලපෙන නිෂ්පාදනය තෝරා ගැනීම සඳහා වෙනත් විවිධ නිෂ්පාදන සන්සන්දනය කිරීමේ හැකියාවද ඇත.

තුන්වන පියවර : මාර්ගගත ක්‍රමයට භාණ්ඩ තෝරාගැනීමේදී භාණ්ඩ මාර්ගගතව රැස්කර තබාගැනීමේ පැස - නිෂ්පාදනයක් තෝරා ගැනීමෙන් පසු, පාරිභෝගිකයින්ට එය ඔවුන්ගේ භාණ්ඩ මාර්ගගතව රැස්කර ගැනීමේ පැසට (ඩසරචඑ්ක්`යදචචසබට ජ්රඑ) එකතු කර භාණ්ඩ මිලදී ගැනීමට හෝ තවදුරටත් භාණ්ඩ පිළිබඳ සොයා බැලීම සිදු කළ හැකිය.

හතර වන පියවර : ගෙවීම් කිරීම - භාණ්ඩ සඳහා මුදල් ගෙවීමෙන් පසුවත් මාර්ගගත භාණ්ඩ රැස්කරන පැසට තවත් භාණ්ඩ එකතු කිරීමට පාරිභෝගිකයාට තවදුරටත් අවස්ථාව ලබාදෙන අතර, පාරිභෝගිකයින් විසින් නිෂ්පාදන භාරදිය යුතු දිනය, වෙලාව සහ ලිපිනය ආදී විස්තර ලබා දී ගෙවීම් ක්‍රමයක් තෝරා ගත යුතුය. විද්‍යුත්-වාණිජ්‍ය වේදිකා ණයකාඩ්පත්, හර කාඩ්පත්, මුදල් හුවමාරු කිරීම් සහ ඩිජිටල් පසුම්බි වැනි ගෙවීම් විකල්ප කීපයක්ම ලබා දෙයි.

පස් වන පියවර : ඇණවුම තහවුරු කිරීම සහ බෙදා හැරීම - ගෙවීම් සිදු කිරීමෙන් පසු, අපේක්ෂිත බෙදා හැරීමේ කාලය පිළිබඳ විස්තර සහිත ඇණවුම් තහවුරු කිරීමක් පාරිභෝගිකයින්ට ලැබේ. ඔබ මිල දී ගත නිෂ්පාදන ඇණවුම ඔබට ලැබෙන තුරු එම වෙබ් අඩවිය හරහා ඔබට ඔබේ ඇණවුමේ තත්වය (ඇසුරුම් කිරීම, ප්‍රවාහනය සඳහා භාර දීම, ප්‍රවාහනය සහ භාර දීම ආදී) නිරීක්ෂණය කළ හැකිය..

විද්‍යුත් වාණිජ්‍යයේ ඩිජිටල් ගෙවීම් විකල්ප

ආරක්ෂිත සහ කාර්යක්ෂම ගනුදෙනු සම්පූර්ණ කිරීමේ ක්‍රම සහිත ඩිජිටල් ගෙවීම් ක්‍රම විද්‍යුත්-වාණිජ්‍යයට අත්‍යවශ්‍ය වේ. සම්මත ඩිජිටල් ගෙවීම් ක්‍රමවලට ඇතුළත් වන්නේ:



ආරක්ෂිත අන්තර්ජාල වෙළඳාම සඳහා උපදෙස් 7ක්

මාර්ගගත වෙළඳාම පහසුව සහ විවිධත්වය ලබා දෙන අතර, වංචා වළක්වා ගැනීමට සහ ආරක්ෂිත වෙළඳාම් අත්දැකීමක් සහතික කිරීමට ආරක්ෂිත පිළිවෙත් අනුගමනය කිරීම ඉතා වැදගත් වේ.

1. විශ්වාසදායක වෙබ් අඩවි වලින් පමණක් මිලදී ගන්න: හොඳ පාරිභෝගික ප්‍රතිචාර සහ ආරක්ෂිත ගෙවීම් විකල්ප සහිත බොහෝ දෙනා අතර ප්‍රචලිත වෙබ් අඩවි තෝරන්න.

2. වෙබ් අඩවි ලිපිනයේ (ඹසෘඛ), යඑඑච් ලෙස සඳහන් වේදැයි පරීක්ෂා කරන්න: දත්ත සුරක්ෂිත කිරීම සඳහා වෙබ් අඩවි විසින් යඑඑච් වෙබ් අඩවි ලිපිනයට පෙර අගුළු සංකේතයක් (ඒාකදජන් හපඉදක) ලෙස භාවිතා කරන බවට වග බලා ගන්න

3. ශක්තිමත් මුරපද(ඒ්අදරා) භාවිතා කරන්න: අනවසර ප්‍රවේශය වැළැක්වීම සඳහා ඔබේ විද්‍යුත්-වාණිජ්‍ය ගිණුම් සඳහා ශක්තිමත්, ආවේණික මුරපද සාදන්න.

4. එක්වරක් පමණක් ලබාදෙන මුරපද (ධඹඡ) සමඟ ගෙවීම් සත්‍යාපනය කරන්න: ගෙවීම අතරතුර, ගනුදෙනුව සත්‍යාපනය කිරීමට සහ අනවසර ප්‍රවේශය වැළැක්වීම සඳහා ඔබේ ලියාපදිංචි ජංගම දුරකථනයට හෝ විද්‍යුත් තැපෑලට යවන ලද ධඹඡ එක ඇතුළත් කර ඇති බවට සහතික වන්න.

5. පොදු අන්තර්ජාල පහසුකම් (චමඉකසප අසසෙ) භාවිතයෙන් වළකින්න: අනාරක්ෂිත පොදු උස-ඍස ජාල හරහා මිලදී ගැනීම් සිදු නොකරන්න. එවැනි පොදු අන්තර්ජාල පහසුකම් හරහා ඉතා පහසුවෙන් ඔබේ රහස්‍ය තොරතුරු සොරකම් කල හැක

6. ෆිෂින් වංචා (විද්‍යුත් තැපෑලෙන් යැවීමෙන් පාරිභෝග කයින් ඉලක්ක කරගත් මූල්‍ය වංචා - චයසියසබට ජ්පි) ගැන දැනුවත් වන්න: සැක සහිත සබැඳි (කසබනි) මත ක්ලික් නොකරන්න. විද්‍යුත් තැපෑල හෝ සමාජ මාධ්‍යය හරහා පුද්ගලික තොරතුරු බෙදා ගැනීමෙන් වළකින්න.

7. මිලට ගත් භාණ්ඩ නැවත හරවා යැවීම සහ මුදල් ආපසු ගෙවීම පිළිබඳ ප්‍රතිපත්ති පිළිබඳ දැනුවත්වන්න: මිලදී ගැනීමට පෙර, ප්‍රතිලාභ, හරවා යැවුම්, හුවමාරු කිරීම් සහ මුදල් ආපසු ගෙවීම් පිළිබඳ ඇති ප්‍රතිපත්ති පිළිබඳව කියවා තේරුම් ගන්න.

5.4. ඩිජිටල් අයවැයකරණ මෙවලම්

මූල්‍ය යහපැවැත්ම සඳහා ඵලදායී පුද්ගලික මූල්‍ය කළමනාකරණය අත්‍යවශ්‍ය වේ. ඩිජිටල් අයවැයකරණ මෙවලම් විසින් අයවැය නිරීක්ෂණය කිරීම, වියදම් නිරීක්ෂණය කිරීම සහ මූල්‍ය ඉලක්ක සපුරා ගැනීම සඳහා ව්‍යුහගත ප්‍රවේශයක් සපයයි.

ඩිජිටල් අයවැයකරණ මෙවලම් පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා the Budgeting Resources at the Central Bank of Sri Lanka වෙත පිවිසෙන්න.

ඩිජිටල් අයවැයකරණ මෙවලම්වල වාසි

- නිවාස, සිල්ලර බඩු, විනෝදාස්වාදය සහ ඉතිරිකිරීම් වැනි වියදම් කාණ්ඩ හරහා ආදායම වෙන් කිරීමේ හැකියාව.
- මූල්‍ය විනය සහතික කර සහ අධික ලෙස වියදම් කිරීමෙන් වැළකී සිටීමට උපකාරී වේ..

ඩිජිටල් අයවැයකරණ මෙවලම්වල ප්‍රධාන විශේෂාංගි

විශේෂාංගය	විස්තරය
වියදම් පිළිබඳ සොයාබැලීම	ස්වයංක්‍රීය වියදම් වර්ගීකරණය, නිරන්තර යාවත්කාලීන වාර්තා සපයයි
මූල්‍ය ඉලක්ක සැකසීම	ඉලක්ක නිර්මාණය, ස්වයංක්‍රීයව ඉතිරිකිරීම සහ ප්‍රගතිය හඳුනා ගැනීම වැනි දේ සඳහා සහාය වේ.
ඉතුරුම් වෙන් කිරීම	හදිසි අවස්ථා සහ ඉලක්ක සඳහා අරමුදල් ඵලදායී ලෙස වෙන් කිරීමට උපකාරී වේ.

ඩිජිටල් අයවැයකරණ මෙවලම් බුද්ධිමත්ව භාවිතා කිරීම සඳහා උපදෙස් 5ක්:

1. යථාර්ථවාදී ලෙස අයවැය සකසන්න: ඔබේ අයවැය ඔබේ ආදායම සහ අවශ්‍ය වියදම් පමණක් පිළිබිඹු කරන බවට වග බලා ගන්න.

2. ඉතුරුම් ස්වයංක්‍රීය කරන්න: ඉතුරුම් ඉලක්ක කරා අඛණ්ඩව අරමුදල් වෙන් කිරීම සඳහා අයවැයකරණ මෙවලම්වල ස්වයංක්‍රීයකරණ විශේෂාංග භාවිතා කරන්න.

3. වාර්තා නිතිපතා සමාලෝචනය කරන්න: ඔබේ වියදම් පුරුදු තේරුම් ගැනීම සඳහා ඔබ වෙත ලබා දෙන වාර්තා විශ්ලේෂණය කරන්න.

4. වියදම් නිවැරදිව වර්ගීකරණය කරන්න: ඔබේ මුදල් යන්නේ කොතැනටද යන්න තේරුම් ගැනීමට වියදම් නිසි ලෙස වර්ගීකරණය කරන්න.

5. ජීවිතයේ සිදුවන වෙනස්කම් අනුව අයවැය යාවත්කාලීන කරන්න: ආදායමේ හෝ වියදම්වල සැලකිය යුතු වෙනස්කම් ඇති විට ඔබේ අයවැයෙහි ගැලපීම් සිදු කරන්න.

ඩිජිටල් උපාංග මඟින් ඔබව මූල්‍යමය වශයෙන් ඉහළට ඔසවා තබන ක්‍රම 3ක්

1. ඔබේ අයවැය පහසුවෙන් සකස් කිරීම

ජංගම යෙදුම් මඟින් ඔබේ ණය කාඩ්පත් සහ බැංකු ගිණුම් සම්බන්ධ කිරීමට, ඔබේ ගනුදෙනු තොරතුරු අයවැය කාණ්ඩවලට වෙන් කිරීමට ඔබට ඉඩ සලසයි. එවැනි යෙදුම්වල ඔබේ මූල්‍ය කළමනාකරණයට සහාය වීම සඳහා විශේෂිත පහසුකම් ඇත.

2. ණය ඉක්මනින් ගෙවීම

ඇතැම් යෙදුම් (ඇප්) දිනපතා යම් මුදල් ප්‍රමාණයක් ඉතිරි කර ඔබට ඉක්මනින් ණයෙන් මිදීමට උපකාර කිරීම සඳහා නිර්මාණය කර ඇත. මෙම යෙදුම් ඔබගේ ඉතුරුම් ගිණුමට සම්බන්ධ කර ඇත. උදාහරණයක් ලෙස, ඔබේ ණය කාඩ්පත් හෝ පුද්ගලික ණය සඳහා ගෙවීම අයවැයකරණ යෙදුමක් මඟින් කළමනාකරණය කරගත හැක.

3. පුනරාවර්තන වියදම් කපා හැරීම

ඇතැම් යෙදුම්, පුනරාවර්තන වියදම් අඩු කර ගැනීමට උපකාරී වන විශේෂාංග අයවැයකරණය සමඟ ඒකාබද්ධ කරයි. එම යෙදුම් විසින් ඔබේ බැංකුවට සම්බන්ධ වී ගිණුම් පරීක්ෂා කිරීමෙන් පසු, ගනුදෙනු සහ ශේෂ දත්ත ලබාගෙන ඔබේ වියදම් නිරීක්ෂණය කරනු ලබයි. එමඟින් වියදම් පිළිබඳ අවබෝධයක් සහ අයවැය නිවැරදිව නිර්මාණය කිරීමේ අවස්ථාව ඔබට ලබා දෙනු ලබයි.

6 වන පරිච්ඡේදය

මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව

6.1 හැඳින්වීම

ඉගෙනුම් අරමුණු

- මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ සංකල්පය අවබෝධ කර ගැනීම
- මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවේ වැදගත්කම හඳුනා ගැනීම.
- ශ්‍රී ලංකාවේ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව පිළිබඳව ඉගෙන ගැනීම.
- මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව පිළිබඳව මූල්‍ය සේවා සපයන්නන්ගේ වගකීම් දැන ගැනීම.
- මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව පිළිබඳව පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් සහ වගකීම් දැන ගැනීම.
- පැමිණිලි හැසිරවීමේ සහ සහන යාන්ත්‍රණය තේරුම් ගැනීම

මූල්‍ය සේවා සපයන්නන් විසින් පිරිනමනු ලබන මූල්‍ය නිපැයුම් සහ සේවාවන් පහසුවෙන් ලබා ගැනීමට හැකි වීම ඔබේ ජීවිතය සුවපහසු වීමට හේතු වී ඇත. හානිකර, අසාධාරණ සහ වගකීම් විරහිත ව්‍යාපාරික හැසිරීම් වලට මුහුණ නොදී එම මූල්‍ය නිපැයුම් සහ සේවාවන් පහසුවෙන් භාවිතා කිරීමට සහ භුක්ති විඳීමට ඇති හැකියාව පිළිබඳව දැනුවත් වීම අත්‍යවශ්‍ය වේ.

6.2 මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව

මූල්‍ය සේවා සපයන්නන් විසින් සපයනු ලබන මූල්‍ය නිෂ්පාදන සහ සේවාවන් සමඟ අන්‍යෝන්‍ය ලෙස කටයුතු කරන විට මූල්‍ය පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා නිර්මාණය කර ඇති නීති, රෙගුලාසි සහ භාවිතයන් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව ලෙස හැඳින්වේ.

පාරිභෝගික ආරක්ෂණ රාමුවේ ප්‍රධාන ඉලක්කය වන්නේ මූල්‍ය පාරිභෝගිකයින් වංචා, විවේචන, සූරාකෑම් සහ අසාධාරණ මෙන්ම වගකීම් විරහිත ව්‍යාපාරික හැසිරීම් වලින් ඔවුන් ආරක්ෂා කරමින් සාධාරණ, විනිවිද පෙනෙන සහ ආරක්ෂිත මූල්‍ය සේවාවන් ඔවුන්ට ලබා ගත හැකි බව සහතික කිරීමයි.

අනිල් ඔහුගේ පැරණි කාර්යාල සගයෙක් වන සරත් අවන්හලකදී මුණගැසුණි. සරත්ගේ පෙනුම අනුව, ඔහු යහපත් මානසික තත්ත්වයකින් නොසිටින බව අනිල්ට පෙනුණි.





ඉහත සංවාදය විසින් කිසිදු විමසා බැලීමකින් තොරව ණය ගිවිසුම් අත්සන් කිරීමෙන් ඔබේ සියලු ධනය විනාශ වීමේ අවදානම අවධාරණය කරනු ලබයි. එබැවින්, ශ්‍රී ලංකාවේ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව පිළිබඳව මූල්‍ය පාරිභෝගිකයින් දැනුවත් වීම අත්‍යවශ්‍ය වේ.

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණයේ වැදගත්කම

මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට හා මූල්‍ය පාරිභෝගිකයන් සඳහා මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව ඉතා වැදගත් වේ. මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව අත්‍යවශ්‍ය වීමට ප්‍රධාන හේතු පහත දැක්වේ.

- මූල්‍ය පාරිභෝගිකයින්ට සාධාරණ ලෙස සැලකීම සහතික කිරීම: මූල්‍ය ආයතන මූල්‍ය පාරිභෝගිකයින්ට සාධාරණ ලෙස සලකන බව පාරිභෝගික ආරක්ෂණය විසින් සහතික කරයි.
- මූල්‍ය සූරාකෑම වැළැක්වීම: ඇතැම් මූල්‍ය නිපැයුම් සහ සේවා සංකීර්ණ වන අතර, ප්‍රමාණවත් ආරක්ෂාවක් නොමැතිව, පාරිභෝගිකයින් අහිසි මූල්‍ය නිපැයුම් සහ සේවාවන්ට ගොදුරු විය හැකිය.
- කාර්යක්ෂම ආරවුල් විසඳීමක් ලබා දීම: පාරිභෝගිකයින් සහ මූල්‍ය ආයතන අතර ආරවුල් ඇති වුවහොත්, පාරිභෝගික ආරක්ෂණ යාන්ත්‍රණයන් මඟින් සාධාරණ හා කාර්යක්ෂම විසඳුමක් සඳහා මාර්ග සපයයි.
- පාරිභෝගික රහස්‍යභාවය සහ දත්ත සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීම: මූල්‍ය ආයතන විසින් මූල්‍ය පාරිභෝගිකයින්ගේ සංවේදී පුද්ගලික සහ මූල්‍ය තොරතුරු හසුරුවන බැවින්, එවැනි දත්ත සොරකම් කිරීම, අහිසි ලෙස භාවිතා කිරීම හෝ අනවසර දත්ත ලබා ගැනීම් වලින් ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් ආරක්ෂක පියවර ක්‍රියාත්මක කිරීමට මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ නීති මගින් අවස්ථාව සලසා ඇත.
- මූල්‍ය සාක්ෂරතාවය සහ අධ්‍යාපනය දිරිමත් කිරීම: මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ නීති බොහෝ විට පාරිභෝගිකයින් අතර මූල්‍ය සාක්ෂරතාවය වැඩි දියුණු කිරීමට හේතු වේ. මූල්‍ය නිපැයුම් වල නියමයන් සහ කොන්දේසි, පොලී අනුපාත, ගාස්තු සහ වෙනත් අංශයන් පිළිබඳව දැනුම්වත්භාවය වර්ධනය කිරීම මඟින් පාරිභෝගිකයින් දැනුවත්භාවයෙන් යුතු තීරණ ගැනීමට යොමු වේ.
- සැමට මූල්‍ය සේවා ලබා ගැනීමේ හැකියාව (මූල්‍ය අන්තර්ගතභාවය) ප්‍රවර්ධනය කිරීම: අඩු ආදායම්ලාභී පුද්ගලයින්, සුළු ජාතීන් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වැනි ඌන මූල්‍ය සේවාලාභී සහ අවදානමට ලක්විය හැකි පුද්ගලයන්ට දැරිය හැකි සහ සුදුසු මූල්‍ය නිපැයුම් ලබා ගැනීමට ඇති හැකියාව මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ නීති මඟින් සහතික කරයි.
- මූල්‍ය පද්ධතිය කෙරෙහි විශ්වාසය ගොඩනඟා ගැනීම: මූල්‍ය පාරිභෝගිකයින්ට ඔවුන්ගේ මූල්‍ය අයිතිවාසිකම් සහ මූල්‍ය අවශ්‍යතා ආරක්ෂා වී ඇති බව සහතික වූ විට, ඔවුන් විසින් මූල්‍ය පද්ධතිය කෙරෙහි විශ්වාසය තැබීමට සහ මූල්‍ය සේවා භාවිතා කිරීමට යොමු වේ.
- මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහ ආර්ථික වර්ධනයට සහාය වීම: පාරිභෝගිකයින් තම මූල්‍ය ගනුදෙනු පිළිබඳව විශ්වාසයෙන් සිටින විට, ඔවුන් ඉතිරිකිරීම්, ආයෝජනය කිරීම සහ වියදම් කිරීමෙහි නිරත වීමට වැඩි ඉඩක් ඇති අතර, ඒ සියල්ල ආර්ථික වර්ධනයට හේතු වේ.

ස්ථාවර, සාධාරණ සහ සැමට සේවා ලබා ගත හැකි මූල්‍ය පද්ධතියක මූලික අංගයක් ලෙස මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය, ගෝලීය වශයෙන් පිළිගැනේ. මූල්‍ය ආරක්ෂණය සම්බන්ධ නිශ්චිත රෙගුලාසි සහ රාමු, ඒ ඒ රට අනුව වෙනස් විය හැකි වුවද, ජාත්‍යන්තර අධිකරණ කිහිපයක් විසින් ස්ථාපිත ගෝලීය ප්‍රමිතීන් විසින්, මූල්‍ය පාරිභෝගිකයින්ට සාධාරණ ලෙස සලකනු ලබන බවටද; ආරක්ෂිත, විනිවිද පෙනෙන සහ සාධාරණ මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය ඇති බවටද සහතික කර ඇත.

විශේෂයෙන්, ආර්ථික සංවර්ධනයට සහාය වීම සහ හානිකර මූල්‍ය සේවාවන්ගෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සහ සැමටම මූල්‍ය සේවා ලබා දීම (මූල්‍ය අන්තර්ගතභාවය) ප්‍රවර්ධනය කිරීම සඳහා මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව වැදගත් සාධකයක් බව ලෝක බැංකුව විසින් ඉස්මතු කර ඇත. එය පාරිභෝගික මූල්‍ය ආරක්ෂණය සඳහා යහපත් පුරුදු සකස් කර ඇති අතර පාරිභෝගික මූල්‍ය ආරක්ෂණයෙහි මූලධර්ම පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ මූල්‍ය නියාමකයින්ට මඟ පෙන්වන ගෝලීය රාමුවක් ලබා ගනු ලබයි.

ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ විශ්වාසය, විනිවිදභාවය සහ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය අංගයක් ලෙස මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිගැනේ. වසර ගණනාවක් පුරා, දේශීය අවශ්‍යතා සහ අභියෝගවලට මුහුණ දෙමින් ගෝලීය මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමු සමඟ පෙළගැසෙමින්, විවිධ මඟ පෙන්වීම් සහ රෙගුලාසි හරහා මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව ශක්තිමත් කිරීමෙහි ලා ශ්‍රී ලංකාව ප්‍රගතියක් ලබා ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ආරක්ෂණ රාමුව සම්බන්ධ ප්‍රධාන උපදෙස් සහ රෙගුලාසි පහත පරිදි ලැයිස්තුගත කළ හැකිය:

- 2023 අංක 1 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි (Financial Consumer Protection | Central Bank of Sri Lanka)
- බැංකු පනත (බලපත්‍රලාභී බැංකුවල පාරිභෝගික ප්‍රඥප්තිය) 2011 අංක 8 දරන නියෝගය
- මූල්‍ය සමාගම් පනත (මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව) 2018 අංක 1 දරන නියෝගය (https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/Finance_Business_Act_Directions_No_1_of_2018_e.pdf)
- මූල්‍ය කල්බදු පනත (මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව) 2018 අංක 1 දරන නියෝගය (https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/Finance_Leasing_Act_Directions_No_1_of_2018_e.pdf)
- බැංකු පනත (පාරිභෝගික ප්‍රඥප්තියට අතිරේකය - විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන් සඳහා බැංකු සේවා සඳහා ප්‍රවේශ්‍යතාව) (Addendum to Customer Charter - Accessibility to Banking Services for Customers with Special Needs | Central Bank of Sri Lanka) 2022 අංක 06 දරන නියෝගය'

ඉහත සඳහන් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව රෙගුලාසි සහ විධානයන්ට අනුව, මූල්‍ය පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා නියාමන සහ නීතිමය රාමුවක් ස්ථාපිත කිරීමේදී ශ්‍රී ලංකා මහා බැංකුව සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. විශේෂයෙන් 2023 දී පුළුල් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ විධිවිධාන, 2023 අංක 1 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි (මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි) සංවර්ධනය කිරීම යන කරුණු සම්බන්ධයෙන් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව අවධානය යොමු කර ඇත.

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි යටතේ, ඔබේ මූල්‍ය අවශ්‍යතා මූල්‍ය සේවා සපයන්නන් මඟින් ඉටු කර ගැනීමේදී සුරක්ෂිතභාවයක් ලබා දෙනු ඇත.

▶ මම මූල්‍ය පාරිභෝගිකයෙක්ද?

ඔබ මූල්‍ය පාරිභෝගිකයෙක් නම්, ඔබ

a) දැනට මූල්‍ය නිපැයුම් සහ සේවා භාවිතා කරන,

b) මූල්‍ය නිපැයුම්යක් සහ සේවාවක් භාවිතා කර ඇති හෝ

c) මූල්‍ය සේවා සපයන්නන් විසින් සපයනු ලබන මූල්‍ය නිපැයුම් සහ සේවාවන් භාවිතා කිරීමට අපේක්ෂා කරන පුද්ගලයෙක් වේ.

▶ මූල්‍ය සේවා සපයන්නන් කවුද?

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි වලට අනුව, පහත සඳහන් මූල්‍ය ආයතන මූල්‍ය සේවා සපයන්නන් ලෙස සැලකේ.

- බලපත්‍රලාභී බැංකු
- බලපත්‍රලාභී මූල්‍ය සමාගම්
- විශේෂිත කල්බදු සමාගම්
- බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්
- බලයලත් ප්‍රාථමික අලෙවිකරුවන්
- බලයලත් මුදල් තැරැව්කරුවන්
- ගෙවීම් සහ පියවීම් පද්ධතියේ සහභාගිවන්න

▶ මූල්‍ය ආරක්ෂණ රාමුව පිළිබඳ මූල්‍ය සේවා සපයන්නන්ගේ වගකීම්

මූල්‍ය පාරිභෝගිකයින්ට සාධාරණ ලෙස සැලකීම, විනිවිද පෙනෙන ආකාරයේ තොරතුරු ලබා දීම සහ මූල්‍ය සේවා අංශයේ හානිවලින් සහ අනෙකුත් අවදානම් වලින් ආරක්ෂා වීම සහතික කිරීම සඳහා මූල්‍ය සේවා ආරක්ෂණය ඉතා වැදගත් වේ. එමෙන්ම, මූල්‍ය සේවා සපයන්නන්ගේ වගකීම් මූල්‍ය සේවා ආරක්ෂණ රෙගුලාසි වල මූලධර්ම සමඟ අනුකූල වේ. මූල්‍ය සේවා ආරක්ෂණය පිළිබඳව මූල්‍ය සේවා සපයන්නන්ගේ ප්‍රධාන යුතුකම් පහත දැක්වේ.

- මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම.
- මූලික මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පත් කිරීම
- සංවිධානය තුළ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම
- සියලුම සේවකයින් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳව සැමවිටම දැනුවත් බව සහ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම.

▶ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි වල ප්‍රධාන මූලධර්ම

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි වල ප්‍රධාන මූලධර්ම සැලසුම් කර ඇත්තේ මූල්‍ය පාරිභෝගිකයින්ට සාධාරණ ලෙස සලකනු ලබන බවද, විනිවිද පෙනෙන සහ තේරුම්ගත හැකි මූල්‍ය නිපැයුම් ලබා ගත හැකි වීමද, හානිවලින් ආරක්ෂා වන බවද සහතික වීම සඳහා ය. මෙම මූලධර්ම ශ්‍රී ලංකාවේ මූල්‍ය සේවා අංශයේ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමු නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මූලික පදනම ලෙස සලකා බැලේ. නිශ්චිත රෙගුලාසි අධිකරණ බලය අනුව වෙනස් විය හැකි වුවද, මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි පනවන ලද මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ මූලධර්මවලට ප්‍රධාන වශයෙන් පහත සඳහන් කරුණු ඇතුළත් වේ:

- සාධාරණව සැලකීම සහ වගකීම් සහගත ව්‍යාපාරකරණය
- තොරතුරු හෙළිදරව් කිරීම සහ විනිවිදභාවය

- මූල්‍ය සේවා සපයන්නාගේ පැමිණිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටිය සහ සහන සැලසීමේ යාන්ත්‍රණය
- මූල්‍ය පාරිභෝගිකයින්ගේ වත්කම් සහ තොරතුරු ආරක්ෂා කිරීම

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ මූලධර්ම බොහෝ විට පාරිභෝගික අයිතිවාසිකම් ලෙස සැලකිය හැකිය. මෙම මූලධර්ම ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය තුළ පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සහය වීම සඳහා නිර්මාණය කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි ක්‍රියාත්මක කරන විට, ශ්‍රී ලංකාවේ මූල්‍ය සේවා සපයන්නන් විසින් පිරිනමනු ලබන මූල්‍ය නිපැයුම් සහ සේවාවන් ලබා ගැනීමේදී සහ භාවිතා කිරීමේදී ඔබට නිශ්චිත අයිතිවාසිකම් ඇති බව මූල්‍ය සේවා සපයන්නන් විසින් හඳුනා ගනී.

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි යටතේ, ඔබේ මූල්‍ය අවශ්‍යතා සඳහා මූල්‍ය සේවා සපයන්නන් සමඟ කටයුතු කරන විට ඔබේ අවශ්‍යතා ආරක්ෂා කර ගැනීමට උපකාරී වන විවිධ අයිතිවාසිකම් සඳහා ඔබට හිමිකම් ඇත. ඔබට හිමිවන මූලික ආරක්ෂණයන් වන්නේ:

1. සාධාරණ සැලකීම සහ වගකීම්සහගත ව්‍යාපාරික හැසිරීම

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි මගින් මූල්‍ය පාරිභෝගිකයින්ට ආදායම, ශාරීරික හැකියාව, ස්ත්‍රී පුරුෂ භාවය හෝ වෙනත් ඕනෑම සමාජ තත්වයක් නොසලකා සමාන හා සාධාරණ මූල්‍ය සේවාවක් සඳහා අයිතියක් ඇති බව සහතික කෙරේ.

ඒ අනුව, ඔබට හිමිවන්නේ,

- නිපැයුමක හෝ සේවාවක පොලී අනුපාතය, ගාස්තු, හෝ නියමයන් සහ කොන්දේසි වෙනස්කම් කිරීමට පෙර දැනුම් දීමක් ලබා ගැනීමේ අයිතිය
- කොන්ත්‍රාත්තුවේ වෙනස්කම් සිදු කරන විට දැනුම් දීමේ අයිතිය
- මූල්‍ය සේවා සපයන්නන් කොන්ත්‍රාත්තුවට අසාධාරණ කොන්දේසි එකතු කිරීම වැළැක්වීමේ අයිතිය
- නිපැයුමක් පිළිගැනීමට පෙර නිසි මග පෙන්වීමක් ලබා ගැනීමේ අයිතිය.

තවද, ඔබ පහත සඳහන් දේවලින් නිදහස් වනු ඇත.

- ප්‍රසිද්ධියේ ලැජ්ජාවට පත් කිරීම
- ආක්‍රමණශීලී අලෙවිකරණය සහ ප්‍රචාරණය
- හිරිහැර හෝ බිය ගැන්වීම
- මූල්‍ය සේවා සපයන්නන් විසින් ඔබේ පවුලේ සාමාජිකයන්, මිතුරන් හෝ රැකියාවේ නියුතු කාර්යාලය අනවශ්‍ය ලෙස සම්බන්ධ කර ගැනීම

විශේෂයෙන්, ඔබ ආබාධිත පුද්ගලයෙක් නම්, ඔබට;

- මූල්‍ය සේවා සපයන්නන් විසින් නඩත්තු කරනු ලබන සියලු ම වෙබ් අඩවි සහ ජංගම යෙදුම් වෙත ප්‍රවේශ වීමේ අයිතිය
- පහසු ආකෘතිවලින් ලේඛන ඉල්ලා සිටීමේ අයිතිය
- අත්සනක් ලෙස මාපටැඟිලි සලකුණ භාවිතා කිරීමේ අයිතිය
- පුද්ගලික සහාය ලබා ගැනීමේ අයිතිය.ග

ඒ අනුව, මෙම අයිතිවාසිකම් මඟින් ඔබට සාධාරණව, විනිවිදභාවයෙන් සහ ආරක්ෂිතව මූල්‍ය නිපැයුම් සහ සේවා ලබා ගත හැකි බව සහතික කෙරේ.

2. විනිවිදභාවය සහ අනාවරණය

දැනුවත් මූල්‍ය තීරණ ගැනීමට ඔබට නිසි තොරතුරු අවශ්‍ය වන බැවින්, විනිවිදභාවය සහ අනාවරණය කිරීමේ රෙගුලාසි සම්බන්ධයෙන් ඔබට පහත සඳහන් අයිතිවාසිකම් ඇත.

- සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි වැනි ඔබ කැමති භාෂාවෙන් සියලු තොරතුරු ලබා ගැනීමේ අයිතිය.
- ඔබ විසින් එළඹෙන ණය ගිවිසුම් හා සම්බන්ධ පොලී අනුපාතය, සියලු ගාස්තු සහ ගාස්තු පිළිබඳ විස්තර ලබා ගැනීමේ අයිතිය.
- ගිවිසුමකට එළඹීමට පෙර, සියලුම ගිවිසුම් නියමයන් සහ කොන්දේසි පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ අයිතිය.

තවද, මූල්‍ය නිෂ්පාදන සහ සේවාවන් සඳහා වන ගිවිසුම් පහත පරිදි වන බව මූල්‍ය සේවා සපයන්නන් විසින් සහතික කල යුතුය.

- පැහැදිලි සහ තේරුම් ගැනීමට පහසු විය යුතු අතර පහත සඳහන් තොරතුරු ඇතුළත් විය යුතුය:
- පාරිභෝගිකයාගේ අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳ පැහැදිලි කිරීම.
- අදාළ අවදානම් පිළිබඳ විස්තර.
- පොලී අනුපාත, ගාස්තු සහ අයකිරීම් පිළිබඳ තොරතුරු.
- පාරිභෝගික සහාය සඳහා සම්බන්ධතා තොරතුරු.

මූල්‍ය පාරිභෝගිකයෙකු ලෙස, මූල්‍ය සේවා සපයන්නන් විසින් පිරිනමනු ලබන සියලුම නිපැයුම් සහ සේවාවන් පිළිඳ තොරතු සොයා ගැනීමට ඔබට ප්‍රාථමික මූලාශ්‍ර දෙකක් තිබේ.

- අදාළ මූල්‍ය සේවා සපයන්නන්ගේ නිල වෙබ් අඩවිය
- මූලික තොරතුරු ලේඛනය (මෙය එක් එක් මූල්‍ය සේවාව පිළිබඳව පාරිභෝගිකයින්ට මූලික තොරතුරු ලබාදීම සඳහා මූල්‍ය සේවා සපයන්නන් විසින් සකස් කරන ලද ලේඛනයක් වන අතර එම ලේඛනය ඔබට ලබාගත හැකිය)*

මෙම හෙළිදරව් කිරීමේ සහ විනිවිදභාවය පිළිබඳ රෙගුලාසි යටතේ, මෙම ආරක්ෂණයන් මගින් ඔබට දැනුවත් තීරණ ගත හැකි බවත්, අපැහැදිලි හෝ සැඟවුණු කොන්දේසි මගින් නොමඟ නොයන බවත් සහතික කෙරේ. මන්ද මූල්‍ය සේවා සපයන්නන් ඔවුන්ගේ සේවාවන් පිළිබඳ සම්පූර්ණ තොරතුරු තේරුම් ගැනීමට පහසු පරිදි ඉදිරිපත් කිරීමට අවශ්‍ය බැවිනි.

3. මූල්‍ය සේවා සපයන්නාගේ පැමිණිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටිය සහ සහන සැලසීමේ යාන්ත්‍රණය

ඔබේ මූල්‍ය සේවා සපයන්නන් ඔබට අකටයුත්තක් සිදු කළේ නම්, ඔබට පැමිණිලි ඉදිරිපත් කර සහන ලබා ගත හැකිය. පැමිණිලි සහ දුක්ගැනවිලි විසඳීම සඳහා පැහැදිලි සහ කාර්යක්ෂම ක්‍රියාවලීන් වෙත යොමු කරන ආකාරය මෙයට ඇතුළත් වන අතර, අවශ්‍ය නම් එවැනි පැමිණිලි විකල්ප ආරවුල් විසඳීමේ ක්‍රියාපටිපාටීන් වෙත යොමු කිරීමේ හැකියාවද ඇත.

මේ යටතේ, මූල්‍ය සේවා සපයන්නන් විසින් ඔබේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට එරෙහිව ඔබට ක්‍රියා කළ හැකිය. ඒ අනුව,

ඔබට අදාළ මූල්‍ය සේවා සපයන්නන් වෙත නොමිලේ විවිධ මාධ්‍යයන් භාවිතා කරමින් පැමිණිලි කළ හැකිය.

තවද, ඔබ විසින් ගොනු කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන්, ඔබට:

- ඔබගේ පැමිණිල්ල හසුරුවන නිලධාරියා/නිලධාරීන් විසින් සාධාරණ කාලයක් තුළ ලිඛිතව ඔබ විසින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ල විශ්ලේෂණය කළ යුතුය.
- දින 21ක් ඇතුළත ඔබේ කාරණය විසඳා ගැනීමට අයිතියක් ඇත.
- ඔබගේ පැමිණිල්ල සඳහා සහනයක් ලබා දීමට මූල්‍ය සේවා සපයන්නන් හට නොහැකි නම්, මූල්‍ය සේවා සපයන්නන් වෙතින් පැහැදිලි කිරීමක් ලබා ගැනීමට අයිතියක් ඇත.
- අදාළ මූල්‍ය සේවා සපයන්නන්ගේ පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු ලබා ගැනීමට අයිතියක් ඇත.

මූල්‍ය සේවා සපයන්නගේ ප්‍රතිචාරය ගැන ඔබ සෑහීමකට පත් නොවන්නේ නම් හෝ ඔබේ පැමිණිල්ලට මූල්‍ය සේවා සපයන්නන් විසින් අවශ්‍ය ආකාරයෙන් අවධානය යොමු කර නොමැති නම්, ඔබට ඔබේ පැමිණිල්ල ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවට (FCRD) ඉදිරිපත් කළ හැකිය.

මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව යනු මහ බැංකුව යටතේ ස්ථාපිත, පාරිභෝගිකයින් විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය පාරිභෝගික පැමිණිලි හැසිරවීමට බලයලත් දෙපාර්තමේන්තුවයි.

ඒ අනුව, ඔබගේ පැමිණිලි fcrd@cbsl.lk යන විද්‍යුත් තැපෑල හරහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ හැක. ඔබ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව වෙත එවැනි පැමිණිල්ලක් කරන විට, පහත සඳහන් කරුණු පිළිබඳ සැළකිලිමත් විය යුතුය.

- ඔබේ පැමිණිල්ල බලපත්‍රලාභී මූල්‍ය ආයතන සම්බන්ධයෙන් විය යුතුය.
- අදාළ මූල්‍ය සේවා සපයන්නන් වෙත කරන ලද මූලික පැමිණිල්ලේ විස්තර සැපයිය යුතුය.
- මූල්‍ය සේවා සපයන්නන් වෙත මූලික පැමිණිල්ල ඉදිරිපත් කිරීමෙන් වසරක් ඉක්මවීමට පෙර ඔබේ පැමිණිල්ල ඉදිරිපත් කළ යුතුය.
- ඔබ කිසියම් අනවශ්‍ය බලපෑමක් කළහොත් හෝ එම පැමිණිල්ල සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ගයක් ගන්නේ නම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව පැමිණිලි විභාග කිරීම නතර කළ හැකිය.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවහි පැමිණිල්ලක් කිරීම මඟින් ඒ සම්බන්ධව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීම ට බාධාවක් නොවේ.

තවද, මූල්‍ය පාරිභෝගිකයින් ලෙස, ඔබට මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා 1935 ක්ෂණික ඇමතුම් අංකයට ඇමතීමෙන් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙන් අදාළ තොරතුරු සොයා ගැනීමෙන් මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව හා සම්බන්ධ විය හැකිය.

ඒ අනුව, මෙම ආරක්ෂණය මඟින් පාරිභෝගිකයින්ට අකාර්යක්ෂම සේවාවක් හෝ ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් මූල්‍ය ආයතන වගකිව යුතු බවටත්, ගැටළු විසඳීමට සහ අවශ්‍ය විටෙක වන්දි ලබා ගැනීමට ඔවුන්ට පැහැදිලි මාර්ගයක් ඇති බවටත් සහතික කෙරේ.

4. මූල්‍ය පාරිභෝගිකයින්ගේ වත්කම් සහ තොරතුරු ආරක්ෂා කිරීම

මෙහි දී, ඔබේ පුද්ගලික සහ මූල්‍ය දත්ත සහ ඔබේ වත්කම් ආරක්ෂා කිරීමට ඔබට අයිතියක් ඇත.

මෙම රෙගුලාසි වලට අනුව, ඔබේ දත්ත පහත සඳහන් දේවලින් ආරක්ෂා වේ.

- අනවසර ප්‍රවේශය
- වෙනස් කිරීම්
- හෙළිදරව් කිරීම
- මූල්‍ය ආයතනයේ සේවකයින් විසින් සිදු කරන ලද පාඩුව හෝ විනාශය.

ඊට අමතරව, ඔබේ පෞද්ගලිකත්වය පවත්වා ගැනීමට ඔබට අයිතියක් ඇත. නීති මගින් අවසර දී නොමැති නම්, කිසිදු මූල්‍ය සේවා සපයන්නකු සේවකයෙකුට ඔබේ අවසරයකින් තොරව ඔබේ පුද්ගලික තොරතුරු තෙවන පාර්ශවයක් සමඟ හෙළි කිරීමට හෝ බෙදා ගැනීමට නොහැකිය. මූල්‍ය සේවා සපයන්නා සතුව ඇති පුද්ගලික දත්තවල ඇති ඕනෑම වරදක් නිවැරදි කරන ලෙස ඉල්ලා සිටීමටද ඔබට අයිතියක් ඇත.

ඉහත කරුණු සැලකිල්ලට ගෙන, මෙම මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි යටතේ, ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ හානිකර, අසාධාරණ හෝ වංචාසහගත ක්‍රියාකාරකම් වලින් ඔබව ආරක්ෂා කිරීම සඳහා නිර්මාණය කර ඇති පුළුල් පරාසයක අයිතිවාසිකම් ඔබට ලබා දී ඇත. මෙම ආරක්ෂණයන් ඔබට සාධාරණ ලෙස සලකනු ලබන බවත්, විනිවිද පෙනෙන තොරතුරු වෙත ප්‍රවේශය ඇති බවත්, දැනුවත් තීරණ ගත හැකි බවත්, පැමිණිලි විසඳීමට සහ අවශ්‍ය විටෙක පිළියම් සෙවීමට මාර්ග ඇති බවත් සහතික කරයි. මෙම ආරක්ෂණ බොහෝ විට නියාමන රාමු තුළ අන්තර්ගත වී ඇති බැවින්, ශ්‍රී ලංකාවේ සියලුම මූල්‍ය පාරිභෝගිකයින් සඳහා ආරක්ෂිත, වඩාත් සාධාරණ මූල්‍ය පරිසරයක් නිර්මාණය කිරීමට මූල්‍ය සේවා සපයන්නන් උපකාරී වේ.

මූල්‍ය නිපැයුම් භාවිතා කිරීමේදී මූල්‍ය පාරිභෝගිකයින්ගේ වගකීම්

මූල්‍ය නිපැයුම් සහ සේවා භාවිතා කිරීමේදී මූල්‍ය පාරිභෝගිකයින්ට ද වගකීම් ඇත. මෙම වගකීම් මගින් ඔබ දැනුවත් තීරණ ගැනීම, මූල්‍ය සේවා වගකීමෙන් යුතුව භාවිතා කිරීම සහ ඔබේ මූල්‍ය යහපැවැත්ම පවත්වා ගැනීම සහතික කෙරේ. මූල්‍ය පාරිභෝගිකයින්ගේ ප්‍රධාන වගකීම් කිහිපයක් පහත දැක්වේ.

- ඔබේ දැරිය හැකි ආපසු ගෙවීමේ සීමාව ඉක්මවා ණය ගැනීමෙන් වැළකී සිටීම.
- ආපසු ගෙවීම් හෝ වාරික හිඟ බවට පත්වීමට ඉඩ නොදිය යුතුය.
- ණය ආපසු ගෙවීමේදී ඔබට දුෂ්කරතා ඇත්නම් මූල්‍ය සේවා සපයන්නන් වෙත දැනුම් දිය යුතුය.
- ලිපිනය සහ සම්බන්ධ වීමේ තොරතුරු වල යම් වෙනසක් වුවහොත් ඒ පිළිබඳව මූල්‍ය සේවා සපයන්නන් වෙත දැනුම් දිය යුතුය.
- ගිවිසුමට එළඹීමට පෙර පිරිනමනු ලබන නිපැයුම/සේවාව පිළිබඳ සම්පූර්ණ දැනුම සහ අවබෝධය ලබා ගැනීම.
- ඕනෑම ලේඛනයක් අත්සන් කිරීමට පෙර ප්‍රවේශමෙන් කියවීම.
- කිසිදු හිස් කඩදාසියක අත්සන් නොකල යුතුය.
- මූල්‍ය ආයතන සමඟ කරන සියලුම ගනුදෙනු වලදී පූර්ණ සැලකිල්ලක් දැක්විය යුතුය.ග

6.2. පිරමිඩ යෝජනා ක්‍රම අවබෝධ කර ගැනීම

ඉගෙනුම් අරමුණු

- පිරමිඩ යෝජනා ක්‍රම හඳුනා ගැනීම.
- පිරමිඩ යෝජනා ක්‍රම ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව අවබෝධ කර ගැනීම.
- ශ්‍රී ලංකාවේ නීතිමය සහ නියාමන රාමුව හඳුනා ගැනීම.
- මූල්‍ය සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම තුළින් පිරමිඩ යෝජනා ක්‍රමවලට එරෙහිව. ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම.

මෙම පිරමිඩ යෝජනා ක්‍රම මොනවාද?

"පිරමිඩ යෝජනා ක්‍රමයක්" යනු යෝජනා ක්‍රමයේ සහභාගිවන්නන්ගේ සංඛ්‍යාවේ වැඩිවීම හෝ යෝජනා ක්‍රමයේ සහභාගිවන්නන් විසින් කරන ලද දායකත්වයේ වැඩිවීම මත පදනම්ව සහභාගිවන්නන්ට ප්‍රතිලාභ ලැබෙන යෝජනා ක්‍රමයකි.

පිරමිඩ යෝජනා ක්‍රම ක්‍රියාත්මක වන ආකාරය

පහත උදාහරණය ඇසුරෙන් පිරමීඩ යෝජනාක්‍රම ක්‍රියාත්මක වන ආකාරය විමසා බලමු.

ඊයේ උදෑසන ධනංජයට ඔහුගේ පාසල් කාලයේ මිතුරෙකු වූ සකුණ මුණගැසුණි. සකුණ ඔහුට මාසිකව රුපියල් දහස් ගණනක් උපයා ගත හැකි ආකර්ෂණීය ව්‍යාපාරික අවස්ථාවක් හඳුන්වා දෙයි. යෝජනා ක්‍රමය දිග හැරෙන ආකාරය සකුණ පහත දැක්වෙන ආකාරයෙන් පැහැදිලි කළේය.

පියවර 1: මූලික ආයෝජනය

යම් පිරිසක් විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණයකට සහභාගී වන ලෙස ධනංජයට ආරාධනා කරන ලදී. එහිදී ඔහුව යම් නිෂ්ක්‍රීය ආදායමක් උපයා ගැනීමේ මාර්ගයක් ගැන දැනුවත් කරන ලදී. ඒ සඳහා පහත දැක්වෙන සරල අවශ්‍යතා සපුරාලිය යුතු විය.

- මේ සඳහා සම්බන්ධ වීමට "සාමාජික ගාස්තුව" ලෙස රු. 5,000 ක් ගෙවිය යුතුය.
- ධනංජය විසින් ඔහු යටතේ වෙනත් අය බඳවා ගතහොත් ඔහුට කොමිස් මුදලක් ලැබෙනු ඇත.

ධනජය වැඩි වැඩියෙන් පුද්ගලයින් බඳවා ගන්නා තරමට ඔහුට වැඩි මුදලක් උපයාගත හැකි බව සංවිධායකයින් අවධාරණය කළහ. මෙහිදී, විකිණීමට භෞතික නිෂ්පාදනයක් නොමැති අතර මුදල් හුවමාරුවක් පමණක් සිදු බවත් අනාගතයේදී ලැබෙන ආදායම වර්ධනය වන බවට පොරොන්දු විය.

පියවර 2: යෝජනා ක්‍රමයට අන් අය බඳවා ගැනීම

එකඟ වූ පරිදි යෝජනා ක්‍රමය ඉදිරියට ගෙන යාම සඳහා, ධනංජය තවත් මිතුරන් තිදෙනෙකු (අමර, සමන් සහ පියුමි) සම්බන්ධ කළේය. ඔවුන් විසින් යෝජනා ක්‍රමයට සම්බන්ධ වීමට රු. 5,000 බැගින් ද ගෙවනු ලැබීය. ධනංජය විසින් හඳුන්වාදෙන සෑම පුද්ගලයෙක් සඳහාම, ඔහු විසින් රු. 1,000 ක් බැගින් උපයන අතර, මෙම මිතුරන් තිදෙනා වෙනුවෙන් ඔහුට රු. 3,000 ක් ලැබුණි.

ධනංජය ඔහු විසින් යෝජනා ක්‍රමයට හඳුන්වා දුන් මිතුරන් තිදෙනාගේ (අමර, සමන් සහ පියුමි) මිතුරන් සම්බන්ධ කරගනිමින් වැඩි පිරිසක් ගෙන්වා ගැනීමට ඔවුන්ව දිරිමත් කරනු ලැබීය. ඔවුන් යමෙකු සම්බන්ධ කරන සෑම අවස්ථාවකම, යම් ගාස්තුවක් ධනංජය සහ යෝජනා ක්‍රමයේ සංවිධායකයින් වෙත ගලා යයි.

පියවර 3: ඝාතීය වර්ධනය (exponential growth) (කාලයත් සමඟ සිදුවන වැඩිවීම)

අමර, සමන් සහ පියුමි විසින් තිදෙනෙකු බැගින් බඳවා ගත් අතර, ඒ එක් අයෙකු විසින් රු. 5000 බැගින් වූ සම්බන්ධ වීමේ ගාස්තුව ගෙවන ලදී. එම නව සම්බන්ධවීම් නවයේදීම ධනංජයට කොමිස් මුදලක් බැගින් ලැබිණ. ඒ අනුව, ධනංජය යටතේ ඔහු විසින් හඳුන්වා දුන් සම්බන්ධතා හරහා යෝජනා ක්‍රමයට එකතු වන සෑම නව සම්බන්ධතාවකදීම ධනංජයට සහ ඔහු යටතේ සම්බන්ධ වූ පුද්ගලයින්ට කොමිස් මුදලක් බැගින් ලැබේ. මේ ආකාරයෙන් ධනංජය වෙත ලැබෙන ආදායම ක්‍රමයෙන් එකතුවන නව සම්බන්ධතා සමඟ වැඩි වේ.

පියවර 4: ඝාතීය වර්ධනයේ බිඳවැටීම

මෙම යෝජනා ක්‍රමය තිරසාරව පවත්වාගෙන යාමට නම්, වැඩි වැඩියෙන් පුද්ගලයින් සම්බන්ධ විය යුතුය. මෙය ගැටළු සහගත වන්නේ:

- ඉදිරි සහභාගිවන්නන් සංඛ්‍යාව සීමිත වීම.
- යෝජනා ක්‍රමය වර්ධනයත් සමඟ අනාගත සාමාජික සංඛ්‍යාව අඩු වීම ආරම්භ වීම.

අවසානයේදී, බඳවා ගැනීම් සොයා ගැනීමට නොහැකි වූ විට යෝජනා ක්‍රමය බිඳ වැටේ. ඉහළ මට්ටමේ සිටින පැරණිම සාමාජිකයින්ට සහ සංවිධායකයින්ට විශාල මුදලක් ලැබෙන අතර බොහෝ පහළ මට්ටමේ සාමාජිකයින්ට සැලකිය යුතු මූල්‍ය පාඩු සිදු වේ. යෝජනා ක්‍රමය බිඳ වැටෙද්දී, සංවිධායකයින් ඉතා විශාල මුදලක් රැගෙන පලා යනු ලැබේ. පහළ මට්ටමේ සාමාජිකයින්ට තමා විසින් ආයෝජනය කරනු ලැබූ මුදලවත් නොලැබී යයි.

දැන් අපි, මෙම නීති විරෝධී යෝජනා ක්‍රමයට හසු වූ තරුණයෙකු වන ධනංජය කෙරෙහි ඇති වන බලපෑම හඳුනා ගනිමු.

- ඔහුගේ සම්බන්ධතා (සමීප මිතුරන්) පාවා දුන් බවක් මිතුරන්ට හැඟෙන නිසා ධනංජයගේ කීර්ති නාමයට හානි සිදු කරමින් ඔවුන් ඔහුව හැර යා හැකිය.
- ධනංජය ට ඔහු විසින් ගෙවනු ලැබූ මුදල් ආපසු ලබා ගැනීමට තරම් ප්‍රමාණවත් පුද්ගලයින් බඳවා ගැනීමට නොහැකි වූ නිසා ඔහුගේ රු. 5,000 ක ආයෝජනය අහිමි වේ.
- නීති බලධාරීන් මෙම යෝජනා ක්‍රමය විමර්ශනය කරන අතර, නීති විරෝධී පිරමීඩ ව්‍යුහයක් ප්‍රවර්ධනය කිරීම හේතුවෙන් ධනංජයට දඬුවම්වලට මුහුණ දීමට සිදුවිය හැකිය.

පිරමීඩ යෝජනා ක්‍රම හඳුනා ගැනීමට උපදෙස්:

වැඩි උත්සාහයකින් තොරව ඉක්මනින් පොහොසත් වීමට හැකි යැයි පෙනෙන, යෝජනා ක්‍රමයකට සම්බන්ධ වීමට ආරාධනා කරමින් කෙනෙකු ඔබ වෙත කවදා හෝ පැමිණ තිබේද?

ප්‍රවේශම් වන්න. එය පිරමීඩ යෝජනා ක්‍රමයක් විය හැකි අතර ඒවා ශ්‍රී ලංකාව තුල නීති විරෝධී ක්‍රියාවක් වේ.

පිරමීඩ යෝජනා ක්‍රම සම්බන්ධයෙන් පහත දැක්වෙන ලක්ෂණ පිළිබඳව ආයෝජකයින් දැනුවත් විය යුතු බව ශ්‍රී ලංකා මහ බැංකුව පවසයි.

1. ව්‍යාජ හෝ යථාර්ථවාදී නොවන ප්‍රතිලාභ සඳහා පොරොන්දු වීම. (වේගවත් ප්‍රවර්ධන තුලින් සාමාජිකයින් බඳවා ගැනීම)
2. වෙළඳපල ඉල්ලුමක් පවත්වාගත නොහැකි භාණ්ඩ හා සේවා මිල දී ගැනීමට සිදු වීම.
3. මිලදී ගත් භාණ්ඩය නැවත විකිණීම හෝ ආපසු ලබා දීම සිදු නොවීම.
4. යෝජනා ක්‍රමයට ඇතුළත් වීමේ ගාස්තුව අසාමාන්‍ය ලෙස ඉහළ අගයක් ගැනීම.
5. කොමිස් හෝ ගෙවීම් විකුණුම් මත නොව නව බඳවා ගැනීම් මත රඳා පැවතීම.
6. ප්‍රධාන වශයෙන් භාණ්ඩ හෝ සේවා විකිණීමට වඩා බඳවා ගැනීම් කෙරෙහි අවධානය යොමු කිරීම.
7. ව්‍යාපාරික ස්ථානය සහ අදාළ සම්බන්ධතා තොරතුරු සොයා ගැනීමට අපහසු වීම.
8. විකුණුම් හෝ බඳවා ගැනීම් සඳහා නිසි පුහුණු අවස්ථා ලබා නොදීම.
9. මෙහෙයුම් ප්‍රදේශ නිශ්චිතව දක්වා නොමැති වීම.
10. නිසි පාරිභෝගික සේවාවන සැපයීමක් නොමැති වීම.

පිරමීඩ යෝජනා ක්‍රම වර්ග

පිරමීඩ යෝජනා ක්‍රම වර්ග දෙකක් තිබේ.

1. ශූන්‍ය පිරමීඩ යෝජනා ක්‍රම - බඳවා ගැනීමට ඇතුලත්වීමේ ගාස්තුවක් පමණක් අය කෙරේ.
2. නිෂ්පාදන මත පදනම් වූ පිරමීඩ යෝජනා ක්‍රම - භාණ්ඩ හෝ සේවා විකිණීමෙන් පුද්ගලයින් බඳවා ගැනීම.

ශූන්‍ය පිරමීඩ යෝජනා ක්‍රමයකදී කිසිදු නිෂ්පාදනයක් පිරිනමනු නොලැබේ. ඉහත දැක්වූ ධනංජයගේ උදාහරණය ශූන්‍ය පිරමීඩ යොජනා ක්‍රමයකි. ශූන්‍ය පිරමීඩ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ වැඩි විස්තර සොයා බලමු.

ශූන්‍ය පිරමීඩ යෝජනා ක්‍රමයක ව්‍යුහය

- යම් ප්‍රවර්ධකයෙකු විසින් පුද්ගලයින් 10 දෙනෙකු (පළමු වන මට්ටම) සම්බන්ධ වීමට අවශ්‍ය වන යෝජනා ක්‍රමයක් ආරම්භ කරන්නේ යයි සිතමු. මෙහිදී එක් එක් පුද්ගලයා රු. 100 බැගින් දායක විය යුතු බව පවසයි.
- පළමු වන මට්ටමේ සිටින සෑම පුද්ගලයෙකුම අමතර පුද්ගලයින් 10 දෙනෙකු (මට්ටම 2) බඳවා ගත යුතු අතර, එම දෙවන මට්ටමට සම්බන්ධ වන සෑම පුද්ගලයෙකුමත් රු. 100 බැගින් ගෙවිය යුතුය.
- බඳවා ගැනීමේ සහ ගෙවීම් ක්‍රියාවලිය, මට්ටම් හරහා සිදුවන අතර, එක් එක් සහභාගිවන්නා තවත් සහභාගිවන්නන් 10 දෙනෙකු බඳවා ගැනීම සඳහා වගකිව යුතුය.

හය වන මට්ටමෙන් පසු, ඊළඟ මට්ටම සඳහා යෝජනා ක්‍රමයට සහභාගිවන්නන් සංඛ්‍යාව 1,111,110 ක් වන අතර, එය නව බඳවා ගැනීම සඳහා යථාර්ථවාදී නොවන, තවදුරටත් සාක්ෂාත් කරගත නොහැකි ඉලක්කයක් බවට පත් වේ.

නව සහභාගිවන්නන් තවදුරටත් බඳවා ගත නොහැකි වන විට, පිරමීඩය බිඳ වැටෙන අතර, බහුතරයක් වූ පහළ මට්ටම් වල සහභාගිවන්නන්ට ප්‍රතිලාභ ලබා ගැනීමේ හැකියාව අහිමිව යයි.

නිෂ්පාදන මත පදනම් වූ පිරමීඩ යෝජනා ක්‍රමය බොහෝ අවස්ථාවන්හිදී බහු මට්ටමේ අලෙවිකරණ (පමකඑස-කැඩැක ජ්රනැඑසබට) හෝ ජාල අලෙවිකරණ (බැඑඅදරන ජ්රනැඑසබට) යෝජනා ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වේ. එහිදී සහභාගිවන්නෙකුට වෙළඳපල පවතින මිලට වඩා විශාල ලෙස අධික මිලකට නිෂ්පාදනයක් මිලදී ගැනීමට සිදු වේ.

- නිෂ්පාදනයක් විකිණීමේ අයිතිය ලැබේ.
- යෝජනා ක්‍රමයට නව සාමාජිකයින් බඳවා ගැනීම වෙනුවෙන් ප්‍රතිලාභයක් ලබා ගැනීමේ අයිතිය ලැබේ.

බඳවා ගැනීම් මන්දගාමී වූ විට හෝ නතර වූ විට, පිරමීඩය කඩාගෙන වැටෙන අතර ඉහල මට්ටම් වලට මුදල් ප්‍රේෂණය වීම නතර වේ. එවිට තව දුරටත් පිරමීඩය පවත්වාගෙන යාම අපහසු වේ. එවිට බොහෝ පහල මට්ටම්වල සහභාගිවන්නන්ට නිෂ්පාදන විකිණීමට හෝ ඔවුන්ගේ ආයෝජන ආපසු අයකර ගැනීමට නොහැකි වන අතර, එමගින් විශාල මූල්‍යමය පාඩු සිදු වේ.

ඉහත විස්තර කල පරිදි, පිරමිඩ යෝජනා ක්‍රම කාලයත් සමග ස්වාභාවිකවම අද වැටී විනාශ වී යන්නේ, බොහෝ පහළ මට්ටම්වල සිටින සාමාජිකයන්ට මූල්‍ය පාඩු සිදු කරමිනි. ඊට අමතරව, ස්වභාවික විනාශයට පෙර වුවද, නීතිමය මැදිහත් වීම හේතුවෙන්, පිරමිඩ යෝජනා ක්‍රම සාමාජිකයින්ට මූල්‍ය පාඩු සහ දඬුවම් හිමි කරමින් අකර්මන්‍ය විය හැක.

පිරමීඩ යෝජනා ක්‍රමයක සැබෑ තත්වය අවබෝධ වී තිබියදීත්, මුල් මට්ටම් වලට සම්බන්ධ වී අධික ප්‍රතිලාභයක් ලැබිය හැකි පහසු ක්‍රමයක් ලෙස මෙම යෝජනා ක්‍රම පෙනෙන්නට පුළුවන. එහෙත්, විවිධ මට්ටම් වල සිට අලුත් සාමාජිකයින් සම්බන්ධ කර ගැනීමට උත්සාහ කරන බොහෝ සාමාජිකයින් සිටින බැවින්, ඔබ සම්බන්ධ වීමට යන මට්ටම පැහැදිලි ලෙස හඳුනා ගැනීමට නොහැකි වනු ඇත. ඒ අනුව, ඔබ සම්බන්ධ වන්නේ, පිරමිඩයේ ඉහල මට්ටමකට යයි නොමඟ යාමේ හැකියාව ඇත.

ඒ ආකාරයෙන්, යෝජනා ක්‍රමයේ ආයෝජනය කර ඇති ඔබේ සියලු මුදල් පළමු දිනයේදීම ඔබට අහිමි විය හැකිය. එබැවින්, මෙම යෝජනා ක්‍රමවලට සම්බන්ධ වීම කිසිසේත්ම නිර්දේශ කළ නොහැක.ග

වෙනත් මූල්‍ය වංචා

ඉහත සඳහන් කළ පිරමිඩ යෝජනා ක්‍රමවලට අමතරව, ඊට සමාන පසුබිම්වලින් යුත් වෙනත් මූල්‍ය වංචා සිදු විය හැක.

ආයෝජන යෝජනා ක්‍රම (පොන්සි යෝජනා ක්‍රම)

පොන්සි යෝජනා ක්‍රමයක් යනු වංචනික ආයෝජන ක්‍රමවේදයක් වන අතර එය නීත්‍යානුකූල ලාභ වෙනුවට නව ආයෝජකයින්ගේ ප්‍රාග්ධනය භාවිතා කරමින් පෙර ආයෝජකයින්ට ප්‍රතිලාභ ගෙවනු ලබන වංචනික ආයෝජන ක්‍රමයකි. පොන්සි යෝජනා ක්‍රමයකදී, පසුව සහභාගිවන්නන් පෙර ආයෝජකයින්ගේ ප්‍රතිලාභ සඳහා අරමුදල් සපයයි.

උදාහරණයක් ලෙස, පුද්ගලයෙකු ආයෝජන සඳහා ඉහළ ප්‍රතිලාභ පොරොන්දු වන අතර ආයෝජකයින්ගෙන් දායක වන ලෙස ඉල්ලා සිටී.

ඉන්පසු ඔවුන් නව ආයෝජකයින්ගෙන් ලැබෙන අරමුදල් පෙර ආයෝජකයින්ට ප්‍රතිලාභ ගෙවීමට භාවිතා කරයි. මෙසේ, ලාභදායී ව්‍යාපාරයක මායාව නිර්මාණය කරයි.

නව ආයෝජකයින් සංඛ්‍යාව වර්ධනය වන තාක් කල්, යෝජනා ක්‍රමය දිගටම කරගෙන යා හැකි අතර නව මුදල් ගලා ඒම නතර වූ පසු එය බිඳ වැටෙනු ඇත.

ශ්‍රී ලංකාවේ පොන්සි යෝජනා ක්‍රම නීති විරෝධී වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබා නොගෙන කිසිදු පුද්ගලයෙකුට තැන්පතු භාර ගත නොහැකි බැවිනි.

තෑගි කව හෝ දාම තෑගි

මෙය සමහර සංස්කෘතීන්වල "ආශිර්වාද වියමන්" හෝ "කාන්තා කව" ලෙසද හැඳින්වේ. මෙම වංචාවේ දී සහභාගිවන්නන් විසින් කණ්ඩායමේ අනෙක් අයට මුදල් හෝ තෑගි පරිත්‍යාග කරනු ලබයි. පැරණි සාමාජිකයන් විසින් යෝජනා ක්‍රමය වර්ධනයත් සමග සැලකිය යුතු ප්‍රතිලාභ අපේක්ෂා කරනු ලබයි. විශ්වාසදායක මිතුරෙකු හෝ පවුලේ සාමාජිකයෙකු විසින් ආරාධනා කිරීම හේතුවෙන් සාමාන්‍යයෙන් මෙවැනි කවයන්ට සම්බන්ධ වීම සිදු විය හැකි බැවින් මෙම ආකාරයේ වංචනික පද්ධති ගැන ප්‍රවේශම් විය යුතුය.

උදාහරණයක් ලෙස, කවයේ සිටින සෑම සහභාගිවන්නෙකුගෙන්ම නිශ්චිත මුදලක් (උදා: රු.1,000) කවයේ මූලිකයා ලෙස කටයුතු කරන පුද්ගලයාට පරිත්‍යාග කරන අතර ඉහළින් සිටින සාමාජිකයන් හට ඔවුන්ට පහලින් සිටින සෑම සහභාගිවන්නෙකුගෙන්ම දායක මුදලක් ගෙවනු ලබයි. මෙම දායකයින් හට තවත් අය කවයට එකතු කිරීමට දිරිමත් කරනු ලැබේ. මැද සිටින මූලික පුද්ගලයා බඳවා ගත් අයගෙන් සියලුම තෑගි එකතු කරගෙන, යෝජනා ක්‍රමයෙන් ඉවත් වී, ඊළඟ ස්ථරය වෙත නව කව සෑදීමට ඉඩ ලබා දෙයි. ඒ ආකාරයෙන් විකාශනය වන පද්ධතියක සෑම කෙනෙකුටම ලාභ ලැබීම සඳහා ගුණාකාර ලෙස (ඝාතීය) (exponential) බඳවා ගැනීම් අවශ්‍ය වේ. නමුත්, එවැන්නක් වැඩි කාලයක් තිස්සේ පවත්වාගෙන යා නොහැක.

මෙම තෑගි කවවලින් සමහරක් පිහිටුවා ඇත්තේ චිත්තවේගීය(emotional) හා සංස්කෘතික(cultural) ආයාචනයන් සහිත ප්‍රජා සත්කාරක සේවාවන්ට සහාය දක්වන බව ඇඟවීමෙන් බව දැන ගත යුතුය. එනම් කාන්තා බලගැන්වීම, සමීප ප්‍රජාවන් තුළ ධනය ගොඩනැගීම සහ අන්‍යෝන්‍ය සහයෝගය වැනි වටිනාකම් අරමුණු ලෙස තබා ගෙන මෙවැනි තෑගි කව සංවිධානය කරනු ලැබේග

ක්‍රිප්ටෝ මුදල් යෝජනා ක්‍රම :Cryptocurrency Schemes)

ප්‍රවර්ධකයින් යථාර්ථවාදී නොවන ප්‍රතිලාභ පොරොන්දු වෙමින් තිරසාර නොවන ව්‍යාපාර ආකෘති සඳහා ආයෝජකයින් බඳවා ගැනීම සඳහා blockchain හෝ crypto-ආශ්‍රිත වාග් මාලාව භාවිතා කරයි. උදාහරණ ලෙස ව්‍යාජ crypto කාසි, ආයෝජන සැලසුම් හෝ mining යෝජනා ක්‍රම ඇතුළත් වේ.

Do You Know: Participating in Pyramid Schemes is a Punishable Offence in Sri Lanka

1988 අංක 30 දරන බැංකු පනතේ 83C වගන්තියේ විධිවිධානවලට පටහැනිව යෝජනා ක්‍රමයක් සෘජුව හෝ වක්‍රව ආරම්භ කරන, පිරිනමන, ප්‍රවර්ධනය කරන, ප්‍රචාරය කරන, මෙහෙයවන, මූල්‍යකරණය කරන, කළමනාකරණය කරන හෝ මෙහෙයවන ඕනෑම පුද්ගලයෙකු දඬුවම් ලැබිය හැකි වරදකට වරදකරු වේ.

එවැනි වැරදි සඳහා දඬුවම් අතරට වසර තුනක් නොඉක්මවන කාලයක් සඳහා සිර දඬුවමක් හෝ රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයක් හෝ සිර දඬුවමක් සහ දඩයක් යන දෙකම ඇතුළත් වේ..

වරදක් හිතාමතා හෝ දැනුවත්ව සිදු කර ඇති අවස්ථාවක, හෝ එම ක්‍රියාවෙන් වෙනත් ඕනෑම පුද්ගලයෙකුට හානියක් හෝ හානියක් සිදුවන බව දැන දැනම සිදු කර ඇති අවස්ථාවක, ඔහුට/ඇයට වසර තුනකට නොඅඩු සහ වසර පහකට නොවැඩි කාලයක් සඳහා දැඩි සිර දඬුවමක් සහ යෝජනා ක්‍රමයේ සහභාගිවන්නන්ගෙන් ලැබුණු බවට හෙළි කරන ලද හෝ හෙළිදරව් කරන ලද ශ්‍රී ලංකා මුදලින් ලබාගත් මුළු මුදල මෙන් රුපියල් මිලියන දෙකක හෝ දෙගුණයක දඩයක් හෝ ඊට වැඩි මුදලකට යටත් විය හැකිය.

ඒ අනුව, නීතියෙන් දඬුවම් ලැබිය හැකි එවැනි ක්‍රියාකාරකම්වලින් වළකින ලෙස මහජනතාවට දැනුම් දෙනු ලැබේ'.

පිරමීඩ යෝජනා ක්‍රම දිගටම පවතින්නේ ඇයි?

ලැජ්ජාවට පත්වීම හේතුවෙන් වින්දිතයින්ගේ නිහඬ වීම-	මුදල් අහිමි වූ පුද්ගලයින් රැවටීමට ලක්වීම ගැන ලැජ්ජාවට පත් වීම නිසා කරුණු හෙළි කිරීමෙන් වැළකී සිටිති. ඔවුන් තමන්ටම දොස් පවරාගනිමින් සැඟවී සිටිති.
පුනරාවර්තන බලපෑම	පිරමීඩයක පහළ ස්ථරවල සිටින පුද්ගලයින් නිරන්තරයෙන් "එන, යන" ආකාරයෙන් වෙනස් වෙමින් පිරමීඩය පවත්වාගෙන යාමට උදව් වේ. එනම්, ඉවත් වන පරාජිතයින්ව නව සාමාජිකයින් විසින් ප්‍රතිස්ථාපනය කරනු ලැබේ.
ඇතැම් ප්‍රවර්ධකයින් රජයේ නිලධාරීන්ට බලපෑම් කරමින් තම කූට ව්‍යාපාරය කරගෙන යනු ලබයි.	ඔවුන් බොහෝ විට දේශපාලන පක්ෂවලට අරමුදල් සපයමින් සදාචාර විරෝධී ලෙස තම කටයුතු වෙනුවෙන් ඉඩ හසර සකස් කර ගනිති.
ප්‍රවර්ධකයින් විසින් සැබෑ තොරතුරු සැඟවීම	ප්‍රවර්ධකයින් විසින් බහුතරයක් සාමාජිකයින්ට ලැබෙන අඩු ප්‍රතිලාභය ගැන හෙළි නොකර පිරමීඩ යෝජනා ක්‍රමයෙන් උපයා ඇති අතළොස්සක් වූ සාමාජිකයන් ගේ (බොහෝ විට ප්‍රවර්ධකයින් විසින්ම) අධි ප්‍රතිලාභ කෙරෙහි පමණක් අවධානය යොමු කරවනු ලබයි.
යෝජනා ක්‍රමයේ සංකීර්ණත්වය	ප්‍රවර්ධකයින් විසින් හිතාමතාම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන ආකාරය සංකීර්ණ ලෙස හුවා දක්වනු ලබන අතර සම්බන්ධ වීමට අදාළ නීතිද සංකීර්ණභාවයක් සහිතව පැහැදිලි කරනු ලැබීම නිසා සාමාන්‍ය පුද්ගලයාට එහි සැබෑ ස්වභාවය තේරුම් ගැනීමට අපහසු වේ.ග

පිරමීඩ යෝජනා ක්‍රම නිසා සිදුවන හානිය

- එහි සැලසුම අනුව, පිරමීඩ යෝජනා ක්‍රමවලට සහභාගී වන විශාල සංඛ්‍යාවක් (සාමාන්‍යයෙන් 90%-99%) පාඩු ලබන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එවැනි යෝජනා ක්‍රම බිඳවැටීම නොවැළැක්විය හැකිය. අවසානයේ දී, එවැනි යෝජනා ක්‍රම බිඳවැටීම සමාජ නොසන්සුන්තාව සහ ප්‍රචණ්ඩත්වයට පවා හේතු වී තිබේ.

- යෝජනා ක්‍රමයට මිතුරන් හා සබඳතා බඳවා ගැනීමට පුද්ගලයින් නැඹුරු වන බැවින්, යෝජනා ක්‍රමය බිඳ වැටීම මානව සබඳතා අවුල් කර විශ්වාසය විනාශ කරයි. පිරමීඩ යෝජනා ක්‍රම, දික්කසාද වීමට සහ සියදිවි නසා ගැනීමට පවා හේතු වී ඇති බව දන්නා කරුණකි.

- පිරමීඩ යෝජනා ක්‍රමවල නියැලී සිටින සමහර අය දැනටමත් මූල්‍යමය වශයෙන් අවදානමට ලක්ව ඇති අය විය හැකි බැවින්, යෝජනා ක්‍රමය බිඳ වැටුණු විට ඔවුන් දරිද්‍රතාවයට ඇද වැටීමට ඉඩ ඇත. පිරමීඩයේ පහළින් සිටින විශාල සංඛ්‍යාවෙන් ඉහළින් සිටින කිහිප දෙනෙකුට අරමුදල් මාරු කරන මෙම යෝජනා ක්‍රමවල මහා පරිමාණ මෙහෙයුම් හේතුවෙන් රටක ආදායම් බෙදා හැරීමේ සැලකිය යුතු වෙනසක් සහ අසමානතාවයේ වැඩි වීමක් ද සිදුවිය හැකිය.

- පිරමීඩ යෝජනා ක්‍රමවලට සහභාගී වන පුද්ගලයින් ඒ සඳහා මූල්‍ය ආයතනවලින් පවා විශාල ණය ලබා ගැනීම සිදු කරයි. යෝජනා ක්‍රමය බිඳවැටීම නිසා එවැනි මහා පරිමාණ ණය පියවීම පැහැර හැරීම හේතුවෙන් ආර්ථිකයේ මූල්‍ය ස්ථාවරත්වයටද තර්ජනයක් වනු ඇත.

- පිරමීඩ යෝජනා ක්‍රමයකට සහභාගී වීම සඳහා විදේශ මුදල් වලින් ගෙවීමට සිදුවුවහොත්, එවැනි පිරමීඩ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වීම හේතුවෙන් රටකින් විදේශ විනිමය සැලකිය යුතු ලෙස ගලා යා හැකිය. මෙය විනිමය අනුපාතයේ අස්ථාවරත්වය, ගෙවුම් ශේෂ ගැටළු සහ රටේ විදේශ විනිමය සංචිත අඩුවීමට හේතු විය හැක.

- පිරමීඩ යෝජනා ක්‍රමවල සහභාගිවන්නන්ට යෝජනා ක්‍රමයෙන් ලැබෙන අනාගත ආදායම පිළිබඳ අපේක්ෂාව මත පදනම්ව භාණ්ඩ හා සේවා සඳහා ඇති ඉල්ලුම වැඩි විය හැකිය. මෙය ආර්ථිකයේ උද්ධමනය ඇති වීමට සහ ගෙවුම් ශේෂය පිරිහීමට හේතු විය හැක (ආනයන සඳහා ඇති ඉල්ලුම වැඩිවීම හේතුවෙන්). යෝජනා ක්‍රමයේ නොවැළැක්විය හැකි බිඳවැටීමත් සමඟ, බොහෝ පුද්ගලයින්ට දැඩි පාඩු සිදුවනු ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ඉල්ලුමේ පහළ යෑමක් සිදුවිය හැකි අතර එය අවධමනය සහ නිෂ්පාදනය අඩුවීමට හේතු විය හැකිය.

- පිරමීඩ යෝජනා ක්‍රම මඟින් ආර්ථිකයක ඉතුරුම් සහ ආයෝජන කෙරෙහි බලපෑම් කරනු ඇති අතර, සහභාගිවන්නන් තම ඉතුරුම් භාවිතා කරමින් ඵලදායී වත්කම්වල නිරත වීමට වඩා එවැනි යෝජනා ක්‍රමවල ආයෝජනය කරයි. එමඟින් මානව සම්පත් සහ කාලය වැනි සම්පත් වැරදි ලෙස වෙන් කිරීමට ද හේතු විය හැකි අතර, එමඟින් නිෂ්පාදන රැකියාවෙන් ඉවත් වී පූර්ණ කාලීනව මෙම යෝජනා ක්‍රමවල නිරත වන පුද්ගලයින් හේතුවෙන් රටේ සමස්ත නිෂ්පාදනයට ඍණාත්මක බලපෑමක් ඇතිවිය හැකිය.

පිරමීඩ යෝජනා ක්‍රම හඳුනා ගන්නේ කෙසේද?

බොහෝ පිරමිඩ යෝජනා ක්‍රම වර්තමානයේ බහු මට්ටමේ හෝ ජාල අලෙවිකරණ යෝජනා ක්‍රම ලෙස ක්‍රියාත්මක වේ. එබැවින්, එවැනි යෝජනා ක්‍රම ප්‍රවර්ධනය කිරීම නීති විරෝධී බැවින්, එවැනි යෝජනා ක්‍රමවලට සහභාගී වීම ගැන ජනතාව ප්‍රවේශම් විය යුතුය. පිරමිඩ යෝජනා ක්‍රම හඳුනා ගැනීමට ඔබට උපකාර වීම සඳහා පහත උපදෙස් ඉදිරිපත් කෙරේ.

1) සුළු උත්සාහයකින් ඔබට විශාල මුදලක් උපයා ගත හැකි බව පවසන ඕනෑම අයෙකුගෙන් ප්‍රවේශම් වන්න. ඔවුන් නිසැකවම ඔබට සත්‍යය නොකියන අතර ඔබව රවටා වංචා කිරීමට උත්සාහ කරති. ඔබට මුදල් අහිමි වීම පමණක් නොව, වංචාව සම්බන්ධයෙන් නීතිමය නඩු පැවරීමට පවා සිදුවනු ඇත.

2) නිෂ්පාදනයක් අධික මිලකට (නිෂ්පාදනයේ අභ්‍යන්තර වටිනාකමට වඩා වැඩි) විකුණන සහ අනෙකුත් ගැනුම්කරුවන් බඳවා ගැනීම සඳහා කොමිස් ලබා දෙන ඕනෑම විකුණුම් සැලැස්මකින් වළකින්න. මුදල් ආපසු ගෙවීමේ සහතිකයක් ඇතුළත් වුවද, මුදල් ආපසු ලබා ගැනීම සඳහා යටත් වීමට සිදුවන කොන්දේසි වලට එකඟ විය නොහැකි බැවින් ප්‍රවේශම් වන්න.

3) ඔබ විසින් යම් යෝජනා ක්‍රමයකට එකතු කරන සම්බන්ධතාවල අඛණ්ඩ වර්ධනය හරහා ඔබට ගුණාකාරයක් ලෙස (ඝාතීය) (exponentially) ලෙස මුදල් ඉපයිය හැකි බව පවසන සැලසුම් ගැන ප්‍රවේශම් වන්න. එනම්, ඔබ විසින් කරන ලද විකුණුම් පරිමාව වෙනුවට ඔබ විසින් බඳවා ගන්නා පුද්ගලයින් සංඛ්‍යාව අනුව කොමිස් ගෙවීම් මෙයින් අදහස් වේ.

4) භාණ්ඩ විකිණීම වෙනුවට බඳවා ගැනීම් මත පදනම් වූ සැලසුම් වලින් වළකින්න. ප්‍රවර්ධකයින් විසින් ලබාදෙන, භාණ්ඩ විකිණීම වෙනුවට සාමාජිකයින් බඳවා ගැනීම පිළිබඳව පුහුණු හෝ අභිප්‍රේරණ සම්මන්ත්‍රණ වලින් වළකින්න.

5) ඔබට භාණ්ඩයක් විකිණීමට උත්සාහ කරන විකුණුම්කරුවන් තම ආදායමෙන් වැඩි කොටසක් භාණ්ඩ විකිණීමෙන් උපයන බවට කිසිදු සාක්ෂියක් නොමැති නම්, එම සැලසුම් වලින් ඉවත් වන්න.

    නීත්‍යානුකූල ජාල අලෙවිකරණ (legal network marketing) යෝජනා ක්‍රමවලින් විකුණන නිෂ්පාදන සහ සේවා ක්‍රමවත් බෙදාහරින්නන්ගේ ජාලයක් හරහා පමණක් පිරිනමනු ලබයි. බෙදාහරින්නන්ට ගෙවන ඕනෑම කොමිස් මුදලක් අවසාන පරිශීලකයින්ට විකුණන භාණ්ඩ හා සේවා හා සම්බන්ධ වේ. යෝජනා ක්‍රමයට අන් අය බඳවා ගැනීමේ අයිතිය ලබා ගැනීම වෙනුවෙන් කිසිදු කොමිස් මුදලක් ගෙවනු නොලැබේ. අවසානයට මිලදී ගන්නා භාණ්ඩයේ සැබෑ පරිශීලකයා වන අතර නැවත විකිණීමක් සිදු කිරීමට නොමැති වීම, පිරමිඩ යෝජනා ක්‍රමයක් සැබෑ බහු මට්ටමේ අලෙවිකරණ යෝජනා ක්‍රමයකින් වෙන්කර හඳුනාගත හැකි ප්‍රධාන ලක්ෂණයයි.

6) අලෙවිකරණ සැලැස්මකට සහභාගී වීමෙන් තමන් විසින් අධික ලාභ උපයාගෙන ඇති බව කියා සිටින පුද්ගලයින්ගේ රැවටිලිකාර විකුණුම් ප්‍රවර්ධනයන් වලින් ප්‍රවේශම් වන්න. ප්‍රවර්ධකයන් විසින් මෙම පුද්ගලයින්ට එසේ කිරීම සඳහා මුදල් ගෙවා තිබිය හැකිය.

7) කිසිදු සම්මන්ත්‍රණයකදී හෝ වෙනත් මූල්‍ය ආතතියකින් පසුවන අවස්ථාවකදී හෝ අලෙවිකරණ යෝජනා ක්‍රමයකට සහභාගී වීම සඳහා ගෙවීම් කිරීම හෝ ගිවිසුම් අත්සන් කිරීම නොකරන්න. යෝජනා ක්‍රමයට සම්බන්ධ වීමට පෙර එය පිරමීඩ යෝජනා ක්‍රමයක් විය හැකිද යන්න හොඳින් සලකා බලා බැංකුකරුවෙකු වැනි දැනුමැති පුද්ගලයෙකු සමඟ ඒ පිළිබඳව සාකච්ඡා කරන්න.

8) අන්තර්ජාලය හරහා හෝ විද්‍යුත් තැපෑල (e-mail) හරහා එවනු ලබන අනවශ්‍ය "ව්‍යාපාරික අවස්ථා" සහ "ඉක්මනින් පොහොසත් වන්න" යන යෝජනා ක්‍රමවලට නොරැවටීමට වගබලා ගන්න. විද්‍යුත් වාණිජ්‍යයේ (e-commerce) වර්ධනයත් සමඟ, පිරමීඩ යෝජනා ක්‍රම ක්‍රියාකරුවන් සාපේක්ෂව අඩු වියදමකින් ගෝලීය වශයෙන් නව සහභාගිවන්නන් ආකර්ෂණය කර ගැනීම සඳහා විද්‍යුත් මාධ්‍ය වැඩි වැඩියෙන් භාවිතා කරනු ලබයි.

9) රහසිගත සැලසුම් හෝ විදේශීය සම්බන්ධතා හෝ සුවිශේෂී පුද්ගලයන් හෝ ආයතන සමඟ ඇති සබඳතා ගැන පවසමින් ප්‍රවර්ධනය කරනු ලබන යෝජනා ක්‍රම ගැන ප්‍රවේශම් වන්න.



අන්තර්ජාල හරහා ක්‍රියාත්මක වන සමහර යෝජනා ක්‍රම, ඒවා නීත්‍යානුකූල යෝජනා ක්‍රම බව සාධාරණීකරණය කිරීමට උත්සාහ කරමින් පහත දක්වා ඇති සාධක සඳහන් කරමින් ආයෝජකයින් මුදල් තැන්පත් කිරීමට/මෙම යෝජනා ක්‍රමවල ආයෝජනය කිරීමට නොමඟ යවන බවට, ශ්‍රී ලංකා මහ බැංකුවට (ශ්‍රීබ) මෑතකදී මහජන පැමිණිලි රාශියක් ලැබී තිබේ.

- මෙම යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා මහ බැංකුවේ රෙගුලාසිවලට අනුකූලව ආයෝජකයින්ගේ අරමුදල් ආරක්ෂා කරයි";
- මෙම යෝජනා ක්‍රමය රජයට අදාළ බදු ගෙවයි;
- යෝජනා ක්‍රමවලට සහභාගී වන අය අරමුදල් ආපසු ගැනීම සඳහා ඔවුන්ගේ අරමුදල්වලින් ශ්‍රී ලංකා මහ බැංකුවට පුද්ගලික ආදායම් බද්දක් ගෙවිය යුතු අතර එසේ නොවුවහොත් ඔවුන්ගේ අරමුදල් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අත්හිටුවනු ලැබේ;
- මෙම යෝජනා ක්‍රමය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සාකච්ඡා පවත්වා ඇත

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉහත ප්‍රකාශ දැඩි ලෙස ප්‍රතික්ෂේප කරන අතර, මෙම ප්‍රකාශවල කිසිදු සත්‍යතාවයක් නොමැති බව ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාවට දැනුම් දෙයි.ග

තහනම් යෝජනා ක්‍රමවලට එරෙහිව සටන් කිරීමේදී මහජනතාවගේ වගකීම් මොනවාද?

- වංචනික ක්‍රියාකාරකම්වලට හසු නොවීම,
- නීතිය සහ ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්ට වහාම වාර්තා කිරීම සහ
- දැනුවත් වීම සහ අනෙකුත් පුද්ගලයින් ද දැනුවත් කිරීම,
- සෘජුව හෝ වක්‍රව වංචනික පිරමිඩ යෝජනා ක්‍රම ආරම්භ කිරීම, පිරිනැමීම, ප්‍රවර්ධනය කිරීම, ප්‍රචාරණය කිරීම, හැසිරීම, මූල්‍යකරණය, කළමනාකරණය කිරීම හෝ මෙහෙයවීම සිදු නොකළ යුතුය.

පිරමීඩ ආකාරයේ යෝජනා ක්‍රම පිළිබඳව මහජනතාව වාර්තා කරන්නේ කොතැනටද?

The public can complain to the

- ළඟම ඇති පොලිස් ස්ථානයට හෝ
- ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවට පැමිණිලි කළ හැකිය

ලිපිනය:

අධ්‍යක්ෂ,
මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
අංක 30, ජනාධිපති මාවත, කොළඹ - 01.
දුරකථන අංක: 0112477966 $ 1935
විද්‍යුත් තැපෑල:dfcrd@cbsl'lk

පිරමීඩ යෝජනා ක්‍රම වළක්වා ගැනීමට උපදෙස්: සුපරීක්ෂාකාරී ගනුදෙනුකරුවෙකු වන්න

ඔබ මෑතකදී පිරමීඩ යෝජනා ක්‍රම වලට මුහුණ දී ඇත. එසේත් නොමැති නම් ඔබේ ආදරණීයන්, සමීප මිතුරන් සහ පවුලේ සාමාජිකයන් පිරමීඩ යෝජනා ක්‍රමවලට හසුවී පීඩාවට පත්ව සිටිනවා විය හැකිය. එසේ පුද්ගලයින් පීඩාවට පත්වීම වැළැක්වීම සඳහා මූල්‍ය යෝජනා ක්‍රමවල ආයෝජනය කිරීමේදී ඔබ සලකා බැලිය යුතු වැදගත් සාධක කිහිපයක් අපි පරීක්ෂා කර සිටිමු.

- යෝජනා ක්‍රමයේ හෝ ආයතනයේ කාර්යය නීත්‍යානුකූලද යන්න සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා සුදුසු බලධාරීන්ගෙන් හෝ නියාමකයින්ගෙන් අවශ්‍ය අවසර සහ අනුමැතීන් ලබා තිබේද යන්න සොයා බැලීම.

- ගනුදෙනුකරුවන් හෝ සහභාගිවන්නන් වන්දි, කොමිස්, ප්‍රසාද දීමනා, වට්ටම් සහ වෙනත් ප්‍රතිලාභ වලින් ලාභ ලබන ආකාරය දැක්වෙන සවිස්තරාත්මක ව්‍යාපාර සැලැස්මක් ඔවුන් සතුව තිබේදැයි තහවුරු කරගන්න.

- යෝජනා ක්‍රම මගින් පිරිනමනු ලබන ප්‍රතිලාභ සහ ප්‍රතිලාභ අනුපාතය වෙළඳපොලේ ඇති ඊට සමාන සැලසුම්/ප්‍රතිලාභ සමඟ සංසන්දනය කිරීම වඩා සුදුසුය.

  ▶ යෝජනා ක්‍රමයේ විවිධ අංශ පිළිබඳව තොරතුරු ලබා ගැනීම සඳහා නියෝජිතයින්ගෙන් පහත ප්‍රශ්න අසන්න.

  - මිල, ගුණාත්මකභාවය, නිෂ්පාදනවල ලක්ෂණ, නිෂ්පාදන ලබා ගැනීමේ හැකියාව ආදිය ඇතුළුව පිරිනමනු ලබන නිෂ්පාදනයේ හෝ සපයනු ලබන සේවාවේ ස්වභාවය.
  - සමාගම එහි පිහිටීම, ලිපිනය, සම්බන්ධතා තොරතුරු ආදිය ඇතුළුව සමාගම පිළිබඳ මූලික තොරතුරු.
  - වෙළඳපොළේ ඇති සමාන නිෂ්පාදන හෝ සේවාවන් මොනවාද?
  - වෙළඳපොළේ ඒ හා සමාන නිෂ්පාදනයක් සහ සේවාවක් ලබා දෙන අනෙකුත් ව්‍යාපාර සැලසුම්වල ස්වභාවය.

- අලෙවියෙන් පසු සේවා/පාරිභෝගික සත්කාර සේවා ලබා ගැනීමේ හැකියාව සහ පාරිභෝගික ආරක්ෂාව සම්බන්ධයෙන් සාධාරණ සහ අදාළ නියමයන් සහ කොන්දේසි සොයා බලන්න.

- අදාළ පාර්ශවයන් සමඟ ගිවිසුම්වලට එළඹීමේදී නීතිමය බැඳීම් ඇතුළුව අවශ්‍ය සියලු තොරතුරු ලබා ගැනීමෙන් විනිවිදභාවය සහතික කිරීම.

- පහසුවෙන් සහ ඉක්මනින් මුදල් උපයා ගැනීමට නීතිමය/වලංගු ක්‍රම නොමැති බැවින්, අන්තර්ජාලය හරහා හෝ විද්‍යුත් තැපෑල හරහා ලබාදෙන "ව්‍යාපාරික අවස්ථා" සහ "ඉක්මනින් පොහොසත් වන්න" ආදී කූඨ යෝජනා ක්‍රමවලට නොරැවටෙන්න.

- අවම මහන්සියක් සහිත අඩු අවදානම් හෝ අවදානම් රහිත ආයෝජන අවස්ථා වලින් ප්‍රවේශම් වීම ඔබගේ සමාජ වගකීමක් ලෙස සැලකීම. එමෙන්ම, කෙනෙකුගේ සුදුසුකම්, කුසලතා සහ නායකත්ව ගුණාංග පිළිබඳ අවබෝධ කර ගැනීමෙන් බොහෝ විට එම පුද්ගලයාගේ ඉපැයීමේ ධාරිතාව තීරණය කර ගත හැක.

7 වන පරිච්ඡේදය

බදු සාක්ෂරතාව

7.1 හැඳින්වීම

ඉගෙනුම් අරමුණු

- බදු යනු කුමක්ද, සහ අප විසින් බදු ගෙවිය යුත්තේ ඇයි යන්න තේරුම් ගැනීම.
- බදුකරණයේ මූලධර්ම තේරුම් ගැනීම.
- ”බදු යනු ජාතියක ජීවනාලිය” ලෙස හඳුන්වන්නේ ඇයිදැයි තේරුම් ගැනීම.
- බදු හඳුනාගැනීමේ අංකය (TIN අංකය) සහ එය ලබා ගන්නේ කෙසේද යන්න ගැන ඉගෙන ගැනීම.
- ශ්‍රී ලංකාවේ පවතින විවිධ වර්ගයේ බදු දැන ගැනීම.
- ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා බදුකරණය සහ අදාළ සම්මත ආදායම් බදු තේරුම් ගැනීම.
- එකතු කල අගය මත බදු අනුපාත තේරුම් ගැනීම.

බදු යනු මොනවාද?

1. තනි පුද්ගලයන් සහ ව්‍යාපාර ඒකක මගින් තම ආදායම්, ලාභ, ධනය හෝ පරිභෝජනය මත පදනම්ව රජයට කරනු ලබන අනිවාර්යය ගෙවීම් බදු ලෙස හැඳින්වේ.

2. බදු යනු පුරවැසියන් තමන්ගේ මුදල් රජය විසින් කෙසේ වියදම් කරනු ලබන්නේදැයි පිළිබඳව රජයේ වගවීම ඉල්ලීමේ යාන්ත්‍රණයක් හෝ මෙවලමකි.

3. බදු යනු පුද්ගලයන්ගෙන් හෝ සංස්ථාවලින්, දේශීය, ප්‍රාදේශීය හෝ ජාතික මට්ටමින් රජය විසින් අනිවාර්ය ලෙස අයකරන මුදල් දායකත්වයකි.

4. බදු ආදායම්වලින් රජයේ ක්‍රියාකාරකම් සඳහා මුදල් සැපයෙයි. එම කටයුතු අතර මහජන වැඩ සහ සේවා"උදාහරණ ලෙස මාර්ග, පාසැල් සහ ළමුන් සඳහා පෝෂණය වැනි වැඩසටහන්.

බදු ගෙවන්නේ ඇයි?

බදු ගෙවීම හරහා, මාර්ග, පාලම්, දුම්රිය මාර්ග ජාලය වැනි යටිතල පහසුකම් සලසන ව්‍යාපෘති සහ අධ්‍යාපනය සහ සෞඛ්‍යය වැනි මහජන සේවාවන් සඳහා අරමුදල් සැපයීමට බදු ගෙවන්නා දායක වේ.

බදු අයකිරීමේ අරමුණු විවිධ කාණ්ඩවලට වෙන් කළ හැකිය. බහුලව භාවිතා වන කාණ්ඩවලට ඇතුළත් වන්නේ:

1. රජයේ යටිතල පහසුකම් සහ හමුදාව වැනි රජයේ කාර්යයන් සැපයීම;
2. අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා වැනි වෙනත් පොදු භාණ්ඩ සහ සේවා සැපයීම;
3. විශ්‍රාම වැටුප් සහ වයස්ගත ජනගහනය සඳහා සහාය වැනි සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාවට නැංවීම.
4. නැවත බෙදාහැරීමේ කාර්යයන් හරහා වැඩි සමානාත්මතාවයක් ඇති කිරීම; සහ
5. සමාජයේ හැසිරීම් මාර්ගෝපදේශනය කිරීම (බදු ඔස්සේ පිළිගත හැකි සහ පිළිගත නොහැකි හැසිරීම් පිළිබඳ මාර්ගෝපදේශනයක් ලබා දිය හැකි බැවින්)

බදු අය කිරීම හරහා රජයට බොහෝ සමාජ හා ආර්ථික අරමුණු සපුරාලිය හැකිය.

1. ආයෝජන සඳහා බදු ප්‍රතිලාභ හරහා ඉතුරුම් සහ ප්‍රාග්ධන සම්පාදනය දිරිමත් කිරීම
2. එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කර ගැනීම තුළින් තිරසාර සංවර්ධනයක් ඇති කිරීම.
3. සහනදායී බදු අනුපාත හරහා කුඩා පරිමාණ ව්‍යාපාර දිරිමත් කිරීම.
4. ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ සූර්ය පැනල සවි කිරීම සඳහා බදු අඩු කිරීම් හරහා හරිත බලශක්ති ප්‍රභවයන් භාවිතය දිරිමත් කිරීම
5. අයවැය හිඟය අඩු කිරීම හරහා මූල්‍ය ප්‍රතිසංස්කරණ සිදු කිරීම
6. පසුගාමී ප්‍රදේශවල ආයෝජන සඳහා බදු සහන මගින් කලාපීය සංවර්ධනය දිරිමත් කිරීම.

බදු අය කිරීම සම්බන්ධ මූලධර්ම සතර:

1. **ආදායම :** Revenue සේවා සඳහා වියදම් කිරීමට අරමුදල් එකතු කිරීම
2. **නැවත බෙදාහැරීම:** Redistribution ධනවතුන්ගෙන් දුප්පතුන්ට ධනය මාරු කිරීම
3. **නැවත මිල නියම කිරීම:** Repricing පරිභෝජනය දිරිමත්/අධෛර්යමත් කිරීම
4. **නියෝජනය:** Representation පාලකයන් පුරවැසියන්ට බදු පනවයි, පසුව ඔවුන් වගවීම ඉල්ලා සිටී

සාධාරණ බදුකරණයේ මූලධර්ම

(1) මධ්‍යස්ථභාවය

(2) සාධාරණත්වය

(3) ප්‍රගතිශීලීත්වය

(4) සරල බව

(5) ස්ථාවරත්වය

(6) පහසුව

පවුලේ අය රාත්‍රී ආහාරය සඳහා රැස්ව සිටින අතර ගෝතම් ඔහුගේ මිතුරා නිරංජන් විසින් බදු ගෙවීමේ වැදගත්කම පිළිබඳව නිර්මාණය කරන ලද මාර්ගගත වීඩියෝවක් ගැන විස්තර කරයි.

ගෝතම්	අද මම ඔයාලට මගේ යාළුවා නිරංජන් මාත් එක්ක බෙදාගත්ත රසවත් වීඩියෝවක් පෙන්වන්න හිතන් ඉන්නවා. මේකෙන් පෙන්නන්නේ බදු වලින් හම්බවෙන ආදායමෙන් පාරවල්, රාජ්‍ය පාසල්, රෝහල් වගේම තවත් ජනතා පහසුකම් හැනෙන හැටි.
ධනංජය	මේකනම් මරු.
ගෝතම්	ඔව්. මම පාසලේ අවුරුදු 13ක් ඉගෙන ගත්තේ අතින් කිසිම මුදලක් වියදම් නොකරමයි. රාජ්‍ය විශ්වවිද්‍යාලයක ඉගෙන ගන්න මගේ පාසල් යාළුවන්ට අය වෙන්නෙ සුළු මුදලක් පමණයි. ගිය සතියේ නගරයට ගියාම මගේ පාසල් යාළුවන් කීපදෙනෙක් දැක්කා. ඔවුන් පෞද්ගලික විශ්වවිද්‍යාල වල ඉගෙන ගන්නවා. ඉගෙනීම් ගාස්තු, ඇතුළත්වීමේ ගාස්තු, ක්ෂේත්‍ර චාරිකා වියදම්, තාක්ෂණික ගාස්තු වගේ සැළකිය යුතු ගාස්තු ප්‍රමාණයක් ඒගොල්ලොන්ට ගෙවන්න වෙනවා. මේ වියදම් ගොඩක් වැඩියි. වියදම් අතින් පෞද්ගලික පාසල්, රජයේ පාසල් වලට වඩා අවම වශයෙන් 5 සිට 10 ගුණයක් වියදම් වැඩියි. ඒ නිසා බොහෝ පවුල් වලට ඒවාට ප්‍රවේශ වෙන්න තියෙන හැකියාව අඩුයි. පෞද්ගලික පාසල්වල කාර්තුවකට ගාස්තු රුපියල් තිස් දහසකින් පටන්ගෙන ලක්ෂ පහක් වත් යාවි. පෞද්ගලික විශ්වවිද්‍යාලවල පාඨමාලා වලට කාර්තුවකට ගාස්තු ලක්ෂ තුනේ සිට ලක්ෂ පහ අතර වුනාම මුළු පාඨමාලා ගාස්තු මිලියන දෙකකට වඩා ගෙවන්න වෙනවා.
අනුෂා	ඒක ඇත්තද? ඒත් රජය කොහොමද මේ තරම් දරුවන් ගොඩකට නොමිලේ අධ්‍යාපනය ලබා දෙන්නේ ?
අනිල්	ඔව්, අපිට රජයේ පාසල් 10,000ක් විතර තියෙනවා. ඒවල ඉගෙන ගන්නව ලක්ෂ 40කට ආසන්න ගණනක ළමයි. එහෙම බැලුවම,රජයට ඉතා ඉතා විශාල වියදමක් දරන්න වෙනවා. මේවා ඉතා විශාල සංඛ්‍යාවන්, අපේ ගමේම ළමයින් සංඛ්‍යාව වගේ විශාල ගුණයක්.
අනුෂා	මේකනම් හරිම ප්‍රහේලිකාවක්. මෙහෙ මම දන්න හැම ළමයෙකුම මේ රජයේ පාසලට තමයි ගියේ, ඒත් බදු ගෙවන කෙනෙක් මේ ගමේ දකින්නවත් අමාරුයි.
ධනංජය	ඇත්තටම ඔව්. අපි සෘජුවම බදු ගෙවන්නේ නැති වුණත්, රජය අපෙන් සෘජු නොවන විදිහට බදු අරගන්න ගොඩක් ක්‍රම තියෙනව. ඒව ගැන මම පස්සෙ කියන්නම්. නොමිලේ අධ්‍යාපනයටවගේම අනෙකුත් සේවාවන් වලටත් හැම කෙනෙකුටම ප්‍රතිලාභ ලබා දෙන්නේ මේ ආදායමයි.
ගෝතම්	උදාහරණයක් විදියට බලන්න අපේ අසල්වැසි ගම,හබරකඩ. ඒ ගමේ විදේශ වලට ගිහින් පදිංචි වෙලා ඉන්න වෘත්තිකයින් ගොඩක් ඉන්නවා. ඒගොල්ලො නිතරම ඒ අයගෙ පවුල්වලට සල්ලි එවලා, ගමේ ව්‍යාපාර වලටත් ආයෝජනය කරනවා. ඒ නිසාම ගම දැන් ගොඩක් දියුණු වෙලා" හුඟාක් සජීවී වෙළඳපොලක්, ලොකු වෙළඳසැල්, හොඳ පහසුකම් තියෙනවා. හබරකඩේ ජනතාව ගෙවපු බදු වලින් තමයි ඔවුන්ට ලොකු පාසලක්, ප්‍රජාවට වෙනම විශේෂ රෝහලක් තනාගන්නත් පුළුවන් වුණේ.
අයෝධ්‍ය	පොදු සේවා වලට සල්ලි යොදවන එකද බදු වලින් කරන එකම කාර්යභාරය?
ගෝතම්	කොහෙත්ම නැහැ ! සමාජීය සහ ආර්ථික අරමුණු වෙත ළඟා වෙන්නත් බදු කියන්නේ හොඳ මෙවලමක්
අනුෂා	බදු සහන කියන්නෙ ඇත්තටම මොනාද ?
අනිල්	බදු සහන, බදු අඩු කිරීමේ අනුපාත හෝ බදු විරාම කියල හඳුන්වන සම්පූර්ණ බදු නිදහස් කිරීම් ආකාරයෙන් තියෙන්න පුළුවන්. ඒවා ලබා දෙන්නේ සමහර හැසිරීම් සහ ක්‍රියාකාරකම් දිරිගන්වන්නයි.
ධනංජය	ආ ඒක මරු. බදු වලින් මිනිස් හැසිරීම් වලටත් බලපෑම් කරන්න පුළුවන් කියලා මම දැනන් ඉඳියෙ නැහැනේ. දුම්කොළ මත්පැන්වලට වැඩියෙන් බදු අය කරන එක හොඳයි. ඒවා කුඩා, මහලු හැමෝටම සෞඛ්‍ය ගැටලු ගොඩක් ඇති කරනවා. සූදු පවත්වාගෙන යන සමාගම් ගැන කොටසත් සිත්ගන්නාසුළුයි. මමත් දැකලා තියෙනව නගරේ ළමයි පැය ගානක් වීඩියෝ ක්‍රීඩා සෙල්ලම් කර කර ඉන්න වීඩියෝ. ඒ ළමයින්ට ඉගෙනීම් වැඩ කරගන්න අමාරුයි කියලා නම් මට සහතිකවම කියන්න පුළුවන්.
අනුෂා	විශේෂයෙන්ම තරුණ මනසට එය ඉතා භයානක පුරුද්දක්.
ධනංජය	ඇත්ත. ඒ වගේම තමයි, ක්‍රීඩා සමාගම්වලට වීඩියෝ ක්‍රීඩා නිර්මාණකරුවන් විතරක් නෙමෙයි 40% ක ඉහළ බදු අනුපාතයට කැසිනෝ ක්‍රියාකරුවන් ද ඇතුළත් වෙනවා. මේ විදියට ඔට්ටු අල්ලන සහ ක්‍රීඩා පවත්වාගෙන යන සමාගම් ඒගොල්ලොන්ගෙ සාධාරණ ආදායම් බදු කොටස රජයට ගෙවනවා කියල සහතික කරගන්න රජය උත්සාහ කරනවා. ඒ විතරක් නෙමෙයි, ධනය ආපහු බෙදාහැරල ආර්ථික සමානාත්මතාවය සහ සාධාරණත්වය බදු වලින් ප්‍රවර්ධනය කරනවා. වැඩි ආදායමක් ඇති අය වැඩියෙන් බදු ගෙවනවා. වඩාත් සමබර සමාජයක් නිර්මාණය කරන්න ඒක උපකාරී වෙනවා.

අනුෂා	ඒක සාධාරණයි වගේ පේනවා. ඒත් ධනවතුන් වැඩි බදු ගෙව්වයි කියල ධනය අහිමි වෙනවා කියල විශ්වාස නැත. මා දකින දෙය නම්, ධනවතුන් සහ දුප්පතුන් ඔවුන් ගෙවන හෝ ඉතිරි කරන බදු ප්‍රමාණය තිබියදීත් ඔවුන් සිටින ආකාරයටම රැඳී සිටීමයි.
අනිල්	එහෙම වෙන්නත් පුළුවන්. හැබැයි ප්‍රශ්නය තියෙන්නෙ වැඩි බදු ගෙවන්නෙ වැඩිපුරම ධනවතුන්, ඒකෙන් රජයට ලැබෙන ආදායමට ඔවුන් වැඩි දායකත්වයක් දෙනවා. දුප්පත් අයත් බදු ගෙවුවත්, ගොඩක් අඩුවෙන්. ඔවුන්ට තමන්ගේ ජීවිතය පවත්වාගෙන යන්න සාක්කු හිස් නොවෙන්නත් ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපුරගන්න ප්‍රමාණවත් වෙන්න ඉතිරි කරන්නත් තරමට.

ජාතියක ජීවනාලිය ලෙස 'බදු'

බදු යනු මාර්ග, දුම්රිය, පාසල්, රෝහල්, හදිසි සේවා ආදිය භාවිතා කිරීම සඳහා අප ගෙවන දෑ ය.

පොදු සේවාවන් සැමට ලබා ගත හැකි අතර පුද්ගලික භාණ්ඩ හා සේවා ඒවා අයිති අයට හෝ ගෙවීම් කර ලබාගන්නා අයට සීමා වේ. රජයේ පාසල් 10,096 ක් සහ ප්‍රාථමික සත්කාර සඳහා රජයේ රෝහල් 550 ක් පමණ සාමාන්‍ය ගෘහස්ත කටයුතු සඳහා අඩු වියදමකින් අධ්‍යාපනය සහ වෛද්‍ය ප්‍රතිකාර සපයයි.

බදු මගින් දුම්කොළ සහ මධ්‍යසාර භාවිතය වැනි සෞඛ්‍ය උවදුරු අධෛර්යමත් කළ හැක.



බදු මගින් සූර්ය පැනල භාවිතය සඳහා දිරිගැන්වීම් හරහා හරිත බලශක්ති ප්‍රභවයන් දිරිමත් කළ හැක.

බදු වලින් ලැබෙන ආදායම තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට උපකාරී වේ.

ඉතුරුම් සහ ප්‍රාග්ධන ගොඩනැගීම බදු මගින් ප්‍රවර්ධනය කරයි.

කෙටි ප්‍රශ්නාවලිය/ ඇගයීම

1. බදු ගෙවන්නන්ගේ අරමුදලින් ක්‍රියාත්මක වන ඔබ වටා ඇති පොදු අත්‍යවශ්‍ය (උපයෝගිතා) සේවා 5ක් නම් කරන්න.
2. ඒ හා සමාන සේවාවන් සපයන පෞද්ගලික ආයතනවලට වඩා ඔවුන් වෙනස් වන්නේ කෙසේද?
3. බදු සහන භුක්ති විඳින අංශ 3ක් ලැයිස්තුගත කරන්න.
4. ජනගහනයේ ශාරීරික සෞඛ්‍යය දියුණු කිරීම සඳහා බදුවලට දායක විය හැකි ආකාර 3ක් ලැයිස්තුගත කරන්න.
5. කාන්තාවන්, ග්‍රාමීය ව්‍යාපාර සහ අනෙකුත් වරප්‍රසාද නොලත් කණ්ඩායම්වල ආර්ථික සවිබල ගැන්වීම සඳහා අවස්ථා ලබා දීම හරහා බදු මගින් සාධාරණත්වය වැඩිදියුණු කළ හැකි ආකාර 3ක් ලැයිස්තුගත කරන්න.

7.2. බදු හඳුනා ගැනීමේ අංකය (TIN)

බදු හඳුනා ගැනීමේ අංකය (TIN අංකය) යනු කුමක්ද?

බදු ගෙවීමට හෝ ආනයනය/අපනයනය කිරීමට හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) මගින් ඕනෑම සේවාවක් ලබා ගැනීමට, 'බදු ගෙවන්නන් හඳුනාගැනීමේ අංකයී හෙවත් ටින් (TIN අංකය) අත්‍යවශ්‍ය වේ.

IRDහි විද්‍යුත් සේවා භාවිතයෙන් හෝ IRD ප්‍රධාන කාර්යාලයේ 2වන මහලේ හෝ ඕනෑම ප්‍රාදේශීය කාර්යාලයක ප්‍රාථමික ලියාපදිංචි කිරීමේ ඒකකයට පැමිණීමෙන් TIN අංකය ලබා ගත හැක.

TIN අංකය ලබා ගත හැකි පුද්ගලයින් ලෙස තනි පුද්ගලයන්, හවුල් ව්‍යාපාර, ආයතනික සහ වෙනත් අය ඇතුළත් වේ.

TIN අංකය ලබා ගැනීමේ ක්‍රියාවලිය සරලයි.

පහත සඳහන් ලියකියවිලි පුද්ගලයන් විසින් ඉදිරිපත් කළ යුතුයි. -

(i) ජාතික හැඳුනුම්පත/වලංගු රියදුරු බලපත්‍රය/ජ්‍යෙෂ්ඨ පුරවැසි හැඳුනුම්පත. විදේශීය පුරවැසියන් වලංගු ගමන් බලපත්‍රයක් ඉදිරිපත් කළ යුතුය.

(ii) ව්‍යාපාරයේ ලියාපදිංචි කිරීමේ සහතිකය (හිමිකාරත්වය එකතු කළ යුතු නම්).

(iii) උපයෝගිතා බිල් / ස්ථාවර දුරකථන බිල් / බැංකු ගිණුම් ප්‍රකාශනය හෝ බැංකු පොත /ග්‍රාම නිලධාරී සහතිකය (ලිපිනය ජාතික හැඳුනුම්පතට වඩා වෙනස් නම්). විදේශිකයන් සඳහා දේශීය ලිපින සාක්ෂි අවශ්‍ය වේ.

TIN අංකය අංකයක් තිබීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? අවශ්‍යතාවය සහ ප්‍රතිලාභ

වයස අවුරුදු 18 හෝ ඊට වැඩි පුද්ගලයින් සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන් සඳහා TIN අංකය ලබා ගැනීම 2024 ජනවාරි 1 වනදා සිට අනිවාර්ය වේ.

TIN අංකය ලබාදීම අනිවාර්ය කර ඇති අවස්ථා -

1. ඕනෑම බැංකු ගිණුමක් විවෘත කිරීම.
2. ගොඩනැගිලි සැලැස්මක් සඳහා අනුමැතිය ලබා ගැනීම.
3. මෝටර් රථයක් ලියාපදිංචි කිරීම සහ බලපත්‍රයක් අලුත් කිරීම.
4. ඉඩමක් හෝ ඉඩමේ හිමිකමක් ලියාපදිංචි කිරීම

දැනට වාහන බලපත්‍ර අලුත් කිරීමේදී මෙම විධිවිධාන ක්‍රියාත්මක නොවන නමුත් මෙම විධිවිධාන නීතියේ කොටසකි.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ (IRD) මූලස්ථානයේ සේවය කරන බාහිර රාජ්‍ය නිලධාරිනියක වන ප්‍රනාන්දු මහත්මිය විසින් අමතන ලද ප්‍රාදේශීය කාන්තාවන්ගේ රැස්වීමකින් පසු අනුෂා ආපසු පැමිණ ඇත. ප්‍රනාන්දු මහත්මිය ගමේ පාසලේ විදුහල්පතිවරයාගේ මිතුරියක් වන අතර, 2024 ජනවාරි 1 වැනිදා සිට අනිවාර්ය වී ඇති TIN අංකය ලියාපදිංචිය සම්බන්ධයෙන් නව නීතිමය විධිවිධාන පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම මෙම සංචාරයේ අරමුණ විය.

අන්තර් ක්‍රියාකාරී භූමිකා නිරූපණය -

ප්‍රනාන්දු මහත්මිය	මතක තියාගන්න, 2024 ජනවාරි 1 වෙනිදාට පස්සේ වයස අවුරුදු 18න් ඉහළ හැමෝම TIN අංකයට ලියාපදිංචි වීම අනිවාර්යයයි. ඔයාට TIN අංකයට apply කරන්න ඔන්ලයින් ඔස්සේම හෝ පෞද්ගලිකව ගිහිල්ලත් පුළුවන්. නැත්තං පෝරමය තැපෑලෙන් යවන්නත් පුළුවන්.
ලලිතා	ඔව් හරි, මම කියෙව්වා TIN අංකයට ලියාපදිංචි වෙන්න අසමත් වුණොත්, රුපියල් 50,000ත් වෙන තුරු දඩයක් ගෙවන්න සිද්ද වෙන්න පුළුවන් කියලා. TIN mandatory for DMT services from April 15
රෝහිනී	ඒත් ප්‍රනාන්දු මහත්මිය, මම මෝටර් රථ කාර්මික ශිල්පියෙක්. මගේ ආදායමත් මාසෙට රුපියල් ලක්ෂයක් තරම්වත් නැහැ. ඒ වුණත් TIN අංකයකට අයදුම් කරන්න ඕනද?
කමලා (සිල්ලර බඩු වෙළඳසැල් හිමි)	ඒකම තමයි මගේ ප්‍රශ්නයත්. අපේ ගමේ අයගෙ ආදායම් ගොඩක් අඩුයි. අපි TIN අංකයට ලියාපදිංචි වුණා කියලා හරි, බදු ගෙව්වා කියලා හරි, එයින් වෙනසක් තියෙනවද? මගේ රැකියාවෙන් ලැබෙන අඩුම අඩු ආදායමෙන් බදු ගෙවන්න තරම් කාරණාවක් මට පේන්නෙ නැහැ. ඒ බදු මුදල් ඇත්තටම හොඳ දේවල්වලට යොදවනවද?
ප්‍රනාන්දු මහත්මිය	හොඳ ප්‍රශ්නයක්. හැබැයි මතක තියාගන්න "මේ ආදායම් සීමා ඒ ඒ වෙලාවට වෙනස් වෙන්න පුළුවන්. වාර්ෂික අයවැය තුනින් ඒවා යාවත්කාලීන වෙනවා. ඒක නිසා හොඳම දේ තමයි IRD (ආදායම් බදු දෙපාර්තමේන්තුව) වෙබ් අඩවියෙන් නවතම අනුපාත බලාගන්න එක. Sri Lanka Tax Calculator වගේ මෙවලම් තියෙනවා හොඳට ගණන් කරගන්න. Sri Lanka Tax Calculator 2024 | iCalculator™ LK

ඒ හැර, ඔයාගෙ වටපිටාව බලන්න - ළමයින් නොමිලේ අධ්‍යාපනය ලබන ගමේ පාසල, ඖෂධසාලාවෙන් නොමිලේ මූලික සෞඛ්‍ය සේවාව, තැපැල් කාර්යාලය,සහ වෙනත් පොදු පහසුකම් - මේ හැම දෙයක්ම ආරම්භ වෙලා තියෙන්නෙ රජය අරන් තියෙන බදු මුදල් වලින්. ඒ නිසා, අපිට තියෙන්නෙ ප්‍රජා වගකීමක් විදියට බදු ගෙවන්න. ඒවගේම රජය ඒ මුදල් විනිවිදභාවයෙන් යුක්තව, කාර්යක්ෂමව භාවිතා කරනවාද කියල සහතික කරන එක අපගේ පුරවැසි වගකීමක්. අපි බදු සම්බන්ධ සාක්ෂරතාව ව්‍යාප්ත කරන්න ඕනෙ. ඒ වගේමයි බදු අක්‍රමිකතා සහ අපරාධ ගැන පැමිණිලි කරල, ඒවා අධෛර්යමත් කරන එකත් අවශ්‍ය වෙනවා.

TIN අංකය ගැන කතා කරොත්, TIN අංකය අයදුම් කරන එක නීතියෙන් විතරක් නෙවෙයි, මේ සේවාවන් වලටත් අනිවාර්යයි:

1. ඕනෑම බැංකු ගිණුමක් අරිනකොට,
2. ගොඩනැගිලි සැලැස්මකට අනුමැතිය ගන්නකොට,
3. මෝටර් රථයක් ලියාපදිංචි කරනකොටත්, බලපත්‍රයක් අලුත් කරන කොට,
4. ඉඩමක් හෝ ඉඩමේ හිමිකමක් ලියාපදිංචි කරනකොට.
5. TIN අංකයක් නැතිව මේ කියපු ප්‍රතිලාභ ලබා ගන්න බෑ.

කමලා — ස්තූතියි. ඒත්, අපේ මුළු ව්‍යාපාරයම ගොඩක්ම අත්පිට මුදල්(කෑෂ්) වලින් කරනවනම්, අපි බැංකු ගිණුමක් විවෘත කරන්නේ මොකටද?

ප්‍රනාන්දු මහත්මිය — ඒක දැනට ඇතිවෙයි. හැබැයි ඉස්සරහ ගැන හිතලා බලන්න. ඔයාගේ ව්‍යාපාරය වර්ධනය වෙනකොට, බැංකු ගිණුමක් තියෙන එකෙන්, ඔයාට බැංකු අයිරාවක්, ණය පහසුකම්, කුඩා පරිමාණ ව්‍යාපාරවලට උදව් කරන්න තියෙන රජයේ අළුත් යෝජනා ක්‍රම/ පටිපාටි වගේ දේවල් ගන්නත් පුළුවන්. බැංකු ගිණුමක් කියන්නේ පහසුවක් විතරක් නෙවෙයි. ඒක ව්‍යාපාරය වර්ධනය කරන්නත්, අලුත් අවස්ථා අරගෙන එන්නත් තියෙන වැදගත් යතුරක්.

මේකත් ඔයාට කියන්න ඕනෙ අළුත් බදු නීතිවලට අනුව, ඕනෑම බදු ප්‍රතිලාභයක් ලබාගන්න නම් රු. 500,000 ට වැඩි සියලුම ගෙවීම් බැංකු හරහා සිදු කරන්න ඕනෙ.

අනුෂා — ඇත්තටම ඔව්. ගිය අවුරුද්දෙ ඉඳල මම පොඩි ඉඩමක් ගන්න උත්සාහ කරනවා. ඒකට ඔප්පු හා ලේඛන සම්බන්ධ ගැටළු ගොඩක් ඇවිල්ලා. ඒකට TIN අංකය බාධා නොවෙන්නයි ඕනෙ. මම මගේ TIN අංකය ලියාපදිංචි කිරීමේ පෝරමය ඉක්මනට පුරවන්න ඕනෙ.

කමලා — හරි. මටත් ඉක්මනට මගේ බයික් එකේ ලයිසන් අලුත් කරන්න වෙනවා. දැන් පේන විදියට, ඒකටත් TIN අංකය ඕන වෙයි.

ප්‍රනාන්දු මහත්මිය — දැන් නම් TIN අංකය නැතුව වාහන ලයිසන් අලුත් කරන්න පුළුවන්. හැබැයි මම හිතනවා ඉතා ඉක්මනට ඒක අනිවාර්ය වෙයි කියල හිතෙනවා.

කමලා — හරි

සරෝජා — ප්‍රනාන්දු මහත්මිය, TIN අංකය එකක් තියෙන එකේ අවශ්‍යතාවය පැහැදිලි කරාට ස්තූතියි. ගමේ ඉන්ටර්නෙට් කැෆෙ එකෙන් ඔන්ලයින් අයදුම් කරන්න උත්සාහ කළා, හැබැයි ඉතාම දුර්වල අන්තර්ජාල සම්බන්ධතාවයක් තියෙන්නෙ. පද්ධතිය මාර හෙමින් වැඩ කරේ. ඒක නිසා අයදුම දාන්න බැරිවුණා.

ප්‍රනාන්දු මහත්මිය — ඒක ගැන මට කණගාටුයි. TIN අංකය ලියාපදිංචි කිරීමේ පෝරමයක් මට දෙන්න පුළුවන් නම් මම ඒක කොළඹ IRD මූලස්ථානයට ගිහින් දෙන්නම්. අනික් අයටත් ඔවුන්ගේ www.ird.gov.lk විද්‍යුත් තැපෑල ඔස්සේ IRD එක සම්බන්ධ කරගන්න පුළුවන්. ඉතින් මීළඟට 'e-Service' කියන තැන ක්ලික් කරලා, 'Taxpayer Registration' කියන එක තෝරන්න. ඊකේදි කියන පියවර අනුගමනය කරලා, අවශ්‍ය තොරතුරු පුරවලා, ජාතික හැඳුනුම්පතත්, TIN අංකය ගන්න ඕන වෙන වෙනත් ලියවිලිත් උඩුගත (upload) කරන්න වෙයි. ඒ වගේම IRD එකේ පළාත්බද කාර්යාල බොහොමයක් තියෙනවා, එහෙටත් පෝරම පුරවාගෙන ගිහින් දෙන්න පුළුවන්."

අනුෂා — මේ කාර්යාල තියෙන්නේ කොහෙද? අපේ ගමට ලඟම තියෙන්නේ කොයි කාර්යාලයද?

ප්‍රනාන්දු මහත්මිය — ප්‍රශ්නෙ ඇහුවට ස්තූතියි. රට පුරාම පළාත්බද කාර්යාල තියෙනවා, කොළඹ මහනගර ප්‍රදේශය ඇතුළත කාර්යාල තුනක් තියෙනවා. පූර්ණ ලැයිස්තුව මෙතනින් බලන්න පුළුවන් — Metropolitan and Regional Offices' (මහනගර සහ කලාපීය කාර්යාල)

කමලා — හරි, ස්තූතියි. තවත් දෙයක් දැනගන්න ඕනේ, ප්‍රනාන්දු මහත්මිය, මට TIN අංකයක් ගත්තොත් ස්වයංක්‍රීයව බදු ගෙවන්න වෙනවද?

ප්‍රනාන්දු මහත්මිය — නෑ කමලා. TIN අංකයක් තියෙන එකෙන් තමන්ට ස්වයංක්‍රීයව බදු ගෙවන්න පටන් ගන්න වෙනව කියලා නෙවෙයි. ඔයාගේ වාර්ෂික ආදායම රු. 1,200,000 (මාසිකව රු. 100,000) ඉක්මවූ විට පමණයි, ඒක ඇගයීම් වර්ෂය "2023 අප්‍රේල් 1 සිට 2024 මාර්තු 31 දක්වා" ඇතුළත. මේ අගයන් තවදුරටත් අයවැය වලදී වෙනස් වෙන්න පුළුවන්. දැන් තියෙන සංඛ්‍යා 2025 පෙබරවාරි අයවැයෙන් ලබාගන්න පුළුවන් IRD වෙබ් අඩවියෙන්. Inland Revenue (Amendment) Bill, 2025 - Lanka Law

සරෝජා	IRD එක TIN අංකය ගන්න ක්‍රියාවලිය සරල කරලා තියෙනවා. ලියාපදිංචි වෙලා නැතිව ඉන්නකොට රු. 50,000ක් වගේ දඩයක් ගෙවන්න වෙනවා, ඒක නිසා අපි ඉක්මනටම ඒකට අයදුම් කරන්න ඕනේ.
කමලා	පහුගිය අවුරුද්දෙ IRD වෙබ් අඩවිය බිඳවැටිලා කියන එක ඇත්තක් නෙමේද? නගරේ ඉන්න යාළුවෙක් ඒ ගැන කතාවුණා.
ප්‍රනාන්දු මහත්මිය	ඔයා හරි. බදු ගොනු කිරීමේ අන්තිම දවසේ තාක්ෂණික දෝෂ ඇතිවුණා. හැබැයි, පැය කිහිපයකින් ඒව විසඳන්න IRD එකට පුලුවන් වුණා. ගිය අවුරුද්දේ ඉඳලා දැන් වෙබ් අඩවිය යාවත්කාලීන කරලා ගොඩාක් පරිශීලක හිතකාමී බවට පත් කරලා තියෙනවා.
කාන්තාවන්	ස්තුතියි

ග්‍රාමීය ව්‍යවසායන් සඳහා නව ආරම්භයක් - TIN අංකයක් ලබා ගැනීමේ පියවර

- TIN අංකය යනු බදු ගෙවන්නන්ගේ හඳුනාගැනීමේ අංකයයි.
- 2024 ජනවාරි 1වනදා සිට වයස අවුරුදු 18 ට වැඩි පුරවැසියන් සඳහා TIN අංකය ලියාපදිංචිය අනිවාර්ය කර ඇත. එයට අනුකූල නොවුණහොත් රු.50,000 දක්වා දඩ මුදලක් ගෙවීමට සිදුවේ'
- හුදෙක් TIN අංකය ලබා ගැනීමෙන් බදු ගොනු කිරීමක් අදහස් නොවේ.

TIN අංකය අනිවාර්ය කර ඇති අවස්ථා

- බැංකුවක් සමඟ ජංගම ගිණුමක් විවෘත කිරීම
- ගොඩනැගිලි සැලැස්මක් සඳහා අනුමැතිය ලබා ගැනීම
- මෝටර් රථයක් ලියාපදිංචි කිරීම හෝ බලපත්‍රයක් අලුත් කිරීම
- ඉඩමක් හෝ ඉඩමකට අයිතියක් ලියාපදිංචි කිරීම

TIN අංකය ලබා ගැනීම සඳහා අයදුම්පත් කොළඹ IRD මූලස්ථානයෙන් හෝ ඕනෑම ප්‍රාදේශීය කාර්යාලයකින් පුද්ගලිකව ඉදිරිපත් කළ හැක.

සබැඳි අයදුම්පත් IRD වෙබ් අඩවියෙන් ඉදිරිපත් කළ හැක

www.ird.gov.lk - > විද්‍යුත් සේවා සඳහා ප්‍රවේශය -> බදු ගෙවන්නන්ගේ ලියාපදිංචිය

කෙටි ප්‍රශ්නාවලිය/ ඇගයීම

ටින් (TIN අංකය) හි සම්පූර්ණ අර්ථය කුමක්ද සහ එය අවශ්‍ය වන්නේ ඇයි? (පිළිතුර බදු ගොනු කිරීම, අපනයනය/ආනයනය කිරීම සහ IRD සේවා වෙත ප්‍රවේශ වීම සඳහා වේ).

1. ඔබ TIN අංකය ලබා ගැනීම අනිවාර්ය වන්නේ කුමන වේලාවකදීද?

2. TIN අංකය නොමැතිව ප්‍රවේශ විය නොහැකි සේවා 4ක් ලැයිස්තුගත කරන්න.

3. TIN අංකයක් ලබා ගැනීමෙන් ස්වයංක්‍රීයව බදු ගොනු කළ යුතු බව ගම්‍ය වේද? සාකච්ඡා කරන්න.

7.3. බදු වර්ග

ප්‍රධාන වශයෙන් බදු (1) සෘජු බදු සහ (2) වක්‍ර බදු ලෙස වර්ගීකරණය කලහැකිය.

සමහර බදු සෘජුවම (පුද්ගලික ආදායම් බදු සහ ආයතනික ආදායම් බදු) එකතු කරන අතර වැට් (VAT) බදුවැනි අනෙකුත් බදු වක්‍ර බදු වේ.

බදු ගෙවන්නාගේ ආදායම සහ ලාභය මත සෘජු බදු අය කෙරේ. රැකියාවෙන් ආදායමක් උපයන පුද්ගලයෙකු, ලාභ උපයන කුඩා ව්‍යාපාර හිමිකරුවෙකු, වෛද්‍යවරයෙකු නීතිඥවරයෙකු වැනි වෘත්තිමය දීමනා ලබන පුද්ගලයෙකු, පොලී හෝ ආයෝජන මත ලාභාංශ උපයන පුද්ගලයෙකු - මේ සියල්ල ආදායම් බදු සෘජුවම රජයට ගෙවයි.

ආදායම වැඩි වන තරමට සෘජු බදු බර වැඩි වේ. සෘජු බදු වල ප්‍රගතිශීලී ස්වභාවය මෙයින් පැහැදිලි වේ.

ශ්‍රීලංකාවේ ක්‍රියාත්මක වන වක්‍ර බදු ගෙවනු ලබන්නේ ආදායම මත නොව භාණ්ඩ හා සේවා පරිභෝජනය මත ය. උදාහරණයක් ලෙස, ආපනශාලා බිල්පත්, පුද්ගලික කුලී රථ කුලියට ගැනීම, ඇඳුම් මිලදී ගැනීම් යනාදිය සඳහා වැට් බද්ද එකතු කරනු ලැබේ. මෙම සේවා හෝ භාණ්ඩ සඳහා ගෙවීමේදී සෑම පුද්ගලයෙකුම වැට් බද්ද ගෙවයි. මේ ආකාරයෙන් අනුකූල වීම පහසු සහ සරල ය.

භාණ්ඩ නිෂ්පාදකයා හෝ සේවා සපයන්නා වන බදු ගෙවන්නා රජයට වක්‍ර බදු ගෙවයි, නමුත් බදු මුදල, ප්‍රතිලාභ ලබන වෙනත් පුද්ගලයෙකුගෙන් අයකර ගනු ලැබේ, උදාහරණයක් ලෙස අවසාන පාරිභෝගිකයා.

වක්‍ර බදු සඳහා උදාහරණ වන්නේ එකතු කළ අගය මත බදු (VAT බද්ද), සුරාබදු සහ රේගු බදු ය.

තිරිඟු සහ තිරිඟු නිෂ්පාදන සහ ළදරු ආහාර වැනි ඇතැම් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය වැට් බද්දෙන් නිදහස් කර ඇත.

මත්පැන් සහ ඛනිජ තෙල් නිෂ්පාදන වැනි ඇතැම් භාණ්ඩ මිලදී ගැනීමේදී සුරාබදු ඇතුළත් වේ.

	සෘජු බදු	වක්‍ර බදු
අර්ථ දැක්වීම	බදු ගෙවන්නන් විසින් රජයට කෙලින්ම ගෙවනු ලැබේ.	අතරමැදියන් විසින් පාරිභෝගිකයින්ගෙන් වක්‍රව එකතු කරනු ලැබේ.
උදාහරණය	ආදායම් බදු, ආයතනික බදු, දේපල බදු	එකතු කළ අගය මත බදු, (වැට් බදු), සුරාබදු ආනයන බදු.
බර	සෘජුවම බදු ගෙවන්නා මත වැටෙන අතර වෙනත් කෙනෙකුට මාරු කළ නොහැක.	භාණ්ඩ/සේවා සැපයුම් දාමය ඔස්සේ අන් අය වෙත මාරු කළ හැකිය.
පදනම	ආදායම, වත්කම් සහ ධනය	පරිභෝජනය සහ ගනුදෙනු
පරිපාලනයේ පහසුව	වැඩි සම්පත් සහ එකතු කිරීමේ යන්ත්‍රෝපකරණ අවශ්‍යයි	විකුණුම්/සේවා ස්ථානයේ දී එකතු කිරීමට පහසු
බෙදාහැරීමේ/ව්‍යාප්ති බලපෑම	ප්‍රගතිශීලී සහ සාධාරණය. මන්ද ඉහළ ආදායමක් යනු ඉහළ බදු බරකි.	භාණ්ඩ හා සේවා භාවිතය සඳහා තම ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් බදු ගෙවන අඩු ආදායම්ලාභී කණ්ඩායම්වලට අසමානුපාතික ලෙස බලපායි.

අන්තර් ක්‍රියාකාරී භූමිකා නිරූපණය - තම කාර්යාල මිතුරු මිතුරියන් සමඟ ගෝතමී මෑතකදී නගරයට ගිය ගමන ගැන අයෝධ්‍ය සමග සාකච්ඡා කරමින් සිටියි.

අයෝධ්‍ය	ගිය සතියෙ ඔයා නගරෙට ගියාම වුනා කියපු රසවත් සිදුවීම මොකක්ද ?
ගෝතමී	ඒක නම් මගේ ඇස් පාදපු සිද්ධියක්. මතකද මං ඔයාට ගිය සතියෙ කිව්වා වක්‍ර බදු ගැන? ඒ කියන්නෙ, අපි හැමෝම අවබෝධයක් නැතුවම බදු ගෙවනවා.
අයෝධ්‍ය	මොකක්? මටනම් සහතිකයි මමනම් ගෙවන්නෙ නෑ. මම තාම ඉස්කෝලේ යනවාල ආදායමකුත් නෑ, TIN අංකයක් ගන්න අවශ්‍යතාවයකුත් නෑනෙ.
ගෝතමී	මමත් එහෙම තමයි හිතන් ඉඳියෙ. ඒත් මේක අහලම ඉන්නකොග අපි දවල් කෑමට අවන්හලකට යන්න තීරණය කළා. අපි හිතන් හිටියෙ අපි පස්දෙනා රු.400 බැගින් දාලා අපිට ගෙවන්න වෙන මුළු මුදල රු.2000 ගෙවන්න පුළුවන් කියලා. හැබැයි බිල ආවම දැක්කේ රු.2360 කියලා
අයෝධ්‍ය	පොඩ්ඩක් ඉන්න. එතකොට ඇයි අමතර රු. 360ක්?
ගෝතමී	එහෙම තමයි අපි හිතුවෙත්! ඒත් එහෙම වුණේ, එකතු කල අගය මත බද්ද (VAT) 18%ක් නිසා. ඉතින් අපි හැමෝම එක එක්කෙනා රු.72ක බද්දක් ගෙවලා.
අයෝධ්‍ය	ඒත්, ඔයාගේ TIN අංකයවත් තව ලැබුණේ නැහැ නේද? එහෙනම් කොහොමද බදු ගෙව්වේ?
ගෝතමී	TIN අංකය ඕන වෙන්නෙ ආදායම් බදු ගෙවන්න. ඒක සෘජු බද්දක්. ඒත් VAT කියන්නේ භාණ්ඩ සහ සේවාවන් පාවිච්චි කරනකොට ගෙවන්න වෙන, පරිභෝජන බද්දක්. මේක අනියම් බද්දක්. ඒක අවන්හලේ හිමිකරු රජයට ගෙවන්න ඕනේ. හැබැයි ඒක බිලට එකතු කරලා අපෙන් ගන්නවා.
අයෝධ්‍ය	ඇත්තෙන්ම අපූරුයි ! මම ආදායම් බද්දක් ගෙවන්නේ නැතත්, භාණ්ඩයක් ගන්නකොට හෝ සේවාවක් පාවිච්චි කරන සෑම වතාවකම VAT බද්ද ගෙවනවා. රජයේ ආදායමට මමත් දායක වෙනවා. ඒත් ඔයා කොහොමද මේ ඔක්කොම දන්නේ?

ගෝතමී	මතකනෙ පාසලේ විදුහල්පති පෙරේරා මහතාගේ පුතා, නිරංජන්. එයා මගේ යාළුවානෙ. ඔහුට බදු ගැන ගොඩක් උනන්දුවක් තියනවා. කවදහරි එයා ගිණුම්කරුවෙක් වෙන්න බලාපොරොත්තු වෙනවා. තවත් සිත්ගන්නාසුළු දෙයක් කියන්නම්. අපිට දිවා ආහාර බිල ලැබුණාම, මුදල් අයකැමි කීවා 'ඔයාලා බිලක් ඉල්ලන්නේ නැත්තං, රුපියල් 200 ක වට්ටමක් දෙන්නම්' කියලා. ඊකට නිරංජන් 'නෑ නෑ, එහෙම කරන්න බැහැ' කියලා කිව්වා.
අයෝධ්‍ය	එහෙම වට්ටමක් දුන්නානම් ඇයි නොගත්තේ?
ගෝතමී	මොකද, ඊක නීති විරෝධීයි. ආදායම අඩුවෙන් වාර්තා කරන එක බදු ගෙවීම පැහැර හැරීමක් කියලා නිරංජන් පැහැදිලි කළා. සම්පූර්ණයෙන්ම මුදලින් ගනුදෙනු කරලා අනාවරණයන් යට ගහන දූෂිත නිලධාරීන්ට මෙහෙම එකතු කරන මුදල් අල්ලස් විදියටත් දෙනවා. ඊක එච්චර හොඳ දෙයක් නෙමේ.
අයෝධ්‍ය	ඇත්ත! අපි වගේ අයට ඇත්තටම ගමේ අවශ්‍ය බොහෝ නොමිලේ සේවා සඳහා බදු භාවිතා කරන නිසා. බදු පැහැර හැරීමට දඬුවම් කරන්න ඕනෙ. සාමාන්‍ය ජනතාවට ඒ වගේ ක්‍රියාවන් අයබදු ගැනීම සහ ආදායම් බදු එකතු කිරීමේ අධිකාරියට පැමිණිලි කරන්න මොකක්හරි ක්‍රමයක් තියෙන්න ඕනෙ.
ගෝතමී	අපි බිලක් ලබා ගන්න බල කරල ඉල්ලලා විතරක් මදි, මෙහෙම දේවල් අදාල බලධාරීන්ට පැමිණිලි කරන්නත් ඕනෙ. තොරතුරු සපයන අයගේ අනන්‍යතාවය ආරක්ෂා කරල, රහසිගතභාවය සහතික කරලා, එවැනි සිදුවීම් වාර්තා කරන්න ජනතාව දිරිමත් කරන්න IRD පසුගියදා පියවර ගත්තා. එවැනි පැමිණිලි විස්තර cgir@ird.gov.lk කියන විද්‍යුත් තැපෑල් ලිපිනයට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට යවන්න පුළුවන්. තවමත් මේ තොරතුරු ප්‍රාදේශීය කාර්යාලවලින්ත් ගන්න පුළුවන්. ඒ අයගේ දුරකථන අංක වෙබ් අඩවියෙන් බලන්න පුළුවන්. Metropolitan and Regional Offices' ඇත්ත තොරතුරුයි සාක්ෂියි සළකා බලලා, අල්ලස් සහ දූෂණ චෝදනා තියනවනම්, ඒවා IRD එකෙන් අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යොමු කරන්න පුළුවන්. IRD ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පැමිණිලි පෙට්ටියක් හදමින් තියෙනවා. තව ඕනෙම නිලධාරියෙකුගේ දුරකථන අංක වගේම සම්බන්ධ වෙන්න තියෙන තොරතුරු IRD වෙබ් අඩවියෙ තියනවා.
අයෝධ්‍ය	බදු අක්‍රමිකතා අඩු කරන්න ඊක හොඳ පියවරක්.
ගෝතමී	නිරංජන් මේකට තවත් කරුණු එකතු කරා. මේ වගේ ව්‍යාපාර බදු නීති උල්ලංඝනය කරන එක ගැන පැමිණිළි කරන්න අපිට බැරි වුනොත්, අනිත් ක්ෂේත්‍රවලත් රෙගුලාසි මගහැරල යන්න ඒ අය දිරිමත් වෙන්න පුළුවන්. ආහාරවල ගුණාත්මකභාවයට සහ ආරක්ෂාවට හානි කිරීම බරපතල අවදානම් ඇති කරන්න පුළුවන්. මෙහෙම හිතනකොට, බදු අනුකූලතාවය දිරිමත් කරන එක සෑම කෙනෙකුගේම යහපතට හේතු වෙනවා.
අයෝධ්‍ය	ඒ විතරක් නෙමේ, අපි නොදැනුවත්වම වැට් බද්ද ගෙවන වෙනත් අවස්ථා තියෙනවද?
ගෝතමී	අපෝ ඔව්. මම නගරයේ දී ඔයාට අරන් දුන්න ඇඳුම ට දීපු බිල් එක බලන්නකො. බස් හෝල්ට් එකේ ඉඳලා විශ්වවිද්‍යාලයට යන අපේ පික්මී (PickMe) ගමනට පවා වැට් බද්ද ඇතුළත් කරල තියෙන්නෙ.
අයෝධ්‍ය	අපූරු කතාවක්, හැබැයි මේක ටිකක් අසාධාරණයි කියලා හිතෙන්නෙ නැද්ද? අපි අදායම අඩු, සාමාන්‍ය ගම්වැසියො. නගරේ ඉන්න සල්ලි තියෙන අයට සමානව අපිත් වැට්(ඩ්ඕ) එකක් ගෙවනවා නේද?
ගෝතමී	ඔයා හරි. නිරංජන් කීවෙත් ඊකමයි. වැට් බද්ද (VAT) කියන්නේ ගෙවන්න පුළුවන්ද කියන එක බලලා තීරණය වෙන එකක් නෙමෙයි, ඊකට කියන්නේ ප්‍රතිගාමී බද්දක්. සෘජු බදු නම් ප්‍රගතිශීලී. ඒ කියන්නේ, ආදායම වැඩි වෙද්දි බද්දත් වැඩි වෙනවා.
අයෝධ්‍ය	ඊක තව ටිකක් පැහැදිලි කරන්න පුළුවන්ද.
ගෝතමී	වැට් බද්ද (VAT) හැමෝටම එකම ප්‍රතිශතකින් අදාල වෙනවා. හැබැයි, ආදායම වැඩි වෙද්දි වියදමට යන ආදායමේ කොටස අඩු වෙනවා. එනිසා අඩු ආදායම් තියන ගෙවල්වල වියදමට යන ආදායමේ ප්‍රතිශතය වැඩියි, වැඩි ආදායමක් ලැබෙන ගෙවල් වලට වඩා.
අයෝධ්‍ය	එහෙමනම් ඇයි අපි සෘජු බදු පද්ධතියට මාරු වෙන්නේ නැත්තේ?
ගෝතමී	ඊක සරල නෑ. සෘජු බදු රඳා පවතින්නේ මිනිස්සු ස්වේච්ඡාවෙන් ඊගොල්ලොන්ගෙ ආදායම වාර්තා කරල අවශ්‍ය බදු ගෙවන එක මත. ඊක ක්‍රියාත්මක කරන එකයි අධීක්ෂණය කරන එකයි අපහසුයි.
අයෝධ්‍ය	ඔව්, අර අවන්හලේ අයිතිකාරයා වගේ දහස් ගණනක් අය ඉන්නවා බදු ගෙවන එකෙන් වැළකී ඉන්න, හැම අවස්ථාවක්ම ප්‍රයෝජනයට ගන්න කැමති අය.
ගෝතමී	මේ වගේ බදු දූෂණ කොච්චරක් වෙනවද කියල හොයා බලන එක දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට තියෙන දැවැන්ත කාර්යයක්. අනෙක් අතට වැට් බද්ද වැනි වක්‍ර බදු විකිණුම් කරන අවස්ථාවෙදිම ස්වයංක්‍රීයව එකතු වෙන හින්ද පරිපාලනය කරන එක ගොඩක් පහසුයි. වැට් බද්ද ලංකාවේ විශාලතම බදු ආදායම් මාර්ගය වන්නේ ඊකයි.

අයෝධ්‍ය	ඔව්, මට දැනෙන විදියට සෘජු බදු සාධාරණයි. ඒක අපේ ආදායමේ ප්‍රධාන මූලාශ්‍රය වෙන්න ඕනෙ කියලයි මට හැගෙන්නෙ.
ගෝතමී	ඔයා ඒක හරියටම කිව්වා ! ඒ නිසා තමයි සෘජු බදු පද්ධතියේ බදු පදනම පුළුල් කරන්න ඕනෙ. විවිධ ආදායම් කාණ්ඩවලින් උපයන අය බදු ගොනු කරන්න තව දිරිමත් කරන්නත් ඕනෙ. සාධාරණ බදු ක්‍රමයක් හදන පළවෙනි පියවර විදිහට ටින් (TIN අංකය) ලියාපදිංචිය අනිවාර්ය කරන්න රජය තල්ලු කරන්නේ ඒකයි.
අයෝධ්‍ය	තේරුණා. ඒ නිසා, ටින් කියන්නෙ බදු ගෙවන එක විතරක්ම නෙමේ. වඩා සමස්ත පද්ධතියම වඩා හොඳින් ක්‍රියාත්මක වෙලා වඩා හොඳ සමාජයක් කරා ගෙනියන එකයි.
ගෝතමී	හරියටම හරි මගේ පුංචි මල්ලි
අයෝධ්‍ය	බදු කියන මාතෘකාව හරිම රසවත්. උසස් අධ්‍යාපනයෙදි අපිට ඒක උගන්නන්න ඕනෙ කියලා මං හිතනවා. නැත්තම් අපි අපේ විදුහල්පතිට කියලා IRD නිලධාරීන් විසින් දැනුම බෙදාදෙන සැසි ඉස්කෝලෙදි පවත්වන්න ලෑස්ති කරල දෙන්න කියල අහමු.
ගෝතමී	හොඳ අදහසක් !

භාණ්ඩ හා සේවාවල අදෘශ්‍යමාන බදු හස්තය

සෘජු බදු සහ වක්‍ර බද්ද: සෘජු බද්ද යනු එය පනවනු ලබන බදු ගෙවන්නා (තනි පුද්ගල/ව්‍යාපාර/වෙනත්) විසින් සෘජුවම ගෙවනු ලබන බද්දකි. සෘජු බද්ද වෙනත් පුද්ගලයෙකුට හෝ ආයතනයකට මාරු කළ නොහැක. අනෙක් අතට, වක්‍ර බදු එක් බදු ගෙවන්නෙකුගෙන් තවත් බදු ගෙවන්නෙකුට මාරු කළ හැකිය.වක්‍ර බද්ද යනු භාණ්ඩයක හෝ සේවාවක මිල වැඩි කරන බද්ද වන අතර එමඟින් පාරිභෝගිකයින් භාණ්ඩ හෝ සේවාවේ මිල සමඟ බද්ද ගෙවයි. වක්‍ර බදු අය කරනු ලබන්නේ භාණ්ඩ හෝ සේවා පරිභෝජනය කරන ස්ථානයේ ය. උදාහරණ ලෙස, එකතු කළ අගය මත බද්ද (VAT බද්ද), සුරාබදු බදු සහ ආනයන බදු.

- **සෘජු බදු යනු, බදු ගෙවන්නන්ගේ ආදායම මත කෙලින්ම ගෙවනු ලබන්නකි.**
- **වක්‍ර බදු ගෙවීම සිදුකරන්නේ භාවිතා කරන ස්ථානයේදීය. (ආපනශාලා, පෙට්‍රල් පොම්පත් සිනමා ශාලා, බෙදාගන්නා ගමන් වැනි). භාණ්ඩ හා සේවා සපයනා පුද්ගලයන් විසින් ගෙවන නමුත් පරිභෝජනය කරන ස්ථානයේදී එකතු කර ගනී.**
- **සෘජු බදු ප්‍රගතිශීලීය. සහ සාධාරණය. රඳා පවතින්නේ ගෙවීමේ හැකියාව මතය. ඉහළ ආදායමක් යනු ඉහළ බදුය.**
- **වක්‍ර බදු ප්‍රතිගාමී වේ.අඩු ආදායම් උපයන්නන්ගෙන්, වැඩි බදු ප්‍රතිශතයක් එකතු කරයි.**
- **වක්‍ර බදු පරිපාලනය සෘජු බදු පරිපාලනයට වඩා සරලය.**

<table>
<tr><th colspan="3">වක්‍ර බදු</th></tr>
<tr><td>එකතුකල අගය මත බදු (VAT) භාණ්ඩ සහ සේවා මත</td><td>සුරා බදු - මත්පැන් පෙට්‍රෝලියම් වැනි නිෂ්පාදන මත</td><td>රේගු බදු - ආනයන මත</td></tr>
<tr><td colspan="3">වැට් බද්ද(එකතු කළ අගය මත බද්ද) - අපි භාණ්ඩ මිලදී ගන්නා විට එකතු කරනු ලැබේ (තිරිඟු, දේශීයව නිෂ්පාදනය කරන ලද කිරි නිෂ්පාදන වැනි ඇතැම් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සඳහා නිදහස් කිරීම්) සහ අවන්හල්, සාප්පු සංකීර්ණ සහ කුලී රථ සඳහා ගෙවීම් වැනි සේවාවන් ලබා ගනී</td></tr>
<tr><td> </td><td> </td><td> </td></tr>
</table>

කෙටි ප්‍රශ්නාවලිය/ ඇගයීම

1. සෘජු හා වක්‍ර බදු අතර වෙනස කුමක්ද?

2. අවම වශයෙන් උදාහරණ 2ක් උපයෝගී කරගෙන සෘජු හා වක්‍ර බදු වර්ග විස්තර කරන්න

3. රුපියල් 1,300,000 ක වාර්ෂික ආදායමක් ඇති අක්‍රම් මහතා සහ වාර්ෂික ආදායම රුපියල් 500,000 ක් වන රොෂාන් මහතා නත්තල් සාප්පු සවාරි සඳහා විලාසිතා සාප්පුවකට ඇතුළු වෙති. අක්‍රම් මහතා රු. 3000කට සපත්තු යුගලයක් සහ කමිසයක් මිලදී ගන්නා අතර රොෂාන් මහතාගේ මුළු පවුල සඳහාම මිලදී ගැනීම් වල මුළු එකතුව රු. 3000 කි.

   (i) පිළිවෙලින් අක්‍රම් මහතා සහ රොෂාන් මහතා ගෙවන වැට් බද්ද කොපමණද (වැට් බදු අනුපාතය/ අනුප්‍රමාණය 18% යටතේ)?

   (ii) එමගින් වැට් බදු වල ස්වභාවය ගැන අපට පවසන්නේ කුමක්ද?

7.4. කුඩා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා බදුකරණය

කුඩා ව්‍යාපාර (ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් -MSME) බදු ගෙවීමෙන් ප්‍රතිලාභ ලබන ආකාරය?

ක්ෂුද්‍ර , සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (MSME) යනු රැකියා උත්පාදනය සම්බන්ධයෙන් ආර්ථිකයේ ධාවකයන් වේ. වසංගතය සහ ආර්ථික අර්බුදය තුළ ඔවුන් දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දුන්හ.

ඔවුන්ගේ ව්‍යාපාර නැවත ගොඩ නැගීම සඳහා ඉතුරුම්, ණය, රක්ෂණ සහ වෙළඳපල වෙත ප්‍රවේශ විය හැකි විධිමත් ආර්ථිකයකට ඇතුළු විය යුතුය. විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල MSME අතර පවතින තොරතුරු අසමමිතිය මඟහරවා ගත යුතු අතර බදු ගෙවීමේ ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් විය යුතුය.

සම්මත ආදායම් බදු අනුප්‍රමාණයන් - 2025.04.01 සිට

රු. 1,800,000 ක පුද්ගල බදු සහනය (බදු නිදහස් දීමනාව) අඩු කල පසු ඉතිරි බදු අයවන ආදයම මත පහත අනුපාත මඟින් බදු අය කිරීම සිදුවේ.

උදාහරණය:

බදු අය කළ හැකි ආදායම	අඩුම පරාසයට (LKR) සමාන බදු අය කළ හැකි ආදායම මත බද්ද	පරාසයේ අඩුම ප්‍රමාණයට වඩා වැඩි බදු අය කළ හැකි ආදායමක් මත බද්ද
පළමු 1,000,000	60,000	6%
ඊලඟ 500,000	90,000	18%
ඊලඟ 500,000	120,000	24%
ඊලඟ 500,000	150,000	30%
ඉතිරිය		36%

ඇස්තමේන්තුගත සුදුසුකම් ලබන ගෙවීම් (උදාහරණ) - ආදායමෙන් අඩු කළ හැකිය

අ) අවශ්‍යතා ඇති පුද්ගලයින් සඳහා ආයතනික රැකවරණය ලබාදෙන අනුමත පුණ්‍යායතන (බදු අයවන ආදායමෙන් 1/3 ක් හෝ රු. 75,000 ක් වඩා අඩු අගයට සීමා වේ.) අනුමත රාජ්‍ය ආයතන සහ ජනාධිපති අරමුදල සඳහා පරිත්‍යාග

ආ) සමෘද්ධි පවුලක කාන්තාවක් සඳහා කඩයක් පිහිටුවීමට නේවාසික/පුරවැසියෙක් වන පුද්ගලයෙකු විසින් කරන ලද දායකත්වය. (සමෘද්ධි දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත)

ඇ) විවිධ මූලාශ්‍රවලින් පුද්ගලයෙකුගේ සමස්ත ආදායමෙන් ලබා ගත හැකි සහන.

ඈ) ව්‍යවස්ථාපිත සහන – රු. 1,800,000

ඉ) සූර්ය පැනල සහන – රු. 600,000 වසරකට

ඊ) කුලී සහන. (සත්‍ය වශයෙන් අලුත්වැඩියා කිරීම් සිදු වූවාද නොසලකා දළ කුලී ආදායම මත 25 % සහනය)

සමාගම් සඳහා අදාල බදු අනුපාත

සම්මත අනුපාතය – 30%

සුරා, සුදු, ඔට්ටු වැනි ව්‍යාපාර සඳහා – 45%

වැට් බදු ලියාපදිංචිය සඳහා වන සීමාවන් වන්නේ

(i) භාණ්ඩ හා සේවා වටිනාකම (මූල්‍ය සේවා හැර) - කාර්තුවකට රුපියල් මිලියන 15ක් සහ වසරකට රුපියල් මිලියන 60ක් ඉක්මවයි.

(ii) මූල්‍ය සේවා සඳහා වටිනාකම - කාර්තුවකට රුපියල් මිලියන 3 ඉක්මවන අතර වසරකට රුපියල් මිලියන 12 ඉක්මවයි.

ස්වේච්ඡා ලියාපදිංචිය සඳහා ද අවසර දී ඇත.

විසඳූ උදාහරණය -

කරුණානායක මහතා "KDT˜ සමාගමේ ප්‍රධාන මූල්‍ය පාලක (CFO) වේ. 2025/2026 තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ අපේක්ෂිත ආදායම පහත පරිදි වේ;

- රැකියාවෙන් ලැබෙන ආදායම රු. 6,600,000 (රු.. 550,000x12) - රු. 1,494,000 ක APIT අඩු කර ඇත.
- දළ පොලී ආදායම 01.05.2023 දිනට රු. 2,200,000 (AIT වී ඇත 10% ක අනුපාතයකින් අඩු කර ඇත)
- ව්‍යාපාර ආදායම රු. 5,000,000

තක්සේරු වර්ෂය තුළ රජයේ විශ්වවිද්‍යා,යකට රුපියල් 250,000 ක් වටිනා පොත් පරිත්‍යාග කර ඇත. මීට අමතරව, කරුණානායක මහතා ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ ඔහුගේ නවාතැනේ රු. 750,000කට සූර්ය පැනලයක් ස්ථාපනය කර ඇත. ඔහු කාර්තුවකට රු. 250,000 බැගින් වර්ෂය තුල ස්වයං තක්සේරු ක්‍රමයට බදු ගෙවා ඇත.-

ගෙවිය යුතු බදු ගණනය

රැකියා ආදායම		6,600,000
පොලී ආදායම		2,200,000
ව්‍යාපාර ආදායම		5,000,000
තක්සේරු කළ හැකි ආදායම		**13,800,000**
අඩු - සහන		
- පුද්ගලික සහන		(1,800,000)
- සූර්ය පැනලය		(600,000)
අඩු - සුදුසුකම් ගෙවීම්		
- ජාතික රෝහලට පරිත්‍යාග කිරීම		(250,000)
ඇස්තමේන්තුගත බදු අය කළ හැකි ආදායම		**11,150,000**
ඇස්තමේන්තුගත බදු වගකීම (2025 ජනවාරි මාසයේ පවතින අනුපාත මත පදනම්ව)	1,000,000 x 6% = 60,000	
	500,000 x 18% = 90,000	
	500,000 x 24% = 120,000	
	500,000 x 30% = 150,000	
	8,650,000 x 36% = 3,114,000	
සම්පූර්ණ බදු වගකීම/ ගෙවිය යුතු මුළුබදු මුදල		**3,534,000**
අඩු කිරීම් – APIT		(1,494,000)
- AIT මත බදු		(220,000)
- ස්වයං තක්සේරු ක්‍රමය මත බදු		(1,000,000)
ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු (A)		**820,000**

ග්‍රාමීය MSMEs සඳහා විධිමත් කිරීමේ ප්‍රතිලාභ විවර වීම:

- **MSME හිමිකරුවන් TIN අංකය සඳහා ලියාපදිංචි වී විධිමත් ආර්ථිකයට පරිවර්තනයක් විය යුතුය.**
- **ඔෂහ අංකය ලබාගැනීම මඟින්, MSME හිමිකරුවන් තම ඉපැයීම් තැන්පත් කළ හැකි ජංගම ගිණුමක් විවෘත කිරීමට සුදුසුකම් ලබයි.**
- **ඔවුන්ගේ ආදායම රුපියල් 1,200,000 සීමාව ඉක්මවා ගිය පසු ඔවුන්ට බදු ගොනු කිරීමට අවශ්‍ය වේ.**
- **කුඩා මුදල් ප්‍රමාණයක් නිතිපතා තැන්පත් කිරීමෙන් ඔවුන්ට විශ්‍රාම ඉතුරුම් සඳහා ආයෝජනය කර ඔවුන්ගේ අනාගත අවශ්‍යතා සඳහා සැලසුම් කළ හැකිය.**

කෙටි ප්‍රශ්නාවලිය/ ඇගයීම

1. ආන්තික බදු අනුපාතය/අනුප්‍රමාණය සහ ඵලදායී බදු අනුපාතය/අනුප්‍රමාණය කුමක්ද?

2. කුඩා ව්‍යාපාර විසින් ගෙවනු ලබන බදු මොනවාද? (පිළිතුර සඳහා ආදායම් බද්ද, APIT, WHT සහ වැට් බදු ඇතුළත්).

3. ආරිෆ් සතුව මෝටර් රථ අලුත්වැඩියා සාප්පුවක් ඇති අතර මාස 5ක් සඳහා මසකට රුපියල් 100,000ක් සහ මාස 7ක් සඳහා මසකට රුපියල් 150,000ක් උපයයි. ඔහුට පැරණි ආයෝජන ඇති අතර 2026.03.31 වන විට රුපියල් 400,000 ක දළ පොලියක් උපයා ගනී. 2025/26 තක්සේරු වර්ෂය සඳහා ආරිෆ් විසින් ගෙවිය යුතු බද්ද ගණනය කරන්න?

4. වෛද්‍ය වසුමති කරාපිටිය ශික්ෂණ රෝහලේ සාමාන්‍ය ශල්‍ය වෛද්‍යවරියකි. එසේම ඇය ඇයගේම වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යයි. ඇය පෞද්ගලික සෞඛ්‍ය සේවා හා ඖෂධ ලබාදීමේ නිරත වන අතර එමගින් අමතර ආදායමක් උපයා ගනී. 2025/2026 තක්සේරු වර්ෂය සඳහා ඇයගේ ආදායම පහත පරිදි වේ;

   (i) රැකියා ආදායම රු. 9,200,000

   (ii) වෘත්තීය ආදායම ඇයගේම වෛද්‍ය මධ්‍යස්ථානයකින් රුපියල් 31,000,000 කි

   (iii) 01.06.2025 දින ලැබුණු දළ පොලී ආදායම රු. 5,000,000 කි

   (iv) පුද්ගලික පරිචයෙන් ලැබෙන ආදායම රු. 500,000

   (v) කුලී ආදායම රු. 900,000

   (vi) රැකියා ආදායමට ඇස්තමේන්තුගත මුදල් සහ මුදල් නොවන ප්‍රතිලාභ ඇතුළත් වේ.

   (vii) ඇය අනුමත පුණ්‍යායතනයකට රුපියල් 200,000ක් පරිත්‍යාග කර ඇති අතර ඇයගේ පරිශ්‍රයේ සවි කිරීමට සහ ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීමට සූර්ය පැනල ලබා ගැනීමට වසර තුළ රුපියල් 1,200,000ක් වැය කර ඇත.

2025/26 තක්සේරු වර්ෂය සඳහා ඇය විසින් ගෙවිය යුතු බද්ද ගණනය කරන්න. (මූලාශ්‍රය: IRD SET මාර්ගෝපදේශය 2023/24)

References

Kotler, P., & Keller, K. L. (2016). Marketing management (15th ed.). Pearson.

Paul Anthony Samuelson. (1997). Economics: an introductory analysis. Mcgraw-Hill.

Porter, M. E. (1990). The Competitive Advantage of Nations.

Department of Census and Statistics. (2019). Department of Census and Statistics-Sri Lanka. Statistics.gov.lk. http://www.statistics.gov.lk

Central Bank of Sri Lanka. (2019). Central Bank of Sri Lanka. Cbsl.gov.lk. https://www.cbsl.gov.lk/

Pandey, I. M. (2015). Financial management. Vikas Publishing House Pvt Ltd.

Lipsey, R., & Chrystal, A. (2015). Economics (13th ed.). Oxford University Press.

Brealey, R. A., Myers, S. C., & Allen, F. (2014). Principles of corporate finance. (11th ed.). Mcgraw-Hill Education.

Smart, S. J., Gitman, L. J., & Joehnk, M. (2013). Fundamentals of Investing. Pearson Higher Ed.

Bodie, Z., Kane, A., & Marcus, A. J. (2018). Investments. McGraw-Hill Education, Cop.

Brigham, E. F., & Houston, J. F. (2009). Fundamentals of financial management. South-Western/Thomson Learning, Cop.

Charles Parker Jones, & Jensen, G. R. (2016). Investments: analysis and management. Wiley.

Securities & Exchange Commission – Just another WordPress site. (n.d.). https://www.sec.gov.lk/

Colombo Stock Exchange. (n.d.). Colombo Stock Exchange. http://www.cse.lk

Kapoor, J. R., Dlabay, L. R., & Robert James Hughes. (2017). Personal finance. Mcgraw-Hill Education.

Ryan, J. S. (1996). Managing Your Finances. South Western Educational Publishing.

Maslow, A. H. (1954). Motivation and personality. Harper & Row.

Abeysuriya, R. (n.d.). Financial Literacy to Achieve Your Financial Wellbeing (2nd ed.) [Review of Financial Literacy to achieve financial wellbeing]. CFA Society Sri Lanka.

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

Regional Development Department
Central Bank of Sri Lanka
No. 30, Janadhipathi Mawatha
Colombo 01, Sri Lanka
www.rdd.cbsl.lk

United Nations Development Programme (UNDP)
UN Compound,
202-204,
Bauddhaloka
Mawatha,
Colombo 7,
Sri Lanka.